සියළු දෙනාගේ ජීවිත ආලෝකමත් කරමින්...

ලංකා විදුලිබල මණ්ඩලය

වාර්ෂික වාර්තාව 2011

"දැරිය හැකි මිළකට විදුලි බලය අඛන්ඩව ලබාදීමෙන් ජීවන තත්ත්වය උසස් කිරීම සහ විදුලිය ගමට ගෙනයමින් ග්‍රාමීය සංවර්ධනයට දායකවීමත් අපගේ කාර්යභාරය වේ."

පටුන

2011 වසරේ උද්දීපනයන් 9 | ආයතනික තොරතුරු 14 |
සංවිධාන ව්‍යුහය 16 | සභාපති තුමාගේ සමාලෝචනය 20 | සාමාන්‍යාධිකාරීවරයාගේ සමාලෝචනය 22 |
මෙහෙයුම් සමාලෝචනය 29 | ජනන අංශය 29 | සම්ප්‍රේෂණ අංශය 33 |
බෙදාහැරීමේ අංශය 01 44 | බෙදාහැරීමේ අංශය 02 56 | බෙදාහැරීමේ අංශය 03 66 |
බෙදාහැරීමේ අංශය 04 73 | ව්‍යාපෘති අංශය 80 | වත්කම් කළමණාකරන සහ මධ්‍යගත සේවා අංශය 90 |
ආයතනික ක්‍රමෝපාය අංශය 97 | මූල්‍ය අංශය 106 | මූල්‍ය සමාලෝචනය 107 |
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 109 |ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය 110 | ඒකාබද්ධ ශේෂ පත්‍රය 111 |
සමූහය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 112 | මණ්ඩලයේ - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 114 |
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය 116 | මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් 117 |
විගණකාධිපති වාර්තාව 159 | විගණකාධිපති වාර්තාවට පිළිතුරු 177 |

සියළු දෙනාගේ ජීවිත ආලෝකමත් කරමින්...

2012 වර්ෂයේදී අප රටේ සියළු පුරවැසියන් සඳහා විදුලිය ලබාදීමේ අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කරන ලංකා විදුලි බල මණ්ඩලය පසුගිය වර්ෂයේ සාධන මට්ටම පිළිබඳව සෑහීමකට පත්වන අතර දැනට ශ්‍රී ලංකාවේ නිවාස වලින් 91% කට මේවන විටත් විදුලිය ලබාදී ඇති බවත් පවසා සිටී. නිවාස වලින් බොහොමයක් ජාතික පද්ධතියට සම්බන්ධකොට ඇති අතර E Power ක්‍රමයද ප්‍රධාන පද්ධතියට සහායක් වශයෙන් හඳුන්වා දී තිබේ. මෙය ග්‍රාමීය ප්‍රදේශයන් සඳහා වූ බලශක්ති පද්ධතියට සෘජු සහායක් වනු ඇත.

මෙරට ජනතාවගේ ජීවිත ආලෝකමත් කිරීමේ ප්‍රධාන අරමුණට අමතරව ජාතික විදුලි පද්ධතියට විකල්ප මාර්ග වන පුනර්ජනනීය බල ශක්ති මගින් විදුලිය එකතු කිරීම ද ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුණ වේ. රට සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින මෙම අවස්ථාවේදී විදුලි බලය සඳහා වූ ඉල්ලුම ඉහළ යමින් පවතී. ලංකාව තුළ නොයෙකුත් ව්‍යාප්ති කිරීම් ව්‍යාපෘතීන් මගින් නිවාස සහ කර්මාන්ත අංශයට විදුලිය ලබා දීමේ වගකීම සම්බන්ධයේද ලං.වි.ම. කැපවී සිටී.

විදුලිය සංරක්ෂණය කිරීමේ ක්‍රියාදාමය සඳහා නිවාස සහ කර්මාන්ත අංශයේ පාරිභෝගිකයන්ගේ අගනා සහයෝගය අපි ඉමහත්සේ බලාපොරොත්තු වෙමු. සෑම පුද්ගලයෙකුම ඔහුගේ නිවසේ සහ සේවා ස්ථානයේදී ලබාදෙන ස්වල්ප සහයෝග වුවද විදුලිය ඉතිරි කිරීමේ සහ කාර්යක්ෂම භාවිතය සඳහා අතිශයින් දායක වන්නේය.

අපගේ ඉදිරි දැක්ම

සසිරිමත් දිවියකට විදුලිය

අපගේ මෙහෙවර

අපගේ සාරධර්මවලට අනුගත වෙමින් සමස්ත ශ්‍රී ලංකාවටම කාර්යක්ෂම, සමායෝජිත එකලස් හා සකසුරුවම් විදුලිය සැපයුමක් සංවර්ධනය කරමින් පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම.

“කිලිනොච්චිය හරහා වවුනියාව සිට චුන්නාකම් දක්වා කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ගය යාපනය අර්ධද්වීපය සමග නැවත සම්බන්ධකිරීමේ කාර්යය සිදු කරමින් පවතී.”

අපගේ සාරධර්ම

- ගුණාත්මක භාවය
- ජාතියට සේවා සැලසීම
- කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය
- කැපවීම
- සුරක්ෂිතබව
- වෘත්තීමයභාවය
- තිරසාර බව

2010 ජූලි මාසයේදී විදුලිබල හා බලශක්ති අමාත්‍යංශය විසින් එම අමාත්‍යංශය සඳහා කරුණු 15 කින් සමන්විත වූ න්‍යාය පත්‍රයක් ප්‍රකාශයට පත් කරනු ලැබීය. ලං.වි.ම. මෙහෙවර සාක්ෂාත් කර ගැනීමද අරමුණු කරගත් මෙම න්‍යාය පත්‍රයට අදාළ වන වැඩ සටහන් පහත විස්තර කර තිබේ.

1 නංවමු ලංකා

විදුලිබල හා බලශක්ති අමාත්‍යංශයේ මෙම ආරම්භය යටතේ ඉදිරි වසර 05 තුළ ලංකා විදුලිබල මණ්ඩලය මූල්‍යමය වශයෙන් හා තාක්ෂණික වශයෙන් ස්ථාවර වූ ඒකකයක් ලෙස ප්‍රතිසංස්කරණය කරනු ලැබේ. එමගින් නව ආදායම් මාර්ග ඇති කිරීම, වියදම් අවම කිරීම, කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, දූෂණය පිටු දැකීම, මෙහෙයුම් පිරිවැය දැරීම හා ණය අඩු කිරීමට සැලසුම් කර ඇත. ජාතික ආර්ථිකයට පීඩාදායක වැයක් නොවීමටත්, හැකියාවෙන් යුත් මණ්ඩලයක් බවට පත් වෙමින් තම කාර්යසාධනය පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීමටත් එමගින් මහජනතාවගේ ගෞරවයට ලක්වීමත් ලංකා විදුලිබල මණ්ඩලයේ අභිප්‍රාය වේ.

2 විදුලමු ලංකා

මෙම වැඩසටහනේ අරමුණ වන්නේ 2012 වසර වන විට සෑම ශ්‍රී ලාංකිකයෙකුටම විදුලිබලය ලබා ගැනීමට ප්‍රවේශයක් සැලසීම තහවුරු කිරීමයි. ශ්‍රී ලංකාවේ සෑම ගෘහ ඒකකයකටම විදුලිබලය සැපයීමට හැකිවන පරිදි ජාතික විදුලිබල පද්ධතියට ප්‍රවේශ වීමට හෝ විද්‍යුත් ශක්තිය ජනනය කිරීමේ විකල්ප මාර්ග සොයා ගැනීමට හැකිවන පරිදි දුෂ්කර ප්‍රදේශවල යටිතල පහසුකම් හා වෙනත් පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන මගින් කටයුතු කෙරෙනු ඇත. දැනට තම නිවෙස්වලට විදුලිබලය ලබාගෙන නැති ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 12%ක ඵලදායිතාව ඉහළ නැංවීමට හා විශාලත්වයෙන් ජීවන තත්ත්වය ඉහළ දැමීමට මෙමගින් හැකියාව ලැබෙනු ඇත. මෙම වැඩසටහන යටතේ 2012 වසර අවසන් වීමට පෙර ශ්‍රී ලංකාවේ ගම්මාන බහුතරයකටම ජාතික විදුලිබල පද්ධතියෙන් විදුලිය ලැබෙනු ඇත. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා ඉදිරි දෙවසරක කාලය තුළ ග්‍රාමීය විදුලිබල සැපයුම් ව්‍යාපෘති 4593 සැලසුම් කරනු ලබන අතර ඒවා සම්පූර්ණ කිරීමද සිදුවෙනු ඇත. ඉන්පසු ඉතිරි වන ගම්මාන වේ නම්, ග්‍රාම ශක්ති, වැඩ සටහන යටතේ ජාතික විදුලිබල පද්ධතියට පරිබාහිරව විදුලිබලය සපයනු ඇත.

3 විදුලි අත්වැල

මෙම වැඩසටහන යටතේ, ජාතික විදුලිබල පද්ධතියෙන් සම්බන්ධතා ලබා ගැනීමට ක්ෂුද්‍ර ණය සැපයීම් තුළින් අඩු ආදායම්ලාභී නිවාස ඒකකවලට සහාය දැක්වීමට ලං.වි.ම. මගින් පියවර ගනු ඇත. විදුලිබලය අවශ්‍ය, එහෙත් එහි ඉහළ සම්බන්ධතා පිරිවැය දැරිය නොහැකි පුද්ගලයන්ට අරමුදල් එමගින් විදුලිබල සම්බන්ධතා ලබා දී විදුලිබලයේ වාසි භුක්ති විඳීමට සැලැස්වීම සඳහා සහනදායී ක්ෂුද්‍ර මූල්‍යාධාර යෝජනා ක්‍රමයක් විධිමත්ව සකසා තිබේ.

ලං.වි.ම. මගින් ණය යෝජනා ක්‍රමයක් මේ වන විට හඳුන්වා දී තිබේ. විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී කණ්ඩායම් හා සමෘද්ධි ආධාර ලබන්නන් වෙනුවෙන් යොමු වී ඇත. සම්බන්ධතා පිරිවැය දැරීම සඳහා ලං.වි.ම. මගින් රු.30,000 දක්වා ණය පහසුකම් ලබාදෙන අතර එය මාසික විදුලි බිල්පතෙන් ණය වාරික 60 කින් නැවත අයකර ගනු ලැබේ.

4 ග්‍රාම ශක්ති

ජාතික විදුලිබල පද්ධතිය පුළුල් ප්‍රායෝගික වශයෙන් කළ නොහැකි ග්‍රාමීය හා අනෙක් ස්ථානවල ප්‍රතිභාවිත බලශක්ති තාක්ෂණික ක්‍රම පිහිටුවනු ඇත. 2012 වසර වන විට විදුලි බලයෙන් වාසි ලබා ගැනීමට ප්‍රතිභාවිත බලශක්තිය උත්පාදනය කිරීමේ විකල්පය ජාතික විදුලිබල පද්ධතියට පරිබාහිරව විදුලිය ලබා ගන්නා ගෘහ ඒකකවලට ලබාදෙනු ඇත.

මෙම වැඩ සටහන තිරසාර බලශක්ති අධිකාරියේ මූලික විෂය පථය යටතට ගැනෙන අතර ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් අංශ මෙම වැඩසටහන සඳහා අවශ්‍ය තොරතුරු තිරසාර බලශක්ති අධිකාරිය වෙත ලබාදෙනු ඇත.

5 විදුලි සැරය

සියලුම විමසීම්, සහය සේවා, පාරිභෝගික සහය හා බිඳ වැටීම් පිළිබඳ වාර්තා කිරීම් ක්‍රියාශීලී හා පාරිභොගිකයන් කේන්ද්‍ර කොටගත් ජාතික පාරිභෝගික ඇමතුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කෙරේ. මෙය විශ්වසනීය හා කාර්යක්ෂම සේවාවක් පාරිභෝගිකයන්ට ලබා දීම සඳහා සකස් කර තිබේ. මෙම ඇමතුම් මධ්‍යස්ථානවල ශබ්දය පටිගත කිරීමේ පහසුකම් හා මහජනතාව සමඟ සම්බන්ධ නොවන වෙළඳ අංශයට පහසුකම් සපයා තිබේ. ඊට අමතරව ප්‍රාදේශීය බෙදාහැරීම් පාලන මධ්‍යස්ථාන, සේවා ඉටු කිරීම පිළිබඳ අධීක්ෂණ කටයුතු සිදු කිරීම, අමතර බිඳවැටීම් අලුත්වැඩියා කිරීමේ වෑන් රථ හා නව පාරිභෝගික සේවා මධ්‍යස්ථාන පිහිටවනු ලැබේ. විදුලි සැරය වැඩසටහනට නව වෙබ් අඩවියක්ද එක් කෙරේ.විදුලිබලය සැපයීමට අදාළ වන පැමිණිලි කිරීම සඳහා පාරිභෝගිකයන් සඳහා 1987 යන කෙටි කේතකයක් සහිත දුරකථන අංකයක්ද ලං.වි.ම. මගින් මේ වන විට ස්ථාපනය කර තිබේ. 2006 වසර දක්වා ක්‍රියාත්මකව පැවති ලං.වි.ම. ඇමතුම් මධ්‍යස්ථානය මෙම අංකයට මේ වන විට සම්බන්ධ කර ඇති අතර පාරිභෝගික පැමිණිලි මෙම ඇමතුම් මධ්‍යස්ථානය හරහා ශ්‍රී ලංකාවේ සියලුම පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සම්බන්ධ කිරීම මගින් පාරිභෝගික පැමිණිලි වඩාත් කාර්යක්ෂමව හසුරුවනු ලැබේ.

6 ජනබලය

පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා සියලුම පාරිභෝගික ප්‍රභේද ආවරණය කිරීමට 2012 වන විට පාරිභෝගික සේවා සමාජ ජාලයක් ස්ථාපනය කරනු ඇත. අප හා පාරිභෝගිකයන් අතර වැදගත් යාකරණයක් සැපයීමේ අරමුණින් එක් එක් පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සඳහා කොට්ඨාශවල බොහෝ පාරිභෝගික සේවා සමාජ ප්‍රතිස්ථාපනය කර තිබුණි.

7 ජනහිත

මෙම වැඩසටහන යටතේ සාධාරණ, දරාගත හැකි හා සංරක්ෂණ හිතකාමී පාරිභෝගික ගාස්තු ලේඛනයක් ලබා ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය මගින් පියවර ගනු ඇත. එමෙන්ම, විවිධ පාරිභෝගික ප්‍රභේදවල ගාස්තු ලේඛන ව්‍යුහයන්ට අදාළව උපදෙස් ලබා ගැනීමෙහි මහජන උපයෝගිතා කොමිසම නිරත විය. (එවැනි අය ක්‍රම නිර්ණය කිරීම පිළිබඳ විෂය පථයට අයත්) රජයෙන් උපදෙස් ලබා ගනිමින් ඉහත දක්වා ඇති පරිදි කොමිෂන් සභාව මගින් අයක්‍රම සංශෝධන පිළිබඳව ක්‍රියා කළ යුතු අන්දම පිළිබඳ උපදෙස් හා යෝජනා සකස් කර තිබුණි.

2010 ජූලි මාසයේදී, 2011 - 2015 දක්වා කාල පරිච්ඡේදය සඳහා අය ක්‍රම නිර්ණය කිරීම සඳහා ලං.වි.ම. ස්වකීය ආදායම් අවශ්‍යතා පිළිබඳව කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කර ඇත. ජාතික විදුලිබල අය ක්‍රමය ඒකාකාරී ලෙස පවත්වාගෙන යෑමේ ප්‍රතිපත්තිය හේතුවෙන් බලපත්‍රලාභියාගේ ආදායම් අවශ්‍යතා හා නීතියේ විශේෂයෙන් දක්වා ඇති පරිදි පිරිවැය පිළිබිඹු කරන ක්‍රමවේදය මත පදනම්ව අය ක්‍රමය නිර්ණය කිරීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

8 මානව ජවය

අපගේ සේවාවන් ඉහළ නැංවීමට හා සේවාවල ගුණාත්වය සඳහා ශ්‍රම බලකායේ ප්‍රයන්තය ප්‍රධාන අවශ්‍යතාවයකි. පාරිභෝගිකයාට සපයනු ලබන සේවා මට්ටමේ කැපී පෙනෙන වෙනසක් ඇති කර ගැනීම තහවුරු කර ගැනීමට කැප වූ, කාර්යක්ෂමව හා දූෂිත නොවූ ශ්‍රම බලකායක් ඇති කර ගැනීමට ලං.වි.ම. කටයුතු කරයි.

9 සම්පත් සේවා

ලං.වි.ම. සම්පත් පිළිබඳව සැලකිලිමත් වීමට 2010 දී සැප්තැම්බර් මාසයේ නව ඒකකයක් ස්ථාපිත කර තිබේ. එමගින් මෙම වත්කම්වලින් උපරිම යහපත ලබාගත හැකි වන පරිදි එය ස්ථාපනය කර තිබේ. මෙම ඒකකය මගින් මහජනතාවට හා ව්‍යාපාරවලට අනෙකුත් සේවා සැපයීම මගින් ලං.වි.ම. අමතර ආදායම් උත්පාදනය කරමින් මෙම වත්කම් ඒවායේ උපරිම ප්‍රමාණයෙන් භාවිත කරනු ඇත.

10 ලංකා ජනනී

රජයට අයත් පාලික සමාගම් ස්ථාපනය කිරීම මගින් සම්ප්‍රේෂණ ජාලය සංවර්ධන කිරීමට හා පුළුල් කිරීමට දේශීය ඉංජිනේරු කුසලතා භාවිතා කිරීමටද, සුළං බලය, ජීව වායු බලශක්තිය, සූර්ය බල ශක්තිය, ඩෙන්ඩ්‍රෝ හා ජාල තරංග බලශක්තිය ආදී ප්‍රතිභාවිත බලශක්ති ප්‍රභව දියුණු කිරීමටද දේශීය ඉංජිනේරු දක්ෂතා භාවිත කිරීමට ලං.වි.ම. අපේක්ෂා කරයි. අනාගතයේදී තිරසාර සංවර්ධනයක් සඳහා පිරිවැය ඉතිරි කර ගැනීම සඳහා නව්‍ය අදහස් අනාවරණය කර ගැනීමට හා ක්‍රියාත්මක කිරීමටද විකල්ප බලශක්ති උත්පාදන භාවිත කිරීම සඳහා නව අවස්ථාවන් පිළිබඳ සොයා බැලීමට හා රාජ්‍ය සහය සුරක්ෂිත කර ගැනීමට දේශීය ඉංජිනේරුවන්ට මෙමගින් හැකිවෙනු ඇත.
ලං.වි.ම. අයත් වන සමාගමක් ස්ථාපනය කිරීම මගින් ප්‍රතිභාවිත බලශක්ති ප්‍රභව සංවර්ධනය කිරීමට හා සම්ප්‍රේෂණ පද්ධති වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලාංකික ඉංජිනේරුවන්ගේ කුසලතා භාවිත කිරීමට මූලික පියවර ගෙන ඇත.

11 සුපිරි විදුලි ජාල

සුළං, සූර්ය, ඩෙන්ඩ්‍රෝ හා ජීව වායු තාක්ෂණික ක්‍රම භාවිතයෙන් පෞද්ගලික රාජ්‍ය අංශයේ ආයතනවලට ඔවුන්ගේම බලශක්තිය නිපදවා ගැනීමට හා නිපදවූ අතිරේක බලශක්තිය නැවතත් විදුලිබල පද්ධතියට විකිණීමට ඔවුන්ව දිරිමත් කරන "Net metering" යන සංකල්පය ලං.වි.ම. මගින් හඳුන්වා දෙනු ලැබේ. ,කලින් ගෙවූ මනු, හඳුන්වා දීම මගින් පාරිභෝගිකයන්ට ඔවුන්ගේ බලශක්ති බිල්පත් පාලනය කිරීමට සහය වේ. ස්වයංක්‍රීය මනු කියවීම, භාවිත කළ හැකි කාලය සඳහා අය ක්‍රම, පාරිභෝගිකයන් සමඟ සන්නිවේදනය කිරීම, පාරිභෝගිකයන්ගේ භාරය පාලනය ද වැනි විදුලිබල පද්ධතියට අදාල වෙනත් කැපී පෙනෙන සංකල්පද ක්‍රමයෙන් හඳුන්වා දෙනු ලැබේ.

ලං.වි.ම. පාරිසරික ප්‍රතිපත්තිය

බලශක්තිය නිදහසේ ගලා යයි

ලංකා විදුලිබල මණ්ඩලය එහි සියලූ වානිජ ක්‍රියාකාරකම් ඉටුකරන්නේ ස්වාභාවික සහ මිනිසා විසින් සාදන ලද පරිසරය ආරක්ෂා කරමින් එහි සංවර්ධනයට ස්ථිරසාර සහභාගීත්වයක් ලබා දෙමිනි. පාරිසරික ප්‍රශ්නයක් සම්බන්ධයෙන් විවෘතව කටයුතු කිරීම මගින් මහජනතාව, පාරිභෝගික, අධිකාරීන්, සේවකයන් සහ රජය තුල අපගේ ක්‍රියාකාරකම් සම්බන්ධ විශ්වාසයක් ඇතිකිරීමට අපි බලාපොරොත්තු වෙමු. අපගේ ක්‍රියාකාරකම් සඳහා පාරිසරික වැදගත්කමින් යුත් දේවල් අන්තර්ගත කරගැනීම සඳහා වූ ප්‍රතිපත්තියකට අපි ක්‍රියාශීලී ලෙස උත්සහ දරන්නෙමු.

2011 වසරේ උද්දීපනයන්

ශ්‍රී ලංකාවේ විදුලිය ජනනයේ නව යුගයක් සනිටුහන් කරමින් පුත්තලම ලක්විජය ගල් අඟුරු විදුලි බලාගාරය 2011 වර්ෂයේදී ජනනය ආරම්භ කරන ලද අතර 2011 පෙබරවාරි 13 වැනි දින එම බලාගාරය ප්‍රථම වතාවට ජාතික විදුලි පද්ධතියට සම්බන්ධ කරන අයුරු ඉහත දැක්වේ.

බලශක්ති සංචිතය

2010 වර්ෂය සමග සසඳන විට, 2011 වර්ෂය වියලි කාලගුණ සහිත වර්ෂයක් වූ හෙයින් 2011 දෙසැම්බර් 30 වන විට මුළු බලශක්ති සංචිතය ගි.වො.පැ. (GWh) 658 ක අඩු අගයක් ගත්තේය.

දල විදුලි ජනනය

- 2011 වර්ෂයේදී දල විදුලි ජනනය 7.6% කින් වැඩි විය. එනම් 2010 වර්ෂයේ ගි.වො.පැ. (GWh) 10,714 වශයෙන් තිබූ ජනනය 2011 වර්ෂයේදී ගි.වො.පැ. (GWh) 11,528 ලෙස වර්ධනය විය. පුත්තලම ගල් අඟුරු බලාගාරයේ නිෂ්පාදන කටයුතු 2011 පෙබරවාරි මාසයේදී ආරම්භ විය. පුත්තලම ගල් අඟුරු ව්‍යාපෘති අදියර 1 යටතේ මෙ.වො. 300 ධාරිතාවයෙන් යුත් එහි වානිජමය කටයුතු 2011 ජුලි මාසයේදී පටන්ගන්නා ලදී. 2011 වසරේදී ගි.වො.පැ. (GWh) 1038 ක් ලක්විජය තාප විදුලි බලාගාරයෙන් ජනනය කරන ලදී.

1038 ගි.වෝ. පැය

ලක්විජය ගල්අඟුරු විදුලි බලාගාරයෙන් ජනනය කරන ලදී.

2011 වසරේ උද්දීපනයන්



විදුලි ජනනය



ලං.වි.ම. ජල හා තාප ජනනය

පෞද්ගලික හිමිකරුවන් විසින් ජනනය කරන ලද විදුලිය

- 2008 වර්ෂයේ සිට සෑම වර්ෂයක් පාසාම දළ බල ශක්ති ජනනයෙන් 40% කටත් වැඩි විදුලිය ප්‍රමාණයක් (කුඩා ජල සහ තාප) පෞද්ගලික ස්වාධීන නිෂ්පාදකයින් විසින් ජනනය කරනු ලැබීම සැලකිල්ලට ගත යුතු වන්නේය. 2011 වර්ෂයේදී ජලාශවලට සැලකියයුතු ප්‍රමාණයක් ජලය අඩුවෙන් ලැබූ අතර ලංකා විදුලිබල මණ්ඩලයේ දළ නිෂ්පාදනය 57% විය.

ලංකා විදුලිබල මණ්ඩලයේ ජලාශවලට අඩු වශයෙන් ජලය ලැබීම හේතු කොට ගෙන ලං.වි.ම. තාප විදුලි බලාගාර සියල්ලන්ගෙන් සහ ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින් විසින් 2011 වර්ෂයේදී තාප විදුලිය ජනනය සමස්ත දළ ජනනයෙන් 59% කි.

උපරිම ඉල්ලුම

- 10.7% ක වැඩිවීමත් සමග 2011 වර්ෂයේදී උපරිම ඉල්ලුම මෙ.වො. (MW) 208.4 ක් විය. 2010 වර්ෂයේදී උපරිම ඉල්ලුම මෙ.වො. (MW) 1954.7 විය. 2011 වර්ෂයේදී එය මෙ.වො. (MW) 2163.1 ක් ලෙස සටහන් විය.



විදුලි ජනනයේ හිමිකාරිත්වය



උපරිම ඉල්ලුම

2011 වර්ෂයේදී දළ නිෂ්පාදනයෙන් 41% ප්‍රමාණයක් සඳහා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය විදුලි බලාගාර ඇතුළු ජල විදුලි බලාගාරයන් විසින් දායකත්වයක් ලබාදෙනු ලැබීය. ජල, තාප යනාදී වශයෙන් ජනනය කරන ලද බලශක්ති ප්‍රමාණයන් පහත දක්වනු ලැබේ.

නිවාසවලට විදුලි සැපයුම

- 2011 වර්ෂයේ අවසානය වන විට මෙරට සමස්ත නිවාස සංඛ්‍යාවෙන් 91% කට විදුලිය ලබාදී තිබේ.

පාරිභෝගික / සේවක අනුපාතය

- පාරිභෝගික / සේවක අනුපාතය 292 සිට 291 දක්වා අඩු විය. පෙර වර්ෂය සමග සසඳන විට මෙය 0.1% ක අඩු වීමකි. 2011 වර්ෂ අවසානයේදී සමස්ත සේවක සංඛ්‍යාව 16,192 වේ. වර්ෂ අවසානයේ පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව 4,717,448 වේ.

2011 වසරේ උද්දීපනයන්

අලෙවිය

- දළ විදුලි අලෙවිය 2011 වර්ෂයේදී 8.1% කින් වැඩි විය. 2010 වර්ෂයේදී දළ අලෙවිය ගි.වො.පැ. (GWh) 9,268 වශයෙන් තිබුනි. 2011 වර්ෂයේදී එය ගි.වො.පැ. (GWh) 10,023 ලෙස වැඩි විය. දිනක සාමාන්‍ය විදුලි පරිභෝජනය 2010 වර්ෂයේදී ගි.වො.පැ. (GWh) 25 ක් ලෙස පැවති අතර එය මෙම වර්ෂයේදී ගි.වො.පැ. (GWh) 27 ක් විය.



විදුලි විකුණුම්

ආදායම්

- 2011 වර්ෂයේ ජනවාරි 01 වැනි දින හඳුන්වා දෙනු ලැබූ නව අයකිරීම් ක්‍රමය යටතේ දළ අලෙවිය 9.6% කින් එනම් 2010 වර්ෂයේ රු. මිලියන 120,780 ක් වූ එම ප්‍රමාණය 2011 වර්ෂයේදී රු. මිලියන 132,373 ක් ලෙස වර්ධනය විය.2011 වර්ෂයේදී ඉන්ධන ගැලපුම් ගාස්තු ක්‍රියාත්මක නොවීය.



විදුලි විකුණුම් අදායම

- ආගමික සිද්ධස්ථාන ඇතුළු ගෘහස්ථ පාරිභෝගිකයින් විසින් උපරිම පරිභෝජනය ලෙස 34.2% ක අගයක් ලබාගනු ලැබූ අතර සමාලෝචන වර්ෂයේ ඊළඟ ස්ථානය කර්මාන්ත අංශයට හිමි විය. එහි පාරිභෝජනය 31.2% ක් වේ.



අයක්‍රම අනුව විකුණුම් - 2011

පොදු කටයුතු සඳහා වූ පරිභෝජනය දළ අලෙවියෙන් 19.2% ක් විය. මෙය 9.8% ක වාර්ෂික වැඩිවීමකි.

උපරිම ආදායම් පොදුකාර්ය පාරිභොගිකයින්ගෙන්ද දෙවනුව කර්මාන්ත ක්ෂේත්‍රයේ පාරිභෝගිකයන්ගෙන්ද ලැබුනි.



අයක්‍රම අනුව ආදායම - 2011

2011 වර්ෂයේදී දළ ආදායමෙන් 25.3% ක් සඳහා ආගමික සිද්ධස්ථාන සහ ගෘහස්ත ක්ෂේත්‍රයෙන් දායකත්වය ලැබුනි.

2011 වසරේ උද්දීපනයන්

"කාසල්රී ජලාශය 2011"

- සමාලෝචිත වර්ෂයේදී ඒක පුද්ගල විදුලි පරිභෝජනය කි.වො.පැ. (KWh) 449 යේ සිට කි.වො.පැ. (KWh) 480 වශයෙන් ඒකක 31 කින් වර්ධනය විය.



මූලික විදුලි පරිභෝජනය

පාරිභෝගිකයින්

2011 වර්ෂ අවසානයේදී පාරිභෝගික සංඛ්‍යාව 4,717,448 ක් විය. 2010 වර්ෂය සමග සසඳා බලන විට මෙය 5.3% ක වර්ධනයකි. ලං.වි.ම. පාරිභෝගිකයින්ගෙන් 88.3% ක් ගෘහස්ත පාරිභෝගිකයින් වේ. එහි විස්තර පහත දක්වා තිබේ.

පාරිභෝගික වර්ගය	පාරිභෝගික සංඛ්‍යාව	ප්‍රතිශතය
ගෘහස්ත	4,165,738	88.3%
ආගමික	28,320	0.6%
පොදුකාර්ය	475,380	10.1%
කර්මාන්ත	47,529	1.0%
හෝටල්	479	0.01%
ලෙකෝ	1	
විදි ලාම්පු	1	
එකතුව	4,717,448	100.0

2011 වසරේ උද්දීපනයන්

- 2011 වර්ෂයේදී ලං.වි.ම. විසින් නව විදුලි සම්බන්ධතා 237,025 ක් ලබාදෙනු ලැබීය. මෙය සාමාන්‍ය වශයෙන් මසකට පාරිභොගිකයින් 19,752 ක් ලෙස දැක්විය හැක.



ලං.වි.ම. නව පාරිභෝගිකයින්

- 2008 සිට 2010 දක්වා වූ කාලයන්හි විදුලි ඒකකයක සාමාන්‍ය විකුණුම් මිළ ශත 14 කින් අඩුවී තිබුනි. 2011 වර්ෂයේදී නව අයකිරීම් ක්‍රමය ක්‍රියාත්මක වූ නිසා එය ශත 17 කින් වැඩි විය.



සාමාන්‍ය විකුණුම් මිල

- පසුගිය වර්ෂවල පාරිභෝගික ගිණුම් සංඛ්‍යාවෙහි සෘජු වර්ධන තත්වයක් දක්නට තිබේ.



පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව

පද්ධති බලශක්ති හානිය

- 2000 වර්ෂයේ සිට පද්ධති වලින් ඇතිවන බලශක්ති හානිය පියවරෙන් පියවරට අඩුකර ගන්නා ලදී. 2011 වර්ෂයේදී පද්ධති වලින් වූ බලශක්ති හානිය 11.2% වේ.



පද්ධති බලශක්ති හානි

ආයතනික තොරතුරු

නෛතික ව්‍යුහය

1969 අංක 17 පාර්ලිමේන්තු පනත යටතේ හා අංක 1969 අංක 31,
1979 අංක 29, 1988 අංක 32 හා 2009 අංක 20 දරණ පනත්වලින්
සංශෝධනය කළ පරිදි ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරන ලද සංස්ථාපිත මණ්ඩලයකි.

2011 වසර සඳහා මණ්ඩලයේ සාමාජිකයෝ

විද්‍යා අමරපාල මහතා (සභාපති) - 2011.06.06. දින ඉල්ලා අස්විය.

පී.එල්.ඩී. ප්‍රේමරත්න මහතා (උප සභාපති) - 2011.06.06. දින ඉල්ලා අස්විය.
පී.ආර්. ගුණවර්ධන මහතා (සාමාජික) - 2011.06.06. දින ඉල්ලා අස්විය.

අමිල පී. ජයසිංහ මහතා (සාමාජික ලං.වි.ම.) - 2011.06.06. දින ඉල්ලා අස්විය.

මහාචාර්ය විමලධර්ම අබේවික්‍රම මහතා (සභාපති) - 2011.06.06. දින සිට

ඩබ්.ඩී. අනුර සේනක විජයපාල මහතා (උප සභාපති) - 2011.06.06. දින සිට

පී.පී. ගුණරත්න මහතා (සාමාජික) - 2011.06.06. දින සිට
ආචාර්ය බී.එම්.එස්. බටගොඩ මහතා (සාමාජික)
දොස්තර වයි.ඩී. නිහාල් ජයතිලක මහතා (සාමාජික)
කේ.ඩී. රණසිංහ මහතා (සාමාජික) 2011.07.25 දින සිට
ඩබ්.ඩී. ජයසිංහ මහතා (සාමාජික)

මණ්ඩලයේ ලේකම්

මිහිරි සේනාරත්න මහත්මිය

සාමාන්‍යාධිකාරී

බී. ජයවීර මහත්මිය	(2011.06.09 දින විශ්‍රාම ගන්නා ලදි.)
බී.එන්.අයි.එෆ්.ඒ. වික්‍රමසූරිය මහතා	(2011.06.09 දින සිට)

ආයතනික තොරතුරු

ආයතන කලමනාකරණය

අතිරේක සාමාන්‍යාධිකාරී	(ජනන)
කේ.එස්.පී. ජයවර්ධන මහතා	(2011.01.24 දින විශ්‍රාම ගන්නා ලදි.)
එම්.සී. වික්‍රමසේකර මහතා	(2011.01.24 දින සිට)
අතිරේක සාමාන්‍යාධිකාරී	(සම්ප්‍රේෂණ)
අර්.එම්.ආර්.ලොකුබාලසූරිය මහතා	
අතිරේක සාමාන්‍යාධිකාරී	(බෙදාහැරීමේ අංශය 1)
ඊ.ජී. අබේසේකර මහතා	
අතිරේක සාමාන්‍යාධිකාරී	(බෙදාහැරීමේ අංශය 2)
ආර්.ජේ. ගුණවර්ධන මහතා	
අතිරේක සාමාන්‍යාධිකාරී	(බෙදාහැරීමේ අංශය 3)
එෆ්.කේ. මොහිදීන් මහතා	
අතිරේක සාමාන්‍යාධිකාරී	(බෙදාහැරීමේ අංශය 4)
ඩී.ජී.සී. රත්නපාල මහතා	
අතිරේක සාමාන්‍යාධිකාරී	(වත්කම් කලමණාකරණ හා මධ්‍යගත සේවා)
එම්.ජී. ලියනගේ මහතා	
අතිරේක සාමාන්‍යාධිකාරී	(ආයතනික ක්‍රමෝපාය)
බී.එන්.අයි.එෆ්.ඒ. වික්‍රමසූරිය මහතා	(2011.06.09 දින තෙක්)
ඩී.කේ.බී.එස්. තිලකසේන මහතා	(2011.06.09 දින සිට)
අතිරේක සාමාන්‍යාධිකාරී	(ව්‍යාපෘති)
ඩබ්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මහතා	
මූල්‍ය කළමණාකරු	
ඩබ්.ඩී.ඒ.එස්. පෙරේරා මහතා	(2011.11.10 දින විශ්‍රාම ලැබුවේය.)
එන්.ආර්. මහමුද් මෙනෙවිය	(2011.11.10 සිට)

ප්‍රධාන කාර්යාලය
අංක:50,
සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.
දුරකථනය (011)2324471 (මාර්ග 8)
ෆැක්ස් (011) 2449572
වෙබ් අඩවිය:www.ceb.lk

විගණකයන්
විගනකාධිපති
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

බැංකුකරුවන්
මහජන බැංකුව,
අංක:75
සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

ලංකා විදුලිබල මණ්ඩලයේ
සංවිධාන ව්‍යුහය - 2011

අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය)

නි.සා. (ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බලශක්ති විකුණුම්)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික කටයුතු)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තාපබල සංකීර්ණය)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මහවැලි සංකීර්ණය)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ලක්ෂපාන සංකීර්ණය)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යාන්ත්‍රික)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාඩ (ජනන ව්‍යාපෘති)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වෙනත් ජලවිදුලි)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විද්‍යුත් නඩත්තු)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිසර, සිවිල් නඩත්තු හා වේලි ආරක්ෂණ)
අතිරේක මූල්‍ය කලමනාකරු (ජනන)

අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බලශක්ති මිලදී ගැනුම්)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ හා ජනන සැලසුම්කරන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ සැලසුම් හා පරිසර)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික හා නියාමන සබඳතා)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වත්කම් කලමනාකරණ)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ ව්‍යාපෘති)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පද්ධති පාලන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සන්නිවේදන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බලශක්ති අලෙවිකරණ)
අතිරේක මූල්‍ය කලමනාකරු (සම්ප්‍රේෂණ)

අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 01)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගරය)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වයඹ පළාත)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උතුරු මැද පළාත)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උතුරු පළාත)
අතිරේක මූල්‍ය කලමනාකරු (බෙදාහැරීම් කලාප 01)

අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 02)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම පළාත)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත උතුර)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර පළාත)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම වෝල්තතා ඉදිකිරීම හා නඩත්තු)
අතිරේක මූල්‍ය කලමනාකරු (බෙදාහැරීම් කලාප 02)

අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 03)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත දකුණ 11)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සබරගමුව පළාත)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව පළාත)
අතිරේක මූල්‍ය කලමනාකරු (බෙදාහැරීම් කලාප 03)

අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 04)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත දකුණ 1)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණු පළාත)
අතිරේක මූල්‍ය කලමනාකරු (බෙදාහැරීම් කලාප 04)

අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කලමනාකරණ හා මධ්‍යගත සේවා)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වත්කම් කලමනාකරණ හා ආයතනික)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සිවිල් වැඩ හා ගොඩනැගිලි)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩපොළ හා උපකාරක සේවා)
ආරක්ෂක කලමනාකරු
නියෝජ්‍ය මූල්‍ය කලමනාකරු

අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)

ජ්‍යේෂ්ඨ ව්‍යාපෘති අධ්‍යක්ෂ (පුත්තලම ගල් අඟුරු බලශක්ති ව්‍යාපෘතිය)
ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉහළ කොත්මලේ විදුලිබල ව්‍යාපෘතිය)
ව්‍යාපෘති අධ්‍යක්ෂ (කොළඹ නගර විදුලිබල DD ව්‍යාපෘතිය)
ව්‍යාපෘති අධ්‍යක්ෂ (ත්‍රිකුණාමල ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය)
ව්‍යාපෘති අධ්‍යක්ෂ (බ්‍රෝඩ්ලැන්ඩ්ස් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය)
ව්‍යාපෘති අධ්‍යක්ෂ (උමා ඔය ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ ව්‍යාපෘති)
අතිරේක මූල්‍ය කලමනාකරු (ව්‍යාපෘති)

මූල්‍ය කලමනාකරු

අතිරේක මූල්‍ය කලමනාකරු (ප්‍රධාන කාර්යාලය)
අතිරේක මූල්‍ය කලමනාකරු (ආයතනික)
ලේකම් - විශ්‍රාම වැටුප් අරමුදල
ලේකම් - අර්ථසාධක අරමුදල

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්)
කලමනාකරු - විමර්ශන

සමාලෝචනය

සභාපතිතුමාගේ සමාලෝචනය 20 - 21
සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය 22 - 26
ලංවිම සම්ප්‍රේෂණ ජාලය 27
මෙහෙයුම් සමාලෝචනය 29

සභාපතිතුමාගේ සමාලෝචනය

“ලං.වි.ම. මගින් ගන්නා ලද විප්ලවීය පියවරක් වන්නේ එකවර සියලු සේවා ලබාගත හැකි වෙළඳ සැළක් වන, විදුලි පුරවර, හඳුන්වා දීමයි. එමඟින් එකම වේලාවක් තුළ එකම ස්ථානයකින් පාරිභෝගිකයන්ට සේවා කිහිපයක් ලබා ගත හැකි වී තිබේ. රාජ්‍ය ආයතන අකාර්යක්ෂම බවට වන විශ්වාසයද වෙනස් වීමට මෙය හේතු වී ඇත. සේවා සම්බන්ධතා, සේවා විසන්ධි කිරීම් හා බිල්පත් ගෙවීම් ඇතුලු සේවා පොළක්, විදුලි පුරවර, සංකල්පය මගින් පාරිභෝගිකයාට සැපයේ.”

ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා ලංකා විදුලිබල මණ්ඩලයේ පාලන බලය හොබවන දෙවන අනුක්‍රමික වසර 2011 වසර වේ. මහින්ද චින්තන ඉදිරි දැක්ම, හා සමගාමීව ශ්‍රී ලංකාව කලාපයේ බලශක්ති මධ්‍යස්ථානය බවට පරිවර්ථනය කිරීමේ අරමුණු සමඟ 2010 වසරේදී ආරම්භ කරන ලද ක්‍රියාකාරි සැලැස්ම ඉතා ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම මගින් ලංකා විදුලිබල මණ්ඩලය ඉතා කාර්යක්ෂමව හා ඵලදායී සංවිධානයක් බවට පත් විය.

ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභොගිකයන්ට අවම වැය බරක් පැටවෙන පරිදි දිවයින පුරා අඛණ්ඩව පැය 24 ක් විදුලිබලය සැපයීමේ දුෂ්කර කාර්යය ලං.වි.ම. ට පැවරී තිබුණි. එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, විදුලමු ලංකා, නම් ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය ලබා දීමේ වැඩසටහන හඳුන්වා දී තිබූ අතර මෙම ඉතා වටිනා පාරිභෝගික භාණ්ඩය සඳහා මේ දක්වා ප්‍රවේශය ලැබී නොතිබුණු දුර බැහැර පිහිටි ගම්මාන බොහෝ සංඛ්‍යාවකට මෙමගින් විදුලිබලය ලබා දී තිබුණි. ග්‍රාමීය ජනතාවට තවදුරටත් සහන ලබා දීමේ අරමුණින් විදුලිබල සම්බන්ධතා ලබා ගැනීමට මූල්‍ය සහාය අවශ්‍ය පුද්ගලයින් සඳහා ණය ලබා දීමේ වැඩසටහනක් වන, විදුලි අත්වැල, නම් වැඩසටහන සමෘද්ධි බැංකුව හා එක්ව ලං.වි.ම. මගින් හඳුන්වා දෙනු ලැබීය. ලංවි.ම. ට නව පාරිභෝගිකයින් 35,000 ක් හඳුන්වා දෙමින් සිඩා ආයතනයේ ආධාර ලබමින් සිදු කරනු ලැබූ ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීමේ ව්‍යාපෘතිය - 4, 2011 වසර තුළදී සම්පූර්ණ කරනු ලැබීය. ඉරාන රජයෙන් අරමුදල් සැපයෙන ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීමේ ව්‍යාපෘතිය 8 මගින් වයඹ, මධ්‍යම, බස්නාහිර උතුර, නැගෙනහිර, බස්නාහිර දකුණ II, සබරගමුව, බස්නාහිර දකුණ I, උතුරුමැද, ඌව හා දකුණු පළාත් යන පළාත් 11 ක ගම්මාන 1000 කට විදුලිබලය සැපයීමට අරමුණු කරයි. ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය ලබා දීමේ 4 වන ව්‍යාපෘතියේ නව්‍ය සංරචකයන් ලෙස උතුරු මැද පළාතට 100% විදුලිබලය සැපයීම හඳුන්වා දෙනු ලැබීය. බුත්තලදී පැවැත්වූ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමගාමීව මොණරාගල දිස්ත්‍රික්කයේ පවුල්වලට විදුලිබලය සැපයීම සඳහා නව විදුලිබල ව්‍යාපෘති 121 ක් ආරම්භ කරනු ලැබීය.

මිහිතලය උනුසුම් වීමේ ප්‍රතිවිපාක ලොව වටා ක්‍රමිකව සිදු වෙමින් පවතින අතර ශ්‍රී ලංකාවට මෙම සංසිද්ධියෙන් බැහැර විය නොහැක. පසුගිය දශකවල ස්ථාපිතව පැවති කාලගුණ ආකාර වෙනස්වීම ආරම්භ වීඇති අතර බරපතල නියඟතත්ත්වයන්ට හා බොහෝ අවස්ථාවල අනපේක්ෂිත පරිදි වැසි ඇති වීම් අත්විඳීමට අපට සිදු වී තිබේ. මෙම සංදර්භය තුළ ලං.වි.ම. මගින් උත්පාදනය කරනු ලබන බලශක්තියෙන් 40% ක ප්‍රමාණයක් සඳහා ජලවිදුලිබලය මත යැපීමට සිදු වී තිබීම

සභාපතිතුමාගේ සමාලෝචනය

ලං.වි.ම. ට අභියෝගයක් වී ඇත. ජලය නොමැති අවස්ථාවල ලං.වි.ම. ට උත්පාදනය කිරීම සඳහා බල කෙරෙන තාපබල විදුලිය නිෂ්පාදනයේ අධික පිරිවැය සැලකිල්ලට ගෙන සුනිත්‍ය බලශක්ති උත්පාදනයට මාරුවීමේ වැදගත්කම ගරු අමාත්‍යතුමා විසින් අවධාරණය කර තිබේ. ලංකා විදුලිබල මණ්ඩලය සුනිත්‍ය බලශක්ති සංකල්පය පිළිගෙන එය එහි දිගු කාලීන උත්පාදන සැලසුමට ඇතුළත් කර තිබෙන්නේ දිවයිනේ මුළු විදුලිබල සැපයුමෙන් 20% ක් සුනිත්‍ය බලශක්ති ප්‍රභවවලින් ලබා ගැනීමටය. ජාතික විදුලිබල පද්ධතියට ඇතුළත් කළ නොහැකි දුෂ්කර ප්‍රදේශ සඳහා සූර්ය බලශක්තිය, ක්ෂුද්‍ර ජලවිදුලිබලය, සුළඟේ ශක්තිය, ජීව වායු ශක්තිය වැනි සුනිත්‍ය බලශක්ති විකල්ප හඳුනා ගැනීම සඳහා තිරසාර බලශක්ති අධිකාරිය සමඟ සහයෝගීතාවෙන් ,ග්‍රාම ශක්ති, වැඩ සටහන සිදු කරනු ලැබීය. ප්‍රධාන විදුලිබල පද්ධතියෙන් විදුලිබලය ලබා ගැනීමට අපොහොසත් වූ පවුල් 37,814 ක් 2011 වසර තුළදී හඳුනා ගන්නා ලදී. සූර්ය බල ශක්ති අංගෝපාංග කට්ටල 6 ක් තිරසාර බලශක්ති අධිකාරිය මගින් හඳුන්වා දී තිබේ. මෙම එක් එක් පවුල්වල බලශක්ති අවශ්‍යතා නිර්ණය කිරීමෙන් අනතුරුව මෙම අංගෝපාංග කට්ටල බෙදා දී තිබේ.

ලං.වි.ම. මගින් ගන්නා ලද විප්ලවීය පියවරක් වන්නේ එකවර සියලු සේවා ලබාගත හැකි වෙළඳ සැළක් වන, විදුලි පුරවර, හඳුන්වා දීමයි. එමඟින් එකම වේලාවක් තුළ එකම ස්ථානයකින් පාරිභෝගිකයන්ට සේවා කිහිපයක් ලබා ගත හැකි වී තිබේ. රාජ්‍ය ආයතන අකාර්යක්ෂම බවට වන විශ්වාසයද වෙනස් වීමට මෙය හේතු වී ඇත. සේවා සම්බන්ධතා, සේවා විසන්ධි කිරීම් හා බිල්පත් ගෙවීම් ඇතුලු සේවා පොළක්, විදුලි පුරවර, සංකල්පය මගින් පාරිභෝගිකයාට සැපයේ. කොළඹ නගරය තුළ තිබෙන ප්‍රාදේශීය කාර්යාල හතරටම මෙම විදුලි පුරවර පහසුකම් ලබා දී තිබේ. මෙම වසර තුළ කුරුණෑගල, කුලියාපිටිය, හලාවත, මින්නේරිය, අනුරාධපුරය, කැළණිය, හා මහනුවර වැනි නව විදුලි පුරවර මධ්‍යස්ථාන විවෘත කරනු ලැබීය. පාරිභෝගික අධ්‍යාපන වැඩසටහන්, බලශක්ති සංරක්ෂණය හා බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් සඳහා මෙම විදුලි පුරවර භාවිත කරනු ලැබේ.

සමාලෝචනයට භාජනය වන පසුගිය වසර එකක කාලය තුළ, පුත්තලමේ පිහිටි ශ්‍රී ලංකාවේ පළමු ගල් අඟුරු බලාගාරය ක්‍රියාත්මක කරවීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කරනු ලැබීය. පුත්තලමේ ගල් අඟුරුවලින් බලය ලබාදෙන බලාගාරයක් ගොඩනැගීමේ සංකල්පය වරක් අතහැර දැමුවද, 2006 වර්ෂයේදී අතිගරු ජනාධිපති, මහින්ද රාජපක්ෂ මහතා විසින් නැවතත් එම සංකල්පයට ජීවය ලබා දුන්නෝය. ඒ අනුව, දිගින් දිගටම වැඩිවන බලශක්ති ඉල්ලුම සැපයීමේ අරමුණින් මෙම කම්හල ගොඩනැගීම ආරම්භ විය. 2011 ජූලි මාසයේදී ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ වාණිජ මෙහෙයුම ක්‍රියාත්මක විය. එමඟින් ගිගා වොට් පැය 5 ක බලශක්තියක් උත්පාදනය වේ. ගරු අමාත්‍යතුමා විසින් මෙම බලාගාරය, ලක්විජය, බලාගාරය ලෙස නම් කරනු ලැබීය.

2011 වසර තුලදී, එකී කාලය තුළම සාමාන්‍ය තාප බලශක්ති උත්පාදනය පිරිවැය ඒකකයකට රු.20.33 ක් වෙද්දී කි.වො.පැය 1 කට රු.6.60 ක පිරිවැයකින් ගිගා වොට් පැය 1028 ක ප්‍රමාණයෙන් උත්පාදනය කිරීමට පුත්තලම ගල් අඟුරු බලාගාරය සමත් විය.

ත්‍රිකුණාමලය සාම්පූර්හි මෙගා වොට් 500 ක ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියක් සඳහා හවුල් ව්‍යාපාර ගිවිසුම ලං.වි.ම. හා ඉන්දියාවේ එන්ටීපීසී (පුද්.) සමාගම අතර 2011 සැප්තැම්බර් 26 වන දා ඒකාබද්ධ කරනු ලැබිණි. ව්‍යාපෘතිය පිළිබඳව ශක්‍යතා අධ්‍යන අවසන් කිරීමෙන් අනතුරුව එකී ව්‍යාපෘතිවලට අදාළව බලශක්තිය මිලදී ගැනීමේ ගිවිසුම, ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම හා ආයෝජන මණ්ඩල ගිවිසුමට අදාළ පාර්ශවය විසින් අත්සන් තැබීමට නියමිතව ඇත.

ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය මෙගා වොට් 150 ක කම්හල් ධාරිතාවක් අපේක්ෂා කරන අතර වාර්ෂික බලශක්ති උත්පාදනය ගිගා වොට් පැය 409 ක් බවට අපේක්ෂා කරන අතර 2011 වසර අවසානයේදී එය දළ වශයෙන් 94% කින් අවසන් කර ඇති අතර 2012 ජූනි මාසය වන විට ක්‍රියාත්මක කරවීමට අපේක්ෂා කෙරේ.

ස්ථාපනය කළ මෙගා වොට් 35 ක ධාරිතාවක් හා වාර්ෂික උත්පාදනය ගිගා වොට් පැය 126 ක් බවට අපේක්ෂිත, බ්‍රෝඩ්ලෑන්ඩ්ස්, ජලවිදුලිබල ව්‍යාපෘතිය සඳහා උපදේශනාත්මක කොන්ත්‍රාත්තු ගිවිසුම 2011 අගෝස්තු 18 වන දා අත්සන් තබනු ලැබීය. බ්‍රෝඩ්ලෑන්ඩ්ස්, ජල විදුලි ව්‍යාපෘතිය run of river ව්‍යාපෘතියක් වන අතර කැළණි ගඟ මත ගොඩ නැංවීමට සැලසුම් කර ඇත. දැනට පවතින පොල්පිටිය බලාගාරයේ ජල විදුලිය නිපදවීමේ විභවයක් සහිත ගඟ දිගේ පහළට ගලන ජල ධාරාව භාවිත කිරීමේ අරමුණින් එසේ සැලසුම් කර ඇත.

මෑතකදී නිදහස ලබා ගත් දිවයිනේ උතුරු පළාතේ කොටස්වලට විදුලිය ලබා දීමේ ප්‍රගතියක් ඇති වී ඇති අතර එය දැනට ක්‍රියාත්මකව පවතී. ජාතික විදුලිබල පද්ධතියෙන් හුදකලාව පවතින යාපනය අර්ධද්වීපයට විදුලි බලශක්තිය සැපයීම සඳහා චුන්නාකම් හි මෙගා වොට් 24 ක බලාගාරයක් ඉදි කිරීමට තීරණය කර තිබේ. 1500 ඉන්ධන තෙල්වලින් ක්‍රියාකරවන මෙම බලාගාරය 2012 වසර අවසානයේදී එහි වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. මේ සම්බන්ධයෙන් සැපයුම් ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව 2011 ඔක්තෝම්බර් මාසයේදී පත් කරනු ලැබීය.

සම්ප්‍රේෂණ ජාලයේ ධාරිතාව හා විශ්වසනීය බව වැඩි කිරීමේ අරමුණින්, ලං.වි.ම. ක්‍රියාත්මක කර ඇති සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිවල දියුණුව ඇගයීම අඛණ්ඩව සිදු කරනු ලැබීය. ඉහළ යන බලශක්ති ඉල්ලුම සපුරාලීමට හා බෙදා හැරීමේ ජාලය වැඩිදියුණු කිරීමට, පුළුල් කිරීමට හා පුනුරුත්ථාපනය කිරීම සඳහා ආරම්භ කළ කොළඹ නගරයේ බෙදාහැරීම වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මෙම වසර තුළදී සම්පූර්ණ කරනු ලැබීය.

රජය විසින් ස්ථාපිත කරන ලද ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් කලාපයේ බලශක්ති මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම මණ්ඩලය හා කලමණාකරණය එක්ව කටයුතු කරනු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලය තුළ සියලුම වෘත්තිකයන් අතර හා කලමණාකරණ මණ්ඩලයේ හා විදුලිබල හා බලශක්ති අමාත්‍යංශයේ සුහද සම්බන්ධතා නැවතත් යථා තත්ත්වයට පත් කළ හැකි වූ බව සඳහන් කරන්නේ ඉමහත් තෘප්තියකිනි.



මහාචාර්ය විමලධර්ම අබේවික්‍රම

සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය



"පසුගිය වසරවල, පාරිභොගිකයින් මෙන් නොව හුදෙක් විදුලි සැපයුමකින් ඔබ්බට යමක් බලාපොරොත්තු වන බැවින් හුදෙක් විදුලිබල සැපයුම්කරුවෙකුට වඩා ගනුදෙනුකරුවන් ඉලක්ක කර ගත් සංවිධානයක් බවට ලංවිම ආයතනය පරිවර්තනය විය යුතුය."

වර්තමාන දැවැන්තයෙකුගේ නිහතමානී ආරම්භය

ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) 1969 අංක 17 දරණ පනත මගින් සංස්ථාපිත ආයතනයකි. විදුලිබලය ජනනය කිරීමටත්, සම්ප්‍රේෂණය කිරීමත් සෑම තරාතිරමකම පාරිභෝගිකයින් වෙත විදුලිබලය බෙදා හැරීමටත් ඒ වෙත බලය පැවරී තිබේ.

කෙසේ වෙතත් එහි මුල් අඩිතාලම එයටත් වඩා අතීතයෙන් ඉස්මතු වන අතර එහි පුරෝගාමියා වූ රාජ්‍ය විදුලි වැඩ දෙපාර්තමේන්තුව පැවති යුගය දක්වා විහිදේ. 1882 ජූනි 26 දින කොළඹ වරායට සේන්දු වුනු හෙලියොස් නම් ජර්මානු නෞකාවේ නැව් තට්ටුවේ සිට ශ්‍රී ලංකාවේ මුහුදු තීරයට ප්‍රථම වරට විදුලි ආලෝකය දර්ශනය වීමෙන් අනතුරුව 2011 වර්ෂය වන විට දිවයිනෙන් 90% ක ප්‍රදේශ ආවරණය කරමින් දිවයිනේ සියළුම කොටස්වලට ලංවිම මගින් විදුලිය ලබා දී තිබේ. ශ්‍රී ලංකාවේ අතිශයින් ග්‍රාමීය ප්‍රදේශවලට යමෙකු ගියහොත් රථවාහන ගමන් කළ හැකි මාර්ගයක් දර්ශනය වීමට පවා පෙරාතුව තම හිසට ඉහළින් විදුලි රැහැනක් දැකිය හැකි වනු ඇත. අප රටේ විදුලි සැපයුම් මට්ටම දකුණු ආසියානු කලාපයේ වඩාත්ම හොඳ මට්ටමක පවතී. කෙසේ වුවද, අපගේ අභිප්‍රාය හුදෙක් නිවාස ආලෝකමත් කිරීම සඳහා විදුලිය සැපයීම පමණක් නොව හදවත් සහ ආධ්‍යාත්මයද ආලෝකමත් කිරීමත් බැවින් තවත් කළ යුතු බොහෝදේ තිබේ.

ඉදිරි ගමන් මග - හදවත් සහිත සංවිධානය

වර්තමාන, ගනුදෙනුකරු, පසුගිය වසරවල, පාරිභොගිකයින් මෙන් නොව හුදෙක් විදුලි සැපයුමකින් ඔබ්බට යමක් බලාපොරොත්තු වන බැවින් හුදෙක් විදුලිබල සැපයුම්කරුවෙකුට වඩා ගනුදෙනුකරුවන් ඉලක්ක කර ගත් සංවිධානයක් බවට ලංවිම ආයතනය පරිවර්තනය විය යුතුය. මෙම මුළු කාලය තුළ අපගේ වැඩි අවධානය යොමු වූයේ නිවාස වෙත විදුලිය සැපයීම සඳහා අවශ්‍ය තාක්ෂණික යටිතල පහසුකම් ගොඩ නැගීමයි. හදවත් සහිත සංවිධානයක් ලෙස තම ආයතනය පරිවර්තනය වීමේ අවශ්‍යතාව ලංවිම ආයතනය දැන් හඳුනාගෙන තිබේ. ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවන් වෙත සමානව අපගේ අරමුණු ගෙන යාම සඳහා සුප්‍රකට කළමණාකරණ උපාය මාර්ග ක්‍රමවේදය වන තුලිත ලකුණු පත් (BSC) ක්‍රමවේදය ලංවිම අනුගමනය කර තිබේ. තම ආයතනයේ ප්‍රගතිය පාදක හතරක් ඔස්සේ දිශාගත කිරීමට තුලිත ලකුණුපත් ක්‍රමය සංවිධානයට උපකාරි වන ඉන් එක් පාදකයක් වනුයේ ගනුදෙනුකරුය. 2011 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලයේ ආයතනයේ සංයුක්ත මාර්ග අංශය අප විසින් ශක්තිමත් කර ඇති අතර මෙම සංවිධාන පරිවර්තනය සිදු කිරීමට අවශ්‍ය විශ්වාසය මෙම අංශය තුළ ගොඩ නගා තිබේ.

සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය

විදුලිබලය නිවාස වෙත සපයනු ලබන පළමු අවස්ථාවේ එයට ප්‍රධාන වශයෙන් බලපානුයේ සැපයුමේ තත්ත්වයයි. කෙසේ වුවද, ජීවන තත්ත්වයේ අනුක්‍රමික වැඩි දියුණුවත් සමග සැපයුමේ තත්ත්වය වඩා මූලික වී තිබේ. සියළු තාක්ෂණික මෙවලම් යටිතල පහසුකම් සහිත වුවද අතීතයේ මෙන් වර්තමාන සමාජයට එය කලමණාකරණයට විවේකයක් නොමැති වීම ප්‍රහේලිකාවකි. මෙය තේරුම් ගැනීමට අපහසු පරස්පර විරෝධී කරුණක් වුවද මේ නිසා වර්තමාන පුරවැසියන් ගුණාත්මක භාවය ලෙසටම කාලය පිලිබඳවද අවධානය යොමු කරන්නන් බවට පත් වී තිබේ. වඩා වැඩි ඉල්ලීම ඉදිරිපත් කරන විදුලිබලයේ ගුණාත්මකභාවය පිලිබඳ වැඩි අවධානයක් යොමු කරන වර්තමාන සහ අනාගත පාරිභෝගිකයාගේ අවශ්‍යතාවන් සපුරාලීමට ලංවිම ආයතනය දැන් ඇප කැප වී සිටී.

මෙම ඉලක්කය සපුරා ගනු වස් 2011 වර්ෂයේදී විදුලිපුර සංකල්පය තවත් පියවරකින් ඉදිරියට ගෙන යමින් දිවයිනේ විදුලිපුර තව තවත් විවෘත කර තිබේ. කොලඹ නගරයේ ප්‍රාදේශීය කාර්යාල හතරටම විදුලිපුරයක් ඇතුලත් වන පරිදි කොලඹ නව විදුලිපුර තුනක් පිහිටුවනු ලැබීය. තවත් විදුලිපුර තුනක් වයඹ පලාතෙහි එනම්, කුරුණෑගල, කුලියාපිටිය, හා හලාවත ප්‍රදේශයන්හි විවෘත කරනු ලැබීය. විදුලිපුර දෙකක් උතුරු මැද පලාතෙහි හි මින්නේරිය හා අනුරාධපුරය ප්‍රදේශයන්හි විවෘත විය. කැලණිය හා මහනුවර නගරයේ උතුරු මැද පලාතෙහි නගර දෙකක්ද රත්මලාන බස්නාහිර පලාත දකුණ I කාර්යාලයේ විදුලිපුරයක්ද විවෘත කරනු ලැබීය.

වර්තමාන සමාජයේ මූලික අංගයක් බවට ජංගම දුරකථන පත්ව තිබේ. අපගේ පාරිභෝගිකයින්ට වඩා හොඳ සේවාවක් ලබා දීමේ ලා මෙහි ඇති හැකියාව ලංවිම විසින් හඳුනාගෙන තිබේ. සාම්ප්‍රදායක් විසන්ධි නියෝග පාරිභෝගිකයින්ට කෙටි පණිවුඩ මගින් හා ජංගම දුරකථන පාදක කර ගත් පහසුකම් සැපයීමට බලාපොරොත්තු වේ.

මිල කල නොහැකි වත්කම් ආරක්ෂා කිරීම

ආයතනය තුල අවශ්‍යයෙන්ම සිටිය යුතු හැකියා පූර්ණ පිරිස් එනම් ගනුදෙනුකරුවන් හා අනෙකුත් කොටස්කරුවන් සම්බන්ධයෙන් ලංවිම සතුටුදායක ලෙස ක්‍රියා කරන අතර ඔවුන් සඳහා වටිනාකමක් ලබා දී තිබේ. අගය කල හැකි හා අගය කල නොහැකි වත්කම් මෙම හැකියා පූර්ණ පිරිස් මගින් ඇතුලත් වේ.සාම්ප්‍රදායික මූල්‍ය ක්‍රමවේදය මගින් ලබා ගත් හැක්කේ සංවිධානයේ සත්‍ය වටිනාකමෙන් ¼ ක් පමණක් බවට මතකයක් පවතී. පුහුණු ශ්‍රම බලකාය, පමණක් බවට මතයක් පවතී.

පුහුණු ශ්‍රම බලකාය, පද්ධති, ක්‍රමවේදය, විනය පමණක් නොව මනා සංවිධාන අභිවර්ධනයද ඇතුළු අගය කළ නොහැකි වත්කම්වලට ඉතිරි කොටස අයත් වේ. තුලිත ලකුණු පත් ක්‍රමවේදය යටතේ තුලිත ලකුණුපත් සංකල්පයේ (බීඑස්සී) අධ්‍යාපනය හා වර්ධනය නම් දැක්ම අනුව මානව ප්‍රාග්ධනය, සංවිධාන ප්‍රාග්ධනය සහ තොරතුරු ප්‍රාග්ධනය අයත් අගය කළ හැකි හා අගය කළ නොහැකි වත්කම් ශක්තිමත් කිරීමේ ලා අප දැන් අවධානය යොමුකර තිබේ. මෙම ¼ ක කොටස් මගින් සංවිධානය වටිනාකමක් නිර්මාණය කිරීමට පදනම වැටේ. සංයුක්ත තුලිත ලකුණුපත් ක්‍රමයේ (බීඑස්සී) හි ප්‍රධාන කාර්ය සාධක දර්ශක (KPI) ශ්‍රේණිගත මගින් මෙම දැක්මේ ප්‍රබලත්වය සමාලෝචනය කෙරෙනු ඇත. මධ්‍ය හා දීර්ඝකාලීන අරමුණු බැවින් ලංවිම හි අධ්‍යාපනය හා වර්ධනය දැක්ම වැඩිදියුණු කිරීමේ උත්සාහය මල් ඵල දැරීමට වසර කිහිපයක් ගතවනු ඇත. කෙසේ වුවද, 2011 වර්ෂයේදී මේ සඳහා වැදගත් පියවර කිහිපයක්ම ගෙන තිබේ.

මානව ප්‍රාග්ධනය

අපගේ කාර්ය මණ්ඩලය ලංවිම සතු විශාලතම වත්කමයි. ලංවිම බෙහෙවින්ම තාක්ෂණය අරමුණු කරගත් සංවිධානයක් වන අතර එය කාර්ය මණ්ඩලයේ දැනුම, හැකියාව හා අත්දැකීම් වටා ගොඩනැගී තිබේ. ලංවිම කාර්ය මණ්ඩලය මූලාශ්‍ර 03 ක් ඔස්සේ ලබා ගැනේ. එනම් ලංවිමයේ ස්ථිර කාර්ය මණ්ඩලය, කොන්ත්‍රාත් පදනම යටතේ සිටින කාර්ය මණ්ඩලය සහ මිහිස්බල ආයතන මගින් ලබා ගන්නා කාර්ය මණ්ඩල යනුවෙනි. පිටතින් ලබා ගත හැකි නිලධාරීන් ප්‍රමාණය අනුව ඔවුන් මගින් සැපයෙන සේවාව සැලකිල්ලට ගනිමින් මෙම මූලාශ්‍ර තුනෙන්ම සම්මිශ්‍රණයක් හඳුන්වා දෙමින් 2012 වසර සඳහා පුද්ගල සැලැස්ම සකස් විය.

2011 වර්ෂයේදී විවිධ වූ වෘත්තිය වර්ග යටතේ පුද්ගලයින් 1342 දෙනෙකුට රැකියා සපයනු ලැබීය. කෙස් වුවද, අවශ්‍යතාවය වූයේ සංඛ්‍යාව නොව ඔවුන්ගේ සේවාවේ ගුණාත්මක භාවයයි. රැකියා වෙලඳපොලේ නවක රැකියාලාභීන් හා සංවිධානය අභ්‍යන්තර අවශ්‍යතා අතර පවතින හැකියා පරතරය ලංවිම මගින් හදුනාගෙන තිබේ. මෙම පරතරය දුරු කිරීම සඳහා 2011 වර්ෂයේදී ලංවිම මගින් තීරණාත්මක පියවරක් ගෙන ඇති අතර එමගින් ඉදිරි වර්ෂයන්හිදී සැලකිය යුතු ලාභයක් අත්කර ගත හැකි වනු ඇත. විදුලි කාර්මික භාවිත කර්මාන්තයේ අවශ්‍යතාවන් සපුරාලීම ඉලක්ක කරගත් ආධුනික පුහුණු යෝජනා ක්‍රමයක් කාර්මික විද්‍යාලයේ සම්පාදනය කිරීමට අවශ්‍ය සාකච්ඡා කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමග සාර්ථක ලෙස සිදු විය. මෙම වැඩ සටහන ආරම්භ වූ විට මෙරට තරුණ කොටස්වලට කාර්මික විද්‍යාලයේ කාර්මික අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථාව උදා වන අතර අනතුරුව ලංවිමට හෝ පෞද්ගලික අංශයට හෝ සම්බන්ධ විය හැකි අතර විදේශගත වීමටද හැකිය. මෙමගින් අනාගතයේදී ලංවිමට බඳවා ගන්නා නවක කාර්ය මණ්ඩලයේ ගුණාත්මකභාවය ඉහල නැංවීම පමණක් නොව ඉහත සඳහන් අගය කල නොහැකි වත්කම් පදනම වැඩිදියුණු කෙරෙන අතර දක්ෂ කම්කරුවන් විදේශ රැකියාවන්ට යැවීමෙන් විදේශ විනිමය ඉපයීම තුලින් ජාතික සංවර්ධනයට ධනාත්මක ලෙස දායක වීමද සිදුකළ හැකිය.

සුදුසු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම එක් වැදගත් කරුණකි. එලෙස බඳවා ගන්නා සේවකයින්ගේ දැනුම හා හැකියාවන් මට්ටම අඛණ්ඩව සංවර්ධනය කිරීම තවත් වැදගත් කරුණකි. සෑප් පුහුණු මධ්‍යස්ථාන දෙක මගින් හා අභිනවයෙන් ස්ථාපිත පරිගණක විද්‍යාගාරය මගින් 2011 වර්ෂයේදී ලංවිම සේවකයින් 9147 දෙනෙකුට අභ්‍යන්තර පුහුණුවීම් සැපයින. මෙයට අමතරව විධායක කාර්ය මණ්ඩලයේ 370 දෙනෙකුට භාණ්ඩ මූලික පරීක්ෂාව, පුහුණුවීම් සහ වැඩමුළු සම්මන්ත්‍රණ සඳහා සහභාගි වීමට විදේශයන්ට යැවීම තුලින් විදේශ සේවක සම්ප්‍රදායන් සහ නව තාක්ෂණයන් පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබා දුනි.

ගුණාත්මක භාවයෙන් ඉහල පුහුණුවීම් සැපයීම සඳහා පිළියන්දල පුහුණු මධ්‍යස්ථානයේ නව තත්ත්ව කළමණාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම තුලින් ISO 9001/2008 සහතිකය ලබාගත හැකි විය.නූතන කළමණාකරණ දර්ශනයට අනුව සාර්ථකත්වයේ තීරණාත්මක අංග දෙක තෘප්තිමත් හා සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකාය ලෙස සැලකේ. ක්‍රීඩා කටයුතුවලට ක්‍රියාකාරී ලෙස සහභාගි වීමට අවස්ථාව ලබාදෙමින් ලංවිම සේවකයින්ගේ ශාරීරික යෝග්‍යතාව වර්ධනය සඳහා ඔවුන්ව දිරි ගන්වනු ලැබිය. සුගතදාස ක්‍රීඩාංගනයේ පැවති අවසන් මහා තරඟයකින් අවසන් වන පරිදි ප්‍රාදේශීය මට්ටමේ ක්‍රීඩා උත්සව 2011 වර්ෂයේදී පවත්වන්නට යෙදුනි. ලංවිම කාර්ය මණ්ඩලයේ ක්‍රීඩා හැකියාවන් මෙම තරඟවලදී මැනවින් පිලිඹිබු විය.

සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය

මූලික වශයෙන් කාර්මික අංශයේ සංවිධානයක් වුවද, සත්‍ය වශයෙන්ම හදවත් සහිත ආයතනයක් බවට පත්වීමේ අරමුණින් කාර්ය මණ්ඩලයේ සෞන්දර්ය හැකියාවන් ඔප්නැංවීමේ අවශ්‍යතාව ලංවිම මගින් හදුනාගෙන ඇත. 2011 වර්ෂයේදී ජෝන්ද ද සිල්වා රඟහලේදී පවත්වන්නට යෙදුනු විදුලමු ලංකා කලා උළෙලේදී ලංවිම කාර්ය මණ්ඩලයේ සෞන්දර්ය හැකියාවන් හදුනා ගැනීමට අවස්ථාව ලැබුණි. මෙම අවස්ථාවේදී ලංවිම කාර්ය මණ්ඩලයේ සියළුම මට්ටම්වල සේවකයින් එකම වේදිකාවක තම හැකියාවන් ප්‍රදර්ශනය කලහ. තෘප්තිමත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා සේවක දුක්ගැනවිලි සොයා බැලීම අත්‍යවශ්‍ය කරුණකි. විවිධ වූ අධ්‍යාපන හා සමාජ පසුබිම් සහිත සේවකයින් විශාල සංඛ්‍යාවක් එක්ව සේවය කරන විට ඔවුන් අතර මතභේද නිර්මාණය වීම ස්වභාවික සංසිද්ධියකි. සේවක සංගම් බාධකයක් ලෙස නොව සේවක දුක්ගැනවිලි හඳුනා ගැනීමේ චක්‍රයේ ප්‍රබල කොටසක් බව ලංවිම අවබෝධ කරගෙන තිබේ. සේවක සංගම් සහ දුක්ගැනවිලි කමිටු සමඟ සාකච්ඡා කිරීමෙන් 2011 වර්ෂයේදී සේවක දුක්ගැනවිලි බොහොමයක් හඳුනාගත හැකි විය. 2011 වර්ෂයේ සේවක සංගම් ක්‍රියාකාරකම්වල යෙදුනු සේවක සංගම් අතලොස්ස සේවකයින්ගේ මූලික අයිතිවාසිකමක් ලෙස ලංවිම මගින් හඳුනා ගැනින. පාලනය කළ නොහැකි අවස්ථාවට එලෙඹීමට පෙරාතුව සාකච්ඡා මාර්ග යෙන් එම සියළු ක්‍රියාකාරිත්වයන් විසඳා ගත හැකි විය.

මිනිස්බල ආයතන මගින් තරුණ තරුණියන් සැලකිය යුතු ප්‍රමාණයක් ලංවිමට වර්තමානයේ ඔවුන්ගේ වටිනා සේවාවන් ලබා දේ. එම තරුණ කොටස්වල දායකත්වය හඳුනා ගැනීමත් ඔවුන්ට සුරක්ෂිත අනාගතයකට මග පෙන්වීමේ අවශ්‍යතාවය මෙම ආයතනය හදුනාගෙන තිබේ. ලංවිමට ක්‍රමයෙන් ඔවුන් අවශෝෂණය කර ගැනීමට සැලසුම් සකස් කර තිබේ. ලංවිම වර්තමානයේ පවත්නා තත්ත්වයට ගෙන ඒමට තමන්ගේ තරුණ වියේදී අව් වැසි නොතකා ශ්‍රමය කැප කළ අපගේ විශ්‍රාමික කාර්ය මණ්ඩලය අප මොහොතකට වත් අමතර කර නොමැත. අන් අයගේ පිළිසරණ නොමැතිව ගෞරවය විශ්‍රාම දිවියක් ගත කිරීමට ප්‍රමාණවත් මට්ටමට ඔවුන් ලබන සුළු විශ්‍රාමික මුදල වැඩි කල යුතුය. මෙම අවශ්‍යතාව හදුනා ගත් ලංවිම වැඩිදියුණු කල සහ ප්‍රමාණවත් පැකේජයක් අපගේ විශ්‍රාමිකයින් සඳහා සකස් කිරීමේ කටයුතුවල නියැලී සිටී.

තුලිත ලකුණුපත් ක්‍රමය

නවෝත්පාදනය සංකල්පයේ ඉතා වැදගත් ක්‍රියාවලියක් ලෙස සැලකේ. අදහස් හා උපදේශණ සාම්ප්‍රදායිකව ඉහල සිට පහලට ගලා යන සිරස් පිරමීඩාකාර පරිපාලන ව්‍යුහයක් ලංවිම සතුය. මේ නිසා තීරණ ගැනීම ඉහල කළමණාකරණයේ වගකීම බවත් පහල මට්ටමේ සේවකයින් ඒවා ක්‍රියාත්මක කල යුතු බවත් යන මතය ජනිත වී තිබේ.

නවෝත්පාදනය නැතහොත් අඛණ්ඩ වැඩිදියුණුව ද ඉහල මට්ටමේ නිලධාරීන්ගේ ,වෘතිය ක්‍රියාකාරකමක්, බවට අදහසක් විය. මෙම දර්ශනය වෙනස් කිරීමේ අවශ්‍යතාවය හා සියළුම මට්ටම්වල නියුතු අයගේ බුද්ධිය උකහා ගැනීම සදහා නවෝත්පාදනය සංස්කෘතියක් සංවිධානය තුල වගා කිරීමේ අවශ්‍යතාව ලංවිම හදුනාගෙන තිබේ. සැමට නිර්මාණශීලීව සිතීම සඳහා දිරි ගැන්වීමට 2011 වසෙර්දී ආරම්භක පියවර ගනු ලැබීය. ලංවිම තුල අදහස් ද්විදිශා සංසරණය නිල වශයෙන් ඇති කිරීම සඳහා සහ වටිනා අදහස් හඳුනා ගැනීමට ආරම්භක කටයුතු සිදු කල අතර ඒවා 2012 වසරේ ක්‍රියාත්මක කෙරනු ඇත. මී ලඟ වර්ෂයේ සිට තුලිත ලකුණුපත් ක්‍රමයෙ හි KPI ලෙස ඉදිරිපත් කරන ලද නවෝත්පාදනය අදහස් බොහෝ සංඛ්‍යාවක් සමාලෝචනය කිරීමද සිදු කෙරෙනු ඇත. අපගේ ගනුදෙනුකරුට වටිනාකමක් ලබා දීමට නම් පද්ධතිය තුල මනා අභ්‍යන්තර ක්‍රියාවලියක් තිබීමේ අවශ්‍යතාවයද අප හඳුනාගෙන තිබේ. තුලිත ලකුණු පත් ක්‍රමය යටතේ, අභ්‍යන්තර ක්‍රියාවලි දැක්ම, සඳහා තම මූලික ව්‍යාපාර කටයුතුවල ඇති කාර්යක්ෂමභාවය සමාලෝචනය කිරීම ලංවිම නුදුරු අනාගතයේදීම ආරම්භ කරනු ඇත. ප්‍රතිඵල පමණක් නොව දර්ශක ප්‍රධාන කාර්ය සාධක ලෙස යොදා ගනිමින් ද සමාලෝචනය කෙරෙනු ඇත. සංයුක්ත උපාය මාර්ග අංශයේ මැදිහත් වීමෙන් 2011 වර්ෂයේදී සංවිධාන උපාය මාර්ග සාක්ෂාත් කර ගැනීම සඳහා හේතු ඵල ක්‍රමයට අනුව සංවිධානයේ විවිධ අරමුණු පෙන්වා දෙන ප්‍රස්ථාර මෙවලමක් වූ .උපාය මාර්ග සිතියම. පිලියෙළ කිරීමට අප ආයතනයට හැකි විය.

ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා ජපන් එස් 5 ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී ඉහල ප්‍රමිතියක් පෙන්නුම් කල ඒකක සඳහා ප්‍රශංසා කිරීම සඳහා තරඟයක් ලංවිම මගින් 2011 දී දියත් කෙරිනි.මෙම තරඟය විනෝදයක් ගෙන දුන් අතර එය වාර්ෂික ක්‍රියාකාරකමක් ලෙස ඉදිරි වර්ෂයන්හි ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ඊ පාලනය (E - governance)

අපගේ පාරිභෝගිකයින්ට වඩා හොඳ සේවාවක් ලබාදීම සඳහා ප්‍රබල සංයුක්ත වෙබ් අඩවියක ඇති වටිනාකම ලංවිම හඳුනාගෙන තිබේ. උපරිම මට්ටමින් වෙබ් අඩවිය භාවිතය හා අන්තර්ජාලය හා ජංගම දුරකථන මගින් මහජනතාවට සේවාවක් ලබාදීම සම්බන්ධයෙන් අපි බෙහෙවින් පසුගාමීව සිටියෙමු. මෙම තත්ත්වය පිටුදැකීමේ පියවරක් ලෙස සංයුක්ත වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීමට ලංවිමතීරණය කර තිබේ. 2012 දී දියත් කිරීමට නියමිත ලංවිම නව වෙබ් අඩවිය සම්බන්ධ කටයුතු 2011වර්ෂයේ බොහෝ දුරට අවසන් විය. වෙබ් අඩවිය මගින් ගෙවීම් සිදු කිරීමේ පහසුකම් සහිත නවාංග රැසක් මෙම වෙබ් අඩවියට ඇතුලත් වේ.

ගල් අඟුරු බලාගාරයකින් ග්‍රිඩ් පද්ධතියට ලබාදෙන ප්‍රථම k අය 2011 වර්ෂයේදී පුත්තලම ගත් අඟුරු බලාගාරය ක්‍රියාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකාවේ බලශක්ති උත්පාදන ක්ෂේත්‍රයට නව අරුනළු විහිදෙනු අපට දැකගත හැකිවිය. 2011 පෙබරවාරි 13 පුත්තලම ගල් අඟුරු බලාග ාරය පළමු වරට පද්ධතිය හා සමපාත විය. ගිවෝපැය 1110.4(88.1%) ක ජල පරිමාවක් සමඟ වර්ෂය ආරම්භ වූ නමුත් නිරිත දිග මෝසම් වැසි ප්‍රමාණවත් නොවූ බැවින් ගිවෝපැය 275.5 (1.9) දක්වා ජල පරිමාව සීඝ්‍රයෙන් පහත වැටින. එහි අඩුම ජල පරිමාව ජූලි 24 වන දින වාර්තා වූ අතර එදිනම ලක්විජය පුත්තලම ගල් අඟුරු බලාගාරය වාණිජ කටයුතු ආරම්භ කළේය. ලක්විජය බලාගාරයට ස්තුති වන්නට ඉන් අනතුරු ජල පරිමා තත්ත්වය ස්ථාවර විය. වසර අවසානයේ ජල පරිමාව ඨඅය 657.7 දක්වා පහත හෙලමින් 2011 වසරේ ඊසාන දිග මෝසම් වැසිද ප්‍රමාණවත් නොවීය. පුත්තලම ගල් අඟුරු බලාගාරය මගින් G අය 1038 ක බලශක්තියක් සැපයුනු අතර එසේ නොවූවා නම් තත්ත්වය තවත් අයහපත් වන්නට තිබිණි.

ශ්‍රී ලංකාවේ 2011 ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලියේ සම සත්කාරක රටක් වු අතර 2011 පෙබරවාරි මැද සිට අප්‍රේල් දක්වා අඛණ්ඩ විදුලිබල සැපයුමක් ලබාදීමට ලංවිමට සිදු විය. පහත වැටෙන ජලාශ ධාරිතාව හා විටින් විට සමහර ප්‍රධාන ස්වාධීන බලශක්ති නිපදවන්නන් තාප බලාගාරවල සිදුවන දෝෂ මධ්‍යයේ මෙය අභියෝගාත්මක කටයුත්තක් විය. දිවා රාත්‍රී ක්‍රිකට් තරඟ නිසා රාත්‍රී කාලයේ විදුලිබල ඉල්ලුමද බලාපොරොත්තු වූ ලෙසටම ඉහළ ගිය අතර ලෝක කුසලාන තරඟාවලියේ දෙවන අර්ධ අවසන් තරඟාවලියේදී එනම් 2011 මාර්තු මස 30 වනදින ප්‍රථම වරට මෙ.වො.2000 සීමාව ඉක්ම විය. අධික ඉල්ලුම සහිත අවස්ථාවක් වුවද අඛණ්ඩව විදුලිබලය සැපයීම සාර්ථක කර ගැනීමට ලංවිමට හැකි විය.

සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය

ඉහල කොත්මලේ සිහිනයට ඉතා සමීප පියවරක් තබමින්

ඉහල කොත්මලේ සිහිනයට අප ඉතා සමීප කරවමින් 2011 වසර තුලද ඉහළ කොත්මලේ ජලාශයේ කටයුතු අවසන් අධියරට පැමිණ තිබේ. වේල්ලේ පහළින් ජලය පිරවීමට 2011 නොවැම්බර් 30 දින සිදුකරනු ලැබූ අතර ප්‍රධාන ජලාශයේ දිය රඳවා තැබීමට දෙසැම්බර් 15 වන දින සිදු කරනු ලැබීය.

ජනන සංයෝගය

2011 වසර අවසානයේදී පද්ධතියේ ස්ථාපනය කරන ලද ධාරිතාව මොගාවොට් 3141 ක ප්‍රමාණයක රඳවා තිබුන අතර එය බලශක්ති පද්ධතියක කෙදිනක හෝ පැවති ඉහළම වෙන් කළ ධාරිතාව වන 45% ක වෙන් කළ අන්තයක පැවතිනි. 2012 දී ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරයට මෙගා වොට් 150 ක් එක් කිරීමත් සමඟ 2014 දී පුත්තලම ගල් අඟුරු බලාගාරයේ II හා III අධියරවලින් මෙගාවොට් 600 ක් නිෂ්පාදනය වීමේදී නුදුරු අනාගතයේදී අපගේ වෙන් කල ධාරිතා අන්ත ඉතා හොඳ තත්ත්වයකට පත්වීමට නියමිතය.කෙසේ වුවද, ZPP ද ඇතුලත්ව 2011 දී මුළු තාප බල උත්පාදනය 59% ක මට්ටමක තිබුණි. තාප බල ජනනයේ කොටස අනුක්‍රමයෙන් වැඩිවෙමින් හෝ සුනිත්‍ය විදුලිබලය ප්‍රමුඛ ලෙස භාවිත කරන ජාතියක් වශයෙන් අපගේ හිමිකම් කීම ක්‍රමයෙන් අඩුවෙමින් පැවතමේ ප්‍රතිඵලයක් වශයෙන් පරිසරය පිළිබඳ අවධානය ඉහළ යමින් පවතින ලෝකයක මෙය වඩාත් අවධානය යොමු කළ යුතු තත්ත්වයකි. මෙගා වොට් 27 ක ජනනය වන මොරගොල්ල ව්‍යාපෘතිය හැරුනු විට අපගේ අලුත්ම ජනන පුළුල් කිරීමේ සැලසුමට අනුව මෙගාවොට් 354 ක විශාල ජල විදුලි බලාගාර එකතුවක් පමණක් සැලසුම් කර ඇත. කෙසේ වුවද, ත්‍රිකුණාමලය ගල් අඟුරු බලාගාරයද ඇතුළත්ව අනාගතය සඳහා විශාල සංඛ්‍යාවක තාප විදුලිබල උත්පාදන එක් කිරීම් විශේෂයෙන් වෙන් කර තිබේ. ජල විදුලිය නිපදවීමේ විභවතාව ක්‍රමයෙන් අඩුවෙමින් යාමේදී හා පරිසරය පිළිබඳ අවධානය ක්‍රමයෙන් ඉහළ යන ගෝලීය ප්‍රජාවක් මධ්‍යයේ අපගේ අනාගත බලශක්ති සංයෝගය පිළිබඳව සාවධානව අවධානය යොමු කිරීමට සිදුවී තිබේ. ජල විදුලිබලය නිසා ඇති වී ඇති රික්තය පිරවීමට වඩාත් සුදුසු විකල්පයක් වන්නේ සුළඟේ ශක්තිය උපයෝගී කර ගැනීමයි. එය අනාගතය සඳහා වඩාත් අපේක්ෂා තැබිය හැකි ආකාරයයි. කෙසේ වුවද, අතරින් පතර ඇතිවන සුළඟේ ශක්තිය විශාල ප්‍රමාණවලින් අපගේ බලශක්ති පද්ධතියට අවශෝෂණය අනාගත ඉංජිනේරුවන්ට අභියෝගයක් වනු ඇත.

මෙගා වොට් 03 ක් වන හම්බන්තොට සුළං බලාගාරය හැරුණු විට සුළං බලශක්තිට සංවර්ධන කිරීම වර්තමානයේදී පුද්ගලික අංශය වෙත පැවරී ඇති අතර එයද මෙගා වොට් 10 ගුණාකාර වලින් සමන්විත වනු ඇත. පෞද්ගලික අංශයේ කුඩා පරිමාණ සංවර්ධනය සිදුවෙමින් පවතින විට ලං.වි.ම. ද අපගේ ස්ථාපිත ජනන ධාරිතාවට අප විසින් විශාල සුළං බලාගාර එක් කරන්නේ කෙසේ දැයි ධනාත්මකව බැලිය යුතුය.

පද්ධති පාලන මධ්‍යස්ථානය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය

ලං.වි.ම.යේ මෙහෙයුම් පිළිබඳ පාලන කේන්ද්‍රය වන්නේ පද්ධති පාලන මධ්‍යස්ථානයයි. සියලුම විශාල පරිමාණයේ ග්‍රිඩ් පද්ධතියට සම්බන්ධ උත්පාදන හා ඉහළ වෝල්ටීයතා සම්ප්‍රේෂණ ජාලය සමස්ථයක් ලෙස ක්‍රියා කරවීමටද පද්ධති පාලන මධ්‍යස්ථානය මගින් සිදු කෙරේ. කෙසේ වුවද, 1984 තරම් අතීතයේදී ස්ථාපනය කල වත්මන් පද්ධති පාලන මධ්‍යස්ථානය ඵලදායී කාර්යක් සිදු කිරීමට ප්‍රමාණවත් නොවන පරිදි අඩු උපකරණවලින් සමන්විත වේ. එහි දිගු කාලයක සිට පැවති ස්කාඩා පද්ධතියට අධීක්ෂණය කිරීමේ පහසුකම් පමණක් ඇති අතර පාලනය කිරීමට හැකියාවක් නැත. ජාලයෙන් 60% ක පමණ ප්‍රමාණයකට පමණක් මෙම අධීක්ෂණයද සීමා වී ඇත. තවද, තාප බලයෙන් විදුලිය උත්පාදනය කරනු ලබන බලාගාර වැඩි වැඩියෙන් එකතු වීමත් සමඟ නවීන ශක්ති කළමණාකරණ උපාංගද එකට එක් කළ සම්පූර්ණ කරන ලද ස්කාඩා පද්ධතියක අවශ්‍යතාව ලං.වි.ම. ට බොහෝ සෙයින් ඇති වී තිබේ.

ශ්‍රී ජයවර්ධනපුරයෙහි නවීකරණය කරන ලද ස්කාඩා හා බලශක්ති කළමණාකරණ පහසුකම්වලින් සමන්විත නව පද්ධති පාලන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම පිළිබඳ වගකීම පද්ධති පාලන මධ්‍යස්ථාන නවීකරණය කිරීමේ ව්‍යාපෘතියට පැවරී තිබේ. ශබ්ද හා දත්ත සන්නිවේදන අවශ්‍යතා සැපයීම සඳහා දීප ව්‍යාප්ත ප්‍රකාශ තන්තු ජාලයක් ඇති කිරීමටද එයට ඇතුලත්ව තිබේ.

බෙදා හැරීමේ ජාලය ස්වයංකරණය කිරීම.

2011 වසර තුළ උතුරුමැද පළාතේ හා කොළඹ නගරයේ බෙදාහැරීම් පාලන මධ්‍යස්ථාන (DCC) දෙකක් ක්‍රියාත්මක කරනු ලැබූ නාගරික ප්‍රදේශවල සිටින ගුනාත්මය ගැන වැඩිවම අවධානයක් යොමු කරන පාරිභෝගිකයන්ට සේවය සැලසීමේ අවශ්‍යතාවයෙනි. ශ්‍රී ලංකාව වැනි ඝර්ම කලාපීය රටක නොවැසූ සන්නායක ඇති උඩු රැහැන් බෙදාහැරීමේ ජාලය තුළ යම් මට්ටමකට ඔබ්බෙන් බිඳවැටීම් අඩු කිරීමට ප්‍රයන්ත දැරීම ප්‍රායෝගික නොවන බව හා අරපිරිමැසුම්දායී නොවන බව ලං.වි.ම. හඳුනාගෙන තිබේ. එම නිසා දෝෂ තිබෙන ස්ථාන හඳුනා ගැනීම හා යථා තත්ත්වයට පත් කිරීමේ කාලය අඩු කිරීම ඉතිරිව ඇති එකම විකල්පය වේ. දුරස්ථ අධීක්ෂණය, සමායෝජනය හා දුරස්ථ ස්ථානයකින් තත්‍ය කාලයේදී බෙදාහැරීම් සංරචක ක්‍රියාත්මක කිරීමට හැකියාව ලබා දෙන බෙදාහැරීම් ජාලය ස්වයංකරණය කිරීම මගින් මෙය මුදුන් පමුණුවා ගත හැකිය.

බලශක්ති හානිය අඩු කිරීම.

පද්ධතියේ බලශක්ති ශුද්ධ හානිය 2011 වසරේදී 11.72% දක්වා තවදුරටත් පහළ බැස තිබුනි. මේ සම්බන්ධයෙන් අන්තර්ජාතිකව පිළිගත් සම්මාන ලබා ගැනීමට ලං.වි.ම. පියවරකින් ලඟා වී ඇත. මෙම හානිවලින් සාධාරණව පිළිගත හැකි ප්‍රමාණයක් සොරකම් හා ප්‍රකාශන සොරකම් හේතුවෙන් සිදුවන තාක්ෂණික නොවන හානි වේ. ඒවා ලං.වි.ම. පොත්වල ,නැතිවූ, ලෙස වර්ගීකරණය කර තිබුනත් එවැනි ගිණුම්ගත නොකල ඒකකද යම් අරමුණු සඳහා රට තුලදී භාවිත කර තිබුනි. උතුරු හා නැගෙනහිර පළාතේ නීතිය හා සාමය ස්ථාපිත කිරීමත් සමඟ, මෙම ප්‍රදේශවල ප්‍රකාශන සොරකම් හා සොරකම් තවදුරටත් අඩු කිරීමට අපේක්ෂා කරන අතර සමස්ථ හානි ප්‍රමාණයට යහපත් ලෙස බලපෑමක් එයින් සිදු වේ.

උතුරු පළාත ආලෝකමත් කිරීම.

අප රටේ උතුරු හා නැගෙනහිර කොටස්වලට සාමය උදාවීමත් සමඟ, යුද්ධයේ අතිශය දරුණුකම්වලින් පීඩනයට පත්වූ අපගේ සහෝදර ජනතාවගේ ජීවිත ආලෝකමත් කිරීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීමට ලං.වි.ම. යට සිදුවිය. යුද්ධ කාලයේදී සම්ප්‍රේෂණ සම්බන්ධතාව වෙන් කිරීමේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය වෙනම පද්ධතියක් ලෙස ක්‍රියාත්මකව පැවතුනි. දකුණු පළාතේ සම්ප්‍රේෂණ ජාලය උතුරු පළාතේ සම්ප්‍රේෂණ ජාලය දක්වා පුළුල් කිරීමට සියලු ප්‍රයන්තයන් දරමින් පවතී. මෙ සිදු කරන්නේ වව්නියාවෙන් රැහැන් මාර්ගයක් කිලිනොච්චි හරහා චුන්නාකම්වලට ගැනීමෙනි.

සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය

චුන්නාකම්හි මෙගාවොට් ඇම්පියර් 63 කි.වෝල්ට් 132/33 ග්‍රිඩ් උප පොළක් ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2011 අප්‍රේල් මාසයේදී, කිලිනොච්චි ග්‍රිඩ් උප පොලේ සිට චුන්නාකම් ග්‍රිඩ් උප පොළ දක්වා කි.වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන් කි.මී.72 ක් දුරට ඉදි කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2011 මැයි මාසයේදී අත්සන් තබනු ලැබිණි. කි.වෝල්ට් 132 වව්නියා - කිලිනොච්චි සම්ප්‍රේෂණ රැහැන් (කි.මී.73 ක දිගින් යුත්) හා සම්බන්ධ කටයුතුද, කිලිනොච්චියේ කි.වෝල්ට් 132/33 ග්‍රිඩ් උප පොළ ඉදි කිරීමේ කටයුතුද 2011 වසර තුළ හොඳින් ප්‍රගමනය විය.

ජාතික විදුලිබල පද්ධතිය සමඟ සම්බන්ධ වීමට අමතරව, ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන් විසින් ප්‍රමුඛ ලෙස විදුලිය සැපයනු ලැබූ හුදකලා වූ යාපනය අර්ධද්වීපයට විදුලිබල අවශ්‍යතාව සැපයීමට චුන්නාකම්හි මොගා වොට් 24 ක ඩීසල් බලාගාරයක් සවි කිරීමටද තීරණය කර තිබේ.මෙම නව බලාගාරය ලං.වි.ම. අයත් චුන්නාකම්හි පිහිටි ඉඩමක EPC වහාම ලබාගත හැකි කොන්ත්‍රාත්තුවක් ලෙස ඉදිරි කෙරෙනු ඇත. මෙම නව බලාගාරය 1500 ඉක්මවන තෙල්වලින් ක්‍රියාත්මක කෙරෙන අතර 2012 අවසනායේදී එහි වාණිජ ක්‍රියාකාරිත්වය ආරම්භ කිරීමට අපේක්ෂා කරයි.

මුදල් සැපයුම

පසුගිය වසරේ ආදායම වූ රුපියල් බිලියන 122 හා සංසන්ධනය කිරීමේදී 2011 වසරේදී ලං.වි.ම. යේ ආදායම රුපියල් බිලියන 12 කින් එනම් 9.8% කින් ඉහළ ගොස් තිබුණි. ශ්‍රී ලංකා පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාව මගින් ඉඩ ලබා දී තිබූ අයක්‍රම වැඩිවීම මගින් ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල 2010 වසර තුළ කි.වො.පැ.1 ට රු.13.09 ක සිට 2011 වසරේදී කි.වො.පැ.1 කට රු.13.22 කින් ආන්තිකව ඉහළ ගොස් තිබුනි. කෙසේ වුවද, විකුණුම් පිරිවැයද 31% කින් වැඩි වී ඇති අතර පසුගිය වසරේ රුපියල් බිලියන 116 සාපේක්ෂව මේ වසරේ රුපියල් බිලියන 36 වී තිබුනි. ජනන පිරිවැය ඉහළ යෑමට මෙම ඉහළ යෑම මූලිකව දායකත්වය සපයනු ලැබීය. බාධාවකින් තොරව විදුලිබලය සැපයීම (24/7) පිළිබඳ අපගේ සෝදිසියේදී මෝසම් වැසි නොමැති වීම අතරවාරයේදී තාප බල ශක්ති ජනනයේ කොටස වැඩි වී තිබේ. ලං.වි.ම. තාප විදුලි ජනනය (ගල් අඟුරු නොවන) සඳහා පිරිවැය 2010 වසරේදී රු.11.78/ කි.වො.පැ.සිට රු.16.55/ කි.වො.පැ.දක්වා වැඩිවී ඇති අතර ස්වාධීන විදුලි බල නිෂ්පාදකයන්ගේ (ZPP) ජනන පිරිවැය 2010 වසරේදී රු.16.01/කි.වො.පැ.සිට 2011 වසරේදී රු.17.75/කි.වො.පැ.දක්වා වැඩි වී තිබේ.

මෙම තත්ත්වය මගින් 2011 වසරේදී විකුණු ඒකකයට (කි.වො.පැ.)රු.2.37 ක් වන සෘනාත්මක දායකත්වයක් ඇති කර ඇති අතර ලං.වි.ම. මූල්‍යමය ශක්‍යතාව හා ද්‍රවශීලතාව කෙරෙහි අහිතකර ලෙස බලපෑ අතර 2011 වසර අවසානයේදී රුපියල් බිලියන 19 ක ගිණුම්කරණ හානියක් මෙමගින් ඇති කර තිබුනි. රු.6.09/කි.වො.පැ. යන පිරිවැයකට ගල් අඟුරු බලාගාරයෙන් වැඩි ජනනයක් ලබාගත හැකි වූයේ නම් මෙම මූල්‍ය හානි අඩුකර ගත හැකිව තිබුනි. කෙසේ වුවද, 2011 මාර්තු මාසයේදී එහි කටයුතු ආරම්භ කළ ලක්විජය ගල් අඟුරු බලාගාරය සමාලෝචිත වසර තුලදී ඇති වූ තාක්ෂණික ගැටළු හේතුවෙන් එහි පූර්ණ විභවයෙන් ක්‍රියාත්මක වී නොතිබුනි.

ශේෂ පත්‍රයේ දක්වා ඇති දිනට මුළු ස්ථාවර වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 581 ක් විය. මෙමගින් ලං.වි.ම. මුළු වත්කම් ප්‍රමාණයෙන් 83% ක් නියෝජනය කෙරේ. එම නිසා වාර්ෂික ක්ෂය වීම් පිළිබඳව සැලිකිය යුතු ප්‍රමාණයක් වන රුපියල් බිලියන 18 ක්ද පූර්වයෙන් වාර්තා කර ඇති රුපියල් බිලියන 19 ක් වන ගිණුම්කරණ හානියේ ඇතුළත් කර ඇත.

අභිමානවත් අතීතයක සිට ස්ථිරසාර අනාගතයක් වෙත

3 වන සහස්‍රයේ පළමු ද්විත්ව දශකයෙන් ඔබ්බට අඛණ්ඩව ඉදිරියට යද්දී, ලං.වි.ම. විසින් සිදුවීම් දෙස සම්පූර්ණයෙන්ම වෙනස් දෘෂ්ටි කෝණයකින් බැලීම අවශ්‍ය වේ. අප වටා ඇති දර්ශන පථය ඉතිරි ලෝකය හා උරෙනුර ගැටෙමින් සිටීම අවශ්‍ය වේ. ලෝකය වැඩි වැඩියෙන් පරිසරය පිළිබව සවිඥාණක වන අතර තාක්ෂණය ඉතුරු ක්‍රියා කරයි. සම්ප්‍රදායික ඒකාධිකාරි සීමා තුළ ඉදි වූ අපගේ සුව පහසු කලාපවල විවේක ගැනීමට අපගේ වැනි පොදු ප්‍රයෝජනය සඳහා වූ සේවාවලට හැකි වූ කාලය මේ වන විට ගෙවී ගොස් ඇත. පාරිභෝගිකයන් වැඩි වැඩියෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් හා ඉල්ලීම් පිළිබඳව දැනුවත් වේ. ලං.වි.ම. සේවක මණ්ඩලයට මෙම අභියෝගය ජය ගත හැකි වන බව මා විශ්වාස කරන අතරම ,විදුලිබලය තුළින් දිවිය සරු කිරීම, සඳහා සංවිධානය 2020 වන විට ඉහළ මට්ටමට ගෙන යාමට ඔවුන් සමත් වනු ඇත.



බී.එන්.අයි.එෆ්.ඒ. වික්‍රමසූරිය

ලංවිම සම්ප්‍රේෂණ ජාලය



1207 මෙගවොට්
ලංවිම ජල විදුලිබල ධාරිතාවය

848 මෙගවොට්
ලංවිම තාප විදුලිබල ධාරිතාවය

3 මෙගවොට්
ලංවිම සුලං විදුලිබල ධාරිතාවය

16
ජල විදුලි බලාගාර සංඛ්‍යාව

07
තාප විදුලි බලාගාර සංඛ්‍යාව

01
සුලං විදුලි බලාගාර සංඛ්‍යාව

කි.වෝල්ත 220/132/33 ග්‍රිඩ් උපපොළ සංඛ්‍යාව	07
කි.වෝල්ත 132/33 සහ /කි.වෝල්ත 132/11 ග්‍රිඩ් උපපොළ සංඛ්‍යාව	51
කි.වෝල්ත 220 සම්ප්‍රේෂණ රැහැන් මාර්ග මුළු දුර	483 මාර්ග-කි.මී.
කි.වෝල්ත 132 සම්ප්‍රේෂණ රැහැන් මාර්ග මුළු දුර	1724 මාර්ග-කි.මී.
කි.වෝල්ත 132 යටි බහන් රැහැන් මාර්ග මුළු දුර	50 කි.මී.

11,528 ගි.වො.පැය
මුළු විදුලිබල ශක්ති ජනනය -2011

10,023 ගි.වො.පැය
මුළු විදුලිබල ශක්ති පරිභෝජනය

පුත්තලමේ ලක්විජය විදුලි බලාගාරය

ජනන අංශය

ජනන අංශය

ජනන අංශයඃ-

ලං.වි.ම.ට අයත් තාප හා ජලවිදුලි බලාගාර ක්‍රියාකරවීම හා නඩත්තු කිරීම පිළිබඳ වගකීම ලං.වි.ම. ජනන අංශය සතුය. මෙගා වොට් 1205 ක මුළු ස්ථාපිත ධරිතාවක් සහිත ජල විදුලි බලාගාර 16 කින්ද, මෙගා වොට් 548 ක ස්ථාපිත ධාරිතාවක් ඇති තෙල් - දහනය කරන විශාල තාප විදුලි බලාගාර 4 කින්ද, මෙගා වොට් 300 ක ධාරිතාවකින් යුතු ගල් අඟුරු - දහනය කරන බලාගාරයකින්ද යනාදී ලෙස ජනන වත්කම් මෙය සතුව ඇත. යාපනය අර්ධද්වීපය ඒ වටා ඇති හුදෙකලා වූ ජාලවලින් සමන්විත වන විදුලි බලාගාර කීපයක්ද ලං.වි.ම. මගින් ක්‍රියාත්මක කරයි. ඒ අනුව ලං.වි.ම. අයත් විදුලි බලාගාරවල මුළු ස්ථාපිත ධාරිතාව මෙගා වොට් 2058 කි. විවිධ කාර්යයන් සඳහා වගකිව යුතු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් එකොලොස් දෙනෙකු සමඟ අතිරේක සාමාන්‍යාධිකාරිවරයෙකු විසින් ජනන අංශය කලමණාකරණය කෙරේ. මහවැලි, ලක්ෂපාන, තාප විදුලිබල, වෙනත් ජල විදුලි බලාගාර සහ ගල් අඟුරු බලාගාර යනාදී ජනන සංකීර්ණ පහක් ලෙස ජනන අංශය සංවිධානය වී ඇත. බොහෝ කල් ගතවීම හා අඩු විශ්වසනීයතාව හේතුවෙන් සේවා කාලයේ අවසානයට ලඟා වී ඇති බවට හඳුනා ගත් ජනන වත්කම් පුනුරුත්ථාපනය සඳහා භාර ගැනීම ජනන ඒකකය යටතේ ඇති ජනන ව්‍යාපෘති ශාඛාව මගින් සිදු කෙරේ. බලාගාරවල ප්‍රධාන අළුත්වැඩියා කටයුතු සඳහා විශේෂඥ කාර්මික සහාය ජනන ඒකකයේ ජලවිදුලිබල හා තාප බලශක්ති වත්කම් කලමණාකරණ ශාඛා මගින් ලබා දෙයි. ජනන වත්කම්වල තත්ත්වය පිළිබඳ අඛණ්ඩව අධීක්ෂණය කෙරෙන අතර ජනන වත්කම්වල මෙහෙයුම් කාලය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිකාර්මික කටයුතු ක්‍රියාත්මක කෙරේ. ජනන ඒකකයේ වේලිවල සුරක්ෂිතතාව, පරිසර හා සිවිල් ව්‍යුහ නඩත්තු කිරීමේ ශාඛාව වේලි, ස්වභාවික හෝ කෘතිම ජලාශ, විදුලි බලාගාර වල බිම් ගෙවල් / උමඟ සහ විදුලිබල ජනනයට පහසුකම් සලසන අනෙකුත් අදාල ව්‍යුහයන් නඩත්තු කිරීම හා අඛණ්ඩව අධීක්ෂණය කිරීමේ වගකීම උසුලයි. තාප විදුලි බලාගාරවල පාරිසරික පිට කිරීම් පිලිබඳව ජාතික ප්‍රමිතීන්වලට අනුකූලව අඛණ්ඩව අධීක්ෂණය හා නඩත්තුව සිදු කෙරේ. උත්පාදන අංශයේ වාර්ෂික මෙහෙයුම් හා නඩත්තු අයවැය මත පදනම්ව ලං.වි.ම. බලාගාර සඳහා වූ ධාරිතාව හා බලශක්ති පිරිවැය නිර්ණය කිරීම පිලිබඳව හා ඒවා සම්ප්‍රේෂණ ඒකකයට හා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට (PUCSL) ට භාර දීම පිලිබඳව බලශක්ති විකුණුම් ශාඛාව වගකීම උසුලයි. එසේම සම්ප්‍රේෂණ ඒකකයට විදුලිබල බෙදාහැරීම් සඳහා ගෙවිය යුතු ගාස්තු අයකර ගැනීමට සම්ප්‍රේෂණ ඒකකයට මාසික ගනුදෙනු පිලිබඳ සටහන් ලබා දීම පිලිබඳවද වගකීම මෙම ශාඛාව උසුලයි. මානව සම්පත් කලමණාකරණය හා ජනන අංශයේ කාර්ය මණ්ඩල ප්‍රවර්ග පිලිබඳව සැලසුම් කිරීමේ වගකීම ජනන අංශයේ ඒකාබද්ධ කටයුතු පිලිබඳව ශාඛාවට පැවරී තිබේ. කාර්ය මණ්ඩලයේ කුසලතා හා ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම එයට ඇතුලත් වේ. සම්ප්‍රේෂණ ඒකකය යටතේ ඇති පද්ධති පාලන මධ්‍යස්ථානය මගින් බලාගාර පිලිබඳව කටයුතු කරන අතරතුර බලාගාරවල සියලුම නඩත්තු කටයුතු ජනන සංකීර්ණ පහේදී සිදු කෙරේ. පහත දක්වා ඇති පරිදි වසර තුලදී ලං.වි.ම. අයත් සියලුම ප්‍රධාන ජල විදුලි බලාගාර උපරිම අන්දමින් භාවිතයට ගැනීමට සිදු විය.

ලක්ෂපාන සංකීර්ණයඃ-

ලක්ෂපාන බලාගාර සංකීර්ණයේ ස්ථාපනය කරන ලද මුළු ධාරිතාව මෙගා වොට් 335 වන අතර දූරදර්ශී මහා ඉංජිනේරුවකු වන නැසී ගිය ඩී.ජේ. විමලසුරේන්ද්‍ර මහතාගේ යෝජනාවකින් අනතුරුව ඉදිකරනු ලැබූ පැරණි ලක්ෂපාන ජනන බලාගාරය ලෙස නම් කරනු ලැබූ මුල්ම හා ප්‍රධානතම ජලවිදුලි බලාගාරය ඇතුළුව ස්ථාන හතරක පිහිටා තිබෙන ජල විදුලිබල ජනන ස්ථාන පහකින් එය සමන්විත වෙයි. මෙම බලාගාර කැලණි ගඟේ අතු ගංගා දෙකක එක පෙළට පිහිටා තිබේ. විමලසුරේන්ද්‍ර හා පැරණි ලක්ෂපාන බලාගාර කෙහෙල්ගමුව ඔයෙන් පෝෂනය වන අතර කැනියොන් හා නව ලක්ෂපාන බලාගාර මස්කෙළිය ඔයෙන් පෝෂණය වේ. සමනල බලාගාරය සඳහා මෙම ගංගා දෙකේම ජලය අවසානයේදී භාවිත කෙරේ. මෙම සංකීර්ණයේ බලාගර පහත දක්වා ඇති වගුවේ දක්වා ඇති පරිදි ක්‍රියාත්මක වී තිබේ. ලක්ෂපාන සංකීර්ණයේ මුළු බලශක්ති ජනනය 2011 වසර තුලදී ගිගා වොට් පැය 1,365.2 ක් වූ අතර එය මුළු බලශක්ති ජනනයෙන් 12.6% ක් වේ.

	බලාගාරය	මුළු ජනනය (ගිගා වොට් පැය	භාවිත කළ හැකි ප්‍රමාණය (%)
1	පැරණි ලක්ෂපාන	258.4	95.7
2	නව ලක්ෂපාන	481.5	93.4
3	කැනියොන්	138.4	94.5
4	සමනල	384.6	92.9
5	විමලසුරේන්ද්‍ර	102.3	70.1
	මුළු එකතුව	**1,365.2**	

මහවැලි සංකීර්ණයඃ-

කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ, උකුවෙල, බෝවතැන්න හා නිලඹේ බලාගාරවලින් මහවැලි සංකීර්ණය සමන්විත වේ. සංකීර්ණයේ මුළු ස්ථාපිත ධාරිතාව මෙගා වොට් 666 ක් වේ. 2011 වසර තුළදී මහවැලි සංකීර්ණය ගිගා වොට් පැය 1984.9 ක් ජනනය කළ අතර එය මුළු ජනනයෙන් 18.4% ක් වේ. මෙම සංකීර්ණයේ බලාගාර පහත දක්වා ඇති පරිදි ක්‍රියාත්මක වේ.

	බලාගාරය	මුළු ජනනය (ගිගා වොට් පැය	භාවිත කළ හැකි ප්‍රමාණය (%)
1	කොත්මලේ	372.7	83.4
2	වික්ටෝරියා	747.0	93.2
3	රන්දෙණිගල	413.7	89.1
4	රන්ටැඹේ	205.4	97.7
5	උකුවෙල	157.5	80.9
6	බෝවතැන්න	78.7	90.0
7	නිලඹේ	9.9	98.9
	මුළු එකතුව	**1,984.9**	

ජනන අංශය

වෙනත් ජල විදුලි බලාගාර සංකීර්ණයඃ-

සමනළ වැව, කුකුලේ, ඉඟිනියාගල, උඩවලවේ හා හම්බන්තොට (සුළං) බලාගාරවලින් වෙනත් ජලවිදුලි බලාගාර සංකීර්ණ සමන්විත වේ. මෙම සංකීර්ණයේ ස්ථාපිත ධාරිතාව මෙගා වොට් 213 කි. 2011 වසර තුළදී වෙනත් ජලවිදුලි බලාගාර සංකීර්ණය මගින් ගිගා වොට් පැය 670.3 ක බලශක්තියක් ජනනය කරනු ලැබීය. (මෙය මුළු ජනනයෙන් 6.2% ක් වේ.) ඉඟිනියාගල හා උඩවලව මෙහෙයුම් ආකාර සම්පූර්ණයෙන්ම වාරි ජල නිදහස් කිරීම් මත රඳා පවතින නිසා බලාගාර සාධක ඉතා පහත මට්ටමක තිබෙන බව සටහන් කළ යුතුය. කෙසේ වුවද, 60 වසරක එහි මෙහෙයුම් ඉතිහාසය තුළදී ඉඟිනියාගල බලාගාරයෙන් වාර්තා වූ ඉහළම ජනනය වන ගිගා වොට් පැය 44.33 ක ජනනයක් 2011 වසර තුළදී නිපදවනු ලැබීය.
.

බලාගාරය		මුළු උත්පාදනය (ගිගා වොට් පැය	භාවිත කළ හැකි ප්‍රමාණය (%)
1	සමනළ වැව	293.8	91.6
2	කුකුලේගඟ	318.1	96.0
3	ඉඟිනියාගල	44.3	51.4
4	උඩවලවේ	11.4	26.8
5	සුළං (හම්බන්තොට)	2.7	1.0
මුළු එකතුව		**670.3**	

තාප බලාගාර සංකීර්ණයඃ-

කැළණිතිස්ස වායු ටර්බයින් (පීටී), කැළණිතිස්ස සීසීපීටී. සපුගස්කන්ද - ඒ හා සපුගස්කන්ද - බී බලාගාරවලින් තාප බලාගාර සංකීර්ණය සමන්විත වේ. සංකීර්ණයේ මුළු ස්ථාපිත ධාරිතාව මෙගා වොට් 540 ක් වේ. 2011 වසර තුළ තාප බලාගාර සංකීර්ණය මගින් ගිගා වොට් පැය 1,487 ක විදුලිබලයක් ජනනය කරනු ලැබීය. (මුළු ජනනයෙන් 13.77%)

බලාගාරය		මුළු උත්පාදනය (ගිගා වොට් පැය	භාවිත කළ හැකි ප්‍රමාණය (%)
1	කැළණිතිස්ස ගෑස් ටර්බයින් 7	243.7	44.5
2	කැළණිතිස්ස රාමු 5 ගෑස් ටර්බයින් 7	76.6	85.7
3	කැළණිතිස්ස සීසීපීපී වායු ටර්බයින්	248.9	44.9
4	කැළණිතිස්ස සීසීපීපී වාෂ්ප ටර්බයින්	6.8	44.9
5	සපුගස්කන්ද - ඒ	411.9	83.1
6	සපුගස්කන්ද - බී	499.1	84.6
මුළු එකතුව		**1,493.6**	

පුත්තලමේ ලක් විජය ගල් අඟුරු බලාගාරයඃ-

පුත්තලම ලක්විජය බලාගාරය

මෙගා වොට් 300 ක ධාරිතාවකින් යුත් ශ්‍රී ලංකාවේ පළමු ගල් අඟුරු බලාගාරය එහි වාණිජ මෙහෙයුම් කටයුතු 2011 ජූලි මාසයේදී ආරම්භ කරනු ලැබීය. 2011 ජූලි - දෙසැම්බර් කාල පරිච්ඡේදය තුළ මෙම බලාගාරයේ ගිගා වොට් පැය 1,038 ක විදුලිබලයක් උත්පාදනය කරනු ලැබීය. මෙම බලාගාරය ක්‍රියාත්මක කිරීමෙන් පසුව දෝෂ වගකීම් කාලයක් මෙම බලාගාරයට තිබුණු අතර ඉහත කාල සීමාව තුළ එය භාවිත කළ හැකි ප්‍රමාණය පිළිබඳ 82.1% ක සාධකයක් සහිතව ක්‍රියාත්මක විය. එම කාල සීමාව තුළ එම බලාගාරයේ සමස්ථ කාර්යක්ෂමතාව 31.5% ක් විය.

උත්පාදනය කිරීමේ පිරිවැයඃ-

සංකීර්ණය	ඉන්ධන රු.මිලියන	අමතර කොටස රු.මිලියන	වෙනත් රු.මිලියන
තාප	24,609.28	2,168.54	3,178.58
ජලවිදුලි	-	390.76	*6172.52
ගල්අඟුරු	7158.60	20.78	389.02
මුළු එකතුව	**31,767.88**	**2,217.12**	**9740.12**

*සෘජු වියදම් හැර පෞද්ගලික, ද්‍රව්‍යමය, නවාතැන්, ක්ෂයවීම් හා මූල්‍ය වියදම් වැනි සියළුම වියදම් වෙනත් වියදම්වලට ඇතුළත් වේ.

උත්පාදන පිළිබඳ සාමාන්‍ය පිරිවැය ලං.වි.ම. බලාගාර	
	ඒකක පිරිවැය/කිලෝවොට්
ජල විදුලි බලාගාර	1.63
තාප බලාගාර	20.33
ගල් අඟුරු බලාගාර	7.29 **

ගල් අඟුරු බලාගාරයේ ක්ෂයවීම් සැලකිල්ලට ගෙන නැත.

ජනන අංශය

ජනන ව්‍යාපෘති:-

ජනන අංශයේ විෂය පථය යටතට ගැනෙන බලාගාර පුනුරුත්ථාපන ව්‍යාපෘති කලමණාකරණය හා පරිපාලනය භාරව කටයුතු කිරීමේ වගකීම ජනන අංශයේ ජනන ව්‍යාපෘති ශාඛාවට පැවරී ඇත. එමෙන්ම ජනන අංශය සඳහා භාණ්ඩ හා සේවා පිළිබඳ සියලුම විදේශීය මිලදී ගැනීම් මෙහෙයවීමද උත්පාදන ව්‍යාපෘති ශාඛාවට පැවරී ඇත.

උකුවෙල බලාගාරය පුනුරුත්ථාපනය කිරීම:-

මෙම පුනුරුත්ථාපනය සඳහා ජපානයේ "Consortium of Mitsubishi Corporation සමාගම හා Indo East Engineering & Construction (Lanka) පුද්ගලික සමාගම සමඟ ලං.වි.ම. ගිවිසුමකට ඇතුළු විය. මෙම පුනුරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ, රු.මිලියන 1,800.00 ක මුළු පිරිවැයක් යටතේ බලාගාරයේ වඩා හොඳ කාර්යක්ෂමතාවක් හා විශ්වසනීය බවක් ඇති කර ගැනීමේ අරමුණින් ටර්බයින් යන්ත්‍ර හා ඒවායේ ආශ්‍රිත උපකරණ වෙනුවට වෙනත් උපකරණ යෙදවීම හෝ මෙම උපකරණ පුනුරුත්ථාපනය කිරීම සිදු කෙරේ. මෙම ව්‍යාපෘති පිරිවැයෙන් 85% ක ප්‍රමාණයක් සඳහා අපනයන ණය පදනම මත ජේබීඅයිසී ආයතනය මගින් අරමුදල් සැපයේ. 2008 පෙබරවාරි 15 වන දා මුදල් අමාත්‍යංශය හා ජේබීඅයිසී ආයතනය අතර ණය ගිවිසුම අත්සන් කරනු ලැබීය.

ඒකක - 1 යන්ත්‍රය පුනුරුත්ථාපනය කරනු ලැබූ අතර 2011 මැයි 4 වන දා වාණිජ මෙහෙයුමට එක් කරනු ලැබීය. ඒකක - 1 යන්ත්‍රය 2010 දී භාර දෙනු ලැබීය. අගෝස්තු මාසයේදී ටර්බයින් යන්ත්‍ර හා ජෙනරේටර් යන්ත්‍රවල කාර්යක්ෂමතා පරීක්ෂණ සිදු කරනු ලැබීය. ටර්බයින් යන්ත්‍රවල කාර්යක්ෂමතාව තක්සේරු කරන ලද සංඛ්‍යා ඒකකවලදී සහතික කරන ලද වටිනාකම සපුරාලිය. එමෙන්ම ජෙනරේටර් යන්ත්‍රවල විවිධ මෙහෙයුම් භාරවලදී ලබා ගන්නා ලද කාර්යක්ෂමතාව සහතික කරන ලද වටිනාකම වඩා යහපත් විය.

2011 අගෝස්තු මාසයේදී ව්‍යාපෘතිය 100% කින් සම්පූර්ණ වූ අතර ලං.වි.ම. භාර දෙනු ලැබීය. 2012 අගෝස්තු මාසයේදී කොන්ත්‍රාත්තුවේ දෝෂ වගකීම් කාලසීමාව අවසන් වේ.

විමලසුරේන්ද්‍ර හා නව ලක්ෂපාන බලාගාර පුනුරුත්ථාපනය කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ, නව ලක්ෂපාන (2xමෙගාවොට් 50) හා විමලසුරේන්ද්‍ර (2xමෙගාවොට් 25) බලාගාර යළි සකස් කර නවීකරණය කරනු ලැබේ. මෙම ගිවිසුම යටතේ, රු.මිලියන.6,500.00 ක පිරිවැයක් යටතේ ජෙනරේටරය, ටර්බයින් යන්ත්‍ර, පාලනය හා ආධාරක යන්ත්‍ර පුනුරුත්ථාපනය හෝ ඒ වෙනුවට වෙනත් කොටස් සවි කිරීම සිදු කරනු ලබයි. ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වන්නේ "Alsthom Hydro, France" ය. කොන්ත්‍රාත් වටිනාකමෙන් 85% ක් Credit Agricole CIB, France (මුලින් CALYON Corporate Investment Bank) මගින් අපනයන ණය කොන්දේසි මත සපයනු ලබන අතර ඉතිරි 15% හැටන් නැෂනල් බැංකුව මගින් අරමුදල් ලෙස ලබා දෙයි. 2008 පෙබරවාරි මාසයේදී ව්‍යාපෘති කටයුතු ආරම්භ කළ අතර 2013 අප්‍රේල් මාසය වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. 2011 දෙසැම්බර් මස අවසානයේදී සැලසුම් කිරීම 100% කින්ද, නිෂ්පාදනය 97% කින්ද, පරිශ්‍රය ඉදි කිරීම 50% කින්ද, යනාදී ලෙස ව්‍යාපෘති විෂය පථයෙන් 76% ක ප්‍රමාණයක් අවසන් කර තිබේ.

පැරණි ලක්ෂපාන බලාගාරය පුනුරුත්ථාපනය කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ පැරණි ලක්ෂපාන බලාගාරයේ ජෙනරේටරය, ටර්බයින් යන්ත්‍ර හා සියලුම ඒ හා ආශ්‍රිත උපකරණ වෙනුවට මෙගා වොට් 8.33 යන්ත්‍ර 3 ක් 1 වන අදියරේදී භාවිත කිරීම මගින් බලාගාරයේ විශ්වසනීයත්වය, කාර්යක්ෂමතාව හා ජීවන කාලය වැඩි දියුණු කිරීමට සැලසුම් කර ඇත. මෙම කොන්ත්‍රාත්තුව ඔස්ට්‍රියාවේ, Voith Hydro, ආයතනයට රු.මිලියන 4,200.00 ක මුළු පිරිවැයකට ප්‍රදානය කර ඇත. ව්‍යාපෘතිය මූල්‍යකරණය කිරීම, ඔස්ට්‍රියාවේ AG හි Unicredit බැංකුව මගින් අපනයන ණය කොන්දේසි මත 85% ක පිරිවැයක් සපයා දෙනු ලබන අතර ඉතිරි 15% හැටන් නැෂනල් බැංකුව මගින් සපයනු ලැබේ. 2010 මැයි මාසයේදී මෙම ව්‍යාපෘති කටයුතු ආරම්භ වූ අතර 2013 ජූනි මාසය අවසානයේදී අවසන් කිරීමට සැලසුම් කර ඇත. 2011 දෙසැම්බර් මාසය අවසානයේදී, සැලසුම් කිරීම 85% කින්ද, නිෂ්පාදනය 65% කින්ද, යනාදී ලෙස ව්‍යාපෘතියේ විෂය පථයෙන් 31% ක ප්‍රමාණයක් අවසන් කර තිබේ.

බඩු ඇනවුම් කිරීමේ ඒකකය

2011 වසර තුළදී, බලාගාර නඩත්තුව සඳහා එතෙර නිෂ්පාදකයන්ගෙන් අමතර කොටස් හා සේවා ලබා ගැනීම සඳහා රු.මිලියන 1,720 ක් වටිනා ඇණවුම් 201 ක් සිදු කර තිබේ.

නව ලක්ෂපාන ජල විදුලි බලාගාරය පුනුරුත්ථාපනය කිරීම.

සම්ප්‍රේෂණ අංශය

සම්ප්‍රේෂණ අංශය

සම්ප්‍රේෂණ අංශය

ඇතැම් ක්ෂේත්‍රවල ක්‍රියාකාරකම්වලින් ලං.වි.ම. යේ වෙනත් ඒකකවලට සේවා සපයන අතරතුර ලං.වි.ම. යේ සියලුම සම්ප්‍රේෂණ වත්කම් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, මෙහෙයවීම හා නඩත්තු කිරීම සම්ප්‍රේෂණ ඒකකය මගින් සිදු කෙරේ.

සම්ප්‍රේෂණ අංශයේ මෙහෙවර

පිළිගත හැකි පාරිසරික ප්‍රමිති අනුගමනය කරමින් හා සතුටුදායක ලාභ අනුපාතිකයක් උපයමින් සුදුසු ආකාරයෙන් ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික සංවර්ධනය සඳහා සුදුසු තාක්ෂණයක් භාවිතා කරමින් කුසලතා සහිත හා අභිප්‍රේරිත සේවකයන් සහිතව ඵලදායී හවුල්කාරිත්වයක් මගින් සම්ප්‍රේෂණ ජාලය ඵලදායී ලෙස හා කාර්යක්ෂම ලෙසත් සැලසුම් කිරීම, සංවර්ධනය හා මෙහෙයවීම මගින් විශ්වසනීය ලෙසත් ගුණාත්මකවත් විදුලිබලය තොග වශයෙන් සැපයීම මෙම ඒකකයේ මෙහෙවරයි.

සම්ප්‍රේෂණ අංශයේ අරමුණු

මෙම ඒකකයේ මෙහෙයුම් අරමුණු වන්නේ

- කාර්යක්ෂමව, සමායෝජිත, විශ්වසනීය, අරපිරිමැසුම්දායක සම්ප්‍රේෂණ ක්‍රමයක් වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම.
- විදුලිබලය ලබා ගැනීම හා බෙදා හැරීම පිළිබඳ බලපත් හිමියන්ට තොග වශයෙන් විකිණීම මගින් පාරිභෝගිකයන්ට සුරක්ෂිත, විශ්වසනීය හා අරපිරිමැසුම්දායී විදුලිබල සැපයුමක් තහවුරු කිරීම.
- විදුලිබලය සඳහා සාධාරණ ලෙස ප්‍රතික්ෂේපිත ඉල්ලුම සපුරා ගැනීමට විදුලිබල ජනන බලාගාර ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බව තහවුරු කර ගැනීම.
- කිලෝවෝල්ට් 132 සඳහා ±10%, කිලෝවෝල්ට් 220 සඳහා ±5%, සහ හර්ට්ස් 50 සඳහා ±1%, සංඛ්‍යාතයක් තුළ විචල්‍ය සම්ප්‍රේෂණ වෝල්ටීයතාවක් පවත්වා ගැනීම.

මෙහෙයුම් ක්‍රියාකාරකම්

සියලුම බලාගාර එක්කොට එහි පද්ධති පාලන මධ්‍යස්ථානය තුළින් ජාතික විදුලිබල පද්ධතියට සපයනු ලබන සියලුම විදුලිබලය ලබා දීම මගින් මෙම අංශය කිලෝ වෝල්ට් 220 හා කිලෝ වෝල්ට් 132 විදුලිබල පද්ධති ක්‍රියාත්මක කරයි. විශ්වසනීයත්වය, ගුණාත්මය හා මෙහෙයුම් අරපිරිමැස්ම ලඟා කර ගැනීම සඳහා ජනන හා සම්ප්‍රේෂණ ක්‍රම මෙහෙයවීම සැලසුම් කිරීම හා සිදු කිරීමට පද්ධති පාලන මධ්‍යස්ථානය මගින් සිදු කෙරේ. ජනන හා සම්ප්‍රේෂණ දත්ත ලේඛනාගාරගත කිරීම හා විධිමත් කලමණාකරණ තොරතුරු සැකසීමද මෙම අංශය මගින් සිදු කෙරේ.

පද්ධති පාලන මෙහෙයුම්

සියලුම බලාගාර එක්කොට ඈදා ගනිමින් කිලෝ වෝල්ට් 220 හා කිලෝ වෝල්ට් 132 විදුලිබල පද්ධති සමායෝජනය හා මෙහෙයවීම සඳහා පද්ධති පාලන ශාඛාව වගකීම් දරයි. විශ්වසනීයත්වය, ගුණාත්මය හා මෙහෙයුම් අරපිරිමැස්ම උපරිම කර ගැනීමේ අරමුණින් පද්ධති පාලන ශාඛාව මගින් ජනන හා සම්ප්‍රේෂණ පද්ධතියේ මෙහෙයුම සැලසුම් කර සිදු කරයි. මෙම ශාඛාව වාර්තා එක්රැස් කරන අතර ලං.වි.ම. උත්පාදනය හා සම්ප්‍රේෂණ පද්ධතිවලට අදාළ දත්ත ලේඛනාගාරගත කර විධිමත් පදනමක් මත කළමණාකරණයට තොරතුරු ලබා දෙයි.



දෛනික උත්පාදන චක්‍රය 2011.05.20

2010 වසරේදී 77.5% ක් වූ මුළු ජලවිදුලිබලය ගබඩා කිරීමට සාපේක්ෂව 88.1% වූ මුළු ජලවිදුලිබල ගබාඩා කිරීමක් (ගිගා වොට් පැය 1,110.4 ක්) සමඟ 2011 වසර ආරම්භ විය. පසුගිය වසරවලට සාපේක්ෂව පළමු මාස 4 තුළ ජල විදුලිබල ජලාශවලට ජලය ගලා ඒම ඉතා අධික විය. එම නිසා, පළමු කාර්තුව තුළ ලබා ගත හැකි ගබඩා කිරීම තුලිත කිරීමට ලං.වි.ම. මගින් ජල විදුලිබල උත්පාදනය උපරිමකරණය කරනු ලැබීය. නමුත් ඉන්පසුව නිරිත දිග මෝසම් වැසි අඩු වීමෙන් ජලවිදුලිබලය ගබඩා කිරීම කැපී පෙනෙන පරිදි අඩු විය. 2011 ජූලි 24 වන දා වාර්තා වූ අවම ගබඩා කිරීම ගිගා වොට් පැය 275.5 (මුළු ගබඩා කිරීමෙන් 21.9%). ජලවිදුලිබල ජලාශවලට ජලය ලැබීම අඩු කරමින් ඊසාන දිග මෝසම් වැසිද අල්ප බව නිරීක්ෂණය කළ හැකි විය.

පසුගිය වර්ෂවලට සාපේක්ෂව ජලවිදුලි බල ජලාශවලට ජූලි, අගෝස්තු, ඔක්තෝම්බර් හා නොවැම්බර් මාසවල ලැබුනු වර්ෂාව ඉතා අඩු විය. වසරේ අවසන් කොටස තුළද ගබඩා කිරීම ආන්තික ලෙස පමණක් වැඩි වූ අතර වර්ෂ අවසානයේ ගබඩා කිරීම ගිගා වොට් පැය 657.1 ක් වැනි අඩු ප්‍රමාණයක් විය.

2011 වසරේදී, 2011 මැයි 20 වන දා වාර්තා වූ උපරිම විදුලිබල ප්‍රමාණය මෙගා වොට් 2,163.1 ක් විය. එය 2010 වසරට සාපේක්ෂව 10.7% ක වැඩි වීමක් විය. 2010 වසරට සාපේක්ෂව මෙම වසර සඳහා මුළු බලශක්ති උත්පාදනය (ගිගා වොට් පැය 11,527.8 ක් වූ අතර එය 7.6% ක වැඩි වීමක් විය.

පද්ධති පාලන මධ්‍යස්ථාන නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය

පද්ධති පාලන මධ්‍යස්ථානය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය පැකේජ 2 කින් ක්‍රියතේමක කරනු ලබයි. ඒ - පැකේජය යටතේ, නව්‍ය ස්කාඩා හා බලශක්තිය කළමණාකරණ පහසුකම් සමග නව්‍ය පද්ධති පාලන මධ්‍යස්ථානයක් ශ්‍රී ජයවර්ධනපුරයේ ඉදි කෙරේ. ඒ පැකේජයේ හක්ෂ හා දත්ත සන්නිවේදන අවශ්‍යතා සැපයීම සඳහා ප්‍රකාශ තන්තලයක් මුළු දිවයින පුරා බී පැකේජය ලෙස ක්‍රියාත්මක කරනු ලබයි. මෙම පැකේජ දෙකම ක්‍රියාත්මක කිරීමේදී උපදේශක, එක්සත් රාජධානියේ PB Power ආයතනය ලං.වි.මණ්ඩලයට සහය ලබා දෙයි. දැනට පවතින පද්ධති පාලන මධ්‍යස්ථානය 1984 වසරේදී ආරම්භ කරනු ලැබූ අතර සම්ප්‍රේෂණ ජාලයෙන් 60 % ක් පමණක් එමගින් අධීක්ෂණය කරනු ලබයි. නව පද්ධති පාලන මධ්‍යස්ථානයට ලං.වි.ම. යේ කි.වෝල්ට් 132/220 සම්ප්‍රේෂණ ජාල අධීක්ෂණය කිරීමේ හා පාලනය කිරීමේ හැකියාව ලැබෙනු ඇත. පාරිභෝගිකයාට වඩාත් කාර්යක්ෂම ප්‍රභවයක් භාවිතා කරමින් විශ්වසනීය බලශක්ති පද්ධතියක් නඩත්තු කිරීම අවශ්‍ය වන බැවින් සියලුම සම්ප්‍රේෂණ විදුලිබල පද්ධති උප පොළ හා බලාගාර පද්ධති පාලන මධ්‍යස්ථානය මගින් අධීක්ෂණය කිරීමට හා පාලනය කිරීමට එමඟින් හැකි වේ.

ඒ - පැකේජයට සැපයුම් ලබා ගැනීම සඳහා වූ ටෙන්ඩරය 2011 දී

සම්ප්‍රේෂණ අංශය

ප්‍රසිද්ධ කරනු ලැබීය. කෙසේ වුවද, ලං.වි.ම. අවශ්‍යතා සෑහෙන ප්‍රමාණයකින් ලබා දීමට කිසිදු ටෙන්ඩර්කරුවෙකුටවත් නොහැකි වීම නිසා 2012 වසරේදී නැවතත් ටෙන්ඩර් ප්‍රසිද්ධ කිරීමට සිදු විය.

බී - පැකේජය යටතේ කිලෝ වෝල්ට් 132/220 සම්ප්‍රේෂණ ජාල සම්බන්ධයෙන් පවත්නා දෘෂ්‍ය විදුලි භූ තන්තුව (OPGW) ඉවත් කරනු ලබන්නේ ලං.වි.ම. සඳහා දිවයින පුරා සන්නිවේදන ආධාරකයක් සකස් කර ගැනීම සඳහාය. ඉදිරි වර්ෂ 20 ක කාලය සඳහා සියලුම අනාගත සන්නිවේදන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් අතිරේක ධාරිතාවක් සමඟ එක් එක් දෘෂ්‍ය විදුලි භූ තන්තුව සම්බන්ධකයක් මැද රැහැන් 24 ක් ඇති තන්තුවලින් සමන්විත විය.

2010 දෙසැම්බර් මාසයේදී, බී - පැකේජය සඳහා සැපයුම් වෙනුවෙන් ටෙන්ඩර් ප්‍රසිද්ධ කළ අතර 2011 මැයි මාසයේදී ටෙන්ඩර් කැඳවීම අවසන් කරනු ලැබීය. 2012 මුල් කාලයේදී ටෙන්ඩරය ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වන අතර ටෙන්ඩරයේ විෂය පථය ක්‍රියාත්මක කිරීමට කොන්ත්‍රාත්කරුට මාස 18 ක් තිබේ.

පද්ධති පාලන මධ්‍යස්ථාන නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයනු ලබන්නේ පිරිසිදු බල ශක්ති හා වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය යටතේය.

සම්ප්‍රේෂණ වත්කම්

සම්ප්‍රේෂණ ජාලයේ බලාගාර හා උපකරණවලින් උපරිම වාණිජ වාසි ලබා ගැනීම පිළිබඳව සම්ප්‍රේෂණ අංශයේ වත්කම් කළමණාකරණ ශාඛාව වගකිව යුතුය. නඩත්තුව පිළිබඳ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සැකසීම, මෙහෙයුම් ඵලදායිතාව තහවුරු කර ගැනීමට හා වත්කම්වල අරපිරිමැසුම්දායී ජීවන කාලය උපරිම කර ගැනීමට බලාගාරවල

කොටුමා උපපොළ - වවුනියාව

කාර්ය සාධනය හා නඩත්තු කටයුතු ඵලදායී අන්දමින් අධීක්ෂණය කිරීම සම්බන්ධව එය ක්‍රියාත්මක වෙයි. ප්‍රයෝජනවත් ජීවිත කාලය අවසානයේදී වත්කම් වෙනුවට වෙනත් වත්කම් ආදේශ කිරීමට සැලසුම් කිරීම වැදගත් වත්කම් කළමණාකරණ කටයුත්තකි.

කිලෝ වෝල්ට් 132 හා කි.මී.1,704.2 ශීර්ෂ රැහැන්, කිලෝ වෝල්ට් 132 හා කි.මී.47.6 භූගත රැහැන්, කිලෝ වෝල්ට් 220 හා කි.මී.484 ශීර්ෂ සම්ප්‍රේෂණ රැහැන් හා කිලෝ වෝල්ට් 220 හා කි.මී.2 භූගත රැහැන්වලින් අධි වෝල්ටීයතාවෙන් යුත් සම්ප්‍රේෂණ ජාලය සමන්විත වේ. එයට අමතරව, 2011 වසර අවසන් වන විට ක්‍රියාත්මකව පැවති විදුලි උපපොළ 54 ක් අමතර කොටස්, උපකරණ හා මෙවලම් සම්ප්‍රේෂණ ඒකකය සඳහා සැපයුම් කිරීම සහ භාවිතයට ගත නොහැකි සම්ප්‍රේෂණ වත්කම්වලට සුදුස්සක් කිරීම සම්ප්‍රේෂණ වත්කම් කළමණාකරණ ශාඛාවේ වෙනත් ප්‍රධාන කාර්යයන් වේ. එයට අමතරව, කොටුගොඩ ගබඩාවේදී ඉන්වෙන්ටරි භාණ්ඩ හා මෙහෙයුම් ක්‍රියාකාරකම් පරිගණකගත කිරීම ඇතුළත්ව ප්‍රධාන පුනරුත්ථාපන හා පුළුල් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතී.

සම්ප්‍රේෂණ ජාලයේ මෙහෙයුම හා නඩත්තුව

එදිනෙදා නඩත්තු කටයුතු හා විදුලිබල උප පොළවල විදුලිය ක්‍රියා විරහිත කාලය තුළ හා කිලෝ වෝල්ට් 132/220 සම්ප්‍රේෂණ රැහැන්වල කටයුතුවලට මෙහෙයුම් හා නඩත්තු ශාඛාව සහභාගි වෙයි. ඊට අමතරව, "on-load tap changer" නඩත්තුව හා කිලෝ වෝල්ට් 132/220 පරිපථ බිඳිනය සුපරීක්ෂාකාරීව බැලීම හා අවශ්‍ය නම් අලුත්වැඩියා කිරීම වැනි විශේෂ නඩත්තු කටයුතු ද මෙම ශාඛාව මගින් සිදු කෙරුණි.

මෙහෙයුම් හා නඩත්තුව - කොළඹ ඒකකය

2011 සිදු කළ ප්‍රධාන කාර්යයන්වලට

- ට්‍රාන්ස්ෆෝමර් පාදක නලයක් ඉදි කිරීම ඇතුළුව නව කිලෝ වෝල්ට් 132/33 හා 31.5MVA විදුලිබල තරාපැවියක් සපුගස්කන්ද විදුලි උප පොළේ සවි කිරීම, පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- අත්තිවාරම් හා වානේ ව්‍යුහයන් ඉදි කිරීමද ඇතුළුව බියගම විදුලිබල උප පොළේ පරිපථ බිඳිනයක් සඳහා වෙනත් කොටස් සවි කිරීමක් ලෙස SF6 පරිපථ බිඳනයක් හා ධාරා තරාපැවියක් සවි කිරීම, පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- දෝෂ සහිත කිලෝ වෝල්ට් 36 SF6 පරිපථ බිඳින අලුත්වැඩියා කිරීම හා කොස්ගම, පානදුර, කොලොන්නාව විදුලිබල උප ස්ථාන වල සවි කිරීම.

- රත්මලාන විදුලිබල උපස්ථානයේ කිලෝ වෝල්ට් 132/33, 31.5 මෙ.වො.ඇ. විදුලි බල තරාපැවියේ සම්පූර්ණ ගෑස්කට් කට්ටලය ආදේශ කිරීම.

මෙහෙයුම් හා නඩත්තුව * මහනුවර ඒකකය

සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ඒකකයේ මහනුවර ඒකකය විදුලිබල උපස්ථාන 6 ක සියලුම උපකරණ වල වාර්ෂික නිවාරක නඩත්තු කටයුතු සාර්ථකව අවසන් කරනු ලැබූ අතර කිලෝවෝල්ට් 220 හා කි.මී.670 හා කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන්වල මංවර නඩත්තු කටයුතු කටයුතු සාර්ථකව අවසන් කර ඇත.

ඉහත එදිනෙදා කටයුතුවලට පරිබාහිරව, පසුගිය වසර තුළ පහත සඳහන් විශේෂ කටයුතු සැලසුම් කර සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබීය.

- දත්ත පවරා ගැනීමේ ක්‍රමය කිලෝ වෝල්ට් 132 කුරුණෑගල රැ හැන් අංක 2 සහ කිරිබත්කුඹුර විදුලි උප ස්ථානවල කිලෝ වෝල්ට් 33 H4 හා H2 යන පෝෂක වල 2011 වසරේදී නියමු ව්‍යාපෘතියත් ලෙස ක්‍රියාත්මක කරන ලදි. 2012 වසරේදී කිලෝ වෝල්ට් 132 හා කිලෝ වෝල්ට් 33 වෙනත් සියලු පහත් බිම්වල මෙය ක්‍රියාත්මක කරනු ඇත.

සම්ප්‍රේෂණ අංශය

- 2011 අයිසීසී ලෝක කුසලාන තරඟාවලියට පෙර සියලුම ස්විච්ගියර් ආරක්ෂාව හා පාලනය පරීක්ෂා කරන ලද අතර ගැටළු නිරාකරණය කරනු ලැබීය. එමඟින් 2011 ලෝක කුසලාන තරඟාවලිය තුළ විශ්වසනීය විදුලිබල සැපයුමක් ගත හැකිවිය.

- විදුලබල උපස්ථානවල පාලන කාමරයේ යන්ත්‍ර ක්‍රියාකරුවන් හා ඔවුන්ගේ උදව්කරුවන් සියලු දෙනාට දැනුවත් කිරීමට කාර්මික හා උපකාරක පුහුණු වැඩසටහනක් දෙවරක්ම පවත්වනු ලැබීය. අපගේම කාර්ය මණ්ඩලය සම්පත් දායකයන් ලෙස යොදවා ගනිමින් විදුලිබල පද්ධතියේ උපකරණ ක්‍රියා කරවීම, සුරක්ෂිතතාව, ගිනි නිවීම හා එස් පහ යන මාතෘකා පිළිබඳව පුහුණු කාල සීමාව තුළ සාකච්ඡා කරනු ලැබීය.

- කිරිබත්කුඹුර හා තුල්හිරිය විදුලිබල උපස්ථානවල එස් පහ ක්‍රමය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලැබීය.

- බදුල්ල විදුලිබල උපස්ථානයේ කිලෝ වෝල්ට් 33 පරිපථ බිඳින කණුවල ගෑස් කාන්දුවීම් අලුත්වැඩියා කරනු ලැබීය.

- කුරුණෑගල විදුලිබල උපස්ථානයේ අංක 1 දරණ තරාපැවියේ "online tap changer" එකේ හැරවුම් ස්විචය සර්විස් කරනු ලැබීය.

- අම්පාර විදුලිබල උපස්ථානයේ පිහිටි 31.5 හා කිලෝ වෝල්ට් 132/33 විදුලිබල තරාපැවි දෙකේ අපගේ කාර්ය මණ්ඩලය විසින්ම තීන්ත ආලේප කරනු ලැබීය. තරාපැවි අංක 2 දෝෂ සහිත "buchholz relay" එක ඉවත් කර නව "relay" එකක් සවි කරනු ලැබීය.

ජීව රැහැන් නඩත්තු ඒකකය

දැනට දිවයින පුරා ක්‍රියාත්මක වන කාණ්ඩය එකට අයඳුනු විදුලි උපකරණ සමූහ 8 ක් ජීව රැහැන් නඩත්තු ඒකකයකට අයත්ව ඇත. එක් එක් විදුලි අධිකාරීවරයාට වෙන් කර ඇති සම්ප්‍රේෂණ රැහැන් විශේෂිත ප්‍රමාණයක් ඇති අතර 2011 - නඩත්තු කටයුතු සැලැස්මට අනුව එදිනෙදා නඩත්තු කටයුතු ඔවුන් විසින් සිදු කරනු ලබයි.

එදිනෙදා නඩත්තු කටයුතුවලට අමතරව, හානි වූ කන්ඩක්ටර්ස් අලුත්වැඩියා කිරීම, බිම් කම්බි හා පීනු වෙනුවට වෙනත් ඒවා සවි කිරීම, "earth mast" අලුතෙන් සවි කිරීම, අත්හැර දමන ලද කුළුණු ඉවත් කිරීම, "bus bars" ඉවත් කිරීම, "down droppers" අලුතෙන් සවි කිරීම ආදිය 2011 වසර තුළදී සිදු කරනු ලැබීය.

වසර තුළදී ජීව රැහැන් නඩත්තු ඒකකය මගින් සිදු කරන ලද විශේෂ කටයුතු පහත සඳහන් වේ.

- කුකුලේ - මතුගම කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන්, කුළුණු 78 හා 77 අතර 2 - පරිපථයේ bottom conductor කැඩී යාම.

- සපුගස්කන්ද ප්‍රාථමික උපපොළෙහි " Earth mast" අළුතින් සවි කිරීම.

- කෙරවළපිටිය උපපොළෙහි "Bus bars" ඉවත් කිරීම.

- නව කිලෝ වෝල්ට් 132 වව්නියා - චුන්නාකම් සම්ප්‍රේෂණ රැහැන් ඉදි කිරීම සඳහා අත්හැර දමන ලද කුළුණ ඉවත් කිරීම.

- කටුනායක - බෝලවත්ත බිම් කම්බිය අළුතින් සවි කිරීම, කුළුණු 9 හා 16 අතර පිහිටි කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන අළුතින් සවි කිරීම.

- කැළණිතිස්ස උපපොළෙහි ලණු අමුණන ලද "Bus bars" වලින් කොත්මලේ - බියගම සම්ප්‍රේෂණ රැහැන්වල ඉවත් කිරීම.

- 1 වන පරිපථයේ 3 වන කුළුණ කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැනේ ලක්ෂපාන - පොල්පිටිය පීනු රැහැන එක ඉවත් කර ඒ වෙනුවට විදුලි රැහැනක් යෙදීම.

- කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැනේ කිරිබත්කුඹුර - පොල්පිටිය කුළුණු අංක 85 - 87 අතර නව සන්නායකයක් සවි කිරීම.

- කිරිබත්කුඹුර අවසාන Y අදියරේ කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැනේ කිරිබත්කුඹුර - පොල්පිටියේ "down dropper" පැරණි එක ඉවත් කර ඒ වෙනුවට නව "down dropper" දැමීම.

- සන්නිවේදන කටයුතු සඳහා ගාල්ල - බලංගොඩ සම්ප්‍රේෂණ රැහැනේ නව "down dropper" එකක් සවි කිරීම.

- කුළුණු අංක 12 හා 13 අතර සන්නායකයට හානි වීම හේතුවෙන් කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන, පොල්පිටිය - කොලොන්නාව බිඳ වැටීම නිවැරදි කර ගැනීම.

- පන්නල හෙරුවේ කුළුණු අංක 5 හා 8 අතර බිම් කම්බියක් යෙදීම. 2011 වසරේදී සුළි කුණාටුව හේතුවෙන් බිඳ වැටීමකට භාජනය වූ දකුණු පළාතේ බෙදා හැරීමේ පද්ධතියේ නිවැරදි කිරීම් කටයුතුවලදී ජීව රැහැන් නඩත්තු කිරීමේ කාණ්ඩය එකට ඇදුණු විදුලි උපකරණ සියල්ලම සහය කර ගැනීමට හැකි විය.

උත්පාදන සැලසුම් කිරීම.

ලං.වි.ම. දිගු කාලීන ජනන පුළුල් කිරීමේ සැලැස්ම නව්‍ය සංවර්ධන තත්ත්වයේ උපකරණ හා තාක්ෂණික ක්‍රම භාවිත කරමින් සම්ප්‍රේෂණ හා ජනන සැලසුම් කිරීමේ ශාඛාව යටතේ ජනන සැලසුම් කිරීමේ අංශය මගින් සකස් කරනු ලැබූ විධිමත් අදියර ඔස්සේ කලක් ක්‍රියාත්මක වූ සැලැසුමකි.

මොරගොල්ල ජලාශය සඳහා යෝජිත ස්ථානය.

සම්ප්‍රේෂණ අංශය

පළමු පියවර ලෙස මෙම ශාඛාව විසින් ජාතික ඉල්ලුම පිළිබඳ පුරෝකථන සකස් කරයි. අපේක්ෂිත විශ්වසනීය මට්ටමේ හා පාරිසරික සාධක තුළ පුරෝකථනය කළ විදුලිබල ඉල්ලුම සැපිරීමට දී ඇති තාප හා ජල විදුලිබල ජනන පුළුල් කිරීමේ ඉල්ලුම්කරුවන් අතරින් අවම පිරිවැය යටතේ ආර්ථික වශයෙන් ප්‍රශස්ථ කම්හල් එකතු කිරීමේ ක්‍රියාවලිය ජනන සැලසුම් අධ්‍යයන මගින් සිදු කෙරේ. අලුත්ම ජනන පුළුල් කිරීමේ සැලසුම් අධ්‍යයනවලට අනුව, 2011 - 2025 කාලසීමාව සඳහා ගල් අඟුරු පිළිස්සීමෙන් ජල විදුලිබලය නිපදවීමේ කම්හල්වලින් මෙගා වොට් 3,700 ක විදුලිබල ධාරිතාවක් සහිතව ඉදිරි වසර 15 සඳහා ජාතික විදුලිබල පද්ධතියට දළ වශයෙන් මෙගා වොට් 4,250 ක එකතු කිරීමක් කළ යුතු බවට අපේක්ෂා කෙරේ.

ජනන සැලසුම් කිරීමේ ඒකකය මූලික ලියන මේසයේ අධ්‍යයන වල සිට යෝජිත ජනන ව්‍යාපෘති සඳහා සවිස්තර ශක්‍යතා අධ්‍යයන යන පරාසයක විවිධ අධ්‍යයන ක්‍රියාත්මක කිරීමේදී ලං.වි.ම. හා සමාන ආකාරයෙන් ඒවා ක්‍රියාත්මක කිරීම හා ඒ පිළිබඳව කටයුතු කිරීම සිදු කරයි.

මේ සම්බන්ධයෙන් අනාගත ජනන පුළුල් කිරීම සඳහා නව්‍ය විවිධ අංශ 2 ක් පිළිබඳව අධ්‍යයන කටයුතු සඳහා මූලික කටයුතු 2011 වර්ෂයේදී ආරම්භ විය. ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනය (JICA) මගින් අරමුදල් සපයන බලශක්ති නානාංගකරණ වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතියේ 1 වන අදියර (LNG සඳහා ශක්‍යතා අධ්‍යයනය) හා "Pump Storage Hydro" පිළිබඳව ශක්‍යතා අධ්‍යයන මෙයට ඇතුළත් වේ.

මෙයට අමතරව, අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල (KFAED) මගින් අරමුදල් සපයනු ලබන මොරගොල්ල ජල විදුලිබල ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනවල පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) පිළිබඳ කටයුතු 2011 වසරේදී ආරම්භ වූ අතර ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ශක්‍යතාව හා විස්තරාත්මක මුල් සැලසුම සමාලෝචනයට උපදේශාත්මක සැලසුම් ලබාදීම හා මොරගොල්ල ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම 2011 වසරේදී ආරම්භ විය.

සම්ප්‍රේෂණ සැලසුම් කිරීම

සම්ප්‍රේෂණ පද්ධතියේ නව්‍ය අවශ්‍යතා හා ඉල්ලුම සපුරාලීමට 10 අවුරුදු විධිමත් අදියරවලින් යුත් කලක් තිස්සේ ක්‍රියාත්මක වන සැලැස්මක් ලෙස දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන අධ්‍යයන සිදු කරනු ලැබේ. අභිමත සැලසුම්කරණ කාල පරිච්ඡේදය සඳහා විශ්වසනීය හා ස්ථාවර බලශක්ති පද්ධතියක් ලබා දීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන සම්ප්‍රේෂණ සංවර්ධන අවස්ථා පද්ධතියක් සකස් කිරීම හා මෙම සම්ප්‍රේෂණ සංවර්ධන අවස්ථා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ආයෝජන පිරිවැය තක්සේරු කිරීම සම්ප්‍රේෂණ සැලසුම්කරණ ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණු වේ.

2011 - 2020 දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම 2012 - 2020 කාල පරිච්ඡේදය සඳහා සම්ප්‍රේෂණ සංවර්ධණ ව්‍යාපෘති 51 ක් හඳුනා ගනියි. වැඩි ප්‍රමුඛත්වයක් හිමි වන ව්‍යාපෘති කීපයක් සඳහා අරමුදල් සැලසුම් කර ඇත. කොළඹ - බී - විදුලිබල පද්ධතියේ උප පොළ ඉදි කිරීම, පන්නිපිටියේ ධාරිත්‍රක පේළියක් සවි කිරීම, ශ්‍රී ජයවර්ධනපුර, හම්බන්තොට හා රන්ටැඹේ විදුලිබල පද්ධතියේ උප පොළවල් විශාලනය කිරීම ඒවාට ඇතුළත් වේ. හබරණ - වේයන්ගොඩ කිලෝ වෝල්ට් 220 සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය සඳහා අරමුදල් ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනය මගින් සැලසුම් කර ඇත.

සම්ප්‍රේෂණ සැලසුම හා පරිසරය

සැලසුම් කර ඇති සම්ප්‍රේෂණ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මූලික කටයුතු සම්ප්‍රේෂණ සැලසුම් හා පාරිසරික ශාඛාවේ සැලසුම් අංශය මගින් සිදු කරනු ලබයි. සම්ප්‍රේෂණ රැහැන් ඇදීමට සුදුසු බිම් තීරු හඳුනා ගැනීම, උප පොළවල් සඳහා ඉඩම් හඳුනා ගැනීම, සංකල්පනාත්මක සැලසුම් සකස් කිරීම, සම්ප්‍රේෂණ ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම මෙයට ඇතුළත් වේ. ක්‍රියාත්මක කිරීමේ අදියර තුළ ඉදි කිරීම් ඇඳීම් පිළිබඳ සමාලෝචනය කිරීම හා ද්‍රව්‍ය හා උපකරණවල තාක්ෂණික අනුකූල වීම පිළිබඳව පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ. මෙයට අමතරව, අවශ්‍ය අවස්ථාවල සැලසුම් කටයුතු සඳහා සම්ප්‍රේෂණ අංශයේ අභ්‍යන්තර උපදේශකවරුන්ගේ කාර්යභාරය සම්ප්‍රේෂණ සැලසුම් ඒකකය මගින් ඉටු කරයි.

සම්ප්‍රේෂණ සැලසුම්කරණය

2011 දී සම්ප්‍රේෂණ සැලසුම් ශාඛාව මගින් පවරා ගන්නා ලද කටයුතු පහත දැක්වේ.

- උතුරු නැගෙනහිර විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය ඒ ලොට්, බී ලොට්, හා සී ලොට්, නව ගාලු සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය ඒ ලොට්, බී ලොට් ජාතික පද්ධති පාලන මධ්‍යස්ථාන නවීකරණය ව්‍යාපෘතිය) පැකේජය සහ සුළං බලය එකතු කිරීමේ උප පොළ) නොරොච්චෝලෙයි.

- බෙලිඅත්ත විදුලිබල පද්ධති උප පොළ ව්‍යාපෘතිය හා මහ කොළඹ විදුලිබල පද්ධති උප පොල ඉදි කිරීම් සැලසුම් සමාලෝචන, කොටුගොඩ පුළුල් කිරීමේ ව්‍යාපෘතිය, කිලිනොච්චි - චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය, වව්නියා- කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය, සම්ප්‍රේෂණ පද්ධති ශක්තිමත් කිරීමේ විදුලිබල පද්ධති උප පොළ ව්‍යාපෘතිය, සම්ප්‍රේෂණ පද්ධති ශක්තිමත් කිරීමේ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය, සම්ප්‍රේෂණ පද්ධති ශක්තිමත් කිරීමේ නැගෙනහිර පළාත් ව්‍යාපෘතිය, ප්‍රතිභාවිත බලශක්ති ව්‍යාපෘතිය හා සුළං එකතු කිරීමේ උප පොළ නොරොච්චෝලෙයි බලපෑම අඩු කිරීම සඳහා විදුලිබල පද්ධතියේ උප පොළවල් විශාලනය කිරීම.

- කොළඹින් පිටත වටරවුම් හා පදික මාරු සඳහා සම්ප්‍රේෂණ රැහැන් වෙනත් මඟකින් ගෙන යාම සඳහා සංශෝධිත තක්සේරු පිළියෙල කිරීම. (බියගම - කැළණිතිස්ස, කිලෝවෝල්ට් 220 රැහැන, පොල්පිටිය කොලොන්නාව 3 හා 4 රැහැන්, පොල්පිටිය - කොලොන්නාව 1 හා 2 රැහැන්, බියගම - පන්නිපිටිය කිලෝ වෝල්ට් 220, බියගම - සපුගස්කන්ද බලාගාරය කිලෝ වෝල්ට් 132, බියගම - කොටුගොඩ කිලෝ වෝල්ට් 220)

- හම්බන්තොට, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ බී හා කොළඹ සී විදුලිබල පද්ධති උප පොළවල් වැඩිදියුණු කිරීම සඳහා සංකල්පනාත්මක සැලසුම් වාර්තා පිළියෙල කිරීම සිදු කරන ලදි.

ආරක්ෂණ වැඩි දියුණු කිරීම විශ්වනීයබව

ඉහළම අන්තර්ජාතික ප්‍රමිතිවලට අනුව බලාගාරවල සිට බෙදා හැරීම් පද්ධති දක්වා වන සම්ප්‍රේෂණ ජාලය සඳහා සමායෝජිත හා විශ්වසනීය ආරක්ෂණ පද්ධතියක් වැඩි දියුණු කිරීම සම්ප්‍රේෂණ සැලසුම් හා පාරිසරික ශාඛාවේ ආරක්ෂාව වැඩිදියුණු කිරීමේ අංශයේ අරමුණයි. අවශ්‍ය ආරක්ෂණ න්‍යාය ශාස්ත්‍රය අර්ථ දැක්වීම හා පවත්වා ගැනීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. නව්‍ය සම්ප්‍රේෂණ ව්‍යාපෘති යටතේ ආරක්ෂණ වැඩි දියුණු කිරීමේ කටයුතු කලමණාකරණය

සම්ප්‍රේෂණ අංශය

කිරීම මෙම අංශයට පැවරී ඇත. නව ව්‍යාපෘති යටතේ ජාල පුළුල් කිරීමේ කොටසක් ලෙස ආරක්ෂණ යෝජනා ක්‍රම නවීකරණය කිරීම්ද මෙමගින් සිදු කෙරේ. සම්ප්‍රේෂණ ජාලයේ සිදුවන සම්පූර්ණ හෝ කොටසක අකර්මන්‍ය වීම පිළිබඳ අකර්මන්‍ය වීම පිළිබඳ විශ්ලේෂණ සිදු කිරීමද, පද්ධතියේ විශ්වසනීය කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට වැරදි නිවැරදි කිරීමේ හෝ වරද සිදුවීම වැළැක්වීමේ පියවර ගැනීමද මෙම අංශය මගින් සිදු කෙරේ.

අකර්මන්‍යවීම් විශ්ලේෂණය

මෙම වසර තුළ සම්පූර්ණ අකර්මන්‍යවීම් සිදු වූයේ නැත. 2011 අප්‍රේල් 19 වන දින ප්‍රධාන කොටසක අකර්මන්‍ය වීමක්ද සුළු කොටසක අකර්මන්‍ය වීම් ගණනාවක්ද මෙම වසර තුළ සිදු විය. මෙම අකර්මන්‍යතා පිළිබඳව විශ්ලේෂණය කළ අතර වරද නිවැරදි කිරීමේ පියවර යෝජනා කර තිබේ. වැරදි නිවැරදි කිරීමේ හා වැළැක්වීමේ පියවර ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පද්ධති කාර්ය සාධනයේ වැඩිදියුණු කිරීම් නිරීක්ෂණය විය.

ලං.වි.ම. ව්‍යාපෘති සඳහා පවරා ඇති කටයුතු

විදුලිය සැපයුම් යාපනය ඒකකයේ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය පුනුරුත්ථාපනය යටතේ ලං.වි.ම. කිලෝ වෝල්ට් 220 සම්ප්‍රේෂණ ජාලයේ ආරක්ෂක යෝජනා ක්‍රම පුනුරුත්ථාපනය සඳහා ජර්මනියේ KFW බැංකුවෙන් ලං.වි.ම. අරමුදල් ලැබී ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශාත්මක සේවා සපයන්නේ ජර්මනියේ Fitchner GmbH ව්‍යාපෘතිය යටතේ කිලෝ වෝල්ට් 220 රැහැන් වල පවතින ආරක්ෂක යෝජනා ක්‍රම හා බියගම, කොත්මලේ, වික්ටෝරියා, රන්ටැඹේ හා නව අනුරාධපුර විදුලිබල පද්ධති උප පොළවල්වල තරාපැවි ඉවත් කර ඒ වෙනුවට අලුත් ඒවා යෙදීම හා බියගම - කැළණිතිස්ස මාර්ගය, කොත්මලේ - වික්ටෝරියා මාර්ගය, වික්ටෝරියා - රන්දෙණිගල මාර්ගය හා රන්දෙණිගල - රන්ටැඹේ මාර්ගවල දෘෂ්‍ය විදුලි භූ තන්තුව සවි කිරීම.

මෙම වසර තුළ පහත සඳහන් ව්‍යාපෘතිවල වැදගත් කඩඉම් ලබා ගන්නා ලදි.

- ටෙන්ඩර් ලේඛන අවසන් කිරීම.
- සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට මිල ගණන් කැඳවීම.
- ලැබී තිබූ මිල ගණන් ඇගයීම.
- කොන්ත්‍රාත්තු පිරිනැමීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම.

2011 වසර තුළදී, නව්‍ය හා පුනුරුත්ථාපන ව්‍යාපෘති සඳහා ආරක්ෂක විෂය පථය හඳුනා ගැනීම, තාක්ෂණික පිරිවිතර සැකසීම, ව්‍යාපෘතිවලට සම්බන්ධ උපකරණ ක්‍රියාත්මක කිරීමේ කටයුතු තහවුරු කිරීම ආදිය පවත්නා පද්ධතියට නව ව්‍යාපෘති සාර්ථකව සමෝධානය කිරීම. සම්පූර්ණ කරන ලද හා දැනට පවත්නා ව්‍යාපෘති කීපයක් පහත දැක්වේ.

- පුත්තලම ගල් අඟුරු බල ව්‍යාපෘතිය.
- කොළඹ නගරයේ විදුලිය බෙදා හැරීම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.
- මහ කොළඹ කොටුමා උප පොල ව්‍යාපෘතිය යටතේ කොටුගොඩ පුළුල් කිරීම.
- ඉහල කොත්මලේ ජලවිදුලිබල ව්‍යාපෘතිය.
- බෙලිඅත්ත විදුලිබල පද්ධති උප පොල ව්‍යාපෘතිය.

වෙනත් ක්‍රියාකාරකම්

සපුගස්කන්ද විදුලිබල පද්ධති උප පොලේ දෝෂ සහිත තරාපැවි ආරක්ෂක ප්‍රතියෝජකය හා නව ලක්ෂපාන විදුලිබල පද්ධති උපපොල, කැනියොන් බලාගාරය, කොස්ගම විදුලිබල පද්ධති උපපොල හා කොත්මලේ අදාල බලාගාරයේ මාර්ග ආරක්ෂක ප්‍රතියෝජක වෙනුවට අලුත් ඒවා ආදේශ කිරීම සඳහා සැලසුම් පරීක්ෂා කිරීම්, ඇඳීම් සැකසීම හා ගණනය කිරීම් සිදු කිරීම.

පරිසරය

ලං.වි.ම. යේ පාරිසරික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී එය අධීක්ෂණය කිරීම හා සහාය දීම පාරිසරික ඒකකයේ ප්‍රධාන කාර්යය වේ. ලං.වි.ම. යේ බොහෝ පාරිසරික ක්‍රියාකාරකම් සඳහා කේන්ද්‍රීය ස්ථානය වන්නේ මෙම ඒකකයයි. ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ හා උත්පාදන ව්‍යාපෘති සඳහා පාරිසරික වශයෙන් අනුමැතිය දීමේ ක්‍රියාවලිය, ජාතික පාරිසරික පනත සහ/හෝ අරමුදල් ලබා දෙන නියෝජිතායතනවල (අදාල වේ නම්) මෙහෙයුම් නිර්ණායක යටතේ පරිසර ආරක්ෂා කිරීමේ ලේඛන වාර්තා පිළියෙල කිරීම, එකී ව්‍යාපෘති සඳහා අදාළ පාරිසරික අනුමැති ලබා ගැනීම හා ලං.වි.ම. හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන එහි කොටස්කරුවන් සඳහා පාරිසරික දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම පාරිසරික ඒකකයේ ප්‍රධාන වගකීම වේ.
පාරිසරික ඒකකයේ ප්‍රධාන වගකීම් වන්නේ

- මූලික පාරිසරික පරීක්ෂාව/පාරිසරික බලපෑම් ඇගයීමේ (IEE/EIA) වාර්තා පිළියෙල කිරීම හා ඉහත ව්‍යාපෘති සඳහා ජාතික පරිසර අධිකාරියෙන් (NEA) පාරිසරික අනුමත ලබා ගැනීම.
- අදාළ වේ නම් අරමුදල් සපයනු ලබන නියෝජිතායතනවල මෙහෙයුම් නිර්ණායක යටතේ පාරිසරික ආරක්ෂා කිරීමේ ලේඛන පිළියෙල කිරීම හා එකී ව්‍යාපෘති සඳහා එවැනි නියෝජිතායතනවලින් අදාළ පාරිසරික අනුමැතිය ලබා ගැනීම.
- ලං.වි.ම. යේ පාරිසරික පුවත් හසුන ප්‍රසිද්ධ කිරීම.
- ලං.වි.ම. යේ සේවකයන් හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන එහි කොටස්කරුවන් සඳහා පාරිසරික දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

2011 වර්ෂයේදී පාරිසරික ඒකකය මගින් සිදු කරන ලද (EIA/IEE&) ක්‍රියාවලියට කෙටි මෙන්ම සමස්ථ විග්‍රහයක් පහත දැකවේ.
පහත සම්ප්‍රේෂණ මාර්ග සඳහා පාරිසරික අනුමැති ලබා ගන්නා ලද අතර ඇතැම් විට ඒවා අලුත් කර තිබේ.

- උකුවෙල - පල්ලේකැලේ කිලෝවෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය (කි.මී.17)
- ගාල්ල - අම්බලන්ගොඩ කිලෝවෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය (කි.මී.40)

පහත දැක්වෙන සම්ප්‍රේෂණ ව්‍යාපෘතිවල ජාතික පාරිසරික අධිකාරිය යටතේ මූලික පාරිසරික පරීක්ෂා කිරීම් (IEE) වාර්තා සකස් කර ඇති අතර අදාළ PAA ට භාර දීම.

- හබරණ - සාම්පූර් කිලෝවෝල්ට් 220 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය (කි.මී.90)
- හබරණ - වේයන්ගොඩ කිලෝවෝල්ට් 220 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය (කි.මී.140)

සම්ප්‍රේෂණ අංශය

ආසියානු සංවර්ධන බැංකුවේ මෙහෙයුම් නිර්ණායක යටතේ පහත ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන පරිසරය ආරක්ෂා කිරීමේ ලේඛන සියල්ලම සකස් කර ආසියානු සංවර්ධන බැංකුව වෙත භාර දී තිබේ.

- සුනිත්‍ය විදුලිබල අංශ සහායක II ව්‍යාපෘතිය.
- අර්බුදවලින් පීඩාවට පත් කොට්ඨාශ සඳහා හදිසි අවස්ථා ව්‍යාපෘතිය.

බලශක්ති මිලදී ගැනීම්

ප්‍රශස්ථ මිල ගණන්වලට පද්ධතියට ඇති ඉල්ලුම සපුරා ගැනීම සඳහා පෞද්ගලික විදුලිබල නිෂ්පාදකයන්ගෙන් විදුලිය මිලදී ගැනීම සම්බන්ධයෙන් බලශක්ති මිලදී ගැනීමේ ශාඛාව වගකීම දරයි. මෙම ශාඛාව යටතේ ප්‍රධාන වර්ගයේ විදුලිබල කම්හල් දෙකක් පාලනය වේ.

- ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන් (IPP)
- සම්ප්‍රදායික නොවන ප්‍රතිභාවිත කළ හැකි බලශක්ති කම්හල්.

ලංකා විදුලිබල මණ්ඩලයට තාප බලශක්තිය මෙගා වොට් 582 ක් සපයනු ලබන ස්වාධීන පුද්ගලික විදුලිබල නිෂ්පාදකයන් 11 දෙනෙකු හා මෙගා වොට් 227 ක මුළු ධාරිතාවෙන් යුත් සම්ප්‍රධායික නොවන ප්‍රතිභාවිත කළ හැකි බලශක්ති ව්‍යාපෘති 99 ක් 2011 වසර අවසානයේදී ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කෙරෙනු ඇත.

ස්වාධීන විදුලිබල නිෂ්පාදක දත්ත

බලාගාරය	ස්ථාපිත ධාරිතාව
ඒර්ඩ්ස් කැළණිතිස්ස	163.15
හෙළධනව්	100
ඒසීඊ පවර්(ඇඹිලිපිටිය)	100
කොළඹ පවර් (පුද්)සමාගම	60
ඒෂියා පවර්	51
ලක්ධනව්	22.5
ඒසීඊ පවර්(මාතර)	20
ඒසීඊ පවර්(හොරණ)	20
නදර්න් පවර්	30
කෙරවලපිටිය	270
ඇග්‍රිකෝ (චුන්නාකම්)	15
එකතුව	**852**

සම්ප්‍රදායික නොවන ප්‍රතිභාවිත බලශක්ති බලාගාර

මෙගා වොට් 10 ට අඩු ධාරිතාවෙන් යුත් සම්ප්‍රදායික නොවන ප්‍රතිභාවිත බලශක්ති බලාගාරවලට අයක්‍රම දෙකක් යටතේ ගෙවීම් කරනු ලැබේ.

- පිරිවැය තාක්ෂණ සුවිශේෂී පේළි තුනේ අයක්‍රම
- මඟ හරින ලද පිරිවැය පාලක අයක්‍රම

සම්ප්‍රදායික නොවන ප්‍රතිභාවිත බලශක්ති බලාගාරවලින් සැපයෙන මුළු ජනනය ගිගා වොට් 702 ක් වන අතර 2011 වර්ෂය සඳහාද එය එසේමය. එය වසරේ මුළු විදුලිබල ජනනයෙන් 6% ක පමණ ප්‍රමාණයකි.

ක්ෂුද්‍ර ජල විදුලි බලය සංවර්ධය කිරීම.

2011 වසර තුළ ජාතික විදුලිබල පද්ධතියට මෙගා වොට් 16 ක මුළු ධාරිතාවෙන් යුත් ක්ෂුද්‍ර ජලවිදුලිබල ව්‍යාපෘති 7 ක් සම්බන්ධ කර ඇත. විදුලිබල පද්ධතියට සම්බන්ධ කරන ලද මුළු ස්ථාපිත ධාරිතාව 89 ක් වූ ක්ෂුද්‍ර ජලවිදුලි බලාගාරවල ධාරිතාව වසර අවසානයේදී මෙගා වොට් 190 කට ලඟා විය. මොගා වොට් 21 ක සමස්ථ ධාරිතාවක් සඳහා 2011 වසරේදී විදුලිබල මණ්ඩලය මගින් ප්‍රමිත කළ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් (SPPA) 13 කට අත්සන් තබනු ලැබීය.

ජෛව බලශක්ති සංවර්ධනය

ජෛව බලශක්ති ඩෙන්ඩ්‍රෝ, මහනගර සහා අපද්‍රව්‍ය හා කෘෂිකාර්මික හා කාර්මික අපද්‍රව්‍ය වශයෙන් ප්‍රධාන කාණ්ඩ තුනකින් සමන්විත වේ. ජෛව බලශක්ති ව්‍යාපෘතිවලට අදාළව මෙගා වොට් 11 ක සම්පූර්ණ බලශක්තියක් නිපදවන කෘෂිකාර්මික හා කාර්මික අපද්‍රව්‍ය බලශක්ති බලාගාර දෙකකුත් මෙගා වොට් 0.5 ක ධාරිතාවක් නිපදවන එක් ඩෙන්ඩ්‍රෝ බලශක්ති බලාගාරයකුත් ජාතික විදුලිබල පද්ධතියට සවි කර ඇත. 2011 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙගා වොට් 27 ක සමස්ථ ධාරිතාවක් සඳහා ප්‍රමිත කළ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් (SPPA) 05 කට එළඹෙනු ඇත.

සුළං බලශක්ති සංවර්ධනය

මෙගා වොට් 33 ක මුළු ධාරිතාවෙන් යුත් සුළං බල ව්‍යාපෘති හතරක් ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර ඇත.

සූර්ය බලශක්ති සංවර්ධනය

2011 වර්ෂය තුළදී, මෙගා වොට් 1.3 ක මුළු ධාරිතාවෙන් යුත් සූර්ය බලශක්ති ව්‍යාපෘති තුනක් ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කරනු ලැබීය.

බලශක්ති අලෙවිකරණය

සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් බලපත්‍රධාරීන් අතර විදුලිබල ගනුදෙනු පද්ධතිය හා සරිලන පරිදි 2010 වසරේදී බලශක්ති අලෙවිකරණ ශාඛාව නැවත ක්‍රියාත්මක කරනු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ අංශය වෙනුවෙන් අයක්‍රම සැකසීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) සමඟ සක්‍රීය සහයෝගීතාවෙන් බලශක්ති අලෙවි අංශය කටයුතු කරන ලදි.

2011 වසරේදී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) මගින් නව තොග සැපයුම් අයක්‍රමයක් හඳුන්වා දීමත් සමඟ, ශ්‍රී ලංකා විදුලිබල (පුද්) සමාගමට එහි බෙදා හැරීමේ බලපත්‍රවලට විදුලිබලය විකිණීම සඳහා තොග සැපයුම් ගනුදෙනු ගිණුම් හා ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලිබල බෙදාහැරීමේ බලපත්‍ර හතර සඳහා හුවමාරු සටහන් සැකසීම බලශක්ති අලෙවි ශාඛාවට පවරනු ලැබීය. සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ගෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට විදුලිබලය හුවමාරු වීම වාර්තා කිරීම සඳහා සම්ප්‍රේෂණ බලපත්‍ර ලාභීන්ගේ හා බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ සීමා හරහා සවි කිරීමට 0.2 පන්තියේ නිරවද්‍යතාවක් ඇති නව බලශක්ති මනු සපයා ඇත.

සෑම මසකම සම්ප්‍රේෂණ අංශයෙන් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් වෙත හුවමාරු වන විදුලිබලය මත පදනම්ව මාසික පදනම මත 2011 වසර සඳහා හුවමාරු ගිණුම්/සටහන් බලශක්ති අලෙවි ශාඛාව මගින් සකස් කර තිබේ.

සංදේශ

සංදේශ අංශයෙහි වගකීම වනුයේ ලංකා විදුලිබල මණ්ඩලයෙහි ඇති පොදු භාවිතයක් ඇති දුරකථන ජාල Public Switched Telephone Networks තුළ හැරුණු විට, විවිධ තාක්ෂණයන් උපයෝගී කොට ගනිමින් හඬ හා දත්ත සන්නිවේදන අවශ්‍යතා ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සම්බන්ධ කටයුතු ලබා දීම සහ අනෙකුත් ලංකා විදුලිබල මණ්ඩලයේ අංශවලට සහ පද්ධති පාලන මධ්‍යස්ථානය වෙත අධීක්ෂණ පාලන සහ දත්ත සාක්ෂාත් කර ගැනීමේ (SCADA) අවශ්‍යතා සපුරා ලීමයි.

සම්ප්‍රේෂණ අංශය

දෙණියායේ ගොන්ගල ඇති DCN කළුණ

මෙකී පහසුකම් සැපයීමේදී පහත සඳහන් සන්නිවේදන තාක්ෂණ භාවිතා කෙරේ.

- PLC (බල රැහන් පදනම් කොටගත් සංදේශ ජාල) - බල රැහැන් ප්‍රවාහකයා (PLC) සහ දෘෂ්‍යාලෝක Optical (දෘෂ්‍ය විදුලි භූ තන්තු OPGW)
- මයික්‍රවේව් - ඩිජිටල් සන්නිවේදන ජාලිය (DCN)
- VHF/UHF) ජංගම හා ස්ථාවර ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය

සන්නිවේදන පද්ධති ඒකකය මගින් බල රැහැන් හරහා හඤ හා දත්ත සන්නිවේදන ජාලයත එනම් PLC ජාලය අවසන් උපකරණයද සමඟ දෘෂ්‍ය විදුලි තන්තු ජාලය, PLC ජාලය සහ PLTS දුරකථන පද්ධතිය, දුරකථන හුවමාරු ස්ථාන සහ බලශක්ති ස්ථානයන්හි ඇති සහායක පද්ධති සහ රට පුරා ඇති ග්‍රිඩ් උප පොලවල් පිළිබඳව සොයා බැලේ. මෙම ඒකකයට කොළඹ, මහනුවර, ගාල්ල, අනුරාධපුරය, සමනලවැව සහ ලක්ෂපාන සිට ක්‍රියාත්මක වන උප ඒකක පහක් ඇත.

සන්නිවේදන සේවා ඒකකය මගින් ස්කාඩා පද්ධතිය (ටෙලිමෙට්‍රි උපකරණ ස්කාඩා පරිගණක ඒවායේ දෘඩාංග සහ මෘදුකාංග මෙන්ම සහායක උපකරණද ඇතුළුව) සහ පද්ධති පාලන කටයුතු සඳහා අවශ්‍ය වන මෙහෙයුම් සන්නිවේදනය (PLC, PLTS) යන ඒවා පිළිබඳව සොයා බලයි.

ලංකා විදුලිබල මණ්ඩලයේ ජනන, සම්ප්‍රේෂණ, බෙදාහැරීම් සේවා සහ අනෙකුත් ප්‍රධාන ඒකක සඳහා මෙහෙයුම් හා පරිපාලන සන්නිවේදන සේවා ලබා දෙන ඩිජිටල් සන්නිවේදන ජාලය (DCN) සම්බන්ධයෙන් ඩිජිටල් ප්‍රවාහක ඒකකය මගින් සොයා බැලේ. තවද, ජනනය, සම්ප්‍රේෂණය සහ ප්‍රධාන වශයෙන් බෙදා හැරීමේ අංශ සහ තවද ලංකා විදුලිබල මණ්ඩලයෙහි ආරක්ෂක සේවාවන් සඳහා මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා ගුවන් විදුලි (VHF) UHF) තරංග සන්නිවේදන පහසුකමද සැපයේ.

2011 වර්ෂය

වර්ෂය තුළ සිදුකරන ලද ස්කාඩා සහ PLC පද්ධති සම්බන්ධ විශේෂ කටයුතුවලට අයත් වන්නේ

- පවත්නා ස්කාඩා උපකරණයට දියුණු කිරීම්/නවීකරණය කිරීම් සිදු කිරීම සහ ව්‍යාපෘති යටතේ මුහුණත්/පෙනුම interface ලෙස සන්නිවේදනය සිදු කෙරේ.
- සියලු මුහුණත්/පෙනුම (interface) කටයුතු ඇතුළුව ස්කාඩා පද්ධතිය වෙත කැළණිතිස්ස 132 කි.වො. GIS ,කොටුගොඩ 33 කි.වො. GIS සහ උප C GIS ඒකාබද්ධ කිරීම (කොළඹ නාගරික බෙදා හැරීමේ සංවර්ධන ව්‍යාපෘතිය)
- ස්කාඩා පද්ධතියෙහි අදාල දත්ත පාදමද සමඟ MIMIC දර්ශකයන් (CB: ON/OFF තත්ත්වය) නැංවීම.
- පද්ධති පාලන අවශ්‍යතා අනුව ස්කාඩා පරිගණක පෙන්නුම් පද්ධතිය දියුණු කිරීම.
- ස්කාඩා ජාලයට ඉහල කොත්මලේ කොටසක් ඒකාබද්ධ කිරීම.
- කැළණිතිස්ස සන්නිවේදන පාලන මධ්‍යස්ථානයෙහි ඒකාබද්ධ දෘෂ්‍යාලෝක බහුතිර සිනමා පටි (FOX) සහ දුරකථන හුවමාරු (SOPHO) ඒකාබද්ධ කිරීම මගින් උත්පාදන ප්‍රධාන කාර්යාලයට PLC yË ජාලය ව්‍යාප්ත/දීර්ග කිරීම.
- AES හි RTU මුහුණත සඳහා කැළණිතිස්ස අර්ධයෙන් වේගයෙන් ගලනය වන හුදෙකලා ඒකක (ගැල්වානික් හුදෙකලාව 4-20 ප් ට්‍රාන්ස්ටියුසර්) සැළසුම් කිරීම, නිෂ්පාදනය/සැකසීම, ස්ථාපිත කිරීම සහ නිර්මාණය කිරීම.

නව අනුරාධපුර ග්‍රිඩ් උපපොළ සහ කොත්මලේ PSS අතර PLC සන්නිවේදන සම්බන්ධතාව (අවසන් උපකරණය) ප්‍රතිස්ථාපනය කිරීම.

අනාගත සැලසුම්

සංඛ්‍යාත තදබදය ඉවත් කිරීම/අවසන් කිරීම සම එමඟින් අනාගත ව්‍යාප්ත කිරීමේ හැකියාව දියුණු කිරීම සඳහා PLC පදනම් වූ පද්ධති දැන් දැන් ක්‍රමයෙන් ෆයිබර් ඔප්ටික් පද්ධතිවලට මාරු වෙමින් පවතී. ස්කාඩා සහ PLTS ජාල ව්‍යාප්තිය සඳහා නව ඔප්ටිකල් ෆයිබර් සම්බන්ධතාවලින් නාලිකාවන්හි bandwidth ලබා ගනිමින් සුවිශාල නම්‍යතාවක් ලබාගෙන ඇත.

ඩිජිටල් සන්නිවේදන ජාලය

ඩිජිටල් සන්නිවේදන ජාලය යනු PLC සහ ෆයිබර් ඔප්ටික් පද්ධතිවලට පුනරාවර්ථිත පහසුකම් සපයනු ලබන්නාවූත් පරිපාලන ටෙලිෆොනි සහ දත්ත සේවා ලබා දෙන්නා වූත් සහායක මයික්‍රවේව් ගුවන් විදුලි සන්නිවේදන ජාලයකි. මාරු විය හැකි ස්ථාන, point-to-point back bone network සහ බහු අග්‍ර පිවිසුම් ජාල ස්ථානවලින් පද්ධතිය සමන්විත වේ. වර්තමානයේ ඩිජිටල් සන්නිවේදන ජාලය, පාදක මාදිලි

සම්ප්‍රේෂණ අංශය

හතරකින්, repeater stations දහ හතරකින් සහ රට පුරා විසිරුණු පර්යන්ත ස්ථාන හතලිහකින් පද්ධති පාලන මධ්‍යස්ථාන අන්තර් සම්බන්ධ කරමින්, බලාගාර, ප්‍රධාන කාර්යාල, බෙදාහැරීම් ප්‍රදේශ සහ පළාත් කාර්යාල ආදියෙන් සමන්විතය. ඒකාබද්ධ ඩිජිටල් සන්නිවේදන ජාලය නිර්මාණය කොට ඇත්තේ switched හක්ෂ (64 Kb/s PCM), ෆැක්ස් සහ දත්ත තදබදය සමඟ අංක 4 ක අංක සහිත සහිත uniform ඩිජිටල් හුවමාරු සහ ප්‍රමිතියෙන් යුත් සංඥා ලබාදෙන සහ තදබද ලිහිල් කරන ඉන්ටර්ෆේස්/මුහුණත් වලිනි.

2011 වර්ෂය තුළ DCN පද්ධතියෙහි සිදු කරන ලද කටයුතු

01. දියුණු කිරීම්

- ලක්ෂපාන සහ විමලසුරේන්ද්‍ර බලාගාරයන්හි සහ ප්‍රධාන කාර්යාලයෙහි නව සේවා දායක රැහැන් ලබාදෙන ලදි.
- කැනියන් බලාගාරය, සමනල බලාගාරය, සමනළ repeater station හි සංඥා ලබා ගැනීමේ මට්ටමේ වර්ධනයන් සිදු කරන ලදි.

02. අධ්‍යයන

- උප බලාගාරවලට බලය දීම සහ බෙදා හැරීමේ පාලන පද්ධති සඳහා මයික්‍රෝවේව් ජාල ව්‍යාප්ත කිරීමේ හැකියාව අධ්‍යනය කෙරිණ.
- මයික්‍රෝවේව් ජාල හරහා හයිඩ්‍රො ජලාශ මෙහෙයවීම සහ දොරටු පාලනය කිරීම ක්‍රියාත්මක කිරීමේ හැකියාව අධ්‍යයනය කරන ලදි.
- වීඩියෝ සාකච්ඡා (conferencing) සැපයීම සඳහා පවත්නා මයික්‍රෝවේව් සබඳතා ලබා යොදා ගැනීමේ හැකියාව අධ්‍යනය කරන ලදි.
- කල් ඉකුත් වූ/පැරණි මයික්‍රෝවේව් අග්‍රයෙන් - බහු අග්‍රයන්ට පිවිසීමේ ජාලය නැවත ස්ථාපිත කිරීමේ වෙනත් විකල්ප අධ්‍යනය කරන ලදි.

VHF/UHF ගුවන් විදුලි සන්නිවේදන ජාලය

VHF/UHF ජංගම සහ ස්ථාවර ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය මගින් බෙදා හැරීමේ ප්‍රදේශ බලාගාර සහ ආරක්ෂක නිලධාරීන් අතර පහසුකම් සපයනු ලැබේ. භූගෝලීය පසුබිම භූමි භාග සම සංඛ්‍යාත ප්‍රතිභාවිත හැකියාව මත පදනම් වෙමින් VHF පහත්, VHF මධ්‍ය සම UHF නාලිකා කාණ්ඩ කිරීම මගින් ප්‍රාදේශීය මට්ටමේ සේවා සැපයීම සහතික කර ඇත. ප්‍රමිතියෙන් යුත් විශ්වාසනීය සේවාවක් සැපයීම උදෙසා, repeater stations 35 ක් පමණ දිවයින පුරා ස්ථාපිත කර ග්‍රිඩ් උප පොලවල්, බලාගාර, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන, ආරක්ෂක ස්ථාන වෙනුවෙන් අතේ තබා ගන්නා ගුවන් විදුලි 850 ක් සහ ස්ථාවර/ජංගම (transceivers) 1200 ක් සඳහාද නඩත්තු සහ මෙහෙයුම් කාර්ය මණ්ඩලය සඳහා සේවා සැපයීමට කටයුතු කොට ඇත.

2011 වර්ෂය තුළ සිදු කළ කටයුතු

දියුණු කිරීම්:-

- වැඩි ආවරණ කලාපයක් සහ වඩාත් හොඳ ප්‍රමිතියක් සඳහා අඟුලාන පාරිභෝගික සේවා මධ්‍යස්ථානයේ සිට ට්‍රෝවුඩ් මයික්‍රෝවේව් repeater ක්ෂේත්‍ර වෙත මධ්‍ය ප්‍රතිග්‍රාහක මධ්‍යස්ථාන මාරු කිරීම.
- නෝට්‍රන්බ්‍රිජ් මයික්‍රෝවේව් repeater යක් ස්ථාපිත කිරීම මගින් දියුණු කරන ලද ආවරණය සහ ගුණාත්වයෙන් යුත් සේවාවක් සමඟ පාදුක්ක, හංවැල්ල සහ අවිස්සාවේල්ල ප්‍රදේශවලට ලබා දීම. මෙම repeater ප්‍රථමයෙන්ම අවිස්සාවේල්ලෙහි ස්ථාපිත කිරීමට සැලසුම් කරන ලද නමුත් නිසි ස්ථානයක් නොමැති වීම හේතුවෙන් එය ස්ථාපිත කිරීම තාවකාලිකව නවතා දමන ලදි.
- ලක්විජය බලාගාරයෙහි නඩත්තු සහ ආරක්ෂක අවශ්‍යතා සඳහා ගුවන් විදුලි උපකරණ වැඩසටහන්කරණය කිරීම.
- ත්‍රිකුණාමලය repeater station හි කුළුණ සහ උපකරණ භූගත කිරීම වැඩිදියුණු කිරීම.
- හන්තාන මයික්‍රෝවේව් වැඩ බිම VHF high band මෙහෙයුම් සඳහා සාර්ථක ලෙස පරීක්ෂා කරන ලද අතර හුදකලාව අතහැර දමා තිබූ සමනළ වැව high band repeater එතනට ගෙන එන ලදි. එබැවින් මහවැලි සංකීර්ණය වෙත ව්‍යාප්ත කරන සේවා පහසුකම් ලබා දෙන ලදී.
- මොණරාගල ප්‍රදේශය තුළ ආවරණ කලාපය වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් යුතුව නව low band repeater ස්ථාපිත කිරීම සඳහා වඩාත් සුදුසු ස්ථානයක් හඳුනා ගැනීමට ක්ෂේත්‍ර සමීක්ෂණය සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන ලදී.

ආයතනික සහ නියාමන සබඳතා

වාර්ෂික පිරිස් සැලැස්ම සඳහා සම්ප්‍රේෂණ අංශය, කාර්ය මණ්ඩලකරණය සහ පුහුණු අංශයේ සහය ඇතිව දේශීය සහ විදේශීය වැඩ සටහන් පැවැත්වීම මගින් විධායක හා විධායක නොවන කාර්ය මණ්ඩලය යන දෙපක්ෂයේම වෘත්තීය සංවර්ධනය වැඩි කිරීම මගින් සම්ප්‍රේෂණ අංශයේ යෝග්‍ය ක්‍රියාකාරිත්වය සහතික කිරීම. ආයතනික සහ නියාමන සබඳතා අංශයේ වගකීමයි. නියාමන අවශ්‍යතා සහ සැලසුම් කිරීමේ කටයුතු සඳහා ග්‍රිඩ් උප පොලවල්/සුළං බලාගාරවල මෙහෙයුම් පද්ධති වෝල්ටීයතාව උස් පහත් වීම, සංඛ්‍යාත වෙනස් වීම සම ස්වර ඒකතාන එකතු කිරීම් මෙහෙයවීම් ඉංජිනේරු විගණන අංශය මගින් සිදු කරන ලදි.

ඉංජිනේරුමය විගණනය

ආයතනික සහ නියාමන සබඳතා අංශයෙහි ඇති ඉංජිනේරු විගණන ඒකකය ස්ථාපිතකොට ඇත්තේ ක්ෂේත්‍ර මැණුම් මගින් සම්ප්‍රේෂණ පද්ධති ප්‍රමිතීන්හි ප්‍රමිතිය හා ගුණාත්වය පරීක්ෂාකොට පවත්වාගෙන යාම සඳහායි. පද්ධති මෙහෙයවීම සඳහා දත්ත (loggers) සහ බලශක්ති තත්ත්ව විශ්ලේෂක භාවිත වේ.

සම්ප්‍රේෂණ ජාලයට සම්බන්ධ පුද්ගලික සුළං බලශක්ති බලාගාර ඉංජිනේරුමය විගණනය මගින් මෙහෙයවන්නේ ලංකා විදුලිබල මණ්ඩලයෙහි බලශක්ති තත්ත්ව ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීම සිදු වෙනවාදැයි තහවුරු කර ගැනීම පිණිසය.

දත්ත loggers යොදා ගනිමින් ක්ෂණික බලශක්ති ගුණාත්ව දත්ත සහ බලශක්ති ජනන පැතිකඩ දත්ත උකහා ගැනේ. සුළං බලශක්ති බලාගාර මගින් බලශක්ති පද්ධතියට සමස්වර ඒකතාන එක් කිරීම් සිදු කරනවාදැයි පරීක්ෂා කිරීම සඳහා බලශක්ති ගුණාත්ව දත්ත භාවිතා කෙරිණ. බලශක්ති ජනන පැතිකඩ දත්ත භාවිත කරනුයේ සුළං බලශක්ති බලාගාර ජනන රටා සම ලංකා විදුලිබල මණ්ඩලයෙහි ජාලයට සුළං බලශක්ති ජනනය ස්ථාපිත කිරීම සඳහා වන අනාගත ව්‍යාප්තීන් විශ්ලේෂණය කිරීම සඳහා භාවිතා වේ. රූප සටහනින් පෙන්වන්නේ සෙගුවන්තිව් 10 මෙ.වො. සුළං බලශක්ති බලාගාරයෙහි බලශක්ති උත්පාදන පැතිකඩයි.(එනම් 2011 ජූලි 05 වන දින සිට 2011 ජූලි 07 වන දින දක්වා)

සම්ප්‍රේෂණ අංශය

මානව සම්පත්

ආයතනික හා නියාමන සම්බන්ධතා අංශය මගින් මානව සම්පත් කළමණාකරණ ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි. විධායක මට්ටමේ නිලධාරීන් 122 කින් හා විධායක නොවන නිලධාරීන් 996 කින් සමන්විතව මුළු ගණන 1218 ක් වන සේවකයන් ගණනක් සම්ප්‍රේෂණ අංශය සතුව පවතී. මේ වසර තුළ මණ්ඩලය මගින් 125 දෙනෙකු බඳවාගෙන ඔවුන්ව මෙම අංශයට අනුයුක්ත කර තිබේ. ලං.වි.ම. බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුකූලව පුද්ගලයින් 121 දෙනෙකු ඉහළ ශ්‍රේණිවලට උසස් කිරීම හෝ ඔවුන්ගේ අදාළ ඉහළ වැටුප් පරිමාණවල පිහිටුවීම හෝ සිදු කර තිබේ.

කුසලතා සංවර්ධන අවශ්‍යතා මත පදනම් වෙමින් කාර්යය මණ්ඩලයට දේශීය හා විදේශීය යන ආකාර දෙකේම බාහිර පුහුණුවීම් අවස්ථා ලබා දී තිබේ. විදේශීයව පුහුණු කිරීමේදී ආවරණය කරන ලද විෂය ක්ෂේත්‍ර වන්නේ සැළසුම්කරණය, සන්නිවේදනය, උප පොලවල් හා සම්ප්‍රේෂණ මාර්ග මෙහෙයුම හා නඩත්තුවයි. 53 දෙනෙකු දේශීය බාහිර පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ/වැඩමුළුවලට සහභාගි වූ අතර 50 දෙනෙක් විදේශීය පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ/වැඩමුළු ආදියට සහභාගි වූහ. එසේ පුහුණු වැඩසටහන්වලට සහභාගි වූ පුද්ගලයන් ලං.වි.ම. යේ අනෙකුත් කාර්යය මණ්ඩල සඳහා පුහුණුවීම් ලබා දීමේදී ඔවුන් ලබා ගත් දැනුම එම කාර්යය මණ්ඩලයට ද ලබා දීම අවශ්‍ය වේ. සම්ප්‍රේෂණ අංශය පුහුණුවීම් සඳහා පුද්ගලයින් 52 කට පහසුකම් සලසනු ලැබීය. එමෙන්ම විවිධ සම්ප්‍රේෂණ මාර්ග හා විදුලිබල පද්ධති උප පොළ උපකරණවල කම්හල්වලට භාර ගැනීමේ පරීක්ෂාවන් දැක බලා ගැනීමටද පැමිණීමටද ඔවුන්ට පහසුකම් සලසනු ලැබීය.

සම්ප්‍රේෂණ අංශයේ කාර්යය මණ්ඩලය සඳහා පුහුණු කිරීමේ ශාඛාවේ සහයද ඇතිව අභ්‍යන්තර පුහුණු කිරීමේ වැඩසටහන්/සම්මන්ත්‍රණ/වැඩමුළු ඒකාබද්ධ හා නියාමන සම්බන්ධතා ශාඛාව මගින් සපයනු ලැබීය.



සෙගුවන්තිව් සුලං බලාගාරයේ බලශක්ති ජනන සටහන

නිල අනුග්‍රහය ද සහිතව ක්‍රියාත්මක වන ශක්තිමත් සුභසාධක සංගමයක් මෙම අංශය සතුව පවතී. මෙම වසර තුළ මෙමගින් කාර්යය මණ්ඩලයේ විවිධ තරාතිරම්වල පුද්ගලයින් අතර සුහද පුද්ගල සම්බන්ධතා ගොඩ නැගීම සඳහා පහසුකම් සලසනු ලැබ අතර එහි සාමාජිකයන්ට විවිධ සේවාද සපයා දී තිබේ.

බෙදාහැරීමේ අංශය 1

බෙදාහැරීමේ අංශය 1

වසරේ අවධානයට ලක් වූ අවස්ථා

වසර තුළ අංශය තුළ විකුණන ලද ඒකක	ගි.වො.පැ.2,797
විකුණන ලද ඒකකවලින් උපයාගත් ආදායම	රු.මි.42,771
සාමාන්‍ය විකුණුම් මිල	රු.15.29/කි.වො.පැය.
බෙදාහැරීම් හානිය	9.4%
ලැබිය හැකි තත්ත්වය	1.89 මාස
වසර අවසානයේදී අංශය තුළ ගෘහස්ථ පාරිභෝගිකයින් ගණන	1,265,463
වසර තුළ ලබාදෙන ලද නව සම්බන්ධතා ගණන	76,761
වසර අවසානයේදී සේවකයන් ගණන	2,865
සාමාන්‍ය ආදායම/පාරිභෝගිකයෙකු/මසකට	රු.2816.56
වසර අවසානයේදී ගෘහස්ථ පාරිභෝගිකයින් සාමාන්‍ය ගණන/සේවකයෙකු සඳහා	442
සිල්ලර පාරිභෝගිකයන් සාමාන්‍ය ගණන/බෙදාහැරීමේ උප පොළකට	181
අඩු වෝල්ටීයතාවෙන් යුතු මාර්ගවල සාමාන්‍ය දිග/සේවකයෙකු සඳහා	කි.මී.10.6
අඩු වෝල්ටීයතාවෙන් යුතු මාර්ගවල සාමාන්‍ය දිග/පාරිභෝගිකයෙකු සඳහා	කි.මී.0.024
මධ්‍යම වෝල්ටීයතාවෙන් යුතු මාර්ගවල සාමාන්‍ය දිග/පාරිභෝගිකයෙකු සඳහා	කි.මී.1.26

සේවා ලබාදෙන ප්‍රදේශ



බෙදාහැරීම් අංශයේ මෙහෙයුම් ප්‍රදේශය මගින් ශ්‍රී ලංකාවේ මුළු බිම් ප්‍රමාණයෙන් 42% කොළඹ මහ නගර සභාව, වයඹ පළාත, උතුරු මැද පළාත හා උතුරු පළාත ආවරණය වේ. මෙම කොට්ඨාශයේ මුළු ජනගහනය මිලියන 8.7 කි. මෙම කොට්ඨාශයේ විදුලිබලය සපයා ඇති ඉහළම මට්ටම වන්නේ කොළඹ නගරයේ 99% ක ප්‍රමාණයකි. විදුලිබලය සපයා ඇති අඩුම මට්ටම වන්නේ උතුරු පළාතේ 65% කි.

මෙම කොට්ඨාශයේ එක් පාරිභෝගිකයෙකු සඳහා වාර්ෂික විදුලිබල පරිභෝජනය කිලෝ වොට් පැය 2,208 කි. පාරිභෝගිකයෙකු සඳහා ඉහළම වාර්ෂික විදුලිබල පරිභෝජනය කොළඹ නගරයෙන් වාර්තා වන අතර එය ඒකක 7,860 කි. එක් පාරිභෝගිකයෙකු සඳහා අඩුම වාර්ෂික විදුලිබල පරිභෝජනය වයඹ පළාතෙන් වාර්තා වන අතර එය ඒකක 1,128 කි. මෙම කොට්ඨාශයේ වඩාත්ම ලාභදායක කොටස වන්නේ කොළඹ නගරයයි. එමෙන්ම යාපනය හා කිලිනොච්චි වැනි ප්‍රදේශවල මෙම ව්‍යාපාරය සතුටුදායක මට්ටමට වඩා බොහෝ අඩු මට්ටමක පවතී.

මෙහෙයුම් ව්‍යුහය

ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීමේ අංශය 1, සාමාන්‍යාධිකාරිවරයාට සෘජුවම වගකිව යුතු අතිරේක සාමාන්‍යාධිකාරිවරයෙකු මගින් පාලනය වේ. කොළඹ නගරය, වයඹ පළාත, උතුරු මැද පළාත හා උතුරු පළාත ලෙස මෙම කොට්ඨාශය පළාත් හතරකට බෙදා තිබේ. එක් එක් පළාත ප්‍රධාන ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවන් හෝ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවන් හෝ විසින් පාලනය කරනු ලබන ප්‍රදේශවලට නැවතත් බෙදනු ලැබේ. ඵලදායක පරිපාලනයක් සඳහා කොට්ඨාශය තුළ ප්‍රදේශ 14 ක් හා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 50 ක් තිබේ.

පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්ට අමතර කොට්ඨාශයේ ව්‍යාපෘති හා අධිසැර නඩත්තු කටයුතු, සැළසුම් හා සංවර්ධන කටයුතු හා වාණිජ්‍ය හා ආයතනික කටයුතු පිළිබඳව සොයා බැලීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් තිදෙනෙක් සිටිති. මෙම කොට්ඨාශය තුළ මෙන්ම වෙනත් කලාපවල ග්‍රාමීය විදුලිබල සැපයුම් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරනු ලබන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ගැමි විදුලියන සැපයුම් ව්‍යාපෘති හා සැපයුම්) විසිනි. පළාත්වල මූල්‍ය හා ආදායම් කටයුතු ගණකාධිකාරිවරුන් ඉටු කරනු ලබන අතර අංශයේ අතිරේක මුදල් කලමණාකරු විසින් පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම සිදු කරයි. මානව සම්පත් කටයුතුවල නියැලීම සඳහා වෙනම මානව සම්පත් නිලධාරියෙකු එක් එක් පළාත සඳහා ලබා දී තිබේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ හා ආයතනික) යටතේ මෙම ක්‍රියාකාරකම් සමායෝජනය කිරීම හා ආයතනික ශාඛාවට අනුයුක්ත කර ඇති විධායක නිලධාරීන් සියලු දෙනාගේ හා කාර්ය මණ්ඩලයේ මානව සම්පත් කටයුතු සිදු කරීම මෙම ඒකකය මගින් සිදු කෙරේ.

ප්‍රධාන අරමුණු

- වෝල්ටීයතාවයේ ව්‍යවස්ථානුකූල මට්ටමට අංශය තුළ පාරිභෝගිකයන්ට විශ්වසනීය විදුලිබල සැපයුමක් ලබා දීම.
- විදුලිබලය විකිණීම හා මුළු වියදම්වලට සාපේක්ෂව සැලසුම් කරන ලද ආදායම්වල අතිරික්ත උපයා ගැනීම.
- අපේක්ෂිත පාරිභෝගිකයන්ට නව සම්බන්ධතා සැපයීම.
- කොට්ඨාශය තුළ විදුලිබල බෙදා හැරීමේ පද්ධතියේ තාර්කික සංවර්ධනයක් තහවුරු කිරීම.

බෙදාහැරීමේ අංශය 1

බෙදා හැරීමේ යටිතල පහසුකම්

කිලෝවෝල්ට් 33 බෙදා හැරීමේ මාර්ග	කි.මී.7,489
කිලෝවෝල්ට් 11 බෙදා හැරීමේ මාර්ග	කි.මී.708
කිලෝවෝල්ට් 11 යටි බිහන් විදුලි රැහැන්	කි.මී.597
කිලෝවෝල්ට් 33/11 මූලික උප පොළ ගණන	38
අඩු සැර බෙදා හැරීමේ මාර්ග	කි.මී.29,711
අඩු සැර යටි බිහන් විදුලි රැහැන්	කි.මී.586
අඩු සැර බෙදා හැරීමේ උප පොළවල් ගණන	6,996
සේවා සම්බන්ධතා මුළු ගණන	1,285,633

පාරිභෝගික සත්කාරය

පාරිභෝගිකයන් නිලධාරීන්ව හමුවන ස්ථානවලදී සපයනු ලබන සේවා වැඩි දියුණු කිරීමට 2011 වසර තුළ විශේෂ ප්‍රයත්නයක් දරනු ලැබීය. ප්‍රාදේශීය කාර්යාල 14 කට, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 50 කට, විකුණුම් කවුන්ටර් (POS) 45 කට හා බෙදා හැරීම් පාලන මධ්‍යස්ථාන 3 කට අනුයුක්ත කර ඇති කාර්යය මණ්ඩලය මෙම වසර තුළ පාරිභෝගිකයන්ට වඩා හොඳින් සේවය කිරීමට විශේෂ ප්‍රයත්නයක් ගන්නා ලදි. නව විකුණුම් කවුන්ටර් 9 ක් ආරම්භ කිරීමත් සමඟ මුදල් ගෙවීම සඳහා පෝලිම්වල සිටිමින් පාරිභෝගිකයින් මුහුණ දුන් අපහසුතා අවම කළ හැකිවිය.

පාරිභෝගිකයන්ට හා මහජනතාවට විශේෂ සේවා සැපයීම සඳහා 2010 වසරේදී ලංකා විදුලිබල මණ්ඩලය මගින් පළමුවරට විදුලි පුරවර, සංකල්පය හඳුන්වා දෙන ලදි. මෙම සේවා 2011 වසරේදී බෙදා හැරීම් අංශයේ 1 හි තවදුරටත් වැඩි දියුණු කර පුළුල් කරන ලදි. විදුලි පුරවර යනු පාරිභෝගිකයාට හා මහජනතාවට සියලුම සේවා (බැර සැපයුම් හැර) ලබා දෙන "එකම ව්‍යාපාරික ස්ථානයෙන් සියලුම සේවා ලබා ගත හැකි, යන සංකල්පය අනුව බිහි වූවකි. මෙම වසර අවසානයේදී මෙම අංශය තුළ විදුලි පුරවර 9 ක මුළු ප්‍රමාණයක් ක්‍රියාත්මකව පැවතුණි. ඒවා අතරින්, කොළඹ නගරය තුළ විදුලි පුරවර මධ්‍යස්ථාන 3 ක් ස්ථාපිත කර තිබුණි. මෙම නව්‍ය විදුලි පුරවර 3 ත් සමඟ කොළඹ නගරයේ ප්‍රාදේශීය කාර්යාල හතරම විදුලි පුරවරයක පහසුකම්වලින් සමන්විත වේ. මෙම ස්ථානවලදී සම්ප්‍රදායානුකූල විසන්ධි කිරීමේ නියෝගය වෙනුවට කෙටි පණිවිඩ සේවය ඔස්සේ පාරිභෝගිකයාට අනතුරු හැඟවීමක් යැවීම වැනි දියුණු තාක්ෂණික ක්‍රම භාවිත කෙරේ. එමෙන්ම, පාරිභෝගික අධ්‍යාපන වැඩ සටහන්.

බලශක්තිය ඉතිරි කර ගැනීමේ හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ක්‍රියාකාරකම් පිළිබඳව තොරතුරු හා ප්‍රචාරය ලබා දීම සඳහා විදුලි - නගර සේවා පුළුල් කර තිබේ. කුරුණෑගල, කුලියාපිටිය හා හලාවත යන වයඹ පළාතේ ප්‍රදේශවලට තවත් නව විදුලි පුරවර 3 ක් විවෘත කරනු ලැබීය. මින්නේරිය හා අනුරාධපුර ප්‍රදේශවල එනම් උතුරුමැද පළාතේ නව විදුලි පුරවර දෙකක් ආරම්භ කරනු ලැබීය.

අපගේ වටිනා පාරිභෝගිකයන්ට අපගේ සේවා වැඩිදියුණු කර ගැනීමේ අරමුණින් කොට්ඨාසය තුළ නව පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 3 ක් විවෘත කරනු ලැබීය. රිදීගම, ආණමඩුව හා හිරිපිටිය යන වයඹ පළාතේ ප්‍රදේශවල නව පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 3 ක් විවෘත කරනු ලැබීය.

කුරුණෑගල විදුලි පුරවර විවෘත කිරීම.

කොළඹ විදුලි පුරවර විවෘත කිරීම.

ලං.වි.ම. සේවා සැපයීමේදී පැන නගින ඕනෑම ගැටළුවක් විසඳීමේදී පාරිභෝගිකයන්ට පහසුකම් සැපයීමේ අරමුණින් උතුරු මැද පළාතේ පාරිභෝගික සමිති 3 ක්ද පිහිටුවනු ලැබීය. පාරිභෝගිකයන්ගේ සහයෝගය තුළින් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවා වැඩිදියුණු කිරීමටද මෙමගින් පහසුකම් සැලසේ.

විකුණුම්

2011 වසරේදී රටේ විදුලිබල විකුණුම්වලින් 27.9% ක ප්‍රමාණයක් බෙදාහැරීමේ අංශය 1 න් වාර්තා විය. මෙම වසරේදී ඉකුත් වසරට සාපේක්ෂව 8.7% වැඩි වීමක් සහිතව මෙම අංශයෙන් ගිගා වොට් පැය 2,797 ක විදුලිබලය විකුණා ඇත.

බෙදාහැරීමේ අංශය 1



බලශක්ති විකුණුම් කොටස - බෙදාහැරීමේ අංශය 1

ආදායම්

මෙම අංශයේ මුළු විකුණුම්වලින් 57% ක් කොළඹ නගරයෙන් ලැබුණු අතර වයඹ පළාත, උතුරු මැද පළාත හා උතුරු පලාත ඊට අඩුවෙන් විකුණුම් සිදුකර ඇත.



පළාත අනුව විදුලිබල විකුණුම්වලින් ලද ආදායම

වසර තුළ විදුලිබල විකුණුම්වලින් ලද ආදායම ඉකුත් වසරට සාපේක්ෂව 11% කින් වැඩි වී ඇති අතර එය රු.මිලියන 42,771 කි.



ආදායම්වල කොටස - බෙදාහැරීමේ අංශය 1



බෙදාහැරීමේ අංශයේ 1 හි පළාත්වල සාමාන්‍ය විකුණුම් මිල

විදුලිබල පාරිභෝගික ගිණුම් හා නව සේවා සම්බන්ධතා

2011 වසර අවසාන වන විට බෙදාහැරීමේ අංශය 1 න් පාරිභෝගික ගිණුම් 1,265,463 ක් වාර්තා වී තිබුණි. පාරිභෝගික ගිණුම්වලින් බහුතරය ගෘහස්ත ප්‍රභේදයට අයත් වූ අතර දෙවන ඉහළම ගිණුම් වූයේ වාණිජ ප්‍රභේදයට අයත් ඒවාය. වසර අවසාන වන විට තොග වශයෙන් විදුලිබලය සපයනු ලැබූ පාරිභෝගිකයන් සංඛ්‍යාව 2,865 කි. තොග වශයෙන් විදුලිබලය සපයනු ලැබූ පාරිභෝගිකයන් වැඩිම ගණනක් වාර්තා වූයේ කොළඹ නගරයෙනි.



අය ක්‍රමය අනුව පාරිභෝගික ගිණුම්

බෙදාහැරීමේ අංශය 1 හි පාරිභෝගික ගිණුම්වල මුළු ගණනින් වැඩිම පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව වූ 627,289 වාර්තා වූයේ වයඹ පළාතෙනි. එමෙන්ම අඩුම ගණන වූ 157,000 කොළඹ නගරයෙන් වාර්තා විය.



පළාත අනුව පාරිභෝගික ගිණුම්

බෙදාහැරීමේ අංශය 1

ප්‍රාදේශීය මණු පරීක්ෂණාගාරය

2011 වසර ප්‍රාදේශීය මණු පරීක්ෂණාගාරය සඳහා තවත් අභියෝගාත්මක වසරක් විය. වසර ආරම්භයේ සිටම මණු පරීක්ෂාගාරයේ සේවක මණ්ඩලයේ දක්ෂතා නැවත වරක් පරීක්ෂණයට භාජනය විය. එයට හේතුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂම දිවයිනේ සියලුම තොග සැපයුම්වල අය ක්‍රමය වෙනස් කිරීමයි. මෙය මෙම අංශයට සැබෑම අභියෝගයක් වූයේ සමස්ථ දිවයිනේ 6,500 ක් වන සැපයුම්කරුවන් අතරින් දළ වශයෙන් 2,330 ක් වත් තොග සැපයුම්කරුවන් වීමය. 2011 මාර්තු අවසානයට පෙර මෙම නව අය ක්‍රමයට ගැළපෙන පරිදි මෙම සියලුම තොග සැපයුම් සඳහා නිශ්චිත සැලැස්මක් සකස් කිරීමේ ඉලක්කය ජය ගැනීමට අංශයට සිදු විය.

මෙම අභියෝගය වූයේ ලැබී තිබූ කාල සීමාව වන සති 12 ක් තුළ සියලුම අත්‍යවශ්‍ය යටිතල පහසුකම් (මානව සම්පත්,වාහන,පරිගණක වැඩසටහන් සම්පාදනය කිරීම) අත්කර ගැනීම හා පරීක්ෂණාගාරයෙන් පිටත අනෙකුත් ඒකකවලින් ලබා ගන්නා ලද පුද්ගලයන්ට පරිගණක වැඩ සටහන් සම්පාදනය කිරීම පිළිබඳ පුහුණුවක් සැපයීම ආදී කටයුතු කිරීමයි. මෙම කාර්යය අවසන් කිරීම සඳහා ලබා දී තිබූ කාල සීමාව තුල මණු පරීක්ෂණාගාරය - බෙදාහැරීමේ අංශය 1 විසින් භාර ගෙන තිබූ එම කටයුත්ත සාර්ථකව අවසන් කරනු ලැබීය. මෙම කාර්යයේ අවසාන ප්‍රතිඵල පහත සඳහන් කර ඇත.

- පරිශ්‍රය තුළදී ක්‍රම ලේඛනය කරනු ලැබූ මණු සංඛ්‍යාව 1,545
- දුරස්ථ ප්‍රවේශය තුලින් ක්‍රම ලේඛනය කරනු ලැබූ මණු සංඛ්‍යාව: 370
- ඉවත් කරන ලද මනු සංඛ්‍යාව: 360 (බටහිර කොළඹ ප්‍රදේශයේ), අනෙක් ප්‍රදේශවල 26 යි.

මනු ක්‍රම නැවත සකස් කරීම සම්බන්ධයෙන් මාස තුනක පමණ කාලයක් ගත කළද, මනු පරීක්ෂණාගාරයේ සේවක මණ්ඩලය වයඹ පළාත, උතුරුමැද පළාත හා උතුරු පළාතේ පිහිටි මනු සිරිත් පරිදි පරීක්ෂා කිරීම් සම්පූර්ණ කිරීමට සමත්ව සිටියි. ඉතිරි වී ඇති මාස 7 ක කාල සීමාව තුලදී ප්‍රදේශ 14 කින් ලැබී තිබූ මහජන පැමිණිලි සියල්ල පිළිබඳව විමසීම් කිරීමටද සමත් වූහ. මෙම පලාත්වල ප්‍රදේශ 10 ක දළ වශයෙන් මනු 1,150 ක් පමණ පරීක්ෂා කිරීමට හැකි විය.

මනු පරීක්ෂණාගාරයෙන් පුහුණු කිරීමේ වැඩ සටහන් පැවැත්වෙනු ලැබේ. කිලිනොච්චි ප්‍රදේශයේ තොග සැපයුම් මනු තතැඳීම පිළිබඳව පුහුණු වැඩසටහන් මෙම වසරේදී පවත්වා ඇත.

සැපයුම් පිලිබඳ විශ්වසනීයත්වය

බෙදාහැරීමේ අංශය 1 හි සැලසුම් සංවර්ධන ශාඛාව මගින් එහි පාරිභෝගිකයන්ට සැපයුම පිළිබඳ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමට ප්‍රයත්න දරයි. බිඳ වැටීම් අඩු කිරීමට හා සදොස් අංශවල පිහිටීම සෙවීමට/ඒකලනය කිරීමට ගතවන කාලය අඩු කිරීමට පියවර කීපයක් අනුගමනය කර තිබේ. මෙමගින් සැපයුම ඉක්මනින් යථා තත්ත්වයට පත්කර ජාලය පිලිබඳ විශ්වසනීයත්වය වැඩි කිරීම අරමුණු කෙරේ.

වෘක්ෂලතාදිය සම්බන්ධ දෝෂ හා අයහපත් කාලගුණ තත්ත්ව ආදී බාධවන් වැනි බොහෝ ආකාරවලින් බෙදාහැරීම් ජාලයට හානි සිදු වේ. මෙයට ප්‍රධානම හේතුව වන්නේ බෙදාහැරීම් ජාලය ප්‍රධාන වශයෙන්ම ඉහළින් පිහිටා තිබෙන ජාලයක් වීමයි. (මධ්‍යම වෝල්ටීයතා බෙදා හැරීම් ජාලය යටි බහන් රැහැන් පද්ධතියක් වන කොළඹ නගරයේ හැර) ස්වයංක්‍රීය පද්ධති පැන්නුම ඇතින් ඇති වෘක්ෂලතාදිය හා අතු, පිළිස්සීම හා සංරචක දිරාපත්වීම බිඳවැටීම් සඳහා ප්‍රධාන හේතු වේ. වසර තුළදී මෙම අංශයේ මධ්‍යම වෝල්ටීයතා ජාලයේ සාමාන්‍ය බිඳවැටුම් අනුපාතිකය මසකට රැහැන් දුර කි.මී.100 කට 7.5 ක් විය. අඩු වෝල්ටීයතා ජාලය සඳහා මෙය මසකට කි.මී.100 කට 20.7 ක් විය. 2010 වසර සඳහා මෙම අනුරූප අගය පිලිවෙළින් 6.1 හා 21.2 ක් විය.



පලාත්වල මධ්‍යම වෝල්ටීයතා ජාලයේ බිඳ වැටීම්



පලාත්වල අඩු වෝල්ටීයතා ජාලයේ බිඳ වැටීම්

බෙදාහැරීම් පාලන මධ්‍යස්ථාන හා බෙදාහැරීම් සඳහා යන්ත්‍ර භාවිතය

සේවා විශ්වසනීයත්වය සඳහා සෑම විටම මුඛ්‍ය වැදගත්කමක් ලබා දීම අවශ්‍ය වේ. සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමෙන් විදුලිය ක්‍රියා විරහිතව පවතින කාලය අඩු කිරීම, බිඳ වැටීම් අනුපාතිකය අඩු වීම හා පිළිසකර කිරීමේ කාලයද අඩු කිරීම අදහස් කෙරේ. ශ්‍රී ලංකාව වැනි ඝර්ම කලාපික රටවල ඉහළින් සවි කළ නිරාවරණය වූ සන්නායක වෝල්ටීයතාවෙන් යුත් ජාලයේ බිඳ වැටීම් කිසියම් මට්ටමක් ඉක්මවා අඩු කිරීම ලාභ දායක නොවන අතර ප්‍රායෝගික වශයෙන්ද අපහසුය. එබැවින් දෝෂ සිදු වූ ස්ථානය හඳුනා පිළිසකර කිරීමේ කාලය අඩු කිරීම අනෙක් පියවරයි. දුරස්ථ ස්ථානයක සිට ආදාන දත්ත එසැනින් සැකසීමෙන් ප්‍රතික්‍රියා කරන (පද්ධති) ආකාරයෙන් බෙදා හැරීමේ සංරචක දුරස්ථාව අධීක්ෂණය කිරීම, සමායෝජනය හා ක්‍රියා කරවීමට හැකි වන පරිදි බෙදා හැරීමේ ජාල කාර්යයන් ස්වයංක්‍රීය යන්ත්‍ර භාවිතය මගින් සිදු කිරීමෙන් මෙය ළඟා කර ගත හැකිය.

උතුරු පළාත සඳහා බෙදා හැරීමේ පාලන මධ්‍යස්ථානයක කටයුතු 2012 වසරේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර එමගින් උතුරු පළාතේ මධ්‍යම වෝල්ටීයතා හා අඩු වෝල්ටීයතා ජාල සමස්ථය අධීක්ෂණය කරනු ඇත.

පාලන මධ්‍යස්ථානයේ ඉංජිනේරු හා අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා උපකරණ නිෂ්පාදකයන් මගින් ස්විච සවි කිරීම, ස්විච නැවත සකස් කිරීම හා ස්කාඩා පද්ධතිය පිළිබඳ අවශ්‍ය පුහුණුවීම් සූදානම් කර ඇත.

බෙදාහැරීමේ අංශය 1

මධ්‍යම වෝල්ටීයතා ජාලයේ බිඳවැටීම්වලට හේතු - පළාත්



වයඹ



උතුරු මැද



උතුර



කොළඹ නගරය

සැපයුම් විශ්වසනීයත්වය පිලිබඳ පිළිබිඹු කරන වසර තුළ වයඹ පළාත, උතුරුමැද පළාත හා කොළඹ නගරයේ බෙදාහැරීම් පාලන මධ්‍යස්ථාන මගින් අධීක්ෂණය කර ගණනය කරන ලද වයඹ පළාතේ, උතුරුමැද පළාතේ හා කොළඹ නගරයේ පාර්භෝගික මට්ටමේ විශ්වසනීයත්ව දර්ශක පහත දැක්වේ.

	වයඹ පළාත		උතුරුමැද පළාත		කොළඹ නගරය	
	2011	2010	2011	2010	2011	2010
පද්ධති සාමාන්‍ය බාධක සංඛ්‍යාත දර්ශකය(SAIFI)	38	39.6	18	19.8	-	-
පද්ධති සාමාන්‍ය බාධක කාල දර්ශකය SAIDI (පැය)	73	80	64	57	0.3	0.64

පළාත් අනුව විශ්වසනීයත්ව දර්ශක

ලං.වි.ම. බෙදාහැරීමේ අංශය 1 හි තවත් බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථාන දෙකක් කොළඹ නගරයේ සහ උතුරුමැද පළාතේ ක්‍රියාත්මක කර තිබේ. කොළඹ නගරයේ පාලන මධ්‍යස්ථානය නව්‍ය සංවර්ධන තත්ත්වයෙන් පවතින අතර බෙදා හැරීමේ ස්කාඩා හා බෙදා හැරීමේ ස්වයංකරණයද සහිත වේ.එමෙන්ම එය සන්නිවේදන පද්ධතිවලින් පරිපූර්ණ කර තිබේ. ස්කාඩා තුළින් උපකරණවල දුරස්ථ ක්‍රියාකාරීත්වය සඳහා මෙහෙයුම් හා ආරක්ෂක ක්‍රියාමාර්ග හා මෙහෙයුම් නිර්ණායක වැඩි දියුණු කර ඇත.

කොළඹ නගරයේ බෙදා හැරීම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සවි කරන ලද ස්කාඩා පද්ධතියක් තුළින් මධ්‍යම වෝල්ටීයතා ජාලය මෙහෙයවීමට ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවන් 7 දෙනෙකු පැය 24 පුරා යොදවා ඇත. කොළඹ 5, ක්ලේසන් පෙදෙසේ පිහිටා ඇති කොළඹ නගරයේ පාලන මධ්‍යස්ථානයෙන් මෙහෙයවනු ලබන උප පොළ 212 ක් මුලින්ම ස්වංකරණය කර තිබේ. ප්‍රකාශ තන්තු කේබල් හා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමෙන් සපයනු ලැබූ සම්බන්ධතා ස්වංකරණය කරන ලද උප පොළ හා කොළඹ නගරයේ පාලන මධ්‍යස්ථානය සමඟ සන්නිවේදනය සඳහා භාවිතා කරයි. මෙම පද්ධතිය ක්‍රියාත්මකව පවතින මුල් අදියරවලදී විදුලිය ක්‍රියා විරහිතව පවතින කාලය 30-40% කින් අඩු කිරීමට අපේක්ෂා කෙරේ. බෙදාහැරීම් පාලන මධ්‍යස්ථානය - උතුරු මැද පාලන මධ්‍යස්ථානය භාරව කටයුතු කිරීම සඳහා පාලන

බෙදාහැරීමේ අංශය 1

බෙදාහැරීම් පාලන මධ්‍යස්ථානය - කොළඹ නගරය

මධ්‍යස්ථාන ඉංජිනේරුවරයෙකු පත් කරනු ලැබීය. උතුරු මැද පළාතේ සවි කර ඇති ධාරිතා බණ්ඩන ස්විච 27 ක් (දුරස්ථ හා අතින් ක්‍රියා කරන) ස්වංක්‍රීය පිළිවසු 24 ක් සහ දුරස්ථ සාවද්‍ය මං දර්ශක 21 ඒවා බෙදා හැරීම් පාලන මධ්‍යස්ථානය මගින් ඒවා පාලනය/අධීක්ෂණය වේ. බිඳ වැටීම් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය, බිඳවැටීම් දත්ත සටහන් කිරීම සහ බිඳ වැටීම් අංශ ඒකලනය, බිඳ වැටීම් කණ්ඩායම පිටත් කර හැරීම, ඉක්මනින් සැපයුම යථා තත්ත්වයට පත් කිරීම සමායෝජනය කිරීම සඳහා මෙම පාලන මධ්‍යස්ථානය මගින් පහසුකම් සලසා දෙයි.

2010 වසරේදී ක්‍රියාත්මක වූ වයඹ පළාත් පාලන මධ්‍යස්ථානය සැපයුම් බිඳ වැටීම් අධීක්ෂණය කිරීමට හා බිඳ වැටීම් ඉක්මනින් ඒකලනය/යථා තත්ත්වයට පත් කිරීමට සහය වෙමින් දවස මුළුල්ලේම ක්‍රියාත්මක වේ. පළාතේ සියලුම ඒකක සමායෝජනය කරමින් සැපයුම් බිඳ වැටීම්වලින් උපරිමය ලබා ගැනීමට සැලසුම් කරන ලද අතුරු බාධාවන් සැකසීම සිදු වේ. සැපයුම් බිඳ වැටීම් හේතුව මගින් විශ්ලේෂණය කරනු ලබන අතර යෝග්‍ය නඩත්තු සැලසුම් සකස් කිරීමට නඩත්තු අංශයට අවශ්‍ය පසුපෙවුම් සපයනු ලබයි.

මේ අතරතුර ස්විච සවි කරීම, ස්විච හා ස්කාඩ පද්ධතිය ක්‍රම ලේඛ කිරීම පිළිබඳව උපකරණ නිෂ්පාදකයන් උපයෝගී කොටගෙන පාලන මධ්‍යස්ථාන ඉංජිනේරුවන් හා වෙනත් අදාළ සේවකයන් සඳහා තවදුරටත් පුහුණුවීම් පිළියෙල කර ඇත.

පුනරුත්ථාපන හා පද්ධති වැඩිදියුණු කිරීමේ කටයුතු

විදුලිය ඇණිහිටීමේ කාලය දිග් ගැස්සීම වළක්වා ගැනීම සඳහා ධාරිතා බන්ඩන ස්විච හා ස්වංක්‍රීය පිළිමසු සඳහා අමතර කොටස් සපයා ඇත. මෙම වසරේදී, වයඹ පළාතේ, උතුරු මැද පළාතේ හා උතුරු පළාතේ මධ්‍යම වෝල්ටීයතාජාලයක් සවි කිරීම සඳහා දුරස්ථ පාලනය කළ හැකි ධාරි බණ්ඩන ස්විච සපයා ඇත.

වඩක්කින් වසන්තම් ව්‍යාපෘතිය යටතේ, උතුරු පළාත සඳහා ස්කාඩා හා දුරස්ථ පාලනය කළ හැකි ස්විච බොහොමයක් ඇණවුම් කර ඇත. බෙදා හැරීමේ ජාලයේ සැපයුම් ගුණාත්මක බව වැඩි දියුණු කර ගැනීමට පහත දක්වා ඇති පියවර අමතර වශයෙන් ගෙන ඇත.

ආර්ථිකමය වශයෙන් ප්‍රායෝගික විදුලිබල ප්‍රභවයක් සවි කිරීමේ වැදගත්කමක් නොමැති පරිභෝජනය කරන විදුලිය ප්‍රමාණය අඩු එමෙන්ම ප්‍රභවයේ සිට ඉතා අධික දුරකින් පිහිටි මධ්‍යම වෝල්ටීයතා රැහැන හේතුවෙන් වෝල්ටීයතාව ඉතා අඩු දුෂ්කර පළාත්වල ස්වයංක්‍රීය වෝල්ටීයතා රෙගියුලේටර් (කිලෝ වෝල්ට් 36) සවි කර ඇත. කල්පිටිය ප්‍රදේශයේ අඩු වෝල්ටීයතා තත්ත්වය මඟ හැරවීම සඳහා නිෂ්පාදකයාගේ අධීක්ෂණය යටතේ පුත්තලම කල්පිටිය අතුරු මාර්ගයේ කිලෝ වෝල්ට් 36 ක ස්වංක්‍රීය වෝල්ටීයතා රෙගියුලේටරයක් 2011 ජුලි මාසයේදී සවි කරනු ලැබීය. මෙම සවි කිරීමත් සමඟ, කල්පිටිය ප්‍රදේශයේ වොල්ටීයතාවයේ කැපී පෙනෙන වර්ධනයක් සිදු වී ඇති බව නිරීක්ෂණය කරනු ලැබීය. එයට අමතරව වෝල්ටීයතාව තවදුරටත් වැඩි කිරීමේ හැකියාව සොයා බැලීම සඳහා මෙම වසර තුළ කල්පිටිය ප්‍රදේශයේදී වෝල්ටීයතා කියවීම් කීපයක්ම (කාර්ය බහුල හා කාර්ය බහුල නොවන යන අවස්ථා දෙකේම) ලබා ගන්නා ලදි. මෙම කටයුත්ත 2012 වසරේදී පළමු කාර්තුව තුළදී අවසන් කරනු ඇත.

කිලෝ වෝල්ට් 33 වෝල්ටීයතාවය වැඩි දියුණු කිරීම සඳහා ස්වයංක්‍රීය වෝල්ටීයතා රෙගියුලේටරයක් අවශ්‍ය වන තවත් ස්ථානයක් ලෙස මන්නාරම හඳුනාගෙන තිබේ. මෙම වසර තුළදී වෝල්ටීයතා රෙගියුලේටරයක් සවි කිරීම සඳහා ඉඩමක් හඳුනාගෙන තිබෙන අතර ඒ පිළිබඳ තාක්ෂණ අධ්‍යයනයක් සිදු කිරීම දැනටමත් නිම කර තිබේ.

නිෂ්පාදකයා විසින් LBS ලබා දෙන ධාරිතා බණ්ඩන සවි කිරීම පිළිබඳ පුහුණුව

බෙදාහැරීම් හානි අඩු කිරීම

2002 වසරේදී දළ විදුලි ජනනයෙන් 17% තරම් ඉහළ අගයක පැවති ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීම් හානිය 2011 අවසානයේදී 9.44% ක ප්‍රමාණයකට ක්‍රමයෙන් අඩු කර තිබේ. පසුගිය වසර කීපය තුළ බෙදාහැරීම් අංශය මගින් දියත් කර තිබූ බෙදාහැරීම් හානි අඩු කිරීමේ වැඩසටහන් (කාර්මික හා වාණිජ) ශක්තිමත් ලෙස අධීක්ෂණය කිරීම හා ක්‍රියාත්මක කිරීම මූලිකවම මෙම බෙදා හැරීම් හානි අඩු කිරීමට හේතු විය.

බෙදාහැරීමේ අංශය 1

බෙදාහැරීමේ අංශය 1 ට ලබාදෙන බෙදාහැරීම් යෙදවුම්වලින් 8.7% ක බෙදාහැරීම් හානියක් පවත්වා ගැනීමට බෙදාහැරීමේ අංශය 1 ට හැකි විය. 2011 වසර තුළදී බෙදාහැරීමේ අංශය 1 හි ප්‍රාදේශීය මට්ටමේ හානි පිළිබඳ විශ්ලේෂණ පහත දක්වා ඇත.

පළාත	බලශක්ති යෙදවුම ගිගාවොට් පැය/වසර	හානි %
කොළඹ නගරය	1306.1	5.88
වයඹ පළාත	1092.1	9.15
උතුරුමැද පළාත	404.1	12.3
උතුරු පළාත	223.2	23.53
සමස්ථ බෙදාහැරීමේ අංශය 1	3025.5	9.4

1 වන අංශයේ බෙදාහැරීම් හානිය

මෙම 8.7% හානියෙන්, 7.7% ක් කාර්මික හානි ලෙස තක්සේරු කර ඇති අතර ඉතිරි 1 සොරකම් කිරීම්, අනවසර සැපයීම්, බිල්පත් දෝෂ, මනු කියවීමේ දෝෂ හා මනුගත නොකළ වීදි ලාම්පු ආදි කාර්මික නොවන හානි ලෙස තක්සේරු කර ඇත.

කාර්මික නොවන හානි අඩු කිරීමේ වැඩසටහනේ 1 වන අදියර යටතේ මෙම පළාත්වල දුරස්ථ මීටර් කියවීමේ ක්‍රියාවලි අඛණ්ඩව අධීක්ෂණය කරනු ලැබූ අතර අවශ්‍ය පරිදි ප්‍රාදේශීය ඉංජිනේරුවන්ට සහය ලබා දී තිබේ. උතුරු පළාතේ යාපනය හා කිලිනොච්චි ප්‍රදේශයේ සියලුම තොග සැපයුම් මනු වෙනුවට ක්‍රමිත මනු හා දුරස්ථ මනු කියවීමේ පහසුකම් කිලිනොච්චි හා යාපනය ප්‍රදේශ දෙකටම මෙම වසරේදී හඳුන්වා දී ඇත. තොග සැපයුම් පිළිබඳ වාණිජ හානි වාර්ෂික මනු පරීක්ෂා කිරීම් විධිමත් පරීක්ෂණ මෙන්ම ස්වයංක්‍රීය මනු කියවීම් මගින් ආසන්න වශයෙන් ශුන්‍ය මට්ටම දක්වා අඩු කර තිබේ.

එමෙන්ම මෙම වසර තුලදී තාක්ෂණික නොවන හානි අඩු කිරීමේ වැඩසටහනේ II වන අදියර ක්‍රියාත්මක කරනු ලැබීය. මේ යටතේ, කිලෝ වෝල්ට් පැය සටහන් කිරීමත් සමඟ ක්‍රමික මනු ඇම්පියර් 60 සවිකිරීම් සියල්ලම වෙනුවට සවි කිරීමට කටයුතු කරනු ලැබීය. ඇම්පියර් 60 පාරිභෝගිකයින් අතරින් කිලෝවෝල්ට් පැය 42 ට වඩා ඉල්ලුම් කරන පාරිභෝගිකයින් හඳුනා ගැනීමට මෙය සහය වේ. අනවසරයෙන් වෙනස්කම් කිරීමේ අවස්ථා පසුව විමර්ශනය කිරීම සඳහා මනුවල වාර්තා වේ. ඇම්පියර් 60 විද්‍යුත් යාන්ත්‍රික මනු වෙනුවට ක්‍රමික මනු යෙදීම, ඇම්පියර් 60 සවි කිරීම් අනවසර වෙන් කිරීම් රෝධක මනු කොටු සවි කිරීම මගින් ප්‍රනරුත්ථාපනය කිරීම හා පැඩ්ලොක් වර්ගයේ අනවසර වෙනස් කිරීම් රෝධක මුද්‍රා සවි කිරීම වැනි පියවරද මෙම වසර තුළදී අඛණ්ඩව සිදු කරනු ලැබීය.

වසර අවසානයේදී ප්‍රගතිය පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

ඇම්පියර් 60 සිල්ලර සැපයුම්	සවි කිරීම් සංඛ්‍යාව	මුළු අළුත්වැඩියා කිරීම් සංඛ්‍යාව	
		සංඛ්‍යාව	%
වයඹ	3085	1693	55%
උතුරුමැද	1081	906	84%
උතුර	822	162	19.7%
කොළඹ නගරය	අදාල නැත	අදාල නැත	අදාල නැත

තාක්ෂණික නොවන හානි අඩු කිරීමේ වැඩ සටහන ඇම්පියර් 60 අදියර 3

මෙයට සමාන කටයුත්තක් 2008 වසරේදී ආරම්භ කරනු ලැබීය. එනම් සියලුම තෙකලා ගෘහස්ථ නොවන සවි කිරීම්වල අනවසර වෙනස් කිරීම් රෝධක මනු කොටු, කොල පැහැති අනවසර වෙනස් කිරීමේ රෝධක පැඩ්ලොක් ආකාර මුද්‍රා සවි කිරීම හා AEE මගින් මනු වාර්ෂිකව පරීක්ෂා කිරීම් ආදි ඇම්පියර් 30 සැපයුම් සඳහා වයඹ හා උතුරු මැද පළාතේ, කොළඹ නගරය හා උතුරු පළාතේ තාක්ෂණික නොවන හානි අඩු කිරීමේ වැඩසටහනින් II අදියර ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලැබීය. මෙම සවි කිරීම්වලදී සියලුම දෝෂ සහිත මනු ඉවත් කර යෙදවීම සඳහා නව තෙකලා විද්‍යුත් යාන්ත්‍රික මනු මිලදී ගන්නා ලදි.

සමාලෝචිත වර්ෂය අවසානයේදී මෙම වැඩසටහනේ ප්‍රගතිය පහත දක්වා ඇත.

ඇම්පියර් 30 සිල්ලර සැපයුම්	සවි කිරීම් සංඛ්‍යාව	මුළු අලුත්වැඩියා කිරීම්	
		සංඛ්‍යාව	%
වයඹ	7965	3279	41
උතුරුමැද	4110	993	24
උතුරු	2149	50	2.3
කොළඹ නගරය	අදාල නැත	අදාල නැත	අදාල නැත

තාක්ෂණික නොවන හානි අවම කිරීමේ වැඩසටහන - ඇම්පියර් 30 අදියර 3

බිල්පත් ක්‍රමයේ පාරිභෝගික වාර්තා සමඟ සංසන්දනය කිරීමේ ආකාරයෙන් වයඹ පළාතේ හා උතුරුමැද පළාතේ බෙදාහැරීම් උප පොල සියල්ලේම උප පොළ බලශක්ති විගණනයක් ආරම්භ කරනු ලැබීය. සමාලෝචිත වර්ෂය තුළ මෙම ව්‍යායාමය තවදුරටත් වැඩි දියුණු කරනු ලැබීය. හානි අධික බෙදා හැරීමේ උප පොළ ප්‍රදේශ හඳුනා ගන්නා අතර සිදුවිය හැකි සොරකම් පිළිබඳව පරීක්ෂණ පැවැත්වෙමින් තිබේ. සමාලෝචිත වර්ෂය තුළ මෙම වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳ දත්ත පහත දක්වා තිබේ.

පලාත	උප පොළ ගණන	බලශක්ති අධීක්ෂණය කරන උප පොළ සංඛ්‍යාව	%
වයඹ	2770	1520	55%
උතුරුමැද	1653	853	52%

බෙදාහැරීම් උපපොල මීටර් සවිකිරීමේ ප්‍රගතිය

ඵලදායිතාව වැඩි දියුණු කිරීම හා තත්ත්ව කළමණාකරණය

අයිඑස්ඕ හා එස් පහ සංකල්පය

2011 වසර තුළදී මෙම අංශය තුළ ඵලදායිතාව වැඩි දියුණු කිරීම හා තත්ත්තව කළමණාකරණ අංශ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරනු ලැබීය. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ කාර්යාල පරිශ්‍රය, ප්‍රධාන ඉංජිනේරු (කුරුණෑගල), විදුලි ඉංජිනේරු (කුලියාපිටිය), විදුලි ඉංජිනේරු (වාරියපොල) ප්‍රදේශවලට හා පොතුහැර වි.පා.සේ.ම., කුරුණෑගල නගර වි.පා.සේ.ම., මාහෝ වි.පා.සේ.ම. සහ නාරම්මල වි.පා.සේ.ම., ප්‍රදේශවල තත්ත්ව කලමණාකරණ ක්‍රම ක්‍රියාත්මක කරනුයේ හා ලං.වි.ම. වයඹ පළාතේ පාරිභෝගිකයන්ට සේවා සැපයීම වැඩි දියුණු කිරීම සඳහාය. තවද, 2012 වසර ආරම්භයේදී ISO 9001:2008 QMS සහතිකය ලබා ගැනීමටද නියමිතව ඇත.

බෙදාහැරීමේ අංශය 1

මෙම අංශය තුළ පංච විධ ඵලදායිතා සංකල්පද සැලකිය යුතු මට්ටමින් වැඩි දියුණු වී ඇත. 2011 වර්ෂයේදී පාරිභෝගිකයින් හැසිරවීමේ අංශය යටතේ සමස්ත ලංකා එස් පහ සංකල්පය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ පලමු ස්ථානය දිනා ගැනීමට කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාල සමත් විය. තවද, ප්‍රධාන ඉංජිනේරු (බෙදාහැරීම් නඩත්තු) කාර්යාලය සමස්ත ලංකා එස් පහ සංකල්පය සඳහා වූ කාර්යාල අංශය යටතේ 3 වන ස්ථානය දිනා ගත් අතර සමස්ත ලංකා "එස් පහ" තරඟාවලියේදී ලංකා විදුලිබල මණ්ඩලයේ කුසලතා සම්මාන ලුණුවිල ප්‍රාථමික උපපොල (වෙන්නප්පුව ප්‍රදේශය) දිනා ගන්නා ලද අතර මාහෝ වි.පා.සේ.ම. සිදු කරන ඵලදායිතා වැඩි දියුණු කිරීම් පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව ලංකා විදුලිබල මණ්ඩලයෙන් විශේෂ සම්මානයක් දිනා ගන්නා ලදි.

වයඹ පලාත් ඵලදායිතා වැඩි දියුණු කිරීම්වලින් පසුව කාර්යාලය

2011 වසරේදී පාරිභෝගිකයින් හැසිරවීමේ අංශය යටතේ සමස්ත ලංකා "එස් පහ" සංකල්පය අනුව ලං.වි.ම.යේ 1 වන ස්ථානය කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය දිනා ගන්නා ලදි.

කොළඹ නගරයේ වෙබ් අඩවිය www.metroceb.lk

2011 මාර්තු මාසයේදී කොළඹ නගරයේ වෙබ් අඩවිය ආරම්භ කරනු ලැබීය. නව සම්බන්ධතා සඳහා ලියාපදිංචි වීම් සඳහා කොළඹ නගරයේ කාර්යාල සමඟ ගනුදෙනු කිරීමටද, කෙටි පණිවිඩ සේවය ආදියට, ආකෘති හා ලේඛන අවපතනය කිරීම, බිල් ගණක යන්ත්‍රය භාවිතයෙන් යවා ඇති බිල්පතේ නිරවද්‍යතාව සත්‍යාපනය කරීමට හා ප්‍රසිද්ධ කර ඇති ටෙන්ඩර් ඇතුළු ලං.වි.ම. විවිධ කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගැනීමට මෙම වෙබ් අඩවිය මගින් පහසුකම් ලබා දෙයි.

ඉලෙක්ට්‍රොනික ලේඛන කළමණාකරණය ක්‍රමය

සියලු ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල, ගබඩා හා තොග සැපයුම්

ශ්‍රී ලංකාවේ පලාත් ඵලදායිතා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා 2011 වසරේ ලං.වි.ම. එස් පහ තරඟයේ විශේෂ සම්මානයක් මණු පරීක්ෂණාගාරය බෙදාහැරීම් කලාප 1 විසින් දිනා ගන්නා ලදි.

ඒකකවල ආයතනය තුළදී සංවර්ධනය කරන ලද ඉලෙක්ට්‍රොනික ලේඛන කළමණාකරණ ක්‍රමයක් (EDMS) පවතී. මෙමගින් ලේඛන ආරක්ෂා කෙරෙන අතර මෙම කාර්යාල හා ඒකක තුළ, ඇතුළත හා පිටතට මෙම ලේඛනවල ගනුදෙනු හා චලන පිළිබඳව අනාවරණය කරයි.

ඉලෙක්ට්‍රොනික ලේඛන කළමණාකරණ ක්‍රමය මගින් කඩදාසි භාවිතයද බොහෝ දුරට අඩු කර කර තිබෙන අතර එමඟින් වියදම් කපා හැර පරිසරයට සහය ලබා දී තිබේ.

සේවකයන් හා නිළධාරීන් අතර කටයුතු ඉතා සමීපයෙන් අධීක්ෂණය කිරීම මගින් ප්‍රමාද අවම කර ගැනීමටද මෙයින් දායකත්වය ලැබී තිබේ. එක් එක් ඒකක භාරව සිටින ඉංජිනේරුවන් සඳහා EDMS (ඉලෙක්ට්‍රොනික ලේඛන කළමණාකරණ ක්‍රමය) පද්ධතියට පිවිසීමට හා කටයුතු කිරීමට පහසුකම් සපයා ඇති අතර එමඟින් ඔවුන්ගේ ඒකක මෙහෙවීමට හා අධීක්ෂණය කිරීමට ඔවුන්ට සම්පූර්ණ නම්‍යතාව ලැබී තිබේ.



ලං.වි.ම. කොළඹ නගරයේ වෙබ් අඩවිය.

ඉලෙක්ට්‍රොනික ලිපිගොනු කළමණාකරණ පද්ධතිය (EFMS)

ඉලෙක්ට්‍රොනික ගොනු කළමණාකරණ පද්ධතිය (EFMS) කොළඹ නගර කාර්යාලය මගින් අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද තවත්

බෙදාහැරීමේ අංශය 1

ව්‍යාපෘතියකි. විදුලිබල සැපයුම් ගිවිසුම්, පාරිභෝගික තොරතුරු, ගොඩනැගිලි සැලසුම් ආදී ඉතා වටිනා එමෙන්ම නැති වීමකදී නෛතික අවදානමක් ඇති වැදගත් ලේඛන ආරක්ෂා කිරීමට මෙය පහසුකම් සලසයි. බටහිර කොළඹ ප්‍රදේශයේ සියලුම පාරිභෝගික ලිපිගොනු පරීක්ෂා කර නැවත ආපසු ලබා ගැනීමේ පහසුකම් සහිතව server ගබඩා කර ඇත. ඉලෙක්ට්‍රොනික ලිපිගොනු කළමණාකරණ පද්ධතිය (EFMS) තොග සැපයුම් හා ආදායම් ඒකකවල ආරම්භ කර ඇත.

සේවා සම්බන්ධතා, ඉදි කිරීම් හා රජයේ සවි කිරීම් කටයුතු කළමණාකරණය සඳහා MITFIN පරිගණක මෘදුකාංග ක්‍රියාත්මක කිරීම.

තොරතුරු තාක්ෂණ ශාඛාවේ සහය ඇතිව , කාර්යාලවල, ගබඩාවල හා කොළඹ නගරයේ ඒකකවල සම්පූර්ණ ක්‍රියාකාරකම් කළමණාකරණය සිදු කිරීමට MITFIN මෘදුකාංගය පාරිභෝගිකරණය කර තිබුණි. සියලුම ශාඛා හා ඒකක එකට බැඳ තබන සීමිත පරිගණක ජාලයක් (LAN) ස්ථාපනය කර තිබුණි. මෙමගින් කඩදාසි අවශ්‍යතාව තවදුරටත් අඩුකර පරිසරයට සහය වී තිබුණි.

සේවා සම්බන්ධතා, බිඳ වැටීම්, ගොඩනැගිලි කටයුතු, රජයේ සවි කිරීම් කටයුතු හා තාවකාලික සම්බන්ධතා ආදී කොළඹ නගරය තුළ ඕනෑම ස්ථානයක සිදුවන සියලුම ක්‍රියාකාරකම් මෙම පද්ධතියේ සුවිගත කර තිබේ. ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් අධීක්ෂණය කළ හැකිය. මේ නිසා විගණනය සරල කටයුත්තක් වී ඇත. තවද,අදාළ තොරතුරු තථ්‍ය කාල ක්‍රියාව සමඟ ඇතළත් කිරීමෙන් තොග සත්‍යාපනය කිරීම සරල අභ්‍යාසයක් වී තිබේ.

මිනිස්බල (කාල පත්‍ර) උපයෝගී කර ගැනීම වැඩි දියුණු කිරීම සඳහා MITFIN තවදුරටත් වැඩිදියුණු කර තිබේ. (පාරිභෝගකරණය)

කොළඹ නගරය සඳහා ව්‍යාපෘති ඒකකයක් ස්ථාපිත කිරීම.

ලං.වි.ම. ඉංජිනේරුවන්ගේ සෘජු අධීක්ෂණය යටතේ ප්‍රාථමික උප පොළක් ගොඩ නැගීම බොහෝ කලකට ඉහත සිදු වූවා විය හැකිය. 2011 අගෝස්තු මාසයේදී ස්ථාපනය කරන ලද කොළඹ නගරයේ ව්‍යාපෘති ඒකකය කොළඹ නගරයේ පහත සඳහන් ව්‍යාපෘති භාරව කටයුතු කරයි.

1. කොළඹ 09 ඩැනිස්ටර් ද සිල්වා මාවතේ පිහිටි (උප - ව්‍යාපෘතිය) වායු පරිවරණ ස්විච්පන්න සමඟ ස්වයංකරණය කරන ලද ප්‍රාථමික උප පොළ 2 x මෙගාවෝල්ට් පැය 16, කිලෝවෝල්ට් 33/11 ඉදි කිරීම.
2. මැගසින් බන්ධනාගාරයේ පරිශ්‍රය තුළ ඇති D මූලික උප පොළ වැඩි දියුණු කිරීම. වායු පරිවරණ ස්විච්පන්න මෙගාවෝල්ට් ඇම්පියර් 3x12.5 හා කිලෝවෝල්ට් 33/11 සමඟ හා ස්වංකරණය කරන ලද වායු පරිවරණ ස්විච්පන්න 3x16 මෙගාවෝල්ට් ඇම්පියර් හා කිලෝවෝල්ට් 33/11 ඉදි කිරීම.
3. කිලෝවෝල්ට් 11 වායු පරිවරණ ස්විච්පන්න panels සමඟ ප්‍රාථමික උප පොළේ කිලෝ වෝල්ට් 11 MOCB panels වෙනුවට යෙදීම සහ ස්වංකරණය කිරීම.
4. උප බී (පිටකොටුව) තාවකාලික උප පොළක් දැනට පවතින තරා පැව් උපයෝගී කරගෙන ඉදි කිරීම.sub බී ඉහළ මට්ටමට පත් කිරීම සඳහා පහසුකම් සැලසීම නව සම්ප්‍රේෂණ ඉදි කිරීම් ඒකකය මගින් සිදු කරයි. මේ සඳහා 3x මෙගාවෝල්ට් ඇම්පියර් 3x 12.5 හා කිලෝ වෝල්ට් 33/11 සිට 2x මෙගාවෝල්ට් ඇම්පියර් 2 x 30 කිලෝ වෝල්ට් 132/11 වායු පරිවරණ ස්විච්පන්න භාවිතා කරයි.

පිරි සැලසුම, ප්‍රසම්පාදනය, සවි කිරීම, ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘතිවල පරීක්ෂණ කටයුතු කොළඹ නගරයේ ඉංජිනේරුවන් හා කාර්ය මණ්ඩලයක් මගින් සිදුකර ලං.වි.ම. හා ජාතියට එහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන පිරිවැය ඉතිරියක් ලබා දීමට කටයුතු කළහ. මෙම ක්‍රියාකාරකම් ලං.වි.ම. ඉංජිනේරු කුසලතා හා මතකය නැවත අළුත් කිරීමට හා සංවර්ධනය කිරීමටද සහය වනු ඇත. කොළඹ නගරයේ ව්‍යාපෘති ඒකකය හා සමගාමීව ඉහත සියළුම ව්‍යාපෘති සිදු වේ.

විදුලිය බෙදාහැරීමේ ක්‍රමය සංවර්ධනය කිරීම.

වයඹ පළාතේ විදුලිය බෙදා හැරීමේ ක්‍රමය සංවර්ධනය කිරීමේ එක් කොටසක් ලෙස 2011 වසරේදී පහත කටයුතු සිදු කරනු ලැබීය.

- පහත සඳහන් යෙදුම් සඳහා ගෝලීය ස්ථාපන ක්‍රමය (GPS) සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබීය.

  (අ) මධ්‍යම වෝල්ටීයතා (මෙ.වො.) සිතියම් යාවත්කාලීන කිරීම.
  (ආ) තක්සේරු කිරීම් පිළියෙල කිරීම සඳහා මධ්‍යම වෝල්ටීයතා නඩත්තු තොරතුරු රැස් කිරීම. (රැහැන් ආරක්ෂා කිරීම)
  (ඇ) තෙකලා පාරිභෝගික දත්ත පදනම සංවිධානය කිරීම.
  (ඈ) වයඹ පළාතේ ලං.වි.ම. දේපළ දත්ත පදනම සංවිධානය කිරීම.

- ArcGIS මෘදුකාංගයේ සහය ඇතිව GIS දත්ත පදනම සකස් කර තිබේ.

කොළඹ නගරයේ කාර්යාලය එහි භූගත බෙදාහැරීම් ජාලය පුළුල් කළ අතර වසර තුළ කරන ලද කටයුතු පහත සාරාංශගත කර තිබේ.

කාර්යය ප්‍රභේදය	කාර්යයේ ප්‍රමාණය		
	අධි සැර කේබල් (කි.මී.)	අඩු සැර කේබල් (කි.මී.)	උප පොළ (සංඛ්‍යාව)
තොග සැපයුම්, පිරිවැය ගෙවූ කාර්යය හා පද්ධති විශාලනය කිරීමේ කටයුතු	20	12.5	42
ඩීසීබී	-	0.2	-
ලයිටින් ශ්‍රී ලංකා	-	2.4	-

ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීම

2011 වසර තුළ අංශය තුළ ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීම හා ඒ සඳහා ඉටු කරන ලද කටයුතු පහත දැක්වේ.

කාර්යය වර්ගය	කාර්යයේ ප්‍රමාණය			
	අධි සැර HT /කි.මී	උප පොළ සංඛ්‍යාව	අඩු සැර LT /කි.මී	රැහැන් හැරවීම (කි.මී.)
ඩීසීබී	0	0	32.742	15.824
පීසීබී	0.62	5	82.647	22.602
ලයිටින් ශ්‍රී ලංකා (උතුරුමැද පළාත, වයඹ පළාත)	21	22	109.857	0.815
ගම නැගුම	11.3	12	383.549	65.919
රජරට නවෝදය	0	0	0.5	0
තොග සැපයුම්	27.915	116	4.298	1.1
පිරිවැය ගෙවූ කාර්යය	12.25	24	49.032	28.58
පද්ධති විශාලනය හා හානි අඩු කිරීම	37.81	46	3.544	64.92
රක්ෂණ සංචිත	0	0	0	0
අයිසීපී	0	0	0.07	0

බෙදාහැරීමේ අංශය 1

කාර්යය වර්ගය	කාර්යයේ ප්‍රමාණය			
	අධි සැර HT /කි.මී	උප පොළ සංඛ්‍යාව	අඩු සැර LT /කි.මී	රැහැන් හැරවීම (කි.මී.)
විශේෂ විදුලි ව්‍යාපෘති	7.2	2	17958	284
ඉරානය	6.631	3	5.995	0
ඒආර්ඊපී	95.35	55	710.442	13.655
එස්අයිඩීඒ	29.25	13	70.8	2
වෙනත්	0	0	0	0
මුළු	249.326	298	1471.434	218.255

ගැටුම්වලින් හානියට පත් වූ ප්‍රදේශ පුනුරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (CAARP)

සිවිල් කැළඹීම් හා කෝලාහල හේතුවෙන් බලපෑම්වලට ලක් වූ 12,000ක් පමණ වූ ගේ දොරවලට ප්‍රතිලාභ සැලසීමේ අපේක්ෂාවෙන් උතුරු හා නැගෙනහිර ගැටුම්වලින් බලපෑමට ලක් වූ ප්‍රදේශ පුනුරුත්ථාපනය හා පුළුල් කිරීමේ කටයුතු සඳහා විදුලිය ලබා දීමේ ව්‍යාපෘතියක් වන ගැටුම්වලින් හානියට පත් වූ ප්‍රදේශ පුනුරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (CAARP) මෙහෙයවීමට ඇමෙරිකානු ඩොලර් මිලියන 6.5 ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් සපයනු ලැබීය. අමතර ගේ දොර 9,000 කට විදුලිබලය සැපයීම සඳහා මෙම ව්‍යාපෘතිය පුළුල් කිරීමේ කටයුතු සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 8.6 ක් NORAD මගින් තවදුරටත් ප්‍රදානය කරනු ලැබීය. ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇ.ඩො.මිලියන 18.5 කි.මෙම ඉහත දක්වා ඇති ණය සංරචක 2010 වසරේදී භාවිත කරනු ලැබීය. උතුරු, නැගෙනහිර ප්‍රජා පිළිසකර කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය II පරිපූරක ණය (NECORD II) මගින් CAARP ව්‍යාපෘතිය යටතේ සම්පූර්ණ නොකළ කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 187 ක් සැපයීමට එකඟතාව පළකරන ලදි. ඉහත ණය මුදල යටතේ රු.මිලියන 126 ක් භාවිතා කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය දැනට අවසන් වීමට ආසන්නය.

යෝජනා ක්‍රම 147 ක් හා 35 මධ්‍යම වෝල්ටීයතා සංවර්ධන රැහැන් හා අටළු අංගන.

ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිය සැපයීමේ 4 ව්‍යාපෘතිය SIDA

ස්වීඩන් අන්තර්ජාතික සංවර්ධන නියෝජිතායතනය (SIDA) මගින් සපයනු ලැබූ ඇමෙරිකානු ඩොලර් මිලියන 28 ක විදේශීය සංරචකයක් සහිතව ඇමෙරිකානු ඩොලර් මිලියන 34 ක් වූ මුළු පිරිවැයකට ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීමේ ව්‍යාපෘතිය 4 යටතේ විදුලිබලය ඉදි කිරීමේ කටයුතු ඉතා විශාල පරිමාණයෙන් මුළු රට පුරාම සිදු කරනු ලැබීය.දළ වශයෙන් පාරිභෝගිකයින් 35,000 කට විදුලිබලය සඳහා ප්‍රවේශය සලසමින් නව විදුලිබලය ලබා දීමේ යෝජනා ක්‍රම 219 ක් ඉදි කරනු ලැබිණි.

කොන්ක්‍රීට් කණු හා තරා පැවි හැර සියළුම ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින් සපයනු ලබන අතර කොන්ක්‍රීට් කණු හා තරා පැවි සැපයීම හා ඉදි කිරීමේ කටයුතු ලං.වි.ම. මගින් සිදු කරනු ලබයි. කටයුත්තේ සම්පූර්ණ විෂය පථය වූයේ බෙදාහැරීම් උප පොළ 219, කිලෝවෝල්ට් 33 මධ්‍යම වෝල්ටීයතා රැහැන් කි.මී.33 මධ්‍යම වෝල්ටීයතා රැහැන් කි.මී.414 ඉදි කිරීමට, අඩු වෝල්ටීයතා තෙකලා ABC රැහැන් කි.මී.1,105 ක ඉදි කිරීම, හා රැහැන් කි.මී. 13 ක් ඉදි කිරීම.මෙම ව්‍යාපෘතිය 2011 වසරේ අවසානයේදී අවසන් කරනු ලැබිණි.

ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපීමේ ව්‍යාපෘතිය - 8 (ඉරානය)

පළාත් 11 ක එනම් වයඹ, මධ්‍යම, බටහිර උතුර, නැගෙනහිර, බටහිර දකුණ II -, සබරගමුව, බටහිර දකුණ I, දකුණු පළාතේ ගම්මාන 1,000 ක්ම විදුලිබලය සැපයීම ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීමේ ව්‍යාපෘතිය - 8 මගින් ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීමේ ශ්‍රී ලංකා රජයේ වැඩසටහන යටතේ අරමුණු කරනු ලැබීය.

ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීමේ ව්‍යාපෘතිය - 8 සඳහා ඉරාන රජය මගින් අරමුදල් සපයනු ලැබූ අතර මෙම ව්‍යාපෘතිය සඳහා මුළු ඇස්තමේන්තුගත පිරිවැය වූයේ ඇ.ඩො.මිලියන 106.5 කි. ලං.වි.ම. මගින් සපයනු ලබන වැරකැවූ හා පෙරැදි කොන්ක්‍රීට් කණු හැර ඉතිරි සියලුම ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින් සපයනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය යටතේ යෝජිත කාර්යය පථය:-

(අ) බෙදාහැරීම් උප පොළ 100kVA , කිලෝ වෝල්ට් 33/අඩු වෝල්ටීයතා 1000 සංඛ්‍යාවක් ඉදි කිරීම.

(ආ) කිලෝ වෝල්ට් 33 මධ්‍යම වෝල්ටීයතා රැහැන් 1000 ඉදි කිරීම.

(ඇ) පොදි බහන් සන්නායක, තෙකලා, අඩු වෝල්ටීයතා බෙදාහැරීම් කි.මී.4000ක් ඉදි කිරීම.

(ඈ) තෙකලා අඩු වෝල්ටීයතා බෙදා හැරීම් රැහැන් කි.මී.2000ක් ඉදි කිරීම.

(ඉ) කි.මී.500ක එකලා රැහැන් තෙකලා රැහැන් බවට පරිවර්තනය කිරීම.

ව්‍යාපෘති කාලය මාස 36 ක් වන අතර මෙම ව්‍යාපෘතිය සඳහා වාණිජ ගිවිසුම 2009 ජූනි මස 10 වන දා අත්සන් තබනු ලැබිණි. ද්‍රව්‍ය සඳහා දළ වශයෙන් 40% ක ගෙවීමක් කර තිබෙන අතර ද්‍රව්‍ය කොටස් මධ්‍යම ගබඩාවට හා ප්‍රාදේශීය ගබඩාවලට භාර දී තිබේ. යෝජනාක්‍රම ඉදි කිරීම පළාත්වලදී ආරම්භ කර ඇත.

ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීමේ ව්‍යාපෘතිය - 4 (පුළුල් කිරීම)

මෙම ව්‍යාපෘති යෝජනාවේ ප්‍රධාන අරමුණ වන්නේ Nordea බැංකුවේ සහය ඇතිව උතුරු මැද පළාතට 100% කින් විදුලිබලය සැපයීමයි. උප පොළ 550 ක්, නව අඩු වෝල්ටීයතා යෝජනා ක්‍රම කි.මී.2000ක්, අඩු වෝල්ටීයතා රැහැන් කි.මී.2000ක් එකලා රැහැන් තෙකලා බවට පරිවර්තනය කිරීම. ද්‍රව්‍ය ලැයිස්තුව තනා නිම කර තිබේ.

පිරිසිදු බලශක්ති හා පිවිසුම් වර්ධන ව්‍යාපෘතිය - ඉල්ලුම කළමනාකරණය වීථි පහන් ව්‍යාපෘතිය (4 කොටස)

පිරිසිදු බලශක්ති හා පිවිසුම් වර්ධන ව්‍යාපෘතිය - මහනගර සහ වීදි ආලෝකකරණය සඳහා ඉල්ලුම් අංශයේ කළමණාකරණය පිරිසිදු බලශක්ති හා පිවිසුම් වර්ධන ව්‍යාපෘතිය (මහ නගර සහා වීදි ආලෝකකරණය සඳහා ඉල්ලුම් අංශයේ කළමණාකරණය) (4 කොටස) යටතේ ලං.වි.ම. හා ලංකා විදුලිබල සමාගම විසින් තෝරා ගත් මහනගර සහා ප්‍රදේශවල වීදි ආලෝකකරණය මෙහෙයුම් කටයුතු භාර ගැනීම සඳහා මෙන්ම ආසියානු සංවර්ධන බැංකුවේ සහය ඇතිව ඉල්ලුම් අංශයේ කළමණාකරණය තුළින් බලශක්ති ඉතිරි කිරීමට උපරිම කර ගැනීමට අභ්‍යන්තර ඒකක පිහිටුවා තිබේ. මුළු ආයෝජන පිරිවැය ඇමෙරිකානු ඩොලර්මිලියන 4.2 ක් සඳහා වෙන වෙනම ප්‍රදාන දෙකක් මගින් අරමුදල් සැපයේ. (එකක් “Climate Change Fund” මගින් සපයනු ලබන ඇ.ඩො.මිලියන 2.2 හා අනෙක “Clean Energy Partnership Facility” යටතේ වන “Asian Clean Energy Fund” මගින් සැපයෙන ඇ.ඩො.මි.2 ය) සහ ඇ.ඩො.මිලියන 0.8 ක් රජය මගින් සැපයේ.

හෝමාගම ප්‍රදේශයේ ක්‍රියාත්මක වන නියමු ව්‍යාපෘතිය සවි කිරීම් සැපයීමේ අදියරේ පවතී. නියමු ව්‍යාපෘතියේ රැහැන් ඉදි කිරීම සම්පූර්ණ කර ඇත. දළ වශයෙන් කි.මී.90 ක දිගින් යුත් උප ව්‍යාපෘති දෙහිවල, ගම්පහ, කඩුගන්නාව, ත්‍රිකුණාමලය හා කුරුණෑගල ප්‍රදේශවල රු.මිලියන 215 ක වියදමක සමග ක්‍රියාත්මක වේ.

බෙදාහැරීමේ අංශය 1

පිරිසිදු බලශක්ති හා පිවිසුම් වර්ධන ව්‍යාපෘතිය - ග්‍රාමීය ගෘහ විදුලි සම්බන්ධතා (8 කොටස) ලබා දීම.

ග්‍රාමීය ගේ දොර සම්බන්ධතා ලබා දීමේ ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය ලබා දීමේ මෙහෙයුම් හා මූල්‍ය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමටද දුගී බව අඩු කිරීම සඳහා ග්‍රාමීයප්‍රදේශවලට විදුලිබලය ලබා දීමේ ආවරණ කලාපය පුළුල් කිරීමටද සහය ලැබෙනු ඇත. ග්‍රාමීය ජනගහනයට ග්‍රිඩ් විදුලිබලයට තිරසාර ලෙස පිවිසීමේ හැකියාව හා ග්‍රාමීය ප්‍රදේශවලට ලං.වි.ම. යෙන් වඩාත් සේවයක් ලබා දීම මෙම ව්‍යාපෘතියේ අවසාන ඵලය වනු ඇත. 2016 වසර අවසානට වන විට අවම වශයෙන් දුගී පවුල් 60,000කට පමණ විදුලිබල සම්බන්ධතා ලබා දීමට අපේක්ෂිතය. විදුලිබල සම්බන්ධතා ලබා ගැනීමට හැකි වීම නිසා අත්කර ගත හැකි ප්‍රතිලාභ පවුල් විසින් භුක්ති විඳින අතර ලං.වි.ම. ට බොහෝ පාරිභෝගිකයින් අතිකර ගැනීම මගින් වැඩිපුර ආදායම් උපදවා ගැනීමට හැකියාව ලැබෙන අතර රජය විසින් විදුලිබලය ලබා දීම පිළිබඳව නියම කර ගන්නා ලද ඉලක්ක ජය ගැනීමට හැකි වීමද ආදී වශයෙන් මෙම ව්‍යාපෘතියෙන් බොහෝ ප්‍රතිලාභ ළඟා කර ගත හැකිය. ණය මාලාවක් ස්ථාපනය කර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකි වන පරිදි ආසියානු සංවර්ධන බැංකුව මගින් ඇමෙරිකානු ඩොලර් මිලියන 3.5 ක අරමුදල් සපයා ඇත.

වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ හා අධීක්ෂණය කිරීමේ ඒකකයක් (PIMU) ලං.වි.ම. යේ ස්ථාපිත කර තිබෙන අතර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම එහි කාර්යභාරයයි. මූල්‍ය සේවා සපයන්නෙකු තෝරා ගැනීමේ අදියරේ මෙම ව්‍යාපෘතිය පවතී.

උතුරු මැද පළාතට 100% කින් විදුලිබලය සැපයීම.

උතුරු මැද පළාතේ පිහිටා ඇති සෑම නිවාසයකටම විදුලිය සැපයීම සහ උතුරු මැද පළාතේ සැමටම විදුලි සැපයුමේ තත්ත්වය, විශ්වසනීයභාවය හා සේවය වැඩි දියුණු කිරීමට 100% කින් උතුරු මැද පළාතට විදුලිය සැපයීමේ අරමුණු වේ.

බෙදා හැරීම් උප පොළ 550 ක් ස්ථාපනය කිරීම, මධ්‍යම වෝල්ටීයතා රැහැන් කි.මී.825 ක් ඉදි කිරීමට හා අඩුවෝල්ටීයතා රැහැන් කි.මී.4200 ක් ඉදි කිරීමට මෙම ව්‍යාපෘතියෙන් ආවරණය කෙරේ. ඉල්ලුම සැපයීම සඳහා ඊ ලඟ වසර තුළදී පොළොන්නරුව කොටුමා උපපොළ ඉදිකෙරෙනු ඇත.

වඩික්කිල් වසන්තම් ව්‍යාපෘතිය.

සමාලෝචිත වසර තුළදී මාන්කුළම් - මුලතිව් (කි.මී.51), මාන්කුළම් -තුන්නුකායි (කි.මී.23),කිලිනොච්චි - පරන්තන් (කි.මී.5), ඔඩ්ඩු සුඩාන් - නැදුන්කර්නි (කි.මී.11), මුලතිව් - උප්පුමාවේලි (කි.මී.6), මුහුමාලි - පලෙයි (කි.මී.12) රැහැන් සම්පූර්ණ කර ඇති අතර මුලතිව් නගරය

වඩික්කිල් වසන්තම් ව්‍යාපෘතිය යටතට පැමිණෙන නව යෝජනා ක්‍රම විවෘත කිරීමේ උත්සවය.

ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර ඇත.
වඩික්කිල් වසන්තම් ව්‍යාපෘතිය යටතේ 2011 වසර තුළ සවිකරන ලද මුළු ට්‍රාන්ස්ෆෝමර් සංඛ්‍යාව වූයේ

වව්නියා දිස්ත්‍රික්කය	13
මුලතිව් දිස්ත්‍රික්කය	11
කිලිනොච්චි දිස්ත්‍රික්කය	5
මන්නාරම දිස්ත්‍රික්කය	8
යාපනය දිස්ත්‍රික්කය	5
මුළු උතුරු පළාත	42

2011 වසර තුළදී උතුරු පළාතේ විදුලිබල සැපයුම සංර්ධනය කිරීම සඳහා වඩික්කිල් වසන්තම් මගින් රු.මිලියන 916 ක් වැය කරනු ලැබීය. වර්ෂය තුළ උතුරු පළාත තුළ ඇති වූ මුළු ප්‍රගතිය වන්නේ අධිසැර - කි.මී.422, උප පොළ - සංඛ්‍යාව 135, අඩුසැර - කි.මී.884

ව්‍යාපෘති හා බැර නඩත්තු කටයුතු.

කි.වෝල්ට් 33 කුළුණු රැහැන්, කි.වෝල්ට් 33/11 ප්‍රාථමික උප පොළ, ග්‍රැන්ට්, ස්වයං පිළිමසු, බැර කඩන වහරු හා ඉහළ වෝල්ටියතා මනින තරා පැවි සම්බන්ධ නඩත්තු හා ඉදි කිරීම් කටයුතු ව්‍යාපෘති හා බැර නඩත්තු කටයුතු ශාඛාව මගින් සිදු කරනු ලබයි. දෛනික නඩත්තු කටයුතුවලට අමතරව පහත සඳහන් වැඩි දියුණු කිරීම් ද අත්පත් කරගෙන තිබේ.

සැපයුමට බාධා සිදු නොවන අන්දමින් මධ්‍යම වෝලටියතා කුලුණු රැ හැන් දෛනික නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා 2011 පළමු කාර්තුව තුළ පද්ධතියේ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සජීවී රැහැන් නඩත්තු කටයුතු හඳුන්වා දෙනු ලැබීය. සන්නිවේදන මාර්ග නඩත්තු කිරීම සඳහා එකට ඈඳුනු විදුලි උපකරණ කට්ටලයක් සමඟ සන්නිවේදන මාර්ග නඩත්තු ක්‍රියා පිළිවෙල පිළිබඳව ඉන්දියාවේදී විශේෂ පුහුණුවක් ලැබූ එක ඉංජිනේරුවරයෙකු, විදුලි අධිකාරීවරු දෙදෙනෙකු හා කම්කරුවන් පස් දෙනෙකු මුලින්ම යොදවනු ලැබීය. මෙම විදුලි උපකරණ කට්ටලය අවශ්‍ය සියලුම උපාංගවලින් සමන්විත විය. බෙදාහැරීමේ අංශය 1 හි ප්‍රථම වරට 2011 අප්‍රේල් මාසයේදී සන්නිවේදන මාර්ග නඩත්තු කටයුතු ආරම්භ විය. වසර අවසානයේදී අධිවේගී මාර්ගවල දෛනික නඩත්තු කටයුතු සඳහා සිදු කරනු ලැබූ සැළසුම් කළ විදුලිබල අතරමඟ ඇණහිටීම් සැලකිය යුතු අන්දමින් අඩු විය. එම නිසා, සජීවී රැහැන් නඩත්තු කිරීම සඳහා විදුලි උපකරණ කට්ටල් සංඛ්‍යාව වැඩි කිරීම මගින් පද්ධතියේ විශ්වසනීය බව තවදුරටත් වැඩි දියුණු කිරීමේ සැලසුම් සකස් කෙරෙමින් පවතී. මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා ලං.වි.ම. කාර්ය මණ්ඩල සාමාජිකයින් අතරින් තෝරා ගන්නා ලද සුළු පිරිසකට සජීවී රැහැන් නඩත්තු කිරීමේ ශිල්ප ක්‍රම පිලිබඳව රැකියාවේ නියැලී සිටියදීම පුහුණුවක් ලබා දෙනු ලැබූ අතර ඔවුන්ව සජීවී රැහැන්වල කටයුතුවලට යොදවා ඇත. හබරණ පුහුණු මධ්‍යස්ථානය 2012 වසරේ අවසානය වන විට ඉදි කිරීමට මූලික කටයුතු ආරම්භ කර තිබෙන්නේ ලං.වි.ම. කාර්මික කාර්ය මණ්ඩලයට සජීවී රැහැන් නඩත්තු කටයුතු පිළිබඳව පුහුණු කිරීමට හා සන්නිවේදන විදුලි උපකරණ කට්ටල්වල කටයුතු කිරීමට සුදුසුකම් ලැබීමට ඔවුන්ට අවස්ථාවක් ලබා දීමටය. අඛණ්ඩව ක්‍රියාත්මක වන මධ්‍යම වෝල්ටීයතා සංවර්ධන කටයුතුවල කොටසක් වශයෙන් ව්‍යාපෘති හා බැර නඩත්තු අංශය මගින් ස්විච් චි පන්න මැසි 4 ක් උතුරු පළාතේ වඩුක්කොඩෙයි, චාවකච්චේරි, පෙරේතන්කුළම් හා මාන්කුළම් යන ප්‍රදේශවල 2011 වසරේදී CAARP ව්‍යාපෘතිය යටතේ දළ වශයෙන් මුළු පිරිවැය වූ රු.මිලියන 80 ක් ආයෝජනය කර ඉදි කරනු ලැබීය. එයට අමතරව, මෙම වසරේදී පරමේෂ්වරම් ප්‍රාථමිකයේ ධාරිතාව 3x මොගාවොට් ඇම්පියර් 2 සිට 2x මොගාවොට් ඇම්පියර් 5 දක්වා වැඩි දියුණු කරන ලදි. ශ්‍රී ලංකාවේ ප්‍රථම වෝල්ටීයතා රෙගුයුලේටරය කල්පිටිය අර්ධද්වීපයේ වෝල්ටීයතාව වැඩි දියුණු කිරීම සඳහා පාදුක්කේ සවි කරනු ලැබීය. මුළු පිරිවැය වූ රු.මිලියන 250 කට තුල්හිරිය ග්‍රිඩ් උපපොළේ සිට නාරම්මල අටළු අංගනය දක්වා කි.මී.20 ක් වන ද්විත්ව පරිපථ කුළුණු රැහැන ඉදි කිරීම

බෙදාහැරීමේ අංශය 1

සම්පූර්ණ කරන නව කිලෝ වෝල්ට් 33 අධි වේගී කුළුණු රැහැන්වල කි.මී.85 ක දිගක්ව සඳහා මූලික බිම් සමීක්ෂණය 2011 වසරේදී ආරම්භ විය. භූමිය වෙන් කිරීමේ කටයුතු අනාගතයේ ඉදිකරනු ලබන අටළු අංගන 6 ක් සඳහා ආරම්භ කරනු ලැබූ අතර 2011 වසරේ අවසානයේදී එයින් තුනක් නිම කිරීමට අපේක්ෂිතය.

කුළුණු රැහැන්, ප්‍රාථමික උපපොළවල් හා අටළු අංගන පිළිබඳ පිරිසැලසුම් කටයුතු පිළිබඳ කටයුතු කිරීම සඳහා ව්‍යාපෘති හා බැර නඩත්තු ශාඛාවට අනුබද්ධව පිරිසැලසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට මූලික පියවර ගෙන ඇත. මූල්‍ය මෙන්ම කාර්මික ප්‍රශස්තකරණය තුළින් පොදු අරමුදල් ඉතිරි කර ගැනීමට අභ්‍යන්තර කුසලතා වැඩිදියුණු කර ගැනීම පිරිසැලසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ අරමුණයි. මෙම අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා PLSCAD නම් වන විශේෂ කුළුණු රැහැන් මෘදුකාංගයක් මිලදී ගෙන තිබේ. 2011 වසර අවසානය වන විට, සියලුම අනාගත මධ්‍යම වෝල්ටීයතා කුළුණු රැහැන්වල පිරිසැලසුම් කටයුතු හා පාංශු පරීක්ෂණ කටයුතු සඳහා නූතන මිණුම් උපකරණ හා පාංශු පරීක්ෂණ උපකරණවලින් පිරිසැලසුම් මධ්‍යස්ථානය සමන්විත වනු ඇත.

කි.මී.5 ක දිගකට වඩා අඩු, සේවකයන් රහිත ප්‍රාථමික උප පොළ හා අටළු අංගන වල ඉදි කිරීම් කටයුතු අනාගතයේදී බාහිර කොන්ත්‍රාත්තු මත විශ්වාසය නොතබා අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ කෘතහස්තභාවය හා කුසලතා සමඟ ඉදි කිරීම් කටයුතු භාර ගැනීමට මෙම අංශය බලාපොරොත්තු වෙයි.

ව්‍යාපෘති හා අධිසැර නඩත්තු බෙදාහැරීමේ අංශය 1 ශාඛාවේ ඉදි කිරීම් කටයුතු

කාර්ය මණ්ඩල සුබසාධනය

වයඹ පළාතේ අලුත් අවුරුදු උත්සවයේ විශේෂ අවස්ථා

බෙදාහැරීමේ අංශය 1 හි කණ්ඩායම් කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වඩා හොඳ වැඩ පරිසරයක් ඇති කරීම, සම්බන්ධයෙන් සේවකයන් නිරත කරවීම සඳහා බොහෝ අවස්ථා සංවිධානය කරනු ලැබූ අතර කුලියාපිටිය ශිල්ප ශාලිකාවේ පැවැත්වූ වාර්ෂික ක්‍රීඩා උත්සවය හා නිකවැරටිය විතිකුලියේ පැවැත්වූ සිංහල අළුත් අවුරුදු උත්සවය වේ.

උතුරුමැද පළාත සුභසාධන සංගමයක් ස්ථාපිතකරන ලද අතර එමඟින් කාර්ය මණ්ඩලය අතර සංස්කෘතික උත්සව හා ක්‍රීඩා ක්‍රියාකාරකම් සංවිධානය කරනු ලැබීය.කණ්ඩායමේ ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර ක්‍රීඩා තරඟද උතුරු මැද පළාත මගින් සංවිධානය කරනු ලැබිණි.

2600 වන ශ්‍රී සම්බුද්ධ ජයන්ති සැමරුම - 2011 මැයි

සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ පිහිටි ලං.වි.ම. ප්‍රධාන කාර්යාලය 2600 වන ශ්‍රී සම්බුද්ධ ජයන්ති සැමරුම් උත්සවය වෙනුවෙන් ආලෝකමත් කිරීම කොළඹ නගර ශාඛාව විසින් භාර ගන්නා ලදි. සැරසිලි හා ආලෝකමත් කිරීම මගින් බොහෝ මහජනතාවගේ උසස් මට්ටමේ ප්‍රශංසා ලබා ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකි විය.

බෙදාහැරීමේ අංශය 2

මෙහෙයුම් ප්‍රදේශය

බෙදාහැරීමේ අංශය 2 මගින් සම්පූර්ණ නැගෙනහිර හා මධ්‍යම පළාතේ හා බස්නාහිර පළාතේ - උතුර (බ.ප.උ.) වන බස්නාහිර පළාතේ කොටසක් ආවරණය වේ. අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය හා කල්මුනේ යන ප්‍රදේශවලට නැගෙනහිර පළාත බෙදා තිබේ. මහනුවර නගරය, පේරාදෙනිය, නාවලපිටිය, කෑගල්ල, කුණ්ඩසාලේ, කටුගස්තොට හා මාතලේ යන ප්‍රදේශවලින් මධ්‍යම පළාත සමන්විත වේ. බස්නාහිර පළාතේ උතුර මගින් ගම්පහ, කැළණිය, මීගමුව, ජාඇල, දිවුලපිටිය හා වේයන්ගොඩ ප්‍රදේශ ආවරණය වේ. මෙම අංශය මගින් මිලියන 4.5 කට අධික ශ්‍රී ලාංකික පාරිභෝගිකයන් අතරින්, පාරිභෝගිකයන් 1,488,745 කට මෙම අංශය මගින් අවශ්‍ය සේවා ඉටු කරයි.



බෙදාහැරීමේ අංශය 2 මායිම්



ආදායම් වර්ධනය බෙදාහැරීමේ අංශය 2



විවිධ අය ක්‍රම ප්‍රභේදවල විකුණුම් (ගිගාවොට් පැය) බෙදාහැරීමේ අංශය 2



සාමාන්‍ය විකුණුම් මිල බෙදාහැරීමේ අංශය 2



විකුණුම්වල වර්ධනය බෙදාහැරීම් බෙදාහැරීමේ අංශය 2



විදුලිබල විකුණුම්වලින් ලැබෙන ආදායම බෙදාහැරීමේ අංශය 2

බෙදාහැරීමේ අංශය 2



අයක්‍රමය විදුලිබල විකුණුම්වලින් ලද ආදායම බෙදාහැරීමේ අංශය 2



අයක්‍රමය අනුවපාරිභෝගික ගිණුම් බෙදාහැරීමේ අංශය 2

මෙහෙයුම් ව්‍යුහය

සාමාන්‍යාධිකාරීවරයාට සෘජුවම වගකියන අතිරේක සාමාන්‍යාධිකාරීවරයා විසින් මෙම බෙදාහැරීමේ අංශය 2 හි ප්‍රධානත්වය දරයි. මෙහෙයුම් අරමුණු සඳහා මෙම අංශය නැගෙනහිර, මධ්‍යම හා බස්නාහිර පළාතේ උතුර ලෙස පළාත් තුනකට බෙදා තිබේ. එක් එක් පළාත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් පාලනය කෙරේ. එක් එක් පළාත ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවරයෙකු විසින් පාලනය කරන ප්‍රදේශ කීපයකට නැවතත් බෙදා තිබේ. මෙහෙයුම් කටයුතුවල ඵලදායිතාව සඳහා අංශය තුළ ප්‍රාදේශීය කාර්යාල 17 ක් හා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 59 ක් තිබේ.

පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ට අමතරව, අංශයේ ව්‍යාපෘති හා අධිසැර නඩත්තුව, සැලසුම් කිරීම හා සංවර්ධනය වාණිජ හා ආයතනික කටයුතු පිළිබඳව සොයා බැලීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරු තිදෙනෙකු සිටිති. වාණිජ හා ආයතනික ශාඛාව මගින් ආදායම් අධීක්ෂණය, තාක්ෂණික නොවන හානි අඩු කිරීම, ශක්ති කළමණාකරණය, ඉංජිනේරු විගණනය හා මානව සම්පත් කළමණාකරණය හා සංවර්ධන කටයුතු සිදු කරයි. සැලසුම් හා සංවර්ධන ශාඛාව මගින් විශ්වසනීයභාවය පිළිබඳ ගැටළු, මධ්‍යම වෝල්ටීයතා ජාල සංවර්ධනය, කොට්ඨාස මට්ටමින් ද්‍රව්‍ය ප්‍රසම්පාදනය, එබ්බුණු උත්පාදනය සම්බන්ධ කටයුතු, තාක්ෂණික හානි අඩු කිරීම හා ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීම සම්බන්ධ ගැටළු පිළිබඳ කටයුතු කරයි. ව්‍යාපෘති හා අධිසැර නඩත්තු ශාඛාව කි. වෝල්ට් 33 වාගේ කුළුණු රැහැන් , ලින්ස් සන්නායක උපයෝගී කර ගනිමින් පෙර සවි කණු මත වූ රැහැන් මාර්ගද, කි. වෝල්ට් 33/ කි. වෝල්ට් 11 ප්‍රාථමික උප පොළවල්, කි. වෝල්ට් 33 ස්විච්චිපන්න මැසිද, ස්වයං පිළිමසුද සහ අධිසැර මණු පරිණාමකයන්ද සම්බන්ධ ඉදි කිරීම්, නඩත්තුව හා පුනුරුත්ථාපනය සිදු කරයි. එමෙන්ම කි. වෝල්ට් 33 වාගේ කුළුණු මත වූ බලගැන්වූ රැහැන් මාර්ගවල නඩත්තු කාර්යන්ද ව්‍යාපෘති හා අධිසැර නඩත්තු ශාඛාව මගින් සිදු කරනු ලැබේ.

පළාත්වල සිදු කරනු ලබන මූල්‍ය හා ආදායම් කටයුතු සිදු කරනු ලබන්නේ අංශයේ අතිරේක මුදල් කළමණාකරුගේ අධීක්ෂණය යටතේ ගණකාධිකාරීවරුන් විසිනි. එක් එක් පළාතේ මානව සම්පත් කටයුතුවල නිරත වීම සඳහා වෙනම මානව සම්පත් නිලධාරියෙකු පත්කරයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා (වාණිජ හා ආයතනික) යටතේ පවතින ඒකකය මගින් ආයතනික කාර්යාලයට අනුයුක්ත කර ඇති සියලුම විධායක නිලධාරීන්ගේ හා කාර්ය මණ්ඩලයේ මානව සම්පත් කටයුතු හා මෙම ක්‍රියාකාරකම් සමායෝජනය කිරීම සිදු කරනු ලැබේ.

ප්‍රධාන අරමුණු

- පවත්නා පාරිභෝගික ජාලයට තවත් පාරිභෝගිකයන් සම්බන්ධ කරීම.
- දිනය පුරා අතරමැද අත්හිටුවීමකින් තොරව විදුලිබල සැපයුම පවත්වා ගැනීම.
- තාක්ෂණික හානි හා තාක්ෂණික නොවන හානි වැනි සියලුම හානි අවම කිරීමට පූර්වෝපාය ගැනීම.
- පාරිභෝගිකයන්ගේ ගැටළුවලට අවධානය යොමු කිරීම හා අවම කාලයකින් විසඳුම් ලබා දීම.
- පාර්ශවකරුවන්ගේ උපරිම තෘප්තියට හේතුවන පරිදි සියළුම සේවා සැපයීම.

2011 වසරේ විශේෂ අවස්ථා

වසර තුලදී පලාත තුල විකුණනු ලැබූ ඒකක	ගිගාවොට් පැය	2,835
විකුණනු ලැබූ විදුලිබලයෙන් උපයනු ලැබූ ආදායම	රු.මිලියන	35,949
බෙදාහැරීම් හානි	මෙගා.වොට්.පැය	377,300
වසර අවසානයේදී පලාතේ පාරිභෝගිකයන්ගේ මුළු සංඛ්‍යාව	සංඛ්‍යාව	1,506,862
වසර අවසානයේදී අංශය තුළ සිල්ලර පාරිභෝගිකයන් සංඛ්‍යාව	සංඛ්‍යාව	1,504,745
වසර අවසානයේදී තොග සැපයුම් පාරිභෝගිකයන් සංඛ්‍යාව	සංඛ්‍යාව	2,117
වසර තුළ සපයනු ලැබූ නව සම්බන්ධතා සංඛ්‍යාව	සංඛ්‍යාව	69,397
වසර අවසානයේදී සේවකයින් සංඛ්‍යාව	සංඛ්‍යාව	3,399

බෙදාහැරීමේ අංශය 2

බෙදාහැරීම් යටිතල පහසුකම්.

කි.වෝල්ට් 33 බෙදා හැරීම් රැහැන්	කි.මී.	6,727
කි.වෝල්ට් 11 බෙදා හැරීම් රැහැන්	කි.මී.	647
ප්‍රාදේශික සංඛ්‍යාව	සංඛ්‍යාව	17
වි.පා.සේ.ම. සංඛ්‍යාව	සංඛ්‍යාව	59
කි.වෝල්ට් 33/11 ප්‍රාථමික උප පොළ	කි.මී.	42
අඩු වෝල්ටියතා බෙදාහැරීම් රැහැන්	කි.මී.	27,550
කි.වෝල්ට් 33 අඩු වෝල්ටියතා බෙදාහැරීම් උප පොළ	සංඛ්‍යාව	5886
කි.වෝල්ට් 11 අඩු වෝල්ටියතා බෙදාහැරීම් උප පොළ	සංඛ්‍යාව	915

පාරිභෝගික සත්කාරය

දිනය පුරා අතරමැද අත්හිටුවීමකින් තොර විදුලිබල සැපයුම පවත්වාගෙන යෑමේ මුඛ්‍ය පරමාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා ගත හැකි සියලුම පියවර අංශයේ සියලුම ඒකක මගින් ගනු ඇත. මෙම පියවර මෙම වාර්තාවේ පසුව දක්වා ඇති අංශවල විස්තරාත්මකව දක්වා ඇත.

අංශයේ සෑම ප්‍රදේශයකටම පාරිභෝගික සමිති ස්ථාපිත කර තිබේ. ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් මෙම සමිතිවල ක්‍රමවත් රැස්වීම් පවත්වනු ලැබීය. ඒ අනුව 2011 වසර තුළ පාරිභෝගික සමිති 24 ක් සකස් කරනු ලැබීය. මෙම සමිතිවලින් ල.වි.ම. මෙන්ම පාරිභෝගිකයන්ද යන දෙපාර්ශවයම ප්‍රතිලාභ ලැබූහ. අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් ලං.වි.ම. ට මෙමගින් අනගි සහයක් ලැබුණි. තවදුරටත්, පාරිභෝගිකයන්ට ලං.වි.ම. නිලධාරීන් සමඟ විවෘතව ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීමේ අවස්ථාව ලැබුණු අතර ඇතැම් ගැටළු සඳහා ක්ෂණික විසඳුම් ලබා දී තිබුණි.

ඊ - සිටි (විදුලි පුරවර) ස්ථාපනය කිරීම

2011 වසර තුළදී කැළණිය හා මහනුවර නගරවල ප්‍රාදේශීය කාර්යාලවල විදුලි පුරවර මධ්‍යස්ථාන 2 ක් විවෘත කරන ලද අතර මෙම මධ්‍යස්ථානවලින් පාරිභෝගික අවශ්‍යතාවලට ක්ෂණිකව අවධානය යොමු කරනු ලබන අතර නව සේවා සම්බන්ධතා සඳහා අයදුම් කිරීමට ගෙවීම් කිරීම හා පාරිභෝගික විමසුම්වලට අවධානය යොමු කිරීම වැනි පහසුකම්ද පාරිභෝගිකයන්ට ලබා දෙයි.

ඊ සිටි ප්‍රාදේශීය කාර්යාලය, කැළණිය

බලශක්ති විකුණුම්

පළාත	විකුණුම් (ගිගාවොට් පැය වලින්)
බස්නාහිර පළාත උතුර	1662
මධ්‍යම	733
නැගෙනහිර	441
මුළු ගණන	2836

ආදායම්

සමාලෝචිත වසර තුළ අංශයේ මුළු එකතුව රු. මිලියන 36,183 ක් විය. පසුගිය වසරේදී අංශයේ ආදායම් එකතුව රු.36,668 ක් වූ අතර 2010 වසරට සාපේක්ෂව රු.මිලියන 485 ක ආදායම් අඩුවීමක් ඇත. බස්නාහිර පළාත උතුරේ ලං.වි.පු.ස. ප්‍රදේශය සම්ප්‍රේෂණ අංශයට පැවරීම එයට හේතුවයි.

විදුලිබල පාරිභෝගික ගිණුම් හා නව විදුලිබල සැපයුම් සම්බන්ධතා සැපයීම.

2011 දෙසැම්බර් වන විට බෙදාහැරීමේ අංශය 2 හි පාරිභෝගිකයින් 1,488,745 ක් සිටියහ. එයින් පාරිභෝගිකයින් 2,060 ක් තොග සැපයුම් පාරිභෝගිකයෝ වූහ. 2011 වසර තුළ පාරිභෝගික ජාලයට නව පාරිභෝගිකයින් 67,815 ක් එක් විය.

වාණිජ හා ආයතනික ශාඛාව

අංශයේ බලශක්ති කළමණාකරණය හා මානව සම්පත් ක්‍රියාකාරකම් ඇතුළු අංශයේ වාණිජ ක්‍රියාකාරකම් ඉටු කිරීම වාණිජ හා ආයතනික ශාඛාවේ ප්‍රධාන වගකීම වේ. පලාත් මනු පරීක්ෂණාගාරය මෙම ශාඛාව යටතේ ක්‍රියාත්මක කෙරේ.

මනු පරීක්ෂාව

එකලා හා තෙකලා මනු පරීක්ෂාව, ක්‍රමාංකනය හා අළුත්වැඩියාව මනු පරීක්ෂණාගාරයේ ප්‍රධාන කාර්යයන් වේ. තොග සැපයුම් මණු පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂාවද මෙමගින් සිදු කරනු ලැබේ. ක්‍රම ලේඛනය කළ හැකි බහු කලා (PPM) සියලුම තොග සැපයුම් පාරිභෝගිකයන්ට 2011 වසර තුලදී සපයනු ලැබීය. මෙමගින් දුරස්ථ කියවීමේ හා අනවසරයෙන් මනුවල වෙනස්කම් කිරීමේ අවස්ථා අධීක්ෂණය කිරීමේ පහසුකම්වලින් ක්‍රමාංකනය කල හැකි බහු කලා මනු (PPM) සමන්විත වේ. මෙමගින් තොග සැපයුම් පාරිභෝගික සවිකිරීම්වලදී සිදුවන තාක්ෂණික නොවන හානි අඩු කරයි.

බලශක්ති කළමණාකරණය.

බෙදාහැරීමේ අංශය 2 හි බලශක්ති කළමණාකරණ ඒකක මගින් වසර තුළදී පහත සඳහන් ක්‍රියාකාරකම්වලට සහභාගි වූහ.

බෙදාහැරීමේ අංශය 2

කාර්යය		සංඛ්‍යාව
නිවාස සේවා මනු		
පිරික්සූ මනු		29,505
සවි කල මනු		77
තෙකලා සෘජු සම්බන්ධිතා මනු (20/80)		
පරික්සූ මනු		133
සවි කල මනු		46
තොග සැපයුම් පරිශ්‍රයේදී පරික්ෂා කිරීම		1,131
ඒඑම්ආර් - තොග සැපයුම් මනු		573
ඒඑම්ආර් - අධිසැර		16
තොග සැපයුම් මනුවල සුපුරුදු පරික්ෂාව		260
නව තොග සැපයුම් මනුවල පරික්ෂාව හා සවි කිරීම		24
ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ ඉල්ලීම පරිදි තොග සම්බන්ධිතා මනු පරික්ෂා කිරීම		36
දෝෂ සහිත මනු ඉවත්කොට අළුත් ඒවා යෙදීම හා මනුපරික්ෂාව		78
පද්ධති වැඩි දියුණු කිරීම		21
බලශක්ති කළමණාකරණ ඒකක මගින් අනෙකුත් කටයුතු සිදු කිරීම		
1	පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන්	15
2	ග්‍රාමීය විදුලිබල සැපයුම් යෝජනා ක්‍රම (සම්පූර්ණ කල)	15
3	කලා/අංශ තුලනය කිරීමේ කටයුතු	22
4	මධ්‍යම වෝල්ටීයතා ධාරිත්‍රක සවි කිරීම්	1
5	උඩු වෝල්ටීයතා ධාරිත්‍රක සවි කිරීම්	4
6	උප පොළ කිලෝ වොට් පැය මනු සවි කිරීම් (හානි ගණනය කිරීමේ අරමුණු සඳහා	60

හානි අඩු කිරීමේ වැඩසටහන්

අංශයේ හානි අඩු කිරීම් වැඩසටහන් යටතේ, අඩු වෝල්ටීයතා ජාලයේ තාක්ෂණික නොවන හානි අඩු කිරීම සඳහා සෑම ප්‍රයත්නයක්ම දරා තිබේ. ප්‍රධාන තාක්ෂණික නොවන හානි හඳුනාගෙන තිබෙන අතර ඒවා අවම කිරීමට නව ක්‍රියාදාමයන් හඳුන්වා දී තිබේ. විදුලිය අනවසරයෙන් භාවිතා කරන්නන්ගෙන් සිදුවන හානි පියවා ගැනීම සඳහා වැටලීමේ වැඩසටහන් හඳුන්වා දී තිබේ. මෙම ක්‍රියාවලිය ප්‍රදේශවල කාර්ය මණ්ඩල සම්බන්ධීකාරකයන් භාවිතා කර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සීඇන්ඩ්සී) සෘජු අධීක්ෂණය යටතේ සිදු කෙරේ. 2011 වසර තුළ වැටලීම් සිදු කර රු.මිලියන 72.8 ක් පියවා ගැනීමට මෙම සමස්ථ ඒකකයට හැකි විය.

හානි අඩු කිරීමේ වැඩ සටහන සමඟ වාණිජ හා ආයතනික ශාඛාව මගින් හඳුන්වා දුන් තවත් ක්‍රියාකාරකමක් වූයේ අවසානයට ගෙන එන ලද විදුලිබල ගිනුම්වලින් හිඟ මුදල් එකතු කිරීමයි. මෙම ක්‍රියාවලිය වසරේ අග භාගයේදී හඳුන්වා දෙනු ලැබිණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, සමාලෝචිත වසර තුළ අවසානයකට ගෙන එන ලද විදුලිබල ගිනුම්වලින් රු.මිලියන 22.9 ක ප්‍රමාණයක් ගෙවිය යුතු ගාස්තු එකතු කර ගැනීමට බෙදාහැරීමේ අංශය 2 සමත් විය.

දුරස්ථ මනු සවි කිරීම.

2011 මාර්තු අවසානයේදී සෑම අංශයකටම තොග පාරිභෝගිකයින් සඳහා දුරස්ථ මනු සවි කිරීම් පහසුකම ලබා දෙනු ලැබීය.

දුරස්ථ මනු සවි කිරීම සඳහා ඩිපිටල් ක්‍රමාංකනය කළ හැකි බහු කලා මනු භාවිතා කරන බැවින් විදුලිබල ක්‍රියා විරහිත වීම් පිළිබඳ වාර්තා, අනවසර ලෙස මනුවලට බාධා කිරීම පිළිබඳ වාර්තා ආදී ඒවායේ අති නවීන අංග බලශක්ති කළමණාකරණ අරමුණු සඳහාද භාවිතා කළ හැකිය. දුරස්ථ මනු සවි කිරීම සමඟ තොග සැපයුම් ආදායම්වල වැඩිවීමක් අපේක්ෂා කෙරේ.

විදුලි රැහැන් සම්ප්‍රේෂණය තුළින් සෘජුව සම්බන්ධ කළ තෙකලා විදුලි මනුවලින් බලශක්ති කියවීම් ලබා ගැනීමේ නියමු ව්‍යාපෘතිය ආරම්භ කර තිබේ.

මානව සම්පත් : බෙදාහැරීම් කලාප 2

2011 අවසානය වන විට මෙම අංශයට අනුයුක්ත කර තිබූ ස්ථිර සේවකයන් සංඛ්‍යාව 3,743 ක් වේ. ශ්‍රේණි අනුව සේවකයන්ගේ ව්‍යාප්තිය පහත රූප සටහනේ පෙන්වා ඇත.



කාර්ය මණ්ඩල ව්‍යාප්තිය බෙදාහැරීමේ අංශය 2

නැගෙනහිර පළාත, මධ්‍යම පළාත හා ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා ඵලදායිතා වැඩිදියුණු කිරීමේ විශේෂ පුහුණු වැඩසටහන් සමාලෝචිත වර්ෂය තුලදී පවත්වනු ලැබීය.

සැලසුම් හා සංවර්ධනය

බෙදාහැරීමේ අංශය 2 හි මෙහෙයුම් පළාත්වලට පහත සේවා සැපයීම සම්බන්ධව සැලසුම් හා සංවර්ධන අංශය වගකීම දරයි.

- සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා සහය දීම.
- ගුණත්වය වැඩිදියුණු කිරීම සඳහා පද්ධති වැඩිදියුණු කිරීම සඳහා ජාල සැළසුම්කරණයේදී සහය වීම හා අංශයේ පාරිභෝගිකයින් සඳහා විදුලිබල සැපයුම පිළිබඳ විශ්වසනීයත්වය.
- නඩත්තු කටයුතු, නව ව්‍යාපෘති හා සම්බන්ධිතා සඳහා ද්‍රව්‍ය කළමණාකරණය

බෙදාහැරීමේ අංශය 2

සැලසුම්කරණ ඒකකය

ප්‍රාදේශීය සැළසුම්කරණ ඒකක සමඟ සහයෝගීව මෙම ඒකකය කටයුතු කරයි. එමඟින් වාර්ෂිකව මධ්‍යම වෝල්ටීයතා හා අඩු වෝල්ටීයතා ජාල සඳහා වැඩි දියුණු කිරීමේ යෝජනා කරන අතර දිගු කාලීන මධ්‍යම ජාල වැඩි දියුණු කිරීමේ සැලසුම් සඳහා යෝජනා පිළියෙල කරයි.

යෝජිත වැඩ කටයුතු පිළිබඳ විෂය පථය - දිගු කාලීන යෝජනා

යෝජනාව/වසර	2012	2013	2014	2015	මුළු
ග්‍රීඩ් උපපොළ නව GSS/(සංඛ්‍යාව)	3	1	3	2	**9**
වැඩි දියුණු කරන ලද ග්‍රීඩ් උපපොළ (සංඛ්‍යාව)	5	-	-	-	**5**
අතිරේක පෝෂක Bays (සංඛ්‍යාව)	23	-	-	-	**23**

යෝජනාව/වසර	2012	2013	2014	2015	2016	2017	2018	2019	එකතුව
Backbone lines km									
ලින්ස් DC Tower	199	86	94.6	135	29	-	-	-	**546.6**
ලින්ස් SC Tower	82	-	14	1.5	14.5	-	-	0.5	**112.5**
ලින්ස් DC Pole	38.8	52	-	-	15	-	-	-	**105.8**
ලින්ස් SC Pole	6	64	3	-	-	32	-	-	**105**
Racoon	36.7	3	-	-	-	-	-	-	**39.7**
බෙදාහැරීම් අටළු අංගන සංඛ්‍යාව									
DBB Tower	18	6	3	2	2	-	-	1	**32**
SBB Pole	14	-	4	1	2	1	-	-	**22**
Reconductoring of MV Lines km	25	-	-	-	-	-	-	-	**25**
මධ්‍යම වෝල්ටියතා පරිවර්තන රැහැන් කි.මී.	108.5	25.5	15	-	-	10	-	-	**159**
New PSS + (LECO)	2+2*	1	-	-	-	-	-	-	**5**
Aug. PSS (Nos.)	3	-	1	-	-	-	-	-	**4**

වාහන , උපකරණ හා කොන්ත්‍රාත්කරුවන් වැනි සම්පත් මදිකම හේතුවෙන් 2011 වසරේදී මධ්‍යම වෝල්ටීයතා යෝජනා ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාදයක් සිදු විය. බලශක්ති හානිය හා සැපයුමේ ගුණාත්මයේ අපේක්ෂිත අඩු වීම සැලසුම් කළ පරිදි ලබා ගැනීමට නොහැකි වූයේ මධ්‍යම වෝල්ටීයතා යෝජනා නිසි කලට ක්‍රියාත්මක නොවීම නිසාය. කෙසේ වුවද, පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් භාවිතා කරමින් මෙම වැඩි දියුණු කිරීම් කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට ප්‍රයන්තයක් දරණු ලැබේ.

ජාල කාර්යසාධනය වැඩිදියුණු කිරීමට අධ්‍යයන සිදු කරමින් පවති. එසේ කිරීමේදී, කලාප 2 හි මුළු පළාත් තුනම සඳහා පාලන මධ්‍යස්ථාන ඉදිකර තිබේ. බිඳ වැටීම් තොරතුරු වාර්තාගත කිරීම, ජාල ස්ථාන විශ්ලේෂණය කිරීම හා ඉක්මනින් සැපයුම නැවතත් යථා තත්ත්වයට පත්කිරීම සඳහා මෙහෙයුම් කාර්ය මණ්ඩලයට විස්තරාත්මක උපදෙස් ලබා දීම මෙම පාලන මධ්‍යස්ථානවලින් අපේක්ෂිතය. එමෙන්ම ස්වයං පිළිවසු, බැර කඩන වහරු හා මායිම් මනු සියල්ල ස්වයංක්‍රීයව මෙහෙවීම සඳහා පියවර ගෙන ඇත.

එක් එක් ඒකකයට බෙදා වෙන් කරනලද කාර්යයන්වල ප්‍රගතිය මෙම ශාඛාව මගින් නිරන්තරයෙන්ම අධීක්ෂණය කරයි. කුළුණු රැහැන්, අටළු අංගන හා ප්‍රාථමික උප පොළ වැඩි දියුණු කිරීම හා ඉදි කිරීම වැනි බැර ඉදි කිරීම් කටයුතු ව්‍යාපෘති හා බැර නඩත්තු ඒකකයට වෙන් කර දී ඇති අතර අනෙකුත් කටයුතු පළාත්වලට බෙදා දී තිබේ. එබ්බුණු ජනනය සඳහා ග්‍රිඩ් අන්තර් සම්බන්ධතාවය සැපයීම සඳහා පළාත්වලින් එවා ඇති යෝජනා සඳහා තාක්ෂණික ශක්‍යතා අධ්‍යන සිදු කිරීම හා මෙගා වෝල්ට් ඇම්පියර් 2 ට වඩා වැඩි ප්‍රධාන කාර්මික භාරය සඳහා තාක්ෂණික යෝජනා පිළිබඳ ශක්‍යතා අධ්‍යන සිදු කිරීම සැලසුම් හා සංවර්ධන අංශය මගින් සිදු කරයි. 2011 වසර තුළ ග්‍රිඩ් අන්තර් සම්බන්ධතා යෝජනා සඳහා ක්ෂුද්‍ර විදුලිබල යෝජනා 32 ක් පමණ ලැබුණි. බෙදාහැරීමේ අංශය 2 හි ක්‍රියාත්මකව පවතින මුළු ක්ෂුද්‍ර ජල විදුලිබලාගාර ප්‍රමාණය 15 කි.

ද්‍රව්‍ය කළමණාකරණ ඒකකය

බෙදාහැරීමේ අංශය 2 සඳහා ප්‍රධාන ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම මෙම ශාඛාව මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි. වාර්ෂික ප්‍රසම්පාදන සැලසුමේ ඇස්තමේන්තු කළ පිරිවැය

බෙදාහැරීමේ අංශය 2

හා ප්‍රසම්පාදිත ද්‍රව්‍ය සඳහා තථ්‍ය වියදම රූප සටහනේ දැක්වේ. 2011 වසරේ සැලසුම් කළ ප්‍රසම්පාදන හා තථ්‍ය ප්‍රසම්පාදනය අතර වෙනසට ප්‍රධාන හේතුව වන්නේ ලං.වි.ම. ද්‍රවශීලතාව හේතුවෙන් ප්‍රසම්පාදනය සඳහා ප්‍රමාණයන් අඩු කිරීමට සිදු වීම නිසාය.



අමුද්‍රව්‍ය මිලදීගැනීම

සංවර්ධන ඒකකය

බෙදාහැරීමේ අංශය 2 හි සැපයුමේ ගුණාත්මය හා විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සංවර්ධන ඒකකය ගොඩ නගනු ලැබීය. විදුලිබල ගුණත්මය පිළිබඳ ගැටළු හා සැපයුම් වැඩි දියුණු කිරීම් හා යෝජිත පිළියම් කිරීමේ පියවර පිළිබඳව අධ්‍යනය කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂිතය. ආසියානු සංවර්ධන බැංකුව, ලයිටින් ශ්‍රී ලංකා (නැගෙනහිර පළාත) වැනි ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීමේ ව්‍යාපෘති මෙම ශාඛාව මගින් සමායෝජනය කෙරෙන්නේ ඉදි කිරීම් කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම මගිනි.

ප්‍රංශ AFD අරමුදල උපයෝගී කර ගනිමින් සිදු කරන ත්‍රිකුණාමලයේ සමෝධානික යටිතල පහසුකම් ව්‍යාපෘතිය (TIIP) ද මෙම ශාඛාව මගින් සමායෝජනය කෙරේ. අඩු වෝල්ටීයතා වැඩි දියුණු කිරීම සඳහා ත්‍රිකුණාමලයේ මධ්‍යම වෝල්ටීයතා අධිවේගී හා බෙදා හැරීම් රැහැන් කි.මී. 48 ක් ඉදි කිරීමට මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ වටිනාකම රු.මිලියන 355 කි. ද්‍රව්‍ය බොහොමයක් ප්‍රසම්පාදනය කර තිබෙන අතර ඉදි කිරීම් කටයුතු සිදු කරමින් පවතී. මෙම ව්‍යාපෘතිය 2012 වසර වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

බෙදාහැරීමේ අංශය 2 හි බෙදා හැරීමේ ක්‍රියාකාරකම් සඳහා ඉදි කිරීම් ප්‍රමිති, දළ සටහන් හා ද්‍රව්‍ය පිරිවිතරවල අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සිදු කිරීමද මෙම ශාඛාව මගින් සිදු කෙරේ.

ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීම

සියළුම ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ පළාත් මගිනි. ආසියානු සංවර්ධන බැංකුව වැනි ලබා දෙන්නන් හෝ විමධ්‍යගත අයවැය හා පළාත් සභා අයවැය මගින් මෙම ව්‍යාපෘතිවලට අරමුදල් සැපයේ. පළාත් මගින් අවසන් කරන ලද කාර්යයන් පහත වගුවේ දක්වා ඇත.

පළාත	කාර්යයන් ගණන
නැගෙනහිර	602
මධ්‍යම	777
බස්නාහිර පළාත - උතුර	397

වසර තුළදී ඉටු කරන ලද කටයුතු පිළිබඳ සාරාංශය පහත දක්වා තිබේ.

අරමුදල් වර්ගය		කාර්යයන් ගණන	වැඩ අන්තර්ගතය			පිරිවැය රු.මිලියන
			අධි සැර (කි.මී.)	අඩු සැර (කි.මී.)	උපපොල	
විමධ්‍යගත අයවැය		376	-	61	-	66
පළාත් සභා අයවැය		377	-	70	-	81
පිරිවැය	තොග සැපයුම	59	18	3	57	127
	බෙදා හැරීම්	79	29	28	25	134
පද්ධති වර්ධනය කිරීම		231	35	103	35	180
කඩිනම් ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිය සැපයීමේ ව්‍යාපෘතිය		93	111	316	50	686
STAART		2	0.7	3	1	5
ලයිටින් ශ්‍රී ලංකා(නැගෙනහිර පළාත)		90	8	110	7	151
ලයිටින් ශ්‍රී ලංකා(මධ්‍යම පළාත)		123	1	52	2	72
ලයිටින් ශ්‍රී ලංකා කෑගල්ල ප්‍රදේශය		33	1	13	1	19
රන් අරුණ		344		59	4	101
ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිය සැපයීමේ ව්‍යාපෘතිය - 8		176	43	267	47	499
විශේෂ අරමුදල		21	3	32	6	58
රැහැන් නඩත්තුව		113	210	-	-	228
ස්වීඩන අන්තර්ජාතික සංවර්ධන නියෝජිතායතනය		13	23	64	13	141
රැහැන් රැලි ගැස්සීම		106,380	97	461	22	138

බෙදාහැරීමේ අංශය 2

ව්‍යාපෘති හා අධිසැර නඩත්තු

පිළිවෙලින් ගම්පහ, මහනුවර පිහිටා ඇති බස්නාහිර කලාපය හා මධ්‍යම කලාපය සඳහා වූ කාර්යාල 2 කින් ව්‍යාපෘති හා අධිසැර නඩත්තු ශාඛාව සමන්විත වේ. කි.වෝල්ට් 33 කුළුණු රැහැන්, ප්‍රාථමික උප පොළ, අටළු අංගන, ස්වයං - පිළිමසු (AR) සහ CT/PT ඒකක ඉදි කිරීම හා නඩත්තුව මෙම ඒකකය මගින් සිදු කරයි. මෙම ඒකක දෙක මගින් 2011 වසර තුළ සිදු කරනු ලැබූ කාර්යයන් පහත දැක්වේ.

බස්නාහිර කලාපය

සම්පූර්ණ කරන ලද ප්‍රධාන ඉදි කිරීම් කටයුතු

1. මීරිගම අටළු අංගනය.
2. මාවිළිය අටළු අංගනය.
3. කෝපියාවත්ත අටළු අංගනය.
4. කටුනායක අටළු අංගනය.
5. ගනේමුල්ල අටළු අංගනය නැවත සැකසීම.
6. මාවනැල්ල අටළු අංගනය නැවත සැකසීම.
7. කිලෝ වෝල්ට් 11 LBS සවි කිරීම - සංඛ්‍යාව 5
8. කිලෝ වෝල්ට් 33 AR සවි කිරීම - සංඛ්‍යාව 6
9. ත්‍රිකුණාමලයේ sea view හි මෙගා වොට් ඇම්පියර් 5 තරාපැවි සවි කරීම.
10. ආනියාකන්ද කොටුමා උපපොල සිට කෝපියාවත්ත අටළු අංගනය දක්වා කිලෝ වෝල්ට් 33 ද්විත්ව පරිපථ ලින්ස් කුළුණු රැහැන් කි.මී.45 ක් ඉදි කිරීම.
11. කටුනායක උන්නරුවෙහි කිලෝ වෝල්ට් 33 ද්විත්ව පරිපථ ලින්ස් කුළුණු රැහැන් කි.මී.2 ක් විතැන් කිරීම.
12. රඹුක්පිටියේ සිට උලපනේ දක්වා D/C ලින්ස් පැරණි කිලෝ වෝල්ට් 66 කුළුණු රැහැන් කි.මී.10 ක් සඳහා නැවත රැහැන් යෙදීම.
13. රඹුක්පිටියේ සිට ගිනිගත්හේන දක්වා D/C ලින්ස් පැරණි කිලෝ වෝල්ට් 66 කුළුණු රැහැන් කි.මී.7 ක් තනි පැත්තේ රැහැන් යෙදීම.
14. උලපනේ සිට සිංහපිටිය දක්වා D/C ලින්ස් පැරණි කිලෝ වෝල්ට් 66 කුළුණු රැහැන් කි.මී.8 ක් නැවත රැහැන් යෙදීම.

දැනට සිදු කරන ප්‍රධාන ඉදි කිරීම් කටයුතු හා ඒවා වර්ධනය කිරීමේ කාර්යයන්

අටළු අංගනය

පළාත	දැනට සිදු කරන ප්‍රධාන ඉදි කිරීම් කටයුතු		වර්ධනය කිරීමේ කාර්යයන්
බස්නාහිර පළාත උතුර	සිරියන්ගනී හීන්කෙන්ද දාගොන්න වෙල්හේන		තලගොල්ල දුනුගහ වේයන්ගොඩ තුඩැල්ල වැවගෙදර පෑලියගොඩ සෙල්ලකන්ද

පළාත	දැනට සිදු කරන ප්‍රධාන ඉදි කිරීම් කටයුතු		වර්ධනය කිරීමේ කාර්යයන්
මධ්‍යම පළාත	නාවුල ගලේවෙල කටුගස්තොට තෝලන්ගමුව රඹුක්කන ගලහ ගලිගමුව	මොරොන්තොට කරඩුපන ගෙවිලිපිටිය කෙහෙලකොටුව වහාකෝට්ටේ	ආඳුරාපොත දඹුල්ල
නැගෙනහිර පළාත	කින්නියා ත්‍රිකුණාමලය		

කිලෝ වෝල්ට් 33 කුළුණු රැහැන්

1. මංකඩ පාරේ සිට ගාල හංදිය දක්වා S/C ලින්ස් කුළුණු රැහැන් කි.මී.2.5 ක් ඉදිකිරීම.
2. කටුනායක අධිවේගී මාවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය හේතුවෙන් කිලෝ වෝල්ට් 33 ද්විත්ව පරිපථ ලින්ස් කුළුණු රැහැන් කි.මී.3 ක් හුණු පිටියේදී ඉදිකිරීම.
3. කැළණිය ග්‍රිඩ් උප පොළේ සිට නුවර පාර දක්වා D/C ලින්ස් කුළුණු රැහැන් කි.මී.0.5 ක් ඉදිකිරීම.
4. එඬුරුපොත සිට කරඳුපොත අටළු අංගනය දක්වා D/C ලින්ස් කුළුණු රැහැන් කි.මී.7 ක් ඉදිකිරීම.
5. තෝලංගමුව අටළු අංගනයේ සිට ගලිගමුව අටළු අංගනය දක්වා D/C ලින්ස් කුළුණු රැහැන් කි.මී.18 ක් ඉදිකිරීම.
6. ගලිගමුව අටළු අංගනයේ සිට මොරොන්තොට අටළු අංගනය දක්වා D/C ලින්ස් කුළුණු රැහැන් කි.මී.18 ක් ඉදිකිරීම.
7. ගෙවිලිපිටිය අටළු අංගනයේ සිට කෙහෙල්ගමුව අටළු අංගනය දක්වා D/C ලින්ස් කුළුණු රැහැන් කි.මී.12 ක් ඉදිකිරීම.
8. රඹුක්කන අටළු අංගනයේ සිට කරඩුපන අටළු අංගනය දක්වා D/C ලින්ස් කුළුණු රැහැන් කි.මී.18 ක් ඉදිකිරීම.

දැනට සිදුකෙරෙමින් පවතින වෙනත් ක්‍රියාකාරකම්

1. කුළුණු රැහැන් කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හරහා යන විවිධ ස්ථානවල හා පෙරියමුල්ල විදුලිබල උප පොළේදී පිටතට යැවෙන පෝෂකයෙහි යටිබහන් රැහැන් යෙදීම. සවි කළ යුතු මුළු යටි බහන් රැහැන් දිග මීටර් 750 ක් පමණ වනු ඇත.
2. අංශයේ විවිධ ස්ථානවල කි.වෝල්ට් 33 හා කි.වෝල්ට් 11 CT/PT ඒකක සවි කිරීම සිදු වේ. විශේෂයෙන්ම ක්ෂුද්‍ර බලාගාරවල මෙන්ම මායිම් මණු ස්ථානවල.
3. 2011 මැද භාගයේදී, කටුනායක හා කිරිබත්ගොඩ විදුලිබල උප පොළ (ලං.වි.පු.ස.) සඳහා පැමිණෙන යටි බහන් රැහැන් සවි කිරීමේ ඇස්තමේන්තුවක් අනුමැතිය ලබා ගැනීම සඳහා භාර දී ඇති අතර ඉහත විදුලිබල උප පොළ ඉදි කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.
4. මායිම් මනු සවි කරීම - සංඛ්‍යාව 8
5. කි.වෝල්ට් 33 හා 11 LBSS සංඛ්‍යාව 12
6. මෙම වසර තුළදී ස්වයං පිළිමසු 6 ක සංඛ්‍යාවක් සවි කරනු ලැබීය. එමගින් ක්‍රියාත්මකව පවතින ස්වයං පිළිමසු සංඛ්‍යාව 178 ක් වේ. එමෙන්ම ස්වයං පිළිමසු 67 ක් දුරස්ථව පාලනය කළ හැකි ඒවා බවට පත් කරනු ලැබීය.

බෙදාහැරීමේ අංශය 2

නඩත්තු කටයුතු

1. අංශයේ ප්‍රාථමික තරාපැවි වල තෙල් පෙරීම ඇතුළුව දෛනික නඩත්තුව 2011 දී සාර්ථකව අවසන් කරනු ලැබීය.
2. ස්වයං පිළිමසු ඇතළත්ව අටළු අංගන නඩත්තුවද බස්නාහිර පළාත - උතුර, මධ්‍යම පළාතේ පූර්ණ වශයෙන්ද නැගෙනහිර පළාතේ අඩක් පමණද 2012 1 වන භාගය තුළදී අවසන් කිරීමට නියමිතව ඇත.
3. 2011 වසර තුළදී පහත සඳහන් රැහැන් නඩත්තු කටයුතු අවසන් කර තිබේ.

i. කොටුගොඩ සිට සීදුව දක්වා කි.මී.4.1 ක කුළුණු රැහැන්
ii. වේයන්ගොඩ සිට මල්වත්ත දක්වා කි.මී.7 ක කුළුණු රැහැන්
iii. වේයන්ගොඩ සිට නිට්ටඹුව අටළු අංගනය දක්වා කි.මී.9 ක කුළුණු රැහැන්
iv. වේයන්ගොඩ සිට නම්බුලාව දක්වා කි.මී.7 ක කුළුණු රැහැන්
v. පූගොඩ සිට කොස්ගම දක්වා කි.මී.5.8 ක කුළුණු රැහැන්
vi. සපුගස්කන්ද සිට අඹතලේ දක්වා F 08
vii. ඉඹුල්ගොඩ සිට බෙන්ඩියමුල්ල දක්වා කි.මී.4.8 ක කුළුණු රැ හැන්
viii. බියගම සිට දෙකටන දක්වා කි.මී.10 ක කුළුණු රැහැන්

මධ්‍යම පළාත

රැහැන් ඉදි කිරීමේ කටයුතු

සම්පූර්ණ කරන ලද ප්‍රධාන කටයුතු

කටයුත්ත	පළාත	විස්තර	දිග	පිරිවැය රු.මිලියන
චීන වරායේ සිට ප්‍රිමා	නැ.	කි.වෝල්ට් 33 ඒකීය පරිපථ ලින්ස්	1.2	15
අම්පාර ගල්මඩුව	නැ.	කි.වෝල්ට් 33 ඒකීය පරිපථ ලින්ස්	4.2	45
කි.වෝල්ට් 66 පැරණි රැහැන නැවත පැවැත්වීම	මධ්‍යම	කි.වෝල්ට් 33 ද්විත්ව පරිපථ ලින්ස්	-	41
කි.වෝල්ට් 66 බ.ප.ද. Norton පැරණි අන්තර් සම්බන්ධය	මධ්‍යම	කි.වෝල්ට් 33 ද්විත්ව පරිපථ ලින්ස්	-	-

දැනට කරගෙන යන ප්‍රධාන කටයුතු

කටයුත්ත	පළාත	විස්තර	දිග	පිරිවැය රු.මිලියන
උකුවෙල සිට කටුගස්තොට	මධ්‍යම	කි.වෝල්ට් 33 ඒකල පරිපථ ලින්ස්	කි.මී.8	88
කටුගස්තොට සිට ගොරකාදෙණිය	මධ්‍යම	කි.වෝල්ට් 33 ද්විත්ව පරිපථ ලින්ස්	කි.මී.8.7	99
රඹුක්පිටිය සිට ඉඹුල්පිටිය	මධ්‍යම	කි.වෝල්ට් 33 ඒකල පරිපථ ලින්ස්	කි.මී.4.3	78
මීවතුර සිට ඊරියගම	මධ්‍යම	කි.වෝල්ට් 33 ද්විත්ව පරිපථ ලින්ස්	කි.මී.2.2	22
කිරිබත්කුඹුර සිට ගලහ	මධ්‍යම	කි.වෝල්ට් 33 ද්විත්ව පරිපථ ලින්ස්	කි.මී.16	224
මඩකලපුවේ සිට වාලච්චේන 3,4 අදියර	නැ.	කි.වෝල්ට් 33 ද්විත්ව පරිපථ ලින්ස්	කි.මී.10.5	111
ත්‍රිකුණාමලයේ සිට කින්නියා	නැ.	කි.වෝල්ට් 33 ද්විත්ව පරිපථ ලින්ස්	කි.මී.14	202
ත්‍රිකුණාමලයේ පාරු මාරුව	නැ.	කි.වෝල්ට් 33 SC චල්මි	කි.මී.1	40

2012 වසරේදී සිදු කළ නව යෝජනා

කටයුත්ත	පළාත	විස්තර	දිග	පිරිවැය රු.මිලියන
ඊරියගම අටළු අංගනයේ සිට පිච්චමල්වත්ත අටළු අංගනය (රැහැන් විතැන් කිරීම)	මධ්‍යම	කි.වෝල්ට් 33 ඒකල පරිපථ ලින්ස්	කි.මී. 15	210
ගොරකදෙණිය අටළු අංගනයේ සිට හෙන්දෙණිය/ගලගෙදර අටළු අංගනය	මධ්‍යම	කි.වෝල්ට් 33 ඒකල පරිපථ ලින්ස්	කි.මී. 14	168
අක්කරපත්තුව අටළු අංගනයේ සිට පොතුවිල් අටළු අංගනය	නැ.	කි.වෝල්ට් 33 ද්විත්ව පරිපථ ලින්ස්	කි.මී. 42	588
ගලමඩුව ග්‍රැන්ට්‍රියේ සිට අක්කරපත්තුව අටළු අංගනය	නැ.	කි.වෝල්ට් 33 ද්විත්ව පරිපථ ලින්ස්	කි.මී. 22	308

රැහැන් නඩත්තු කිරීම

මහනුවර, මාතලේ,පේරාදෙණිය, කුණ්ඩසාලේ, කටුගස්තොට, නාවලපිටිය, අම්පාර සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල සියළුම කි.වො.33 කුළුණු රැහැන් නඩත්තු කිරීමේ ව්‍යාපෘතියේ රැහැන් නඩත්තු ඒකකයේ හා අධිසැර නඩත්තු මධ්‍යම කලාපයේ වගකීම වේ. 2011 වර්ෂයේදී මෙම ඒකකය මගින් සිදු කර ඇති ක්‍රියාකාරකම් වගුවේ දක්වා ඇත.

බෙදාහැරීමේ අංශය 2

සාමාන්‍ය නඩත්තු වැඩ 2011				
ප්‍රදේශය	කුළුණු රැහැන්	කුළුණු සංඛ්‍යාව	ආසන්නතම රැහැන් දිග (කි.මී.)	වියදම (රු.)
අම්පාර	මහඔය පදියතලාව	100	20	512,827
	පියන්ගල මහඔය	151	30	685,585
	අම්පාර කාර්තිව්	101	25	896,118
කුණ්ඩසාලෙ	හන්තාන - කුණ්ඩසාලේ BB රැහැන් නඩත්තු කිරීම	විලි පෙහෙලි කර නොමැති නිසා කණු සිටුවීම	-	365,933
	පල්ලෙකැලේ රැහැන් නඩත්තු කිරීම	93	20	364,748
මාතලේ	1. වේරගම - ගම්මාදුව 2. ඕලිස්කෝන් - කවටයමුන 3. දෝලෙ වේරගම 4. උකුවෙල - පිටකන්ද 5. උකුවෙල - දෝලෙ PB කුළුණු රැහැන් 6. දෝලෙ කවටයමුන 7. කවටයමුන දොඩන්ගස්ලන්ද උකුවෙල - දෝලෙ	314	63	තවදුරටත් සිදු කෙරෙමින් පවතින අතර බොහෝ දුරට වැඩ අවසන් වී ඇත.
මුළු ගණන		**759**	**158**	**2,825,211**

නඩත්තු 2011				
ප්‍රදේශය	**කුළුණු රැහැන්**	**කුළුණු සංඛ්‍යාව**	**ආසන්න වශයෙන් රැහැන් දිග (කි.මී.)**	**වටිනාකම (රු.)**
මහනුවර ප්‍රදේශය	H04/ H05	35	7	**114,179**
මඩකලපුව ප්‍රදේශය	වාලච්චේන - වැලිකන්ද	120	36	**720,022**
නාවලපිටිය ප්‍රදේශය	ඊරියගම - උලපනේ රැහැන			**124,285**
මාතලේ ප්‍රදේශය	උකුවෙල - දෝලේ F01	28	7	**2,024,626**
	කටයාමුන දොඩන්ගස්ලන්ද	64	19	
	දෝලෙ කවටයමුන D/C	43	10	
	දඹුල්ල - හබරණ	107	25	
	උකුවෙල - දෝලෙ PB කණු රැහැන	41	6	
	උකුවෙල - පිටකන්ද	46	7	
	දෝලෙ - වේරගම	18	3	
	ඕලිස්කෝන් - කවටයමුන	35	5	
	වේරගම - ගම්මාදුව	39	5	
	දඹුල්ල - හබරණ	102	15	
ත්‍රිකුණාමල ප්‍රදේශය	ත්‍රිකුණාමලය - මොරවැව	183	46	**2,483,335**
	ත්‍රිකුණාමලය - කිතුල්හුතුව	199	56	
	ප්‍රීමා රැහැන්	34	08	

බෙදාහැරීමේ අංශය 2

නඩත්තු 2011				
ප්‍රදේශය	**කුළුණු රැහැන්**	**කුළුණු සංඛ්‍යාව**	**ආසන්න වශයෙන් රැහැන් දිග (කි.මී.)**	**වටිනාකම (රු.)**
කුණ්ඩසාලේ ප්‍රදේශය	කරලියැද්ද - මාළුස්සාව	30	6	**897,987**
	මාළුස්සාව - කුණිස්ගල	30	6	
	මහියංගනය - රන්දෙණිගල	82	12	
	දිගන - කරලියැද්ද	42	6	
	රන්දෙණිගල - රන්ටැඹේ	16	3	
	කරලියැද්ද - මහියංගනය	114	24	
	පල්ලෙකැලේ - කරලියැද්ද	24	5	
	පල්ලෙකැලේ - නාරංදෙණිඩ B/B	44	11	
	පල්ලෙකැලේ - පිච්චමල්වත්ත	27	4	
එකතුව		**1503**	**332**	**6,364,434**

වියදම් පියවා ගැනීමේ කටයුතු සහ අලාභ හානි		
ප්‍රදේශය	**කාර්යය**	**වියදම (රු.)**
ලංකාතිලක වියදම පියවා ගැනීමේ කටයුතු	නැවත පිළියෙල කිරීමේ කටයුතු	69705
හතලේ අලාභ හානිය	ඇලවෙන කුළුණු නිවැරදි කිරීම	46,803
සිංහපිටිය හෙම්මාතගම අලාභ හානිය	සන්නායකය අළුත්වැඩියා කිරීමේ කටයුතු	28,388
ගම්පොල කි.වෝ.66 අටළු අංගන බිඳ වැටීම	ප්‍රතිසන්ධි කිරීමේ කටයුතු	26,781
මංගලගම කුළුණු අලාභ හානිය	කුළුණු නැවත සකස් කිරීම	679,985
හසලක රැහැන් නඩත්තු කිරීම	හසලක රැහැන් ඇදීමේ ව්‍යාපෘතිය	186,890
අම්පාර ජාල නැවත සැකසීමේ කටයුතු	පෝෂක පහන් නැවත සකස් කරනු ලැබීය	641,063
හපුතලේ පල්ලෙකැලේ අලාභ හානිය	අකුණු සැර අලාභ හානි	76354
අම්පාර අන්තර් - සම්බන්ධය	අන්තර් සම්බන්ධතා පෝෂක	548,520
නාවලපිටිය	ලිදුල පෝෂක	39,036
එකතුව		**2,343,525**

බෙදාහැරීමේ අංශය 2 සඳහා එස් 5 සංකල්පය ආදේශ කිරීම

ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය - ව්‍යාපෘති සහ අධිසැර නඩත්තු 02 ඒකකය - මධ්‍යම කලාපය විසින් 2011 ලං.වි.ම. එස් 5 තරඟයේ ප්‍රථම ස්ථානය දිනාගෙන ඇත.

ප්‍රධාන ඉංජිනේරු (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු බෙදාහැරීමේ අංශය 2) එස් 5 තරඟයෙන් ජයග්‍රහණ දෙකක් ලබා ගැනීම.

බෙදාහැරීමේ අංශය 3

විශේෂ කරුණු - 2011

වසර තුළ අංශයේ අලෙවි කර ඇති ඒකක(ගි.වො.පැ.)	1846
අලෙවි කල ඒකක මගින් ලබා ගත් ආදායම් බදු(රු.මිලියන)	22,854
ආසන්න විකුණුම් මිල (රු./ කි.වො.පැ.)	12.38
බෙදාහැරීමේ පාඩු (%)	13
ලබා ගත හැකි මට්ටම	0.93
වසර අවසානයේ අංශයේ සිටි සිල්ලර පාරිභෝගිකයින් සංඛ්‍යාව (අංක)	1,114,287
වසර තුලදී සපයා ඇති නව සම්බන්ධතා සංඛ්‍යාව (අංක)	64,882
වසර අවසාන වන විට සිටි සේවක සංඛ්‍යාව (සංඛ්‍යා)	2,492
වසර අවසාන වන විට සිටි තොග පාරිභෝගික සංඛ්‍යාව (සංඛ්‍යා)	1755
පාරිභෝගිකයෙකු සඳහා මසකට ආසන්න වශයෙන් බදු ප්‍රමාණය (රු./මසකට)	1,706
වසර අවසාන වන විට සේවකයෙකු සඳහා වන සිල්ලර පාරිභෝගිකයන්ගේ ආසන්න සංඛ්‍යාව (සංඛ්‍යා)	447
බෙදාහැරීම් උප පොළ සඳහා ආසන්න වශයෙන් වන සිල්ලර පාරිභෝගිකයින් සංඛ්‍යාව (සංඛ්‍යා)	208
සේවකයෙකු සඳහා ආසන්න වශයෙන් වන අඩු වෝල්ටීයතා රැහැන් සංඛ්‍යාව (සේවකයෙකු/මීටර)	9.9
වෝල්ටීයතා රැහැන් සංඛ්‍යාව (පාරිභෝගිකයෙකුට/මීටර)	22.0
බෙදා හැරීමේ උප පොළ සඳහා ආසන්න වශයෙන් වන මධ්‍යම වෝල්ටීයතා රැහැන් (උප පොළකට/කි.මී.)	1.3
විදුලිය ලබා දුන් නිවාස සංඛ්‍යාව	89.1



බෙදාහැරීමේ අංශය 3 හි භූගෝලීය මායිම්

බෙදා හැරීමේ අංශය 3 ට අයත් මෙහෙයුම් ක්ෂේත්‍රය ඉහත දක්වා ඇති පරිදි සබරගමුව පළාත,ඌව පළාත සහ බස්නාහිර පළාත දකුණ 2 නමින් හැඳින්වෙන බස්නාහිර පළාතද ආවරණය කරයි. බස්නාහිර පළාත දකුණ 2 මගින් හෝමාගම, ශ්‍රී ජයවර්ධනපුර, අවිස්සාවේල්ල සහ හොරණ යන ප්‍රදේශ ආවරණය කෙරෙන අතර රත්නපුර දිස්ත්‍රික්කයේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ කොටසකින් සහ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් සබරගමුව පළාත සමන්විත වේ. ඌව පළාත මගින් බදුල්ල, මොණරාගල සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොටසක් ආවරණය කෙරේ. මෙම අංශය මගින් ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 23% ආවරණය කෙරේ. අංශය තුළ මුළු ජනගහනය මිලියන 5.6 ක් පමණ වේ. අංශයේ ඉහළම විදුලිබල සැපයුම් මට්ටම 99% බස්නාහිර පළාත දකුණ 2 න් වාර්තා වී ඇති අතර අවම ප්‍රමාණය වන 81% ක ඌව පළාතෙන් වාර්තා විය. සබරගමුව පළාත විදුලිබල සැපයුම් ප්‍රමාණය 91% ක් වේ.

අංශයේ පාරිභෝගිකයෙකු සඳහා වාර්ෂික විදුලිබල පරිභෝජනය කි.වො.1,654 කි. කි.වො.2,942 ක් වන පාරිභෝගිකයෙකු සඳහා උපරිම වාර්ෂික විදුලිබල පරිභෝජනය බස්නාහිර පළාත දකුණ 2 වාර්තා කරන අතර පාරිභෝගිකයෙකු සඳහා වන අවම වාර්ෂික විදුලිබල පරිභෝජනය වන කි.වො.පැ.916 සබරගමුව පළාතින් වාර්තා විය. අංශයේ ඉහළම ආදායම් ලබන කොටස බස්නාහිර පළාත දකුණ 2 වන අතර සබරගමුව හා ඌව පළාතේ සමහර අංශ සතුටුදායක මට්ටමට ඉතා පහළින් වේ.

මෙහෙයුම් ව්‍යුහය

බෙදාහැරීමේ අංශය 3 හි අතිරේක සාමාන්‍යාධිකාරිවරයා ප්‍රධානියා වන අතර ඔහු සෘජුවම සාමාන්‍යාධිකාරිවරයාට වගකිව යුතු වේ. මෙහෙයුම් කටයුතු සඳහා මෙම අංශය සබරගමුව, ඌව හා බස්නාහිර පළාත දකුණ 2 නම් පළාත් 3 කට බෙදා ඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා එක් එක් පළාතේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. ක්ෂේත්‍ර විදුලි ඉංජිනේරුවරුන් මගින් පාලනය කරනු ලබන ක්ෂේත්‍රවලට එම එක් එක් පළාත නැවතත් බෙදා වෙන් කර ඇත. කාර්යක්ෂම පරිපාලන කටයුතු උදෙසා එක් එක් කලාප තුල ක්ෂේත්‍ර නිළධාරීන් 15 ක්ද පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 46 ක්ද තිබේ.

පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්ට අමතරව අංශයේ ව්‍යාපෘති, අධිසැර නඩත්තු කටයුතු, සැලසුම් හා සංවර්ධන කටයුතු සහ වාණිජ සහ ආයතනික ක්‍රියාකාරකම් පිළිබඳ සොයා බැලීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් තිදෙනෙක් සිටී. වාණිජ හා ආයතනික ශාඛාව මගින් ආදායම් අධීක්ෂණය කාර්මික නොවන අලාභ හානි අවම කිරීම, ශක්ති කළමණාකරණය ඉංජිනේරු විගණනය සහ මානව සම්පත් කළමණාකරණය සහ සංවර්ධන කටයුතු සිදු කරයි. සැලසුම් හා සංවර්ධන අංශය මගින් විශ්වස්‍යතාව මධ්‍යම ප්‍රමාණයේ වෝල්ටීයතා ජාල සංවර්ධනය, අංශයේ අමුද්‍රව්‍ය සැපයුම, ජනනය ආශ්‍රිත ක්‍රියාකාරකම්, තාක්ෂණික අලාභහානි අවම කිරීම සහ ග්‍රාමීය විදුලිබල සැපයුම් යන කරුණු පිළිබඳ ගැටළු හඳුන්වා දේ.

ව්‍යාපෘති සහ අධිසැර නඩත්තු මගින් 33 කි.වො. යකඩ කුළුණු සහිත රැහැන්, ලින්ස් පිරියවත භාවිතයෙන් පෙරදි කණු සහිත රැහැන්, 33 කි.වො./11 කි.වො. ප්‍රාථමික උප පොළවල් 33 කි.වො. වහරු අටළු අංගන, සියසල පිලිවසු, අධිසැර මීටර තාරා පැවි ඉදි කිරීම හා නව්‍යකරණය කිරීමේ කටයුතු සිදු කරයි.

පළාත් මගින් සිදු කරනු ලබන මූල්‍යමය සහ ආදායම් කටයුතු ප්‍රදේශයේ අතිරේක මුදල් කලමණාකරු මගින් අධීක්ෂණය කරනු ලබයි. මානව සම්පත් කටයුතු සඳහා දායක වීම සඳහා සෑම පළාතක් සඳහාම මානව සම්පත් නිලධාරියෙකු පත්කර සිටී. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(වාණිජ හා ආයතනික ශාඛාව) යටතේ ඇති ඒකකයක් මගින් මෙම ක්‍රියාකාරකම්

බෙදාහැරීමේ අංශය 3

සම්බන්ධීකරණය හා සියළු විධායක නිලධාරීන්ගේ හා ආයතන කාර්යාලයට අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලයේ මානව සම්පත් කටයුතු සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

අංශයේ ජනනය

කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාර අතරින් 90% පමණ බෙදාහැරීමේ අංශය 3 හි පිහිටා ඇත. බොහෝ දුරට ක්ෂුද්‍ර ජලවිදුලි බලාගාර ලෙස සැලකෙන ජනන 313 ක් පමණ දැනට ප්‍රයෝජනයට ගැනෙන අතර ඒවා බෙදාහැරීමේ අංශය 3 හි පිහිටුවා ඇත. මෙම බලාගාර අතුරින් 66% ක් පමණ සබරගමුව පලාතේද, 33% ක් පමණ ඌව පලාතේද පිහිටා ඇත. ජාතික ජාලකය ට මෙ.වො.155 ක ශක්ති ප්‍රමාණයක් එක් කරමින් බලාගාර 73 ක් සූදානම් කර ප්‍රාදේශීය බෙදාහැරීමේ ජාලයට සම්බන්ධ කර ඇත.

මූලික අරමුණු

- දැනට පවත්නා පාරිභෝගික ජාලයට තවත් පාරිභෝගිකයින් සම්බන්ධ කිරීම.
- සැපයුම් නිරවද්‍යතාව සතුටුදායක මට්ටමක පවත්වාගෙන යාම.
- සැපයුමේ ගුණාත්මකභාවය නියමිත මට්ටමේ පවත්වාගෙන යාම.
- කාර්මික හා කාර්මික නොවන අලාභ හානි වැනි සියළු අලාභ හානි අවම කර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම.
- සියළු පාරිභෝගික ගැටළුවලට පියවර ගැනීම හා අවම කාල සීමාවක් තුල ඒවාට විසඳුම් ලබා දීම.
- පංගුකරුවන් උපරිම වශයෙන් තෘප්තිමත් වන පරිදි සියළු සේවා සැපයීම.

බෙදාහැරීම් යටිතල පහසුකම්		
කි.වො.33 බෙදාහැරීමේ රැහැන්	කි.මී.	6,797
කි.වො.11 බෙදාහැරීමේ රැහැන්	කි.මී.	54
කි.වො.11 භූගත කේබල	කි.මී.	4
33/11 කි.වො .ප්‍රාථමික උපපොල	සංඛ්‍යා	15
අඩු සැර බෙදාහැරීමේ රැහැන්	කි.මී.	24,645
අඩු සැර බෙදාහැරීමේ උපපොල	සංඛ්‍යා	5,353
සේවා සම්බන්ධතා	සංඛ්‍යා	1,116,039

විදුලි අලෙවිය

බෙදාහැරීමේ අංශය 3 හි දිවයිනේ විදුලි අලෙවියෙන් 21% ක් වාර්තා විය. (ලං.වි.පු.ස. අලෙවි හැර) 2011 වසරේදී ලං.වි.පු.ස. විදුලිසැර ගි.වො.පැ. 1,846 ක් විදුලි අලෙවියක් මෙම අංශයෙන් වාර්තා වූ අතර එම ප්‍රමාණය 2010 වසර හා සසඳන විට 8.7% ක ඉහළ යාමකි. බෙදාහැරීමේ අංශය 3 හි අලෙවි බහුතරය කාර්මික අයක්‍රම වර්ගයට ගන්නා ලද අතර එය අංශයේ මුළු අලෙවියෙන් ආසන්න වශයෙන් 44% ක් විය. මෙහිදී දෙවන හා ස්ථානය හිමි වූයේ ගෘහස්ථ හා සාමාන්‍ය කටයුතු අයක්‍රම වර්ගයන්ය. අංශයේ මුළු අලෙවියෙන් 55% ක් බස්නාහිර පලාත දකුණ 2 වාර්තා කල අතර ඉන් අනතුරුව පිළිවෙළින් සබරගමුව හා ඌව පළාත් වලට එම ස්ථානයන් හිමි විය.

ජනන ඉදි කිරීම් සඳහා නව යෝජනා ඉදිරිපත් කිරීම වලකන ගැටළු කිහිපයක් තිබේ. කුඩා පරිමාණ විදුලි බලාගාරවලට පවා පෝෂක ඉදි කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කරවන ප්‍රමාණවත් නොවන රැහැන් පද්ධති ප්‍රමාණය සහිතව පෝෂක සඳහා රැහැන් මාර්ග සෙවීමේ ප්‍රායෝගික අපහසුතාවය මෙම ගැටළු වලට ඇතුලත් වේ. තවද, අංශයේ බොහෝ ජාලක උප පොල නියමිත බෙදාහැරීමේ සීමාව ඉක්මවා සිටී. එම නිසා බෙදාහැරීමේ අංශය 3 හි සමහර ජාලක උප පොලවල් සඳහා නව යෝජනා ඉදිරිපත් නොකෙරේ. සම්ප්‍රේෂණ ධාරිතාව ඉහල නැංවීමෙන් පමණක් මෙම ගැටළුව විසඳිය හැකි වේ.

විදුලිය අලෙවි කොටස



බෙදාහැරීමේ අංශය 3 හි විදුලිය විකුණුම්

අයක්‍රම ප්‍රභේද අනුව විකුණුම්



විවිධ අය ක්‍රම ප්‍රභේදවල විකුණුම් - බෙදාහැරීමේ අංශය 3

පලාත් අනුව විදුලිය විකුණුම්



පලාත් අනුව විදුලි විකුණුම් - බෙදාහැරීමේ අංශය 3

බෙදාහැරීමේ අංශය 3

විදුලි අලෙවියෙන් ලද ආදායම්

වසර තුලදී විදුලි අලෙවියෙන් ලද ආදායම රු.මිලියන 22,854 ක් වූ අතර එය පෙර වර්ෂයට වඩා 12.4 කින් ඉහළ යාමකි. (ඉහත අලෙවිය ලං.වි.පු.ස. අලෙවියට අමතරය) ලං.වි.ම. මුළු ආදායමෙන් 19% ක් බෙදාහැරීමේ අංශය 3 න් උපයා ගැනේ. බෙදාහැරීමේ අංශය 3 හි අලෙවි බහුතරය කර්මාන්ත අයකුම ගණයට වැටෙන අතර එය ආසන්න වශයෙන් අංශයේ මුළු අලෙවියෙන් 44% කි. මී ලග ස්ථානය ගනු ලබන්නේ පිළිවෙලින් ගෘහස්ථ හා සාමාන්‍ය කටයුතු අයකුම වර්ගයයි. අංශයේ මුළු ආදායමෙන් 58% ක් බස්නාහිර පළාත දකුණ 2 න් ලැබෙන අතර මී ලග ස්ථානයන් හිමි වන්නේ පිළිවෙලින් සබරගමුව හා ඌව පළාත්වලටය. අංශයේ ඒකකයකට සාමාන්‍ය විකුණුම් මිල රු.12.48 ක් වන අතර එය රු.13.61වන ජාතික සාමාන්‍ය අගයට වඩා අඩු අගයකි. අංශ අතර ඒකක මිල සැසඳීමේදී 1 අංශයේ ඉහළම ඒකක මිල වාර්තාවූ අතර එය ජාතික සාමාන්‍ය අගයට වඩා ඉහළ අගයකි.

විදුලි ආදායම් ප්‍රතිශතය



ආදායම් ප්‍රතිශතය : බෙදාහැරීමේ අංශය 3

විදුලිය කණ්ඩ අනුව විකුණුම් ආදායම



අයකුම අනුව ආදායම් : බෙදාහැරීමේ අංශය 3

විදුලි විකුණුම් ආදායම්



පලාත අනුව විදුලිය විකුණුම් වලින් ලද ආදායම : බෙදාහැරීමේ අංශය 3



පලාත් අනුව සාමාන්‍ය විදුලිය විකුණුම් මිල ගණන් - බෙදාහැරීමේ අංශය 3



අංශ අනුව සාමාන්‍ය විදුලිය විකුණුම් මිල ගණන් - බෙදාහැරීමේ අංශය 3

වසර 2011 දී, එකතු කළ මුදල් ප්‍රමාණය අලෙවි ප්‍රතිශතයක් ලෙස 101.9% කි. මීට පෙර වර්ෂයේ එම අගය 99.7% ක් විය. වසර 2011 සඳහා අංශයේ ණයකරුවන්ගේ තත්ත්වය අනුව ණය ප්‍රමාණය රු.මිලියන 3,116 ක් විය. 2011 දෙසැම්බර් වන විට අංශයේ සමස්ථ අය තත්ත්වය මාස 0.96 ක් වූ අතර එම අගය 2010 වසරේදී 1.7 ක් විය.

විදුලි පාරිභෝගික ගිණුම් හා නව සේවා සම්බන්ධතාව.

2011 වසර අවසාන වන විට 3 ප්‍රාදේශිකයේ පාරිභෝගික ගිණුම් 1,116,039 ක් විය. පාරිභෝගික ගිණුම්වලින් බහුතරය ගෘහස්ථ වර්ගයේ

බෙදාහැරීමේ අංශය 3

වූ අතර ඊ ලඟ ස්ථානය හිමි වනුයේ වාණිජ වර්ගයටයි. වසර අවසාන වන විට ප්‍රාදේශිකයේ තොග සැපයුම් පාරිභෝගිකයින් සංඛ්‍යාව 1755 ක් විය. තොග සැපයුම් පාරිභෝගිකයින්ගේ සංඛ්‍යාව ඉහලම සංඛ්‍යාව වූ 829 බස්නාහිර පලාත දකුණ 2 න් වාර්තා විය. බෙදාහැරීමේ අංශය 3 හි පාරිභෝගික ගිණුම් මුළු සංඛ්‍යාව පලාත් 3 අතර බොහෝ දුරට සමාන ලෙස බෙදී ඇත.

2011 වර්ෂයේදී නව සම්බන්ධතා 64,882 ක් සැපයූ අතර ඉන් 78 ක් නව තොග සැපයුම් විය. මෙම නව සම්බන්ධතා සියල්ල අතරින් 60% ක් සති දෙකක් ඇතුලත සපයනු ලැබීය. සම්බන්ධතා සැපයීමේ ප්‍රමාද දෝෂයට හේතූන් ලෙස දිගු සේවා ප්‍රමාණය ගනුදෙනුකරුවන් ඊට සූදානම්ව නොසිටීම සහ අවශ්‍ය මංවර ආදිය නොමැතිකම පෙන්වා දිය හැකිය.



පාරිභෝගික සංඛ්‍යාව: බෙදාහැරීමේ අංශය 3

නිරවද්‍යතාව

බෙදාහැරීමේ අංශය 3 හි ශක්ති සැපයුමේ නිරවද්‍යතාව විශ්ලේෂණය කිරීම සඳහා 2011 වසරේදී වලට සේවා ඇමුණුම් පත අලාභහානි මෘදුකාංග ආකෘතියක් සම්බන්ධ කර බෙදාහැරීමේ අංශය 3 හි සියළුම පාරිභෝගික සේවා මධ්‍යස්ථාන වලට සවි කරනු ලැබීය. කෙසේ වුවද, සෑම උප පොළකටම පාරිභෝගික අංක හඳුනා ගැනීම පෝෂික පතුර ආදී මූලික මට්ටමේ කටයුතු රාශියක් තවදුරටත් ඉටු කිරීමට ඉතිරි වී ඇත. 2011 වර්ෂය තුලදී බ.ප.ද. 2 ආශ්‍රිත සමහර කටයුතු දැනටමත් සිදුකර අවසන් වී ඇත. දුරස්ථ මෙහෙයුම් සඳහා සියළුම සියසල බොහෝ දුරට දැනට සවිකර ඇති අතර වසර 2012 තුලදී එය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. අලාභහානි පිළිසකර කිරීමේ කාලය මෙමගින් නියත වශයෙන්ම අඩු කරනු ඇත.

පෙර වර්ෂයේ සංඛ්‍යා හා සසඳන විට අධි සැර හා අඩුසැර රැහැන් දිග පිළිවෙලින් 3.8% කින් හා 1.2% කින් ඉහල ගොස් ඇති නමුත් සමාලෝචනය කරනු ලබන වර්ෂයේදී පෙර වර්ෂයේදී මෙන්ම සැපයුම් නිරවද්‍යතාවය එලෙසම පවත්වාගෙන තිබේ. කි.මී.100 දිග රැහැන් සඳහා මසකට අලාභහානි ප්‍රමාණය ඉහළ වෝල්ටීයතා රැහැන් සඳහා 14 ක් ලෙසද අඩු වෝල්ටීයතා රැහැන් සඳහා 37 ක් ලෙසද පවත්වාගෙන ගොස් තිබේ.



කි.මී.100 රැහැනකට බිඳවැටුම් සංඛ්‍යාව 2011 : බෙදාහැරීමේ අංශය 3

විදුලිය බෙදාහැරීමේ පද්ධතිය සංවර්ධනය

2011 වර්ෂය තුලදී අංශය තුළ අඛණ්ඩව සිදු කල හා අවසන් කරන ලද ග්‍රාමීය විදුලි සැපයුම්, ග්‍රාමීය ක්‍රියාකාරකම් සහ අනෙකුත් පද්ධති සංවර්ධන ක්‍රියාකාරකම් පහත වගුවේ දැක්වේ. 2011 වර්ෂය තුලදී නව අඩුසැර රැහැන් කි.මී. 885 ක්ද, අධි සැර රැහැන් කි.මී. 246 ක්ද, නව උප මධ්‍යස්ථාන 132 ක්ද ඉදි කරනු ලැබීය. තවද, එකලා කි.මී. 78 රැහැන් හා දෙකලා කි.මී. 32 ක්ද , තෙකලා ට පරිවර්ථනය කරනු ලැබීය. 2011 වර්ෂය තුළ සමස්ථ ක්‍රියාකාරකම් සඳහා අපේක්ෂිත වියදම රු.මිලියන 1,895 ක් විය. ජාල ව්‍යාප්තිය නිසා අංශයන්හි බෙදාහැරීමේ ජාලයට පාරිභෝගිකයින් 64,882 ක් එකතු වී තිබේ.

යෝජනා ක්‍රමය	අඩු වෝල්ටීයතා (කි.මී.)	අධිසැර (කි.මී.)	නව උප පොල	විශාලනය කල උප පොල	උප පොල නඩත්තුව	මුළු පිරිවැය (කි.මී.)
විමධ්‍යගත අය වැය	6	-	-	-	-	7
පලාත්සභා අය වැය	38	-	-	-	-	46
සිඩා	59	14	11	-	-	116
කඩිනම් ග්‍රාමීය විදුලියන වැඩසටහන	255	102	49	-	-	595
ඌව උදානය	253	51	28	-	-	443
අනෙකුත් ග්‍රාමීය යෝජනා ක්‍රම	175	19	10	-	-	285
පද්ධති වැඩිදියුණු කිරීම	97	37	33	12	13	347
නඩත්තු කටයුතු	1	23	1	0	7	57
එකතුව	**885**	**246**	**132**	**12**	**20**	**1,895**

බෙදාහැරීමේ අංශය 3

රැහැන් කුළුණු ඉදිකිරීම් හා වෙනත් උපකරණ සවිකිරීම

අයිතමය	ඉලක්කය	මුළු පිරිවැය (රු.මිලියන)
නව රැහැන්		
ද්විත්ව පරිපථ කුළුණ (කි.මී.)	1	6
තනි පරිපථ කුළුණ (කි.මී.)	5	49
ද්විත්ව පරිපථ ලිනක්ස් කුළුණ (කි.මී.)	3	47
තනි පරිපථ ලිනක්ස් කුළුණ (කි.මී.)	12	120
රැහැන් නඩත්තුව		
ද්විත්ව පරිපථ කුළුණ (කි.මී.)	52	20
තනි පරිපථ කුළුණ (කි.මී.)	110	
ද්විත්ව පරිපථ ලිනක්ස් කුළුණ (කි.මී.)	170	
තනි පරිපථ ලිනක්ස් කුළුණ (කි.මී.)	105	
ප්‍රාථමික උප පොල නඩත්තුව		
උප පොල සංඛ්‍යාව අටළු අංගන	-	18
නව අටළු අංගන		
සියසල පිලිමසු (සංඛ්‍යාව)	2	36
උපකරණ සවිකිරීම්		
සියසල පිලිමසු (සංඛ්‍යාව)	4	10
බැර කඩන වහරු (සංඛ්‍යාව)	2	3
මායම් මීටර (සංඛ්‍යාව)	5	5
තොග සැපයුම් මීටර	14	28
මුළු ගණන		**341**

කඩිනම් ග්‍රාමීය විදුලිබල සැපයුම් ව්‍යාපෘතිය (AREP)

කඩිනම් ග්‍රාමීය යෝජනා ක්‍රම ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී සැමට විදුලිය සැපයීමේ රජයේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා උර දෙන ව්‍යාපෘතියකි. මේ සඳහා ශ්‍රී ලංකා රජය අරමුදල් සපයනුලැබේ. ලං.වි.ම. ට අයත් පලාත් කිහිපයකම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබීය. බෙදාහැරීමේ අංශය 3 හි සබරගමුව හා ඌව පලාත්වල ග්‍රාමීය යෝජනා ක්‍රම 3,135 ක් සම්පූර්ණ කර ඇති අතර එමගින් ල.වි.ම. පාරිභෝගික සංචිතයට පාරිභෝගිකයින් 25,000 ක් පමණ එකතු වී තිබේ. මෙම ව්‍යාපෘතිය නිසා බෙදාහැරීමේ අංශය 3 ට දරන්නට සිදු වූ වියදම රු.මිලියන 1,085 ක් විය.

ඌව උදානය

ග්‍රාමිය ක්ෂේත්‍රයේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත බිහි කරමින් 2012 වර්ෂය තුලදී සැමට විදුලිය සැපයීම ශ්‍රී ලංකා රජයේ අරමුණ වේ. යෝජිත ඌව උදානය ග්‍රාමීය විදුලිබල සැපයුම් ව්‍යාපෘතිය,ග්‍රාමීය විදුලිබල සැපයුම පුළුල් කිරීමේ හා ප්‍රවේශ මාර්ග වැඩි දියුණු කිරීමේ කාර්යයට දායක වනු ඇති අතර ඇමෙරිකානු ඩොලර් මිලියන 45 ක් වැය කරමින් දුරබැහැර ගම්මාන 800 කට පමණ විදුලිබලය සපයනු ඇත. කුඩා සහ මධ්‍ය පරිමාණ මෙන්ම මහා පරිමාණ කර්මාන්ත වලද අවශ්‍යතාවන් සපුරාලමින් අඩු වෝල්ටීයතා ජාල කි.මී. 80,000 ක් පෝෂණය කරන බෙදාහැරීමේ උප මධ්‍යස්ථාන 250 ක් සමග මෙම ව්‍යාපෘතිය මගින් මධ්‍යම වෝල්ටීයතා බෙදාහැරීමේ රැහැන් කි.මී.625 කින් දීර්ග කරනු ඇත.

ඉරාන (ග්‍රාමීය 8) ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා රජයේ ග්‍රාමීය විදුලිබල සැපයුමේ මුල් පියවර යටතේ වයඹ, මධ්‍යම, බස්නාහිර උතුර, නැගෙනහිර, බස්නාහිර දකුණ I, බස්නාහිර දකුණ II සබරගමුව සහ දකුණ පලාත ඇතුළු ලං.වි.ම. පළාත් 11 ක ගම්මාන දහසකට විදුලි ආලෝකය සැපයීමට ග්‍රාමීය විදුලිබල සැපයුම් ව්‍යාපෘතිය - 8 සැලසුම් කර තිබේ. ග්‍රාමීය විදුලි බල සැපයුම් ව්‍යාපෘතිය 8 ට ඉරාන රජයෙන් අරමුදල් සැපයෙන අතර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 106.5 කි. ලංකා විදුලිබල මණ්ඩලයෙන් සපයනු ලබන වැ.කො. සහ පෙරදී කනු හැර අනෙකුත් සියළු අමුද්‍රව්‍ය මෙම ව්‍යාපෘතිය සඳහා යෝජිත කොන්ත්‍රාත්කරු විසින් සපයනු ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ යෝජිත කාර්යයන්

- 100 කි.වො.ඇ. 1000 ක් ඉදි කිරීම සහ 33කි.වො./අඩු සැර බෙදා හැරීමේ උප මධ්‍යස්ථාන 1000 ක් ඉදි කිරීම.
- කි.මී.33 මෙ.වො. රැහැන් කි.මී.1000 ක් සවි කිරීම.
- පොදි බහන්/තෙකලා කි.මී.4000 ක් ඉදිකිරීම හා අඩු සැර බෙදා හැරීමේ රැහැන් කි.මී.2000 ක් සවි කිරීම.
- තනි එකලා රැහැන් කි.මී.50 ක් තෙකලා රැහැන් බවට පරිවර්තනය කිරීම.

යෝජනා ක්‍රම කිහිපයකම වැඩ අවසන් වී ඇති අතර කිහිපයක වැඩ සිදු කෙරෙමින් පවතී.

රත්නපුර නගරය ආලෝකමත් කිරීම.

මෙම ග්‍රාමීය ව්‍යාපෘතියේ අරමුණ වනුයේ රත්නපුර දිස්ත්‍රික්කයට 100% ක් විදුලිය සැපයීමයි. ව්‍යාපෘතිය, ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු මගින් කළමණාකරණය කරනු ලබන අතර එය 2008 වර්ෂයේදී ආරම්භ විය. ව්‍යාපෘතියේ ඉලක්ක පහත දැක්වේ.

- රත්නපුරය ග්‍රිඩ් උප පොල විශාලනය
- කි.මී.71 ක් දිග 33කි.වො. රැහැන් සහ වහරු අටළු අංගන ඉදි කිරීම.
- කි.මී.1000 මෙ.වො. රැහැන් කි.මී.2100 රැහැන් සහ අඩු සැර බෙදාහැරීමේ උප මධ්‍යස්ථාන 550 ක් ඉදි කිරීම.

බෙදා හැරීමේදී සිදුවන හානි අඩු කිරීම

2002 වර්ෂයේදී දළ උත්පාදනයෙන් 17% ක් තරම් ඉහල අගයක් ගත් හානි ප්‍රතිශතය 2011 වර්ෂය වන විට ක්‍රමයෙන් 9% ක් දක්වා පහළ ගොස් තිබේ. බෙදාහැරීමේ මට්ටමේ හානි මෙලෙස පහත වැටීමට පසුගිය වසර කිහිපය තුළ බෙදාහැරීමේ අංශයේ දියත් කරනු ලැබූ බෙදා හැරීමේ හානි අවම කිරීමේ වැඩසටහන් (කාර්මික හා වානිජ) සක්‍රිය ලෙස අධීක්ෂණය හා මනා ලෙස ක්‍රියාත්මක කිරීම හේතු විය.

බෙදාහැරීමේ අංශය 3

පළාත	ශක්තිය මෙ.වො.පැ.	ශක්ති හානිය මෙ.වො.පැ.	හානිය
බ.ප.ද. 2	1,157,036	118,137	10
ඌව	449,519	75,536	17
සබරගමුව	546,446	91,453	17
බෙදාහැරීමේ අංශය 3	2,153,001	285,126	13

13% ක් වන මෙම හානිවලින් 10% කාර්මික දෝෂ නිසා සිදු වූ හානි බව ඇස්තමේන්තු කර ඇති අතර 3% කාර්මික නොවන දෝෂ එනම් සොරකම්,නීති විරෝධී සැපයුම්, කුවිතාන්සි නිසා සිදු වූ අතපසුවීම්, මීටර් දෝෂ සහ මීටර් රහිත වීදි ලාම්පු නිසා සිදු වූ බව සැලකේ. කාර්මික නොවන හානි අවම කිරීමේ වැඩසටහනේ පළමු අදියර යටතේ බ.ප.ද. 2 හි සියලු තොග සැපයුම් මීටර් සවි කිරීම නැවත සිදුකර ඇති අතර ක්‍රමික මණු (PPM මීටර) (සාධන ආවරණ සහිත සහ සාධන සීල් රහිත) සවි කිරීම් අවසන් කර ඇත. බ.ප.ද. 2 හි තොග සැපයුම් සවි කිරීම දුරස්ථ කියවුම් සිදුකර ඇත. අනෙකුත් පලාත් දෙක සඳහා PPM මීටර සවි කිරීම හා දුරස්ථ කියවීම් දැනටමත් ආරම්භ කර ඇති අතර එය 2012 වර්ෂය තුළදී අවසාන කෙරෙනු ඇත. බ.ප.ද. 2 තෙකලා 60A සැපයුම් සඳහා මීටර සවි කිරීම කඩිනමින් ආරම්භ කෙරෙනු ඇත.

බලශක්ති කළමණාකරණය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික) යටතේ බලශක්ති කළමණාකරණ ඒකකයක් 2011 වර්ෂයේදී ස්ථාපනය කර ඇත. බලශක්තිය අරපිරිමැසුම්දායක ලෙස පරිභෝජනය සඳහා විවිධත්වයක් ඇති පාරිභෝගික කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් බලශක්ති සංරක්ෂණ වැඩ සටහන් කිහිපයක්ම සංවිධානය කර තිබේ. මෙයට අමතරව පෝස්ටර්, අත් පත්‍රිකා ආදිය උපයෝගී කර ගනිමින් බලශක්ති සංරක්ෂණයේ වැදගත්කම පිලිබඳව අධ්‍යාපනය ලබා දීමට පියවර ගෙන තිබේ. මෙම ශාඛාව මගින් බෙදාහැරීම් අංශය 3 තුල බලශක්ති සංරක්ෂණය, හානි අවම කිරීම, ඉල්ලුම් කලමණාකරණය ආදී කරුණු කේන්ද්‍ර කර ගනිමින් කටයුතු සිදු කරනු ඇත.

නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සහ තත්ත්ව කලමණාකරණය

බෙදාහැරීමේ අංශය 3 හි කාර්යාල කිහිපයක සහ පා.සේ.ම. වලට එස් 5 සංකල්පය සාර්ථක ලෙස ක්‍රියාත්මක කර තිබේ. ලං.වි.ම. යේ එස් 5 වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන සාමාන්‍යාධිකාරී (ලං.වි.ම.) මගින් 2011 වර්ෂය සඳහා එස් 5 තරගයක් ප්‍රකාශයට පත්කර ඇති අතර ජයග්‍රහකයන්ට වටිනා ත්‍යාග ලබාදෙන බව දැනුම් දී තිබේ. පා.සේ.ම. වර්ග කිරීම අනුව එස් 5 තරගයේ පළමුවන ත්‍යාගය සහ දෙවන ත්‍යාගය නුවර එලිය ප්‍රාදේශිය විදුලි ඉංජිනේරු කාර්යාලයේ රිකිල්ලගස්කඩ සහ තවලන්තැන්න පා.සේ.ම. යන දෙක මගින් හිමිකර ගෙන තිබේ. කාර්යාල වර්ග කිරීම අනුව දෙවන ත්‍යාගය බෙදාහැරීමේ අංශය 3 හි සැලසුම් සහ සංවර්ධන කාර්යාලයට හිමි විය. මෙමගින් බෙදාහැරීමේ අංශය 3 තුල එස් 5 සංකල්පය ක්‍රියාත්මක කිරීම පිලිබඳ ඉතා ඉහල උනන්දුවක් ඇති වී ඇති අතර 2012 වසරේ එස් 5 තරඟය සඳහා තවත් කාර්යාල සහ පා.සේ.ම. රැසක් අයදුම් කර තිබේ.

2012 වර්ෂයේදී සැලසුම් හා සංවර්ධන ශාඛාවට ISO 9001:2008 2008 ලබා ගැනීමේ අරමුණින්, මූලික එකඟතාවකයට එලඹීම පිණිස අවශ්‍ය කරන මූලික ලිපි ලේඛන ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනයට ලබා දී තිබේ. දැනටමත් තත්ත්ව ලිපි ලේඛන සියල්ලම වාගේ සූදානම් කර ඇති අතර ISO 9001:2008 සහතිකය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනයට නිළධාරීන් විගණන කටයුතු ආරම්භ කරන තුරු අංශය අපේක්ෂාවෙන් සිටී.

අමුද්‍රව්‍ය සැපයීම

මුළු ඇස්තමේන්තුගත ගැනුම් මිල රු.මිලියන 1,300 ක් වූ ටෙන්ඩර් 89 ක් (අ.මි.ක., බ.මි.ක. සහ ප.මි.ක. මට්ටමේ) 2011 වර්ෂයේ ආරම්භ කළ අතර එම වර්ෂය තුලදී ටෙන්ඩර් 61 ක් ප්‍රදානය කරනු ලැබීය. අංශයේ දැනට ඇති මධ්‍යගත ක්‍රමයට මිලදී ගන්නා ලද මූලික අමුද්‍රව්‍ය පිළිබඳ සහතික වෙමින් බෙදාහැරීමේ අංශය 3 හි අමුද්‍රව්‍ය තත්ත්වය සැලකිය යුතු මට්ටමින් වැඩි දියුණු වී තිබේ.

සැලසුම් සහ සංවර්ධන ශාඛාවේ සියලු සැපයුම් ආශ්‍රිත කටයුතු සිදු කිරීම සඳහා බෙදාහැරීමේ අංශය 3 හි මගින් සැපයුම් කළමණාකරණ පද්ධති මෘදුකාංග වැඩි දියුණු කර තිබේ. මෙම මෘදුකාංග මගින් සිදුකරනු ලබන පරිගණක මාර්ගගත ටෙන්ඩර් විවෘත කිරීමේ ක්‍රියාවලිය නිසා ටෙන්ඩර් විවෘත කිරීමේ කටයුතු සඳහා වැයවන කාලය අපතේ යාම් බොහෝ සේ අඩුකර ගැනීමට ඉවහල් වී තිබේ. ත.ඇ.ක. හි සිදුවන ප්‍රමාදයන් අඩු කරලීම සඳහා සෑම ටෙන්ඩරයක්ම අඛණ්ඩව අධීක්ෂණය කරන ලද අතර සක්‍රියව ඉදිරියටත් සිදුකරගෙන යනු ලැබීය. ත.ඇ.ක. හි ප්‍රමාදයන් හඳුනා ගැනීම සඳහා සිහිකැඳවීම් ඉබේ ඇති කිරීමට මෙම මෘදුකාංගය තවදුරටත් වැඩිදියුණු කරනු ලැබීය.

මානව සම්පත් කළමණාකරණය

ප්‍රියමනාප සහ කාර්යක්ෂම සේවා පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මානව සම්පත් ඒකකය මගින් සියළු සේවකයින්ට උපකාරක සේවාවක් සපයනු ලැබේ. 2011 වර්ෂය අවසාන වන විට අංශයේ සිටි මුළු සේවක සංඛ්‍යාව 2,492 කි. කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන සෑම අවස්ථාවකම, අත්‍යවශ්‍ය සේවාවන් පිටතින් ලබා ගනු ලැබීය. බෙදාහැරීමේ අංශය 3 හි සැලසුම් සහ සංවර්ධන ශාඛාව මගින් වැඩි දියුණු කරන ලද මානව සම්පත් තොරතුරු පද්ධතිය විසින් ඒකකයේ දෛනික කටයුතු බොහාමයක් ස්වයංක්‍රීයව සිදුකරනු ලබන අතර එමගින් ඒකකයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරනු ලැබීය. මෙම අංශයේ සේවක ව්‍යාප්තිය පහත දැක්වේ.

කාර්ය මණ්ඩල ව්‍යාප්තිය - එකතුව = 2,492



කාර්ය මණ්ඩල ව්‍යාප්තිය 2011 : බෙදාහැරීමේ අංශය 3

තොරතුරු තාක්ෂණ සංවර්ධනය

බෙදාහැරීමේ අංශය 3 හි තොරතුරු තාක්ෂණ ඒකකය මගින් මෘදුකාංග යාවත්කාලීන කිරීම, නව අංග එකතු කිරීම, නඩත්තු කිරීම සහ අනෙකුත් උපකාර සහාය සැපයේ. 2011 වර්ෂයේදී නව සේවා සම්බන්ධතා ක්‍රමවේද ඇතුලත් කිරීම සඳහා සේ.ඇ.ප. මෘදුකාංග සංශෝධනය කළ යුතු වේ.

බෙදාහැරීමේ අංශය 3

2011 වර්ෂය තුළදී වත්කම් කළමණාකරණ මෘදුකාංග සංවර්ධනය සම්පූර්ණ කළ යුතුයි. මෘදුකාංගයේ ආරම්භක සංස්කරණය හඳුන්වා දීම සඳහා එක් වැඩමුළුවක් පවත්වන ලදි. විශේෂයෙන්ම තරාපැවි චලනය අනුක්‍රමික අංක අනුව සිදු කෙරේ. එබැවින් ඒවා MITFIN වැනි ගැටළු හඳුනා ගන්නා වෙනත් මෘදුකාංග වලට සම්බන්ධ කර තිබේ. තවද, වාහන, කාර්යාලයීය දැව භාණ්ඩ, කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය ආදී වත්කම් හැසිරවීම සඳහා පරිගණක මෘදුකාංගයක් සංවර්ධණය කිරීම 2011 වසර අවසානයේ ආරම්භ විය. එය 2012 වසරේ පළමු කාර්තුවේදී අවසන් කර ක්‍රියාත්මක කෙරෙනු ඇත.

සැලසුම් සහ සංවර්ධන ශාඛාවේ තොරතුරු තාක්ෂණ ඒකකය මගින් පහත මෘදුකාංග වැඩි දියුණු කර තිබේ.

- SMCDBMS : පා.සේ.ම. හි සියළුම ක්‍රියාකාරකම් සඳහා වන සේවා රැහැන් දත්ත කළමණාකරණය
- CCDMS : පළාත් මට්ටමේ ක්‍රියාකාරකම් සඳහා වන වාණිජ හා ඉදි කිරීම් දත්ත කළමණාකරණ මෘදුකාංගය'
- HRMS: කටයුතු සඳහා වන මානව සම්පත් දත්ත කළමණාකරණ මෘදුකාංගය
- ESRLFS : විදුලිබල සැපයුම් නිරවද්‍යතා මට්ටම් සහ ප්‍රමාද දෝෂ අධීක්ෂණ පද්ධතිය
- AMS: වත්කම් කළමණාකරණ පද්ධතිය
- PDMS: සැපයුම් දත්ත කළමණාකරණ පද්ධතිය
- OAIMS: කාර්යාලයීය වත්කම් සහ ඉන්වෙන්ට්රි කළමණාකරණ පද්ධතිය

බෙදාහැරීමේ අංශය 3 හි විවිධ ශාඛාවන්හි සිදු කරන ක්‍රියාකාරකම් පරිගණකගත කිරීම සඳහා මෙම අංශයේ සැලසුම් හා සංවර්ධන ශාඛාව මගින් පහත මෘදුකාංග වැඩි දියුණු කර තිබේ. බ්‍රිතාන්‍ය පරිගණක සමාජය මගින් කරන ලද ජාතික මට්ටමේ හොඳම තත්ත්ව මෘදුකාංග සම්මාන සඳහා තරඟ කර කුසලතා පදක්කම් දෙකක් දිනාගෙන ඇත.

කාර්ය මණ්ඩල සුභසාධනය

වඩා හොඳ පරිසරයක් නිර්මාණය කිරීමටත්, අංශයේ කණ්ඩායම් ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමටත්, සේවකයින්ගේ යහපත උදෙසාත්, බොහෝ ක්‍රියාකාරකම් සංවිධානය කරනු ලැබීය. ඒවා අතර පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ ක්‍රීඩා පිටියේදී පවත්වන ලද වාර්ෂික ක්‍රීඩා උත්සවය හා සුහද හමුවද දකුණු පළාතේ බොහෝ ස්ථාන ආවරණය කරමින් ගිය වාර්ෂික විනෝද සවාරියද විශේෂයෙන් සඳහන් කළ යුතුය. රුධිර සාම්පල අවශ්‍යතාවය ඇති රෝගීන් ගේ දිවි ගලවා ගැනීමේ අරමුණින් බෙදාහැරීමේ අංශය 3 හි බ.ප.ද. 2 මගින් ලේදන් දීමේ වැඩසටහනක් සංවිධානය කර තිබුණි. තවද, අන් අයගේ පිළිසරණ අවශ්‍ය කරන වැඩිහිටි ජනතාවට මූල්‍යමය ආධාර ලබා දීමේ වැඩසටහනක් 2011 වර්ෂයේදී සංවිධානය කරනු ලැබීය. ඒ සඳහා බෙදාහැරීමේ අංශය 3 හි මූලස්ථාන ගොඩනැගිල්ලේ පවත්වන ලද වැඩසටහනට 150 දෙනෙකු පමණ සහභාගි විය.

වාර්ෂික ක්‍රීඩා උළෙල හා සුහද හමුව, 2011,පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය ක්‍රීඩා පිටිය

බෙදාහැරීමේ අංශය 4

සේවා ප්‍රදේශය

බෙදාහැරීමේ අංශය 4 හි මෙහෙයුම් ප්‍රදේශය මගින් බස්නාහිර පළාතේ කොටසක්ද (බස්නාහිර පළාත දකුණ I), සමස්ථ දකුණු පළාතද, සබරග මුව හා ඌව පලාත්වල කොටස්ද, ආවරණය කෙරේ. බස්නාහිර පලාත දකුණ I මගින් රත්මලාන, කළුතර, දෙහිවල යන ප්‍රදේශ ආවරණය කෙරේ. බෙදාහැරීමේ ජාලය දෙහිවල සිට කතරගම දක්වා විහිදේ.



බෙදාහැරීමේ අංශ 4 : සීමා

2011 වසරේ උද්දීපනය

වසර තුල අංශයේ විකුණුම් ඒකක	ගි.වො.පැ.	1,269
විකුණන බද විදුලිය මඟින් ඉපයූ ආදායම	රු. මිලියන	16,267
සාමාන්‍ය විකුණුම් මිල	රු./කි.වො.පැ.	12.81
බෙදාහැරීම් පාඩුව	%	12.0%
ලැබීම් (අවසන් කල ගිණුම් සහ වීදි පහන් හැර)	මාසය	0.89
ලැබීම්වල තත්වය (අවසන් කල ගිණුම් සමඟ)	මාසය	2.13

වර්ෂය අවසන් වන විට අංශය තුල සිල්ලර පාරිභෝගිකයින්	සංඛ්‍යාව	846,007
වර්ෂය අවසන් වන විට අංශය තුල තොග පාරිභෝගිකයින්	සංඛ්‍යාව	1,192
වර්ෂය තුල සපයන ලද නව සම්බන්ධතා	සංඛ්‍යාව	32,112
වර්ෂය අවසන් වන විට සේවකයින්	සංඛ්‍යාව	2,031
සාමාන්‍ය ආදායම	රු./මාසය/ පාරිභෝගිකයින්	1,600
වසර අවසානයේදී සේවකයෙකුට සිටින සාමාන්‍ය පාරිභෝගිකයින් සංඛ්‍යාව	සංඛ්‍යාව/ සේවක	417
බෙදාහැරීම් උපපොලකට සිටින සාමාන්‍ය පාරිභෝගික සංඛ්‍යාව	සංඛ්‍යාව/ උප පොල	214
සේවකයෙකුට ඇති සාමාන්‍ය අඩු වෝල්ටියතා රැහැන් දුර ප්‍රමාණය	කි.මී./ සේවක	10.76
පාරිභෝගිකයෙකුට ඇති සාමාන්‍ය අඩු වෝල්ටියතා රැහැන් දුර ප්‍රමාණය	කි.මී./ පාරිභෝගික	0.026
බෙදාහැරීම් උපපොලට ඇති සාමාන්‍ය මධ්‍යම වෝල්ටියතා රැහැන් දුර ප්‍රමාණය	කි.මී./ උප පොල	1.18

මෙම අංශය තුල මුළු ජනගහනය මිලියන 4.06 ක් පමණ වේ. අංශයේ උපරිම විදුලිබල සැපයුම් මට්ටම වන 99.06% බස්නාහිර පලාත දකුණ I වාර්තා වන අතර අඩුම ප්‍රතිශතය වන 97% දකුණු පලාතෙන් වාර්තා වේ. රත්මලාන ගුවන් තොටුපල, රත්මලාන වෙළඳ කළාපය, කොග්ගල වෙළඳ කලාපය, හම්බන්තොට වරාය හා බොහෝ ප්‍රසිද්ධ වෙරලබඩ නිවාඩු නිකේතන ආදිය භූගෝලීය වශයෙන් මෙම කලාපයේ පිහිටා ඇත.

මෙම අංශයේ පාරිභෝගිකයෙකු සඳහා වන විදුලිය පරිභෝජනය ඒකක 1,498 කි. ඒකක 2,213 ක් වන පාරිභෝගිකයෙකුට වන ඉහළම වාර්ෂික විදුලිය පරිභෝජනය බස්නාහිර පළාත දකුණ I වාර්තා වන අතර පාරිභෝගිකයෙකු සඳහා වන අඩුම වාර්ෂික විදුලි පරිභෝජනය වන ඒකක 1,231 දකුණු පළාතෙන් වාර්තා වේ.



බලශක්ති විකුණුම් : බෙදාහැරීමේ අංශය 4

බෙදාහැරීමේ අංශය 4



අයකුම අනුව විකුණුම් : බෙදාහැරීමේ අංශය 4



පලාත අනුව ආදායම : බෙදාහැරීමේ අංශය 4



පලාත අනුව විකුණුම් : බෙදාහැරීමේ අංශය 4



සාමාන්‍ය විකුණුම් මිල : බෙදාහැරීමේ අංශය 4



ආදායම් ප්‍රතිශතය : බෙදාහැරීමේ අංශය 4



අයකුම අනුව පාරිභෝගික ගිණුම් : බෙදාහැරීමේ අංශය 4



අයකුම අනුව ආදායම : බෙදාහැරීමේ අංශය 4



පලාත් අනුව පාරිභෝගික ගිණුම් : බෙදාහැරීමේ අංශය 4

බෙදාහැරීමේ අංශය 4

මෙහෙයුම් ව්‍යුහය

ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීමේ අංශය 4 හි ප්‍රධානියා ලෙස අතිරේක සාමාන්‍යාධිකාරිවරයෙකු පත්කර ඇති අතර ඔහු සාමාන්‍යාධිකාරිවරයාට සෘජුවම වගකිව යුතු වේ. මෙහෙයුම් කටයුතු සඳහා මෙම අංශය පළාත් දෙකකට එනම් දකුණු පළාත හා බස්නාහිර පළාත දකුණ I ලෙස වෙන්කර ඇත. එම පළාත් පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්ගේ ප්‍රධානත්වයෙන් පාලනය කෙරේ. එක් එක් පළාත් ප්‍රාදේශීය ප්‍රධාන විදුලි ඉංජිනේරුවරුන් හෝ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවරුන් මගින් පරිපාලනය වන පරිදි උප ප්‍රදේශවලට වෙන්කර ඇත. සක්‍රිය ක්‍රියාකාරිත්වය සඳහා මෙම අංශය තුළ ප්‍රාදේශීය කාර්යාල 09 ක්ද පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 36 ක්ද ඇත.

දෙහිවල, කළුතර සහ රත්මලාන යන ප්‍රදේශවලින් බස්නාහිර පළාත දකුණ I සමන්විත වන අතර අම්බලන්ගොඩ, ගාල්ල, හම්බන්තොට, මාතර, තංගල්ල සහ වැලිගම වන ප්‍රදේශවලින් දකුණු පළාත සමන්විත වේ.

	බස්නාහිර පළාත දකුණ 1	දකුණු පළාත
භූමි ප්‍රමාණය	1,230	5,640
ජනගහනය මිලියන	1.46	2.6
නිවාස සංඛ්‍යාව	430,890	634,118
විදුලි සැපයුම් මට්ටම	99.06%	97%

පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්ට අමතරව අංශයේ ව්‍යාපෘති සහ අධිසැර නඩත්තු, සැලසුම් සහ සංවර්ධන, වාණිජ සහ ආයතනික ශාඛාවන් භාරව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් තිදෙනෙකු සිටී.

ව්‍යාපෘති සහ අධිසැර නඩත්තු ශාඛාව අංශයේ ඉදි කිරීම් කටයුතු, සවි කිරීම්, ප්‍රාථමික උප පොළ නඩත්තුව, කි.වෝ.33 බෙදා හැරීමේ ජාලයේ කි.වෝ.33 කුළුණු රැහැන්, අටළු අංගන සහ අනෙකුත් ආශ්‍රිත උපකරණ නඩත්තුව භාරව සිටී. අංශයේ ප්‍රධාන මිලදී ගැනීම් සඳහා ජාත්‍යන්තරව හා දේශීයව තරඟකාරී ලංසු කැඳවීමේ කටයුතු ව්‍යාපෘති හා අධිසැර නඩත්තු අංශය මගින් සිදු කරනු ලබයි.

සැලසුම් හා සංවර්ධන ශාඛාව මගින් නිරවද්‍යතාවය, මධ්‍යම වෝල්ටීයතා බෙදා හැරීමේ ජාල සංවර්ධනය සහ ජනන ආශ්‍රිත කටයුතු පිලිබඳ ගැටළු හඳුන්වා දේ.

වාණිජ හා ආයතන ශාඛාව මගින් මෙම අංශයේ වාණිජ ප්‍රතිපත්ති අධිසැර සැපයුම් සහ තොරතුරු කලමණාකරණය පිලිබඳ සොයා බැලේ. මානව සම්පත් කටයුතු පිළිබඳ සොයා බැලීමට සෑම පළාතක් සඳහාම මානව සම්පත් නිලධාරියෙකු පත්කර සිටී.

බෙදාහැරීමේ අංශය 4 හි පලාත් කාර්යාලවල මානව සම්පත් කටයුතු සම්න්ධීකරණය විධායක නිලධාරින්ගේ මානව සම්පත් කටයුතු මෙහෙයවීම වාණිජ හා ආයතන මගින් සිදු කරනු ලබයි.

බෙදාහැරීමේ අංශය 4 හි කාර්යාලයේ මූල්‍ය ශාඛාව මගින් පලාත් මගින් සිදුකරනු ලබන මූල්‍ය හා ආදායම් කටයුතු අධීක්ෂණය කෙරේ.

ප්‍රධාන අරමුණු

අංශයේ ප්‍රධාන අරමුණු වනුයේ

- වෝල්ටීයතා තත්ත්වය හොඳ තත්තත්වයේ පවත්වා ගනිමින් අංශය තුල පාරිභෝගිකයන්ට විශ්වසනීය විදුලිය සැපයුමක් ඇති කිරීම.
- මුළු වියදම වෙනුවෙන් සැලසුම් කරන ද අතිරික්ත ආදායම ලබා ගැනීම.
- අනාගත පාරිභෝගිකයන් සඳහා නව සම්බන්ධතා ලබා දීම.
- අංශය තුල විදුලිය බෙදාහැරීමේ පද්ධතියේ න්‍යායානුකූල සංවර්ධනය ඇති කිරීම.

බෙදාහැරීම් යටිතල පහසුකම්		
කි.වො.33 බෙදාහැරීමේ රැහැන්	කි.මී.	4,370
කි.වො.11 බෙදාහැරීමේ රැහැන්	කි.මී.	275
කි.වො.33/11 ප්‍රාථමික උප පොල	සංඛ්‍යාව	33
අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ රැහැන්	කි.මී.	21,852
අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ උප පොල	සංඛ්‍යාව	3,946
සේවා සම්බන්ධතා (මහා පරිමාණ සැපයුම් ඇතුළු)	සංඛ්‍යාව	847,199

පාරිභෝගික සත්කාරය

පාරිභෝගික ස්ථානයන්හි සේවාවන් වැඩි දියුණු කිරීමට විශේෂ ප්‍රයන්ත ගනු ලැබීය. ප්‍රාදේශීය කාර්යාල 9 ට පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 36 ට විකුණුම් ස්ථාන කවුළු පාරිභෝගික අලෙවි මධ්‍යස්ථාන 86 ට සහ බෙදා හැරීමේ පාලන/කැඳවුම් මධ්‍යස්ථාන දෙකට අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය විසින් වසර තුලදී පාරිභෝගිකයින් සඳහා වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා විශේෂ උත්සාහයක් ගනු ලැබීය. බද්දේගම ප්‍රදේශයේ ජනතාවට වඩා කාර්යක්ෂමව සේවා සැපයීම සඳහා එම ප්‍රදේශයේ නව උප පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් විවෘත කෙරිණ.

ලං.වි.ම. ඉතිහාසයේ ප්‍රථම ජංගම සේවාව 2011 ජනවාරි මසදී කළුතර දී සාර්ථකව පවත්වනු ලැබීය බස්නාහිර පලාත දකුණ I හි විදුලි පුරවර නගරය 2011 ඔක්තෝම්බර් සිට ක්‍රියාත්මක කරනු ලැබීය.

කළුතර ජංගම සේවාව

ශක්ති අලෙවිය

දිවයිනේ විදුලි අලෙවියෙන් 13% ක ගිණුම් බෙදාහැරීමේ අංශය 4 හි මගින් නඩත්තු කෙරේ. 2011 වසර තුලදී මෙම අංශය තුල විදුලිය ගි.වො.පැ.1269 ක් අලෙවි කරනු ලැබීය. සම්ප්‍රේෂණ අංශයට ලං.වි.පු.ස. ගිනුම් පරිවර්තනය කිරීමත් සමග 2010 වසර ට අනුව 2011 වසරේදී

බෙදාහැරීමේ අංශය 4

බෙදාහැරීමේ අංශය 4 තුල වූයේ මුළු අලෙවි ප්‍රමාණය පහත වැටී තිබේ. 4 අංශයේ ඉහලම අලෙවිය ගෘහස්ථ අයක්‍රම යටතේ අලෙවි කරනු ලබන අතර අංශයේ මුළු අලෙවියෙන් ආසන්න වශයෙන් 48% ක් වේ. බෙදාහැරීමේ අංශය 4 හි බෙදාහැර ඇති මුළු ජනන ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් 60% ප්‍රතිශතයක් දකුණු පලාත මගින් පරිභෝජනය කරනු ලබයි.

ආදායම

2011 වර්ෂයේදී විදුලි අලෙවියෙන් ලද ආදායම රු.මිලියන 16,267 ක් වූ අතර එය පෙර වර්ෂයේදී ආදායමට වඩා 22.56% ක් අඩු අගයක් විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ 2011 වර්ෂයේදී ලං.වි.පු.ස. ගිනුම් සම්ප්‍රේෂණ අංශයට ඇතුළත් කිරීමයි. මුළු ආදායමෙන් 12% ක් බෙදාහැරීමේ අංශය 4 හි ආදායමෙන් වැඩිම කොටස ගෘහස්ථ අයක්‍රම ගණයට අයත් විය. මුළු ආදායමෙන් 12% ක් දකුණු පලාතට අයත් වේ. අංශයේ සාමාන්‍ය විකුණුම් මිල කි.වො.පැ.ට12.81 ක් වන අතර එය ජාතික සාමාන්‍ය අගය වන කි.වො.පැ.ට.රු.13.21 කට අඩු අගයක් වේ. වසර 2011 අවසාන වන විට අංශයේ තොග සැපයුම් පාරිභෝගිකයන්ගේ හා සාමාන්‍ය සැපයුම් පාරිභෝගිකයන්ගේ ලැබුම් ත්තත්වය (නිරවුල් කර අවසන් කළ ගිණුම්) පිළිවෙලින් මාස 3.92 ක් සහ මාස 0.99 ක් විය. 2011 වර්ෂයේදී විකුණුම් ප්‍රතිශතය ට අනුව රැස් කිරීම් 100.1% ක් විය.

විදුලිය පරිභෝජන ගිණුම් සහ නව සේවා සම්බන්ධතා

2011 වර්ෂය අවසානය වන විට බෙදාහැරීමේ අංශය 4 හි පරිභෝජන ගිණුම් 847,199 ක් විය. එම පරිභෝජන ගිණුම් අතරින් බහුතරය ගෘහස්ථ ගණයේ විය. සමාලෝචනය කරනු ලබන වර්ෂය තුළදී නව සම්බන්ධතා 32,112 ක් සපයනු ලැබීය.

නිරවද්‍යතාවය

2011 වර්ෂයේදී දිග කි.මී.100 රැහැනකට මසකදී සිටිවන අලාභ හානි සංඛ්‍යාව මධ්‍යම වෝල්ටීයතා රැහැන් සඳහා 14 ක් වන ලෙසද අඩු වෝල්ටීයතා රැහැන් සඳහා 17 ක් වන ලෙසද පවත්වා ගෙන තිබේ.

විදුලිය බෙදාහැරීමේ පද්ධතිය සංවර්ධනය කිරීම.

2012 වර්ෂයේදී සැමට විදුලිය සැපයීමේ රජයේ දැක්ම මුදුන්පමුණුවා ගැනීම සඳහා ග්‍රාමීය විදුලි සැපයුම් වැඩ සටහන් කඩිනම් කරනු ලැබීය. 2011 වර්ෂයේදී සිදුකරන ලද හා අවසන් කරන ලද ග්‍රාමීය විදුලි සැපයුම් යෝජනා ක්‍රම සහ අනෙකුත් ඉදි කිරීම් කටයුතු පිළිබඳ විස්තර පහත දැක්වේ.

කාර්යය	වැඩ ප්‍රමාණය			
	අධි සැර (කි.මී.)	උප පොල (සංඛ්‍යාව)	අඩුසැර (කි.මී.)	රැහැන් පරි. (කි.මී.)
විමධ්‍යගත අයවැය පළාත් සභා අයවැය	9.5	6	39.3	13.4
ගෙවා ඇති මිල සහ තොග සැපයුම්	17.9	63	1.3	-
ගම නැගුම	-	-	26.4	4.0
දේපල සංවර්ධනය	1.2	3	25.5	0.6
පද්ධති විශාලනය	48.0	30	53.7	194.7
ඉරානය	55.9	44	180.1	15.7
ස්වීඩන අන්තර්ජාතික සංවර්ධන නියෝජිත ආයතනය	47.5	12	69.7	2.2
ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම(ගාල්ල-මාතර)	-	-	49.3	13.1
ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම(හම්බන්තොට ව්‍යාපෘතිය)	10.1	8	93.0	-
ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම(කළුතර ව්‍යාපෘතිය)	4.1	2	43.4	2.8
වෙනත්	-	-	0.2	-
මුළු ගණන	**194.2**	**168**	**581.7**	**246.4**

2011 වසරේ අවධානයට ලක් වූ කරුණු

2011 වසරේදී පහත දැක්වෙන ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කෙරින.

- රු.මිලියන 50 ක මුළු පිරිවැයක් දරා කි.වො.33 ලින්ස් D/C කුලුණු රැහැන් පද්ධතිය ඉදි කිරීම.
- රු.මිලියන 50 ක මුළු පිරිවැයක් දරා දකුණු පළාතේ යෝජිත අධිවේගී මහා මාර්ගය අවසාන කුළුණ ඉදි කිරීම.
- 2011 නොවැම්බර් සුළි කුණාටුවෙන් පසුව රු.මිලියන 2 ක මුළු පිරිවැයක් දරා දකුණු පළාතේ කි.වෝ.33 කුළුණු රැහැන් පද්ධතියක් ඉදි කිරීම.
- රු.මිලියන 30 ක මුළු පිරිවැයක් දරා දකුණු පළාතේ කි.මී.75 ක දිගකින් යුතු දැනට පවත්නා කි.වෝ.33 කුළුණු රැහැන් අතරින් තෝරාගත් ඒවා පුනුරුත්ථාපනය කිරීම.
- කි.මී.140 ක පමණ දිග කි.වෝ.33 කුළුණු රැහැන් සඳහා අධිසැර රැහැන් නඩත්තු කිරීම.
- රු.මිලියන 16 ක මුළු පිරිවැයක් දරා තෙල්ලැල්ල හා යාල යන ප්‍රදේශවලට පිළිවෙලින් නව 2 මෙ.වො.ඇ., 33/11 කි.වො. ප්‍රා.උ.පො. හා IMVA, 33/11කි.වො. ප්‍රා.උ.පො. ඉදි කිරීම.
- රු.මිලියන 90 ක මුළු පිරිවැයක් දරා ගුල්ටර්න්හි හා බොරලැස්ග මුව ප්‍රා.උ.පො. නැවත සකස් කිරීම. (2012 වසරේදීත් අඛණ්ඩව සිදුකෙරෙන ලෙස)
- රු.මිලියන 15 ක මුළු පිරිවැයක් දරා පානදුර ප්‍රා.උ.පො. හි 33 කි.වො. සහ 11 කි.වො. ස්විච්පන්න ස්ථාන වෙනස් කිරීම.
- රු.මිලියන 18 ක මුළු පිරිවැයක් දරා ස්වයංක්‍රීය ආවරණ සවි කිරීම සහ තරාපැව් මීටර් සවි කිරීම.
- මිනිස්බල ප්‍රා.උ.පො. 20 ක් සහ මිනිස්බල සහිත ප්‍රා.උ.පො. 13 ක් අඛණ්ඩව නඩත්තු කිරීම.
- 33 කි.වො. ස්විච්ජිපන්න ග්‍රන්ටීස් 26 ක් සහ 33 කි.වො. ස්වයංක්‍රීය ප්‍රතිවැසුම් 56 ක් 33 කි.වො. LBSS 127 ක් සහ වහරු තරාපැව් 38 ක් ආඛණ්ඩව නඩත්තු කිරීම.

ඉහත ජාල සංවර්ධන ව්‍යාපෘතිවලට අමතරව දකුණු පලාතේ විශේෂයෙන්ම හම්බන්තොට ප්‍රදේශයේ මහා මාර්ග පළල් කිරීමේ ව්‍යාපෘති රැහැන් මාරු කිරීම ආරම්භ කර ඇති අතර දක්ෂිණ දුම්රිය මාර්ග ව්‍යාපෘතියද ආරම්භ කර ඇත.

බෙදාහැරීමේ අංශය 4

සැලසුම් සහ සංවර්ධනය

2013 - 2022 පරිච්චේදය සඳහා මධ්‍යම වෝල්ටීයතා බෙදාහැරීමේ ජාල සැලැස්ම සංවර්ධනය කිරීම ආරම්භ කර ඇත. වැඩිවන විදුලිබල ඉල්ලුම සැලකිල්ලට ගනිමින් සහ හම්බන්තොට බරුටන්කන්ද ප්‍රදේශ සඳහා යෝජිත මෙ.වො.30 සූර්ය බලශක්ති බලාගාරය සැලකිල්ලට ගනිමින් හම්බන්තොට ජාලක උප පොල විශාලනය කිරීමේ යෝජනාව සමාලෝචනය කරනු ලැබීය. සැපයුම් නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම සඳහා බෙදාහැරීමේ ඔස්සේ ඇති ජාලක උප පොල හා ස්වයංක්‍රීය ආවරණ අතර ආරක්ෂණ සමායෝජනය පිළිබඳ අධ්‍යනය කිරීම ආරම්භ කර ඇත.

බෙදා හැරීමේදී සිදුවන හානිය අඩු කිරීම.

පළාත තුළ සිදුවන බෙදාහැරීමේ පද්ධති හානි හඳුනා ගැනීමට හා අඩු කිරීමට දකුණු පළාතේ ශක්ති කළමණාකරණය ඒකකයක් ස්ථාපනය කර තිබේ. (කාර්මික හා කාර්මික නොවන) මීටර පරික්ෂාව, මීටර ආදේශ කිරීම, තොග සැපයුම් මීටරවල දුරස්ථ කියවීම්, පළාත් සහ ප්‍රදේශ මායිම් මීටර සවි කිරීම සහ නඩත්තු කිරීම, බෙදා හැරීමේ තරාපැවි ජනන විගණනය ජනන කලමණාකරණ ඒකකය මගින් සිදු කළ යුතුය.

ජනන අරපිරිමැසුම්දායක උපකරණ පිළිබඳ දැනුම ලබා දීමටත් දෛනික කටයුතුවලදී ශක්තිය කාර්යක්ෂම ලෙස හා සඵලදායී ලෙස සංරක්ෂණය කිරීම පිළිබඳ පාසල් සිසුන්ට අධ්‍යාපනය ලබා දීමටත් තෝරාගත් පාසල්වල සංරක්ෂණ සම්මන්ත්‍රණ පවත්වනු ලැබීය.

මීටර සවි කිරීම

ප්‍රාදේශිය මණු පරීක්ෂණාගාරය මගින් 2011 වර්ෂය තුලදී පහත වැඩ සටහන් පවත්වනු ලැබීය.

- තොග සැපයුම් මීටර, දුරස්ථ කියවීම් මීටර බවට පරිවර්ථනය කිරීම.
- බස්නාහිර පළාත දකුණ 1 කොටසේ අවසන් කරනු ලැබීය.
- තොග සැපයුම් අඩු සැර හා අධි සැර මීටර 1300 අධික සංඛ්‍යාවක හා උප පොලවල්වල අන්තර් ප්‍රාදේශිත මායිම් වල සහ ප්‍රාථමික උප පොළවල බලශක්ති මීටර වල නිරවද්‍යතාවය පරික්ෂා කිරීම.
- නව අයක්‍රම වෙනස්වීම් සඳහා අවකාශ ලබා දීම සියළු තොග සැපයුම්, ප්‍රාථමික සහ අන්තර් ප්‍රාදේශික මායිම්වල ශක්ති මීටර නැවත සකස් කිරීම.
- මීටර සවි කිරීම හා ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු වැඩ සටහන්

අමුද්‍රව්‍ය සැපයීම

2011 වර්ෂය තුලදී කලාපීය සැපයුම් ඒකකය මගින් පහත ක්‍රියාකාරකම් සිදු කරනු ලැබීය.1:

- පළාත් මට්ටමින් සහ අනෙකුත් අංශ මට්ටමින් ඇති අමුද්‍රව්‍ය හා සේවා අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් වාර්ෂික සැපයුම් සැලසුම් සකස් කිරීම. මෙම සැලැස්ම සඳහා ඇස්තමේන්තු කල මුදල රු.මිලියන 1,425 කි.
- මාසික අමුද්‍රව්‍ය කළමණාකරණ සැලැස්ම සකස් කරන ලද අතර එක් එක් මාසයේදී ටෙන්ඩර් ආරම්භ කරනු ලැබීය. ප.ප්‍ර.ක., ම.ප්‍ර.ක., අ.ප්‍ර.ක. සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව ආදී විවිධ බලතල මට්ටම් වල ආරම්භ කරන ලද ටෙන්ඩර් සංඛ්‍යාව 81 කි.
- වර්ෂය සඳහා සැලසුම් කරන ලද අයිතම සැපයුම සඳහා අන්තර්ජාතික තරගකාරි ලංසු තැබීම්(ICB) සහ දේශීය තරගකාරි ලංසු තැබීම් (NCB) පවත්වනු ලැබීය.
- ක්‍රියාකාරිත්වය පරික්ෂා කරනු පිණිස විදේශීය අයිතම මෙන්ම දේශීය අයිතමයන් සඳහාද පිරික්සුම් කටයුතු සූදානම් කිරීම.
- සපයනු ලබන අයිතම පිළිබඳ දැනුවත් කිරීමට සහ හඳුන්වා දීමට පුහුණු , වැඩමුළු සහ සම්මන්ත්‍රණ ආදිය සංවිධානය කිරීම.

පරිගණකගත කිරීමේ ක්‍රියාකාරකම්

2011 වර්ෂයේද බෙදාහැරීම් අංශයේ 4 හි මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) හඳුන්වා දුන් අතර දත්ත සංචිතයට මූලික සේවක තොරතුරු ඇතුලත් කිරීම අවසන් කරනු ලැබීය. HRIS පද්ධතියට මොඩියුල 13 ක් ඇතුලත් වන අතර 2011 වර්ෂය අවසාන වන විට අංශයේ පළමුවන මොඩියුලය නිවාඩු මොඩියුලය හා අත්පොත් ක්‍රමය සමග එකම අවස්ථාවේ ආරම්භ කරනු ලැබීය.

ප්‍රාදේශීය කාර්යාල 3 ටම මාර්ගගත (On line) සම්බන්ධතා 2011 වර්ෂය තුළදී බස්නාහිර පළාත දකුණ 1 හි MITFIN මෘදුකාංගය අඛණ්ඩව භාවිතයට ගත් අතර දකුණු පළාත යටතේ ඇති ප්‍රාදේශීය කාර්යාල 6 ටම (On line) පහසුකම් සපයනු ලැබීය. මෙයට අමතරව තල්ගස්වල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය හැර කලාපයේ සියළුම පාරිභෝගික සේවා මධ්‍යස්ථානයන්ට (On line) ජාල පද්ධථි සම්බන්ධ කරනු ලැබීය 2011 වර්ෂයේදී MITFIN මෘදුකාංග භාවිතා කරමින් පාරිභෝගික සේවා මධ්‍යස්ථාන අනුව ගණනය කිරීම් කළුතර, මාතර, තංගල්ල ප්‍රදේශවල ආරම්භ කර තිබේ. කලාපය තුල පාරිභෝගික සේවා මධ්‍යස්ථාන අනුව ගනනය කිරීම් 2012 වර්ෂය තුළ අවසන් කිරීමට සැළසුම් කර තිබේ.

ඵලදායිතා වර්ධනය

2011 වර්ෂයේදී බෙදාහැරීමේ අංශය 4 හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයන්හි, ප්‍රාදේශීය කාර්යාලයන්හි හා පාරිභෝගික සේවා මධ්‍යස්ථානයන්හි එස් 5 සංකල්පය ක්‍රියාත්මක කරනු ලැබීය. ගාල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහයෝගය ඇතිව දකුණු පළාත මගින් එස් 5 සංකල්පය වැඩිදියුණු කිරීම උදෙසා ක්‍රියාකාරකම් සංවිධානය කරනු ලැබීය. 2011 වර්ෂයේදී ලං.වි.ම. මගින් පැවැත්වූ එස් 5 තරගයේදී කඹුරුපිටිය ප.සේ.ම. තෙවන ස්ථානය හිමිකරගත් ප්‍රධාන ඉංජිනේරු ශාඛාවට(ඉදි කිරීම්) සහ අගුණුකොලපැලැස්ස පාරිභෝගික සේවා මධ්‍යස්ථානයට කුසලතා සම්මාන දෙකක් හිමි විය.

ශ්‍රී ලංකාව ආලෝකමත්කිරීම - හම්බන්තොට ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කයන් 100% ක් ආලෝකමත් කිරීමේ අරමුණු කරගත් ප්‍රථම ග්‍රාමීය විදුලි සැපයුම් ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම හම්බන්තොට ව්‍යාපෘතිය යි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ විදුලිබල සැපයුමේ තත්ත්වය නිරවද්‍යතාව සහ සේවාව වැඩි දියුණු කරමින් නිවාස 30,000 කට විදුලිය සපයා 2011 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය අපේක්ෂිත ඉලක්කය කරා ලගා විය. ශ්‍රී ලංකා රජය මගින් රු. මිලියන 4,000ක් වූ ඊට අවශ්‍ය අරමුදල් සපයනු ලැබීය.

උප මධ්‍යස්ථාන 230 ක්, කි.මී.350 මධ්‍යම වෝල්ටීයතා රැහැන් කි.මී.108 ක් වන කි.වෝ.33 සීඝ්‍රගාමී ද්විත්ව පරිපථ කුළුණු රැහැන් පද්ධති කි.වෝ.33 අටළු අංගන 06 ක්, බෙලිඅත්ත ග්‍රිඩ් උප මධ්‍යස්ථානය සහ සම්ප්‍රේෂණ රැහැන් මෙම ව්‍යාපෘතිය යටතේ ඉදි කිරීමට නියමිතය.

බෙදාහැරීමේ අංශය 4

ව්‍යාපෘතියේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට අතිරේක විදුලිය බෙදා හැරීමේ ජාලය ඉදි කිරීමේ කටයුතු මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබයි. 2011 වන විට උප මධ්‍යස්ථාන 243 ක් ඉදි කිරීම කි.මී.238 මෙ.වො. රැහැන් පද්ධති සහ කි.මී.1,882 අඩු සැර රැහැන් ඉදි කිරීම සම්පූර්ණ කර තිබේ. දිස්ත්‍රික්කයේ වටිනා ශාඛ සුරකිනු වස් (පොදි බහන්)භාවිතා කරමින් අඩු වෝල්ටීයතා රැහැන් පද්ධති අතරින් 75% කට අධික ප්‍රමාණයක් ඉදිකර තිබේ.

දිස්ත්‍රික්කයේ ශාඛ, ශාඛ ප්‍රජාව සහ වන රක්ෂිත සුරැකීම පිණිස ග්‍රාමීය විදුලි සැපයුම් කටයුතු යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට කි.මී.5 ක් පමණ දිග බෙදා හැරීමේ ජාලයක් සඳහා පරිසර හිතකාමී අර්ධ පරිවාරක මධ්‍යම වෝල්ටීයතා රැහැන් භාවිතා කර තිබේ. මාර්ගයේ ඇති කොල අතු කපා දැමීම තහනම් කර ඇති භූමි භාගයන්හි ඉහත තාක්ෂණය යොදා ගැනීම සඳහා ග්‍රාමීය විදුලි ක්‍රියාකාරකම් ලං.වි.ම. මගින් ආරම්භ කර තිබේ.

කි.වො.33 කුළුණු රැහැන් පද්ධති සහ අටළු අංගන ඉදි කිරීම සිදු කෙරෙමින් පවතින අතර එය 2012 තුන්වන කාර්තුවේදී නිම කිරීමට යොදා ගෙන ඇත. අවශ්‍ය ප්‍රහුණුව සහිත PLC CAD නව මෘදුකාංගය භාවිතා කරමින් කි.වෝ. 33 කුළුණු රැහැන් පද්ධති නිර්මාණය කරන ලද අතර කුළුණු පද්ධතියේ වටිනාකම උපරිම අගයක් ගෙන තිබේ.

ඉඩම් අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම අවම කිරීමටත් හම්බන්තොට වරායට විදුලිය සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට කි.මී.4.5 ක් දිග පරිපථ කුළුණු හතරක් ඉදි කිරීම මගින් කි.වො. 33 කුළුණු රැහැන් පද්ධති සවිකර ඒවාට වැයවන අධික මිල අවම කර ගැනීමටත් තවත් සුවිශේෂී නව තාක්ෂණයක් යොදා ගන්නා ලදී.

ව්‍යාපෘතියේ බොහෝ ඉලක්ක සාක්ෂාත් කර ගෙන ඇති අතර 2012 වර්ෂය තුලදී කි.වෝ.33 කුළුණු රැහැන් පද්ධති සවි කිරීම සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබේ.

විදුලිබලය බෙදාහැරීමේ සංවර්ධන ව්‍යාපෘතිය - දෙහිවල

පහත ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කර තිබේ

- විදේශ අමුද්‍රව්‍ය හා උපකරණ සැපයීම

  සැපයුම්කරුගේ ණය කොන්දේසිවලට අනුව විදේශ අමුද්‍රව්‍ය හා උපකරණ වලද ටෙන්ඩර් පිළිබද වාණිජ ගිවිසුම කෙටුම්පතට නීතිපතිවරයාගේ නීතිමය අවසරය ලබා ගන්නා ලදි. එසේම ලංසුකරු සමග සාර්ථක ලෙස සම්බන්ධතා පවත්වමින් චීන EXIM බැංකුවේ තැන්පතු පහසුකම් හා සම්බන්ධ වෙන්කල රක්ෂණ පාරිතෝෂික අනුපාතය 6.55% සිට 4.55% දක්වා පහත හෙලනු ලැබීය.
- භූගත කේබල් ජාලයේ පළමු අධියර කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබද සවිස්තරාත්මක ක්ෂේත්‍ර සමීක්ෂණ.

  විස්තරාත්මක වැඩ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා දත්ත රැස් කිරීම අවසන් කර තිබේ. එසේම නැදිමාල කේබල් පාලම්සැලැස්ම (දිග 10.5 මීටර) SLLRDC අනුමැතිය ලබා ගන්නා ලදි.

ඉහත ප්‍රධාන ක්‍රියාකාරකම් වලට සමාන්තරව අඩු වෝල්ටියතා කි.වො.ආවරණ රහිත රැහැන් ඇහැසි පොදි බහන් රැහැන් බවට පරිවර්ථනය කිරීම සඳහා බෙදාහැරීමේ උප මධ්‍යස්ථාන යෝජනා ක්‍රම 50 ක ක්ෂේත්‍ර පරීක්ෂාවන් හා ඇස්තමේන්තු කිරීම් සහ ඉදි කිරීමේ කටයුතු පවත්නා අර්ය උප මධ්‍යස්ථාන ගොඩනැගිලි පළමු අදියර ක්ෂේත්‍ර වල මධ්‍යම වෝල්ටියතා හා අඩු වෝල්ටියතා උපකරණ හුවමාරු කිරීම ඇතුලත් ක්ෂේත්‍ර පිරිසිදු කිරීමේ කටයුතු සිදු කරනු ලැබීය.

ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම - ගාල්ල,මාතර ව්‍යාපෘති

ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම ගාල්ල,මාතර ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ගාල්ල,මාතර දිස්ත්‍රික්කයන්හි සියළු නිවාසවලට විදුලිබලය සඳහා ප්‍රවේශය ලබා දීමත් එම විදුලි සැපයුමේ තත්ත්වය හා නිරවද්‍යතාව වැඩි දියුණු කිරීමත්ය. 2012 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය අවසන් වීමට නියමිතය.

මානව සම්පත් - බෙදාහැරීමේ අංශය 4

වසර අවසානයේ කලාපයේ මුළු සේවක මණ්ඩලය 2,031 කි.



කාර්ය මණ්ඩල ප්‍රමාණයන් : බෙදාහැරීමේ අංශය 4

ඉහළ කොත්මලේ විදුලි බලාගාරයේ ඉදිකිරීම්

ව්‍යාපෘති අංශය

ව්‍යාපෘති අංශය

මෙ.වො.300 පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය

මෙ.වො.300 පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ පළමුවන අදියර යටතේ මෙ.වො.300 පළමු බලාගාරය ඉදි කිරීම් 2007 ජුලි මසදී ආරම්භ විය. පළමු අදියර සඳහා වැය වන මුළු මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 455 කි. මෙය ක්‍රියාත්මක කරන නියෝජිතායතනය ලංකා විදුලිබල මණ්ඩලයයි.

ව්‍යාපෘතිය නොරොච්චෝලෙහි පිහිටා ඇත. එනම් කල්පිටිය උප අර්ධද්වීපයේ දක්ෂිණ කෙලවර. එය කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බල ප්‍රදේශයට අයත් වේ. එම ව්‍යාපෘතිය හෙක්ටයාර 93 කින් සමන්විතය. සහනදායි ණය ක්‍රමයකට අනුව චීන රජයේ EXIM බැංකුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා පූර්ණ වශයෙන් අරමුදල් සපයනු ලැබේ. කොන්ත්‍රාත්තුවට අනුව 2012 ජනවාරි වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබුණි. මෙම බලාගාරය වාණිජ කටයුතු 2011 ජුලි මස සිට ක්‍රියාත්මක කිරීම ආරම්භ වූ අතර එමගින් දිනකට ගි.වො.පැ. 5 ක් පමණ ජනනය කෙරේ.

මෙම බලාගාරය සඳහා යොදා ගන්නා ඉන්ධන උසස් තත්ත්වයේ අඩු සල්ෆර් ප්‍රමාණයක් සහිත බිමුමත් ගල් අඟුරු වේ. පළමු අදියර සඳහා ඇස්තමේන්තුගත ගල් අඟුරු ප්‍රමාණය වර්ෂයකට මෙ.ටො.650,000 කි. කෙසේ වුවද අමතර ආරක්ෂාකාරි පියවරක් ලෙස විමෝචන වායු ප්‍රමිතීන් උල්ලංඝනය වීමේ අවදානම අවම කිරීමට 90% ක් සල්ෆර් ඩයොක්සයිඩ් අවශෝෂණය කර ගත හැකි වායු ඉන්ධන සල්ෆහරණ ඒකකයක් ඉදිකර තිබේ. ගල් අඟුරු දහනය වීමේ ප්‍රතිපලයක් ලෙස නිකුත් වන සුළඟේ විසිරෙන අළුවලින් 99.2 ක් ස්ථිති විද්‍යුත් අවක්ෂේපනය මගින් රඳවා ගනු ඇත. එබැවින් බලාගාරය අවට ශාඛ ප්‍රජාව විනාශ කරන සියළුම ආකාරයේ ද්‍රව්‍ය පිළිබඳ ගැටළු වලින් නිදහස් වී තිබේ.

පළමු අදියරේ අරමුණ පහත සඳහන් ප්‍රධාන කොටස් සතරකින් සමන්විත වේ.

බලාගාරය

වාෂ්ප ටර්බයිනයකින් ක්‍රියාත්මක වන මෙ.වො.300 ක ජනක යන්ත්‍රයකින් සහ බොයිලේරු, ගල් අඟුරු ප්‍රවාහක පටි කුඩුකරණ, කැබලි කරණ, ජල නිෂ්පාදක වැනි ආදිය ඇතුලත් ආශ්‍රිත යන්ත්‍ර සූත්‍ර සහ උපකරණවලින් බලාගාරය සමන්විත වේ.

ගල් අඟුරු මෙහෙයුම් උපකරණ

ගල් අඟුරු ගෙනියන බත්තල් දෙකකට (එකක් මෙ.ටො.5000 ක් වන) එකවර ඉඩකඩ සැලසිය හැකි මීටර් 500 ක් දිග ජැටියකින්/ආධාරක තට්ටුවකින්ද, පැයකට ගල් අඟුරු මෙ.ටො.650 ක් වන හිස් කල හැකි බර ඔසවන යන්ත්‍ර දෙකකින්ද, පැයකට මෙ.ටො.1500 බැගින් ගබඩා අංගනයට ගල් අඟුරු ගෙන යා හැකි වාහක පද්ධතියකින්ද, සාම්පල උපකරණයකින් හා මෙ.ටො.900 බලාගාරයට තෙමසක් සඳහා අවශ්‍ය ගල් අඟුරු මෙ.ටො.750,000 කට ගබඩා පහසුකම් සැලසිය හැකි ගල් අඟුරු ගබඩා අංගනයකින්ද ගල් අඟුරු මෙහෙයුම් උපකරණය සමන්විත වේ.

සම්ප්‍රේෂණ රැහැන් හා උප මධ්‍යස්ථානය

කි.මී.117 ක් දිග කි.වො.220 ක් ක්‍රියාත්මක කරවන පළමු අදියරේ සම්ප්‍රේෂණ රැහැන නොරොච්චෝලේ සිට වේයන්ගොඩ දක්වා වේ. මෙය ද්විත්ව සන්නායක ද්විත්ව සම්ප්‍රේෂණ රැහැනකි.

සේවක නිවාස සංකීර්ණය

ලං.වි.ම. කාර්ය මණ්ඩලය නිදන කාමර, පෞද්ගලික නිවාස, සමාජ ශාලාවකින් සහ අනෙකුත් සියලු පහසුකම්වලින් මෙය සමන්විත වේ.

පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය



පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය II අදියරේ ඉදි කිරීමේ කටයුතු

පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ දෙවන අදියර පළමුවන අදියර මෙ.වො. 2x300 ක ශක්ති ඉහළ නැංවීමකි. මෙම II අදියර

1. බලාගාර 1 ට සමාන වන සේ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සමග මෙ.වො.300 ක දෙවන බලාගාරය ඉදි කිරීම.
2. බලාගාර 1 ට සමාන වන සේ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සමග මෙ.වො.300 ක තෙවන බලාගාරය ඉදි කිරීම.
3. ගල් අඟුරු ගොඩ බෑමේ බර ඉසුලුම් යන්ත්‍ර දෙකක් ඉදිකිරීම.
4. හලාවත නව උප මධ්‍යස්ථානය ඉදි කිරීම.
5. කි.වෝ.220 ක සම්ප්‍රේෂණ රැහැන හා අනුරාධපුරය උප මධ්‍යස්ථානය ඉදිකිරීම යන ක්‍රියාකාරකම්වලින් සමන්විත වේ.

II අදියර සඳහා කොන්ත්‍රාත්තුව 2009 ජුනි මසදී අත්සන් තබනු ලැබීය. II අදියර සඳහා මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 891 කි. 2010 මැයි මසදී ආරම්භ වූ අතර 2013 මැද භාගයේ II අදියරේ පළමුවන කොටස ක්‍රියාත්මක වනු ඇති අතර දෙවන කොටස 2014 අප්‍රේල් මස අග භාගයේදී ආරම්භ වනු ඇත.

වාණිජ ණය ලබා ගන්නා I අදියරේ කොටස හැර ව්‍යාපෘතියේ අදියර දෙකටම සහනදායී ණය ක්‍රමයකට අනුව මහජන චීන රජයෙන් අරමුදල් සපයනු ලැබේ.

ව්‍යාපෘති අංශය

ඉහල කොත්මලේ සම්ප්‍රේෂණ රැහැන් ඉදි කිරීමේ වැඩකටයුතු

ඉහල කොත්මලේ ජල විදුලිබලාගාර ව්‍යාපෘතිය

ඉහළ කොත්මලේ වාන් දොරටු ඉදි කිරීමේ වැඩ කටයුතු

ස්ථාපිත ධාරිතාව	150 මෙ.වො.(75මෙ.වො.x ඒකක 2)
වාර්ෂික ශක්ති ප්‍රමාණය	409 ගි.වො.
විදේශ පිරිවැය (JICA ණය)	ජපන් යෙන් 37,817 මිලියන
දේශීය පිරිවැය (ලං.වි.ම. මගින්)	රු. 8,548 මිලියන

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ඉහළ කොත්මලේ ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය යනු ගි.වො.පැ.409 ක අපේක්ෂිත ශක්ති ප්‍රමාණයක් වාර්ෂිකව ජනනය කරන මෙ.වො.150 ස්ථාපිත ධාරිතාවක් සහිත ජලවිදුලි බලාගාරයක් ඉදිකිරීම මගින් ශ්‍රී ලංකාවේ ඉලක්කගත විදුලිබල ඉල්ලුම වැඩිවීමේ අවශ්‍යතාවට පිළියමක් සැපයීම ප්‍රධාන අරමුණ වන ගංගාශ්‍රිත ජලවිදුලි බලාගාර ව්‍යාපෘතියේ කොටසකි. පාරිසරික හා සාමාජීය ගැටළු සැලකිය යුතු ප්‍රමාණයක් අවම කරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් පහත කොටස් වලින් සමන්විත වේ.

- මීටර් 35.5 ක උසකින් හා මීටර් 180 ක් මුදුන් දිගකින් යුත් තලවකැලේ නගරය ආසන්නයේ පිහිටි වේල්ල සහ මීටර් 0.8 සක්‍රිය ධාරිතාවකින්ද මතුපිට ක්ෂේත්‍රය කි.මී.0.25 (අක්කර 60) ක්ද සහිතව සහ මීටර් 2.5 දල ධාරිතාවක් එයට ඇත. ජලාශයේ මුළු සැපයුම් මට්ටම මධ්‍ය මුහුදු මට්ටමට ඉහලින් මීටර් 1,194 ක් වනු ඇති අතර අවම ක්‍රියාකාරී මට්ටම මීටර් 1,190 කි. සාමාන්‍ය අවර දිය මට්ටම මුහුදු මට්ටමෙන් 703 ක් වනු ඇත.
- විශ්කම්බය මීටර 4.5/ මීටර 5.8 ක් වන පෙර ආර උමග පෝරු දමා ඇති කොටසකින්ද පෝරු නොදැමූ කොටසකින්ද යුක්ත වන අතර දිග කි.මී.12.89 ක් වන අතර වේල්ලේ සිට උතුරට පුන්දල් ඔය දක්වා ඊසාන දිශාවට එනම් දැනට පවත්නා කොත්මලේ වේල්ල හා ජලාශය දෙසට හැරීමට පෙර මෙය පුන්දල් ඔයට වැටේ.(ජලාශය හා බලාගාරය අතර උපරිම දල හිස මීටර 491 ක් වනු ඇත.)
- ප්‍රතිප්‍රවාහ පීඩන ටැංකිය මීටර 12 ක විශ්කම්භයකින්ද මීටර් 98 ක උසකින්ද පාලනය කළ විවරයකින්ද සමන්විත වන අතර බලාගාරයේ මුදුනේ පිහිටා ඇත.
- විශ්කම්භය මීටර් 4.5 ආරම්භ වී 1.45 දක්වා අඩු වන ලෙසට පිහිටි ඇලවූ භූගත දණ්ඩයකින් සොරොව්ව සෑදී තිබේ. එය දිගින් මීටර 793 ක් වනු ඇති අතර මීටර 745 ක එක් මං තීරුවකින්ද මීටර 48 ක මංතීරු දෙකකනිද් සමන්විත වනු ඇත.
- කි.වො. 77,000 ටර්බයින් ඒකක දෙකක්, කි.වො.ඇ. 88,000 සිරස් අක්ෂ තෙකලා ජනක යන්ත්‍ර දෙකක්, තෙකලා තරාපැවි දෙකක් සහ කි.වො. 220 වායු පරිවාරක ස්විච්පන්න (පරිවාරක වහරු උපපොළ) උප මධ්‍යස්ථානයක් සඳහා ඉඩකඩ සපයමින් මීටර 66.3 x මීටර් 18.8 පළල x මීටර් 36.5 ක් උස යන පරිමාණයන් සහිතව නියම්ගම්දොර ප්‍රදේශයේ භූගත බලාගාරයක් පිහිටා ඇත.(පුනා ඔය හා කොත්මලේ ඔය දෙමෝදරින් කි.මී. 2 ක් ප්‍රවාහයට ප්‍රතිවිරුද්ධ දිශාවට)
- බලාගාරය කි.වෝ. 220 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැන් පද්ධතිය හා සම්බන්ධ කිරීම සඳහා මීටර් 36.5 ක් පළල මීටර් 130 ක් දිග එළිමහන් වහරු අංගනයක්ද නියම්ගම්දොර ප්‍රදේශයේ පිහිටා ඇත.
- ජනනය වන විද්‍යුත් බලය දැනට පිහිටුවා ඇති කොත්මලේ උප මධ්‍යස්ථානයට සහ ආශ්‍රිත වහරු අංගන දිගුව හා සම්බන්ධ කිරීමට කි.මී. 11 ක් දිග කි.වො. 220 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැන් පද්ධතියක්

කළමණාකරණ කටයුතු පහසු කිරීම සඳහා ව්‍යාපෘති වැඩ කටයුතු කොටස් පහකට වෙන් කර ඇති අතර පහත පෙන්වා දී ඇති පරිදි කොන්ත්‍රාත්කරුවන් පස් දෙනෙකුට ප්‍රදානය කර තිබේ.

ව්‍යාපෘති අංශය

කොටස	කොන්ත්‍රාත්කරුගේ නම	ප්‍රදානය කළ දිනය	කොන්ත්‍රාත් කාලය	කොන්ත්‍රාත් වටිනාකම	
				ශ්‍රී.ලං.රු. මිලියන	ජපන් යෙන් මිලියන
උපදේශන සේවා	J - බලය	2003.11.15	මාස 96	661	2,017
1 කොටස - සූදානම් කිරීමේ වැඩ	මයිඩා සංස්ථාව	2005.07.27	මාස 33	6,328	697
2 කොටස - ප්‍රධාන සිවිල් වැඩ	මයිඩා නිෂිමට්සු JV	2006.12.06	මාස 54	5,609	7,726
3 කොටස - ජල කාර්මික උපකරණ	කුරිමොටෝ සමාගම	2007.11.29	මාස 42	569	1,994
4 කොටස - විදුලි කාර්මික උපකරණ	මිට්ෂුබිෂි සංස්ථාව	2008.06.20	මාස 36	585	7,973
5 කොටස - සම්ප්‍රේෂණ රැහැන්	කින්ඩෙන්	2009.10.06	මාස 22	576	853
				12,839	20,850

2011 දෙසැම්බර් මස අවසාන භාගය වන විට ව්‍යාපෘතිය භෞතික ප්‍රගතිය

අයිතමය	හැඳින්වීම	අවසන් කළ ප්‍රතිශතය
1 කොටස	සූදානම් කිරීමේ වැඩ	94
2 කොටස	ප්‍රධාන සිවිල් වැඩ	94
3 කොටස	ජල කාර්මික උපකරණ	99
4 කොටස	විදුලි කාර්මික උපකරණ	91
5 කොටස	සම්ප්‍රේෂණ රැහැන්	99
	ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය	**94%**

ආරම්භ කිරීමට බලාපොරොත්තු වන දිනය :2012 ජූනි

අරමුදල් සැපයීම

JICA ණය ජපන් යෙන් 37,817 මි.
CEM (හවුල්කරු) ශ්‍රී.ලං.රු. 8,548 මි.

ත්‍රිකුණාමලය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය මෙ.වො.500

ත්‍රිකුණාමලය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා ඒකාබද්ධ යෝජනා ගිවිසුම අත්සන් තැබීම.

50% ක සමාන කොටස් ඇති ලං.වි.ම. සහ ඉන්දියාවේ NTPC සමාගම හි ඒකාබද්ධ යෝජණා සමාගමක් මගින් සංවර්ධනය කර ක්‍රියාත්මක කරනු ලබන ත්‍රිකුණාමලයේ සාම්පූර්හි මෙ.වො.500ක බලාගාර ඉදි කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුකරනු ලබයි. ව්‍යාපෘති පිරිවැයෙන් 70% ක් ණය ලෙස ලබාගනු ඇත. ව්‍යාපෘතියේ මෙ.වො.500 පළමු අවස්ථාව 2016 වසරේදී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. පහත පරිදි ප්‍රධාන ක්ෂේත්‍ර 3 කින් ව්‍යාපෘතිය සමන්විත වේ.

බලාගාරය ක්‍රියාත්මක කරනු ලබන නියෝජිත ආයතනය

ත්‍රිකුණාමලය බලශක්ති සීමිත සමාගම (ලං.වි.ම. හා NTPC සමාගම අතර ඒකාබද්ධ යෝජනා)

ස්ථානය	:ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සාම්පූර්හි
බලාගාර ධාරිතාව	:මෙ.වො.500
බලාගාර පිරිවැය	:ආසන්න වශයෙන් ඇ.ඩො.මි.500
මූල්‍ය සැපයුම් ණය	:ජාත්‍යන්තර ආධාර සැපයුම්කරුවන්/බැඳුම්කර නිකුත් කිරීම. JVC මගින් තීරණ ගත යුතුය. කොටස්කරුවන්ගේ ශේෂ පත්‍ර හා ස්වාධීන.
ව්‍යාපාර වස්තු	:ලං.වි.ම. (ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සපයන) සහ NTPC මගින් ආසන්නන වශයෙන් ඇ.ඩො.මිලියන75 ක සමාන දායක මුදල් සපයනු ලැබේ.

සම්ප්‍රේෂණ රැහැන් පද්ධති හා උප මධ්‍යස්ථානය

ක්‍රියාත්මක කරනු ලබන නියෝජිත ආයතනය
ලංකා විදුලිබල මණ්ඩලය

රැහැන් මාර්ගය	:හබරණ හරහා සාම්පූර් සිට වේයන්ගොඩ දක්වා කි.වො. 220 ක්
රැහැන් දිග	:කි.මී. 248
රැහැන් පිරිවැය	:සාම්පූර් සිට හබරණ දක්වා ආසන්න වශයෙන් ඇ.ඩො.මි.55 හබරණ සිට වේයන්ගොඩ දක්වා ආසන්න වශයෙන් ඇ.ඩො.මි.140
මූල්‍ය සැපයුම	:බහුපාර්ශ්වික මූල්‍ය නියෝජිතායතනය

ව්‍යාපෘති අංශය

ගල් අඟුරු ගොඩබෑම සඳහා වරාය පහසුකම්

ක්‍රියාත්මක කිරීම

නියමිත නියෝජිත ආයතනය	: නිශ්චිත තීරණයක් ගෙන නොමැත.
ස්ථානය	: බලාගාර ක්ෂේත්‍රය අසළ කෝඩ්ඩියාර් බොක්ක
ධාරිතාව	: අවසාන අදියරේ වසරකට ගල් අඟුරු ටොන් මිලියන 9.2 ක් ගොඩබෑම සිදුකරනු ලැබීය.
පිරිවැය	: ජෙටිය ආසන්න වශයෙන් ඇ.ඩො.මි.80
ගොඩබෑමේ උපකරණ	: ආසන්න වශයෙන් ඇ.ඩො.මි.26
මූල්‍ය පහසුකම්	: නිශ්චිතව තීරණය කර නොමැත.

2011 සැප්.6 වන දින ලං.වි.ම. හා NTPC අතර ඒකාබද්ධ යෝජනා ගිවිසුම් අත්සන් කෙරුනු අතර ඉන් පසු 2011 සැප්.26 දින ඒකාබද්ධ යෝජනා සමාගම සංස්ථාගත කරනු ලැබීය. පිළිවෙලින් ත්‍රිකුණාමලය බලශක්ති සමාගම (TPCL) සහ අතරද, භාණ්ඩාගාරය හා ආයෝජන මණ්ඩලය(BOI) අතරද, බලශක්තිය මිලදී ගැනීමේ ගිවිසුම, ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම සහ ගිවිසුම අත්සන් කිරීම ශක්‍යතා අධ්‍යනයෙන් අනතුරුව අත්සන් කිරීමට නියමිතය.

NTPC හි අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් විසින් ශක්‍යතා අධ්‍යයන පිලිබඳ සිදුකරනු ලබන අතර 2012 පෙබරවාරි මසදී ශක්‍යතා වාර්තාව ලබාගත හැකි වනු ඇත. බලාගාරය පිළිබඳ EIA අධ්‍යයනය සිදුකෙරෙමින් පවතින අතර එහි වාර්තාව 2012 පෙබරවාරි මසදී භාර දීමට අපේක්ෂිතය. බලාගාරයේ ඉදි කිරීම් කටයුතු 2013 පෙබරවාරි මසදී ආරම්භ කිරීමට අපේක්ෂා කරන අතර එහි මුල් කොටසේ වාණිජ ක්‍රියාකාරකම් 2016 නොවැම්බර් මසදී ආරම්භ කිරීමට යෝජනා කර්මට අපේක්ෂිතය.

වේයන්ගොඩ සිට හබරණ දක්වා කි.වො. 220 සම්ප්‍රේෂණ රැහැන

ත්‍රිකුණාමලය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය :සම්ප්‍රේෂණ රැහැන් සමීක්ෂණය

හබරණ සිට වේයන්ගොඩ දක්වා කි.මී.150 දිග කි.වො. 220 සම්ප්‍රේෂණ රැහැන් ඉදි කිරීමට නියමිත අතර හබරණ නව ග්‍රිඩ් උප පොල ද වැඩිදියුණු කිරීමට නියමිතය. ඉහත සම්ප්‍රේෂණ රැහැන සඳහා වැය වන බිලියන 14 ක පමණ මුදල සඳහා JICA වෙතින් අරමුදල් ලබා ගැනීමට අපේක්ෂිතය.

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

උමා ඔය ප්‍රධාන වේල්ලේ ඉදිකිරීම

වැලිමඩ පුහුල්පොලද උමා ඔය හරහා කොන්ක්‍රීට් වේල්ල ඉදි කිරීම සහ දියරබ මහතොටිල්ල ඔය හරහා තවත් වේල්ලක් ඉදි කිරීමද ජල වාහක ව්‍යුහ, භූගත බලාගාරය, වහරු අංගනය සහ බදුල්ල ග්‍රිඩ් උප පොල හා සම්බන්ධ වන සම්ප්‍රේෂණ රැහැන යන ඒවා ඉදි කිරීම ව්‍යාපෘතියට අයත්ය.

ශ්‍රී ලංකාවේ ගිණිකොණ වියළි කලාපයේ ඉඩම්වල වාරි කටයුතු සඳහා යොදා ගන්නා දිගුකාලීන සාමාන්‍ය ජල ප්‍රමාණය අන්තර් නිම්නය කරා ගෙන යාමට මෙම ව්‍යාපෘතිය නිසා හැකි වනු ඇත. එසේම එමගින් මෙ.වො.120 ක ජල විදුලි බලයක් ද ජාතික ග්‍රිඩ් පද්ධතියට එක්වෙනු ඇත.

කොන්ක්‍රීට් වේලි දෙකකින් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ. ඉන් පලමුවැන්න පුහුල්පොල ප්‍රදේශය අසලදී උමා ඔය හරහා ඉදි කිරීමට නියමිතය පුහුල්පොල අසල වේල්ල මගින් නියාවනය කරනු ලබන ජලය අනතුරුව දීර්ඝ පෙර ආර උමග සහ සිරස් දණ්ඩ මගින් ජල භූගත බලාගාර වෙත සැපයෙන දියරබ මහතොටිල්ල ඔය හරහා පිහිටි තවත් වේල්ලක් හා සම්බන්ධ ජලාශයට සම්බන්ධ උමගක් මගින් ජලය සම්බන්ධ කර සපයනු ඇත. බලාගාර මගින් පිට කරනු ලබන දෑ අවර උමගක් මගින් කිරිඳි ඔයේ අතු ගංගාවක් මත අගිකොට ඔයට යොමු කරනු ඇත.

විදුලිබල හා බලශක්ති අමාත්‍යංශය හා සහයෝගය මත වාරිමාර්ග සහ ජල සම්පත් කලමණාකරණ අමාත්‍යංශය (MOIWM) මගින් කාරක නියෝජිත ආයතනය ලෙස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. EPC පදනම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා MOIWM හා ඉරාන ඉස්ලාමීය ජනරජයේ ෆරාබ් (Farab) බලශක්ති හා ජල ව්‍යාපෘතිය අතර 2008 පෙබරවාරි 28 වන දින කොන්ත්‍රාත්තුව අත්සන් තබනු ලැබීය. කොන්ත්‍රාත්තුවේ වටිනාකම ඇ.ඩො.මි.529 ක් වන අතර ඉන් 85% ඉරානයේ බාහිර සංවර්ධන බැංකුව මගින් සපයනු ඇත. ඉතිරි 15% ශ්‍රී ලංකා රජය මගින් දරනු ලබයි. කොන්ත්‍රාත්තුවට අනුකූලව EPC කොන්ත්‍රාත්කරු විසින් 2010 මාර්තු මස 15 වන දින ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළ අතර ජංගම වැඩ හා උමග තැනීමේ කටයුතු දැනට ව්‍යාපෘති ක්ෂේත්‍රයේ සිදුකෙරෙමින් පවතී. බලාගාරය 2015, මාර්තු මසදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ව්‍යාපෘති අංශය

සම්ප්‍රේෂණ රැහැන් ඇතළු (EM සහ HM වැඩ) බලය ජනනය කිරීමේ උපකරණ සඳහා ඇ.ඩො.මි.189 ක් වැය වේ.

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි බලාගාරය

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලිබල ව්‍යාපෘතිය යනු දැනට පවත්නා පොල්පිටිය බලාගාරයේ යටිගං ජල විභවය ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් කැළණි ගඟ හරහා සිදු කිරීමට නියමිතව ඉදිකිරීම් ව්‍යාපෘතියේ කොටසකි. මෙ.වො.35 ක ස්ථාපිත ධාරිතාවක් මෙම ව්‍යාපෘතියෙන් ලැබෙනු ඇති අතර වාර්ෂිකව ගි.වො.පැ.126 ක විද්‍යුත් ශක්තියක් ජනනය කිරීමට එමගින් අපේක්ෂා කෙරේ.ව්‍යාපෘතියේ ප්‍රධාන වැඩ බිම් කොළඹ නගරයේ සිට කි.මී.90 ක් නැගෙනහිරින් කිතුල්ගල නගරය ආසන්නයේ පිහිටා ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කොටස් වනුයේ ප්‍රධාන වේල්ල, හැරවුම් වේල්ල, හැරවුම් උමග, පෘෂ්ඨිත බලාගාරය, වහරු අංගනය සහ සම්ප්‍රේෂණ රැහැනයි.තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් පිලියෙල කල අරමුදල් වලට හානියක් නොවන නොවන පරිදි 2006 වර්ෂයේදී සැලසුම් ඉදි කිරීම් පදනම යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රදානය කරනු ලැබීය. ලංසු සාර්ථක ලෙස ඇගයීමෙන් අනතුරුව සාර්ථක ලංසුකරු ලෙස චීන ජාතික විදුලි උපකරණ සංස්ථාව (CNEEC) තෝරා ගන්නා ලද අතර 2010 වසරේ අග භාගයේදී එම ආයතනය සමග කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් තබනු ලැබීය.

මුළු ව්‍යාපෘති පිරිවැය ඇ.ඩො.මි.82 ක් වන අතර එම මුදල චීන කර්මාන්ත හා වාණිජ බැංකුවෙන් හා ශ්‍රී ලංකා මහජන බැංකුවෙන් ණය ලෙස ලබා ගැනේ. කෙටි කාලයක් ඇතුලත මූල්‍ය ගිවිසුම් අත්සන් කෙරෙනු ඇති අතර 2012 පළමු කාර්තුවේ අවසානයේදී ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය වසර හතරකින් වැඩ නිම කිරීමට සැලසුම් කර තිබේ.

ව්‍යාපෘති උපදේශකවරයෙකු සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. පුළුල් ඉඩම් ජල විදුලි ව්‍යාපෘතිය සඳහා CDN ලියාපදිංචි කිරීමට/ CER ආදායම් ලබා ගැනීම සඳහා උපදේශකයෙකු ලෙස කොරියාවේ Ecoy e Co.Ltd තෝරාගනු ලැබීය. 2011 අගෝස්තු 18 වන දින උපදේශන කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් තබනු ලැබීය. ව්‍යාපෘතියේ CDN ලියාපදිංචි කිරීම සඳහා වන ව්‍යාපෘති සැලසුම් ලේඛනය මහජන මතය විමසීම සඳහා (PDD) කාලගුණ වෙනස්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ (UN) මූලික ප්‍රතිපත්ති වෙබ් අඩවියට (UNFCC) ඇතුලත් කර තිබේ. තවද මෙම ලේඛනය තොරා ගන්නා ලද ජාතික බලධරයා, උදාඃ පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබේ. ව්‍යාපෘතිය සඳහා පරිසරය එළිපෙහෙළි කිරීම සඳහා 2012 නොවැ.8 දක්වා දීර්ඝ කර තිබේ. ව්‍යාපෘති වැඩ සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට සිදුකෙරෙමින් පවතී. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදුකෙරෙමින් පවතී.

මෙ.වො.24 යාපනය බලශක්ති බලාගාරය

ජාතික ග්‍රිඩ් පද්ධතියෙන් හුදෙකලා වී පවත්නා යාපනය අර්ධද්වීපයේ බලශක්ති අවශ්‍යතාවන් සඳහා ස්ථිර විසදුමක් ලබා දීමට වුන්නාකම් හි මෙ.වො.24 ක බලාගාරයක් ඉදිකිරීමට තීරණය කර තිබේ. වර්තමානයේ යාපනය අර්ධද්වීපයේ බලශක්ති සැපයුම ප්‍රමුඛ වශයෙන් සිදු කරනු ලබන්නේ මිල අධික හදිසි අවශ්‍යතා බලාගාර ලෙස පවත්වාගෙන යන ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන් මගිනි.

EPC ආරම්භක කොන්ත්‍රාත්කරුවන් ලෙස චුන්නාකම් හි ලං.වි.ම. වෙත අයත් ඉඩමේ නව බලාගාරයක් ඉදි කරනු ඇත. ඉන්ධන තෙල් 1500 ක් උපයෝගී කරගනිමින් ක්‍රියාත්මක කෙරෙන නව බලාගාරයක් 2012 වසර අවසාන වන විට වාණිජ කටයුතු සඳහා ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. මිලියන 182 ක පමණ ඒකක ප්‍රමාණයක් වාර්ෂිකව ඉන් ජනනය කිරීමට අපේක්ෂිතය. මේ හා සම්බන්ධ සැපයුම් ක්‍රියාවලි සිදු කිරීම සඳහා 2011 ඔක්තෝම්බර් මසදී තාක්ෂණික ඇගයීම් කමිටු පත් කරනු ලැබීය. ලංසු ලේඛනය පිළියෙල කර ඇති අතර ස්ථාවර අමාත්‍ය මණ්ඩලය මගින් පත්කල සැපයුම් කමිටුව මගින් ඒ සඳහා අනුමැතිය ලබා ගෙන ඇත. ICB සඳහා යෝජනා කැඳවීම් සඳහා පුවත්පත් නිවේදනය 2011 දෙසැ.22 පල කරනු ලැබීය 2012 පෙබ.02 ලංසු කැඳවීම අවසන් කිරීමට නියමිත අතර 2012 මාර්තු මස මැද භාගයේදී බලාගාර ඉදි කිරීම් කටයුතු ආරම්භ කරීමට නියමිතය. යෝජිත ක්ෂේත්‍රයේ බිම් මැණුම් කටයුතු හා ප්‍රාථමික ක්ෂේත්‍ර එළිපෙහෙලි කිරීමේ කටයුතු දැනටමත් අවසන් කර ඇත. බලාගාරයේ පංගුකරුවන් ගේ සහභාගිත්වයෙන් විශයපථ සාකච්ඡා පැවැත්වුනු අතර මධ්‍යම පරිසර අධිකාරිය මගින් මූලික පාරිසරික පරීක්ෂාව(IEE) සහ TOR ලේඛනය නිකුත් කරනු ලැබීය ICC වාර්තාව පිළියෙල කිරීම සිදුකෙරෙමින් පවතී.

කොළඹ නගරයේ විදුලි බෙදා හැරීමේ සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතියේ අරමුණු

බෙදාහැරීමේ ජාලයේ ස්වයංක්‍රීය පාලනය හා අධීක්ෂණ පද්ධතිය ස්ථාපනය කිරීම ඇතුළු වැඩි දියුණු කිරීමේ, පුළුල් කිරීමේ හා පුනුරුත්ථාපන කටයුතු මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වේ.

පැකේජය	ක්‍රියාකාරකම	භෞතික ප්‍රගතිය
A	ග්‍රිඩ් උප මධ්‍යස්ථාන 2 ක් ව්‍යාප්ත කිරීම(කොලොන්නාව ග්‍රිඩ් උප මධ්‍යස්ථානයේ 132 කි.වො. වායු පරිවරන වහරු අංගනය ස්ථාපිත කිරීම හා කැළණිතිස්ස ග්‍රිඩ් උප මධ්‍යස්ථානයේ 132 කේ.වී. GIS Bay 10 ක් සවි කිරීම සහ GIS ගොඩනැගිල්ල ඉදි කිරීම ඇතුළු සවි කිරීම්)	100%
	ප්‍රාථමික උප පොල වැඩි දියුණු කිරීම (ප.වි.උ. ගොඩනැගිල්ල ඉදි කිරීම ඇතුළු වායු පරිවරන වහරු අංගනය ඉදි කිරීම.)	100%

ව්‍යාපෘති අංශය

B	කි.වො. 132 භූගත විදුලි කේබල ඉදි කිරීම. (කැළණිතිස්ස ග්‍රිඩ් උප මධ්‍යස්ථානය, C මූලික උප මධ්‍යස්ථානය වෙත, තනි පරිපථ කි.මී.20 සහ කොලොන්නාව ග්‍රිඩ් උපමධ්‍යස්ථානය C මූලික උප මධ්‍යස්ථානය වෙත,තනි පරිපථ කි.මී.6.78 ප්‍රකාශ තන්තු සංඥා බහන්	100%
C	කොළඹ නගරයේ කි.වො. 11 බෙදාහැරීමේ පද්ධතිය ඉදිකිරීම හා පුනුරුත්ථාපනය සහ ප්‍රාථමික උප පොල	100%
D	ස්කාඩා පාලන මධ්‍යස්ථානයක් කොළඹ නගරය සඳහා පිහිටුවීම, ගොඩනැගිලි ඉදි කිරීම් ජාලක හා උප පොලවල දුරස්ථ ඒකක 15 ක් සහ චන්ද්‍රිකා, උප පොලවල දුරස්ථ අන්තික ඒකකය 116 ක් හා අරිය/මදු උප පොල දුරස්ථ අන්තික ඒකකය 117 ක් ඉදිකිරීම.	100%

සම්ප්‍රේෂණ ව්‍යාපෘති

2011 වර්ෂයේදී ව්‍යාපෘති කළමණාකරණ ඒකක 10 ක් හා සම්ප්‍රේෂණ ඉදි කිරීම් ඒකකයක් සම්ප්‍රේෂණ ව්‍යාපෘති ශාඛාවට ඇතුලත් වූ අතර ඒවා උපරිම මට්ටමින් ක්‍රියාත්මක විය. 132/33 කි.වො. නව ග්‍රිඩ් උප මධ්‍යස්ථාන 11 ක් ඉදිකිරීම පවත්නා ග්‍රිඩ් උප මධ්‍යස්ථාන 21 විශාලනය කිරීම, කි.මී. 516 කි.වො. 132 නව සම්ප්‍රේෂණ රැහැනේ කි.මී. 163 දිග දෙවන පරිපථය රැහැන් සවි කිරීම යන කාර්යයන් 2011 වර්ෂයේදී මෙම ශාඛාව මගින් සිදු කල ක්‍රියාකාරකම් වේ.

මෙම සුවිශාල කාර්යභාරය මෙහෙයවීම සඳහා ශාඛාවේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව ඉහළ නංවනු ලැබීය. 2011 වර්ෂය අවසාන වන විට ඉංජිනේරුවන් 48 ක් අධීක්ෂකවරුන් 55 ක් සේවකයින් 172 කින් යුත් ශක්තිමත් අනෙකුත් ශ්‍රේණිවල සේවක බලකායක් මෙම ශාඛාවට අනුයුක්ත කරන ලද අතර ව්‍යාපෘති අංශයේ විශාලම ශාඛාව බවට මෙය පත් විය.

කොළඹ මහ නගරයේ ග්‍රිඩ් උප මධ්‍යස්ථානය ව්‍යාපෘතිය කොටුගොඩ

මෙම ව්‍යාපෘතිය මගින් කොටුගොඩ ග්‍රිඩ් උප මධ්‍යස්ථානයේ පිහිටි පැරණි එළිමහන් 33 කි.වො. අංගනය වෙනුවට වායු පරිවාර වහරු හඳුන්වා දුන් අතර බස්නාහිර උතුර හා වයඹ දිග පළාත්වල විදුලි සැපයුම් නිරවද්‍යතාව ඉහළ නංවමින් 31.5 මෙ.වො.ඇ.,132/33 කි.වො. නව විදුලි තරාපැවි දෙකක් පද්ධතියට එක් කරනු ලැබීය. යුරෝ මිලියන 6 ක් වූ මෙම ව්‍යාපෘතියට දැනට වැඩ අවසන් කොළඹ මහනගරයේ ග්‍රිඩ් උප මධ්‍යස්ථානයේ (GCGSP) පිරිසකර කිරීමත් ජර්මනියේ KFW ආයතනය අරමුදල් සපයනු ලැබීය. කෙසේ වුවද, මෙම තරාපැවි දෙකම ABB වියට්නාම කම්හල මගින් සුරක්ෂිතව ශ්‍රී ලංකාවට ප්‍රවාහනය නොකල බැවින් අළුත්වැඩියාවන් කිරීමට සිදු විය. 2010 දෙසැම්බර් මසදී 33 කි.වො. ස්විච්පන්න සමග පළමු තරාපැවිය පන ගන්වන ලෑබීය. 2011

කොටුගොඩ ග්‍රිඩ් උප මධ්‍යස්ථානයේ 2x31.5 මෙ.වො.ඇ. තරාපැවි සවිකරනු ලැබීය.

දෙසැම්බර් මසදී ව්‍යාපෘතියේ අරමුණු මුදුන්පමුණුවා ගැනීමට දෙවන තරාපැවි පනගන්වනු ලැබීය.

බෙලිඅත්ත ජාලක උප පොල ව්‍යාපෘතිය

දකුණු පළාතේ කි.වො. 33 බෙදාහැරීමේ පද්ධතියට අවැසි ධාරිතාව බෙලිඅත්ත ග්‍රිඩ් උප මධ්‍යස්ථාන මගින් සපයනු ලබන අතර හක්මනදී මාතර - හම්බන්තොට කි.වො. 132 සම්ප්‍රේෂණ රැහැන හා සම්බන්ධ වීමෙන් විදුලිය ලබා ගැනේ. රු.මිලියන 427 ක් වැය වන කි.මී.8 ක් දිග කි.වො. 132 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීමේ වැඩ කටයුතු ලං.වි.ම. මගින් අවසන් කෙරින.

හම්බන්තොට ආලෝකමත් කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියරේදී ශ්‍රී ලංකා රජය මගින් සැපයූ අරමුදල් මගින් යුරෝ මිලියන 4.7 ක් හා ශ්‍රී.ල.රු.මිලියන 89.3 ක් වැය වන 33 මෙ.වො.ඇ. , හා කි.වො. 132/33 ග්‍රිඩ් උප මධ්‍යස්ථානය ඉදි කරනු ලැබීය. මෙහි වැඩ 85% ක් අවසන් කර ඇති අතර වාණිජ ක්‍රියාකාරකම් 2012 මුල් භාගයේ ආරම්භ කරීමට අපේක්ෂා කෙරේ.

වව්නියා - කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය

දශක දෙකකට පෙර විනාශ වී ගිය කිලිනොච්චිය හරහා වව්නියාවේ සිට චුන්නාකම් දක්වා ඇති සම්ප්‍රේෂණ රැහැන දීර්ඝ කිරීම සඳහා අවශ්‍ය සම්ප්‍රේෂණ රැහැන් හා ග්‍රිඩ් උප මධ්‍යස්ථාන ඉදිකිරීම "වඩක්කින් වසන්තම්" වැඩසටහනට ඇතුලත් විය. මෙම ව්‍යාපෘතිය අවසන් වන විට ජාතික ග්‍රිඩ් විදුලි බල සැපයුම වව්නියාවේ සිට කිලිනොච්චිය දීර්ඝ කෙරෙනු ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට JICA ආයතනය එකග වී ඇත. වව්නියාවේ ග්‍රිඩ් උප මධ්‍යස්ථානය අවශ්‍ය පරිදි විශාලනය කිරීම ඇතුළුව 63 මෙ.වො.ඇ.,132/33 කි.වො. කිලිනොච්චිය ග්‍රිඩ් උප මධ්‍යස්ථානයේ කිලිනොච්චිය ග්‍රිඩ් උප මධ්‍යස්ථානය දක්වා කි.මී. 73 ක් දිග ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැනක් ඉදි කිරීම මෙම ව්‍යාපෘතියේ කොටසකි.

2011 අවසාන වන විට සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම්වලින් 72% ක්ද ග්‍රිඩ් උප මධ්‍යස්ථානය ඉදි කිරීම්වලින් 71% ක්ද අවසන් කර තිබිණ.

ව්‍යාපෘති අංශය

මාන්කුලම්හි සම්ප්‍රේෂණ කුළුණ ඉදි කිරීම

කිලිනොච්චිය - චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය

අලිමංකඩ බෙදාහැරීම් රැහැන් මාර්ග ඉදිකිරීම සඳහා භූමිය පරීක්ෂා කිරීම

චුන්නාකම්හි 63 මෙ.වො.ඇ.,132/33 කි.වො. ග්‍රිඩ් උප මධ්‍යස්ථානය ඉදි කිරීම සහ කිලිනොච්චිය ග්‍රිඩ් උප මධ්‍යස්ථානයේ සිට චුන්නක්කම් ග්‍රිඩ් උප මධ්‍යස්ථානය දක්වා කි.මී.67 ක ද්විත්ව පරිපථ කි.වො. 132 ක සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරෙනු ඇත.

ගැටුම් ඇති වූ ප්‍රදේශවල හදිසි අනතුරු ව්‍යාපෘතිය (CAREP) වඩ්ක්කින් වසන්තම් සංවර්ධන වැඩසටහනේ උප ව්‍යාපෘතියක් වන අතර ඒ සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යංශය හා බලශක්ති අමාත්‍යංශය හරහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇ.ඩො.මි.28.72 ක් ලබා දීමට සැලසුම් කර තිබේ.

කොටස් දෙකම සඳහා හදිසි කොන්ත්‍රාත්වලට අත්සන් තබා ඇති අතර කොන්ත්‍රාත්කරුවන් ක්ෂේත්‍රවලට රැස් කර තිබේ. වැඩ ආරම්භ කර ඇති අතර 2011 වසර අවසාන වන විට කොටස් දෙකෙහිම 10% ක ප්‍රගතියක් වාර්තා විය. 2013 අගෝස්තු වන විට ව්‍යාපෘතියේ වැඩ අවසන් වූ විට උතුරු පළාත ඇතුළු දිවයිනේ සියලු කොටස්වලට ජාතික විදුලිබල ග්‍රිඩ් පද්ධතියේ සැපයුම් ලැබෙනු ඇත.

නැවත ප්‍රයෝජනයට ගත හැකි ශක්තීන් අවශෝෂණය සඳහා ග්‍රිඩ් උප මධ්‍යස්ථාන විශාලනය කිරීමේ ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුවේ බලශක්ති වැඩි දියුණු කිරීමේ 2518-SRI (SF) ණය පහසුකම් මගින් මෙම ව්‍යාපෘතියේ කොටසකට (ව්‍යාපෘතියේ II අදියර) රු.මිලියන 2,998 ක මුදලක් ලැබෙනු ඇත.

මෙම අරමුදල් උපයෝගී කරගනිමින් නව 63 මෙ.වො.ඇ.,132/33 කි.වො. ග්‍රිඩ් උප මධ්‍යස්ථානයක් මහියංගනයේ ඉදි කෙරෙමින් පවතී. තවද බදුල්ල, සහ උකුවෙල ප්‍රදේශ වල දැනට පිහිටුවා ඇති ග්‍රිඩ් උප මධ්‍යස්ථානයන්හි විශාල කිරීමක් සිදු කෙරේ.

ශ්‍රී ලංකා රු. මිලියන 1361 ක් වැයවන මෙම ව්‍යාපෘතියේ ඉතිරි කොටසට (ව්‍යාපෘතියේ I අදියර) ශ්‍රී ලංකා රජයෙන් මූල්‍ය පහසුකම් සැපයේ. රත්නපුරය, විමලසුරේන්ද්‍ර සහ රන්ටැඹේ යන ග්‍රිඩ් උප මධ්‍යස්ථානයන්හි විශාලන කටයුතු සිදු කිරීම සහ රන්ටැඹේ හා මහියංගනය ග්‍රිඩ් උප මධ්‍යස්ථානය (අදියර I කොටස බී) සම්බන්ධ කරමින් කි.මී. 21 දිග කි.වො. 132 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියේ I අදියරේ ඉලක්කය වේ.

තොරාගත් කොන්ත්‍රාත්කරුවන් සමග සියලුම කොන්ත්‍රාත්කරුවන් අත්සන් කර ඇති අතර සියලුම ස්ථානවල වැඩ ආරම්භ කර තිබේ. 2011 අවසාන වන විට අදියර I කොටස ඒ අදියර I කොටස බී සහ අදියර II, පිළිවලින් 18%, 74% සහ 28 යන ප්‍රතිශතයයන්ගෙන් ප්‍රගතිය වාර්තා කර තිබේ. 2013 වසරේ මුල් භාගයේදී සියලු කොටස්වල වාණිජ කටයුතු සඳහා වැඩ අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

සම්ප්‍රේෂණ පද්ධතිය, සම්ප්‍රේෂණ රැහැන් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බංකුව මගින් බලශක්ති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ණය අංක 2518)SRI(SF) මගින් සම්ප්‍රේෂණ පද්ධතිය, සම්ප්‍රේෂණ රැහැන් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියට ඇ.ඩො.මි.20.4 ක මුදලක් සපයනු ලබයි.

ව්‍යාපෘතිය සඳහා හදිසි කොන්ත්‍රාත් අත්සන් තබා ඇති අතර වෙනස් වූ මාර්ග හතරක කි.මී.100 දිග කි.වො. 132 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැන් ඉදි කෙරෙමින් පවති. ඒවා නම් ගාල්ල - මාතර, පුත්තලම - මාහෝ සහ උකුවෙල - පල්ලෙකැලේ රැහැන් සහ නාඋල ග්‍රිඩ් උපමධ්‍යස්ථානය වෙත ඇති අන්තර් සම්බන්ධතා රැහැනයි.

2011 වසර අවසාන වන විට මෙම ව්‍යාපෘතිය 6.5% ක සාමූහික ප්‍රගතියක් වාර්තා කර ඇත. 2013 වසර ආරම්භයේදී පන්ගැන්වීම සඳහා වැඩ අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘති අංශය

ජාලක උප පොල ශක්තිමත් කරන සම්ප්‍රේෂණ පද්ධති ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියද ආසියානු සංවර්ධන බැංකුවේ 2518-SRI(SF) බලශක්ති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති ණය ක්‍රමය මගින් අරමුදල් කොටසක් සැපයෙන ඇ.ඩො.මි.33.1 ක් වැයවන ව්‍යාපෘතියකි.

ව්‍යාපෘතිය කොටස් තුනකින් සමන්විත වේ (දැනට පවත්නා කුරුණෑගල ග්‍රිඩ් උපමධ්‍යස්ථානය විශාලනය) ඒ 2 කොටස (හබරණ, පානදුර, මාතර, පුත්තලම සහ ගාල්ල ස්ථානයන්හි දැනට පවත්නා ග්‍රිඩ් උප මධ්‍යස්ථාන විශාලනය ඇතුලත් නාඋල, මහව හා පල්ලෙකැලේ කි.වො. 132/33 නව ග්‍රිඩ් මධ්‍යස්ථාන තුන ඉදි කිරීම. ඒ 3 කොටස (වේයන්ගොඩ සහ හොරණ ග්‍රිඩ් උප මධ්‍යස්ථාන විශාලනය) සැපයුම් කාල සීමාව තුලදී ව්‍යාපෘතිය අසීරු සහ අවිනිශ්චිත කාල සීමාවකට මුහුණ දුන් බැවින් නිශ්චිත තීරණයකට එලඹ 2011 වසර තුලදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කල හැකි වූයේ ඒ 2 කොටස පමණි. 2011 වසර අවසාන වන විට 11% ක ප්‍රගතියක් අත්පත් කර ගැනීමට ඒ 2 කොටසට හැකි විය.

ඒ 1 සහ ඒ 3 කොටස් සඳහා ටෙන්ඩර් අවිනිශ්චිත වූ බැවින් ඒවා කාර්මික හේතු මත ඉවත දැමීමට සිදු වූ අතර ඒ 1 හා ඒ 3 කොටස් සඳහා 2012 ජනවාරි මසදී නැවතත් ටෙන්ඩර් කැඳවීමට තිරණය විය.

සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීමේ නැගෙනහිර පළාත් ව්‍යාපෘතිය

වැලිකන්ද සම්ප්‍රේෂණ කුළුණ ඉදි කිරීම

හබරණ සිට අර්ධ වශයෙන් අබලන් වූ කුළුණ හරහා ඇද ඇති කි.වො. 132 රැහැනක් පමණක් නැගෙනහිර පළාත විශේෂයෙන්ම මඩකලපුව දිස්ත්‍රික්කය සතුව ඇත. වාලච්චේන ග්‍රිඩ් උප මධ්‍යස්ථානයද ඉතා පැරණිය. එබැවින් ප්‍රදේශයේ විදුලිබල සැපයුම ඉතා දුර්වල වන අතර නිරවද්‍යතාව ශක්තිමත් කිරීම සඳහා හබරණ ග්‍රිඩ් උප මධ්‍යස්ථානයේ සිට වාලච්චේන ග්‍රිඩ් උප මධ්‍යස්ථානය දක්වා (බී කොටස) කි. මී.100 කි.වො. 132 නම් සම්ප්‍රේෂණ රැහැනක් ඉදි කිරීමටද වාලච්චේන හා අම්පාර ග්‍රිඩ් උප මධ්‍යස්ථාන විශාලනය කිරීමටද සැලසුම් කර ඇත.

ආසියානු සංවර්ධන බැංකුව මගින් බලශක්ති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ණය අංක 2518SRI(SF) සහ 2619-SRI(SF) යටතේ මෙම ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො.මි.25.2 අරමුදල් සැපයේ. කොටස් දෙකම සඳහා හදිසි කොන්ත්‍රාත් අත්සන් තබා ඇති අතර ඉදි කිරීම් කටයුතු ආරම්භ කර සිදු කෙරෙමින් පවතී. 2011 වර්ෂය අවසාන වන විට ඒ හා බී කොටස් පිළිවෙලින් 14% සහ 44% ක භෞතික ප්‍රගතියක් වාර්තා කර තිබේ. 2013 වසරේ මුල් භාගයේ කොටස් දෙකෙහිම වැඩ අවසන් කිරීමට බලාපොරොත්තු වන අතර ව්‍යාපෘතිය අවසන් වූ විට නැගෙනහිර පළාතට විදුලිබල සැපයුම් තත්ත්වය හා කල්පවත්නා බව සැලකිය යුතු මට්ටමින් ඉහළ යනු ඇත.

ඊසාන දිග විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය

විශේෂයෙන්ම දශක කිහිපයක් තිස්සේ බලපැවැත්වූ ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමත් සමග නැගෙනහිර හා උතුරුමැද පළාත්වල සීඝ්‍රයෙන් වැඩිවන විදුලිබල ඉල්ලුම විසඳුමක් ලෙස එම ප්‍රදේශ වල විදුලිබල සැපයුම ශක්තිමත් කිරීම තවදුරටත් අවශ්‍ය විය. ඒ අනුව සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා සුනිත්‍ය විදුලිබල ව්‍යාපෘතිය II යටතේ ආසියානු සංවර්ධන බැංකුව ඇ.ඩො.මි.55 ක් සැපයීමට එකග වී ඇත.

(i) මොණරාගල, පොලොන්නරුව සහ වව්නියා ප්‍රදේශයන්හි 132/33 කි.වො. නව ග්‍රිඩ් උප මධ්‍යස්ථාන 3 ක් ඉදි කිරීම සහ අම්පාර, රන්ටැඹේ(ඒ කොටස) හි දැනට පවත්නා ග්‍රිඩ් උප මධ්‍යස්ථාන විශාලනය කිරීමේ වැඩ කටයුතු.

(ii) මහියංගනය - වවුනතිව්, උහන - අම්පාර හා මැදගම මොණරාගල (සී කොටස) යන ප්‍රදේශ අතර කි.වො. 132 සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම.

(iii) දැනට ඇති අනුරාධපුරය - කොත්මලේ සම්ප්‍රේෂණ රැහැන් (සී කොටස) ට කි.වො. 220 දෙවන පරිපථය ඉදි කිරීම.

PMU පත්කර ඇති අතර සැපයුම් ක්‍රියාවලිය ආරම්භ කර ඇත. 2011 වසර අවසාන වන විට කොටස් තුන සඳහා කාර්මික යෝජනා ඇගයීම අවසන් කල අතර 2012 වසර ආරම්භයේදී කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වේ.

ග්‍රිඩ් උප මධ්‍යස්ථාන ඉදි කිරීමට ඉඩම් අත්පත් කර ගැනීම ඇතුලු ප්‍රාදේශීය ක්‍රියාකාරකම් සහ පංගුකරුවන් ගේ උපදෙස් අනුව සම්ප්‍රේෂණ රැහැන් මාර්ග තීරණය කිරීම ආරම්භ කිරීම සිදු කෙරෙමින් පවතී.

ගාල්ල නව විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය

දකුණු කලාපයේ විදුලිබල ජාලය සංවර්ධනය කිරීමේ හා ධාරිතාව ඉහළ නැංවීමේ අවශ්‍යතාව හඳුනා ගන්නා ලද අතර ඒ සඳහා කල සැලසුමේ ප්‍රමුඛතාවයක් වූයේ ගාල්ල ප්‍රදේශයේ නව ග්‍රිඩ් උප පොල ඉදි කරීමයි. පිළිගත හැකි තත්ත්වයන් යටතේ ඒ සඳහා මූල්‍ය ආධාර හඳුනාගත නොහැකි වූ අතර එම නිසා එම වැඩ කටයුතු වසර කිහිපයකින්ම කල් දැමීමට සිදු විය. අවසානයේ ගාල්ල නව විදුලිබල සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය ලෙස හඳුන්වා දුන් ඉලක්කය මුදුන් පමුණුවා ගැනීමට ඇ.ඩො.22 ක් ලබා දීමට එකග වූ අතර මෙම වසරේ ගිවිසුම් අත්සන් කෙරිණි.

ව්‍යාපෘතියේ ඒ 1 කොටස යටතේ ගාල්ල නව ග්‍රිඩ් උපපොළ 94.5 මෙ.වො.ඇ.,132/33 කි.වො. ඉදි කෙරෙනු ඇති අතර ව්‍යාපෘතියේ බී කොටස යටතේ විදුලිබල සම්ප්‍රේෂණ හැකියාව ඉහල නැංවීම සඳහා අම්බලන්ගොඩ ග්‍රිඩ් උපපොළේ සිට ගාල්ල නව ග්‍රිඩ් උපපොළ දක්වා කි.මී.40 132 කි.වො. ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැන් ඉදිකෙරෙනු ඇත. එයට අමතරව පද්ධතියේ විදුලිබල ශක්ති ගුණාත්මකභාවය

ව්‍යාපෘති අංශය

වැඩිදියුණු කිරීමට ව්‍යාපෘතියේ ඒ 2 කොටස යටතේ ජාලක උපපොළ සතරක සවි කිරීමට බලාපොරොත්තු වේ.

වසර තුලදී ව්‍යාපෘති කළමණාකරණ ඒකකය ස්ථාපිත කර සැපයුම් ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර 2012 වසර මුල් කාලයේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කෙරෙනු ඇත.

සම්ප්‍රේෂණ ඉදි කිරීම

අභිනවයෙන් ස්ථාපනය කරන ලද සම්ප්‍රේෂණ ඉදි කරීම් ඒකකය වසර තුලදී තවදුරටත් ශක්තිමත් කරන ලද අතර තව තවත් ක්‍රියාකාරකම් එයට පවරනු ලැබීය. ප්‍රමාණවත් බලතල හා යටිතල පහසුකම් සපයා ශාඛාවේ ප්‍රධානියා ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු පත්කර සම්ප්‍රේෂණ ඉදිකිරීම් වැඩ ඇගයීමේ අවශ්‍යතාව තහවුරු කරන ලද අතර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය වර්ෂය තුලදී නැවත ආරම්භ කරනු ලැබීය. මෙම ශාඛාව ස්ථාපනය කර සංවිධානය වූ වහාම එමගින් ලං.වි.ම. හා ශ්‍රී ලංකා රජයේ අරමුදල් සැපයෙන සියලු සම්ප්‍රේෂණ ඉදි කරීම් වැඩ කටයුතු සිදු කෙරෙනු ඇත. අවශ්‍ය පත්කිරීම් 2012 වසර ආරම්භයේ සිදු කිරීමට බලාපොරොත්තු වේ.

පුත්තලම සහ වව්නියා ග්‍රිඩ් උපපොළ විශාලනය කිරීම මෙන්ම රන්ටැඹේ සිට මහියංගනය දක්වා 132 කි.වො. සම්ප්‍රේෂණ කුලුණු රැහැන් වලින් කොටසක් ඉදි කිරීම් කටයුතුවල ප්‍රධාන ඉංජිනේරුවරයා ප්‍රධානත්වය දරණ සම්ප්‍රේෂණ ඉදි කිරීම් ඒකකය පූර්ණ වශයෙන් නියැලී සිටී.

ඉහත ක්‍රියාකාරකම්වලට අමතරව අවශ්‍ය තැන්හි සුළු පරිමාණ සම්ප්‍රේෂණ ඉදි කිරීම් කටයුතුද මෙම ඒකකය මගින් සිදු කරනු ලබයි.

වත්කම් කළමණාකරණ හා මධ්‍යගත සේවා අංශය

ආයතනික ක්‍රමෝපාය අංශය

වත්කම් කළමණාකරණ හා මධ්‍යගත සේවා අංශය

වත්කම් කළමණාකරණ හා මධ්‍යගත සේවා අංශය යටතේ පහත ශාඛා ක්‍රියාත්මක වේ.

1. වත්කම් කළමණාකරණ සහ ආයතනික ශාඛාව
2. සිවිල් කටයුතු සහ ගොඩනැගිලි ශාඛාව
3. ආරක්ෂක ශාඛාව
4. පුහුණු ශාඛාව
5. වැඩපල සහ උපකාරක සේවා ශාඛාව

වත්කම් කළමණාකරණ සහ ආයතනික ශාඛාව

ව්‍යවස්ථාදායක ක්‍රියාකාරකම්වලට බලපෑමක් නොවන පරිදි ලං.වි.ම. හි සාමාන්‍ය ක්‍රියාකාරකම්වලට අමතරව දැනට ඇති සම්පත් සහ වත්කම් ප්‍රයෝජනයට ගනිමින් අමතර ආදායමක් ඉපයීමේ අරමුණින් වත්කම් කළමණාකරණ ක්‍රියාකාරකම් වෙත හඳුන්වා දෙනු ලැබීය. මෙම නව ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා 2010 ජුනි මස වෙනම ශාඛාවක් පිහිටුවනු ලැබීය. වත්කම් කළමණාකරණ ශාඛාව සඳහා හඳුන්වා දුන් සමහර ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- මුහුදු ගුවන් යානා සහ බෝට්ටු සේවා වැනි සංචාරක සහ විනෝදාත්මක පහසුකම් සඳහා ලං.වි.ම. ජලාශ බදු දීම.
- පවත්නා වෙළඳපල මිල ගණන් වලට බාහිර පුද්ගලයන් සඳහා ලං.වි.ම. සංචාරක බංගලා විවෘත කිරීම.
- ලං.වි.ම. පරිශ්‍රයන්හි හා තාප්පවල දැන්වීම් කටයුතු සඳහා බදු දීම.
- ආලෝක කණුවල දැන්වීම් ඇලවීමට අවසර ලබා දීම.

ආදායම් උත්පාදන කටයුතු සඳහා ඉඩම් සහ ගොඩනැගිලි ඵලදායී ලෙස යොදා ගැනීම කළමණාකරණයට ඉන්වෙන්ට්‍රියක් සකස් කිරීමටද පියවර ගෙන තිබේ. මෙම ශාඛාව සඳහා කාර්ය මණ්ඩලය නම්කර ඇති අතර එලඹෙන වර්ෂයේ සිට නියමිත සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. වත්කම් කළමණාකරණ හා මධ්‍යගත සේවා අංශයේ ආයතනික ක්‍රියාකාරකම්ද මෙම ශාඛාව මගින් මෙහෙයවනු ලබයි.

පුහුණු ශාඛාව

නූතන ඒකීයකරණ කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු සඵලදායී ලෙස සිදු කිරීමට සුදුසු අධ්‍යාපනය, පුහුණුව, හැකියා සංවර්ධනය, සහ අත්දැකීම් ලබා දීම තුලින් දක්ෂ සේවා බලකායක් බිහි කිරීමට පසුගිය වසර ගණනාවක් පුරා පුහුණු ශාඛාව පියවර ගෙන තිබේ. සියළුම කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් පුහුණුවක් ලබා දීම සම්මත ක්‍රියාවලියකි. සමාලෝචනය කරනු ලබන වර්ෂය තුලදී සම්මත පුහුණු පටිපාටියට අමතර සේවකයන්ගේ ප්‍රයෝජනය උදෙසා විවිධ ක්ෂේත්‍රයන්හි දැනුවත් කිරීමේ වැඩ සටහන් රැසක් පවත්වනු ලැබීය.

පුහුණු අංශය පහත සඳහන් ප්‍රධාන ඒකකවලින් සමන්විත වේ.

1. ලං.වි.ම. පුහුණු මධ්‍යස්ථානය, පිළියන්දල
2. ලං.වි.ම. පුහුණු මධ්‍යස්ථානය, කාසල්රී
3. බාහිර පුහුණු ඒකකය ලං.වි.ම. මූලස්ථානය
4. විභාග ඒකකය
5. වෘත්තීය සෞඛ්‍යය හා සුරැකුම් ඒකකය
6. තත්ත්ව හා පද්ධති ඒකකය

ලං.වි.ම. පුහුණු මධ්‍යස්ථානය, පිළියන්දල

මෙම මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක වන තත්ත්ව කළමණාකරණ පද්ධතියට අයි.එස්.ඕ. 9001: 2008/එස්.එල්.එස්. අයි.එස්.ඕ. 9001: 2008 සහතිකය ප්‍රදානය කර තිබේ.

පිළියන්දල ලං.වි.ම. මධ්‍යස්ථානයේ දැක්ම

ශ්‍රී ලංකාවේ උපයෝගිතා ක්ෂේත්‍රයේ හොඳම පුහුණු ආයතනය බවට පත් වීම.

පිළියන්දල ලං.වි.ම. පුහුණු මධ්‍යස්ථානයේ මෙහෙවර

ශ්‍රී ලංකා ජාතික සංවර්ධනයේ උන්නතිය උදෙසා දැනුම,කුසලතාවයන් හා ආකල්ප පොහොසත් කිරීමට රැකියා මාර්ගෝපදේශණ ලබා දීම.

පුහුණු ශාඛාවේ විවිධ ඒකකයන්හි රාජකාරි හා වගකීම්

	ඒකකය	උප ඒකකය	වගකීම
1	ලං.වි.ම.- පුහුණු මධ්‍යස්ථානය - පිළියන්දල	කා.පු.වි. පිළියන්දල	2002 ලං.වි.ම. බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමයට අනුව ලං.වි.ම. ක්ෂේත්‍ර සේවා සහ කුසලතා ශ්‍රේණිවල සේවකයින්ට කාර්මික පුහුණුව හා උසස්වී ලබා දීමේ අවශ්‍යතාවය සඳහා පුහුණුව ලබා දීම.
2	ලං.වි.ම.- පුහුණු මධ්‍යස්ථානය - පිළියන්දල	අභ්‍යන්තර පුහුණු ඒකකය	2002 ලං.වි.ම. බඳවා ගැනීම් හා උසස් කිරීම් යෝජනා අනුව ලං.වි.ම. හි කාර්මික නොවන සේවකයන්ට පරිගණක පුහුණුව සහ උසස් කිරීමේ අවශ්‍යතාවන් සඳහා පුහුණුව ඉංජිනේරු සහ තාක්ෂණ උපාධි හදාරන්නවුන් සහ ඩිප්ලෝමා හදාරන්නවුන් සඳහා බලාගාර තුල පුහුණුව ලබා දීම.
3	ලං.වි.ම. - පුහුණු මධ්‍යස්ථානය - කාසල්රී		2002 ලං.වි.ම. බඳවා ගැනීම් හා උසස් වීම් යෝජනා ක්‍රමයට අනුව ජනන අංශයේ ලං.වි.ම. ක්ෂේත්‍ර සේවා සහ කුසලතා ශ්‍රේණිවල සේවකයන්ට උසස්වීම් අවශ්‍යතාවන් අනුව පුහුණුව ලබා දීම.
4	බාහිර පුහුණු ඒකකය		සියළුම ලං.වි.ම. සේවකයින් සඳහා වන විදේශගත පුහුණුවීම්.

වත්කම් කළමණාකරණ හා මධ්‍යගත සේවා අංශය

	ඒකකය	උප ඒකකය	වගකීම
5	විභාග ඒකකය		ලං.වි.ම. සේවකයිනගේ සියළුම අභ්‍යන්තර පරීක්ෂණ සහ බඳවා ගැනීමේ පරීක්ෂණ, ලං.වි.ම. සේවකයින් සඳහා වෘත්තිය අධ්‍යාපන පහසුකම් සැලසීම.
6	වෘතිය සෞඛ්‍ය හා සුරක්ෂිතතා ඒකකය		ලං.වි.ම. සේවකයින් සඳහා සුරක්ෂිතභාවය පිළිබඳ දැනුවත් කරීමේ වැඩ සටහන් පැවැත්වීම සහ අනතුරු පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම, සහ විශ්ලේෂණය සඳහා ඒවා යොදා ගැනීම.
7	තත්ත්ව සහ පද්ධති ඒකකය		ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, ඵලදායිතාව සහ ලං.වි.ම. හි එස් 5 සංකල්පය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණු වීම.

2011 වර්ෂය තුල ක්‍රියාකාරීත්වය

බාහිර පුහුණු ඒකකය

2011 වර්ෂය තුලදී බාහිර පුහුණු ඒකකය මගින් විවිධ මට්ටම්වල සේවකයින් 370 කට පහත සඳහන් පැවරුම් සඳහා විදේශගත වීමට පහසුකම් සලසනු ලැබීය.

වැඩ සටහන	සහභාගිවන්නන් සංඛ්‍යාව
සැපයීමට ඇති භාණ්ඩ පෙර නැවිගත කිරීමේ පරීක්ෂාව	176
ශිෂ්‍යත්ව, පුහුණු සහ අධ්‍යයන චාරිකා	102
වැඩ මුළු, සම්මන්ත්‍රණ, සාකච්ඡා	80
ක්‍රීඩා කටයුතු	12

අභ්‍යන්තර පුහුණු ඒකකය

2011 වර්ෂය තුලදී අභ්‍යන්තර පුහුණු ඒකකය මගින් වැඩිපුර පුහුණු අවස්ථා ලබාදෙමින් ලං.වි.ම. සේවකයින්ට බාහිර පුහුණු ලාභීන්ටද ලබාදෙන පුහුණු පහසුකම් ඉහල නංවනු ලැබීය.විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල වැනි විවිධ බාහිර සංවිධානවලට අයත් පුහුණු ලාභීන් 200 කට පමණ බලාගාර තුල පුහුණු පහසුකම් ලබාගත හැකිවිය.

විධායක සහ විධායක නොවන වර්ගයට අයත් නිළධාරීන් ඇතුළු ලං.වි.ම. සේවකයින් 1,448 කට පමණ පරිගණක පුහුණු, පද්ධති පුහුණුව සහ විද්‍යුත් ප්‍රේරණ පුහුණුව යන ක්ෂේත්‍ර ආවරණය කරමින් පුහුණුව ලබාදෙන ලදි. 2011 වර්ෂය තුලදී වෙනස් වූ විෂයයන් හා වෙනස් වූ වර්ගීකරණයට අයත් ලං.වි.ම. සේවකයින් 30 කට දේශීය ආයතනයන්හි පුහුණුව ලබා දුනි.

වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා ඒකකය

සුරක්ෂිතභාවය ලං.වි.ම. කේන්ද්‍රගත වටිනාකමක් ලෙස හඳුනාගෙන ඇත. සුරක්ෂිතභාවය පිළිබඳ ආයතනික, ජාතික සහ අන්තර්ජාතික අවශ්‍යතාවයන් සපුරාගනු පිණිස හා ලං.වි.ම. සේවකයන්ගේ සුභ සිද්ධිය උදෙසා අධ්‍යාපන සහ පුහුණු ශාඛාව යටතේ නව ඒකකයක් පිහිටුවනු ලැබීය.

දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, සේවස්ථාන පුහුණුව ලබා දීම කාලයෙන් කාලයට අනතුරු පිළිබඳව දත්ත එක් රැස් කිරීම සහ සිදුවන අනතුරු සංඛ්‍යාව ශූන්‍ය කර ගැනීමේ ඉලක්කය කරා ලඟා වීම සඳහා පියවර ගැනීමට එම එක් රැස් කරගත් දත්ත විශ්ලේෂණය කිරීම තුළින් ඉහත පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට හැකි වේ. 2011 වර්ෂය තුලදී මෙම ඒකකය මගින් පහත වැඩසටහන් සහ වැඩමුළු පවත්වනු ලැබීය.

	වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වන්නන් සංඛ්‍යාව
1	විධායක සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය සඳහා සුරක්ෂිතතාව පිළිබඳ වන වැඩමුළුව	7	261
2	සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	1	30
3	ප්‍රථමාධාර සහ ගිනි ඇවිලීමෙන් සිදුවන හානි පිළිබඳ සුරක්ෂිතතාව	32	1542
4	අනතුරුදායක ස්ථානවලින් ඉවත්වීම සහ ගිනි නිවීම	1	23
5	ඉංජිනේරුවන් සඳහා වෘත්තිය සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව පිළිබඳ වැඩසටහන්	3	108

විභාග ඒකකය

විභාග පැවැත්වීමේ ලං.වි.ම. ක්‍රියාවලියේ ගුණාත්මකභාවය හා විනිවිදභාවය උපරිම මට්ටමින් ආරක්ෂා වන අයුරින් බාහිර ආයතනයන්හිද උපකාර ඇතිව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ උසස්වීම් ලබා දීමට බඳවා ගැනීමේ, උසස් කිරීමේ සහ යෝග්‍යතා පරීක්ෂණ 42 ක් විභාග ඒකකය මගින් සංවිධානය කර පවත්වනු ලැබීය.

කාර්මික පුහුණු මධ්‍යස්ථානය - පිළියන්දල

පිළියන්දල කාර්මික පුහුණු මධ්‍යස්ථානය මගින් සමාලෝචනයට ලක්වන වර්ෂය තුලදී ඉංජිනේරුවන්,අධිකාරිවරුන්, පුහුණු සහ නුපුහුණු ක්ෂේත්‍ර සේවකයින් ඇතුළු ලං.වි.ම. සේවකයින් 3,138 කෙටිකාලීන පාඨමාලා 93 ක් මෙම කාර්මික පුහුණු වැඩසටහන්වලට අයත් විය.

පිරිවැය අයකර ගැනීමේ පදනම මත අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික සංවිධානවල සේවකයන්ට ඔවුන්ගේ ඉල්ලීම අනුව කාර්මික පුහුණු වැඩසටහන් කිහිපයක්ම පවත්වනු ලැබීය.

වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව
අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය	11
වැඩමුළු සහ සම්මන්ත්‍රණ	6
උසස් කිරීම්	70
අනෙකුත් සංවිධාන සඳහා පුහුණු	4

වත්කම් කළමණාකරණ හා මධ්‍යගත සේවා අංශය

අධිසැර හා අඩුසැර බෙදාහැරීමේ රැහැන් පිළිබඳ පුහුණු වැඩසටහන අවස්ථාවේදී

කාර්මික පුහුණු මධ්‍යස්ථානය - කාසල්රී

ලං.වි.ම. හි ප්‍රමුඛතම පුහුණු මධ්‍යස්ථානය වන කාලස්රී කාර්මික පුහුණු මධ්‍යස්ථානය තම උපරිම ධාරිතාව ප්‍රයෝජනයට ගනිමින් 2011 වර්ෂය තුලදී සේවකයන් 1490 කට පුහුණුව සපයන ලදි. මෙම පුහුණු වැඩසටහන් මගින් පද්ධති පුහුණුව, කාර්මික පුහුණුව, වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂාව, ප්‍රථමාධාර හා ඵලදායිතාව යන ක්ෂේත්‍ර ආවරණය විය. පරිවැය අයකර ගැනීමේ පදනම යටතේ ලං.වි.ම. සේවා සැපයුම්වල සේවකයින්ට හා මහජනයාට පුහුණු වැඩසටහන් පවත්වනු ලැබීය.

ගුණාත්මකභාවය හා පද්ධති ඒකකය

එස් 5 තත්ත්ව සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ පිළියන්දල ලං.වි.ම. පුහුණු මධ්‍යස්ථානය සඳහා දැක්ම සහ මෙහෙවර ප්‍රකාශයක් සම්පාදනය කරන ලද අතර පිරවුම් පද්ධතිය, අපද්‍රව්‍ය කළමණාකරණය, සරල ප්‍රවේශ මාර්ග සඳහා උපකරණ හඳුනා ගැනීම යනාදිය වැඩිදියුණු කිරීම සහ හරිත සංකල්පයට අනුව පරිසරය නගා සිටුවීම.

2011 වර්ෂයේ තත්ත්ව ප්‍රමිතිය පිළිබඳ අයි.එස්.ඕ. 9001-2008 QMS සහතිකය ලං.වි.ම. පිළියන්දල පුහුණු මධ්‍යස්ථානය අත්පත් කරගනු ලැබීය.

මූලික ක්‍රියාකාරකම්

තුලිත ලකුණුපත (බී.එස්.සී.) පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුව

තුලිත ලකුණුපත් ක්‍රමයට (බී.එස්.සී.) අනුව දැනුවත් කරීමේ වැඩසටහන් සහ වැඩමුළු බී.එස්.සී. සංකල්ප, ක්‍රියාකාරකම් සහ ක්‍රමවේද පිළිබඳ දැනුවත් කිරීමට හා ඒ පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීමේ අභිප්‍රායෙන් සම්මන්ත්‍රණ සංවිධානය කරනු ලැබීය.ආයතනික ක්‍රමෝපාය අංශයේ ආධාර ඇතිව මෙම සම්මන්ත්‍රණ පවත්වනු ලැබීය.

පිළියන්දල ලං.වි.ම.පු.ම. ශ්‍රවණාගාරයේ පැවති බී.එස්.සී. පිළිබඳ සම්මන්ත්‍රණයේදී

පාරිසරික සංවර්ධනය

පරිසරය රජයේ ප්‍රතිපත්තිය සහ එස් 5 සංකල්පයට අනුගත වෙමින් පිළියන්දල ලං.වි.ම. පුහුණු මධ්‍යස්ථානයේ පරිශ්‍රය තුල පාරිසරික සෞඛ්‍යය සහ සාමකාමී බව ආරක්ෂා කිරීමේ හා නඩත්තු කිරීමේ අරමුණින් වැඩසටහනක් දියත් කරනු ලැබීය. මෙම වැඩසටහන යටතේ පිළියන්දල ලං.වි.ම. පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රය තුල ඝන අපද්‍රව්‍ය කළමණාකරණය සහ එළවළු, පළතුරු සහ වෙනත් බෝග වගා කිරීම සිදු කෙරින. ඝන අපද්‍රව්‍ය කළමණාකරණ අංගයක් ලෙස පරිශ්‍රය තුළ කොම්පෝස්ට් පොහොර නිපදවා ඒවා එළවළු වගාව සඳහා භාවිතා කරනු ලැබීය.

පිළියන්දල ලං.වි.ම.පු.ම. පරිශ්‍රයේ එළවළු වගා බිම.

විශේෂ වැඩ සටහන්

නවීන තාක්ෂණික සංවර්ධනය සැලකිල්ලට ගනිමින් සහ ක්ෂේත්‍රයේ අත්දැකීම් හා විශේෂඥතා දැනුම ලබා ගැනීමේ අරමුණින් 2011 වර්ෂය තුලදී පහත කාර්මික පුහුණු සැසිවාර සංවිධානය කරනු ලැබීය.

වත්කම් කළමණාකරණ හා මධ්‍යගත සේවා අංශය

1. අධි සැර හා අඩුසැර බෙදාහැරීමේ රැහැන් පද්ධති ඉදි කිරීම.
2. සේවකයින් ආරක්ෂා කිරීමේ මූලික පුහුණුව ලබාදීම.
3. බෙදාහැරීමේ රැහැන් පද්ධති සැලසුම් කිරීම.
4. සන්නිවේදන රැහැන් සවි කිරීම.

පිළියන්දල ලං.වි.ම.පු.ම. හි "බී" ගාඩනැගිල්ලේ නව සන්නිවේදන සම්බන්ධතාවක් සවිකල අතර අන්තර්ජාල ප්‍රවේශයට Wi-Fi පහසුකම් ලබා දීම සඳහා ප්‍රකාශ සන්නිවේදන ක්‍රමය එහිදී භාවිතා කරනු ලැබීය.



2010- 2011 පුහුණු විස්තර සංසන්දනය

3. වැඩපල හා උපකාරක සේවා ශාඛාව

වැඩපල හා උපකාරක සේවා ශාඛාවට ඒකක 4 ක් ඇතුලත් වේ. එනම්,

- වායුසමීකරණ හා ශීතකරණ
- ජනක යන්ත්‍ර
- විදුලි සෝපාන
- මධ්‍යම වැඩපල හා මධ්‍යම ගරාජය

වායුසමීකරණ හා ශීතකරණ

වායුසමීකරණ හා ශීතකරණ අංශයේ ප්‍රධාන වගකීම වනුයේ,

- රජයේ රෝහල්වල මෘත ශරීරාගාර ශීතකරන සැපයීම, සවි කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සහ රජයේ ආයතනයන්හි සියළුම ආකාරයේ වායු සමීකරණ යන්ත්‍ර සැපයීම, සවි කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- රජයේ රෝහල්වල සහ අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි සවිකර ඇති වායුසමීකරණ උපකරණ වල සියළුම ආකාරයේ මූලික අළුත්වැඩියා සිදු කිරීම.
- රජයේ රෝහල්වල සහ අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි සවිකර ඇති සියළු ම ආකාරයේ වායු සමීකරණ උපකරණවල නිවාරන නඩත්තු කටයුතු සිදු කිරීම.
- හානි, අළුත්වැඩියාවන්, නව සවි කිරීම් ආදිය පිළිබඳ වායු සමීකරණ ක්ෂේත්‍රයේ උපදේශන සේවා සැපයීම.

2011 වසරේ ක්‍රියාකාරකම්

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, අනෙකුත් රාජ්‍ය දෙපාර්තමේන්තුවල ලං.වි.ම. මූලස්ථානයේ සහ අනෙකුත් ලං.වි.ම. ශාඛාවන්හි රු.මිලියන 166 ක පිරිවැයක් දරා වායු සමීකරණ නඩත්තු කටයුතු සිදු කිරීම.

1. නව වායු සමීකරණ සවි කිරීම.

ලං.වි.ම. - යන්ත්‍ර 63 ක්
වෙනත් කාර්යාල - යන්ත්‍ර 9 ක්

මුළු වියදම රු.මිලියන 11

2. අළුත්වැඩියා කිරීම්

2011 වර්ෂයේදී සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විවිධ රෝහල්වල සහ කාර්යාලවල රු.මිලියන 3 ක මුළු පිරිවැයක් දරා වායු සමීකරන යන්ත්‍රවල අළුත්වැඩියා සිදු කරනු ලැබීය.

ජනක යන්ත්‍ර

ජනක යන්ත්‍ර ඒකකයේ ප්‍රධාන වගකීම වනුයේ,

- රජයේ රෝහල්වල සහ අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි ඩීසල් ජනක යන්ත්‍ර සැපයීම් සිදු කිරීම, සවි කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.
- ඩීසල් ජනක යන්ත්‍ර සවි කිරීම, ඒවායේ දෝෂ සෙවීම, සහ අළුත්වැඩියාවන් පිළිබඳ උපදේශණ සේවා සැපයීම.
- ජාතික ජාලක පද්ධතියේ විදුලි සැපයුමට සමාන්තර ලෙස ජනක යන්ත්‍ර ක්‍රියා කරවීම.
- ප්‍රභූවරුන් සහභාගි වන උත්සව වලදී සහ රජයේ ආරක්ෂක කටයුතුවලදී සහ අනෙකුත් වැදගත් ජාතික උත්සවවලදී ජංගම ජනක යන්ත්‍ර ක්‍රියාත්මක කර අතිරේක/ආධාරක බලශක්තිය සැපයීම.
- කුලී පදනම මත විවිධ ආයතනයන්ට ඩීසල් ජනක යන්ත්‍ර ලබා දීම.
- ඩීසල් ජනක යන්ත්‍ර වල අළුත්වැඩියා කටයුතු සිදු කිරීම.
- රජයේ රෝහල්වල සහ අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි සවිකර ඇති ආධාරක ජනක යන්ත්‍රයන්හි නිවාරක නඩත්තු කටයුතු සිදු කිරීම.

2011 වර්ෂයේදී ජනක යන්ත්‍ර ඒකකයේ ක්‍රියාකාරිත්වය

ක්‍රියාකාරකම් ස්වභාවය	ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන
වාර්ෂික නඩත්තුව	120	71.0
අළුත්වැඩියාවන්	48	8.0
ජනක යන්ත්‍ර කුලියට දීම	456	153.5
ජනක යන්ත්‍ර සවි කිරීම	3	7.0
අනෙකුත් ක්‍රියාකාරකම්	25	8.6

වත්කම් කළමණාකරණ හා මධ්‍යගත සේවා අංශය

සෝපාන

සෝපාන ඒකකයේ ප්‍රධාන වගකීම වනුයේ,

- රජයේ දෙපාර්තමේන්තුවලට නව සෝපාන සැපයීම, ඒවා සවි කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- නව සෝපාන සවි කිරීම, ඒවායේ දෝෂ සෙවීම, අළුත්වැඩියාවන් හා ඒවා නවීකරණය කිරීම වැනි සෝපාන පිළිබඳ ක්ෂේත්‍රයේ උපදේශණ සේවා සැපයීම.
- රජයේ රෝහල්වල සහ අනෙකුත් ආයතනවල සවිකර ඇති සෝපානවල නිවාරක නඩත්තු කටයුතු සිදු කිරීම.
- රජයේ රෝහල්වල සහ අනෙකුත් ආයතනයන්හි සවිකර ඇති සෝපාන අළුත්වැඩියා කිරීම සහ පුනුරුත්ථාපනය.

2011 වසර තුල සෝපාන ශාඛාවේ කාර්යය සාදනය

ක්‍රියාකාරකම් වර්ගය	ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ඇස්තමේන්තු අගය රු.	ප්‍රගතිය
සේවා සහ නඩත්තුව	139	39,148,138	සම්පූර්ණ කර ඇත
අළුත්වැඩියාවන් සහ පුනුරුත්ථාපනය	5	1,490,572	ගෙවීම් සිදුකර ඇත
	4	603,806	සම්පූර්ණ කර ඇත
	8	2,907,245	සිදුකෙරෙමින් පවතී
නව සවි කිරීම් රජයේ දෙපාර්තමේන්තු, ලං.වි.ම.	1	7,361,982	ප්‍රදානය කර ඇත
	1	5,779,688	සිදු කෙරෙමින් පවතී තා.ඇ.ක. පත් කිරීමට නියමිතය
	1	8,595,048	තීරණය බලාපොරොත්තු වේ
උපදේශණ සේවා	2	30,000	සම්පූර්ණ කර ඇත
	1	90,000	යෝජනාව බලාපොරොත්තු වේ
		1,000,000	සිදුකෙරෙමින් පවතී

සේවා සහ නඩත්තු

2011 වර්ෂයේදී ලං.වි.ම. යටතේ පුද්ගලිකව කොන්ත්‍රාත්කරුවන්/දේශීය නියෝජිතයන් 5 දෙනෙකු මගින් ආරෝහක 88 ක් නඩත්තු කරනු ලැබීය. 2011 වර්ෂයේදී පහත ප්‍රධාන නඩත්තු/අළුත් වැඩියා පුනුරුත්ථාපන කටයුතු සිදු කරනු ලැබීය.

1. මහනුවර මහ රෝහලේ අබලන් අනුස්මරණ වාට්ටුවේ නොවාර බෙඩ් ලිෆ්ට්.
2. අවිස්සාවේල්ල මූලික රෝහලේ නොවාර බෙඩ් ලිෆ්ට් දෙකක් අළුත්වැඩියා කිරීම.
3. පුත්තලම ගල් අඟුරු බලාගාරයේ මගී සේවා සෝපාන 3 ක් නඩත්තු කිරීම.
4. ජාතික රෝහලේ බ්ලොක් ඒ පැරණි සෝපානය පුනුරුත්ථාපනය සිදුකෙරෙමින් පවතී.
5. බොරැල්ල රජයේ මුද්‍රණාලයේ සේවා සෝපානය පුනුරුත්ථාපනය හා නවීකරණය.

ලක්විජය ගල් අඟුරු බලාගාරයේ සවිකර ඇති ආරෝහක පරීක්ෂාව

නව සවි කිරීම්

යාපනය සහ රත්නපුර රෝහල්වල බෙඩ් ලිෆ්ට් අළුතින් සවි කිරීම සිදු කරනු ලැබීය.

සෝපාන ශාඛාව මගින් සාදන ලද සෝපාන පාලක පරීක්ෂා කිරීමේ සිමියුලේටරය

වත්කම් කළමණාකරණ හා මධ්‍යගත සේවා අංශය

උපදේශණ සේවා

ඉහළ කොත්මලේ ජ.වි.ව්‍යා. කැළණිතිස්ස රාජ්‍ය සංවිධානයන්ට හා ඒකාබද්ධ ව්‍යාපෘතිය සහ කොළඹ නගරයේ විදුලිය බෙදා හැරීමේ ව්‍යාපෘතිය වැනි ලං.වි.ම. ව්‍යාපෘති කාර්යාලයන්ට සෝපාන සවි කරීම පිළිබඳ උපදේශණ සේවා සපයනු ලැබීය.

මධ්‍යම වැඩපල

මධ්‍යම වැඩපල පහත අංගවලින් සමන්විත වේ.

- විදුලි කාර්මික අංශය
- වාහන අංශය
- යාන්ත්‍රික සැකසුම් හා සවි කිරීම් ශාඛාව

මධ්‍යම වැඩපලේ ප්‍රධාන වගකීම් වනුයේ

- අඩු සැර හා අධි සැර බෙදා හැරීමේ රැහැන් පද්ධතිවලට අවශ්‍ය කොටස් නිෂ්පාදනය.
- දිවත්, යන්ත්‍ර කොටස් වැනි විශේෂ කොටස් නිෂ්පාදනය.
- ආරක්ෂක වැටවල් සෑදීම ආරක්ෂක කූඩාරම් සෑදීම වැනි විශේෂ කාර්යන් සිදු කිරීම.
- ජනක යන්ත්‍ර එතීම,මෝටර එතීම වැනි විදුලි කාර්මික යන්ත්‍රවල අළුත්වැඩියා කටයුතු සහ නඩත්තුව සිදු කිරීම.
- පාලක පනේල ස්විච්පන්න සහ ආශ්‍රිත උපාංගවල රැහැන් සවි කිරීම ඇතුලත් අළුත් වැඩියා කටයුතු, සර්විස් කිරීම සහ සවි කිරීම් සිදු කිරීම.
- ලං.වි.ම. ට අයත් වාහනවල එන්ජින්වල ප්‍රධාන පිරික්සුම්, ටිංකර් වැඩ, පින්තාරු කිරීම හා අනෙකුත් ප්‍රධාන අළුත්වැඩියාව සිදු කිරීම.
- ලං.වි.ම. වාහන සඳහා ඉන්ධන පරිභෝජන පරීක්ෂා කිරීම.
- තත්ත්ව වර්තා, අනතුරු වාර්තා ආදිය පිළියෙල කිරීමට මෝටර් රථ පරීක්ෂා කිරීම.

2011 වර්ෂය තුල මධ්‍යම වැඩපලේ ක්‍රියාකාරකම්

විදුලි කාර්මික අංශය මගින් සිදු කල කටයුතු

- කි.වො. 155 දක්වා එකලා හා තෙකලා මෝටර නැවත එතීම සහ ප්‍රත්‍යාවර්ත සකොබන ක්ෂේත්‍රය සහ ස්තායුක දඟර නැවත එතීම.
- ලං.වි.ම. මූලස්ථානයේ හා අනෙකුත් ශාඛාවල මෝටර් හා ජල පොම්ප සර්විස් කිරීම හා ජල පොම්ප අළුත්වැඩියා කිරීම.
- වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා සකසන ලද දිය පාලන පනේල.

වර්ෂය තුල සිදු කල ඉහත ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තු කල මිල රු.මිලියන 3.2 කි.

මෝටර් රථ අංශය මගින් සිදුකල ක්‍රියාකාරකම්

- එන්ජින් සම්පීඩන පරීක්ෂාව
- ඉන්ධන පරිභෝජන පරීක්ෂාව
- සියළුම ආකාරයේ මෝටර් රථ අළුත්වැඩියාවන් (සුක්කානම් පද්ධතියේ අළුත්වැඩියාවන්, තිරිංග පද්ධතියේ අළුත්වැඩියාවන්, ක්ලච් පද්ධතියේ අළුත්වැඩියාවන් ආදිය)
- එන්ජින් පරීක්ෂාව
- වාහන කොටස් ප්‍රතිස්ථාපනය කිරීම.
- ටින්කරිං කිරීම හා වාහන අළුත්වැඩියාව.
- සියළුම ආකාරයේ වාහන අළුත්වැඩියා සිදු කිරීම.

වර්ෂය තුලදී සිදු කල ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තු කල මුදල රු.මිලියන 5.8

කාර්මික සැකසුම් හා සවි කිරීම් අංශය මගින් සිදු කල ක්‍රියාකාරකම්

- බලාගාර ඒකකයේ කාමර බෙදා වෙන් කිරීම සහ රාක්ක ඉදි කිරීම.
- කොලොන්නාව, ආරක්ෂක මූලස්ථානයේ වානේ දොරවල්, මාර්ග බාධක සහ ගේට්ටු අළුත්වැඩියා කරනු ලැබීය.
- ලං.වි.ම. මූලස්ථාන ගොඩනැගිල්ලේ වෙසක් තොරණ ඉදි කිරීම.
- ලං.වි.ම. අවශ්‍යතාවන් සඳහා විවිධ උපකරණ අළුත්වඩියා කිරීම, සැකසීම හා ඒවා පින්තාරු කිරීම.

වර්ෂය තුලදී සිදු කල ඉහත ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තු කල වියදම - රු.මිලියන 6.3

ලං.වි.ම. මූලස්ථාන ගොඩනැගිල්ලේ වෙසක් තොරණ ඉදි කිරීම

වත්කම් කළමණාකරණ හා මධ්‍යගත සේවා අංශය

සිවිල් කටයුතු සහ ගොඩනැගිලි

ශ්‍රී ලංකාවේ ලං.වි.ම. ගොඩනැගිලි ඉදි කිරීම සහ අළුත්වැඩියා කටයුතු සිවිල් කටයුතු සහ ගොඩනැගිලි ශාඛාව මගින් සිදු කරනු ලබයි. සි.වැ. හා ගො. ශාඛාව මගින් 2011 වර්ෂය තුලදී පහත කටයුතු සිදු කරනු ලැබීය.

නව ඉදි කිරීම්

1. බුත්තල දැයට කිරුළ භූමියේ ලං.වි.ම. නැරඹුම් ශාලාව ඉදිකිරීම සහ එහි වැඩ අවසන් කිරීම.
2. ලං.වි.ම. හි විවිධ ශාඛා සඳහා කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීම.
3. ලං.වි.ම. මූලස්ථානයේ වාහේ හදිසි අවස්ථා පිටවුම් දොරටුව සෑදීම.

අළුත්වැඩියා සහ වැඩිදියුණු කිරීමේ කටයුතු

1. දිවයින පුරා පිහිටි විවිධ ලං.වි.ම. ශාඛාවන්ගේ අළුත්වැඩියාවන් හා වැඩිදියුණු කිරීමේ කටයුතු 2011 වර්ෂයේදී සි.වැ. හා ගො. ශාඛාව මගින් සිදු කරනු ලැබීය.
2. විවිධ ලං.වි.ම. ගොඩනැගිලි වල අභ්‍යන්තර කටයුතු වැඩිදියුණු කිරීම.
3. ලං.වි.ම. මූලස්ථානයේ ඉදිරි දොරටුවේ නවීකරණ කටයුතු.

මීගමුවේ පිහිටි ලං.වි.ම. යේ ඉදිකිරීම් භූමි භාගය

ලංසු තැබීමේ අදියරෙහි වැඩ

2012 වසරේදී ආරම්භ කරන පහත ක්‍රියාකාරකම් ලංසු කැඳවා තිබේ.

1. පද්ධති පාලන මධ්‍යස්ථානය, පිළියන්දල ලං.වි.ම.පු.ම. ආපන ශාලාව, නි.සා. (නැගෙනහිර පළාත) කාර්යාලය, නි.සා.(බ.ප.උ.) කාර්යාලය වැනි ලං.වි.ම. ගොඩනැගිලිවල අළුත්වැඩියා හා නවීකරණ කටයුතු.
2. මහනුවර, කටුගස්තොට, පේරාදෙණිය, නාවලපිටිය සහ කොලොන්නාව ප්‍රදේශවල ලං.වි.ම. භූමිවල පාංශු පරීක්ෂාව
3. යෝජිත මහනුවර සත්මහල් නගර කාර්යාල ගොඩනැගිල්ල සඳහා ගෘහ නිර්මාණ හා ව්‍යුහ සැලසුම් සැකසීමට උපදේශණ සේවාවන්.
4. මහනුවර සංචාරක බංගලාව සහ මාඋස්සාකැලේ නිවාඩු නිකේතනය නැවත සකස් කිරීම.

ලඝු ලේඛන පිලියෙල කිරීම/ප්‍රධාන බිල්පත්‍රය සැකසීම.

- දිවයින පුරා ලං.වි.ම. ගොඩනැගිලිවල 28 කට අළුත්වැඩියාවන් හා වැඩිදියුණු කිරීමේ කටයුතුවලට ලඝු ලේඛන සහ ප්‍රමාන බිල්පත් පිළියෙල කර ඇත.

වැඩ ආශ්‍රිත ලං.වි.ම. වත්කම් කළමණාකරණය

- සිවිල් කටයුතු ශාඛාවේ ඇති SISL මිණුම් පිඹුර භාවිතා කරමින් ලං.වි.ම. ට අයත් ඉඩම්වල දත්ත රැස් කිරීම.
- කොළඹ මින්නිදෝරු දෙපාර්තමේන්තුවේ උපකාර ඇතිව කොළඹ නගර සීමාව ඇතුලත ලං.වි.ම. අයත් ඉඩම් කට්ටි 378 ක් මැනීම සිදු කරනු ලැබීය.

මූලස්ථාන නඩත්තු ඒකකයට අයත් රාජකාරි

- ලං.වි.ම. මූලස්ථානය හා අයත් විවිධ ශාඛාවන්හි බලශක්ති අමාත්‍යංශයට අයත් ගොඩනැගිල්ලේ සහ බලශක්ති අමාත්‍යංශයට අයත් නිළ නිවාසවල අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු සිදු කිරීමේ වගකීම සිවිල් නඩත්තු ඒකකයට පැවරී ඇත.

ආරක්ෂක අංශය

බලාගාර සහ ජලාශය ඇතුලු සියළු ලං.වි.ම. ගොඩනැගිලි සහ පරිශ්‍රයන්ගේ ආරක්ෂක ක්‍රමවේදය පිළිබඳ වගකීම ලං.වි.ම. හි ආරක්ෂක අංශයට පැවරී තිබේ.

ජනනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම වෙනුවෙන් ආරක්ෂක ඒකක තුනක් ලං.වි.ම. හි සෑම ප්‍රධාන අංශයක්ම ආරක්ෂාව සඳහා ක්‍රියාත්මක වේ. ඉහත ප්‍රධාන ඒකක 3 ක් යටතේ උප ආරක්ෂක ඒකක 98 ක් ක්‍රියාත්මක වේ. සමහර ලං.වි.ම. පරිශ්‍රයන්හි ක්‍රියාත්මක වන පෞද්ගලික ආරක්ෂක සේවාවන්ද ආරක්ෂක අංශය මගින් අධීක්ෂණය හා නිරීක්ෂණය කරනු ලබයි. ආරක්ෂක අංශයේ ප්‍රධාන කළමණාකරණ ආරක්ෂක අංශය යටතේ සේවය කරන නියෝජ්‍ය කළමණාකරු ආරක්ෂක, ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරීන් තිදෙනෙකු, ආරක්ෂක නිලධාරීන් 20 දෙනෙකු ඇතුලත් ආරක්ෂක නිලධාරීන් 762 දෙනෙක් සමන්විත කාර්ය මණ්ඩලයකින් මෙම අංශය සමන්විත වේ.

ආරක්ෂක නිලධාරීන් සඳහා පුහුණුව

අවි භාවිතය, ගින්නෙන් ආරක්ෂා වීම, මුදල් ගනුදෙනු ස්ථාන සහ ප්‍රභූ නිවාස රාජකාරි, හදිසි ආපදාවලදී එම ස්ථානවලින් මහජනයා ඉවත් කිරීම සහ එස් 5 සංකල්පය පිළිබඳ විශේෂ පුහුණුවක් 2011 වර්ෂයේදී ආරක්ෂක නිළධාරීන්ට ලබා දුනි.

ආයතනික ක්‍රමෝපාය අංශය

ව්‍යාපාරික හා මෙහෙයුම් ක්‍රමෝපාය

තම ආයතනයට සුප්‍රකට තුලිත ලකුණු පත නම් කළමණාකරණ අංගය ආදේශ කිරීමට ලං.වි.ම. මගින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති අතර තුලිත ලකුණුපත් ක්‍රමය පද්ධතියේ උපාය මාර්ග කළමණාකරණ ආයතනය ලෙස විශේෂයෙන් නම් කරන ලද උපාය මාර්ග කළමණාකරණ කාර්යාලය ලෙස බලය ලත් ආයතනය ලෙස ආයතනික ක්‍රමෝපාය අංශය පත්කර තිබේ. අංශ හතරක් තුලින් මූලික කාර්ය සාධන සුචක මාලාවක් ලෙස තුලිත ලකුණුපත් ක්‍රමය, ලං.වි.ම. සංවිධාන කාර්යසාධනය පාලනය කෙරෙනු ඇත. මෙම ක්‍රමවේදය සොයා ගත් ආචාර්ය ඩේවිඩ්සන් නෝටන් සහ රොබට් කැප්ලන් යන අය මගින් ඩුබායි හා රියාද් හි පවත්වනු ලබන තුලිත ලකුණුපත් සංසදය සඳහා සහභාගි වීමට ආයතනික ක්‍රමෝපාය අංශය මගින් විධායක නිලධාරීන් කණ්ඩායම් දෙකක් යවා ඇත. එම සංසද වලින් ලබාගත් දැනුම උපයෝගීකර ගනිමින් ලං.වි.ම. තුල තුලිත ලකුණුපත් ක්‍රමය ක්‍රියාත්මක කිරීම ආයතනික ක්‍රමෝපාය අංශය මගින් ආරම්භ කෙරිණ. ලං.වි.ම. කාර්ය මණ්ඩලය අතර තුලිත ලකුණුපත් ක්‍රමය සංකල්පය ප්‍රචලිත කිරීමට 2011 වර්ෂය තුලදී කොළඹදී හා ඉන් පිටතදී වැඩ මුළු මාලාවක් පවත්වනු ලැබීය. 2 පංතිය 1 ශ්‍රේණිය ඇතුළු ඉන් ඉහළ පංතිවල ද කාර්ය මණ්ඩලය ඇතුළු 300 කට අධික සියළුම ජ්‍යෙෂ්ඨ ලං.වි.ම. විධායක නිලධාරින් දැනුවත් කිරීම මෙම වැඩමුළු මගින් ආවරණය විය. සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත තුලිත ලකුණුපත් ක්‍රමය තුලිත ලකුණුපත් කණ්ඩායමේ උපකාර ඇතිව ප්‍රධානතම විශේෂඥයන් සියල්ලන්ගෙන් සමන්විත ඉංජිනේරු හා මූල්‍ය විධායක නිලධාරීන්ගෙන් සෑදුනු ලං.වි.ම. හි තුලිත ලකුණුපත් ක්‍රමය ප්‍රධාන මෙහෙයුම් කමිටුවේ සහයෝගයද ඇතිව සංවිධානයේ උපාය මාර්ග සිතියම හා මූලික කාර්ය සාධක සුචක (KPI) තීරණය කිරීම සඳහා දැනුම බෙදා දීමේ සැසිවාර රැසක් ආයතනික ක්‍රමෝපාය අංශය මගින් පවත්වනු ලැබීය. 2011 වර්ෂය අවසාන වන විට ආයතනික තුලිත ලකුණුපත කෙටුම්පත් ස්වරූපයෙන් සූදානම් විය.

සංවිධානය තුල ඵලදායිතාව සහ සංයුක්තභාවය වැඩි දියුණු කිරීම සඳහා සංවිධාන සරල බැවින් එය වඩාත් පුළුල් කිරීමේ අරමුණින් ජපානයේ එස් 5 ක්‍රමය යොදා ගැනීමේ වැදගත්කම ආයතනික ක්‍රමෝපාය අංශය මගින් අවබෝධ කරගෙන තිබේ. ව්‍යාපාරික ඒකක එස් 5 ක්‍රමය යොදාගැනීම සඳහා උනන්දු කරවීමට එක් එක් ඒකකය හඳුනාගෙන ත්‍යාග ප්‍රදානය කරන අන්දමින් තරගයක් පැවැත්වීම ආයතනික ක්‍රමෝපාය අංශය මගින් සංවිධානය කරනු ලැබීය. මෙම තරගය ලං.වි.ම. කාර්ය මණ්ඩලයට උද්යෝගයක් ලබා දුන් අතර දිවයිනේ සියළු ශාඛා/ඒකක පාහේ එයට සහභාගි විය. එය වාර්ෂික ක්‍රියාකාරකමක් ලෙස අඛණ්ඩව සිදු කිරීමට නියමිතය.

තම විදුලිබල පරිභෝජන ඉතිහාසය පරික්ෂා කිරීම වැනි නව අංග හඳුන්වා දෙමින් 2011 වසරේදී ආයතනික ක්‍රමෝපාය අංශය මගින් නව ලං.වි.ම. සංයුක්ත වෙබ් අඩවියක් සංවර්ධනය කර වැඩිදියුණු කරනු ලැබීය. 2012 වසරේදී ලං.වි.ම. මගින් අවසන් කර හඳුන්වා දීමට බලාපොරොත්තු වන මාර්ග ගත බිල්පත් ගෙවීමේ අවස්ථාව ඉදිරියේදී මෙම වෙබ් අඩවිය මගින් සැලසෙනු ඇත.

ආයතනික ක්‍රමෝපාය සහ නියාමන කටයුතු

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම සමග හා එක් එක් පළාත් තුළදී ලං.වි.ම. වෙත ලබාදෙන ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ බලපත්‍ර ආශ්‍රිත ඒවා තුලින් පැනනගින ගැටළු සම්බන්ධීකරණය කිරීම ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු අංශය සිදු කරයි.

SLEA යටතේ 2010 වසරේ ජූලි මසදී ලංකා විදුලිබල මණ්ඩලය මගින් තම ප්‍රථම බහු වාර්ෂික ආදායම් අවශ්‍යතා ගොනු කිරීම සිදු කෙරිණි. 2010 ජූලි මසදී ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම මගින් හඳුන්වා දුන් අය ක්‍රමවේදයට අනුව 2011-2015 කාල සීමාව සඳහා බලපත්‍ර වලට ආදායම් අවශ්‍යතා ගොනු කිරීමද අවශ්‍ය විය. ව්‍යවස්ථාදායක උපදේශණ ක්‍රියාවලියට අනතුරුව 2011 ජනවාරි සිට ක්‍රියාත්මක වනපරිදි ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම මගින් නව විදුලිබල අයක්‍රම ප්‍රකාශයට පත්කරනු ලැබීය. එලෙස ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම මගින් ප්‍රකාශයට පත්කල අයක්‍රම මගින් 2011 වර්ෂයේ ලං.වි.ම. ආදායම් අතර රු.බිලියන 11 ක අන්තරයක් පනවනු ලැබීය. ඉන් අනතුරුව අතිවිශේෂ අයක්‍රම පැනවීම 2011 අගෝස්තු මස සිදු කරන ලද අතර ඒ සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම තීරණය ලැබීමට නියමිතය.

ලං.වි.ම. හි පහත සඳහන් ආයතනික ලේඛන මුද්‍රණය කිරීමේ කාර්යය මෙම අංශය මගින් සිදු කරන ලද අතර එම කාර්යය වර්ෂය තුලදී සිදු කර අවසන් කරනු ලැබීය.

- ආයතනික සැලැස්ම 2009 - 2013
- වාර්ෂික වාර්තාව - 2010
- සංඛ්‍යා ලේඛන සංග්‍රහය - 2010

2011 වර්ෂය තුලදී පහත ලේඛන සකස් කර අවසන් කිරීම සඳහා ආයතනික ක්‍රමෝපාය සහ නියාමන කටයුතු ශාඛාව ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම සමග ඉතා සමීපව වැඩ කටයුතුවල නිරත විය.

- බෙදා හැරීමේ වාර්තාව
- කාර්ය සාධනය පිළිබඳ නියාමන ප්‍රමිතීන්
- ජාලක කෙටුම්පත් වාර්තාව

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම මගින් අනුමත කල කොටස් තුනක අයක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා සියලු තොග සැපයුම් කරුවන්ට බහුකාර්ය මීටර ලං.වි.ම. මගින් සවිකර දුන් අතර එය වසරේ මුල් භාගයේ සිදුකර අවසන් විය.

එම වසර තුලදීම පුත්තලම ගල් අගුරු බලාගාරයක් පළමුවන අදියර (300 මෙ.වො.) සහ යාපනය අර්ධද්වීපයේ ලං.වි.ම. මගින් පවත්වාගෙන යන කුඩා හුදෙකලා උත්පාදන බලාගාර ලං.වි.ම. වෙත දැනටමත් ප්‍රදානය කර ඇති උත්පාදන බලපත්‍රයට ඇතුලත් කරනු ලැබීය.

තොරතුරු තාක්ෂණය

ඕනෑම කර්මාන්තයක් සඳහා නිවැරදි සහ කාලානුරූපී තීරණ ගැනීම සඳහා ප්‍රධාන අවශ්‍යතාවයක් වනුයේ ඉක්මන් සහ නිවැරදි තොරතුරු ලබා ගැනීමේ අවශ්‍යතාවයයි. තොග පාලනය, ගණන් තැබීම් කටයුතු (MITFIN) සහ මානව සම්පත් කළමණාකරණය (HRMIS) යන පහසුකම් සැලසීම සඳහා ප්‍රධාන ව්‍යාපෘති දෙකක් ආරම්භ කිරීමට නියමිතය. 2011 වර්ෂය තුලදී MITFIN වැඩ සටහන ස්ථාන හයක පිහිටුවනු ලැබීය. ඒ අතර තුරදී සේවා සැපයීමේ මාදිලිය SPS ආයතනය තුල සාර්ථකව සංවර්ධනය කරන ලද අතර MITFIN හා සම්බන්ධ කරනු ලැබීය. SPS ද ස්ථාන හයක සවිකරනු ලැබීය. නව පාරිභෝගික ගිණුම් විවෘත කිරීමට ගතවන කාලය මෙමගින් අඩුකර තිබේ.

පාරිභෝගිකයින් සඳහා වඩා හොඳ සේවාවක් ලබා දීමටත් කළමණාකරණයට කාලීන විශ්ලේෂනාත්මක තොරතුරු ලබා දීමටත් විදුලිසැරය වැඩසටහනට සමගාමීව කොළඹ නගරයේ සහ බස්නාහිර පළාත උතුරු ප්‍රදේශයේත් ආයතනය මගින් සංවර්ධනය කල ඒ සියළුඇමතුම් මධ්‍යස්ථාන වල ක්‍රියාත්මක කරනු ලැබීය

ආයතනික ක්‍රමෝපාය අංශය

නුවරඑළිය හා කැළණිය ප්‍රදේශයන්හි නව විකුණුම් කවුළු (POS) කාර්යාල විවෘත කරනු ලැබීය. නුවර එළිය ප්‍රදේශයේ පාරිභෝගික සබඳතා කළමණාකරණ පද්ධතියක් පිහිටුවනු ලැබීය.

මීටර් දුරස්ථ සන්නිවේදන ක්‍රමයට අනුව කියවනු ලබන බස්නාහිර පළාත දකුණ II සහ වාරියපොල යන ප්‍රදේශයන්හි තොග සැපයුම් පාරිභෝගිකයින් ඉලෙක්ට්‍රොණික බිල්පත් ක්‍රමය (ඊමේල් මගින්) හඳුන්වා දෙනු ලැබීය.

අයක්‍රම භාවිත පහසුකම් සැපයීමට තොග පාරිභෝගික බිල්පත් ක්‍රමය නවීකරණය කරනු ලැබීය.

දකුණු පළාත සඳහා නිත්‍යානුකූල නොවන විදුලි පද්ධතියක් පරිභෝජන තොරතුරු කළමණාකරණය සඳහා පද්ධතියක් හඳුන්වා දෙනු ලැබීය.

පාරිභෝගිකයන්ට වඩා හොඳ තත්ත්වයේ සේවාවක් ලබා දීම සඳහා සහ පාරිභෝගිකයන්ට ඇතිවන අපහසුතාවයන් අවම කිරීමට නැගෙනහිර කොළඹ ප්‍රදේශයට කෙටි පණිවිඩ අනුව විසන්ධි කිරීමේ වැඩසටහනක් හඳුන්වා දෙනු ලැබීය.

බස්නාහිර පළාත උතුර, බස්නාහිර පළාත දකුණ I, බස්නාහිර පළාත දකුණ II, වයඹ පළාත සහ නැගෙනහිර පළාත සඳහා අගරු චෙක්පත් ස්වයංක්‍රීයව හැසිරවීම හඳුන්වා දෙනු ලැබීය. මෙම පද්ධතිය මගින් ගනුදෙනුකරුවන්ට දැනුම් දීමට ගතවන කාලයත් මාස 3 සිට දින 3 දක්වා ගිණුම් හර කිරීමටත් අඩුකරන ලද අතර ගෙවීම් අතපසු කරන ගනුදෙනුකරුවන් තවදුරටත් අගරු චෙක්පත් බිල්පත් ගෙවීමට භාවිත කිරීමත් වලක්වනු ලැබීය.

ආරක්ෂාව, නිරවද්‍යතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා PAYAPC වෙතින් සෘජුවම අර්ථසාධක අරමුදල් කළමණාකරණ පද්ධතියට සේවකයින් ඇතුලත් කිරීමට මොඩියුලයක් සංවර්ධනය කරනු ලැබීය. ලං.වි.ම. අන්තර්ජාලය තුලින් මූල්‍ය තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ පහසුකම් සලසනු ලැබීය.

යොදා ගන්නා මෘදුකාංග භාවිතය පුළුල් වන විට වඩා හොඳ සන්නිවේදනයක් සඳහා අවශ්‍යතාව හා තොරතුරු ලබා ගත හැකි ප්‍රමාණය පහළ ගොස් තිබේ. එබැවින් 2011 වර්ෂය තුලදී දැනට පවත්නා සබඳතා 200 ට පෞද්ගලික ජාල සබඳතා 70 ක් එක් කරනු ලැබීය. නිරවද්‍ය හා පුළුල් ගබඩා පහසුකම් සැපයීමට ගබඩා අරාව ජාල (SAN) විසඳුමක් සහ ආපදා ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමේ (ODR) පද්ධතියක් හඳුනාගනු ලැබීය. SAN හා ODR පද්ධතිය සඳහා අවශ්‍ය පිරිවිතර පිළියෙල කරන ලද අතර සැපයුම් ආරම්භ කරනු ලැබීය.

පාරිභෝගිකයන් හා සාමාන්‍ය ජනතාවට වඩා හොඳ සේවාවක් හා තොරතුරු ලබා දීම සඳහා ලං.වි.ම. වෙබ් අඩවිය නවීකරණය කිරීමට කටයුතු ආරම්භ කරනු ලැබීය.

කොළඹ නගරයේ සහ බස්නාහිර පළාතේ (උතුර) ඇමතුම් මධ්‍යස්ථානයන්ට යටිතල පහසුකම් සැපයීම ආරම්භ කරන ලදි.

බිල්පත් තොරතුරු වැඩිදියුණු කර ක්ෂණිකව ඉහළ නැංවීමට සුපිරි විදුලි ජල වැඩසටහන යටතේ යෙදුම් මෘදුකාංග වැඩි දියුණු කෙරෙමින් පවතී. වර්තමාන බිල් පිළිබඳ පාරිභෝගිකයාට තොරතුරු ලබා ගැනීම සඳහා කෙටි පණිවිඩ පදනම් කරගත් සේවාවක් සංවර්ධනය කිරීම සිදු කෙරෙමින් පවතී.

- පිරිස් ශාඛාව
- විශේෂ විමර්ශණ ඒකකය
- නීති ඒකකය
- අභ්‍යන්තර විගණක ශාඛාව

පිරිස් ශාඛාව

මානව සම්පත්

ලං.වි.ම. මගින් සියළුම සේවකයින් සඳහා උපකාරක වැඩ කිරීමේ පරිසරයක් සැපයීම අඛණ්ඩව සිදු කල අතර පෞද්ගලික නිදහස, නිර්මාණශීලීත්වය හා වගකීම පිළිබඳ උනන්දු කරවනු ලැබීය. තම රාජකාරි ඉටු කිරීමට ඇති සීමිත සම්පත් ප්‍රමාණය මධ්‍යයේ තම සේවකයින්ගෙන් මුදුන් පමුණුවා ගත හැකි වූ අරමුණු පිළිබඳ ලං.වි.ම. ආඩම්බර වේ. පිරිස් ශාඛාව මගින් පහත ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදුකල අතර අනෙකුත් මානව සම්පත් කටයුතු ඒ ඒ ප්‍රාදේශයන්ට අයත් මානව සම්පත් ඒකක මගින් සිදු කරනු ලැබීය.

- ලං.වි.ම. ස්ථිර සේවක සංඛ්‍යාවට සේවකයින් බඳවා ගැනීම
- සේවක සංඛ්‍යා නියමයක් සහිත සේවක සංඛ්‍යාවන්ට අයත් සේවකයින්ට උසස්වීම් ලබා දීම
- ලං.වි.ම. මානව සම්පත් ප්‍රතිපත්ති සම්පාදනය
- සභාපතිවරයා සහ සාමාන්‍යාධිකාරිවරයා යටතේ ඇති ශාඛාවල සියළු සේවකයින්ගේ මානව සම්පත් පරිපාලනය

2011 වර්ෂය අවසාන විට ලං.වි.ම. හි සිටි මුළු සේවක සංඛ්‍යාව 16,192 ක් වූ අතර එම වසර තුලදී පුද්ගලයින් 1,472 ක් බඳවා ගැනීම කල අතර විශ්‍රාම යාම් නිසා සේවකයින් 646 සේවයෙන් ඉවත් විය.2011 වර්ෂයේ පාරිභෝගික සේවක අනුපාතය 2010 වසර අගදී 292 ක් වූ අගයෙන් 291 දක්වා වෙනස් වී තිබේ.

වයස් කාණ්ඩ විශ්ලේෂණය අනුව ඉදිරි වසර 5 ඇතුලත ලං.වි.ම. සේවකයින් 2883 සේවයෙන් විශ්‍රාම යනු ඇත. සේවකයන්ගෙන් 17.8% ක් වයස 55 ට වැඩි වන අතර 17.94% ක් වයස 51-55 අතර වේ. මෙමගින් පෙනී යන්නේ ලං.වි.ම. වයස්ගත වන ආයතනයක් බවත් ඉහත කියන ලද දක්ෂ සහ වෘත්තීමය මානව සම්පත් හිඟය ඇති වීම වලක්වා ගැනීමට සකසුරුවම් රැකියා ධාරාවලි සැලැස්මක් අවශ්‍ය වේ.



ලං.වි.ම. කාර්ය මණ්ඩලයේ වයස් විශ්ලේෂණය

සේවා විශ්ලේෂණ ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරනුයේ බොහෝ වසර ගණනක සේවා අත්දැකීම් සහිත මනා අත්දැකීම්වලින් පරිපූර්ණ කාර්ය මණ්ඩලයක් ලංකා විදුලිබල මණ්ඩලය සතු බවයි. සේවකයින්ගෙන් 39.9% ක් පමණ වසර 20 කට අධික අත්දැකීම්වලින් සමන්විත වූවෝ වෙති.



සේවා විශ්ලේෂණය - ලං.වි.ම. කාර්ය මණ්ඩලය

ලං.වි.ම. කාර්ය මණ්ඩල ව්‍යාප්තිය බැලීමේදී ඉන් 7.8% ක් පමණ විධායක කාර්ය මණ්ඩලයට අයත් වන අතර 56% ක් පමණ පුහුණු හා අර්ධ පුහුණු කාර්ය මණ්ඩලයට අයත් වේ.



ලං.වි.ම. සේවක ව්‍යාප්තිය

පත්කිරීම්

2011 වර්ෂය තුලදී ජ්‍යෙෂ්ඨ කළමණාකරණ ව්‍යුහයේ වෙනස්කම් කිහිපයක් ඇති විය. සාමාන්‍යාධිකාරී බී. ජයවීර මහත්මිය ලං.වි.ම. සේවාවෙන් විශ්‍රාම ගත් අතර 2011 ජුනි 9 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බී.එන්.අයි.එෆ්. වික්‍රමසූරිය මහතා ලං.වි.ම. හි සාමාන්‍යාධිකාරිවරයා ලෙස පත්කරනු ලැබීය. අතිරේක සාමාන්‍යාධිකාරී (ජනක) කේ.එස්.ජී. ජයවර්ධන මහතාද සේවයෙන් විශ්‍රාම ගත් අතර 2011 ජනවාරි 24 සිට ක්‍රියාත්මක වන පරිදි එම්.සී. වික්‍රමසේකර මහතා අතිරේක සාමාන්‍යාධිකාරී (ජනක) ලෙස පත්කරනු ලැබීය. බී.එන්.අයි.එෆ්. වික්‍රමසූරිය මහතා සාමාන්‍යාධිකාරිවරයා ලෙස පත් කිරීම නිසා ඇති වූ පුරප්පාඩුව පිරවීමට ඩී.කේ.බී.එස්. තිලකසේන මහතා අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය) ලෙස 2011 ජුනි 09 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්විය. මුදල් කළමණාකරු ලෙස කටයුතු කළ ඩබ්ලිව්.ඩී.ඒ.එස්. පෙරේරා මහතා 2011.11.10 දින විශ්‍රාම ගිය අතර එන්.ආර්. මහමුත් මෙනෙවිය ලං.වි.ම. හි මුදල් කළමණාකරු ලෙස පත් විය.

පිරිස් ශාඛාව

මානව සම්පත් ප්‍රතිපත්තිය

ලං.වි.ම. සියලු ප්‍රාදේශිකයන්ගේ පාලනය භාරව සිටින සියලු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ගෙන් සමන්විත මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව මගින් නව ප්‍රතිපත්ති සෑදීම සහ පවත්නා ප්‍රතිපත්ති නැවත පරීක්ෂාව අඛණ්ඩව සිදුකරනු ඇත.ආයතනයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම වෙත සේවකයන් උනන්දු කරවීමේ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සේවකයින්ගේ සුභසිද්ධිය වෙනුවෙන් යෝජනා ක්‍රම කිහිපයක් 2011 වසර තුලදී ක්‍රියාත්මක කෙරින. ප්‍රසාද දීමනා හා ලබා නොගත් අසනීප නිවාඩු වෙනුවෙන් දිරිදීමනා ගෙවීම් සහ විවිධ මූල්‍යමය ප්‍රතිලාභ සැලසීම මේවාට අයත් විය.

ප්‍රසාද දීමනා ගෙවීම.

පෙර වර්ෂයේ පරිදිම 2011 වසරේදීද එම පදනම යටතේම ලං.වි.ම. සේවකයින් සඳහා ප්‍රසාද දීමනා ගෙවනු ලැබීය. මේ සඳහා වැය වූ මුළු මුදල රු.511,736,194 කි.

දිරි දීමනා ගෙවීම

සේවයට නොපැමිණීම අඩු කිරීමටත් ඵලදායිතාව ඉහළ නැංවීමටත් 1984 වසරේ සිට ලබා නොගත් අසනීප නිවාඩු සඳහා දිරි දීමනා ගෙවීමේ ක්‍රමයක් ක්‍රියාත්මක විය. මෙම ප්‍රතිලාභය 2011 වසරේදී ප්‍රදානය කරනු ලැබීය. ඒ සඳහා වැය වූ මුළු මුදල රු.370,058,749 කි.

සිංහල හින්දු අළුත් අවුරුද්ද සඳහා විශේෂ අත්තිකාරම් ගෙවීම.

2011 වසරේ සිංහල හින්දු අළුත් අවුරුද්ද සැමරීම සඳහා විශේෂ අත්තිකාරම් සහ වැටුප් අත්තිකාරම් ලං.වි.ම. සේවකයින් සඳහා ලබා දුනි.

රාමසාන් උත්සවය සඳහා ලං.වි.ම. සේවකයින්ට විශේෂ අත්තිකාරම් ගෙවීම.

2011 වර්ෂයේදී ලං.වි.ම. මුස්ලිම් සේවකයින් සඳහා විශේෂ අත්තිකාරම් හා වැටුප් අත්තිකාරම් ගෙවනු ලැබීය.

කාර්ය මණ්ඩල සුභසාධනය

ලං.වි.ම. සේවකයින්ගේ සුභසාධන කටයුතු සඳහා සුභසාධන ඒකකය පිහිටුවා තිබේ. දිවයිනේ විශේෂ ස්ථානවල එනම් හැටන් සහ බණ්ඩාරවෙල වැනි සුභදායී දේශගුණික ස්ථානයන්හි සහ ආගමික නගරයන්හි එනම් අනුරාධපුරය, මින්නේරිය, මහනුවර, කතරගම සහ යාපනය යන නගරයන්හි ලං.වි.ම. නිවාඩු නිකේතන ජාලයක් මෙම ඒකකය මගින් පවත්වාගෙන යනු ලබයි. නිවාඩු අවශ්‍යතාවන් සඳහා ලං.වි.ම. බොහෝ අවස්ථාවන්හිදී ඒවා අවශ්‍ය වන බැවින් එය ලං.වි.ම. සේවකයින් ලද ප්‍රධාන ප්‍රතිලාභයකි. ඒවා පරිහරණය කරන්නන්ට උපරිම පහසුකම් සැපයීම සඳහා මෙම නිවාඩු නිකේතනයන්හි පහසුකම් අඛණ්ඩව වැඩි දියුණු කිරීම සිදු කෙරේ.

ලං.වි.ම. ක්‍රීඩා සමාජයේ කටයුතු සඳහා රු.125,000 කින් වාර්ෂිකව දායක වෙමින් ලං.වි.ම. මගින් ක්‍රීඩා කටයුතු සඳහා සේවකයන්ට දායකත්වය දක්වා තිබේ. රාජ්‍ය සේවයේ සහ ජාතික සේවා තරග වලදී මළල ක්‍රීඩා, වොලි බෝල් පාපන්දු, දැල් පන්දු, ක්‍රිකට් සහ ගෘහස්ථ ක්‍රීඩා ක්ෂේත්‍රවල ලං.වි.ම. බොහෝ ජයග්‍රහණයන් අත්පත් කර ගනිමින් ගෞරවයට පාත්‍ර වී තිබේ. 2011 වර්ෂයේ ආරම්භ කල තවත් වැදගත් ක්‍රියාකාරකමක් වූයේ 2011 වසරේ අප්‍රේල් මස සාර්ථක ලෙස අවසන් කල විදුලමු ලංකා ක්‍රීඩා උළෙලයි.

ආයතනයේ සේවකයින්ගේ ආගමික ක්‍රියාකාරකම්වලට දිරි දෙමින් ලං.වි.ම. බෞද්ධ සංගමය සහ ක්‍රිස්තියානි සංගමය වැනි විවිධ සංගම් හරහා සේවකයින් සංවිධානය කරනු ලබන වෙසක්, පොසොන් සහ නත්තල් උත්සවය වැනි උත්සව වලට ලං.වි.ම. වාර්ෂිකව දායක වේ. මෙම දායකත්වයන් සිදු කරන්නේ සෑම වසරකම ලං.වි.ම. මගින් වාර්ෂිකව සිදු කරන ක්‍රියාකාරකම් එනම් අගෝස්තු මසදී මහනුවර දළදා මාලිගාවේත් දෙසැම්බර් මස මාදැස්සාකැලේ සමන් දේවාලයේත්, ජූනි මසදී මිහින්තලයේත්, අගෝස්තු මසදී කතරගම කිරි වෙහෙරේදීත් සිදු කරනු ලබන කටයුතුවලට අමතරවය.

2011 වසරේ ආරම්භ කල විදුලමු ලංකා කලා උළෙලද වැදගත් ක්‍රියාකාරකමකි. එමගින් සියලු ලං.වි.ම. සේවකයින්ට ඔවුන්ගේ කලා ක්ෂේත්‍රයේ කුසලතා සහ හැකියාවන් විදහා දැක්වීමටත්, මුවහත් කර ගැනීමටත් අවස්ථාවක් ලැබේ.

අභාවප්‍රාප්ත ඩී.ජේ. විමසුරේන්ද්‍ර මහතාගේ 137 වැනි උපන් දිනය සැමරීම සඳහා පවත්වන ලද උත්සවවලට සමගාමීව ලං.වි.ම. සුභසාධන ඒකකය මගින් සැප්තැම්බර් 17 වන දින විමසුරේන්ද්‍ර දිනය සැමරීම සංවිධානය කරන ලද අතර නොවැම්බර් 1 වන දිනට යෙදුනු ලං.වි.ම. දිනය සැමරීම සඳහා පවත්වන ලද උත්සවයන්ට සමගාමීව සාර්ථක ලේ දන් දීමේ ව්‍යාපාරයත් සංවිධානය කරනු ලැබීය.

දුරබැහැර ප්‍රදේශයන්හි සේවය කරන සේවකයින්ගේ ගැටළු ඉවත් කිරීම සඳහා ජනක අංශයේ සියලු බලාගාර ස්ථානයන්හි මොන්ටිසෝරි පවත්වාගෙන යාමට ලං.වි.ම. අරමුදල් සපයනු ලබයි. ලං.වි.ම. මූලස්ථාන කාර්යාලයේ ප්‍රාදේශික කාර්යාලයන්හි ලං.වි.ම. සේවකයින් සඳහා අඛණ්ඩව පවත්වනු ලබන දෙමළ භාෂා පන්ති සුභසාධන ඒකකය මගින් සංවිධානය කරනු ලබයි.

දීර්ඝ කාලීන සේවය සඳහා ප්‍රදාන

දීර්ඝ කාලීන සේවය සඳහා ප්‍රදාන ලබා දෙමින් ලං.වි.ම. මගින් තම සේවකයින්ගේ විශිෂ්ඨ සේවාව අඛණ්ඩව ඇගයීමට ලක් කරයි. ශ්‍රී ලාංකිකයින්ගේ යහපත වෙනුවෙන් තම ජීවිතයේ වැඩි කොටසක් කැප කල ලං.වි.ම. සේවකයින්ට ප්‍රශංසාව පල කිරීම සහ ඔවුන් ලං.වි.ම. ප්‍රගතිය වෙනුවෙන් කල වටිනා සේවය අගය කරන බව දැනුම් දීම මෙම ප්‍රදානය මගින් සනිටුහන් කෙරේ.

රාජ්‍ය විදුලිබල දෙපාර්තමේන්තුව යටතේ සහ ලං.වි.ම. හි වසර 30 ක සේවා කාලයක් සම්පූර්ණ කල සේවකයින්ට ප්‍රධාන ලබා දෙමින් 1984

දීර්ඝ කාලීන සේවය සඳහා ප්‍රදාන 2011

පිරිස් ශාඛාව

වසරේදී දීර්ඝ කාලීන සේවාව සඳහා ප්‍රදාන ලබා දීමේ සම්ප්‍රදාය ආරම්භ විය.1991 වසරේ සිට වසර 30 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති සේවකයින්ට මෙම ප්‍රදානය ලබා දෙනු ලැබීය. 2011 වසරේදී සේවකයින් 541 දෙනෙකුට මෙම වැඩ සටහන යටතේ ප්‍රදානයන් ලබා දුනි. මෙම වැඩ සටහන මගින් මේ දක්වා ලං.වි.ම. සේවකයින් 4730 කට ප්‍රදාන ලබා දී තිබේ.

ප්‍රචාරක ඒකකය

ලං.වි.ම. හි මෙම ඒකකය මගින් ලං.වි.ම. හි විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යන්ටද සජීවී වැඩ සටහන් සඳහාද ලබා දෙන පුවත් පත් නිවේදන සම්බන්ධීකරණය කරනු ලබයි. මෙයට අමතරව ලං.වි.ම. හි ප්‍රචාරක ඒකකය මගින් ලං.වි.ම. සේවකයින්ට තම ලේඛන හැකියාවන් ඔප් නංවා ගැනීමට මග සලසමින් දෙමසකට වරක් ලංකා විදුලිබල මණ්ඩලයෙ හි (ලං.වි.ම.) නිල පුවත්පත මුද්‍රණය කරයි. මණ්ඩලයේ නිවේදනය සහ අනෙකුත් අභ්‍යන්තර ප්‍රකාශන මුද්‍රණ ලං.වි.ම. විශේෂ උත්සව අවස්ථාවන්හිදී මාධ්‍ය වැඩ සටහන් සංවිධානය කරීම මෙම ඒකක මගින් සිදු කරනු ලබන අනෙකුත් ක්‍රියාකාරකම් වේ. ලං.වි.ම. ප්‍රචාරක ඒකකය මගින් 2011 වසරේදී පහත ක්‍රියාකාරකම් සිදු කර තිබේ.

- ජාතික පුවත්පත මගින් විවිධ දැන්වීම්, පුවත්පත් අතිරේක සහ පුවත්පත් නිවේදන ප්‍රකාශයට පත් කිරීම.
- පුවත්පත් සාකච්ඡා සහ විවිධ මාධ්‍ය වැඩසටහන් සංවිධානය කිරීම.
- ජාතික මට්ටමේ ප්‍රදර්ශනයන්හිදී ලං.වි.ම. දායකත්වයන් සංවිධානය කරීම.
- විශේෂ ලං.වි.ම. උත්සවයන්හිදී සම්බන්ධීකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම.
- විවිධ නිල ප්‍රකාශන මුද්‍රණය කිරීම.

විශේෂ විමර්ශණ ඒකකය

අනවසර ලෙස විදුලිය ලබාගන්නන් සහ මනු අක්‍රමිකතා කරන්නන්ට එරෙහිව විමර්ශන කටයුතු කඩිනම් කිරීම සඳහා, කළමණාකරු (විමර්ශන) යටතේ විශේෂ විමර්ශන ඒකකය 1995 වසරේ දී ස්ථාපිත කර ඇත.

මෙම විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා වැටලීම් කණ්ඩායම් 18 ක් දිවයින පුරා යොදවා ඇත.

2011 වර්ෂය තුල විශේෂ විමර්ශන අංශයේ ප්‍රගතිය :-

මහේස්ත්‍රාත් අධිකරණ වෙත	
ඉදිරිපත් කර සාර්ථක වූ මනුපිළිබඳ නඩු	- 2,157
කොකු පිළිබඳ සාර්ථක නඩු	- 778
උසාවි දඩ (මනු හා කොකු සඳහා)	- රු. 32,996,711.70
අයකර ගන්නා ලද ලං.වි.ම. අලාභය	
(මනු හා කොකු සඳහා)	- රු. 199,519,376.66

වංචනික ලෙස කටයුතු කර ඇති ලං.වි.ම. සේවකයින් පිළිබඳ විවිධ මාර්ග වලින් ලද තොරතුරු අනුව මූලික විමර්ශන පවත්වා ඒ අනුව විනය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කිරීම ද ඉහත දැක්වූ කාරණා වලට අමතරව විශේෂ විමර්ශන අංශය විසින් සිදු කරනු ලැබේ.

නීති ඒකකය

නීති අංශය ලං.වි.ම. හා සම්බන්ධ සියලු නීත කටයුතු සහ නඩු හා සම්බන්ධ කටයුතු නීති අංශය මගින් මෙහෙයවනු ලබයි. ප්‍රධාන නීති නිළධාරි, නීති නිලධාරීන් පස් දෙනෙකු සහ කාර්යාල කාර්ය මණ්ඩලයෙන් නීති අංශය සමන්විත වේ. උසාවි නඩු (1) ලං.වි.ම. මගින් ගොනු කල නඩු (II) ලං.වි.ම. ට විරුද්ධව ගොනු කල නඩු, ඇතුලත් නඩු සම්බන්ධ කටයුතු ප්‍රධාන වශයෙන් නීති අංශය මගින් මෙහෙයවනු ලබයි.

පළමු වර්ගයට අයත් වනුයේ:

(අ) මීටර දෝෂ/ අනවසර මීටර වෙනස් කිරීම් නිසා විසන්ධි කිරීම්/ප්‍රතිශෝධනයන්වලින් පසුව හිඟ මුදල් පියවා ගැනීම.

(ආ) ගිවිසුම්/කොන්ත්‍රාත් උල්ලංඝනය කිරීම නිසා පැන නගින ගැටළු

(ඇ) ලං.වි.ම. දේපල/වාහනවලට සිදුවන අලාභහානි පියවා ගැනීම

(ඈ) ලං.වි.ම. නිවාස / ඉඩම් අත්පත්කර ගැනීම පියවා ගැනීම

දෙවන වර්ගයට අයත් වනුයේ:

(අ) විසන්ධි කිරීම්, බිල්පත් ප්‍රතිශෝධනයන්ට එරෙහිව පියවර ගැනීම.

(ආ) තෙවන පාර්ශවයේ දේපළ හරහා විදුලි රැහැන් ඇදීම/එම දේපළවලට අයත් ඉඩම්, ශාක/ශාක වගාව ආදියට සිදුවන අලාභ හානි සඳහා වන්දි ඉල්ලීමට එරෙහිව පනවන තහනම් නියෝග/අත්හිටුවීමේ නියෝග

(ඇ) ක්‍රියාවලිය කඩ කිරීම/උල්ලංඝනය, අලාභ හානි සඳහා වන්දි ඉල්ලීම් සම්බන්ධ ටෙන්ඩර්/කොන්ත්‍රාත් කටයුතු

2011 වර්ෂයේදී පහත උසාවි කටයුතු මෙම අංශය මගින් සිදු කර තිබේ.

උසාවිය	**නඩු සංඛ්‍යාව**
මහාධිකරණය	12
අභියාචනාධිකරණය	35
සිවිල් අභියාචනාධිකරණය	5
ඉහළ උසාවිය	12
දිස්ත්‍රික් උසාවිය	165
කම්කරු උසාවිය	9
කර්මාන්ත උසාවිය	3
මහේස්ත්‍රාත් අධිකරණය	2

පහත සඳහන් අධිකරණ මණ්ඩලය මගින් සේව්‍ය සේවක ආරාවුල්, සේවය අවසන් කිරීම පිළිබඳ ගැටලු, සේවය අත්හැර යාම හා සේවකයින්ගේ දුක්ගැනවිලි පිලිබඳ විමසා පවත්නා නීති රීති අනුව වියදම් ලබා දී ගැටළු නිරාකරණය කර තිබේ.

- කම්කරු අධිකරණ මණ්ඩලය
- කම්කරු දෙපාර්තමේන්තුව
- මානව අයිතිවාසිකම් කොමිසම
- කර්මාන්ත උසාවිය

මෙයට අමතරව චෝදනා පත්‍ර, නිශ්චිත බඳවා ගැනීමේ කොන්දේසි පිලිබඳ පත් කිරීමේ ලිපි හා ඒ ආශ්‍රිත ලිපි ලේඛන නීති අංශය මගින් පරීක්ෂා කරනු ලැබේ.

ලං.වි.ම. ප්‍රධාන ව්‍යාපෘති සඳහා විදේශ සමාගම්, මෙරට සමාගම් සහ පුද්ගලයින් සමග ඇති කර ගන්නා ගිවිසුම්, කොන්ත්‍රාත් විශාල සංඛ්‍යාවක්ද, එසේම මූල්‍ය ගිවිසුම්, වාණිජ ගිවිසුම්, බලශක්ති මිලයට ගැනීමේ ගිවිසුම් ඇතුලත් ලං.වි.ම. හි අනෙකුත් අවශ්‍යතාවන් සඳහාද එම ලිපි ලේඛන නිත්‍යානුකූලව සකසා ඇති බව තහවුරු කර ගැනීමට මෙම අංශය මගින් ඒවා පරීක්ෂාවට ලක් කෙරේ.

නොතාරිස් කටයුතු

(i) ලං.වි.ම. එහි අවශ්‍යතාවන් සඳහා ගොඩනැගිලි/ඉඩම් බද්දට ලබා ගත් විට මෙම අංශය එම බදු ගිවිසුම් පරීක්ෂාවට ලක් කෙර්.

(ii) ලං.වි.ම. බාහිර පාර්ශවයන්ගෙන් දේපල මිලදී ගත් අවස්ථාවන්හිදී හුවමාරු ඔප්පු පරීක්ෂාවට ලක්කර තිබේ.

නීති උපදෙස්

ලං.වි.ම. සියලු කටයුතු සඳහා නීති උපදෙස් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

බේරුම් කිරීම

1995 අංක 11 දරණ බේරුම්කරණ පනතේ කොන්දේසි අනුව ලං.වි.ම. හා බාහිර පාර්ශවයන් අතර ඇතිවන ආරවුල් බේරුම් කිරීම සිදු කෙරේ. නෛතික අංශය මගින් අවස්ථා හතරකදී මැදිහත් වීම් සිදු කර තිබේ.

අභ්‍යන්තර විගණක ශාඛාව

ආයතනයටම අයත් අභ්‍යන්තර විගණක ශාඛාවක් ලං.වි.ම. ආයතනය සතුව ඇති අතර ප්‍රධාන අභ්‍යන්තර විගණක එහි ප්‍රධානියා වන අතර දිවයින පුරා පිහිටි ලං.වි.ම. ශාඛාවන්හි විගණන කටයුතු සිදු කරන නිලධාරීන් (49) දෙනෙකුගෙන් සමන්විත විගණන කාර්ය මණ්ඩලයක්ද ඇත.

අභ්‍යන්තර විගණක ශාඛාවේ ප්‍රධාන අරමුණ වනුයේ සමස්ථ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ ස්වාධීනව සහතික වීම සහ නීති රෙගුලාසි සහ ලං.වි.ම. මගින් ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රියාදාමයන්ට අනුගත වන බවට සහතික වීමය.

දැනට පවත්නා පාලනයේ කාර්යක්ෂම හා සාර්ථක ක්‍රියාකාරිත්වය ඇගයීම ලං.වි.ම. හි අභ්‍යන්තර විගණක ශාඛාව මගින් සිදු කරන අතර මෙය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශද අවශ්‍ය තැන්හි නව පාලන ක්‍රම හඳුන්වා දීමද සිදු කරයි.

2011 වර්ෂය තුළදී දෛනික විගණන, පද්ධති සමාලෝචන විගණන සහ විශේෂ පරීක්ෂණ වැනි ක්ෂේත්‍ර ආවරණය කරමින් අභ්‍යන්තර විගණන වාර්තා 85 ක් නිකුත් කර තිබේ. මේ පිළිබඳව කළමණාකරණයේ ප්‍රතිචාරය බෙහෙවින් ධනාත්මක විය.

මණ්ඩලයට අවශ්‍ය කළ මූල්‍ය ප්‍රකාශ, අභ්‍යන්තර පාලන ක්‍රම වේද, ගණන් තැබීමේ ප්‍රතිපත්ති සහ අනෙකුත් ආශ්‍රිත කටයුතු පිළිබඳ අභ්‍යන්තර හා බාහිර විගණන ගැටලු විගණන ශාඛා 2 මගින් සමාලෝචනය විය. මෙම සමාලෝචනයන්හිදී කමිටුව මගින් සාකච්ඡා කළ වැදගත් ගැටළු අධ්‍යක්ෂක මණ්ඩලයේ අවධානයට හා ඒ පිළිබඳ පියවර ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබීය. 2011 වර්ෂයේදී විගණන කමිටු රැස්වීම් 6 ක් පැවත්වූ අතර සාකච්ඡා කරන ලද කරුණු මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබීය.



මූල්‍ය තොරතුරු

මූල්‍ය අංශය	106
මූල්‍ය සමාලෝචනය	107
අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව	109
ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය	110
ඒකාබද්ධ ශේෂ පත්‍රය	111
සමූහය-ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය	112
මණ්ඩලයේ-ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය	114
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය	116
මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්	117
විගණකාධිපති වාර්තාව	159
විගණකාධිපති වාර්තාවට පිළිතුරු	177

මූල්‍ය අංශය

ලංකා විදුලිබල මණ්ඩලයේ සමස්ථ මෙහෙයුම් ක්‍රියාවලියේ ප්‍රධානතම භූමිකාව මූල්‍ය අංශය මේ.

දෛනික මෙහෙයුම් බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට සම්පත් කලමණාකරණය මනා ලෙස සිදු කිරීමට ලං.වි.ම. හි මූල්‍ය අංශය සක්‍රි හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීමේ වාසියකි.

සාර්ථක සැලසුම්කරණය හා දැඩි අයවැය පාලනය යාන්ත්‍රනය තුලින් අරමුදල් කලමණාකාරයේ කාර්යක්ෂම බව පැහැදිලි විය. වඩා හොඳ පොලී අනුපාතිකයන් ලබා ගැනීම සඳහා බැංකු සමඟ අඛණ්ඩ සබඳතා පවත්වනු ලැබේ.මෙයට අමතරව සේවකයින්ගේ ඵලදායි බව ශක්තිමත් කිරීමට මෙම අංශයට එස් 5 සංකල්පය හඳුන්වා දුන් අතර එය ක්‍රියාත්මක වෙමින් පවතී.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තා (IFRS) ප්‍රමිතීන් හා ඉදිරියට යාම 2011 වර්ෂයේදී මූල්‍ය අංශයට ඇති වූ විශාලතම අභියෝගය විය.(IFRS) හි මෙම නව අභිසරණය නිසා ප්‍රයිස් වෝටර් හවුස් කූපර් යන පිලිගත් ආයතනයන්හි සහයෝගය ලබා ගැනීමට තෝරා ගෙන ඇති අතර නව වාර්තා කිරීමේ ප්‍රමිතීන්ට අනුව සිදුවන ප්‍රධාන වෙනස්කම් හා අවශ්‍යතාවන් පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම ගණකාධිකාරීවරුන් සඳහා වැඩමුළු කිහිපයක් පවත්වනු ලැබීය.

දිවයින පුරා ව්‍යාප්ත අංශ හා ශාඛාවන් සහිත විශාල ඒකකයක් ලෙස නියමිත දිනයන්ට අවශ්‍ය තොරතුරු සැපයීම මගින් ආයතනික අවශ්‍යතාවන් සපුරා ලීමට අමතරව ලං.වි.ම. මූල්‍ය අංශයට නියමිත දිනයට විගණකාධිපතිවරයාට වාර්ෂික මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීමටට හැකි විය.

පවත්නා වර්ෂය තුලදී ආදායම් එකතු කිරීම, වැඩි දියුණු කිරීම අඛණ්ඩව සිදු විය. ලං.වි.ම. හි එකතු කිරීමේ නියෝජිතයින් ලෙස පෞද්ගලික අංශයේ සංවිධාන කිහිපයක්ම පත්කරනු ලැබීය.

නිළධාරීන්ගේ දැනුම හා අත්දැකීම් ඉහල නැංවීමට මෙරට හා පිටරට නව පුහුණු හා වැඩමුළු පවත්වනු ලැබීය. විශේෂයෙන්ම ලං.වි.ම. ගණන් තැබීමේ ක්‍රමයට අලුතින් එක් වූ ගල් අඟුරු ක්‍රියාකාරීත්ව ගණන් තැබීම පිලිබඳවය. ගල් අඟුරු ගණන් තැබීමේ ක්‍රම හා පද්ධති පිළිබඳ පුහුණුවීම සඳහා කණ්ඩායමක් ඉන්දියාවට යවනු ලැබීය. තවද, ලං.වි.ම. කලමණකරණය මගින් උපාය මාර්ග කාර්ය සාධන කළමණාකරණයේ නව සංකල්පයක් වන තුලිත ලකුණු පත් ක්‍රමය හඳුන්වා දෙනු ලැබීය. ගණකාධිකාරීවරුන් ක්‍රියාකාරී ලෙස මෙම වැඩසටහන්වලට සහභාගි වූ අතර මේ පිළිබඳ විදේශ පුහුණුවීම්වලටද සහභාගි විය.

ලං.වි.ම. සේවක අර්ථසාධක අරමුදල

විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල 1958 අංක 15 දරණ අර්ථ සාධක අරමුදල් පනතේ විධි විධානවලට අනුකූලව පෞද්ගලික අර්ථ සාධක අරමුදලක් ලෙස ක්‍රියාත්මක වේ. එය සාමාජිකයින් 8 දෙනෙකුගෙ න් සමන්විත කළමණාකරණ කමිටුවකින් පාලනය කෙරේ. ලං.වි.ම. හි සභාපති එහි නිළ සභාපති වන අතර සාමාන්‍යාධිකාරීවරයා ලං.වි.ම. හි නිළ නියෝජ්‍ය සභාපති වේ. මූල්‍ය කළමණාකරු හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා (පුද්ගල)අනෙකුත් නිළ සාමාජිකයින් වේ. අනෙකුත් සාමාජිකයින් 4 දෙනා මණ්ඩලය මගින් නම් කරනු ලැබේ.

2011 වර්ෂයේ මෙම අරමුදලට දායක කල මුදල රු.මිලියන 1,485 ක් වූ අතර ඉන් රු.මිලියන 594 ක් මණ්ඩලයේ සේවකයින් මගින් ලබා දී ඇත.

2011 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට අරමුදලට එකතු වූ මුළු මුදල රු. මිලියන 30,725 ක් වූ අතර පෙර වර්ෂයේ ප්‍රමාණයෙන් 8.96% ක ඉහල යාමකි. වර්ෂය තුල මෙම අරමුදල ආයෝජන මගින් රු.මිලියක 2206 ක ආදායමක් ඉපයූ අතර 2011 වර්ෂය සඳහා 11.50% ක ලාභාංශයක් ප්‍රකාශයට පත්කර තිබින. නිවාස සෑදීම සහ අනෙකුත් කටයුතු සඳහා සාමාජිකයින්ට ප්‍රදානය කල ණය රු.මිලියන 1,590 ක් විය.

මෙම වර්ෂය තුලදී සේවයෙන් විශ්‍රාම ලත් සාමාජිකයින්ට රු.මිලියන 2,182 ක මුදලක් ආපසු ලබා දුනි.

විශ්‍රාම අරමුදල

මෙම අරමුදලේ ප්‍රතිලාභීන් වනුයේ ලං.වි.ම. ආයතනයට වසර 20 කට වඩා සේවය කල විශ්‍රාම ලත්නිලධාරීන්ය. ලං.වි.ම. හි සිදු කල සේවාවට අනුව විශ්‍රාම යන අවස්ථාවේ ලබමින් සිටි වැටුපෙන් 30% සිට 34% දක්වා ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් මෙයට අදාල වේ. විශ්‍රාමිකයාගේ අභාවයෙන් පසු තවදුරටත් මෙම අරමුදලින් ප්‍රතිලාභ ලබා දීම අත්හිටුවනු ලැබේ.

විශ්‍රාමික සේවකයින් 515 මෙම වසර තලදී විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට සුදුසුකම් ලත් අතර විශ්‍රාමිකයින් 60 දෙනෙකු මරණයට පත් විය. මෙම වසර අවසාන වන විට අතීත සහ වර්තමාන මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 5010 ක් විය.

2011 දෙසැම්බර් 31 වන විට මෙම අරමුදලේ දළ වත්කම් ප්‍රමාණයේ වටිනාකම රු.මිලියන 11,738 ක් විය. අරමුදලේ ආයෝජනවලින් වර්ෂය තුලදී ලබා ගත් ආදායම රු. මිලියන 1,026 ක් විය.

මූල්‍ය අංශය

මූල්‍ය සමාලෝචනය

පොදු

2011 වර්ෂයේදී මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය අයහපත් විය. වර්ෂය තුළදී පොත්වල පෙන්නුම් කරන අලාභය රු.මිලියන118,795 සිට රු.මිලියන 138,778 දක්වා ඉහළ ගියේය. මෙම අයහපත් තත්ත්වයට ප්‍රධාන හේතුව වූයේ වර්ෂය පුරා පැවති ප්‍රමාණවත් නොවූ වර්ෂාපතනය නිසා ජල විදුලි උත්පාදනය පහත වැටීමත් ඉන්ධන මිල ඉහළ යාමත්ය. 2010 වර්ෂය හා සංසන්දනය කරන විට ඒකක මිලියන 1,012කින් ජල විදුලිබල උත්පාදනය පහත වැටීමක් (18% ක පහත වැටීමක්) වාර්තා වූ අතර 2010 වර්ෂය හා සංසන්ධනය කරන විට 36% කින් තාප උත්පාදනය ඉහළ නැගීමක්ද වාර්තා විය. මෙම සාධක හේතුකොටගෙන ඇති වූ අර්බුදය නිසා විකුණුම් පිරිවැය 31% ඉහළ ගියේය. කෙසේ වුවද, වාරික ණය සහ අයිරාවන්හි පොළී අනුපාතික පහත වැටීම නිසා පෙර වසර හා සළකා බලන විට මෙම වසරේ මූල්‍ය පිරිවැය 30% කින් අඩු කිරීමට මණ්ඩලයට හැකි විය.

මෙහෙයුම්

පෙර වර්ෂය හා සංසන්දනය කරන විට සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ පිරිවැටුම 9.32% ක් ඉහළ විය. මෙම වර්ෂයේදී ඒකක මිලියන 10,023ක් අලෙවි කළ අතර එය පෙර වර්ෂයේ ඒකක මිලියන 9.268 ක් වූ අගය 8.1% කින් ඉහළ යාමකි.

මූල්‍ය සංසරණය

දළ මූල්‍ය සංසරණයෙන් විශාල ලාභයක් ලබා ගැනීමට මණ්ඩලයට හැකි වූ අතර එමගින් අයහපත් මූල්‍ය ශේෂය එම වර්ෂයේදී සිට රු.මිලියන 1178 දක්වා රු. මිලියන 3.102 කින් අඩු කිරීමට හැකි විය. කෙසේ වුවද, වෙළඳ හා අනෙකුත් ගෙවීම් ශේෂ රු.මිලියන 26,082 කින් ඉහළ ගිය අතර ඉන් රු.මිලියන 8,814 ක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා වූ අතර රු.මිලියන 11,109 ක් පුද්ගලික අංශයෙන් ලබාගත් ජනන සඳහා වේ.

ණයට ගැනීම.

2010 රු.මිලියන 174,264 ක් වූ මළු දිගුකාලීන ණය 2011 දී රු.මිලියන 192,746 ක් දක්වා වැඩි විය.

ස්ථාවර වත්කම්

ප්‍රධාන වශයෙන් සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ වත්කම් ඉහල යාම නිසා දේපල පිරියත සහ උපකරණවල මුළු වටිනාකම 18% කින් වැඩි විය. සමාලෝචිත වර්ෂයේ බෙදාහැරීමේ ක්ෂේත්‍රයේ වර්ධනය පහත වගුවෙන් දැක්වේ.

වර්ෂය තුලදී දායක ප්‍රාග්ධනය සහ තැන්පතු රු.මිලියන 38,938 ක දළ වැඩිවීමක් පෙන්නුම් කරමින් මුළු වත්කම් අගය රු.91,021 කින්ද, මුළු බැරකම් අගය රු.මිලියන 52,082 කින්ද වැඩි විය. මහජන බැංකුවේ වෙනම රක්ෂණ එස්ක්‍රෝ අරමුදල පවත්වා ගනිමින් මණ්ඩලය තම වත්කම් රක්ෂණය කරන අතර එයට වාර්ෂිකව ස්ථාවර වත්කම්වලින් 1% අරමුදල් සැපයේ. පෙර වර්ෂයේ අගය වූ රු.මිලියන 3,710 හා සංසන්ධනය කරන විට සමාලෝචිත වර්ෂය අවසානයේදී මෙම අරමුදල රු.මිලියන 4,027 ක් විය.

	2011	2010	2009
බෙදාහැරීමේ උප මධ්‍යස්ථාන	22,839	21,930	21,319
MV රැහැන් කි.මී.	27,590	26,684	25,212
LV රැහැන් කි.මී.	108,886	104,153	99,445
සේවා සම්බන්ධතා ප්‍රමාණය	4,717,448	4,480,423	4,280,168

සමූහ ගිණුම්

සමූහ ගිණුම් පිලියෙල කර ඇත්තේ මණ්ඩලයේ ගිණුම් වලට අමතරව එහි පරිපාලිත සමාගම් වන ලංකා විදුලි පුද්ගලික සමාගම, එල්.ටී.එල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම සහ ලංකා කෝල් සමාගම යන පරිපාලන සමාගම් වල ගිණුම් ඒකාබද්ධ කිරීමෙනි.

ලාභය සහ අලාභය	**2011 රු.මිලියන**	**2010 රු.මිලියන**	**2009 රු.මිලියන**	**2008 රු.මිලියන**	**2007 රු.මිලියන**
පිරිවැටුම	132,460	121,226	110,518	111,287	87,575
සෘජු වියදම	(152,427)	(116,168)	(118,186)	(145,713)	(108,355)
දල ලාභය (අලාභය)	(19,967)	5,058	(7,668)	(34,426)	(20,780)
පරිපාලන වියදම්	(2,013)	(1,851)	(2,870)	(1,487)	(1,534)
මෙහෙයුම් ලාභය (අලාභය)	(21,980)	3,207	(10,538)	(35,913)	(22,314)
අනෙකුත් ආදායම්	4,543	4,230	4,273	3,581	9,205
පොලී අයකිරීම්	(1,827)	(2,605)	(3,412)	(1,537)	(1,703)
බදුවලට පෙර ලාභය/(අලාභය)	(19,265)	4,831	(9,338)	(33,869)	(14,812)
ශේෂ පත්‍රය					
මුළු වත්කම්	696,388	605,367	516,021	465,296	417,610
ප්‍රාග්ධන හා සංචිත	320,253	281,314	275,208	270,176	275,648
වලංගු නොවන ණය	254,100	229,128	141,883	110,419	94,774
වලංගු ණය	122,034	94,923	98,930	84,700	47,189
මුදල්	(1,178)	(3,102)	(4,039)	(2,261)	(3,915)
අලෙවිය (GWH)	10,023	9,263	8,441	8,418	8,276
උත්පාදන (GWH)	11,528	10,689	9,882	9,901	9,815

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

2011 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂයට අදාළ ඒකබද්ධ මූල්‍ය ප්‍රකාශනය සහ වාර්තාවද ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත්කරනු ලැබේ.

වැදගත් ක්‍රියාකාරකම් සහ ව්‍යාපාර සමාලෝචනය

විදුලි බලය නිෂ්පාදනය කිරීම, ලබාගැනීම, සම්ප්‍රේෂණය කිරීම, එලදායී ලෙස බෙදාහැරීම සහ අලෙවිය මණ්ඩලයේ ප්‍රධානතම ක්‍රියාකාරකම් විය.

මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේදී ලංවිම වෙනුවෙන් පිරිවැටුමෙහි 9.3% වර්ධනයක් සටහන්විය. සමාලෝචිත වර්ෂය තුළ දී රු. මිලියන 19,265 ක ශුද්ධ අලාභයක්ද සටහන් විය.

ආයෝජන

ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ කොටස් වලින් 55.2%, එල්.ටී.එල්. හෝල්ඩිං (පුද්) සමාගමේ කොටස්වලින් 63% ක් සහ ලංකා කෝල් (පුද්) සමාගමේ කොටස් වලින් 60% ප්‍රමාණයක් සඳහා ද ලංකා විදුලිබල මණ්ඩලය මුදල් ආයෝජනය කර ඇත.

2011/2012 මූල්‍ය වර්ෂය සඳහා එල්.ටී.එල්. හෝල්ඩින් (පුද්) සමාගම විසින් රු. මිලියන 300 ක ලාභාංශයක් ප්‍රකාශයට පත්කොට තිබේ. 2011 වර්ෂය සඳහා ලාභාංශ වශයෙන් රු. මිලියන 189 ක් ලබාගන්නා ලදී.

ස්වයං රක්ෂණ සංචිතය

ලංකා විදුලි බල මණ්ඩලය එහි ස්ථිර වත්කම් සඳහා ඔවුන් විසින්ම රක්ෂණයක් පවත්වාගෙන යන්නේය. වර්ෂ අවසානයේදී නැවත තක්සේරු කරන ලද දළ ස්ථිර තක්සේරුව සඳහා වාර්ෂිකව 0.1%ක අදාළකරගැනීම් (appropriate) කරනු ලැබේ. මෙම රක්ෂණයේ දැනට පවතින මුදල් ප්‍රමාණය ශේෂ පත්‍රයට අනුව රු. මිලියන 4,027 ක් වේ.

දේපළ, යන්ත්‍ර උපකරණවලට

පසුගිය වසරේදී එකතු කරන ලද රු. මිලියන 25,730 සමග සසඳන විට මෙම වරෂයේදී දේපළ, යන්ත්‍ර උපකරණ ලෙස ප්‍රාග්ධන වත්කම සඳහා රු. මිලියන 17,223ක් එකතු කරන ලදී. මෙම එකතු කිරීම් ප්‍රධාන වශයෙන් සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් ක්ෂේත්‍රයට අදාල විය.

ණයට ලබා ගැනීම්

පොලී සහිත ණය ලබා ගැනීමේ පසු ගිය වර්ෂයේ රු. මිලියන 184,243 ක්වූ අතර එයට එරෙහිව මණ්ඩලයේ පොලී සහිත ණය ලබා ගැනීම් රු. මිලියන 201,062 ක් විය.

2011 වර්ෂයේ මණ්ඩලයේ සාමාජිකයින්

2011.06.06 දක්වා ලංකා විදුලි බල මණ්ඩලයේ සභාපති වශයෙන් විද්‍යා ඩිල්රුක් අමරපාල මහතා කටයුතු කලේය. ලංවීමේ සහායක සමාගම් වන ලෙකෝ අධ්‍යක්ෂ මණ්ඩලය සහ එල්. ටී. එල්. හෝල්ඩින් (පුද්) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේද සේවය කළේය.

උප සභාපති ඩග්ලස් ප්‍රේමරත්න මහතා ක්‍රියාකාරී අධ්‍යක්ෂ ප්‍රදීප් රොෂාන් ගුණවර්ධන මහතා සහ මණ්ඩලයේ සාමාජික අමිල ජයසිංහ මහතාද 2011.06.06 වැනි දින සේවයෙන් ඉල්ලා අස්වී තිබේ. පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් දොස්තර වයි. ඩී. නිහාල් ජයතිලක, මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ මහජන ව්‍යාවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දොස්තර බී. එම්. එස්. බටගොඩ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩබ් ඩී. ජයසිංහ සහ මහත්වරුන් 2011 වර්ෂය සඳහා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් රැඳී සිටියේය.

2011.06.06 වැනි දිනයේදී නව සාමාජිකයින් පත්කරනු ලැබුවෝය. මහාචාර්ය විමලධර්ම අභයවික්‍රම මහතා සභාපති වශයෙනුත් උප සභාපති ලෙස ඉන්ජිනේරු ඩබ්. ඩී. අනුර සේනක විජයපාල මහතාත්, ක්‍රියාකාරී අධ්‍යක්ෂක ලෙස පී. පී. ගුප්තසේන මහතාත් පත්කරු ලැබුවෝය. 2011.07.25 වැනි දින සිට ක්‍රියාත්මක පරිදි කේ. ඩී. රණසිංහ මහතාද මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත්කරනු ලැබීය.

අර්ථසාධක අරමුදල් සහ විශ්‍රාමික අරමුදල්

මණ්ඩලය විසින් තම සේවකයින් සඳහා ස්වාධීන අර්ථසාධක අරමුදල් සහ විශ්‍රාමික අරමුදලක් පවත්වාගෙන යන්නේය.

ආයෝජන මගින් ලංවිම අර්ථසාධක අරමුදල විසින් 2011 වර්ෂයේදී රු. මිලියන 3,377 ක ආදායමක් උපයන ලද අතර 11.5% ලාභාංශයක්ද ප්‍රකාශයට පත්කරන ලදී. 2011 වර්ෂයේ විශ්‍රාමික අරමුදල් ආයෝජනය මගින් ලබාගත් ආදායම රු. මිලියන 1,045 ක්වේ.

සේවකයින්

වර්ෂ අවසානයේදී සේවක සංඛ්‍යාව 16,192 ක් වූ අතර පාරිභෝගික/සේවක මුළු එකතුවෙහි අනුපාතය 2011 වර්ෂයේදී 291 ක් විය.

විගණනයකයින්

1971 වර්ෂයේ අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන වලට අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනය විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලදී.

විගණන කමිටුව

සමාලෝචන වර්ෂයේදී විගණන කමිටුව විසින් රැස්වීම් හයක් පවත්වා 2010 සහ 2011 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂයට අදාල විගණකාධිපතිවරයාගේ වාර්තාව සම්බන්ධයෙන් කටයුතු කර කලමණාකරනය සඳහා අභ්‍යන්තර විගණන වාර්තාවන් ලබා දෙන ලදී. ආදායම් ණයගැති තොගය, ඉඩම් සහ ගොඩනැගිලි යනාදී අභ්‍යන්තර පාලනමය කරුණු සම්බන්ධයෙන් ප්‍රතිකර්ම ක්‍රියාකාරකම් පිළිබඳව කමිටුව විසින් අවධානය යොමු කරන ලදී.

ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		සමූහය		මණ්ඩලය	
	සටහන	2011 රු.'000	2010 රු.'000 යළිප්‍රකාශිත	2011 රු.'000	2010 රු.'000 යළිප්‍රකාශිත
ආදායම	3	149,633,788	129,894,502	132,459,860	121,226,432
විකුණුම් පිරිවැය		(163,624,671)	(119,868,532)	(152,427,470)	(116,168,481)
දළ ලාභය / (අලාභය)		(13,990,884)	10,025,970	(19,967,610)	5,057,951
වෙනත් ආදායම් සහ ලාභ	4.1	4,673,008	4,336,190	3,968,638	3,672,134
බෙදාහැරීමේ පිරිවැය		(79,423)	(105,908)	-	-
වෙනත්		(230,991)	(255,873)	-	-
පරිපාලන වියදම්		(3,773,242)	(3,736,562)	(2,013,589)	(1,850,634)
මූල්‍ය ආදායම්	4.2	1,443,985	881,300	574,849	557,713
මූල්‍ය වියදම්	5	(2,084,747)	(3,057,971)	(1,827,830)	(2,605,179)
බදු ගෙවීමට පෙර ලාභය / (අලාභය)	6	(14,042,295)	8,087,146	(19,265,542)	4,831,985
ආදායම් බදු වියදම	7	(131,201)	(4,931,181)	-	(4,500,000)
බදු ගෙවීමට පසු ලාභය / (අලාභය)		(14,173,496)	3,155,965	(19,265,542)	331,985
සුළු කොටස් හිමි අයිතිය		(2,454,654)	(1,419,295)	-	-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය)		(16,628,150)	1,736,670	(19,265,542)	331,985

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

ඒකාබද්ධ ශේෂ පත්‍රය

2011 දෙසැම්බර් 31 දිනට

	සටහන	සමූහය 2011 රු.'000	සමූහය 2010 රු.'000 යළිප්‍රකාශිත	මණ්ඩලය 2011 රු.'000	මණ්ඩලය 2010 රු.'000 යළිප්‍රකාශිත
ජංගම නොවන වත්කම්					
දේපල, පිරියත හා උපකරණ තක්සේරුව අනුව	8	593,030,313	502,995,637	580,934,990	491,599,667
පරිපාලිත සමාගම්වල ආයෝජන	10	-	-	736,902	736,902
වෙනත් ආයෝජන	11	2,928,631	3,814,514	150,000	-
පරිපාලන ණය ගැනිම්		570,000	570,000	-	-
විලම්භිත බදු වත්කම්		-	4,712	-	-
රක්ෂණ සංචිතවල ආයෝජන	12	4,027,412	3,710,485	4,027,412	3,710,485
අස්පෘශ්‍ය වත්කම්		1,327	1,915	-	-
මුළු ජංගම නොවන වත්කම්		**600,557,683**	**511,097,263**	**585,849,304**	**496,047,054**
ජංගම වත්කම්					
භාණ්ඩ තොග	13	21,172,863	18,645,058	18,916,632	16,669,168
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	14	92,351,227	93,437,410	88,515,121	89,271,818
සම්බන්ධිත පාර්ශවලින් ලැබිය යුතු මුදල්	15	-	-	1,627,537	1,831,493
ආයෝජන - වෙනත්	11	13,688,004	7,404,851	-	-
ලැබිය යුතු ගෙවූ බදු		234,608	470,672	-	-
මුදල් හා බැංකු ශේෂ	26	3,099,871	3,078,053	1,479,258	1,546,976
මුළු ජංගම වත්කම්		**130,546,573**	**123,036,045**	**110,538,548**	**109,319,455**
මුළු වත්කම්		**731,104,256**	**634,133,308**	**696,387,852**	**605,366,509**
ස්කන්ධය හා වගකීම්					
ප්‍රාග්ධනය හා ස්කන්ධය					
දායක ප්‍රාග්ධනය	16	96,090,404	83,311,423	96,090,404	83,311,423
සංචිත	17	367,018,036	320,550,127	362,941,162	316,799,059
රඳවාගත් ලාභ / (අලාභ)		(129,428,251)	(111,994,093)	(138,778,378)	(118,795,827)
		333,680,189	291,867,457	320,253,188	281,314,655
සුළු කොටස් හිමියන්ගේ අයිතිය		12,517,353	9,697,583	-	-
මුළු ස්කන්ධය		**346,197,542**	**301,565,039**	**320,253,188**	**281,314,655**
ජංගම නොවන වගකීම් හා විලම්භිත ආදායම්					
පොළිය සහිත ණය හා ණය ගැනීම්	18	194,138,980	175,054,426	192,746,023	174,264,109
පාර්භෝගිත තැන්පතු	19	8,162,181	7,543,940	8,162,181	7,543,940
ප්‍රතිපාදන හා අනෙකුත් විලම්භිත වගකීම්	20	3,415,793	3,357,020	2,929,959	2,929,959
විලම්භිත ආදායම්	21	53,049,814	47,081,838	50,262,392	44,390,174
විලම්භිත බදු	22	59,442	791,574	-	-
මුළු ජංගම නොවන වගකීම් සහ විලම්භිත ආදායම්		**258,826,210**	**233,828,797**	**254,100,555**	**229,128,182**
ජංගම වගකීම්					
වරණීය කොටස්		-	7,518	-	-
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතුදෑ	23	106,407,374	80,903,597	103,838,382	78,596,719
ගෙවිය යුතු ලාභාංශ		328,949	282,274	-	-
සම්බන්ධිත පාර්ශවවලට ගෙවිය යුතු මුදල්	24	-	-	2,289,004	1,447,831
පොළී සහිත ණය හා ණය ගැනීම්	18	12,891,283	11,592,554	11,006,723	9,979,122
ගෙවිය යුතු ආදායම් බදු		6,452,898	5,953,528	4,900,000	4,900,000
මුළු ජංගම වගකීම්		**126,080,504**	**98,739,471**	**122,034,109**	**94,923,672**
මුළු ස්කන්ධය හා වගකීම්		**731,104,256**	**634,133,308**	**696,387,852**	**605,366,509**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය වගකීම දරයි. මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ,

....	....	....
සභාපති	**සාමාන්‍යාධිකාරී**	**මූල්‍ය කළමනාකරු**

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යාවශ්‍යය කොටසක් වේ.
03.05.2013
කොළඹ

සමූහය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

2011 දෙසැම්බර් 31 දිනට

	දායක ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	පොදු කාර්ය සංචිත
	රු. '000	රු. '000	රු. '000	රු. '000
2010 ජනවාරි 01 දිනට ශේෂය	**73,515,582**	**17,763,539**	**299,559,111**	**1,276**
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	(2,727,696)	-
අපහරණ ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	(166,895)	-
වත්කම් ප්‍රතිශ්ඨාපන සංචිතය	-	-	-	-
ආයෝජන සංචිතය	-	-	-	-
වසරේ ලාභය / (අලාභය)	-	-	-	-
ස්වරක්ෂණ සංචිතයට මාරු කිරීම	-	-	-	-
තාප අනුපාතික සංචිතය	-	20,206	-	-
විදේශ විනිමය සංචිතය	-	19,890	-	-
විනිමය සමාහාර සංචිතය	-	(3,427)	-	-
පොදුකාර්ය සංචිතය	-	-	-	1,708
අපේක්ෂිත කොටස් විභාජනය	-	(7,409)	-	-
ප්‍රාග්ධන දායකය	-	-	-	-
ADB ණය 2043	-	-	-	-
ගල් අඟුරු බල ව්‍යාපෘතිය	-	-	-	-
2 වන බල පද්ධති ව්‍යාපෘති "ඒ" කොටස	-	-	-	-
ශ්‍රී ලංකාව ආලෝකවත් කරමු	3,211,608	-	-	-
CAARP ලංකා රජය	355,232	-	-	-
විදුලමු ලංකා විදුලිබල ව්‍යාපෘතිය	25,000	-	-	-
GOSL ප්‍රදාන	3,024,167	-	-	-
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය	1,135,000	-	-	-
මග නැගුම	211,730	-	-	-
අන්තර්ග්‍රහන බලශක්ති ව්‍යාපෘතිය	100,000	-	-	-
PSDTP ව්‍යාපෘතිය	7,846	-	-	-
PSDTP ADB ණය ව්‍යාපෘතිය	3,790	-	-	-
රඳවා ගැනීම් මුදාහැරීම	270,891	-	-	-
ශ්‍රී ලංකා ගටර් කනෙක්ෂන් ව්‍යාපෘතිය	22,229	-	-	-
JICA ව්‍යාපෘතිය	455,902	-	-	-
SIDA ව්‍යාපෘතිය	972,446	-	-	-
සාමාන්‍ය කොටස් ලාභාංශ 2008/2009	-	-	-	-
වරණීය කොටස් ලාභාංශ	-	-	-	-
කොටස් විභජනය	-	-	-	-
2010 දෙසැම්බර් 31 දිනට ශේෂය	**83,311,423**	**17,792,799**	**296,664,520**	**2,984**
2011 ජනවාරි 01 දින යළි ප්‍රකාශිත ශේෂය	**83,311,423**	**17,792,799**	**296,664,520**	**2,984**
වැරදි නිවැරදි කිරීම	-	-	(14,000)	-
වත්කම් ප්‍රතිශ්ඨාපන සංචිතය	-	-	-	-
ආයෝජන සංචිතය	-	-	-	-
වසර සඳහා ශුද්ධ ලාභය / (අලාභය)	-	-	-	-
ස්ව-රක්ෂණ සංචිතයට මාරු කිරීම	-	-	-	-
තාප අනුපාතික සංචිතය	-	12,489	-	-
විදේශ විනිමය සංචිතය	-	(7,289)	-	-
විදේශ විනිමය සමාහාර සංචිතය	-	2,052	-	-
පොදු කාර්ය සංචිතය	-	-	-	33,689
ස්කන්ධයට ගැලපූ විලම්භිත බදු	-	(40,724)	-	-
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	45,754,734	-
අපහරණ ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	(55,032)	-
රක්ෂණ සංචිතයට/යෙන් මාරු කිරීම්	-	-	-	-
AREP ව්‍යාපෘතිය	1,560,000	-	-	-
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය (ඉරානය)	5,566,289	-	-	-
CAARP ව්‍යාපෘතිය	95,902	-	-	-
IDC ව්‍යාපෘතිය	7	-	-	-
කිලිනොච්චි චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය	139,994	-	-	-
ශ්‍රී ලංකාව ආලෝකමත් කරමු	1,914,000	-	-	-
වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය	1,046,052	-	-	-
ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය 04 (ව්‍යාප්තිය)	1,160,072	-	-	-
ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය 04 (පැරණි)	1,296,666	-	-	-
නිවිදු කොටස් නිකුත්ව	-	-	-	-
පවන් දනවි කොටස් නිකුතුව	-	-	-	-
සාමාන්‍ය කොටස් ලාභාංශ	-	-	-	-
වරණීය කොටස් ලාභාංශ	-	-	-	-
	96,090,405	**17,759,327**	**342,350,222**	**36,673**

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

ක්ෂය සංචිත	වත්කම් ප්‍රතිස්ථාපන සංචිත	ආයෝජන සංචිත	ස්වයං රක්ෂණ සංචිත	රඳවාගත් ඉපැයීම්	සුළු කොටස් හිමියන්ගේ අයිතිය	එකතුව
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
23,000	**171,395**	**58,015**	**5,134,146**	**(113,114,406)**	**8,479,257**	**292,881,280**
-	-	-	-	-	2,335	(2,725,361)
-	-	-	-	166,893	-	(2)
-	18,220	-	-	(18,220)	-	-
-	-	2,515	-	(60,531)	(54,700)	(112,716)
-	-	-	-	1,736,674	1,419,295	3,155,969
-	-	-	682,589	(682,589)	-	-
-	-	-	-	(20,206)	-	-
-	-	-	-	-	18,753	38,643
-	-	-	-	-	(2,012)	(5,439)
-	-	-	-	(1,708)	-	-
-	-	-	-	-	(6,013)	(13,422)
-	-	-	-	-	1,000	1,000
-	-	-	-	-	-	-
-	-	-	-	-	-	-
-	-	-	-	-	-	-
-	-	-	-	-	-	3,211,608
-	-	-	-	-	-	355,232
-	-	-	-	-	-	25,000
-	-	-	-	-	-	3,024,167
-	-	-	-	-	-	1,135,000
-	-	-	-	-	-	211,730
-	-	-	-	-	-	100,000
-	-	-	-	-	-	7,846
-	-	-	-	-	-	3,790
-	-	-	-	-	-	270,891
-	-	-	-	-	-	22,229
-	-	-	-	-	-	455,902
-	-	-	-	-	-	972,446
-	-	-	-	-	(171,142)	(171,142)
-	-	-	-	-	(2,612)	(2,612)
-	-	-	-	-	13,422	13,422
23,000	**189,615**	**60,530**	**5,816,735**	**(111,994,093)**	**9,697,583**	**301,565,096**
23,000	**189,615**	**60,530**	**5,816,735**	**(111,994,093)**	**9,697,583**	**301,565,096**
-	-	-	-	-	-	(14,000)
-	9,892	-	-	(15,702)	5,810	-
-	-	-	-	-	-	-
-	-	-	-	(16,628,150)	2,454,654	(14,173,496)
-	-	-	-	-	-	-
-	-	-	-	(19,824)	7,335	-
-	-	-	-	-	(6,872)	(14,161)
-	-	-	-	-	1,935	3,987
-	-	-	-	(53,474)	19,785	-
-	-	-	-	-	(33,052)	(73,776)
-	-	-	-	-	256,172	46,010,906
-	-	-	-	55,032	-	-
-	-	-	772,040	(772,040)	-	-
-	-	-	-	-	-	1,560,000
-	-	-	-	-	-	5,566,289
-	-	-	-	-	-	95,902
-	-	-	-	-	-	7
-	-	-	-	-	-	139,994
-	-	-	-	-	-	1,914,000
-	-	-	-	-	-	1,046,052
-	-	-	-	-	-	1,160,072
-	-	-	-	-	-	1,296,666
-	-	-	-	-	14,667	14,667
-	-	-	-	-	470,400	470,400
-	-	-	-	-	(370,616)	(370,616)
-	-	-	-	-	(447)	(447)
23,000	**199,507**	**60,530**	**6,588,775**	**(129,428,251)**	**12,517,353**	**346,197,542**

මණ්ඩලය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	දායක ප්‍රාග්ධනය Rs. '000	ප්‍රාග්ධනය සංචිතය Rs. '000	ප්‍රාග්ධනය සංචිතය අව කරණ අරමුදල Rs. '000
2010 ජනවාරි 01 දිනට ශේෂය (යළි ප්‍රකාශිත)	**73,515,583**	**17,447,061**	**165,446**
වැරදි නිවැරදි කිරීම	-	-	-
වසර තුල කරන ලද ගැලපුම්	-	-	-
දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	-
අපහරණ ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය)	-	-	-
වර්ෂය තුල මාරුකිරීම / මාරු කිරීම්	-	-	-
ශ්‍රී ලංකාව ආලෝකමත් කරමු	3,211,608	-	-
CAARP ලංකා රජය	355,232	-	-
විදුලමු ලංකා විදුලි බල ව්‍යාපෘතිය	25,000	-	-
GOSL ප්‍රධාන	3,024,167	-	-
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය	1,135,000	-	-
මග නැගුම	211,730	-	-
SIDA ව්‍යාපෘතිය	972,446	-	-
අන්තර්ග්‍රාහක බලශක්ති ව්‍යාපෘතිය	100,000	-	-
PSDTP ව්‍යාපෘතිය	7,846	-	-
PSDTP ADB ණය - 1930 ව්‍යාපෘතිය	3,790	-	-
රඳවා ගැනීම් මුදාහැරීම	270,891	-	-
ශ්‍රී ලංකා ගටර් කනෙක්ෂන් ව්‍යාපෘතිය	22,229	-	-
JICA ව්‍යාපෘතිය	455,901	-	-
2011 දෙසැම්බර් 31 දිනට ශේෂය	**83,311,423**	**17,447,061**	**165,446**
2011 ජනවාරි 01 දිනට යළි ප්‍රකාශිත ශේෂය	**83,311,423**	**17,447,061**	**165,446**
වැරදි නිවැරදි කිරීම	-	-	-
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	-
අපහරණ ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය)	-	-	-
රක්ෂණ සංචිතයට / යෙන් මාරු කිරීම්	-	-	-
AREP ව්‍යාපෘතිය	1,560,000	-	-
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය 08 (ඉරාන)	5,566,289	-	-
CAARP ව්‍යාපෘතිය	95,902	-	-
IDC ව්‍යාපෘතිය	7	-	-
කිලිනොච්චි, චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය	139,994	-	-
ශ්‍රී ලංකාව ආලෝකමත් කරමු	1,914,000	-	-
වවුනියා, කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය	1,046,052	-	-
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය 04 (ව්‍යාපෘතිය)	1,160,072	-	-
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය 04 (පැරණි)	1,296,666	-	-
2011 දෙසැම්බර් 31 දිනට ශේෂය	**96,090,405**	**17,447,061**	**165,446**

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

ප්‍රත්‍යා ගණන සංචිතය Rs. '000	ක්ෂය සංචිතය Rs. '000	ස්ව රක්ෂණ සංචිතය Rs. '000	රඳවාගත් ඉපයීම් Rs. '000	එකතුව Rs. '000
296,260,291	**23,000**	**5,118,196**	**(118,612,116)**	**275,207,826**
-	-	-	-	-
(2,730,631)	-	-	-	(2,730,631)
-	-	-	-	-
(166,893)	-	-	166,893	-
-	-	-	331,985	331,985
-	-	682,589	(682,589)	-
-	-	-	-	3,211,608
-	-	-	-	355,232
-	-	-	-	25,000
-	-	-	-	3,024,167
-	-	-	-	1,135,000
-	-	-	-	211,730
-	-	-	-	972,446
-	-	-	-	100,000
-	-	-	-	7,846
-	-	-	-	3,790
-	-	-	-	270,891
-	-	-	-	22,229
-	-	-	-	455,901
293,362,767	**23,000**	**5,800,785**	**(118,795,827)**	**281,314,655**
293,362,767	**23,000**	**5,800,785**	**(118,795,827)**	**281,314,655**
(14,000)	-	-	-	(14,000)
45,439,094	-	-	-	45,439,094
(55,032)	-	-	55,032	-
-	-	-	(19,265,543)	(19,265,543)
-	-	772,040	(772,040)	-
-	-	-	-	1,560,000
-	-	-	-	5,566,289
-	-	-	-	95,902
-	-	-	-	7
-	-	-	-	139,994
-	-	-	-	1,914,000
-	-	-	-	1,046,052
-	-	-	-	1,160,072
-	-	-	-	1,296,666
338,732,829	**23,000**	**6,572,825**	**(138,778,378)**	**320,253,188**

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		සමූහය		මණ්ඩලය	
	සටහන	2011 රු.'000	2010 රු.'000 යළිප්‍රකාශිත	2011 රු.'000	2010 රු.'000 යළිප්‍රකාශිත
මෙහෙයුම් කටයුතු වල / වලින් යෙදවු මුදල් ප්‍රවාහයන්					
ආදායම් බදුවලට හා අතිවිශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ ලාභය		(14,042,294)	8,087,148	(19,265,542)	4,831,985
ගැලපුම්					
ක්ෂය	6	19,645,770	17,376,078	18,415,694	16,064,035
පාරිභෝගික දායකය	6	(2,155,369)	(1,885,012)	(1,853,318)	(1,632,276)
රජයේ ප්‍රදාන	6	(12,391)	(12,391)	(12,391)	(12,391)
විදේශ විනිමය ලාභය	5	-	44,216	-	-
සංවර්ධන පිරිවැය / පරිගණක දෘඩාංග ක්‍රමක්ෂය	6	588	-	-	-
ආයෝජන පොළී ආදායම	4.2	(1,116,712)	(881,300)	(385,887)	(431,713)
ආයෝජනවල ලාභාංහ ආදායම	4.2	(327,273)	-	-	-
දේපල, යන්ත්‍ර හා උපකරණ විකිණීමෙන් ලාභ / (අලාභ)	4.1	(56,437)	(103,837)	(56,437)	(103,837)
මූල්‍ය පිරිවැය	5	2,017,388	3,013,755	1,827,830	2,605,179
නොඉල්ලූ ජා.ගො.බ.		-	-	-	-
බොල් හා අඩමාණ ණය ප්‍රතිපාදනය		(326,311)	54,603	(76,228)	34,325
යල්පැනගිය හා සෙමින් වැය වන තොග සදහා ප්‍රතිපාදන		247,869	78,929	244,000	78,929
මිල විචලනය සදහා ප්‍රතිපාදන		228,809	731,296	228,809	731,296
සුන්බුන් පාඩුව		319	-	319	-
මණ්ඩලයේ දේපලවලට වූ හානි හා පාඩු		116	-	116	-
ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අලාභ	6	63,581	-	-	-
ආදායම් ප්‍රකාශනයට කපාහළ ඉඩම්	6	9,142	-	-	-
විදුලිය ණය ගිණුම හැර ලියාහල බොල් ණය		-	-	-	-
අනෙකුත් ප්‍රතිපදන	20	(1,741)	(14,682)	-	-
නිර්නය කළ ප්‍රතිලාභ සැලසුම් ප්‍රතිපාදන	20.1	401,185	598,229	320,874	522,220
අයභාර සංචිතයෙන් මාරු කිරීම්		(14,161)	38,643	-	-
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය		-	17	-	-
විනිමය සමාහාර සංචිතයට මාරු කිරීම්		3,987	(5,439)	-	-
		-	-	-	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)		**4,566,066**	**27,120,253**	**(612,161)**	**22,687,752**
තොග (වැඩිවීම) / අඩුවීම		(3,004,918)	(3,452,040)	(2,720,708)	(2,178,817)
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්වල (වැඩිවීම) / අඩුවීම		1,534,460	(53,924,242)	2,832,925	(53,346,017)
සම්බන්ධිත පාර්ශවවලින් ලැබිය යුතු මුදල් (වැඩිවීම) / අඩුවීම		-	-	203,956	(604,472)
වෙනත් ආයෝජන (වැඩිවීම) / අඩුවීම		(6,283,153)	(89,999)	-	-
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්වල (වැඩිවීම) / අඩුවීම		24,791,233	(8,676,968)	24,529,118	(6,456,144)
සම්බන්ධිත පාර්ශවවලට ගෙවිය යුතු මුදල් (වැඩිවීම) / අඩුවීම		-	-	841,174	(394,303)
මෙහෙයුම්වලින් ජනිත මුදල්		**21,603,687**	**(39,022,996)**	**25,074,305**	**(40,292,001)**
ගෙවූ මූල්‍ය පිරිවැය	5	(2,017,388)	(3,013,755)	(1,827,830)	(2,605,179)
ගෙවූ නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් පිරිවැය	20.1	(340,670)	(329,169)	(320,874)	(318,727)
ගෙවූ ආදායම් බදු		(196,931)	(311,636)	(2,000,000)	(34,185)
මෙහෙයුම් කටයුතුවලින් ලද (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ		**19,048,697**	**(42,677,556)**	**20,925,601**	**(43,250,092)**
ආයෝජන කටයුතුවලින් ලද / (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ					
දේපල, යන්ත්‍ර හා උපකරණසහ කෙරීගෙන යන					
ප්‍රාග්ධන වැඩ පවරා ගැනීම්	8	(63,701,781)	(52,777,774)	(62,469,746)	(52,372,340)
සාමාන්‍ය කොටස් ආයෝජන		(150,000)	-	(150,000)	-
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන / ඉවත් කර ගැනීම		(2,437)	54,977	-	-
ස්ථාවර තැන්පත් ආයෝජන ආපසු ගැනීම		1,038,321	(7,006)	-	-
රක්ෂණ සංචිතයෙහි ආයෝජන	12	(316,927)	(404,151)	(316,927)	(404,150)
රක්ෂණ සංචිතයෙන් ආපසු ගැනීම්		-	634,462	-	634,462
අපහරණ විකිණීමෙන් ලද මුදල්		235,036	323,883	235,036	323,883
ලද පොලී	4.2	1,443,988	881,300	385,887	431,713
ලද ලාභාංශ	4.2	(324,388)	-	-	-
ආයෝජන ආපසු අයකර ගැනීම		-	-	-	-
ආයෝජන කටයුතුවලින් ලද (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**(61,778,188)**	**(51,294,308)**	**(62,315,749)**	**(51,386,432)**
මූල්‍ය කටයුතුවලින් ලද (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහයන්					
දායක ප්‍රාග්ධනයෙන් ලැබීම්	16	12,778,981	9,796,841	12,778,981	9,795,841
ණයකර ආපසු ගෙවීම		-	-	-	-
පොලී සහිත ණය සහ ණය ගැනිම් ආපසු ගෙවීම		(6,183,486)	(5,275,276)	(5,366,491)	(4,711,400)
වරණීය කොටස් නැවත ගෙවීම		-	-	-	-
කොටස් නිකුත් කිරීමෙන් ලද මුදල්		485,067	-	-	-
පාරිභෝගික දායකය	21.1	8,848,281	7,792,813	8,450,473	7,437,138
පාරිභෝගික තැන්පතු	19	618,241	782,422	618,241	782,422
පොලී සහිත ණය හා ණය ගැනීම්	18	28,441,293	82,268,817	26,833,093	82,268,817
ගෙවූ ලාභාංශ		(324,388)	(186,207)		-
මූල්‍ය කටයුතුවලින් (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**44,663,989**	**95,179,410**	**43,314,297**	**95,572,818**
මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		**1,934,499**	**1,207,546**	**1,924,149**	**936,294**
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ		(2,550,496)	(3,758,044)	(3,102,217)	(4,038,511)
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ	26	**(615,998)**	**(2,550,496)**	**(1,178,068)**	**(3,102,217)**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

1.0 සංයුක්ත තොරතුරු

1.1 පොදු

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාපිත කර ඇත. එහි ප්‍රධාන කාර්යාලය කොළඹ 02, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ අංක 50 දරණ ස්ථානයේ පිහිටුවා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

මණ්ඩලය

වර්ෂය තුල මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ විදුලිය ජනනය, ප්‍රසම්පාදනය, සඵල බෙදාහැරීම සහ විකිණීමයි.
මණ්ඩලයේ පරිපාලිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වේ.

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලිය මිලට ගැනීම හා ගාල්ල, කළුතර, මොරටුව, කැළණිය, නුගේගොඩ, කෝට්ටේ හා මීගමුව පිහිටි සමාගමේ ශාඛා මගින් එසේ මිලදී ගත් විදුලිය සිල්ලරට ගෘහාශ්‍රිත හා කාර්මික පාරිභෝගිකයින්ට විකිනීම.

සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික)සමාගම

සංයුක්ත ව්‍යාපාරික ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම වශයෙන් සමූහයේ සමාගම්වල ආයෝජන ක්‍රියාකාරකම්වල නිරත වීම.

ලංකා කෝල් (පුද්ගලික) සමාගම

පුත්තලම් දිස්ත්‍රික්කයේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ බලශක්ති ජනනය සඳහා උසස් ප්‍රමිතියෙන් යුත්, අඩු මුදලට ගෙන්දගම් හා ගල් අඟුරු සැපයීම.

1.3 සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානය වනවිට මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 16,192 ක් විය. (2010 දී 15,366 කි.)

1.4 නිකුතුව සඳහා බලය පවරනු ලැබූ දිනය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලංකා විදුබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට 2013 මැයි 03 දින ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවකින් බලය ලබාදෙන ලදී.

2.0 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 පොදු ප්‍රතිපත්ති

2.1.1 පිළියෙල කිරීමේ පදනම

2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ඒ සමඟ ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වේ. වෙළඳපොල වටිනාකමට ප්‍රකාශ කර ඇති සමහර දේපල පිරියත හා උපකරණවල ප්‍රත්‍යාගණන අගය හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත ශ්‍රී ලංකා රුපියල් වටිනාකමින් පිළියෙල කර ඇත.

2.1.2 අනුකූලතා ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ඇතුලත් මූල්‍ය ප්‍රකාශයන් වල 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වේ.

2.1.3 ඒකාබද්ධ කිරීමේ ප්‍රතිපත්තිය

සමූහ ගිණුම්වලට ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම් වන සීමිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම, සීමිත ලංකා විදුලිය පුද්ගලික සමාගම, සීමිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම යන සීමිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් සමාගමේ සහ සීමිත ලංකා විදුලිය (පුද්ගලික) සමාගම යන සමාගම්වල පරිපාලිත සමාගම් වලද ගිණුම් ඒකාබද්ධ කර ඇත.

සීමිත එල්ටීඑල් (පුද්ගලික) සමාගමේ පරිපාලිත සමාගම් සීමිත පවන් දනවි (පුද්ගලික) සමාගම නමින් කොටසක් අයිති සමාගමක් ලෙස සංස්ථාපනය කර ඇත. ඊට අමතරව සීමිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ පරිපාලිත සමාගම් වනුයේ සීමිත එල්ටීඑල් ගැල්වනයිස් (පුද්ගලික) සමාගම, සීමිත එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්ගලික) සමාගම, සීමිත ලක්දනව් (පුද්ගලික) සමාගම, සීමිත නිව්ඳු (පුද්ගලික) සමාගම සීමිත එල්ටීඑල් එනර්ජි (පුද්ගලික) සමාගම, සීමිත නිව්ඳු අසුපිනිඇල්ල (පුද්ගලික) සමාගම සහ සීමිත ලංකා ඉන්ඩස්ට්‍රයල් ප්‍රොඩක්ට්ස් ඉන්ජිනියරිං (පුද්ගලික) සමාගමයි. මෙම සමාගම් සීමිත සමාගම් ලෙස ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර ඇති අතර, ඒවායේ ලියාපදිංචි කාර්යාලයන් කොළඹ 02, පාර්ක් රෝඩ්හි අංක 67 දරන ස්ථානයේ පිහිටා ඇත. තවද, සීමිත ලක්දනව් (පුද්ගලික) සමාගමට සම්පූර්ණයෙන් අයත් පරිපාලිත සමාගමක් වන සීමිත බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්ගලික) සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ පයනියර් සෙන්ටර්, අංක 08, සිංගප්පූරුව 628420 දරණ ස්ථානයේය. සීමිත ලක්දනව් (පුද්ගලික) සමාගම සහ සීමිත ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රඩක්ට්ස් (පුද්ගලික) සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තේ සපුගස්කන්ද ලිපිඩෙල් ඉන්ඩස්ට්‍රියල් එස්ටේට්හි වන අතර, සීමිත එල්ටීඑල් එනර්ජි (පුද්ගලික) සමාගමේ සහ සීමිත නිව්ඳු (පුද්ගලික) සමාගමේ ව්‍යාපාරික ස්ථානය බලංගොඩ බෙලිහුල්ඔය පිහිටා ඇත. සීමිත නිව්ඳු අසුපිනිඇල්ල (පුද්ගලික) සමාගමේ කාර්යාලය අරනායක පිහිටා ඇත.

සීමිත හෙළදනවි සමාගම, ලක්දනව් (පුද්ගලික) සමාගම සහ සීමිත හේමාස් පවර් (පුද්ගලික) සමාගම අතර බද්ධ ව්‍යාපාරයකි. එහි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ කොළඹ 01, බ්‍රිස්ටල් වීදියේ අංක 36 දරණ ස්ථානයේ වන අතර, ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පුත්තලම හෙළ ජනපදයේ පිහිටා ඇත. සීමිත ලංකා විදුලිය (පුද්ගලික) සමාගමේ (LECO) පරිපාලිත

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

සමාගම් වන්නේ සීමිත ලෙකො ප්‍රොපෙක්ස්ට් (පුද්ගලික) සමාගම සහ සීමිත ඇන්ට් ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාග මයි. මෙම සමාගම්වල ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ අංක 411, ඊ.එච්. කුරේ ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේය.

සීමිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 51/3, දුටුගැමුණු මාවත, දෙහිවල යන ස්ථානයේ පිහිටා ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයට, සීමිත ලංකා විදුලිය (පුද්ගලික) සමාගමට හා ලංකා කෝල් (පුද්ගලික) සමාගමට දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මුදල් වර්ෂයක් ඇති අතර, සීමිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ මුදල් වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් වේ.

කෙසේ වුවද, සීමිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ විගණකයින් විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ හුදෙක් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට සමූහයට හැකිවනු පිණිස මිස එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම සම්බන්ධයෙන් වාර්තා කිරීම සඳහා නොවන්නේය.

පරිපාලිත සමාගම්වල මුළු ලාභ හා අලාභයන් ඒකාබද්ධ ආදායම් ප්‍රකාශවල ඇතුළත් කර ඇති අතර, පිටස්තර කොටස්කරුවන්ට හිමි බදුවලට පසු ලාභ හෝ අලාභ සමානුපාතියන් ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාජිකයන්ට ආරෝපණය කරනු ලබන ලාභ හෝ අලාභ ගණනය කිරීමේදී සුළු කොටස් හිමියන්ගේ අයිතිය ශීර්ෂය යටතේ ගලපා ඇත.

මණ්ඩලයේ හා එහි සියළු පරිපාලිත සමාගම්වල සියලු වත්කම් හා බැරකම්, සමූහ ශේෂ පත්‍රයට ඇතුළත් කර ඇත. පිටස්තර කොටස්කරුවන්ගේ ශුද්ධ වත්කම්වලට ඇති හිමිකම් ඒකාබද්ධ ශේෂ පත්‍රයෙහි සුළු කොටස් හිමියන්ගේ හිමිකම යන ශීර්ෂය යටතේ පෙන්නුම් කරනු ලැබේ.

අන්තර් සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනුවලින් උද්ගතවන උපලබ්ධි නොවූ ලාභ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ඉවත් කරනු ලැබේ.

2.1.4 අනුරූපී තොරතුරු හා ගිණුම්කරණ ප්‍රතිපත්ති

අනුරූපී තොරතුරු සපයා ඇති අතර, ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතව යොදා ගනිමින් ඉකුත් වර්ෂයන්හි යොදාගත් පදනම සමඟ සංගතවන පරිදි සකස් කර ඇත. අවශ්‍යවූ විට ඉකුත් වර්ෂයට අදාල වන ගැලපීම් හා යෙදුම් සමහරක්, ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි නැවත සකස් කර ඇත.

2.2 වැදගත් ගිණුම්කරණ උපකල්පනයන්

උපකල්පනයන්

ඊළඟ මුදල් වර්ෂය තුළ වත්කම් හා බැරකම් පිළිබඳ ධාරණ අගයන්ට වැදගත් ගැළපීම් සිදු කරන ප්‍රධාන අවදානමක් සහිතවූ, අනාගත ශේෂ පත්‍ර දිනට අවිනිශ්චිතතාව පිළිබඳ ඇස්තමේන්තුවේ වෙනත් ප්‍රධාන ප්‍රභවයන් පිළිබඳ ප්‍රධාන උපකල්පනයන් මෙහි පහත විස්තර කරනු ලැබේ. වත්කම් හා බැරකම් පිළිබඳ ඒ ඒ ධාරණ අගයන් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වල දක්වා ඇත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රථිලාභ බැඳීම් සහ වර්ෂය සඳහා ආශ්‍රිත ගාස්තු නිර්ණය කරනු ලබන්නේ ජීව ගණක තක්සේරු ශිල්පීය ක්‍රමයක් යටතේ අවශ්‍ය වන උපකල්පනයන් භාවිතා කරමින්ය. වට්ටම් අනුපාතිකය අනාගත වැටුප් වැඩිවීම, කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාත ආදිය සම්බන්ධයෙන් උපකල්පනයන් යොදා ගැනීම මෙම ඇගයීමට අදාල වේ. සටහන 20.2 හි මෙය වැඩිදුරටත් විග්‍රහ කර ඇත. මෙවැනි බැඳීම්වල දිගුකාලීන ස්වභාවය හේතු කොටගෙන මෙම ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ.

2.3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.3.1 විදේශ විනිමය පරිවර්තනය

ලංකා විදුලිබල මණ්ඩලය

1969 අංක 17 දරණ ලංකා විදුලි බල මණ්ඩල පනතේ 42 වගන්තියෙහි 6 වැනි උප වගන්තිය ප්‍රකාර, ලංවිම විදේශ ව්‍යවහාර මුදල්වලින් ලැබෙන ප්‍රාග්ධනය හෝ ණය පොළිය වෙනුවෙන් විදේශ විනිමය අනුපාත උච්චාවචනය මගින් උද්ගතවන ලාභ හෝ අලාභ ගැන ගිණුම්කරණයේදී සලකා බලන්නේ නැත. එසේ කරනු ලබන්නේ ඒවා ශ්‍රී ලංකා රජය විසින් දරන බැවිනි. ලංවිම විසින් ණය ලබාගන්නා අවස්ථාවේදී එකඟවූ විනිමය අනුපාතය මත ආපසු ගෙවිය යුතු හිඟ ණය ශේෂ අගය කරනු ලැබේ.

විදේශ මුදල්වලින් කරන අනෙකුත් ගනුදෙනුවලින් උද්ගත වන විදේශ විනිමය වෙනස්කම්, ආදායම් ප්‍රකාශයේදී හඳුනාගනු ලැබේ.

සීමිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම
සීමිත ලංකා විදුලිය (පුද්ගලික) සමාගම

සමාගමේ කාර්යයන් හා මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන ක්‍රියාකාරී මුදල් වනුයේ ශ්‍රී ලංකා රුපියලයි. සියලුම විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු, ගනුදෙනුව ක්‍රියාත්මකව පවත්නා වේලාවේ පවතින විනිමය අනුපාතිකයන්ට අනුව මුලින්ම වාර්තාගත කෙරේ. විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් ගණනය කරන මූල්‍ය වත්කම් හා වගකීම් ශේෂ පත්‍ර දිනට පවතින ක්‍රියාකාරී විදේශ ව්‍යවහාර මුදල් අනුපාතය අනුව පරිවර්තනය

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

කරනු ලබේ. ඒවායින් ජනිතවන වෙනස්කම් ලාභ හෝ අලාභ ලෙස ගණන් ගැනේ.

මූල්‍යමය නොවන විෂයයන්, ඓතිහාසික පිරිවැය මත ගනුදෙනුව සිදුවන අවස්ථාවේ පැවති විනිමය අනුපාතය භාවිතා කරමින් පරිවර්ථනය කරනු ලැබේ. මූල්‍යමය නොවන විෂයයන්ගේ සාධාරණ වටිනාකම තීරණය කරනු ලබන දිනයට පවතින විනිමය අනුපාතිකයන්ට අනුව එම විෂයයන්ගේ සාධාරණ වටිනාකම තීරණය කරනු ලබයි.

ආසියානු සංවර්ධන බැංකුවේ ණය මුදල්වලින් එකිනෙකට වෙනස් විදේශ විනිමය භාවිතයෙන් ප්‍රසම්පාදනය කරන භාණ්ඩ, එම භාණ්ඩ ලද අවස්ථාවේ පවතින විනිමය අනුපාතිකයට අනුව ඇමරිකානු ඩොලර්වලට පරිවර්ථනය කරනු ලබනුයේ ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර.) හා ලෙකෝ සමාගම ගිවිසුම අත්සන් කරන දිනයට පවතින විනිමය අනුපාතිකයට අනුව වේ. ලෙකෝ විසින් ණය ආපසු ශ්‍රී ලංකා රජයට ගෙවනු ලබන්නේ ලෙකෝ හා ශ්‍රී ලංකා රජය සමඟ ගිවිසුම් අත්සන් කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාතිකයට අනුවයි. මෙම ගනුදෙනුවලින් ජනිත වන විනිමය ප්‍රතිලාභ ඉකුත් වර්ෂවලින් පැවත එන ප්‍රාග්ධන සංචිතයට මාරු කරනු ලැබේ. විදේශ මුදල් වලින් සිදු කරනු ලබන අනෙකුත් ගනුදෙනුවලින් පැනනඟින විදේශ විනිමය වෙනස්කම් ආදායම් ප්‍රකාශයේදී හඳුනා ගැනේ.

විදේශ විනිමය මෙහෙයුම්
සීමිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික සමාගම)

සීමිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමේ විදේශ පරිපාලිත සමාගම් සහ බද්ධ ව්‍යාපාරවල ශේෂ පත්‍ර සහ ආදායම් ප්‍රකාශ විදේශ ව්‍යවහාර මුදල්වලින් සිදුකරනු ලබන බවට සැලකෙන අතර, ඒවා ශ්‍රී ලංකා රුපියල්වලට නැවත පරිවර්තනය කෙරේ. ගනුදෙනුව ක්‍රියාත්මකව පවතින වේලාවේ පවතින විනිමය අනුපාතිකයට අනුව පිළිවෙලින් ශේෂ පත්‍ර දිනයට හා කාලපරිච්ඡේදයට අදාල සාමාන්‍ය වාර්ෂික හුවමාරු විනිමය අනුපාතයට අනුව එම ගනුදෙනු ක්‍රියාකාරී මුදල්වලට පරිවර්තනය කරනු ලැබේ.

එවන් පරිවර්තනයන් හේතුවෙන් උද්ගතවන විදේශ විනිමය වෙනස විදේශ අස්ථිත්වයක් අපහරණය කිරීම මත ස්කන්ධයේ වෙනම සංරචකයන්ට ගනු ලබන අතර, එකී නිශ්චිත විදේශ මෙහෙයුම ආදායම් ප්‍රකාශයට හඳුනාගැනීමට අදාලව ස්කන්ධයේදී විලම්භිත සමුච්චිත අගය පිළිගනු ලැබේ.

2.3.2 බදුකරණය

(අ) ප්‍රවර්තන බදු

ලංකා විදුලිබල මණ්ඩලය

දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව, 2011 අප්‍රේල් 01 දිනෙන් පටන් ගන්නා තක්සේරු වර්ෂයේ සිට ලංකා විදුලි බල මණ්ඩලයේ සියළුම ප්‍රභවයන්වලින් ලැබෙන ආදායම් වසර 05 කාල පරිච්ඡේදයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස්ය.

- **සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම**
- **සීමාසහිත එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්ගලික) සමාගම**
- **සීමාසහිත එල්ටීඑල් ගැල්වනයිසස් (පුද්ගලික) සමාගම**
- **සීමාසහිත එල්ටීඑල් එනර්ජි (පුද්ගලික) සමාගම**

මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනු ලබන අදායම් හා වියදම් මූලිකාංග මත ආදායම් බදු සඳහා ප්‍රතිපාදන සලසනු ලබන අතර, දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව බදු ගණනය කරනු ලැබේ.

සීමිත ලක්දනව් සමාගම

සමාගම ආරම්භ කළ නව භාරගැනීම්වල ලාභ සහ ආදායම එනම්, අධි ඉංජිනේරු ව්‍යාපෘති 2007/08 තක්සේරු වර්ෂයෙන් ආරම්භවී 2011/2012 තක්සේරු වර්ෂය දක්වා වූ වසර 05 ක කාල පරිච්ඡේදයක් සඳහා 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 17(2)(ඇ) වගන්තිය පරිදි ආදායම් බද්දෙන් නිදහස් වේ.

හදිසි අවස්ථා බලශක්ති පිරියතෙන් උද්ගතවන ආදායම් හා වෙනත් ආදායම් මත ආදායම් බදු ප්‍රතිපාදනය දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව ගණනය කෙරේ.

සීමිත නිව්ඳු (පුද්ගලික) සමාගම

ආදායම් බදු සඳහා වෙන්කිරීමේ පදනම වන්නේ මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තා කරනු ලද දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනවල අනුකූලව ගණනය කරන ලද ආදායම් හා වියදම් මූලිකාංගය මතය.

සමාගම විදුලිය ජනනය කිරීමේ හා ජාතික ජලවිදුලිබල පද්ධතියට සැපයීමේ නිරතව සිටී. කෙසේ වුවද, 2004 අංක 12 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනතේ 21 (අ) වගන්තිය ප්‍රකාරව, සමාගමේ සිදු කරන කාර්මික නිෂ්පාදනයෙන් ජනිත වන ලාභය සහ ආදායම් වසර 05 කට ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

සීමිත නිව්ඳු අසුපිනිඇල්ල (පුද්ගලික) සමාගම

1978 අංක 4 දරණ ආයෝජන මණ්ඩල නීතියේ 17 වැනි වගන්තිය ප්‍රකාරව, 2003 සැප්තැම්බර් 11 දින ආයෝජන මණ්ඩලය සමඟ එළඹි ගිවිසුමට සමගාමීව, සමාගම කුඩා ජල විදුලි උත්පාදන ව්‍යාපාර පටන්ගෙන ලාභ ඉපයීම ආරම්භවී අවුරුදු 05 ක කාලයකට බද්දෙන් නිදහස්ය. සමාගම බදු විරාමය පටන් ගනු ලබන්නේ කුඩා ජල විදුලි බල උත්පාදන ව්‍යාපාරයන් ආරම්භ කොට ලාභ ලැබීමත් සමඟම හෝ තක්සේරු වර්ෂ 02 ක් ඉක්මයාමට මත්තෙන් ව්‍යාපාරයේ වාණිජ කටයුතු ආරම්භ වීමත් සමඟම යන කවර කාර්යයක් හෝ පළමුව සිදුවීම මතයි.

ඒ අනුව 2005/2006 සහ 2006/2007 වර්ෂයන්හිදී සමාගම බදු අලාභ ලැබීමේ හේතුවෙන් 2007/2008 සිට 2011/2012 දක්වා වූ අවුරුදු 5 ක කාලයකට සමාගම ආදායම් බද්දෙන් නිදහස් වේ. ඉහත දැක්වූ සහනදායී බදු කාලය අවසන් වූ පසු ව්‍යාපෘතියේ ආදායම මත වර්ෂ දෙකක කාලපරිච්ඡේදයක් සඳහා 10% ක ප්‍රතිශතයක බද්දක් අයකරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

තවද, ඉහත සඳහන් සහනදායී බදු අනුපාතය අනුව කාලය නිමවූ පසු එළඹෙන ඕනෑම තක්සේරු වර්ෂයක් සඳහා ආයතනයේ ව්‍යාපාර ලාභයෙන් හා ආදායමෙන් සියයට 20 ක බදු අනුපාතිකය මත බද්දට යටත් වේ. කෙසේ වුවද, සමාගමේ අනෙකුත් දේශීය ආදායම් පනතේ විධි විධානයන්ට අනුකූල වන පරිදි බදු වගකීමක් ඇත.

සීමිත හෙළදනව් (පුද්ගලික) සමාගම
ආයෝජන මණ්ඩල නීතියේ 17 වැනි වගන්තිය ප්‍රකාරව 2003 අගෝස්තු 23 දින එළඹි ගිවිසුමට සමගාමීව අවුරුදු 10 ක කාලයකට බද්දෙන් නිදහස් වේ. එම නිදහස් කිරීම පටන් ගන්නේ ව්‍යාපාරයෙහි ලාභ ලැබීම ආරම්භ වීමත් සමඟම හෝ තක්සේරු වර්ෂ 02 ක් ඉක්ම යාමට මත්තෙන් වාණිජ කටයුතු ආරම්භවීම යන කවර කාර්යයක් හෝ පළමුව සිදුවීම මතය. ඒ අනුව, සමාගම 2004 සැප්තැම්බර් සිට 2014 සැප්තැම්බර් දක්වා කාලයකට බද්දෙන් නිදහස් වේ.

මෙම බදු විරාම කාලය අවසන් වීමෙන් පසු ව්‍යාපාරයේ ආදායමෙන් 15% ක ප්‍රමාණයක බදු අයකිරීමක් සිදුකළ යුතුය. කෙසේ වුවද, සමාගමේ අනෙකුත් ආදායම් දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට අනුකූල වන අන්දමින් බදු වගකීමක් ඇත.

සීමිත ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රොඩක්ට්ස් ඉංජිනියරින් (පුද්ගලික) සමාගම

දේශිය ආදායම් පනතේ 21 (අ) වගන්තිය ප්‍රකාරව ලාභ ඉපයීම ආරම්භවී තක්සේරු වර්ෂ 5 ක් හෝ වාණිජ කටයුතු ආරම්භ කර ලාභ ඉපයීම පටන්ගෙන වර්ෂ 2 ක් ඉක්මයාම හෝ ඉන් කවරක් හෝ පළමු සිදුවීම යටතේ 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනත අනුව ලාභ සහ ආදායම මත ආදායම් බදු අයකිරීම හා ගෙවීම් පැනවීම සම්බන්ධයෙන් ආදායම් හා ලාභය ව්‍යාපාරයේ ලාභය හා ආදායම ලෙස ගණන් නොගැනේ. ඒ අනුව සමාගම 2005/2006 සිට 2009/2010 වර්ෂ දක්වා ආදායම් බද්දෙන් නිදහස් වේ.

එමෙන්ම එම කාල පරිච්ඡේදය ඉකුත්වීමෙන් පසුව කාලීනව පවතින දේශීය ආදායම් පනතේ නීති ප්‍රතිපාදනවලට ව්‍යාපාරය යටත්වේ.

සීමිත බුයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්ගලික) සමාගම
සිංගප්පූරුවේ පවතින දේශීය ආදායම් පනත ප්‍රකාරව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම් මූලිකාංග පදනම් කරගෙන ආදායම් බදු බැරකම සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

සීමිත පවන් දනව් (පුද්ගලික) සමාගම
1978 අංක 4 දරණ ආයෝජන මණ්ඩල නීතියේ 17 වැනි වගන්තිය ප්‍රකාරව, 2010 ජූලි 01 වැනි දින ආයෝජන මණ්ඩලය සමඟ එළඹි ගිවිසුමට සමගාමීව සමාගම අවුරුදු 08 කාලයකට බද්දෙන් නිදහස් වේ. එම නිදහස් කිරීම පටන්ගන්නේ ව්‍යාපාරයෙන් ලාභ ලැබීම ආරම්භවීමත් හෝ තක්සේරු වර්ෂ 2 ක් ඉක්ම යාමට මත්තෙන් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භවීම යන කවර කාර්යයක් හෝ පළමුව සිදුවීම මතය.

මෙම බදු විරාම කාලය අවසන් වීමෙන් පසු ව්‍යාපාරයේ ආදායමෙන් 15% ක බදු අයකිරීමක් කළ යුතුය. කෙසේ වෙතත් සමාගමේ අනෙකුත් ආදායම් දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාර බදු වගකීමට යටත් වේ.

සීමිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම
දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාර ආදායම් බදු ගෙවීමට සමාගම යටත්වේ. බදු සඳහා වෙන් කිරීම වර්ෂයේ ලාභ මත පදනම්ව 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ ඉන් පසුව සිදු කරන ලද සංශෝධනයන් ප්‍රකාරව සිදු වන අතර, බදු ගෙවිය හැකි ආදායම මත පනවනු ලබන බදු අනුපාතය සියයට 28 ක් වේ.

සීමිත ලංකා විදුලිය (පුද්ගලික) සමාගම
ආදායම් බදු සඳහා ප්‍රතිපාදන සැලසීමේ පදනම් වන්නේ මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තා කරන ලදුව දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට අනුකූලව ගණනය කරන ලද ආදායම් හා වියදම් මූලිකාංග මතය.

ස්කන්ධයේ සෘජුව හඳුනාගන්නා ලද විෂයයන් සම්බන්ධයෙන් ප්‍රවර්තන ආදායම් බද්ද, හිමිකරු ප්‍රාග්ධනයේදී හඳුනාගනු ලබන අතර, ඒවා ආදායම් ප්‍රකාශයට ඇතුලත් නොවේ.

(ආ) විලම්භිත බදු

සීමිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම
සීමිත ලංකා විදුලිය (පුද්ගලික) සමාගම
මූල්‍ය වාර්තාකරන කාර්යය සඳහා වත්කම් හා වගකීම්වල බදු පදනම් හා ඒවායේ ධාරණ අගයයන් අතර, ශේෂ පත්‍ර දිනට තාවකාලික වෙනස්කම් සැලකිල්ලට ගනිමින් විලම්භිත ආදායම් බදු ප්‍රතිපාදනය සලසා ඇත්තේ බැර ක්‍රමය භාවිතා කරමින්ය.

ගිණුම්කරණ ලාභය හෝ බදු අයකල හැකි ලාභය හෝ පාඩුවට බලනොපාන පරිදි, ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී සහ ව්‍යාපාරික සම්බන්ධතාවක් නොමැති ගනුදෙනුවකදී වත්කම් හා බැරකම් ලෙස මූලිකව නොසලකන විලම්භිත බදු බැරකම හැරෙන්නට සියලුම කාලීන බදු වෙනස්කම් පදනම් හැරෙන්නට විලම්බිත බදු බැරකම හඳුනා ගනු ලබයි.

විලම්භිත බදු වත්කම් පිළිගනු ලබන්නේ අඩුකළ හැකි සියලු කාල වෙනස්කම් හා හිලව් නොකළ ඉදිරියට ගෙන ගිය බදු අලාභ හා අඩුකළ හැකි කාල වෙනස්කම්වලට එරෙහිව බදු අයකළ හැකි ලාභ තිබෙන පමණට හා හිලව් නොකළ ඉදිරියට ගෙන ගිය බදු අලාභ භාවිතා කලහැකි වන පමණටය. ගනුදෙනුවක් සිදුවන අවස්ථාවේදී හෝ ව්‍යාපාරික සම්බන්ධතාවයක් නොමැති ගනුදෙනුවකදී පිළිගැනෙන වත්කම් හෝ බැරකම්වලදී විලම්භිත බදු වත්කම් සම්බන්ධ ලාභ හෝ අලාභ බලනොපාන පරිදි ගනුදෙනුව සිදුවන කාලයේදී සහ ව්‍යාපාරික සම්බන්ධතාවක් නොමැති ගනුදෙනුවකදී වත්කම්

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

හා බැරකම් ලෙස මූලිකව නොසලකා විලම්භිත බදු බැරකම් හැරෙන්නට සියළුම තාවකාලික බදු වෙනස්කම් පදනම් කරගෙන විලම්භිත බදු බැරකම හඳුනාගනු ලබයි. විලම්භිත බදු වත්කම්වල ධාරණ අගයන් එක් එක් ශේෂ පත්‍ර දිනයේදී සමාලෝචනය කරන විලම්භිත බදු සියල්ල හෝ ඉන් කොටසක් උපයෝගී කර ගැනීමට සෑහෙන තරම් බදු අයකරගත හැකි නොවන පමණට අඩු කරනු ලබයි.

විලම්භිත බදු වත්කම් හා බැරකම් මනිනු ලබන්නේ බදු වත්කම් උපලබ්ධි වන හෝ බදු බැරකම් නිරවුල් කරනු ලබන අවස්ථාවන්හිදී හෝ ශේෂ පත්‍ර දිනට ක්‍රියාත්මක වන හෝ පසුකාලීනව පනවනු ලබන බදු අනුපාතිකයන් (සහ බදු නීති) අනුව වේ. ස්කන්ධ ප්‍රාග්ධන විෂයයන් සම්බන්ධිත විලම්භිත ආදායම් බදු සෘජුවම ස්කන්ධ ප්‍රාග්ධනයට හඳුනාගන්නා අතර, ඒවා ආදායම් ප්‍රකාශයට හඳුනා නොගනී.

2.3.3 ණයගැනීම් පිරිවැය

වත්කමක් එයින් අපේක්ෂිත කාර්යය හෝ විකිණීම සඳහා සූදානම් කිරීමට ගනු ලබන ප්‍රමාණවත් කාලයකින් එම වගකීම අත්පත් කර ගැනීමට ඉදිකිරීමට හෝ නිෂ්පාදනය සෘජුවම ආරෝපණය වන ණය මුදලක් නොවන අවස්ථාවලදී හැරෙන්නට ණය ගැනීමේ පිරිවැය, ඒවා සිදුවී ඇති කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

2.4 වත්කම් ඇගයීම සහ ඒවායෙහි මිනුම් පදනම්

2.4.1 භාණ්ඩ තොග

ලංකා විදුලි බල මණ්ඩලය

වැඩියෙන්ම ප්‍රයෝජනය ගන්නා හා වාර්ෂික භාණ්ඩ මිල ලැයිස්තුවේ දක්වා ඇති භාණ්ඩ විෂයයන් ප්‍රමිත මිලට අගය කර ඇති අතර, පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා අමතර කොටස් වැනි තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයකට අගය කරයි.

කෙසේ වෙතත් මණ්ඩලය ප්‍රමිත මිලට අගය කරන ලද භාණ්ඩවල උපලබ්ධි නොවූ ලාභ කොටස් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ඇත්තේ ඒවායෙහි අගය පිරිවැය දක්වා අඩුවන ලෙසටය.

සීමිත ලංකා විදුලිය (පුද්ගලික) සමාගම

භාණ්ඩ තොග අගය කර ඇත්තේ යල්පැනගිය හා සෙමින් නිකුත් වන විෂයයන් සඳහා නිසි වෙන්කිරීමකින් පසුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයටයි. ශුද්ධ උපලබ්ධි අගය යනු නිම කිරීමට ඇස්තමේන්තු කළ පිරිවැය සහ විකුණුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩුකොට සාමාන්‍ය ව්‍යාපාර කාල සීමාව තුල භාණ්ඩ විකිණිය හැකි මිලයි.

තථ්‍ය පිරිවැයට අගය කරන ලද මාර්ගස්ථ තොග හැරුණු විට, භාණ්ඩ තොග දැනට පවත්වාගෙන යන ස්ථානයට රැගෙන ඒමට සහ ඒවා එම තත්ත්වයෙන් පවත්වාගෙන යාමට දරන ලද පිරිවැය පහත සඳහන් පරිදි ගිණුම්ගත කර ඇත.

සීමිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමෙහි මෙහෙයුම් හා නඩත්තු භාණ්ඩ බර තැබූ සාමාන්‍ය පදනම මත තත්‍ය පිරිවැයට තක්සේරු කරනු ලැබේ.

සීමිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

අමුද්‍රව්‍ය	- පළමු ලැබීම් පළමු නිකුත් කිරීමේ පදනම මත තථ්‍ය පිරිවැයට
නිමි තොග සහ කෙරීගෙන යන වැඩ	- සෘජු අමුද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය හා අදාල ස්ථාවර පොදු කාර්ය පිරිවැය අනුපාතිකය
පාරිභෝගික ද්‍රව්‍ය අමතර කොටස් පිරිවැය	- පළමු ලැබීම් පළමු නිකුත් කිරීමේ පදනම මත තථ්‍ය පිරිවැයට

2.4.2 වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්

වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් දක්වා ඇත්තේ බොල් හා අඩමාන ණය වෙනුවෙන් ප්‍රතිපාදන සැලසීමෙන්පසු ශුද්ධ ලෙස උපලබ්ධි වීමට ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයටය. වෙනත් ලැබිය යුතු මුදල් හා සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් හඳුනාගෙන ඇත්තේ බොල් හා අඩමාන ණය සඳහා වෙන් කිරීමෙන් අනතුරුව පිරිවැයටයි.

වෙළඳ අයවිය යුතු මුදල් සඳහා බොල් හා අඩමාන ණය වෙන්කිරීම් ගණනය කිරීම සඳහා මණ්ඩලය පහත සඳහන් ක්‍රම අනුගමනය කරයි.

විදුලිය ණයගැතියන්

-අවසන් කළ ගිණුම් සහ බොල් ණය ලෙස හඳුනාගෙන ඇති පාරිභෝගිකයින්	100%
-අවුරුදු 1 සිට 2 ට වඩා පරිශේෂව ඇති මුදල් බොල් ණය ලෙස	10%
-අවුරුදු 2 සිට 3 ට වඩා පරිශේෂව ඇති මුදල් බොල් ණය ලෙස	20%
-අවුරුදු 3 ට වඩා වැඩි කලක් පරිශේෂව ඇති මුදල් බොල් ණය ලෙස	100%
-මාස 6 ක් ඉක්මවා සහ අවුරුද්දකට අඩු කලක් පරිශේෂව ඇති ශේෂයන් බොල් ණය ලෙස	5%

අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා බොල් ණය හා අඩමාන ණය ලෙස නිශ්චිත ප්‍රතිපාදන සලසනු ලැබේ.

2.4.3 මුදල් හා මුදල්වලට සමාන දෑ

මුදල් හා මුදල්වලට සමාන දෑ නිර්වචනය කරනු ලබන්නේ

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු හා කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජනයන් සහ අගය පිළිබඳ වෙනස්කම්වලට වැදගත් නොවන අවදානම්වලට යටත්ව මුදල් බවට ක්ෂණිකව පරිවර්තනය කළ හැකි දෑය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් හා මුදල්වලට සමාන දෑ වලට අතැති මුදල් පරිශේෂ බැංකු අයිරා අඩු කල පසු ශුද්ධ බැංකු තැන්පතු අන්තර්ගත වේ. කෙටි කාලීන වශයෙන් පරිණත වන එනම් පවරාගත් දින සිට මාස තුනකින් හෝ ඊට අඩු කාලයකින් පරිනත වන කෙටි කාලීන ආයෝජනද ඇතුළත් වේ.

2.4.4 දේපල පිරියත හා උපකරණ

(අ) පිරිවැය ඇගයීම

ලංකා විදුලි බල මණ්ඩලය

දේපල, පිරියත හා උපකරණ සඳහන් කර ඇත්තේ සමුච්චිත ක්ෂය අඩු කොට පිරිවැයට හෝ ඇගයූ මිලටය. තොග මිල දර්ශකය, ආනයන වටිනාකම් දර්ශකය සහ වර්ෂය සඳහා දළ ජාතික නිෂ්පාදිත අනුපාතිකය පිළිබඳ වෙනස්කම්වල ගණිතමය සරල සාමාන්‍ය යන කරුණු පදනම් කරගෙන ලංවිම දේපල පිරියත හා උපකරන වාර්ෂිකව නැවත ආගණනය කරනු ලැබේ.

සීමිත ලංකා විදුලිය (පුද්ගලික) සමාගම

දේපල පිරියත හා උපකරණවල සියලූ විෂයයන් මුලින්ම පිරිවැයට වාර්තා කරනු ලැබේ. පසුව සියලූ වර්ගවල වත්කම් මෙන්ම දේපල, පිරියත හා උපකරණ විෂයයන් ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. එහිදී ශේෂ පත්‍ර දිනට පවත්වාගෙන යන සාධාරණ අගයයන්, ධාරණ අගයන්ගෙන් සෑහෙන තරම් වෙනස් නොවන ලෙස ප්‍රමාණවත් අඛණ්ඩ බව තහවුරු වන පරිදි ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. වත්කමක මූලික පිරිවැය හඳුනාගැනීමෙන් අනතුරුව ප්‍රත්‍යාගණනය කළ දේපල පිරියත හා උපකරණ පසුව කරන ලද ක්ෂය අඩු කිරීමෙන් පසු ප්‍රත්‍යාගණන අගයට පෙන්නුම් කෙරේ. අනෙකුත් සියලූම දේපල, පිරියත හා උපකරණ ක්ෂය අඩු කොට ඓතිහාසික පිරිවැය මත දක්වා ඇත. 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය ආරම්භයේ සිට ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවයට අනුව සමාගමේ සැපයුම් යටිතල වත්කම් G-5 MUV දර්ශකය පදනම් කර ගෙන (ලෝක බැංකුව විසින් පළකර ඇති) හරිත සාමාන්‍ය දර්ශකය භාවිතා කරමින් වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර එම වත්කම්වල දේශීය සංරචකය එම වර්ෂයේ සිටම තොග මිල දර්ශකය අනුව ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

මූලාරම්භයේදී පළාත් පාලන / ලංවිම යන ආයතනයන්ගෙන් සීමිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම වෙත පවරා ගන්නා ලද වත්කම්, 1992 මුදල් වර්ෂය හා ඒ දක්වා ඓතිහාසික පිරිවැය මත අගය කළ අතර, ඉන් අනතුරුව ප්‍රත්‍යාගණනය කරන ලදී. ප්‍රත්‍යාගණනයෙන් ඇතිවන අතිරික්තය ප්‍රාග්ධන සංචිතයට බැර කරන ලදී. තවද, සමුච්චිත ක්ෂය ගිණුමේ ඉදිරියට ගෙන එන ලද ශේෂයන්ගේ ආශ්‍රිත වැඩිවීම නව අගයන් පිළිබිඹු වන පරිදි ගලපනු ලැබේ. පසුගිය කාලයේදි වියදමක් ලෙස හඳුනාගත් එකම වත්කමකට ඉකුත් ප්‍රත්‍යාගණන අඩුවීම ආපසු ගලපා නැතහොත්, ඡේදයේ විස්තර කර ඇති පරිදි වත්කමක් ප්‍රත්‍යාගණනය කරන විට ධාරණ අගයෙහි යම් වැඩිවීමක් ප්‍රත්‍යාගණන අතිරික්තයට සෘජුවම බැර කරනු ලැබේ. මෙවැනි අවස්ථාවන්වලදී මීට පෙර ලියාහරින ප්‍රමාණයට අදාල වැඩිවීම ආදායමක් ලෙස සැලකේ. ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් වශයෙන් වත්කමේ ධාරණ අගය අඩු වුවහොත් එකී වත්කමට මීට පෙර වූ වැඩිවීම ආපසු ගලපා නැත්නම් එකී අඩුවීම වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. එම ප්‍රමාණය ප්‍රත්‍යාගණන අතිරික්තයට අයකරනු ලබන්නේ එම අඩුවූ ප්‍රමාණය එම වත්කම වෙනුවෙන්ම ප්‍රත්‍යාගණන අතිරික්තයක් ඇතොත් පමණි. යම්කිසි වත්කමක ප්‍රත්‍යාගණන සංචිතයේ ඉතිරිවන ශේෂයක් වත්කම විශ්‍රාම ගන්වා අපහරණය කිරීමේදී සෘජුවම රඳවාගත් ඉපයීම්වලට මාරු කරනු ලැබේ.

එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

එදිනෙදා කරනු ලබන සේවා පිරිවැය අත්හැර සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අගය අඩු කොට දේපල, පිරියත හා උපකරණ පිරිවැයට සඳහන් කෙරේ. හඳුනාගැනීමේ නිර්ණායකය පැනනගී නම්, එවැනි පිරිවැයට පිරියත හා උපකරණවල කොටස් ප්‍රතිස්ථාපනයට දැරූ පිරිවැය ඇතුළත් කරනු ලැබේ.

(ආ) හඳුනා නොගැනීම

දේපල, පිරියත හා උපකරණ යන වත්කම් විෂයයක් අනාගතයේදී පරිහරණය කිරීමෙන් හෝ අපහරණය කිරීමෙන් ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකි නම් එම විෂයය පිළිගනු නොලැබේ. එසේ වත්කම් පිළිනොගැනීමෙන් පැනනගින ලාභය හෝ පාඩුව (වත්කමෙහි අපහරණයෙන් ලද ශුද්ධ ලැබීම්වල එහි ධාරණ අගය අතර වෙනස ගණනය කර) වත්කම පිළිනොගත් වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

(ඇ) යථාතත්ත්වයට පත්කිරීමේ පිරිවැය

කාර්ය සාධනය පිළිබඳ මුලින් ඇගයීම කරන ලද ප්‍රමිතයන්ට අනුකූලවන පරිදි අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ යථාතත්ත්වයට පත්කිරීමට හා පවත්වාගෙන යාමට, දේපල, පිරියක හා උපකරණ අලූත්වැඩියා හා නඩත්තු සඳහා දරන ලද වියදම් එම වියදම් දැරූ අවස්ථාවේදීම වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

(ඈ) වත්කම් හානිකරණය

බොහෝ සෙයින් තාක්ෂණික ස්වභාවයකින් යුතු ජනන යන්ත්‍ර, තරාපැවි ආදී වත්කම්වල තත්ත්වය නියාමනය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වත්කම් කළමනාකරණ ඒකක ස්ථාපිත කර ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව මුලින්ම සම්පාදනය කරන ලද දර්ශකයන් ප්‍රකාර මෙකී වත්කම් සියල්ල එක් එක් වාර්තාකරන දිනයේදී ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. එසේම ස්ථාවර වත්කම්වල වන යම් හානියක් පියවීම සඳහා රක්ෂණ එස්ක්‍රෝ (Escro) ගිණුමක්ද පිහිටුවා වත්කම්වල මුළු වටිනාකමින් 0.1% ක් සෑම වසරකදීම මෙම ගිණුමට මාරු කරනු ලැබේ. පරිපාලිත

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

සමාගම්ද එක් එක් වාර්තා කරන දිනයේදී යම්වත්කමක් හානිවීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කරයි ද යන බව තක්සේරු කරයි. එවැනි ප්‍රවනතාවයක් පෙන්නුම් කෙරේ නම් හෝ යම් වත්කමක් පිළිබඳව වාර්ෂික හානිකරණ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමක් අවශ්‍ය වේනම් වත්කමේ ආපසු අයකරගත හැකි ප්‍රමාණය අදාල සමාගම විසින් ඇස්තමේන්තු කරනු ලැබේ. ස්වාධීන වත්කමක් තීරණය කරනු ලබන්නේ විකිණීම සඳහා වන පිරිවැය අඩුකළ පසු නැත්නම් වත්කම් විකිණීමෙන් අයකර ගන්නා මුදල වැඩිනම්ය. එමෙන්ම සමූහයේ වත්කම්වලින් හෝ වෙනත් වත්කම්වලින් මුදල් ප්‍රවාහයට මුදල් ජනිත නොකරයි නම් ඒවා අනෙකුත් වත්කම්වලින් තදබල ලෙස ස්වාධීන වන ඒවා සේ සැලකේ. වත්කමෙන් ආපසු අයකරගන්නා වටිනාකම ධාරණ අගයට වඩා අඩු වේ නම් වත්කම හානිකරණය කළ යුතු සේ සලකා එහි අයකරගත හැකි වටිනාකම දක්වා කපා හරිනු ලැබේ. භාවිතයේ වටිනාකම් තක්සේරුවේදී ප්‍රවර්තන වටිනාකම් බදු වලට පෙර අනාගත වෙළඳ පොළෙහි මුදලේ වටිනාකම පිළිබිඹු විය හැකි පරිදි වත්කමේ නිශ්චිත අවදානම් අගයන් වට්ටම් කරනු ලබන අගයන්ට තක්සේරු කරනු ලබයි.

ස්කන්ධයට එකතු කරන ලද ප්‍රත්‍යාගණනයන් හා මුලින් අගය කරන ලද දේපල හැරුණු විට නිරන්තර මෙහෙයුම්වලින් වන පාඩු හානිකරණය ආදායම් ප්‍රකාශයන්හි හඳුනාගන්නේ හානිකරණයට ලක් කල වත්කම්වල අඛණ්ඩ ක්‍රියාකාරීත්වය හා වියදම් වර්ගවල ස්වභාවය අනුවය. මෙවැනි අවස්ථාවලදී ස්කන්ධයට හානිකරණය හඳුනාගන්නේ පූර්ව අවස්ථාවන්හිදී ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකමට සමාන මුදලකට පමණි.

මුලින් හඳුනාගත් හානිකරණයන් තවදුරටත් පවතීද නැතහොත් ඒවා අඩුවී ඇත්ද යන්න පිළිබඳ ඇඟවීමක් ඇත්දැයි නිගමනය කිරීම සඳහා සෑම වාර්තා කරන දිනයකදීම වත්කම් පිළිබඳ තක්සේරුවක් කරනු ලැබේ. එවැනි ඇඟවීමක් තිබේ නම් කොපමණ ප්‍රමාණයක් අයකරගත යුතු වේද යන්න සමාගම් විසින් ඇස්තමේන්තු කරනු ලබයි. පෙර හඳුනාගත් හානිකරණයන් පෙරලා වෙනස් කළ යුතු වන්නේ හානිකරණයට ලක්වූ වත්කම් වෙනුවෙන් අයකරගතයුතු ප්‍රමාණය හානිකරණයෙන් පසු නිගමනය කිරීම සඳහා උපයෝගී කරගත් ඇස්තමේන්තු වෙනස් වන්නේ නම් පමණි. එවැනි අවස්ථාවක් නම් වත්කමේ ධාරන අගය එහි අයකරගතයුතු ප්‍රමාණයට වැඩි කරනු ලබයි. පෙර වර්ෂයන් සඳහා හානිකරණයන් හඳුනාගෙන නොමැති නම්, වත්කමේ වටිනාම වැඩිවන ප්‍රමාණය ශුද්ධ ක්ෂය වූ ධාරණ අගයට වඩා වැඩි විය නොහැක. කෙසේ වුවද, මෙය බලපවත්වන්නේ පෙර වර්ෂයන්හිදී හානිකරණයේ පාඩු පිලිගෙන නැත්නම් පමණි. වත්කම් අගය අවකරණය වූ අගයන්හි නොපවතින්නේ නම්, සිදු කරනු ලබන පෙරලා වෙනස්වීම් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගන්නා අතර, ඒවා මුලින්ම සිදුකළ වෙනස්කම් ප්‍රත්‍යාගණනය නැවත වැඩි කිරීමක් ලෙස සලකනු ලැබේ.

(ඉ) ක්ෂය කිරීම

සින්නක්කර දේපල හැර, වත්කම් භාවිතය සඳහා තිබේ නම් සියලූම දේපල, පිරියත හා උපකරණවල ඇගයීම මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. බදු දේපල හා ගොඩනැගිලි වත්කමේ ඇස්තමේන්තුගත අඩුම ආයු කාලය සහ කල්බදු කොන්දේසිය අනුව ක්ෂය කරනු ලැබේ. වත්කම්වල ඇස්තමේන්තු කරන ලද ඵලදායී ආයු කාලය පහත දැක්වේ.

ලංකා විදුලි බල මණ්ඩලය	
සින්නක්කර ගොඩනැගිලි හා බදු ඉඩම් ගොඩනැගිලි	අවුරුදු 40
සිවිල් වැඩ	
වාරි මාර්ග හා වේලි	අවුරුදු 100
වානේ ජලනල සහ රැඳවුම් ජලය	අවුරුදු 40
උප බලාගාර හා පුවරු පර්යන්ත්‍ර	අවුරුදු 35
ජනන පිරියත්	
විදුලි බලාගාර හා පිරියත (ජල)	අවුරුදු 35
විදුලි බලාගාර හා පිරියත (තාප)	අවුරුදු 25
විදුලි බලාගාර හා පිරියත (ඩීසල්)	අවුරුදු 15
විදුලි බලාගාර හා පිරියත (ගෑස්ටර්බයින්)	අවුරුදු 12
සම්ප්‍රේෂණ මාර්ග කි.වො. 220, කි.වො. 132 සහ කි.වො. 66	අවුරුදු 35
බෙදාහැරීම් මාර්ග	
යටබිම අධි.බ. 33	අවුරුදු 50
යටබිම අධි.බ. 132	අවුරුදු 50
යටබිම අධි.බ. 11	අවුරුදු 40
ඉස්මත් අධි.බ.	අවුරුදු 35
යටබිම අව.බ.	අවුරුදු 40
ඉහළින් පිහිටි අව.බ.	අවුරුදු 35
එල්ටී ෆීඩර් පිලර්	අවුරුදු 35
පාරිභෝගික උපපොළ	අවුරුදු 35
HT සේවා මානය අධි. බ.	අවුරුදු 35
ප්‍රාථමික හා ග්‍රිඩ් උපපොළ	අවුරුදු 35
සේවා නඩත්තුව	අවුරුදු 35
SCADA (මධ්‍යම පහසුකම්) හා සන්නිවේදන උපකරණ	අවුරුදු 15
මෝටර් වාහන	අවුරුදු 07
මෝටර් බෝට්ටු	අවුරුදු 07
යන්ත්‍ර හා ආයුධ	අවුරුදු 05
කාර්යාල උපකරණ	අවුරුදු 05
ලී බඩු හා සවිකිරීම්	අවුරුදු 05

සීමිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

ගොඩනැගිලි	අවුරුදු 10-50
පිරියත හා යන්ත්‍රෝපකරණ	අවුරුදු 05-15
කර්මාන්ත ශාලා උපකරණ	අවුරුදු 04
අභ්‍යන්තර දිගු උපකරණ	අවුරුදු 04
ගිනි නිවීමේ උපකරණ	අවුරුදු 04
කාර්යාල උපකරණ	අවුරුදු 10
ලී බඩු හා සවිකිරීම්	අවුරුදු 03-10
මෝටර් රථ වාහන	අවුරුදු 04
උණුසුම ලබා ගැනීමේ ඒකක	අවුරුදු 06
පරිගණක මෘදුකාංග	අවුරුදු 03
භ්‍රමණිත අමතර කොටස්	තථ්‍ය භාවිත පැය ගණන

මූල්‍ය ප්‍රකාශ වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

සී/ස ලංකා විදුලිය (පුද්ගලික) සමාගම

ගොඩනැගිලි	අවුරුදු 40
බදු ඉඩම්	
කල්බදු කාල සීමාව තුල	
යටිතල පහසුකම් සැපයීම්	
උපපොළ, පළාත් පාලන ආයතනවලින් හා ලංවිමෙන් පවරා ගන්නා ලද ඉස්මත් රැහැන් සහ සේවා රැහැන්	අවුරුදු 10
ලෙකො විසින් ඉදිකරන ලද	අවුරුදු 20-25
මෝටර් රථ වාහන	අවුරුදු 7
පරිගණක	අවුරුදු 5
කාර්යාල උපකරණ	අවුරුදු 7
යන්ත්‍ර හා පිරියත	අවුරුදු 4

සී/ස කෝල් (පුද්ගලික) සමාගම

ලී බඩු හා සවිකිරීම්	අවුරුදු 5
උපකරණ	අවුරුදු 4
මෝටර් රථවාහන	අවුරුදු 4

වත්කම්වල ස්වභාවය හා එහි කාර්යයන් මූල්‍ය කල්බදු වත්කම් සම්බන්ධයෙන් එකඟවූ කාලය, පරිපාලිත හා පරිපාලක සමාගම් අතර එකිනෙක වෙනස් වේ. සමූහයේ එක සමාන වත්කම් පන්ති සඳහා ඵලදායී ජීව කාලය වෙනස් ආකාරයෙන් පවත්වාගෙන යාමට මේවා හේතු වේ.

2.4.5 ආයෝජන

දිගුකාලීන ආයෝජන

දිගුකාලීන ආයෝජන පිරිවැයට දක්වා ඇත. ආයෝජන පිරිවැයට පවරා ගැනීමේ පිරිවැය, බ්‍රෝකර් ගාස්තු, බදු සහ බැංකු ගාස්තු ඇතුළත්ය. දිගු කාලීන ආයෝජනවල ධාරණ අගය ආයෝජනවල තාවකාලික වටිනාකම හැර එක් එක් ආයෝජනයේ නිශ්චය කරන ලද පිරිහීම හඳුනා ගැනීමට අඩු කරනු ලැබේ. ධාරණ අගයෙහි තාවකාලික පිරිහීම හැර මෙම අඩුවීම් ආදායම් ප්‍රකාශයට අයකරනු ලැබේ.

ජංගම ආයෝජන

ජංගම ආයෝජන වෙළඳ වටිනාකම හෝ පිරිවැය යන දෙකෙන් අඩු මිලට ප්‍රකාශ කර ඇත. ධාරණ අගය ආයෝජන කළඹේ එකතුව පදනම් කරගෙන නිශ්චය කරනු ලැබේ.

ලංකා විදුලිය (පුද්ගලික) සමාගමේ ජංගම ආයෝජනවල ධාරණ අගය එක් එක් ආයෝජන පදනම මත නිශ්චය කරනු ලැබේ.

ජංගම ආයෝජන මත උපලබ්ධි නොවූ පාඩු, වෙළඳපොල අගයට ගෙන එනු ලැබේ. උදා . ජංගම ආයෝජන වෙළඳපොල අගයට හෝ පිරිවැයට යන දෙකෙන් අඩු අගයට පෙන්වීමේ අවශ්‍යතාවය සඳහා වෙළඳපොල අගයට අඩු කිරීම සහ එකී අඩු කිරීම් ආපසු ගැලපීමට ආදායම් ප්‍රකාශයන්ට බැර හෝ හර කරනු ලැබේ.

සී/ස එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමේ අළෙවි කළ හැකි සුරැකුම් වෙළඳපොල අගයට ප්‍රකාශ කර ඇති අතර, ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශය හරහා ගලපනු ලැබේ. භාණ්ඩාගාර බිල්පත්, ශේෂ පත්‍ර දිනට පැවති වෙළඳපොල අගයට ප්‍රකාශ කරන අතර, ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ.

ආයෝජන අපහරණය

ආයෝජන අපහරණයේදී, අපහරණයෙන් ලද මුදල් හා ධාරණ අගය අතර වෙනස ආදායම් හෝ වියදම් වශයෙන් හඳුනා ගැනේ.

2.4.6 කල්බදු

මෙහෙයුම් කල්බදු

බදුකරු විසින් අයිතිය පිළිබඳව සියළු ආවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස රඳවා තබා ගනිමින් බදු දෙන අවස්ථාවන් මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කරනු ලැබේ.

මෙහෙයුම් කල්බදු වෙනුවෙන් ගෙවන බදු කුලිය වියදමක් ලෙස සලකා අදාල බදු කාලය තුල සරල මාර්ග ක්‍රමයක් මත ආදායම් ප්‍රකාශවලට හඳුනා ගැනේ.

මූල්‍ය කල්බදු

කල්බද්ද ආරම්භ වන අවස්ථාවේදී කල්බදු වත්කම සම්බන්ධයෙන් අදාල වන සෑම ප්‍රතිලාභයක් සහ අවදානමක් මණ්ඩලය වෙත මාරු කරන ලද මූල්‍ය කල්බදු, කල්බදු වත්කමේ සාධාරණ වටිනාකම හෝ එය අඩුවේ නම් අවම කල්බදු වාරිකවල වර්තමාන අගය ප්‍රාග්ධනීත කරනු ලැබේ. වගකීමෙහි පවත්නා ශේෂය මත නොවෙනස්වන පොළී අනුපාතිකයක් සාක්ෂාත් කරගැනීම් වස් කල්බදු ගෙවීම් මූල්‍ය කල්බදු අයකිරීම් හා කල්බදු වගකීම්වල අඩුවීම අතර විභජනය කෙරේ. මූල්‍ය අයකිරීම්, මූල්‍ය ප්‍රකාශයට අයකොට එහි පෙන්නුම් කෙරේ. ප්‍රාග්ධනීත කරන ලද කල්බදු වත්කම් වත්කමෙහි ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය සහ කල්බදු කාලපරිච්ඡේදය යන දෙකෙන් කෙටි කාලපරිච්ඡේදයට ක්ෂය කරනු ලැබේ. වත්කමේහි අයිතිය පිළිබඳව සාධාරණ නිශ්චිතතාවක් නැත්නම් කල්බදු කාලසීමාව අවසානයේදී මණ්ඩලය විසින් වත්කමෙහි අයිතිය පවරා ගනු ලැබේ. ක්ෂය කළහැකි කල්බදු වත්කම්වල ක්ෂය ප්‍රතිපත්තිය, අයිතිය අනුව ක්ෂය කළ හැකි වත්කම් ක්ෂය කරන ආකාරය දැක්වෙන 2.4.4 (ඉ) ඡේදය ප්‍රකාර වේ.

2.5 බැරකම් හා ප්‍රතිපාදන

2.5.1 ප්‍රතිපාදන

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහය වර්තමානයේදී ඇතිවන ආර්ථික ප්‍රතිලාභ අඩංගු සම්පත් පිටතට ගලායාමට හේතුවන බැඳීම් (නෛතික හා සම්මුතික බැඳීම්) වෙනුවෙන් බැඳීම්වල ප්‍රමාණය අනුව විශ්වාසදායක ඇස්තමේන්තුවක් මත ප්‍රතිපාදන සලසනු ලැබේ.

මුදල්වල සඵලතා කාලීන අගයේ බලපෑම සැළකිය යුතු වේනම් ප්‍රතිපාදන තීරණය කරනු ලබන්නේ පූර්ව බදු අනුපාතිකයකට අනුව අනාගත අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙනි.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

උචිත අවස්ථාවලදී වට්ටම් කිරීම යොදාගන්නා විට වගකීමට නිශ්චිත වූ අවදානම මඟහරවා ගැනෙන පරිදි කාලය හේතුවෙන් වැඩිවන ප්‍රතිපාදනය පොළී වියදමක් ලෙස හඳුනා ගැනේ.

2.5.2 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම * පාරිතෝෂිකය

මණ්ඩලය

2011 දෙසැම්බර් 31 දක්වා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව පාරිතෝෂිත ප්‍රතිපාදන සලසා ඇත. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා පිරිවැය තක්සේරු කරනු ලබන්නේ, ප්‍රක්ෂේපිත ඒකක බැරකිරීම් ක්‍රමය භාවිතා කරමිනි. මෙම ක්‍රමය යටතේ, විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන පිරිවැය ආදායම් ප්‍රකාශයට අගය කරනු ලැබේ. එසේ කරනු ලබන්නේ සේවකයින්ගේ සාමාන්‍ය සේවා කාලය අනුව නිරන්තර සේවා පිරිවැය සේවා කාලය පුරා විහිදී යන ආකාරයෙන් සුදුසුකම් ලත් ආයුගණක තක්සේරුකරුවන් විසින් සෑම වසර තුනකට වරක් සිදු කරනු ලබන සම්පූර්ණ ඇගයීමක් මත කරන ලද නිර්දේශයන්ට අනුකූල වන පරිදිය. මෙම බැඳීම ගිණුම්කරණය සිදු කරනු ලබන්නේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ අනුව වර්තමාන වටිනාකමට 11% ක පොළී අනුපාතිකයක් භාවිතා කරමිනි. සියළුම ආයුගණක ලාභ හා අලාභ සේවකයින්ගේ ඉදිරියට ඉතිරි සාමාන්‍ය සේවා ආයු කාලය පුරාවට විහිදී යන ආකාරයට බෙදාහැර ඇත.

සීමිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

පාරිතෝෂිකය යනු නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. සමූහය, පාරිතෝෂිකය සඳහා පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන අගය මිනිනු ලැබේ. එය කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 "E" පරිශිෂ්ඨයෙහි දැක්වෙන පාරිතෝෂික සූත්‍රය අදාල කරගෙනයි. ඒ සඳහා පදනම වන්නේ එකී ප්‍රමිතයේ (2006 දී සංශෝධිත) සාකච්ඡා කර ඇති පරිදි ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමයයි. (PCU) එහිදී ආයුගණක උපකල්පනයන් භාවිතා කර තිබුණද, ආයුගණක තක්සේරුවට ආදේශකයක් ලෙසට එය නොසැලකිය යුතුය.

ආයුගණක ලාභ හෝ අලාභ එය පැන නඟින වර්ෂයේ ආදායමක් හෝ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

පාරිතෝෂික වගකීම සඳහා අරමුදල් නොසපයන අතර, ආයු ගණනය තක්සේරු නොකෙරේ. මෙම විෂයය ශේෂ පත්‍රයේ අනෙකුත් නිශ්චිත ප්‍රතිලාභ වගකීම් යටතේ වර්ග කෙරේ.

සීමිත ලංකා විදුලිය (පුද්ගලික) සමාගම

සමාගම ගිවිසගත් විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂිකය පිළිබඳව සෑම වර්ෂයකදීම වර්තමාන අගය මිනිනු ලබන්නේ ප්‍රක්ෂේපිත ප්‍රතිලාභ ඇගයීම් ක්‍රමය භාවිතා කරමින් ආයුගණක තක්සේරුකරුගේ උපදෙස් අනුවය. ආයුගණක අලාභ හෝ අලාභ ආදායම් හෝ වියදම් ලෙස හඳුනාගන්නේ සැලසුමට අදාල සහභාගීවන්නන්ගේ අපේක්ෂිත ඉතිරි සේවා කාලයේ සාමාන්‍යය මත වේ.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්
සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

ලංකා විදුලි බල මණ්ඩලය
සීමිත ලංකා විදුලිය (පුද්ගලික) සමාගම

අදාලවන ප්‍රඥප්ති හා නීතිරීතිවලට අනුකූලව යතෝක්ත අරමුදල් වලට දායකවීමට සේවකයෝ සුදුසුකම් ලබති. මණ්ඩලය / සමාගම විසින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් සේවක දළ පාරිශ්‍රමිකයෙන් 15% ක් 3% ක් වශයෙන් දායක වනු ඇත.

සී/ස එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

අදාල ව්‍යවස්ථා හා රෙගුලාසිවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකවීමට සේවකයෝ හිමිකම් ලබති. සමාගම සේවකයින්ගේ දළ ඉපයීම්වලින් 12% ක් හා 3% ක් පිලිවෙලින් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක වනු ඇත.

(ඇ) ලංකා විදුලි බල මණ්ඩලය
විශ්‍රාම අරමුදල

විශ්‍රාම අරමුදලේ ආයෝජන වෙනමම අරමුදලක රඳවා තබාගෙන ඇත. ස්වාධීන සුදුසුකම් ලත් ආයුගණකයින්ගේ නිර්දේශ පිළිබඳව සැළකිල්ලට ගෙන ලංවිම විසින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලට අරමුදල් සපයනු ලැබේ. 2009 දෙසරම්බර් මාසයේදී ආයු ගණනය වශයෙන් විශ්‍රාම අරමුදල් අගය කරන ලදී. විශ්‍රාම අරමුදලට ලංවිම දායකත්වය සිදුකරන වර්ෂයේදීම ආදායම් ප්‍රකාශයට අයකරනු ලැබේ.

2.5.3 ස්වයං රක්ෂණ සංචිතය

වර්ෂය අවසානයේදී ප්‍රත්‍යාගණනය කරනලද ස්ථාවර වත්කම්වල දළ අගයෙන් 0.1% ක අනුපාතයට ලංවිම විසින් රක්ෂණ සංචිතයට මාරු කරනු ලැබේ.

විදුලි බල මණ්ඩලයේ දේපල පිරියත හා උපකරණවලට සිදුවන රු.10,000 ක වටිනාකම වඩා වැඩි අගයෙන් යුතු අලාභහානි මෙම රක්ෂණ අරමුදලට අය කරනු ලැබේ. අනෙකුත් හානි, අළුත්වැඩියා හා නඩත්තු පිරිවැය යටතේ ආදායම් ප්‍රකාශයට අය කෙරේ. මෙම කාර්යය සඳහා අරමුදල් ලබාගන්නේ වෙනම බැංකු ගිණුමක ආයෝජනය කර ඇති මුදලකිනි.

2.6 විලම්භිත ආදායම

(අ) පාරිභෝගික දායකත්වය

මණ්ඩලය

ලංවිම නව සේවා සැපයුම් සඳහා පාරිභෝගිකයන්ගෙන් ලද දායක මුදල් 1996 වර්ෂයේ සිට ප්‍රාග්ධන සංචිතයක් ලෙස පවත්වාගෙන යනු ලැබීය. මෙම පාරිභෝගික දායක මුදල් විලම්භනය කර ආදායම් ප්‍රකාශවලට අවුරුදු 35 ක කාලයක් තුල ක්‍රමක්ෂය කරනු ලැබේ. එම කාලය අදාල වත්කම්වල ක්ෂය කිරීමේ කාලය වේ.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

සීමා සහිත ලංකා විදුලිය (පුද්ගලික) සමාගම

නව සේවා සම්බන්ධතා බිහිකර ගැනීම සඳහා ස්ථාපනය කරන ලද වත්කම්වල පිරිවැය ඉසිලීම සඳහා පාරිභෝගිතයන්ගෙන් ලද දායක මුදල් විලම්භිත බැඳීම් ලෙස හඳුනාගනු ලැබේ. නව සේවා සම්බන්ධතා වත්කම් වසර 20 ක් ඇතුළත ක්ෂය කරනු ලැබේ. අනුරූපී පාරිභෝගිත දායක මුදල් 2008 දෙසැම්බර් 31 දින දක්වා සමාන වසර 20 ක කාල පරිච්ඡේදයක් තුලදී ආදායම් ප්‍රකාශයට ක්‍රමක්ෂය කරනු ලැබේ. 2009 ජනවාරි 01 දින සිට පාරිභෝගිත දායක ලැබීම් වසර 8 ක් ඇතුළත ක්‍රමක්ෂය කරන අතර 2008 දෙසැම්බර් 31 දිනට පෙර ලද පාරිභෝගික දායක මුදල් වසර 20 ක් ඇතුළත ක්‍රමක්ෂය කරනු ලැබේ.

(ආ) රජයේ ප්‍රදානයන්

- පිරියත හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම සඳහා රජයෙන් ලබාදෙන ප්‍රදානයන් විලම්භිත ආදායම් වශයෙන් සැලකේ.
- සටහන 21.2 යටතේ දැක්වෙන රජයේ ප්‍රදානයන්ගේ වටිනාකමින් නියෝජනය වන්නේ, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුණු සීතාවක කර්මාන්ත පුරවරයෙහි ස්ථාපිත කර ඇති ග්‍රිඩ් උපපොල හා සම්ප්‍රේෂණ රැහැන්වල අගයන් වේ. එම අගයන් ආයෝජන ප්‍රවේශය පදනම් කරගෙන අවුරුදු 35 ක් ඇතුළත ක්‍රමක්ෂය කරනු ඇත.

2.7 ආදායම් ප්‍රකාශය

2.7.1 ආදායම හඳුනාගැනීම

සමූහය තුලට ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාවේ ප්‍රමාණය මත ආදායම හඳුනාගන්නා අතර, ආදායම සහ දරන හෝ දැරිය යුතු ආශ්‍රිත පිරිවැය විශ්වාසවන්ත ලෙස මැනිය හැකි විය යුතුය. වෙළඳ වට්ටම් සහ විකුණුම් බදුවල ලැබුණු හෝ ලැබිය යුතු ශුද්ධ ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට ආදායම මනිනු ලැබේ.

සීමිත ලක්දනවි සහ සීමිත හෙලදනවි සමාගම්වල ආදායම, කැලැන්ඩර් වර්ෂය අවසානයේදී අවම ඇපකර බලශක්ති මුදල සඳහා (MEGA) ධාරිතා ගාස්තු ලෙස ගලපනු ලැබේ. ආදායම හඳුනාගැනීමේ කාර්යය සඳහා පහත සඳහන් නිශ්චිත නිර්නායකයන් යොදාගනු ලැබේ.

(අ) සේවා සැලසීම

භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම හඳුනාගනු ලබන්නේ භාණ්ඩවල වැදගත් අවදානම් හා අයිතියේ ප්‍රතිලාභ, භාණ්ඩය මිලදීගත් පුද්ගලයා වෙත පැවරීමෙනි. සමූහය එක්තරා ප්‍රමාණයකට හෝ කළමනාකරණ අයිතිය තවදුරටත් රඳවා තබා නොගත යුතු අතර, අනුෂාංගික අයිතියක් හෝ ඵලදායී පාලනයක් විකුණනු ලැබූ භාණ්ඩ මත ගබා නොගනී.

(ආ) භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම හඳුනාගනු ලබන්නේ භාණ්ඩවල වැදගත් අවදානම් හා අයිතියේ ප්‍රතිලාභ, භාණ්ඩය මිලදීගත් පුද්ගලයා වෙත පැවරීමෙනි. සමූහය එක්තරා ප්‍රමාණයකට හෝ කළමනාකරණ අයිතිය තවදුරටත් රඳවා තබා නොගත යුතු අතර, අනුෂාංගික අයිතියක් හෝ ඵලදායී පාලනයක් විකුණනු ලැබූ භාණ්ඩ මත තබා නොගනී.

(ඇ) පොළී

එකතු කිරීම පිළිබඳව සැකයක් නැතිවීම මත පොළී ආදායම උපචිත වූ විට ආදායම ලෙස හඳුනා ගනී. උපචිත වන පොළී ආදායම ලෙස හඳුනාගනු ලබන්නේ එකතු කිරීම පිළිබඳව අනුමාන ණයක් නොමැති පොළී ආදායම්ය.

(ඈ) ලාභාංශ

ලාභාංශ ලැබීමට කොටස් හිමියන්ගේ අයිතිය තහවුරු වූ පසු ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

(ඉ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. ආයෝජන ඇතුළුව, දේපල, පිරියත හා උපකරණ සහ වෙනත් ජංගම නොවන වත්කම් අපහරණයන් ආදායම් සම්බන්ධයෙන් වන ශුද්ධ වාසි හා අවාසි ආදායම් ප්‍රකාශයේදී ගිණුම්ගත කරනු ලැබේ. මෙහිදී අපහරණයෙන් ලද මුදල් සහ වත්කම්වල ධාරණ අගය හා අදාල වියදම් අඩුකරනු ලැබේ. ප්‍රත්‍යාගණනය කරන ලද දේපල, පිරියත හා උපකරණ අපහරණයේදී, ප්‍රත්‍යාගණන සංචිතයේ එහි වටිනාකමට අදාල මුදල සමුච්චිත ලාභයට සෘජුව මාරු කරනු ලැබේ. ප්‍රධාන ආදායම් ජනනයට අනුෂාංගික ක්‍රියාවක් නිසා ජනනය වන ලාභ සහ පාඩු එතරම් සැලකිය යුතු නොවන බැවින් ඒවා එකතුවක් ලෙස ශුද්ධ පදනමෙන් වාර්තා කර ඉදිරිපත් කර ඇත.

2.7.2 2012 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

මණ්ඩලය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද 2012 ජනවාරි 01 දායින් මූල්‍ය කාලපරිච්ඡේද ආරම්භකර බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) සහ ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශ වාර්තා කිරීමේ ප්‍රමිති LFRS& වලින් සමන්විත නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මණ්ඩලය විසින් අනුගමනය කරනු ලැබේ. මාරුවීමට සූදානම් වීමක් වශයෙන් මණ්ඩලය එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය වාර්තාකරණය සමාලෝචනය කිරීම ආරම්භ කර ඇත. මණ්ඩලයේ වර්ෂය අවසාන වන්නේ දෙසැම්බර් 31 දින වන බැවින් මණ්ඩලය ඉදිරියේදී නව ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ආරම්භක ශේෂ පත්‍රයක් පිළියෙල කිරීම කෙරෙහි ප්‍රමුඛත්වය ලබාදී ඇත. ඒ අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නව ප්‍රමිතවලට අනුකූල මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම අවශ්‍ය වේ.

සී/ස ලංකා විදුලිය (පුද්ගලික) සමාගම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද 2012 ජනවාරි 01 දිනෙන් මූල්‍ය කාලපරිච්ඡේදය ආරම්භ කර බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) සහ ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශ වාර්තා කිරීමේ ප්‍රමිති (SLFRS) වලින් සමන්විත නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, සමූහය විසින්

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

අනුගමනය කරනු ලැබේ. මාරුවීමට සූදානම් වීමක් වශයෙන් සමූහය එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය වාර්තාකරණය සමාලෝචනය කිරීම ආරම්භ කර ඇත. එසේම ඒවායින් මූල්‍ය ප්‍රකාශවලට වන බලපෑම ගණනය කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටී. (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා වැරදිවල වෙනස්කම් පිළිබඳ වූ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 10 හි 30 හා 31 ඡේදවල දැක්වෙන සංශෝධිත විධිවිධාන, 2012 ජනවාරි 01 දිනෙන් ආරම්භවන මූල්‍ය කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනවලට යොදාගත නොහැක.) එබැවින් මෙම ගනුදෙනුවේ බලපෑම මෙම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයක් නැත.

සී/ස එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද 2012 ජනවාරි 01 දිනෙන් මූල්‍ය කාලපරිච්ඡේදය ආරම්භ කර බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) සහ ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශ වාර්තා කිරීමේ ප්‍රමිති (SLFRS) වලින් සමන්විත නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, සමාගම විසින් අනුගමනය කරනු ලැබේ. මාරුවීම සඳහා සූදානම් වීමක් වශයෙන් සමාගම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය වාර්තාකරණය සමාලෝචනය ආරම්භ කර තිබේ. සමාගමේ වර්ෂය අවසානය දෙසැම්බර් 31 වන බැවින් සමාගම ඉදිරියේදී නව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව ආරම්භක ශේෂ පත්‍රයක් පිළියෙල කිරීම කෙරෙහි ප්‍රමුඛත්වය දී ඇත.

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට බලපෑ හැකි ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට කලයුතු වෙනස්කම් පිළිබඳ ප්‍රධාන ක්ෂේත්‍ර පහත දැක්වේ. එවැනි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම ගණනය කිරීමේ ක්‍රියාවලියෙහි සමාගම නිරතව සිටී.

(අ) **ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේ ප්‍රමිති** (SLFRS 1)
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මුල් වරට යොදා ගැනීමේදී සමාගම, නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට හැරවීමේ දිනයට ආරම්භක නව ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශ වාර්තා කිරීමේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. සමාගම එහි ආරම්භක නව ශ්‍රී ලංකා ගිණුම්කරණ මූල්‍ය ප්‍රකාශවල එම ගිණුම් ප්‍රතිපත්තිම භාවිතා කලයුතු අතර, සියලූ කාලපර්ච්ඡේද පුරාම එහි පළමු නව ශ්‍රී.ලං.ගි.ප්‍ර. මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කල යුතුය. 2012 දෙසැම්බර් දින සිට බලපැවැත්වෙන පරිදි එකී ගිණුම්කරණ ප්‍රතිපත්ති එක් එක් ශ්‍රී.ලං.ගි. ප්‍රමිතිවලට අනුකූල විය යුතුය.

(ආ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01** - මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී යම් අස්තිත්වයක්, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයක්, ස්කන්ධයේ අයිතියේ සියළු වෙනස්වීම් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. ස්කන්ධයේ අයිතිය නැති සියලූ වෙනස්වීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ එක ප්‍රකාශයක හෝ ප්‍රකාශ දෙකක ඉදිරිපත් කලයුතු වේ. (වෙනම ආදායම් ප්‍රකාශයක් සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයක්) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සංරචකයන් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ ඉදිරිපත් කිරීමට අවසර නොදේ. මෙම ප්‍රමිතය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ කියවන්නාට අස්ථිත්‍යයේ අරමුණු, ප්‍රතිපත්ති හා ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රියාවලිය ඇගයීමට හැකිවන පරිදි, සමාගම විසින් අවශ්‍ය තොරතුරු හෙළිදරව් කල යුතුය.

(ඇ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16** - සමාගමක් විසින් හඳුනාගන්නා දිනට අත්පිට මුදලට සම කිරීම භාවිතා කරමින් දේපල, පිරියත හා උපකරණ අයිතමයක් පිරිවැයට මුල් අදියරේදී මැනිය යුතුය. සාමාන්‍ය ණය කොන්දේසිවලට වඩා ගෙවීම වෙනස් වුවහොත් අත්පිට මුදලට සමාන මුදල හා මුළු ගෙවීම අතර වෙනස, ශ්‍රී.ලං.ගි.ප්‍ර. 23, ණය ගැනිම් පිරිවැය ප්‍රමිතය පරිදි එවැනි පොලිය ප්‍රාග්ධනිත නොකලහොත් කාලපර්ච්ඡේදයේ පොළිය ලෙස හඳුනාගනු ලැබේ.

වෙනත් පාරිසරික ප්‍රතිෂ්ඨාපන සහ වෙනත් සමාන පිරිවැය ඇතුළු සියළුම වැඩබිම් ප්‍රතිශ්ඨාපන පිරිවැය, වත්කමේ ඵලදායී ජීවන කාලය තුල එකී පිරිවැය ක්ෂය කිරීම උදෙසා ආරම්භක හඳුනාගැනීමේදී ඇස්තමේන්තු කොට ප්‍රාග්ධනිත කල යුතුය. මෙම ප්‍රමිතියෙහි තවත් අවශ්‍යතාවයක් වන්නේ ක්ෂය කලහැකි වටිනාමට එළඹීමේදී වත්කමෙහි සුන්බුන් අගය අඩුකොට (අවශේෂ අගය) වත්කමෙහි ඵලදායී ජීවන කාලය තුල ක්ෂය කලයුතු වීමයි. තවද, වත්කමක සැලකිය යුතු සංරචකයන් ක්ෂය කිරීම් සඳහා වෙනම ඇගයිය යුතු බවද මෙම ප්‍රමිතියෙහි අවශ්‍යතාවයකි.

(ඈ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 32 - මූල්‍ය උපකරණ : ඉදිරිපත් කිරීම ශ්‍රී.ලං.ගි.ප්‍ර. 39 - මූල්‍ය උපකරණ : හඳුනාගැනීම සහ මිණුම හා හෙළිදරව් කිරීම - ශ්‍රී.මූ.වා.ප්‍ර. 7** - අනාවරණය කිරිමේ, ප්‍රතිඵලය වන්නේ මූල්‍ය වත්කම්, මූල්‍ය වගකීම් සහ ස්කන්ධ උපකරණවල පවතින හඳුනාගැනීමේ ක්‍රමය වෙනස් කිරීම්වලට ලක්කිරීමයි. මෙම ප්‍රමිතවලින් අවශ්‍ය වන්නේ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් මූලික මිනුමේදී සාධාරණ අගයට මිනුම් කිරීමයි. පසුව කරනු ලබන මූල්‍ය වත්කම්වල මිණුම, ලාභාංශ හරහා සාධාරණ අගය ලෙස වර්ගීකරණය කරන අතර, විකිණීම සඳහා ඇති විට සාධාරණ අගයටයි. එහිදී ලාභ හෝ පාඩු පිළිවෙලින් විස්තීරණ ආදායම හරහා පෙන්නුම් කෙරේ. කල්පිරුණ ලෙස හා ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ග කර තබා ඇති මූල්‍ය වත්කම් පසුව මනිනු ලබන්නේ ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටයි. මෙම වත්කම්, වත්කමේ (හානි සිදුවීමක්) මූලික හඳුනාගැනීමෙන් පසු සිදුවූ සිදුවීම් එකක් හෝ කීපයක් හේතු කොට ගෙන හානිකරණයක් පිළිබඳ යම් සාක්ෂි ඇති විට ඒ සඳහා මෙම වත්කම් තක්සේරු කිරීම අවශ්‍ය වේ. එසේම එම හානි සිදුවීම මූල්‍ය වත්කම්වල හෝ මූල්‍ය වත්කම් සමූහය ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවලට බලපෑමක් ඇතිවිට එය විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තු කලහැක. එබැවින්, හානිකරණය සඳහා වූ තක්සේරු කිරීමේ වර්තමාන ක්‍රමය, මෙම නව ප්‍රමිතවල අවශ්‍යතා මත පදනම් විය යුතුය.

මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට හෝ ක්ෂය අගයට යන 2 කට වර්ග කල යුතුය. වර්තමානයේදි සමාගම ප්‍රමිතයේ අවශ්‍යතාමත මූල්‍ය වත්කම් හඳුනාගැනීම, වර්ග කිරිම හෝ මිණුම් කරනු නොලැබේ. සමහර ව්‍යුත්පන්න

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

උපකරණ ශේෂ පත්‍රයේදී හඳුනා නොගනී. එබැවින් ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස් කිරීමක් අවශ්‍ය වේ.

(ඉ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 23 - ණය ගැනීම් පිරිවැය** - සුදුසුකම් ලත් වත්කම් සම්බන්ධයෙන් සමාගම ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනගත කළ යුතුය. (අදාල නම්) වර්තමානයේ ප්‍රතිපත්තිය වන්නේ ණය ගැනීමේ සියලු පිරිවැය වියදම කපාහරින බැවින් ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කල යුතුය.

(ඊ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 12 - ආදායම් බදු** - නව ශ්‍රී.ලං.ගි.ප්‍ර. වලට අනුකූල වන පරිදි ගැලපීම හේතු කොට ගෙන පැනනගින තාවකාලික වෙනස සම්බන්ධයෙන් විලම්භිත බදු ප්‍රතිපාදනය කළ යුතුය.

(උ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 18 - ආදායම** - සමාගම ලද හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ අගයට ආදායම මිනිය යුතුය. එය ආදායම හඳුනාගැනීමේ නිර්නායකද නිශ්චය කරන අතර ගනුදෙනුවේ හරය පිළිබිඹු කිරීම සඳහා සමාගම තනි ගනුදෙනුවක වෙනම හඳුනාගතහැකි සංරචකවලට එම හඳුනාගැනීම් නිර්නායක යොදාගත යුතුය.

(ඌ) **ජාත්‍යන්තර මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය - 12 (IFRIC 12) සේවා සබඳතා සකස් කිරීම**
සකස් කිරීම සඳහා යටිතල පහසුකම් කාර්යය සම්බන්ධයෙන් මෙහෙයුම්කරු විසින් ඉදිකර හෝ පවරාගෙන දීමනාකරුට භාවිතය සඳහා ලබාදෙයි නම්, මෙම නිර්වචනය රජයේ සහ පෞද්ගලික සේවා සහනදායී වැඩපිළිවෙල යොදා ගනී. මෙම අර්ථ නිරූපණය අනුව මෙහෙයුම්කරු ගිණුම්කරණය සඳහා "මූල්‍ය වත්කම් මාදිලිය" හෝ "අස්පෘශ්‍ය වත්කම් මාදිලිය" යොදා ගනී.

(එ) **ජාත්‍යන්තර මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය - 4 (IFRIC 4) කල්බද්දක් ඇතුළත් වැඩපිළිවෙලක් නිශ්චය කිරීම**
ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ - 12 න් වැඩපිළිවෙල සඳහා අවකාශ සැලසුවහොත්, මෙහෙයුම්කරු ජා.මූ.ප්‍ර.වා. 4 (IFRIC 4) කල්බද්දක් ඇතුලත් වැඩපිළිවෙලක් නිශ්චය කිරීම යොදාගත යුතුය. වැඩපිළිවෙලේ හරය පදනම් කරගෙන සමාගම මූල්‍ය මෙහෙයුම් කල්බදු වැඩපිළිවෙලක් සඳහා ගිණුම්ගත කළ යුතුය.

ජා.මූ.ප්‍ර.වා. (IFRIC) - ජා.මූ.ප්‍ර.වා. 4 හි විෂය පථය සංශෝධනය කර ඇති නිසා, ජා.මූ.ප්‍ර.වා. 12 හි විෂය පථය තුල වූ වැඩ පිළියෙල ජා.මූ.ප්‍ර.වා. 4 ට යොදා නොගනී.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

	සමූහය		මණ්ඩලය	
	2011	2010	2011	2010
3. ආදායම	රු. '000	රු. '000	රු. '000	රු. '000
3.1 සාරාංශය				
විකුණුම්	149,633,788	129,894,504	132,459,860	121,226,432
අඩු කළා: විකුණුම් බදු	-	-	-	-
ආදායම	**149,633,788**	**129,894,504**	**132,459,860**	**121,226,432**

	සමූහය		මණ්ඩලය	
3.2 ඛණ්ඩ තොරතුරු	2011	2010	2011	2010
	රු. '000	රු. '000	රු. '000	රු. '000
3.2.1 ඛණ්ඩ ආදායම * පාරිභෝගික පදනම				
ගෘහස්ථ	40,070,483	37,312,667	33,131,353	32,047,206
කාර්මික හා හෝටල්	46,073,815	38,039,040	42,328,368	34,869,842
අනුගාමික පරමාර්ථයන්	420,988	502,407	358,391	426,583
වාණිජ	7,642,445	5,302,444	-	-
වීදි ලාම්පු	17,129	2,855,511	-	2,656,938
ල.වි.ස. (LECO)	-	-	14,968,050	14,821,702
පොදු කාර්ය	41,673,698	36,404,161	41,673,698	36,404,161
වෙනත්	727,316	2,620,020	-	-
	136,625,874	**123,036,250**	**132,459,860**	**121,226,432**
3.2.2 ඛණ්ඩ ආදායම -				
ට්‍රාන්ස්ෆෝමර් නිෂ්පාදනය	2,063,357	1,842,831	-	-
ගැල්වනයිස් මෙහෙයුම්	882,453	683,197	-	-
300MW CC බලශක්ති පිරියත ඉදිකිරීම්	-	2,837,575	-	-
තාක්ෂණික හා ඉංජිනේරු සේවා	2,367,659	1,329,592	-	-
බලශක්ති ඉතිරිය	-	1,503	-	-
වෙනත්	474,273	163,556	-	-
ලංකා කෝල් සමාගමෙන් විකුණුම්	7,220,171	-	-	-
	13,007,914	6,858,254	-	-
	149,633,788	**129,894,504**	**132,459,860**	**121,226,432**

4.1 වෙනත් මෙහෙයුම් ආදායම්

ලැබිය යුතු පොලී ආදායම

	සමූහය		මණ්ඩලය	
	2011	2010	2011	2010
	රු. '000	රු. '000	රු. '000	රු. '000
කාර්ය මණ්ඩල ණය	165,606	159,242	152,092	138,326
වෙනත්	-	42,171	-	-
මුළු පොලිය	165,606	201,413	152,092	138,326
	-			
විදේශ ආයෝජන මත ආදායම	72,334	43,167	-	-
විදුලි පාරිභෝජනය මත දඩ	21,736	22,067	21,736	22,067
පාරිභෝගික අයකිරීම්	212,575	229,688	-	-
දේපල පිරියත හා උපකරණ අපහරණ ලාභ / (අලාභ)	56,760	103,837	56,660	103,837
විලම්භිත ආදායම් පාරිභෝගික දායකය	2,151,858	1,885,012	1,853,318	1,632,276
විවිධ ආදායම්	1,445,126	1,031,399	1,360,115	956,020
රජයේ දෙපාර්තමේන්තු ආදායම	216,151	175,652	216,151	175,652
කුලී	8,919	8,069	8,919	8,069
විදුලි බිල්මත අධිභාර	299,647	635,887	299,647	635,887
ආලෝක උපකරණ ආදායම	22,296	-	-	-
	4,673,008	**4,336,190**	**3,968,638**	**3,672,134**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

		සමූහය		මණ්ඩලය	
		2011	2010	2011	2010
4.2	**මූල්‍ය ආදායම්**	රු. '000	රු. '000	රු. '000	රු. '000
	ලැබිය යුතු පොළී ආදායම				
	ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත්	1,116,712	881,300	385,887	431,713
	ලාභාංශ ආදායම	327,273	-	188,962	126,000
		1,443,985	**881,300**	**574,849**	**557,713**

		සමූහය		මණ්ඩලය	
		2011	2010	2011	2010
5.	**මූල්‍ය පිරිවැය**	රු. '000	රු. '000	රු. '000	රු. '000
	අයිරා සහ දිගුකාලීන බැංකු ණය මත පොළී වියදම්	1,692,278	2,786,770	1,428,962	2,293,791
	විදුලිය මිලදී ගැනීම් ගෙවීම් ප්‍රමාද මත දඩ පොළී	325,110	225,985	331,509	267,172
	විනිමය අලාභ	67,359	44,216	67,359	44,216
		2,084,747	**3,057,971**	**1,827,830**	**2,605,179**

		සමූහය		මණ්ඩලය	
		2011	2010	2011	2010
6.	**බදු ගෙවීමට පෙර ලාභය / (අලාභ)**	රු. '000	රු. '000	රු. '000	රු. '000
	අයකළ / බැරකළ පසු ප්‍රකාශිත ·				
	විගණක පාරිශ්‍රමික - ප්‍රවර්තන වසරේ ගාස්තු හා වියදම්	8,050	8,355	2,542	4,045
	අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය	2,255	2,463	1,779	1,132
	ක්ෂය	19,645,770	17,376,078	18,415,694	16,064,035
	කාර්ය මණ්ඩල පිරිවැයට ඇතුළත්				
	- නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික	401,185	598,229	320,874	522,220
	- නිශ්චිත දායක සැලසුම් පිරිවැය - EPF සහ ETF	1,156,697	1,140,258	1,025,690	1,029,906
	- අනෙකුත් කාර්ය මණ්ඩල පිරිවැය	11,444,179	11,104,304	10,912,078	10,687,501
	දේපල, පිරියත හා උපකරණ අපහරණ (ලාභ) / අලාභ	(56,760)	(106,259)	(56,660)	(103,837)
	පරිගණක මෘදුකාංග ක්‍රමක්ෂය	588	-	-	-
	ආදායම් ප්‍රකාශයට කපාහළ ඉඩම්	9,142	-	-	-
	දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන ඌණතාවය	63,581	-	-	-
	පාරිභෝගික දායකත්වය	(2,155,369)	(1,885,012)	(1,853,318)	(1,632,276)
	රජයේ ආධාර	(12,391)	(12,391)	(12,391)	(12,391)

		සමූහය		මණ්ඩලය	
		2011	2010	2011	2010
7.	**ආදායම් බදු වියදම**	රු. '000	රු. '000	රු. '000	රු. '000
	ප්‍රවර්තන ආදායම් බදු				
	වර්ෂය සඳහා සාමාන්‍ය කටයුතු මත ප්‍රවර්තන බදු වියදම	932,491	4,980,513	-	4,500,000
	ඉකුත් වසර සඳහා බදු ගෙවීම	-	-	-	-
	ඉකුත් වර්ෂ සම්බන්ධයෙන් ප්‍රවර්තන බදු ඌන/(අධි) ප්‍රතිපාදනය	(126)	(374,745)	-	-
	සමාජ වගකීම් බද්ද	-	1,167	-	-
	විලම්භිත බදු අයකිරීම (අවලංගු කිරීම)	(801,164)	324,246	-	-
		131,201	**4,931,181**	**-**	**4,500,000**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

8 දේපල, පිරියත හා උපකරණ
සමූහය

8.1 දල ධාරණ අගය

පිරිවැයට හෝ ප්‍රතිතක්සේරුවට	01.01.2011 දිනට ශේෂය රු. '000	එකතු කිරීම් / පවරා ගැනීම් / මාරුකිරීම් රු. '000	ප්‍රත්‍යාගණන වැඩිවීම / (අඩුවීම) රු. '000	අපහරණය/ මාරු කිරීම් රු. '000	ගැලපුම් රු. '000	31.12.2011 දිනට ශේෂය රු. '000
සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි	22,206,331	150,656	2,723,739	(383,664)	2,812	24,699,873
බදු ඉඩම්	7,065	-	-	(3,350)	-	3,715
සිවිල් වැඩ	140,925,448	-	16,911,054	-	-	157,836,502
යන්ත්‍ර හා උපකරණ	160,280,359	165,841	14,434,214	-	(195,740)	174,684,674
සම්ප්‍රේෂණ මා බෙදාහැරීම් මාර්ග	357,559,135	15,620,977	38,975,955	(270,895)	(146,447)	411,738,725
මෝටර් වාහන	6,498,124	1,449,002	375,697	(579,958)	(42,642)	7,700,223
අනෙකුත් සැපයුම් යටිතල	15,095,489	396,003	435,620	(34,705)	-	15,892,407
කාර්යාල හා අනෙකුත් උපකරණ	1,959,686	222,683	84,392	(9,798)	(29,657)	2,227,306
ලී බඩු හා සවිකිරීම්	76,733	55,818	10,595	(1,049)	17,385	159,482
යන්ත්‍ර හා මෙවලම්	1,213,163	289,207	59,409	(132)	161,317	1,722,964
බහාලුම් අංගන	-	6,744	-	-	-	6,744
ක්ෂය කල හැකි වත්කම් වල මුළු අගය	**705,821,532**	**18,356,931**	**74,010,675**	**(1,283,550)**	**(232,972)**	**796,672,616**

8.2 කරනු ලබන ඉදිකිරීම්

	01.01.2011 දිනට ශේෂය රු. '000	වර්ෂය තුළ දැරූ රු. '000	යළිවර්ග කළ/ මාරු කළ රු. '000	අපහරණ/ ලියාහැරීම් රු. '000	ගැලපුම් රු. '000	31.12.2011 දිනට ශේෂය රු. '000
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ (9.5)	113,768,594	63,623,612	94,014,399	(15,601,515)	(95,293,872)	160,511,217
මුළු දළ ධාරන වටිනාකම	**113,768,594**	**63,623,612**	**94,014,399**	**(15,601,515)**	**(95,293,872)**	**160,511,217**

8.3 ක්ෂය

පිරිවැයට හෝ ඇගයීම මත	01.01.2011 දිනට ශේෂය රු. '000	අයකිරීම් වර්ෂය සඳහා රු. '000	ප්‍රත්‍යාගණන සංචිතයට මාරුකිරීම් රු. '000	බණ්ඩනය කළ / අපහරණ මාරුකිරීම් රු. '000	ගැලපුම් රු. '000	31.12.2011 දිනට ශේෂය රු. '000
සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි	3,608,461	326,596	380,095	(44,437)	-	4,270,716
බදු ඉඩම්	1,798	15	-	-	-	1,813
සිවිල් වැඩ	35,048,274	1,670,303	4,205,793	-	-	40,924,370
යන්ත්‍ර හා උපකරණ	113,103,642	5,506,101	8,994,730	(706)	(223,625)	127,380,142
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් මාර්ග	150,202,694	10,479,013	14,024,152	(103,719)	226,463	174,828,603
මෝටර් රථ වාහන	4,099,755	648,297	104,930	(6,491)	(48,633)	4,794,132
අනෙකුත් සැපයුම් යටිතල	9,081,543	623,951	250,987	(25,056)	-	9,931,425
කාර්යාල හා අනෙකුත් උපකරණ	1,323,300	170,435	47,263	(2,506)	(4,493)	1,533,999
ලී බඩු හා සවිකිරීම්	30,374	26,219	3,046	4	(218)	59,424
යන්ත්‍ර හා මෙවලම්	95,971	320,011	8,719	-	2,509	427,210
බහාලුම් අංගන	-	1,686	-	-	-	1,686
මුළු ක්ෂය	**316,595,812**	**19,772,627**	**28,019,715**	**(182,910)**	**(47,997)**	**364,153,521**

8.4 ශුද්ධ පොත් අගයන්

	2011 රු. '000	2010 රු. '000
පිරිවැයට හෝ ඇගයීම මත	593,030,313	502,995,637
අඩු කළා : හානිවූ වත්කම් සඳහා ප්‍රතිපාදනය	-	-
දේපල, පිරියත හා උපකරණවල මුළු ධාරණ අගය	**593,030,313**	**502,995,637**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

9 දේපල පිරියත හා උපකරණ
මණ්ඩලය

9.1 දළ ධාරණ අගය පිරිවැයට හෝ ඇගයීම මත	2011.01.01 දිනට ශේෂය රු.'000	එකතු කිරීම් /මාරුකිරීම් /පවරා ගැනීම් රු.'000	ප්‍රත්‍යාගණන වැඩිවීම /(අඩුවීම) රු.'000	අපහරණය / මාරු කිරීම් රු.'000	ගැලපුම් රු.'000	2011.12.31 දිනට ශේෂය රු.'000
සින්නක්කර ඉඩම්	10,044,771	54,766	1,065,118	(46,247)	-	11,118,408
ගොඩනගිලි	10,059,125	70,361	1,279,315	(438)	2,812	11,411,175
සිවිල් වැඩ	140,925,448	-	16,911,054	-	-	157,836,502
යන්ත්‍රෝපකරණ	156,244,129	22,513	14,434,214	-	(195,740)	170,505,116
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් මාර්ග	357,559,135	15,620,977	38,975,955	(270,895)	(146,447)	411,738,725
මෝටර් රථ වාහන	5,498,489	1,059,777	340,616	(168,999)	(41,466)	6,688,417
කාර්යාල හා වෙනත් උපකරණ	1,406,760	184,521	81,489	(3,675)	(29,684)	1,639,411
ලී බඩු හා සවිකිරීම්	54,352	55,235	8,806	(837)	17,412	134,968
යන්ත්‍ර හා මෙවලම්	328,684	289,144	59,409	-	161,317	838,554
ක්ෂය වන වත්කම්වල මුළු වටිනාකම	**682,120,893**	**17,357,294**	**73,155,976**	**(491,091)**	**(231,796)**	**771,911,276**

9.1.1 ව්‍යාපෘති වත්කම්

දල ධාරණ අගය පිරිවැයට හෝ ඇගයීම මත	2011.01.01 දිනට ශේෂය රු.'000	එකතු කිරීම් /මාරුකිරීම් /පවරා ගැනීම් රු.'000	ප්‍රත්‍යාගණන වැඩිවීම /(අඩුවීම) රු.'000	අපහරණය / මාරු කිරීම් රු.'000	ගැලපුම් රු.'000	2011.12.31 දිනට ශේෂය රු.'000
සින්නක්කර ඉඩම්	-	-	-	-	-	-
ගොඩනගිලි	7,977	-	-	-	-	7,977
සිවිල් වැඩ	-	-	-	-	-	-
යන්ත්‍රෝපකරණ	-	-	-	-	-	-
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් මාර්ග	-	-	-	-	-	-
මෝටර් රථ වාහන	383,755	340,067	28,420	(410,959)	(1,176)	340,107
කාර්යාල හා වෙනත් උපකරණ	30,798	5,213	2,903	(5,725)	27	33,216
ලී බඩු හා සවිකිරීම්	14,910	583	1,789	(189)	(27)	17,066
යන්ත්‍ර හා මෙවලම්	-	63	-	-	-	63
ක්ෂය වන වත්කම්වල මුළු වටිනාකම	**437,440**	**345,926**	**33,112**	**(416,873)**	**(1,176)**	**398,429**

9.1.2 කල් බදු වත්කම්	2011.01.01 දිනට ශේෂය රු.'000	එකතු කිරීම් /මාරුකිරීම් /පවරා ගැනීම් රු.'000	ප්‍රත්‍යාගණන වැඩිවීම /(අඩුවීම) රු.'000	අපහරණය / මාරු කිරීම් රු.'000	ගැලපුම් රු.'000	2011.12.31 දිනට ශේෂය රු.'000
මෝටර් රථ වාහන	30,472	29,286	6,661	-	-	66,419
	30,472	29,286	6,661	-	-	66,419
ක්ෂය වන වත්කම්වල මුළු වටිනාකම	**682,588,805**	**17,732,506**	**73,195,749**	**(907,964)**	**(232,972)**	**772,376,124**

9.2 කරනු ලබන ඉදිකිරීම්	2011.01.01 දිනට ශේෂය රු.'000	එකතු කිරීම් /මාරුකිරීම් /පවරා ගැනීම් රු.'000	ප්‍රත්‍යාගණන වැඩිවීම /(අඩුවීම) රු.'000	අපහරණය / මාරු කිරීම් රු.'000	ගැලපුම් රු.'000	2011.12.31 දිනට ශේෂය රු.'000
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	113,392,753	62,395,199	94,025,462	(15,439,442)	(95,293,872)	159,080,100
මුළු දල ධාරණ අගය	**113,392,753**	**62,395,199**	**94,025,462**	**(15,439,442)**	**(95,293,872)**	**159,080,100**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

9.3 ක්ෂය

පිරිවැයට හෝ ඇගයීම මත	2011.01.01 දිනට ශේෂය රු.'000	වසරේ අයකිරීම රු.'000	ප්‍රත්‍යාගණන සංචිතයට මාරුකිරීම රු.'000	අපහරණය / මාරු කිරීම් බණ්ඩනය කළ රු.'000	ගැලපුම් රු.'000	2011.12.31 දිනට ශේෂය රු.'000
සින්නක්කර ඉඩම්	343,270	-	-	-	-	343,270
ගොඩනගිලි	3,082,904	300,301	380,095	-	-	3,763,300
සිවිල් වැඩ	35,048,274	1,670,303	4,205,793	-	-	40,924,370
යන්ත්‍රෝපකරණ	110,995,372	5,208,881	8,994,730	-	(223,625)	124,975,358
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් මාර්ග	150,202,694	10,479,013	14,024,152	(103,719)	226,463	174,828,603
මෝටර් රථ වාහන	3,500,848	468,256	85,244	106,147	(26,872)	4,133,623
කාර්යාල හා වෙනත් උපකරණ	854,125	129,825	45,465	(740)	(3,268)	1,025,407
ලී බඩු හා සවිකිරීම්	16,192	22,060	1,988	97	28	40,365
යන්ත්‍ර හා මෙවලම්	72,702	125,987	8,719	-	2,509	209,917
මුළු ක්ෂය	**304,116,381**	**18,404,626**	**27,746,186**	**1,785**	**(24,765)**	**350,244,213**

ව්‍යාපෘති වත්කම්

පිරිවැයට හෝ ඇගයීම මත	2011.01.01 දිනට ශේෂය රු.'000	වසරේ අයකිරීම රු.'000	ප්‍රත්‍යාගණන සංචිතයට මාරුකිරීම රු.'000	අපහරණය / මාරු කිරීම් බණ්ඩනය කළ රු.'000	ගැලපුම් රු.'000	2011.12.31 දිනට ශේෂය රු.'000
සින්නක්කර ඉඩම්						
ගොඩනගිලි	-	-	-	-	-	-
සිවිල් වැඩ	-	-	-	-	-	-
යන්ත්‍රෝපකරණ	-	-	-	-	-	-
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් මාර්ග	-	-	-	-	-	-
මෝටර් රථ වාහන	234,700	104,623	19,686	(112,637)	(24,550)	221,822
කාර්යාල හා වෙනත් උපකරණ	19,859	7,731	1,798	(1,714)	(1,225)	26,449
ලී බඩු හා සවිකිරීම්	8,815	3,222	1,058	(93)	(246)	12,756
යන්ත්‍ර හා මෙවලම්	-	2	-	-	-	2
ක්ෂයවන වත්කම්වල මුළු වටිනාකම	**263,374**	**115,578**	**22,542**	**(114,444)**	**(26,021)**	**261,029**

කල් බදු වත්කම්	2011.01.01 දිනට ශේෂය රු.'000	එකතු කිරීම් /මාරුකිරීම් /පවරා ගැනීම් රු.'000	ප්‍රත්‍යාගණන වැඩිවීම /(අඩුවීම) රු.'000	අපහරණය / මාරු කිරීම් රු.'000	ගැලපුම් රු.'000	2011.12.31 දිනට ශේෂය රු.'000
මෝටර් රථ වාහන	2,136	11,068	-	-	2,789	15,993
	2,136	11,068	-	-	2,789	15,993
ක්ෂය එකතුව	**304,381,891**	**18,531,272**	**27,768,728**	**(112,660)**	**(47,997)**	**350,521,234**

9.4 ශුද්ධ පොත් අගය

	2011 රු.'000	2010 රු.'000
පිරිවැයට හෝ ඇගයීම මත	580,934,990	491,599,667
අඩුකළා : හානියට පත්වූ වත්කම් සඳහා ප්‍රතිපාදන	-	-
යන්ත්‍ර, පිරියත හා උපකරණවල මුළු ධාරණ අගය	**580,934,990**	**491,599,667**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

9 දේපල පිරියත හා උපකරණ

9.5 පහත සදහන් වැය විෂයයන්ගෙන් නියෝජනය වන 2011 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

	සමූහය		මණ්ඩලය	
ව්‍යාපෘති	**2011**	**2010**	**2011**	**2010**
	රු.'000	**රු.'000**	**රු.'000**	**රු.'000**
ජනන ව්‍යාපෘති	8,313,240	4,321,041	8,313,240	4,321,041
සම්ප්‍රේෂණ ව්‍යාපෘති	6,174,854	1,921,935	6,174,854	1,921,935
බෙදාහැරීම් සමූහ ව්‍යාපෘති	18,395,977	14,948,632	18,395,977	14,948,632
ඉහළ කොත්මලේ ජලවිදුලි ව්‍යාපෘතිය	37,522,955	26,400,688	37,522,955	26,400,688
කොළඹ නගරයේ විදුලි බෙදාහැරීම් සංවර්ධන ව්‍යාපෘතිය	12,188,666	10,742,561	12,188,666	10,742,561
ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය	76,175,017	54,822,695	76,175,017	54,822,695
වෙනත්	309,391	235,199	309,391	235,199
කෙරීගෙන යන වැඩ LECO	594,144	358,186	-	-
කෙරීගෙන යන වැඩ LTL	836,973	17,655	-	-
	160,511,217	**113,768,592**	**159,080,100**	**113,392,751**

9.6 ලංකා විදුලි බල මණ්ඩලය

ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විස්තර කළ පරිදි ලංවිම දේපල, පිරියත හා උපකරණ, උද්ධමනය හේතුකොටගෙන මිල වෙනස්වීම්වල පිළිඹිබු වන දර්ශක උපයෝගී කරගෙන වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

වත්කම්වල ක්ෂය අඩු කොට පිරිවැයට ගෙන එන ලද්දේ නම්, මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කළ හැකිව තිබූ ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල ධාරණ අගය, තොරතුරු නොමැතිවීම හේතුකොටගෙන අනාවරණය කළ නොහැක.

දේපල, පිරියත හා උපකරණවලට රු.මිලියන 17,569 ක් තුළ ධාරණ අගයක් ඇති සම්පූර්ණයෙන් ක්ෂයවූ වත්කම් ඇතුළත් වේ. (2010 දී රු. මිලියන 754.268)

9.7 සීමිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මුදල් වර්ෂය තුලදී අවසන් වරට ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය ප්‍රත්‍යාගණනය කරනු ලැබුවේ වෙළඳපොල පදනම්වූ සාක්ෂි මත කේ.ටී.ඩී. තිසේරා, පී.බී.ඩී. විදිරිසිංහ, පී.ටී මොහිදීන්, සුනිල් ප්‍රනාන්දු සහ ඇසෝසියේට් යන ස්වාධීන තක්සේරුකරුවන් විසිනි. එය ක්‍රියාත්මක වන දින එනම් 2011 දෙසැම්බර් 31 දින සිට එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල මෙම මූල්‍ය ප්‍රකාශනවලට සංයෝග කර ඇත. ප්‍රත්‍යාගණනයේදී පැනනැඟුණු අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරනු ලැබීය. වත්කම් ක්ෂය අඩුකොට ගෙන ආවේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුව තිබූ සැපයුම් යටිතල පහසුකම් හැර ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල ධාරණ අගය පහත දැක්වේ.

වත්කම් පන්තිය	**පිරිවැය**	**වත්කම් පිරිවැයට දැක්වූයේ නම් සමුපිචිත ක්ෂය**	**ශුද්ධ ධාරණ අගය**
	රු.'000	**රු.'000**	**රු.'000**
ගොඩනැගිලි	317,055	60,665	256,390
ඉඩම්	502,125	-	502,125
	819,180	**60,665**	**758,515**

මුදල් වර්ෂය තුලදී සමාගම එකතුව රු. මිලියන 836 ක් වටිනා (2010 දී රු. මිලියන 758) දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් සඳහා රු. මිලියන 440 ක් (2010 දී රු. මිලියන 23) මුදලින් ගෙවා ඇත. රු. මිලියන 509 ක් වටිනා, සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද (2010 දී රු. මිලියන 754) තුල ධාරණ අගය සහිත වත්කම් සමාගමේ දේපල, පිරියත හා උපකරණවල ඇතුළත්වී ඇත.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

9.7.1 කල්බදු දේපල

කල්බදු දේපල පිළිබඳ විස්තර පහත දැක්වේ.

පිහිටීම	පිරිවැය රු. මිලියන	කල්බදු කාලය	සිට	2009.12.31 දිනට ඉකුත් නොවුන කාලසීමාව
උඩහමුල්ල	1667	අවුරුදු 99	1988.01.12	අවුරුදු 76
හික්කඩුව	1448	අවුරුදු 50	1997.01.07	අවුරුදු 36
අම්බලන්ගොඩ	600	අවුරුදු 30	1996.12.01	අවුරුදු 15

9.8 සීමිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

අඟුලානේ පිහිටි ගොඩනැගිලිවල සාධාරණ අගය 1989/90 මූල්‍ය වර්ෂය තුලදී ස්වාධීන තක්සේරුකරුවකු වූ සී/ස ඉංජිනියරින් කන්සල්ටන් සමාගම විසින් ප්‍රත්‍යාගණනය කරන ලදී එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල 1990 මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශනවලට සංයුක්ත කරන ලදී. එකී වත්කම් භාවිතයේ පවතින පදනම මත වෙළඳපොල අගය මත අගය කරන ලදී. ප්‍රත්‍යාගණනයේදී පැණනැගුණු අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරනු ලැබීය.

ක්ෂය කිරීම් අඩුකර වත්කම් පිරිවැයට ප්‍රකාශ කරන ලද්දේ නම් මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කළ හැකිව තිබූ ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ධාරණ අගයන් පහත දැක්වේ.

වත්කම් පන්තිය	පිරිවැය රු.	සමුච්චිත ක්ෂය වත්කම් පිරිවැයට දැක්වූවා නම් රු.	2011 ශුද්ධ ධාරණ අගය රු.	2010 ශුද්ධ ධාරණ අගය රු.
ගොඩනැගිලි	12,325,000	6,578,507	5,746,493	5,992,993

සමූහය, කාලපරිච්ඡේදය තුලදී එකතුව රු.994,196,768 ක් වටිනා දේපල, පිරියත හා උපකරණ පවරාගෙන ඇති අතර, එකී වත්කම්මිලදී ගැනීම සඳහා කාලපරිච්ඡේදය තුලදී රු.994,196,768 ක් මුදලින් ගෙවා ඇත.

දේපල, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද රු.317,742,258 ක මුදල ධාරණ වටිනාකමක් ඇති (2010 දී රු.317,742,258) වත්කම් ඇතුළත්ව ඇත.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

10. පරිපාලිත සමාගම්වල ආයෝජන

ලැයිස්තුගත නොකළ	**අයිතිය %**	**සමූහය 2011 පිරිවැය රු.'000**	**සමූහය 2010 පිරිවැය රු.'000**	**මණ්ඩලය 2011 පිරිවැය රු.'000**	**මණ්ඩලය 2010 පිරිවැය රු.'000**
සීමිත ලංකා විදුලි (පුද්) සමාගම	55.2%	-	-	628,002	628,002
සීමිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම	63%	-	-	96,900	96,900
සීමිත ලංකා කෝල් (පුද්) සමාගම	60%	-	-	12,000	12,000
පරිපාලිත සමාගම්වල මුළු ලැයිස්තුගත නොකළ ආයෝජන		**-**	**-**	**736,902**	**736,902**

ලංකා විදුලිබල මණ්ඩලයට සම්පූර්ණයෙන්ම අයිති ශ්‍රී ලංකා එනර්ජිස් 2011 ජනවාරි 13 දින සංස්ථාපනය කරන ලද අතර 2012 ජනවාරි 09 දින මූලික ආයෝජනය කරන ලදි.

10.1 ලංකා විදුලිබල මණ්ඩලය සෘජුව හෝ වක්‍රව පාලන අයිතිය දැරූ සමාගම් වල විස්තර පහත දැක්වේ.

සමාගමේ / පරිපාලිත සමාගමේ නම	**කොටස් ප්‍රතිශතය සමූහය**	**කොටස් ප්‍රතිශතය සමාගම**	**ව්‍යාපාර පිළිබඳ විස්තර**
එල්.ටී.එල් හෝල්ඩින්ස් (පුද්) සමාගම	63 %	63 %	ට්‍රාන්ස් ෆෝමර් නිෂ්පාදනය
ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO)	52.2 %	55.2 %	බලශක්ති විකිණීම
ලංකා කෝල් (පුද්) සමාගම	60%	60%	ගල් අඟුරු බලශක්තිය සඳහා ගල් අඟුරු මිලදී ගැනීම.
ලක්දනව් (පුද්) සමාගම	52 %	-	ජාතික විදුලි පද්ධතියට විදුලිය ජනනය
එල්.ටී.එල්. එනර්ජි (පුද්) සමාගම	63 %	-	බලශක්ති කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීම සඳහා සේවා සැපයීම.
ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රොඩක්ස් ඉන්ජිනියරිං	63%	-	ඉංජිනේරු සේවාවන්
එල්.ටී.එල්. ට්‍රාන්ස් ෆෝමර්ස් (පුද්) සමාගම	63%	-	ට්‍රාන්ස් ෆෝමර් නිෂ්පාදනය හා අළුත්වැඩියාව, පෝෂක කණු නිෂ්පාදනය
එල්.ටී.එල්.ගැල්වනයිසර්ස් (පුද්) සමාගම	63%	-	ගැල්වනයිස් මෙහෙයුම් වල යෙදීම.
ලෙකෝ ව්‍යාපෘති (පුද්) සමාගම	55%	-	විදුලිය බෙදා හැරීම සඳහා යටිතල පහසුකම් සැපයීම.
බ්‍රයිට් ඉන්ටනැෂනල් පවර් (පුද්) සමාගම	51.7%	-	විදුලිබල පිරියත් මෙහෙයුම සහ සැපයීම.

10.2 බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්) සමාගම හැර අනෙකුත් සියලුම සමාගම් ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇත.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

11. වෙනත් ආයෝජන

සාරාංශය	සමූහය 2011 රු.'000	සමූහය 2010 රු.'000	මණ්ඩලය 2011 රු.'000	මණ්ඩලය 2010 රු.'000
ජංගම නොවන				
ත්‍රිකුණාමලයේ බලශක්ති සමාගම	150,000	-	150,000	-
ස්කන්ධ සුරැකුම් වල ආයෝජන ජංගම නොවන	2,525,000	2,525,000	-	-
කාලීන තැන්පතු	132,000	1,170,321	-	-
භාණ්ඩාගාර බැඳුම්කර	121,631	119,194	-	-
	2,928,631	**3,814,514**	**150,000**	**-**
ජංගම				
ස්කන්ධ සුරැකුම් වල ආයෝජන	198	129	-	-
REPO ආයෝජන සහ වාණිජ පත්‍ර	1,972,661	1,210,073	-	-
ස්ථාවර තැන්පතු සහ විකිෂණ තැන්පතු	11,172,378	5,712,563	-	-
ආයෝජන කාර්ය මණ්ඩලයට ණය දීම සඳහා බැංකු වල ආයෝජනයන්	542,768	482,086	-	-
	13,688,004	**7,404,851**	**-**	**-**

12. රක්ෂණ සංචිතයේ ආයෝජන

	සමූහය 2011 රු.'000	සමූහය 2010 රු.'000	මණ්ඩලය 2011 රු.'000	මණ්ඩලය 2010 රු.'000
වර්ෂය ආරම්භයේදී	3,710,485	3,940,796	3,710,485	3,940,796
වර්ෂය තුලදී කරන ලද ආයෝජන	316,927	404,151	316,927	404,151
වර්ෂය තුල ආපසු ගැනීම්	-	(634,462)	-	(634,462)
වර්ෂය අවසානයේදී	**4,027,412**	**3,710,485**	**4,027,412**	**3,710,485**

13. භාණ්ඩ තොග

	සමූහය 2011 රු.'000	සමූහය 2010 රු.'000	මණ්ඩලය 2011 රු.'000	මණ්ඩලය 2010 රු.'000
අමු ද්‍රව්‍ය	520,390	516,648	-	-
නිමි ද්‍රව්‍ය	112,134	56,214	-	-
පාරිභෝජ්‍ය අමතර කොටස්	17,151,650	17,145,715	15,594,876	15,768,634
ඉන්ධන	4,838,330	2,090,409	4,838,330	2,090,409
මාර්ගස්ථ තොග	561,542	431,929	530,544	417,835
අඩුකළා:යල්පැනගිය සහ ප්‍රයෝජනය ගත නොහැකිවූ භාණ්ඩ සඳහා ප්‍රතිපාදනය	(2,067,030)	(1,623,753)	(2,047,118)	(1,607,710)
	21,117,016	18,617,161	18,916,632	16,669,168
කෙරීගෙන යන වැඩ	55,847	27,896	-	-
	21,172,863	**18,645,058**	**18,916,632**	**16,669,168**

14. වෙළඳ හා අනෙකුත් ලැබිය යුතුදෑ

14.1

	සමූහය 2011 රු.'000	සමූහය 2010 රු.'000	මණ්ඩලය 2011 රු.'000	මණ්ඩලය 2010 රු.'000
වෙළඳ ණයගැතියන්	14,354,711	13,116,761	11,643,815	11,030,866
අඩුකලා : අඩමාන ණය සඳහා වෙන් කිරීම්	(2,602,599)	(2,939,510)	(2,077,568)	(2,164,397)
	11,752,112	10,177,251	9,566,247	8,866,469
වෙනත් ණයගැතියන්	28,629,138	23,644,274	27,412,556	21,299,400
අත්තිකාරම් හා පූර්ව ගෙවීම්	48,906,209	57,070,013	48,833,032	56,872,759
අඩුකළා : අඩමාන ණය සඳහා වෙන් කිරීම්	(1,463,770)	(1,459,552)	(1,463,770)	(1,459,552)
කාර්ය මණ්ඩල ණයගැතියන්	4,525,374	4,003,152	4,164,891	3,690,470
මාර්ගස්ථ ගිණුම	2,165	2,272	2,165	2,272
	92,351,227	**93,437,410**	**88,515,121**	**89,271,818**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

15. සම්බන්ධිත පාර්ශවලින් ලැබිය යුතු මුදල්

	සම්බන්ධතාව	සමූහය 2011 රු.'000	සමූහය 2010 රු.'000	මණ්ඩලය 2011 රු.'000	මණ්ඩලය 2010 රු.'000
ලංකා විදුලිය (පුද්) සමාගම	පරිපාලිත සමාගම	-	-	1,627,537	1,831,493
ලංකා කෝල් (පුද්) සමාගම	පරිපාලිත සමාගම	-	-	-	-
		-	**-**	**1,627,537**	**1,831,493**

16 දායක ප්‍රාග්ධනය

දායක ප්‍රාග්ධනය නියෝජනය කරනු ලබන්නේ 1969 අංක 17 දරණ ලංවිම ස්ථාපිත කිරීමේදී රජයේ විදුලි කටයුතු දෙපාර්තමේන්තුව (ඩී.ජී.යූ.) වෙතින් පවරා ගන්නා ලද ශුද්ධ වත්කම්වල වටිනාකම සහ පහත සඳහන් නිශ්චිත ප්‍රාග්ධන (සංවර්ධන) ව්‍යාපෘති සඳහා අරමුදල් වලිනි.

	2011 රු.'000	2010 රු.'000
රජයේ විදුලිය දෙපාර්තමේන්තුවෙන් පවරා ගත් ශුද්ධ වත්කම් (1969 අංක 17 දරණ ලංවිම පනතට අනුව)	379,155	379,155
ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා දායකත්වය		
STAART ව්‍යාපෘතිය	250,000	250,000
ආසියානු සංවර්ධන බැංකු ණය 2043	980,166	980,166
රජයේ සුනාමි ආධාර	51,765	51,765
ආසියානු සංවර්ධන බැංකු ණය 1930	1,812,469	1,812,469
ගල් අඟුරු බලය	9,679,281	7,780,345
චීන ගැමි විදුලිය ව්‍යාපෘති	683,056	683,056
ගංගා නිම්න සංවර්ධන මණ්ඩල	52,702	52,702
ගැමි විදුලිය යෝජනා ක්‍රම		
- 500 ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රමය1973-81	82,000	82,000
- ADBRE යෝජනා ක්‍රමය 1 - 1980-89	780,647	780,647
- ADBRE යෝජනා ක්‍රමය 2 - 1990-93	1,336,155	1,336,155
- ADBRE යෝජනා ක්‍රමය 3 - ව්‍යාප්ත	400,000	400,000
- ADBRE ණය යෝජනා ක්‍රමය 1021-1995	153,710	153,710
ඒකාබද්ධ අරමුදල 1991 - 93	230,500	230,500
නිදහස් වෙළඳ කලාපය		
- කටුනායක - 1978-83	87,600	87,600
- බියගම - 1982 - 84	11,486	11,486
PSDPTD	1,406,551	1,406,551
ශ්‍රී ජයවර්ධනපුර සංකීර්ණය - 1980 - 82	150,840	150,840
වික්ටෝරියා (මහවැලි)	1,306,000	1,306,000
පට්ටියපොල REDP - 1984 - 85	1,582	1,582
බදු ප්‍රතිපූර්ණය - 1984 - 88	1,351,700	1,351,700
කොත්මලේ (මහවැලි)	3,500,000	3,500,000
කොත්මලේ (3 වන කාණ්ඩය) - 1985 - 90	344,452	344,452
හා.නි.ලේ. ප්‍රදාන - 1992	450,000	450,000
උකුවෙළ (මහවැලි) - 1993	155,000	155,000
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය (ආ.සං.බැ. අරමුදල්)	3,461,693	3,461,693
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය (ශ්‍රී.ලං.ර. අරමුදල්)	1,420,161	1,420,161
විදුලි පද්ධති ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය (ආ.සං.බැ.අරමුදල් 1414)	2,597,602	2,597,602
විදුලි පද්ධති ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය (ආ.සං.බැ.අරමුදල් 1021)	5,490	5,490
ESD ව්‍යාපෘතිය - WBTF 28955	108,601	108,601
රජයේ ප්‍රදාන	3,758,746	3,758,746
ඒකාබද්ධ අරමුදල	1,109,846	1,109,846
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය (කුවේට් අරමුදල්)	768,038	768,038
ලක්ෂපාන පුනරුත්ථාපන ව්‍යාපෘතිය (SIDA)	88,739	88,739
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය (RET)	3,494,334	3,494,334
යුද්ධයෙන් විපතටපත් ප්‍රදේශ පුනරුත්ථාපන ව්‍යාපෘතිය (CAARP-ADB)	1,035,754	939,852
ගල් අඟුරු ව්‍යාපෘතිය	3,585,958	3,585,958
STAART ව්‍යාපෘතිය	1,897,273	1,897,273
දිගු කාලීන ණය පරිවර්තනය	30,998,209	30,998,209

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

	2011 රු.'000	2010 රු.'000
ඉපලෝගම නිවාස ව්‍යාපෘතිය	7,035	7,035
ගම නැගුම	1,362,928	1,362,928
සීඩා ව්‍යාපෘතිය	2,478,053	2,478,053
උතුරු වසන්තය	50,000	50,000
මග ගැගුම	211,730	211,730
CAAP ශ්‍රී.ලං.ර.	355,232	355,232
ජයිකා ව්‍යාපෘතිය	455,903	455,903
රඳවාගැනීම් මුදාහැරීම	270,890	270,890
විදුලමු ලංකා	25,000	25,000
ශ්‍රී ලංකා ගටර් කනෙක්ෂන් ව්‍යාපෘතිය	22,229	22,229
අවශෝෂණ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය	100,000	100,000
කඩිනම් ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය	1,560,000	-
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය 08 (ඉරාන්)	5,604,176	-
IDCKh ව්‍යාපෘතිය - SLT 95	7	-
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය 04 (ව්‍යාප්ත)	1,160,090	-
ග්‍රාමීය විදුලි බල ව්‍යාපෘතිය (04) (පැරණි)	1,296,647	-
වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය	1,023,229	-
කිලිනොච්චි චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය	139,994	-
වර්ෂය අවසානයට	**96,090,404**	**83,311,423**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

17. සංචිත	**සමූහය**		**මණ්ඩලය**	
	2011	**2010**	**2011**	**2010**
	රු.000	**රු.000**	**රු.000**	**රු. 000**
ප්‍රාග්ධන සංචිත (17.1)	17,759,327	17,792,999	17,612,509	17,612,509
ප්‍රත්‍යාගණන සංචිතය (17.2)	342,350,222	296,664,462	338,732,828	293,362,766
ක්ෂය සංචිතය (17.3)	23,000	23,000	23,000	23,000
ස්වයං රක්ෂණ සංචිතය (17.4)	6,588,776	5,816,736	6,572,825	5,800,785
වත්කම් ප්‍රතිෂ්ඨාපන සංචිතය	199,507	189,615	-	-
ප්‍රතිසංස්රක්ෂණ සංචිතය	36,673	2,984	-	-
ආයෝජන සංචිතය	60,530	60,530	-	-
	367,018,036	**320,550,127**	**362,941,162**	**316,799,060**

සී/ස ලංකා විදුලිය (පුද්ගලික) සමාගම
වත්කම් ප්‍රතිෂ්ඨාපන සංචිතය

සමාගමේ දේපල. පිරියත හා උපකරණ ප්‍රතිෂ්ඨාපනයට හා පුනරුත්ථාපනයට ලාභයෙන් වෙන් කරන මුදල මෙයින් නියෝජනය වේ.

එල්.ටී.එල්. හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම
ප්‍රතිසංස්කරණ සංචිතය
සමූහයේ අනාගත ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මෙම සංචිතය නිර්මාණය කර තිබේ.

17.1 ප්‍රාග්ධන සංචිත සමූහය	**සමූහය**		**මණ්ඩලය**	
	2011	**2010**	**2011**	**2010**
	රු.000	**රු.000**	**රු.000**	**රු. 000**
වර්ෂය ආරම්භයේදී ශේෂය	17,792,799	17,763,539	17,447,063	17,447,063
තාප පරිමාණ සංචිත	12,489	20,206	-	-
විදේශ විනිමය සංචිත	(7,289)	19,890	165,446	165,446
විනිමය සමාකාර සංචිත	2,052	(3,427)	-	-
අපේක්ෂිත කොටස් විභජනය	-	(7,409)	-	-
ස්කන්ධයට ගැලපුම් විලම්භිත බදු	(40,724)	-	-	-
වර්ෂ අවසානයේදී ශේෂය	**17,759,327**	**17,792,799**	**17,612,509**	**17,612,509**

සී/ස ලංකා විදුලි (පුද්ගලික) සමාගම
විදේශ විනිමය සංචිතය

ප්‍රාග්ධන සැපයුම් භාණ්ඩ ලැබීම් ගිණුම් ගත කරනු ලබන්නේ පවත්නා ඉහළ අනුපාතිකයකට වන නමුත් ප්‍රතිලාභ වාර්තා කරනු ලබන්නේ ගිවිසුම් අත්සන් කරන විටදීය. එහෙත් මෙයින් නියෝජනය වන පෙර වර්ෂවල විනිමය ප්‍රතිලාභ දැක්වනුයේ ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුවෙන් විශේෂ ගැනිලි (එස්.ඩී.ආර්) යටතේ වන අතර ණය ගෙවීම් සිදු කරන්නේ ගිවිසුම් ගත අනුපාතයකට අනුව වේ.

එල්.ටී.එල්. හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම
විනිමය සංචිතය

මෙම සංචිතය නිර්මාණය කර ඇත්තේ වෙළඳ මණ්ඩල (Syndicate) ණය (එ.ජ.ඩො.) මුදල වාර්තා කරන මුදල් වලට පරිවර්තනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

තාප පරිමාණ සංචිතය
මෙම සංචිතය නිර්මාණය කර ඇත්තේ අනාගතයේදී ඇති විය හැකි තාප පරිමාණ ප්‍රසාද මුදල සඳහාය.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

17.2 ප්‍රත්‍යාගණන සංචිතය

	සමූහය		මණ්ඩලය	
	2011	2010	2011	2010
	රු.000	රු.000	රු.000	රු. 000
දේපල, පිරියත හා උපකරණ පිළිබඳව				
වර්ෂය ආරම්භයට ශේෂය	296,664,462	299,559,111	293,362,766	296,260,291
වර්ෂය තුල පැවරූ අතිරික්තය	45,754,734	2,876	45,439,094	-
වර්ෂය තුල කරන ලද ගැලපීම්	(13,942)	(2,730,630)	(14,000)	(2,730,630)
අපහරණ මත වූ ප්‍රත්‍යාගණන අතිරික්තය	(55,032)	(166,895)	(55,032)	(166,895)
වර්ෂ අවසානයට ශේෂය	**342,350,222**	**296,664,462**	**338,732,828**	**293,362,766**

17.3 ක්ෂය සංචිත

	සමූහය		මණ්ඩලය	
	2011	2010	2011	2010
	රු.000	රු.000	රු.000	රු. 000
වර්ෂය ආරම්භයේදී	23,000	23,000	23,000	23,000
වර්ෂය අවසානයේදී	**23,000**	**23,000**	**23,000**	**23,000**

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 47 (2) උප වගන්තිය ප්‍රකාරව ක්ෂය සංචිතය පිහිටුවා ඇත.ලංවිම විසින් තීරණය කරනු ලබන පරිදි දේපල, පිරියත හා උපකරණ ආවරණය වන පරිදි ක්ෂය සංචිතය මත භාණ්ඩාගාරය සමග පවත්වාගෙන යාම අවශ්‍ය වී ඇත.

17.4 ස්වයං රක්ෂණ සංචිතය

	සමූහය		මණ්ඩලය	
	2011	2010	2011	2010
	රු.000	රු.000	රු.000	රු. 000
වර්ෂය ආරම්භයේදී	5,816,736	5,134,147	5,800,785	5,118,196
රඳවාගත් ඉපයීම්වලින් පැවරීම	772,040	682,589	772,040	682,589
වර්ෂය තුළ අයකළ හානි	-	-	-	-
වර්ෂය අවසානයට	**6,588,776**	**5,816,736**	**6,572,825**	**5,800,785**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

18. පොලී සහිත ණය සහ ණය ගැනීම්

සමූහය	2011 වසරක් තුළ ගෙවිය යුතු මුදල රු.'000	2011 වසරකට පසුව ගෙවිය යුතු මුදල රු.'000	2011 එකතුව රු.'000	2010 වසරක් තුළ ගෙවිය යුතු මුදල රු.'000	2010 වසරකට පසුව ගෙවිය යුතු මුදල රු.'000	2010 එකතුව රු.'000
ණයකර (18.1)	-	-	-	-	-	-
බැංකු ණය (18.2)	9,165,143	5,023,171	14,188,314	5,958,475	8,261,117	14,219,591
භාණ්ඩාගාර ණය (18.3)	-	189,090,153	189,090,153	-	166,777,471	166,777,471
කල්බදු ණය හිමියන් (18.4)	10,272	25,656	35,927	5,529	15,838	21,367
බැංකු අයිරාව	3,715,869	-	3,715,869	5,628,551	-	5,628,551
	12,891,283	**194,138,980**	**207,030,263**	**11,592,554**	**175,054,426**	**186,646,980**

18.1 ණයකර

එල්.ටී.එල්. හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම	2011.01.01 දිනට රු.'000	නිකුත්කළ ණයකර රු.'000	ආපසු ගෙවීම් රු.'000	2011.12.31 දිනට රු.'000
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	8,200	-	(8,200)	-
	8,200	**-**	**(8,200)**	**-**

18.2 බැංකු ණය

18.2.1 මණ්ඩලය

	2011.01.01 දිනට රු.'000	ලබාගත් ණය රු.'000	ආපසු ගෙවීම් රු.'000	2011.12.31 දිනට රු.'000	වාර්ෂික පොලී අනුපාතය %	ආපසු ගෙවන කාලය
මහජන බැංකුව						
මිලියන 9250 ණය	1,474,000	-	(1,152,000)	322,000	11.13%	15 Months
මිලියන 1000 ණය	224,200	-	(158,400)	65,800	11.49%	17 Months
මිලියන 1500 ණය	744,000	-	(504,000)	240,000	11.49%	18 Months
මිලියන 8000 ණය	5,770,000	-	(2,676,000)	3,094,000	10.51%	26 Months
මිලියන 5000 ණය	4,583,000	-	(834,000)	3,749,000	10.13%	66 Months
මිලියන 1000 ණය	-	1,000,000	-	1,000,000	10.30%	
මිලියන 3170 ණය	-	3,170,411	-	3,170,411		
ජාතික ඉතිරිකිරීමේ බැංකුව						
350M Loan	-	350,000	(18,733)	331,267		
	12,795,200	**4,520,411**	**(5,343,133)**	**11,972,478**		

18.2.2 සී/ස ලංකා විදුලිය (පුද්ගලික) සමාගම

	2011.01.01 දිනට රු.'000	ලබාගත් ණය රු.'000	ආපසු ගෙවීම් රු.'000	2011.12.31 දිනට රු.'000	වාර්ෂික පොළ අනුපාතය %	ආපසු ගෙවන කාලය
ආසියානු සංවර්ධන බැංකුව						
ව්‍යාපෘතිය 2	155,774	-	(44,507)	111,267	10.5%	20 Years
ව්‍යාපෘතිය 3	131,663	-	(32,916)	98,747	13.0%	15 Years
	287,437	**-**	**(77,423)**	**210,014**		

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

18.2.3 එල්.ටී.එල්. හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

කෙටි කාලීන ණය	HNB	550,003	964,298	(550,003)	964,298	-	මාස 3
දිගු කාලීන ණය	NDB	3,483	282,747	(3,483)	282,747	-	අවුරුදු 7
	HSBC	293,969	-	(102,116)	191,853	-	
	SCB	286,334	-	(80,804)	205,530	-	
	DFCC	3,167	361,155	(3,167)	361,155	-	
.							
		1,136,955	**1,608,200**	**(739,573)**	**2,005,582**		

18.3 භාණ්ඩාගාරයෙන් ණය

18.3.1 මණ්ඩලය

ව්‍යාපෘතිය	අරමුදල් සපයන්නා	වාර්ෂික පොළී අනුපාතය (%)	2011 රු.'000	2010 රු.'000
භාණ්ඩාගාර ණය			1,200,000	1,200,000
භාණ්ඩාගාර ණය 2006	DST 2006	නිමා වී නැත	30,998,209	30,998,209
ඉහළ කොත්මලේ ජලවිදුලි ව්‍යාපෘතිය	JBIC 74	10%	30,235,850	21,726,793
ඉහළ කොත්මලේ ජලවිදුලි ව්‍යාපෘතිය II	JICA 100		7,261	-
කැළණිතිස්ස ඩීසල් ගබඩා ටැංකි ව්‍යාපෘතිය	China	10%	97,378	97,378
මහ කොළඹ ග්‍රිඩ් උපපොල ව්‍යාපෘතිය	KFW	10%	1,677,412	1,672,576
කොළඹ නගර විදුලි බෙදාහැරීම් ව්‍යාපෘතිය	JBIC 72	10%	6,413,316	5,561,883
කෙරවලපිටිය කොටුගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය	JBIC 78	10%	2,982,016	2,982,016
පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය	China	6%	47,381,917	45,604,676
පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය II	China	6%	58,731,905	51,483,589
නව ලක්ෂපාන හා විමලසුරේන්ද්‍ර ප්‍රතිසංස්කරණ	french		4,892,949	2,788,243
උකුවෙල ප්‍රතිසංස්කරණ බලාගාර ව්‍යාපෘතිය	JBIC	12%	1,571,875	833,263
යාපනය ප්‍රතිසංස්කරණ විදුලිය සැපයුම් ව්‍යාපෘතිය	KFW		37,172	37,172
බලශක්ති හැරවුම් ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය	JBIC	10%	63,760	62,694
පැරණි ලක්ෂපාන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය	KFW		1,245,825	1,245,825
පවිත්‍රතා බලශක්ති හා පිවිසුම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	ADB	10%	1,553,309	483,155
			189,090,154	**166,777,472**
වසරක් ඇතුළත ගෙවිය යුතු			-	-
වසරකට පසුව ගෙවිය යුතු			**189,090,154**	**166,777,472**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

18.4 කල්බදු ණය හිමියෝ සමූහය	2011 එකතුව වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු රු.000	2011 එකතුව වර්ෂයකට පසු ගෙවිය යුතු රු.000	එකතුව 2011 රු.000	එකතුව 2010 රු. 000
කල්බදු ණයහිමියන්	17,058	37,035	54,093	27,828
lවිලම්හිත පොළිය	(6,786)	(11,379)	(18,165)	(6,461)
	10,272	**25,656**	**35,928**	**21,367**

18.4.1 මණ්ඩලය	2011 එකතුව වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු රු.000	2011 එකතුව වර්ෂයකට පසු ගෙවිය යුතු රු.000	එකතුව 2011 රු.000	එකතුව 2010 රු. 000
ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව				
කල්බදු ණයහිමියන්	15,949	34,078	50,027	27,828
විලම්හිත පොළිය	(6,553)	(10,681)	(17,235)	(6,461)
	9,395	**23,396**	**32,792**	**21,367**

18.4.2 ලංකා කෝල් සමාගම	2011 එකතුව වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු රු.000	2011 එකතුව වර්ෂයකට පසු ගෙවිය යුතු රු.000	එකතුව 2011 රු.000	එකතුව 2010 රු. 000
පීපල්ස් ලීසිං සමාගම				
කල්බදු ණයහිමියන්	1,109	2,958	4,067	-
විලම්හිත පොළිය	(233)	(698)	(930)	-
	877	**2,260**	**3,136**	**-**

19. පාරිභෝගික තැන්පතු	සමූහය		මණ්ඩලය	
	2011 රු.000	2010 රු.000	2011 රු.000	2010 රු. 000
වර්ෂය ආරම්භයට ශේෂය	7,543,940	6,761,518	7,543,940	6,761,518
වර්ෂය තුළ ලද තැන්පතු	809,973	918,026	809,973	918,026
වර්ෂය තුළ ආපසු ගෙවීම්	(191,732)	(135,604)	(191,732)	(135,604)
වසර අවසානයට ශේෂය	**8,162,181**	**7,543,940**	**8,162,181**	**7,543,940**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

20. ප්‍රතිපාදන හා අනෙකුත් විලම්භිත වගකීම්

	සමූහය		මණ්ඩලය	
	2011	2010	2011	2010
	රු.000	රු.000	රු.000	රු. 000
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂික (20.1)	3,415,793	3,355,279	2,929,959	2,929,959
වෙනත් ප්‍රතිපාදන	-	1,741	-	-
	3,415,793	**3,357,020**	**2,929,959**	**2,929,959**

20.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් * පාරිතෝෂික

	සමූහය		මණ්ඩලය	
	2011	2010	2011	2010
	රු.000	රු.000	රු.000	රු. 000
ආරම්භක ශේෂය	3,355,279	3,086,232	2,929,959	2,726,466
වර්ෂය සඳහා අයකිරීම	401,185	598,216	320,874	522,220
වර්ෂය තුළ ගෙවීම්	(340,670)	(329,169)	(320,874)	(318,727)
අවසන් ශේෂය	**3,415,793**	**3,355,279**	**2,929,959**	**2,929,959**

20.2 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

මණ්ඩලය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 අනුව (2006 සංශෝධිත) ආයුගණක හා කළමනාකාරීත්ව උපදේශකවරුන් (පුද්) සමාගමේ ආයු ගණකඥවරුන් විසින් 2011 දෙසැම්බර් 31 දින නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂික පිළිබඳව ජීවගණක ඇගයීමක් කරන ලදී. විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය නිශ්චය කිරීමේදී උචිත හා අනුකූලතා උපකල්පනයන් යොදා ගන්නා ලදී. යොදාගත් ප්‍රධාන උපකල්පනයන් පහත දැක්වේ.

	2011	2010
උපකල්පිත වට්ටම් අනුපාතිය (%) (වර්ෂයකට)	11%	11%
ඉදිරි වැටුප් වැඩිවීම (%) - වසර 3 කට වරක්	25%	25%
පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභවල ධාරණ අගය (රු.000)	2,929,959	2,929,959

සී/ස ලංකා විදුලිය (පුද්) සමාගම

ආයු ගණක හා කළමනාකාරීත්ව උපදේශකවරුන් (පුද්) සමාගමේ ජීවගණකඥවරුන් විසින් සමාගමේ නිශ්චිත ප්‍රතිලාභ පාරිතෝෂිකය පිළිබඳව ජීවගණක ඇගයීමක් කරන ලදී. විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය නිශ්චය කිරීමේදී උචිත හා අනුකූලතා උපකල්පන යොදාගන්නා ලදී. යොදාගත් ප්‍රධාන උපකල්පන පහත දැක්වේ.

	2011	2010
වට්ටම් අනුපාතය	වර්ෂයකට 11% බැගින්	වර්ෂයකට 11% බැගින්
ඉදිරි වැටුප් වැඩිවීම් අනුපාතය	8.5%	8.5%
සාමාන්‍ය විශ්‍රාම වයස	2006 දෙසැම්බර් 31 දක්වා පත්වීම් - වර්ෂ 65 යි 2007 ජනවාරි 01 දිනෙන් පසු පත්වීම් - වර්ෂ 55 යි	2006 දෙසැම්බර් 31 දක්වා පත්වීම් - වර්ෂ 65 යි 2007 ජනවාරි 01 දිනෙන් පසු පත්වීම් - වර්ෂ 55 යි
ප්‍රවර්තන සේවා පිරිවැය	රු.17,068,291/-	රු.15,888,964/-

එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

මූලික උපකල්පන	**2011**	**2010**
වට්ටම් අනුපාතය	12%	12%
වැටුප් වැඩිවීම් අනුපාතය	10%	10%
ශ්‍රම පිරිවැටුම	6%	6%
විශ්‍රාම වයස	අවු. 55	අවු. 55

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

21. විලම්භිත ආදායම්	සමූහය		මණ්ඩලය	
	2011 රු.000	2010 රු.000	2011 රු.000	2010 රු. 000
පාරිභෝගික දායකය (21.1)	52,777,202	46,796,835	49,989,780	44,105,171
රජයේ ප්‍රදාන (21.2)	272,612	285,003	272,612	285,003
	53,049,814	**47,081,838**	**50,262,392**	**44,390,174**

21.1 පාරිභෝගික දායකය

වර්ෂය ආරම්භයට ශේෂය	46,796,835	40,889,034	44,105,171	38,300,309
වර්ෂය තුළ පාරිභෝගික දායකය	8,135,736	7,792,813	7,737,927	7,437,138
වර්ෂය තුළදී ක්‍රමක්ෂය	(2,155,369)	(1,885,012)	(1,853,318)	(1,632,276)
වසර අවසානයට ශේෂය	**52,777,202**	**46,796,835**	**49,989,780**	**44,105,171**

21.2 රජයේ ප්‍රදාන

වර්ෂය ආරම්භයට ශේෂය	285,003	297,394	285,003	297,394
වර්ෂය තුළ ක්‍රමක්ෂය	(12,391)	(12,391)	(12,391)	(12,391)
වර්ෂය අවසානයට ශේෂය	**272,612**	**285,003**	**272,612**	**285,003**

22. විලම්භිත බදු	සමූහය		මණ්ඩලය	
	2011 රු.000	2010 රු.000	2011 රු.000	2010 රු. 000
වර්ෂය ආරම්භයට ශේෂය	786,862	449,468	-	-
වර්ෂය තුළ කළ ප්‍රතිපාදන	(801,196)	342,106	-	-
ස්කන්ධයට ගැලපූ විලම්භිත බදු	73,775	-	-	-
වර්ෂය අවසානයට ශේෂය	**59,442**	**791,574**	**-**	**-**

23. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	සමූහය		මණ්ඩලය	
	2011 රු.000	2010 රු.000	2011 රු.000	2010 රු. 000
වෙළඳ ගෙවිය යුතු	60,243,302	52,673,007	60,132,974	51,318,441
වෙනත් ගෙවිය යුතු	25,154,114	12,827,822	23,519,159	12,420,903
උපචිත වියදම් සහිත විවිධ ණයහිමියන්	4,655,477	4,411,474	3,831,768	3,866,081
තැන්පතු (23.1)	12,809,070	10,991,294	12,809,070	10,991,294
ERD වෙතින් තහවුරු කරන තුරු ණයහිමි ශේෂය	3,545,411	-	3,545,411	-
	106,407,374	**80,903,597**	**103,838,382**	**78,596,719**

23.1 තැන්පත්

සේවා රැහැන් තැන්පතු	9,836,742	9,124,196	9,836,742	9,124,196
ටෙන්ඩර් තැන්පතු	152,835	132,677	152,835	132,677
ආරක්ෂක තැන්පතු	73,663	48,677	73,663	48,677
වෙනත් තැන්පතු	2,745,830	1,685,744	2,745,830	1,685,744
	12,809,070	**10,991,294**	**12,809,070**	**10,991,294**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

24. සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු දෑ

		සමූහය		මණ්ඩලය	
	සම්බන්ධය	2011 රු.'000	2010 රු.'000	2011 රු.'000	2010 රු. '000
එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම	පරිපාලිතය	-	-	2,289,004	1,447,831
ලංකා විදුලිය පුද්ගලික සමාගම	පරිපාලිතය	-	-	-	-
ඇන්ටිලෙකෝ මීටරින් (පුද්) සමාගම	ආශ්‍රිතය	-	-	-	-
ලංකා කෝල් (පුද්) සමාගම	පරිපාලිතය	-	-	-	-
		-	**-**	**2,289,004**	**1,447,831**

25 අතීතානුයෝගීව වැරදි නිවැරදි කිරීමේ ප්‍රකාශය

(අ) ලංකා විදුලි බල මණ්ඩලය

රු.1,317,087 ක් ඉදිරියට ගෙන ආ රඳවාගත් ඉපයීම්වලට ගැලපූ අතර ගැලපුම් විස්තර පහත දැක්වේ.

1) ලංවිම විසින් කරන ලද නඩත්තු කාර්යයන් සඳහා රජයේ ආයතනවලින් ලැබීම්, ලැබිය යුතු ගිණුමේ බැර කරනවා වෙනුවට 2009 සහ 2010 දී සාවද්‍ය ලෙස වෙනත් ආදායම්වලට බැර කොට තිබුණි. 2009 සහ 2010 මූල්‍ය ප්‍රකාශ මෙම වැරදි නිවැරදි කිරීමට යළි ප්‍රකාශ කරන ලදී. මෙම මූල්‍ය ප්‍රතාශ යළි ප්‍රකාශ කිරීමේ බලපෑම පහත සාරාංශකර දැක්වේ. 2011 ට බලපෑමක් නැත.

	2009.12.31 න් අවසන් වර්ෂයට බලපෑම රු.000	2010.12.31 න් අවසන් වර්ෂයට බලපෑම රු.000	එකතුව රු.000
ආදායම් ප්‍රකාශය			
රඳවාගත් ඉපයීම් අඩුවීම	13,288	26,722	**40,010**
ශේෂ පත්‍රය			
වෙනත් අයකිරීම් අඩුවීම	13,288	26,722	**40,010**

2) 2000/2001 කාලසීමාව තුළදී ලංවිම එකඟ වූ ස්වයං උත්පාදන ප්‍රතිදානය ලංකා විදුලි සමාගමට ලබා නොදී එම සමාගමෙන් ලංවිමට ලැබිය යුතු මුදල් වලට හිලව් කරන ලදී. කෙසේ වෙතත්, අඩු කරන ලද මුදල් ලංකා විදුලි සමාගමෙන් ලැබිය යුතු ලෙස ලංවිම පොත්වල සටහන් කරන ලදී. පසුව කරන ලද සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් ලංවිම විසින් ස්වයං උත්පාදන ප්‍රතිදානය පියවීමට එකඟ වන ලදී. ඒ අනුව ලැබිය යුතු ලෙස දැක්වූ මුදල අනුව කාලපරිච්ඡේදයට ජනනය පිරිවැයට එරෙහිව ගලපන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස රඳවාගත් ඉපයීම්වලට ගැලපීම් පහත සාරාංශයෙන් දැක්වේ.

	2009.12.31 න් අවසන් වර්ෂයට බලපෑම රු.000	2010.12.31 න් අවසන් වර්ෂයට බලපෑම රු.000	එකතුව රු.000
ආදායම් ප්‍රකාශය			
රඳවාගත් ඉපයීම් අඩුවීම	12,963	3,407	**16,370**
ශේෂ පත්‍රය			
වෙනත් අයකිරීම් අඩුවීම	12,963	3,407	**16,370**

3) ලංවිම විසින් වසර තුනකට වරක් වැටුප් සංශෝධනයක් කරනු ලබන අතර, එය 2009.01.01 දින සිදු කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් වැටුප් සංශෝධනය බලපැවැත්වූයේ 2009.11.01 දින සිටයි. අනතුරුව 2011 වර්ෂයේදී, සාමාන්‍යාධිකාරීගේ අංක 2011/GM/50/Pers මගින් 2009.01.01 සිට 2009.10.31 හිඟ වැටුප් ගෙවීමට තීරණය කරන ලදී. ඒ අනුව ශ්‍රී.ලං.ගි. ප්‍රමිත 29 ට අනුව පහත සඳහන් පරිදි රඳවාගත් ඉපයීම්වලින් 2009 මූල්‍ය ප්‍රකාශවලට ගැලපීම් කළ යුතුව ඇත. 2011 මූල්‍ය ප්‍රකාශවලට මෙහි බලපෑමක් නැත.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

	2009.12.31 න් අවසන් වර්ෂයට බලපෑම රු.'000
ආදායම් ප්‍රකාශය	
රඳවාගත් ඉපයීම් අඩුවීම	1,260,707
ශේෂ පත්‍රය	
වෙනත් ගෙවිය යුතු මුදල්වල වැඩිවීම	1,260,707

සමූහය

(ආ) එල්.ටී.එල්. හෝල්ඩින්ස් (පුද්) සමාගම

1) නිවිඳු (පුද්) සමාගම

වර්ෂය තුලදී සමාගම එල්.ටී.එල්.ඒසොටි සාමාන්‍ය කොටස් 1,466,670 ක් නිකුත් කරන ලදී. මෙම කොටස් නිකුතුව පදනම්වී ඇත්තේ දායක මුදල් සහ එල්.ටී.එල්.ඒසොටි සහ එහි කොටස්කරුවන් අතර එළඹි ගිවිසුමයි. ගිවිසුමේ සඳහන් කර ඇති කොන්දේසි අනුව, අසුපිනිඇල්ල ව්‍යාපෘතිය සාර්ථකව නිමකළ විට අධ්‍යක්ෂවරුන්ගේ අභිමතය පරිදි කොටස් නිකුත් කළ යුතුය. ඒ අනුව මෙම ගනුදෙනුව පෙර වර්ෂ ගැලපුමක් ලෙස සලකන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශ යළි ප්‍රකාශ කිරීමෙන් බලපෑම පහත සාරාංශ කොට දක්වා ඇත.

	2010.12.31 න් අවසන් වර්ෂයට බලපෑම රු.'000
ශේෂ පත්‍රය	
රඳවාගත් ඉපයීම් අඩුවීම	14,667
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්වල වැඩිවීම	14,667

2) ලක්දනවි සමාගම

(අ) මෙහෙයුම් හා නඩත්තු අමතර කොටස් ක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රවර්තන වර්ෂය හා සැසඳීම සහතික කරගැනීම සඳහා සරල මාර්ග ක්‍රමයෙන් තථ්‍ය භාවිතා ක්‍රමයට වෙනස් කරන ලදී. 2010 මූල්‍ය ප්‍රකාශ යළි ප්‍රකාශ කරන ලද අතර, එකී ප්‍රකාශයේ මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම පහත සාරාංශ කර දරක්වේ. යළි ප්‍රකාශ කිරීම ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට බලපෑමක් නොකරේ.

ආ) මූල්‍ය ප්‍රකාශ වඩා හොඳින් ඉදිරිපත්කිරීම සඳහා 300MWCCPP කොන්ත්‍රාත්තුවේ ආදායම යළි ප්‍රකාශ කරන ලදී. 2010 මූල්‍ය ප්‍රකාශ යළි ප්‍රකාශ කළ අතර, එකී යළි ප්‍රකාශ කිරීම මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම පහත සාරාංශ කර දැක්වේ. ප්‍රවර්තන මුදල් වර්ෂයට එහි බලපෑමක් නැත.

	2010.12.31 න් අවසන් වර්ෂයට බලපෑම රු.'000
ආදායම් ප්‍රකාශය	
ආදායම වැඩිවීම (ආ)	73,694
විකුණුම් පිරිවැය වැඩිවීම (අ)	271,557
බද්දට පසු ලාභයේ වැඩිවීම (අ) හා (ආ)	345,251
ශේෂ පත්‍රය	
දේපල පිරියත හා උපකරණ (අ)	271,557
රඳවාගත් ඉපයීම් වැඩිවීම (අ) හා (ආ)	345,251
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම (අ) හා (ඇ)	73,694

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

26 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදලට සමාන දෑ

	සමූහය		මණ්ඩලය	
මුදල් හා මුදලට සමාන දෑ වල සංරචක	**2011**	**2010**	**2011**	**2010**
	රු.'000	**රු.'000**	**රු.'000**	**රු. '000**
26.1 වාසිදායක මුදල් හා මුදල්වලට සමාන දෑ වල ශේෂය				
මුදල් හා බැංකු ශේෂය	3,039,644	3,016,047	1,479,258	1,546,976
ඒක්ෂණ තැන්පත්	60,227	62,006	-	-
	3,099,871	3,078,053	1,479,258	1,546,976
26.2 අවාසිදායක මුදල් හා මුදල්වලට සමාන දෑ වල ශේෂය				
බැංකු අයිරාව (18)	(3,715,869)	(5,628,550)	(2,657,325)	(4,649,192)
මුදල් ප්‍රවාහ ප්‍රකාශ කාර්ය සඳහා මුදල් හා මුදල් සමාන දෑ වල එකතුව	**(615,998)**	**(2,550,496)**	**(1,178,067)**	**(3,102,216)**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

27 ඔඩපනය කළ වත්කම්

27.1 මණ්ඩලය

පහත සඳහන් වත්කම්, වගකීම්වලට සුරැකුම් ලෙස ඔඩපනය කරන ලදී.

වත්කමේ ස්වභාවය	වගකීමේ ස්වභාවය	ඔඩපනය කළ මුදල 2011 රු.'000	2010 රු.'000	තුළ ඇතුළත්වඇත
ලක්ෂපාන බලාගාර සංකීර්ණය	කාලීන ණය	18,166,000	18,166,000	දේපල, පිරියත හා උපකරණ
		18,166,000	**18,166,000**	

27.2 ශ්‍රී ලංකා විදුලිය (පුද්) සමාගම

වගකීම් සඳහා සුරැකුම් ලෙස පහත සදහන් වත්කම් ඔඩපනය කරන ලදී.

වත්කමේ ස්වභාවය	වගකීමේ ස්වභාවය	ධාරණ අගය ඔඩපනය කළ 2011 රු.'000	2010 රු.'000	තුළ ඇතුළත්වඇත
ස්ථාවර තැන්පතු	මහජන බැංකුවේ අයිරා පහසුකම්	45,500	45,500	ජංගම හා ජංගම නොවන ආයෝජන තුළ
ස්ථාවර තැන්පතු	මහජන බැංකුවේ සුමක ණය යෝජනා ක්‍රමය	87,331	80,838	
ස්ථාවර තැන්පතු	උකස් හා ආයෝජන බැංකුවේ සහ HDFC බැංකුවේ කාර්යමණ්ඩල යෝජනා ක්‍රමය	541,757	482,086	
ස්ථාවර තැන්පතු	ජාතික සංවර්ධන බැංකුවට සීමිත වෙස්ට්කෝස්ට් (පුද්) සමාගමේ උපස්ථ ණයවර ලිපි පහසුකම්වලට එරෙහි බැදුම්කර	-	319,000	

27.3 එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම

වගකීම් සදහා සුරැකුම් ලෙස පහත සඳහන් වත්කම් ඔඩපන කර ඇත.

වත්කමේ ස්වභාවය	වගකීමේ ස්වභාවය	ඔඩපනයේ ධාරණ Pledged 2011 රු.'000		තුළ ඇතුළත්ව ඇත
ස්ථාවර තුන්පතු	ණය හා ණයගැනීම් සඳහා පළමු උකස	125,345		ආයෝජන
ලක්දනව් සමාගම හා එහි ඒකාබද්ධ පාලනය කරන අස්ථිත්වයන්				
අස්පෘශ්‍ය දේපල	එ.ජ.ඩො. 11,600,000	4,865,200	-	ඉඩම්, ගොඩනැගිලි, පිරියත හා යන්ත්‍ර, රැහැන්
අස්පෘශ්‍ය දේපල	එ.ජ.ඩො. 6,400,000 - HSBC සමග කාලීන ණය	3,047,173	-	ඉඩම්, ගොඩනැගිලි, පිරියත හා යන්ත්‍ර
අස්පෘශ්‍ය දේපල	එ.ජ.ඩො. 6,000,000 - ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකු සමග කාලීන ණය	3,047,173	-	ඉඩම්, ගොඩනැගිලි, පිරියත හා යන්ත්‍ර
අස්පෘශ්‍ය දේපල	බංකු ඇපකර මත උකස128,028			ආයෝජන
පවන් දනව් (පුද්) සමාගම				
ව්‍යාපෘති වත්කම්	බැංකු ණය	838,488	-	දේපල, පිරියත හා උපකරණ

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

28. ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවුන සිදුවීම්

මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශ වලට ගැලපීම් කිරීමට හෝ එහි හෙලිදරව් කිරීමට තරම් අවශ්‍ය ප්‍රමාණාත්මක ශේෂ පත්‍ර දිනට පසුව එළඹුන සිදුවීම් කිසිවක් නොවීය.

ලංකා විදුලිය (පුද්) සමාගම

2012 පෙබරවාරි මාසයේදී සමාගම ලෙකෝ ව්‍යාපෘති (පුද්) සමාගමෙන් රු. මිලියන 25 ක් වටිනා ස්කන්ධ ප්‍රාග්ධනය පවරාගෙන තිබුණි.

එල්.ටී.එල්. හොල්ඩින්ස් (පුද්) සමාගම

මූල්‍ය ප්‍රකාශ වලට ගැලපීම් කිරීමට හෝ එහි හෙලිදරව් කිරීමට තරම් අවශ්‍ය ප්‍රමාණාත්මක, ශේෂ පත්‍ර දිනට පසුව එළඹුන සිදුවීම් කිසිවක් නොවීය.

29. අසම්භාව්‍යතා

29.1 මණ්ඩලය

2011.12.31 දිනට අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු කම්කරු උසාවියේ ලංවීම වග උත්තරකරු කරමින් නඩු පවරා තවමත් අවසන් නොවූ නඩු කටයුතු මත අසම්භාව්‍ය වගකීම පැන නැගී ඇත. සිදු වීම අවිනිශ්චිතව පැවති අසම්භාව්‍ය වගකීම් වල ඇස්තමේන්තු ගත මුදල රු.මිලියන 574 ක් වූ අතර ඒ සියල්ල මණ්ඩලයට අවාසිවන ලෙස තීරණය වී තිබුණි.

29.2 ලංකා විදුලිය (පුද්) සමාගම

සමාගම 2008 ජූලි 01 දින සිට පිරිවැටුම් බදු ගෙවීම් අත්හිටුවා තිබුණි. 2008 ජූලි 01 දින සිට 2010 දෙසැම්බර් 31 දක්වා නොගෙවා තිබූ පිරිවැටුම් බදු ප්‍රමාණය රු.මිලියන 273 ක් විය. (2010 දී රු. මිලියන 273) කෙසේ වෙතත් අදාල බදු බලධාරින්ගෙන් පැහැදිලි ලිඛිත පැහැදිලි කිරීමක් ලැබී නොතිබුණි. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශ වල ප්‍රතිපාදන සලසා නැත.

සමාගම නඩු 23කට (2009 - 24) වගඋත්තරකරු කරමින් නඩු පවරා තිබුණු අතර වර්ෂය අවසානයට ඇස්තමේන්තු කරන ලද අවම වගකීම රු. මිලියන 305.8 කි. (2010 දී - රු. මිලියන 305.8) තහවුරුවක් නොමැති වුවත්, පවත්නා තොරතුරු පදනම් කරගෙන එකී නෛතික පටිපාටිවල අවසාන නිගමනය මෙහෙයුම් ප්‍රතිඵලයට, මූල්‍ය තත්වයට හෝ සමාගමේ ද්‍රවශීලතාවට ප්‍රමාණාත්මකව අවාසි ලෙස බලපෑමක් නොකරනු ඇති බවට අධ්‍යක්ෂවරු විශ්වාස කරති. ඒ අනුව මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශ වල වගකීම් සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් කර නැත.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

30. ප්‍රාග්ධන බැඳීම්

30.1 මණ්ඩලය

	2011 රු.000	2010 රු.000
මණ්ඩලය අනුමත කළ නමුත් ස්ථාපනය කර නොමැති කොන්ත්‍රාත්තු	47,462	88,833
එකතුව	**47,462**	**88,833**

30.2 ලංකා විදුලිය (පුද්) සමාගම

සමාගම දේපල, පිරියත හා යන්ත්‍ර අත්පත් කර ගැනීම වෙනුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට (2010- නැත) ප්‍රමාණාත්මක මිලදී ගැනීම් බැඳීම් ඇති කර නොතිබුණි.

30.3 එල්.ටී.එල්. හොල්ඩින්ස් (පුද්) සමාගම

සමාගම සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට සහ සිටි බැංකුවට රු.380,750,528 (2010 දී රු.184,779,176) මුළු බැඳීම් ප්‍රමාණයක් පැවතුණි. මේ සියල්ල බැංකු ඇපකර වලට අදාල වේ.මෙකී ඇපකර ප්‍රධාන වශයෙන් ලංසු සහ කාර්ය සාධන බැදුම්කර වේ. මුළු බැඳීම පහත සඳහන් පරිදි ඒවාහි අදාල ප්‍රතිලාභීන් වශයෙන් බෙදා දැක්විය හැකිය.

සමාගමේ නම	ඇපකර						ණයවර ලිපි	රු.000 ප්‍රතිලාභ එකතුව 2011	රු.000 ප්‍රතිලාභ එකතුව 2010
	කොළඹ සිටි බැංකුව	HNB කුරුඳු වත්ත	HSBC	NDB බැංකුව	සම්පත් බැංකුව	ඇපකර එකතුව	කුරුඳු වත්ත HNB		
හෝල්ඩින්ස් (පුද්) සමාගම	253,150	127,600	-	-	-	380,750	-	380,750	195,845
ලක්දනව් සමාගම	188,017	128,028	-	-	-	316,045	-	316,045	293,820
හෙලදනව් සමාගම	-	-	-	300,000	300,000	600,000	-	600,000	300,000
එල්.ටී.එල්. ගැල්වනයිසර් (පුද්) සමාගම	-	-	-	-	-	-	112	112	3,913
ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රොඩක්ට් ඉන්ජිනියරින් (පුද්) සමාගම	-	-	-	-	-	-	12,802	12,802	3,490
එල්.ටී.එල්. ට්‍රාන්ස් ෆෝමර්ස් (පුද්) සමාගම	-	30,075	-	-	-	30,075	22,666	52,741	18,713

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

30.3.2 මෙහෙයුම් කල්බදු බැඳීම්

ස්වභාවය

සමාගම 1998 ජූනි 01 දින ආරම්භ වී 2028 මැයි 31 දින දක්වා වසර 30 ක කාලපරිච්ඡේදයක් සඳහා ලංකා ඉන්ඩස්ට්‍රියල් එස්ටේට් සමාගම සමග මෙහෙයුම් කල්බදු ගිවිසුමකට ඇතුලත් වී තිබුණි.

	2011 රු.'000	2010 රු.'000
වර්ෂයක් ඇතුලත	8,894	8,894
වර්ෂයකට පසු එහෙත් වර්ෂ 5 ට අඩු	4,447	13,341
	13,341	**22,236**

සෑම වසර 5ක දීම කල්බදු කුලිය අළුත් කරනු ලැබේ. එබැවින්, වසර 5 කට වඩා කල්බදු බැඳීම 2013 ජූනි 30 දින වන තුරු පමණක් ප්‍රකාශ කර ඇත.

30.3.3 ලක්දනව් සමාගම සහ එහි බද්ධ පාලිත අස්ථිත්වය

මෙහෙයුම් කල්බදු බැඳීම්

ස්වභාවය

සමාගම 1996 පෙබරවාරි 19 දිනෙන් ආරම්භ වී 2013 පෙබරවාරි 18 දින දක්වා වූ වසර 17 ක කාලපරිච්චේදයක් සඳහා ලංකා ඉන්ඩ්‍රස්ට්‍රියල් එස්ටේට් සමාගම සමඟ මෙහෙයුම් කල්බදු ගිවිසුමකට එළඹ තිබුණි.

	2011 රු.'000	2010 රු.'000
වර්ෂයක් ඇතුලත	12,762	12,762
වර්ෂයකට පසු එහෙත් වර්ෂ 5 ට අඩු	-	12,762
	12,762	**25,524**

30.3.4 හෙලදනව් සමාගම (බද්ධ පාලිත අස්ථිත්වයකි)

(අ) ලංකා විදුලිබල මණ්ඩලය සමඟවූ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම

වර්ෂයකට කි.වො.පැ. 698,417,280 ක්වූ අවම සහතික බලශක්ති ප්‍රමාණය (MGEA) සැපයීමට හෙලදනව් සමාගම අපොහොසත් වුවහොත්.

ඌනතාවය	**ඈවර කළ අලාභ ප්‍රමාණය ඌනතාවයේ එක් එක් කි.වො.පැ. සඳහා**
MGEA 25% ට වැඩි සහ 25% දක්වා	ධාරිතා ගාස්තු 15% ක්
MGEA 25% ට වැඩි	ධාරිතා ගාස්තු 15% ක්

(ආ) ලංකා ඛණිජ තෙල් සංස්ථාව සමග ඇති ඉන්ධන සැපයුම් ගිවිසුම

හෙළදනව් සමාගම, සැපයුම් උපලේඛනය යටතේ ඉන්ධන භාර ගැනීමට අපොහොසත් වුවහොත් සහ/ හෝ මෙම ගිවිසුම යටතේ බැඳීම් වලට අනුකූල වුවහොත්, එම අපොහොසත් වීම හෝ නොහැකියාව හේතු කොටගෙන සෘජුව හෝ විචෘතව සිදුවන පිරිවැය, වියදම්, හානි හා පාඩු සමාගම විසින් දින 30ක් ඇතුළත ගෙවිය යුතුය. කෙසේ වෙතත් මෙම ගිවිසුම යටතේ සමාගමේ වගකීම වර්ෂයකට ඩොලර් 500,000 කට සීමා කර ඇත.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

(ඈ) ලක්දනව් සමාගම සමග ඇති මෙහෙයුම් හා නඩත්තු ගිවිසුම

මෙම ගිවිසුම අනුව, නිම කළ අවසාන දිනයට පසු ගෙවිය යුතු ස්ථාවර ගාස්තුව වර්ෂයකට ඩොලර් 625,000 ක් වන අතර එය මාසික වාරික ලෙස ගෙවනු ලැබේ. මෙම ගිවිසුම කල්පිරීමට පෙර අවසාන කළහොත් කාලසීමාවේ එක් එක් ඉතිරි වර්ෂයට හෝ කාලසීමාවේ කොටසකට සමානුපාතිකව අතිරේක ඩොලර් 200,0000 ක් සමාගම, ලක්දනව් සමාගමට ගෙවීමට බැඳී සිටියි.
විචල්‍ය ගාස්තුව ජනනය කළ ශුද්ධ බලශක්ති නිමවුම මත පදනම් වේ.

(ඇ) එල්.ටී.එල් ව්‍යාපෘති (පුද්) සමාගම සමග ඉන්ධන ප්‍රවාහන ගිවිසුම

සමාගම කාලසීමාව තුලදී ඉන්ධන ප්‍රවාහනය සඳහා එල්.ටී.එල් ව්‍යාපෘති (පුද්) සමාගම සමග ගිවිසුමකට එළඹෙන ලදි. ගිවිසුම ප්‍රකාරව, සැලැස්මේ දැක්වෙන බලශක්ති ජනනය ආරම්භ කළ දිනයේ සිට මාසයකට ඩොලර් 10,500 ක ස්ථාවර ගාස්තුවක් සමාගම ගෙවිය යුතුය.

(ඉ) ජනන බලපත්‍රයක් ඉල්ලීමේ හිමිකම

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 9(1) (ඇ) වගන්තිය ප්‍රකාරව 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇති සමාගම් මෙ.වො. 25 ට වැඩි ධාරිතාවක විදුලිය ජනනය කරන විට ජනනය කිරීමේ බලපත්‍රයක් ඉල්ලීමට හිමිකම ලබයි. ඒ සඳහා එකී සමාගම 50%ට වැඩි කොටස් ප්‍රමාණයක් රජයට හිමි රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ සමාගමක් විය යුතුය. නැතහොත්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිශ්චය කරන ලද කොටස් ප්‍රමාණයක් හිමි එවැනි සමාග මක පරිපාලිතයක් විය යුතුය.

2003 සැප්තැම්බර් 26 දින ලබාගත් ජනන බලපත්‍රය යටතේ දැනට මෙහෙය වන හෙලදනව් සමාගම ද (“හෙලදනව්”) 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත ප්‍රකාරව ජනනය බලපත්‍රයක් ඉල්ලා ඇත. කෙසේ වෙතත් 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ ඉහතකී වගන්තිය ප්‍රකාරව ජනන බලපත්‍රයක් ඉල්ලීමේදී සපුරාලිය යුතු නිර්නායකයන් සම්පූර්ණ කර නොමැති බව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම විසින් හෙලදනව් වෙත දැනුම් දී ඇත. ඒ සමගම, පවත්නා ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන් මෙම අවශ්‍යතාවෙන් නිදහස් කිරීමේ අරමුණෙන් රජය නව විදුලිබල පනත සංශෝධනය කිරීමට අපේක්ෂා කරන බව අවබෝධ වී ඇත.

කෙසේ වෙතත් හෙලදනව් සමාගම මේ සම්බන්ධයෙන් නෛතික මතය ලබා ගැනීමට අපේක්ෂා කරන අතර නීතියේ වෙනස්කම් සහිත බලශක්ති මිලදී ගැනීම් ගිවිසුම සහ ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම යටතේ හෙලදනව් සමාගමට නෛතික සහන හා හානිපූරණ ඉල්ලීමේ හිමිකම ඇති බව දැනුම් දී ඇත.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

31. සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

31.1 මණ්ඩලය

31.1.1 ගිවිසුම් වල අධ්‍යක්ෂ වරුන්ගේ සබඳතා

මණ්ඩලය

විද්‍යා දිල්රුක් අමරපාල මහතා 2011.06.06 දින දක්වා ලංවිම සභාපති ධූරය දරමින් සිටියේය. මණ්ඩලයේ පරිපාලිත සමාගම් වූ ලංකා විදුලිය (පුද්ගලික) සමාගමේ සහ එල්.ටී.එල් හෝල්ඩින්ස් (පුද්) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල වල අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද සේවය කරන ලදි.

උප සභාපති ඩග්ලස් ප්‍රේමරත්න මහතා, ක්‍රියාකාරී අධ්‍යක්ෂ ප්‍රදීප් රොෂාන් ගුණවර්ධන මහතා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික අමිල පී ජයසිංහ මහතා 2011.06.06 දින ඉල්ලා අස්විය.

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශයේ ලේකම් වෛද්‍ය වයි.ඩී.නිහාල් ජයතිලක, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය බී.එම්.එස්. බටගොඩ මහතා සහ කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශයේ අතිරේක ලේකම් ඩබ්ලිව්.ඩී.ජේ ජයසිංහ මහතා 2011වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වශයෙන් රැඳී සිටියහ.
නව සාමාජිකයන් 2011.06.06 දින පත් කරන ලදි. මහාචාර්ය විමලධර්ම අබේවික්‍රම මහතා සභාපති ලෙසද, ඉංජිනේරු අනුර සේනක විජේපාල මහතා උප සභාපති ලෙසද සහ පී.පී ගුණසේන මහතා ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙසද පත් කරන ලදි. කේ.ඩී. රණසිංහ මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් 2011 ජූලි 25 දින සිට පත් කරන ලදි.

31.1.2 සම්බන්ධිත සමාගම් සමග ගණුදෙනු

සම්බන්ධිත පාර්ශවයේ / පාර්ශව වල නම	අධ්‍යක්ෂවරුන්ගේ නම්	සම්බන්ධතාවය	ගණුදෙනුවේ ස්වභාවය	2011.12.31 දිනට ගණුදෙනු වල පරිමාව රු.'000
ලංකා විදුලි (පුද්) සමාගම	1. මහාචාර්ය ඩබ්ලිව්.අබේවික්‍රම මහතා 2. විද්‍යා අමරපාල මහතා 3. බී.ජයවීර මිය 2011.06.09 දක්වා බී.එන්.අයි.එෆ්.ඒ. වික්‍රමසූරිය මහතා 2011.06.09 දිනැතිව	අධ්‍යක්ෂවරු	විදුලිය විකිණීම මනු මිලදී ගැනීම්	14,968,050 799,146
එල්.ටී.එල්. හොල්ඩින්ස් (පුද්) සමාගම	1. මහාචාර්ය ඩබ්ලිව්.අබේවික්‍රම මහතා 2. විද්‍යා අමරපාල මහතා 3. බී.ජයවීර මිය 2011.06.09 දක්වා බී.එන්.අයි.එෆ්.ඒ. වික්‍රමසූරිය මහතා 2011.06.09 දිනැතිව	අධ්‍යක්ෂවරු	ට්‍රාන්ස්ෆෝමර් /ගැල්වනයිස් විෂයන් හා විදුලිය මිලට ගැනීම.	12,132,651
ලංකා කෝල් (පුද්) සමාගම	1. මහාචාර්ය ඩබ්ලිව් අබේවික්‍රම මහතා	අධ්‍යක්ෂ	තාප ගල් අඟුරු මිලදී ගැනීම	8,469,920

31.1.3 ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග ගණුදෙනු

ප්‍රධාන කළමනාකරණ පිරිස් වලට මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් අයත් වේ.

(i) අධ්‍යක්ෂවරුන්ට ණය
මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ට ණයදී නැත.

(ii) ප්‍රධාන කළමනාකරණ පිරිස් වල පාරිශ්‍රමික
සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණය පිරිස් වෙනුවෙන් රු.1,779,450 (2010 දී රු.1,132,244) ක් වැය වී ඇත.

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

31.2 එල්.ටී.එල්.හොල්ඩින්ස් (පුද්) සමාගම

31.2.1 සම්බන්ධිත පාර්ශව හෙලිදරව් කිරීම

වැදගත් සම්බන්ධිත පාර්ශව හෙලිදරව් කිරීම් විස්තර පහත දැක්වේ.

31.2.1.1. පාලිත හා සම්බන්ධිත අස්ථිත්වයන් සමග ගණුදෙනු

	සමාගමේ නම හා සම්බන්ධතාව			
	ලංවිම පාලක	එල්.ටී.එල්.ඊසොට් සම්බන්ධිත සමාගම්	එල්.ටී.එල්.ඊසොට් සම්බන්ධිත සමාගම්	එකතුව
	2011	2011	2011	2011
	රු.'000	රු.'000	රු.'000	රු.'000
ගනුදෙනුවේ ස්වභාවය				
ජනවාරි 31 දිනට				
භාණ්ඩ / සේවා විකිණීම	898,307	(221,421)	168	677,054
ප්‍රකාශිත ලාභාංශ	7,391,694	-	-	7,391,694
සේවා ලැබීම්	(188,962)	(61,012)	(80,984)	(330,958)
ගෙවූ ලාභාංශ	-	-	-	-
වර්ෂය තුල කරන ලද ගෙවීම්	125,975	-	54,000	179,975
බොල් ණය කපාහැරීම්	(49,707)	-	(168)	(49,875)
වර්ෂය තුල ලැබීම්	(6,883,958)	-	-	(6,883,958)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,293,349**	**(282,433)**	**(26,984)**	**983,933**

31.2.1.2 සේවක කොටස් හිමිකම් භාරය

2011 මාර්තු 30 දින පැවති කොටස් හිමියන්ගේ විශේෂ රැස්වීමකදී විශේෂ යෝජනාවක් සම්මත කර ගනිමින් සේවක කොටස් හිමිකම් භාරය (ඊසොට්) ස්ථාපිත කරන ලදී.

(ඊසොට්) පිහිටුවන ලද්දේ සමාගමට එහි සේවකයන් සේවය කිරීම ඇගයීමක් වශයෙන් සමාගමේ කොටසකට ඔවුන්ගේ අයිතිය ලබා දීමටයි.

සමාගමේ නිකුත් කළ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 10.02% ක් නියෝජනය කරන කොටස් 1,670,000 ක් 2011 මාර්තු 31 දින වන විට (ඊසොට්) වෙත නිකුත් කර තිබුණි.

සමාගමේ හෝ පාලිතයේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග ගනුදෙනු

ප්‍රධාන කළමනාකරණ පිරිස් වලට අයිති වන්නේ එහි හා පාලිත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සහ ප්‍රධාන විධායක නිලධාරී.

31.2.1.3 ප්‍රධාන කළමනාකරණ පිරිස් වල වන්දි

	2011	**2010**
	රු.000	**රු.000**
කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	24,915	24,915
පසු සේවා ප්‍රතිලාභ	3,737	3,737
	28,652	**28,652**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

31.3.1 සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

වැදගත් සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම් විස්තර පහත දැක්වේ.

සමාගම, සම්බන්ධිත සමාගම් සමග පහත සඳහන් ගනුදෙනු සිදු කර තිබුණි.

	සමාගමේ නම හා සම්බන්ධතාව			
	ලංවිම පාලිත 2011	වෙනත් ප්‍රධාන කොටස්කරුවන්/ භාණ්ඩාගාරය 2011	පරිපාලිත සමාගම් හා සම්බන්ධිත සමාගම් 2011	එකතුව 2011
	රු.'000	රු.'000	රු.'000	රු.'000
ගනුදෙනුවේ ස්වභාවය				
ජනවාරි 31 දිනට	(1,672,132)	287,437	131,862	(1,252,833)
විදුලිය මිලදී ගැනීම්	(14,913,616)	-	-	(14,913,616)
විදුලිය සඳහා ගෙවීම්	14,865,987	-	-	14,865,987
ආ.ස.බැ.ණය ආපසු ගෙවීම්	-	(77,422)	-	(77,422)
ණය ගැනීම් සඳහා පොලිය	-	33,190	-	33,190
උපචිත වියදම්	(515)	-	-	(515)
පොලී ගෙවීම්	-	(33,190)	-	(33,190)
අමුද්‍රව්‍ය මාරුකිරීම්	(8,062)	-	8,062	-
අමුද්‍රව්‍ය ලැබීම්	-	-	-	-
භාණ්ඩ මිලදී ගැනීම්	-	-	(136,681)	(136,681)
ගෙවීම්	-	-	147,663	147,663
අරමුදල් මාරු කිරීම්	-	-	(14,321)	(14,321)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**(1,728,338)**	**210,015**	**136,585**	**(1,381,738)**

31.3.2 රජයට සම්බන්ධ අස්ථිත්වයන් සමග ගනුදෙනු

මෙම අනාවරණ කාර්යය සඳහා, සමාගම අයත් රේඛීය අමාත්‍යංශය යටතේ ඇති අස්ථිත්වයන් සමග වූ ගනුදෙනු සහ ඊට අමතරව රජයේ භාණ්ඩාගාරය සමග ගනුදෙනු හෙලිදරව් කිරීමට කළමනාකාරිත්වය තීරණය කරන ලදි. සමාලෝචිත වර්ෂය තුලදී එවැනි ගනුදෙනු කිසිවක් නොවීය. (2010 දී නැත)

31.3.3 සමාගමේ සහ එහි පාලිතයේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග වූ ගනුදෙනු

සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස් වශයෙන් නිර්වචනය කර ඇත්තේ සමාගමේ සහ පාලිත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, සාමාන්‍යාධිකාරී ඇතුලු අංශ ප්‍රධානීන්.

ප්‍රධාන කළමනාකරණ පුද්ගල වන්දි

	2011	2010
	රු.'000	රු.'000
අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු හා කෙටි කාලීන ප්‍රතිලාභ	326	474
වෙනත් ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා පාර්ශ්‍රමික	11,995	13,879
ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ගෙවූ මුළු වන්දි	**12,321**	**14,353**

මූල්‍ය ප්‍රකාශ වලට අදාල සටහන්

2011 දෙසැම්බර් 31 දිනට

32 අනුරූපී සංඛ්‍යා

ප්‍රවර්ථන සංඛ්‍යා සමග සැසදීම සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශ වල පහත සඳහන් විෂයයන් වල ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය සංශෝධනය කරන ලදි.

	ඉකුත් කාලයේ වාර්තා කළ පරිදි 2010 රු.'000	වැඩිවීම	අඩුවීම	ප්‍රවර්තන ඉදිරිපත් කිරීම 2011 රු.'000
ශේෂ පත්‍රය				
ආයෝජන				
පරිපාලිත වල ආයෝජන	-	31,321	-	31,321
ශේෂ පත්‍රය				
ස්කන්ධ සුරැකුම් වල ආයෝජන	2,031,321	-	(31,321)	2,000,000
	2,031,321	**31,321**	**(31,321)**	**2,031,321**

විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது / My No. } EH/A/CEB/FA/2011

ඔබේ අංකය / உமது இல / No. }

දිනය / திகதி / Date } 10 July 2013

සභාපති,
ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ලංකා විදුලිබල මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 31 දරණ පනතින් සංශෝධිත 1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 49(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන අදාල පරිපාලිතයන්හි සාමාජිකයින් විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තීයෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2013 ජනවාරි 28 දින නිකුත් කරන ලදි.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. } 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

විගණකාධිපති වාර්තාව

සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සදහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2 මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සහ එහි පරිපාලිතයන්හි මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සදහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම්

2.2.1 සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම (ලංවිස)

ලංකා විදුලි බල මණ්ඩලයට 55% ක හිමිකම් ඇති එහි පරිපාලිත සමාගමක් වු ලංකා විදුලි සමාගමේ, විගණකවරු පහත සදහන් පරිදි සමූහයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කර තිබුණි.

ප්‍රමාණවත් තොරතුරු ලබාගැනීමට නොහැකිවීම හේතුකොට ගෙන වර්ෂය අවසානයට දේපල, පිරියත හා උපකරණ යටතේ ඇතුළත් කර ඇති රු.මිලියන 590 ක් වු (දළ වශයෙන්) යටිතල - කෙරීගෙන යන වැඩ ශේෂය පිළිබද නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය විගණකවරුන්ට තහවුරු කර ගැනීමට නොහැකි විය.

(අ) දේපල පිරියත හා උපකරණ යටතේ දැක්වෙන රු.මිලියන 16 ක් වු "සැපයුම් යටිතල" සමාගමේ ණයකරුවන් විසින් නියම කරන ලද සම්මත සුත්‍රයක් යොදා ගනිමින් දක්වා ඇති බව බව අනාවරණය විය. එම වත්කම් වල සාධාරණ අගය මෙම ප්‍රත්‍යාගණන ක්‍රමය මගින් නිරූපණය නොවේ. එමඟින් දේපල , පිරියත හා උපකරණ, ප්‍රත්‍යාගණන අතිරික්තය හා අදාළ ක්ෂය කිරීම් වලට වු කිසිදු බලපෑමක් තහවුරු කර ගත නොහැකි විය.

(ආ) කැළණිය හා ගාල්ල ශාඛාවල ලෙජර ශේෂ පිළිවෙලින් රු.මිලියන 18 කින් හා රු.මිලියන 5 කින් බිල් කිරීම් පද්ධති ශේෂ ඉක්මවා තිබුණු අතර කළුතර ශාඛාවේ බිල් කිරීම් පද්ධති ශේෂය රු.මිලියන 8 කින් ලෙජර ශේෂය ඉක්මවා තිබුණි. ප්‍රමාණවත් තොරතුරු ලබාගැනීමට නොහැකිවීම හේතුකොට ගෙන මෙම ශේෂ පරික්ෂා කළ නොහැකි විය.

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබුණු සනාථ කිරීමට අනුව ගෙවිය යුතු ශේෂය රු.මිලියන 14 කින් ලෙජරයේ ශේෂය සමඟ එකඟ නොවන අතර ඒ සදහා සතුටුදායක පැහැදිලි කිරීමක් ලැබී නොතිබුණි. තවද රු.මිලියන 9 ක් වු ලැබිය යුතු ශේෂය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් සනාථ කිරීමක් ලැබී නොතිබුණි.

විගණකාධිපති වාර්තාව

2.2.2 සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල ඒකල මුල්‍ය ප්‍රකාශන එකඟවූ පරිදි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වර්ෂය තුළ සංස්ථාපනය කරන ලද "සීමාසහිත පවන් දනව් (පුද්ගලික) සමාගම" නමින් නව පරිපාලිත සමාගමක් ඇති කිරීම සදහා ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් ලබාදී ඇති එකඟතාවය විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

2.2.3 ඒකාබද්ධ කිරීමේ අඩුපාඩු

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වෙන වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ පිළිබඳ සංචලනය සහ විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම්ව කරන ලද ගණනය කිරීම් අතර රු.මිලියන 122 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3 ලංකා විදුලි බල මණ්ඩලයේ මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රීලගිප්‍ර) හා ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ශ්‍රීලංගිප්‍ර 5 -** තොග ප්‍රමිතියට අනුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකමින් අඩු අගයට තොග ගණනය කළ යුතු අතර තොගවල පිරිවැය පිළිවෙලින් ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (FIFO) හෝ බර තැබූ සාමාන්‍ය පිරිවැය සූත්‍රය යොදා ගනිමින් නිකුත් කළ යුතුය. ප්‍රමිතියට පටහැනිව, මණ්ඩලය තම බෙදාහැරීම් කලාපවල ඇති තොග අගය කිරීම සදහා සම්මත මිල යොදා ගෙන තිබුණි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද නියෝග වලට අනුව මිල උච්චාවචනයට යටත් තොග අගය කිරීම සදහා ප්‍රමිත පිරිවැය යොදා ගැනීමට ඉඩදිය හැකි අතර එසේ නොමැති නම් තොග වටිනාකම පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකමින් අඩු අගයට ගණනය කළ යුතුය. පවත්නා තත්ත්වයට අනුව මිල ඉහළ යන නමුත් උච්චාවචනය නොවේ. මණ්ඩලය බොහෝ අවස්ථා වලදී තථ්‍ය ප්‍රමාණයට වඩා ඔවුන්ගේ සම්මත මිල අධි ඇස්තමේන්තුගත කර ඇති බව පැහැදිලි විය. උදාහරණයක් වශයෙන් 2011 වර්ෂයේදී ද්‍රව්‍ය මිල හා ශ්‍රම මිල අධි ඇස්තමේන්තු කිරීමෙන් හදුනාගත් ශුද්ධ ආදායම පිළිවෙලින් රු.මිලියන 2,920 (2010 - රු.මිලියන 1,785) ක් හා රු.මිලියන 803 (2010 - රු.මිලියන 548) ක් විය. එයට අමතරව ආදායම් ප්‍රකාශනයේ ආදායම් ලෙස හදුනාගෙන තිබූ රු.මිලියන 1,255 (2010 - රු.මිලියන 962) ක මුදලක් පොදු කාර්ය පිරිවැය (භාවිතා කළ තථ්‍ය ශ්‍රම පැය සදහා යොදා ගත් ප්‍රමිත මිල ගණනය කළ) ලෙස කාර්ය පිරිවැයට අයකර තිබුණි.

එහි ප්‍රතිඵලයක් ලෙස 2011 දෙසැම්බර් 31 දිනට තොග, කෙරීගෙන යන වැඩ , නඩත්තු හා නිම කරන ලද කාර්ය පිළිබඳ සාධාරණ අගය කිරීම ප්‍රශ්නගත වේ.

(ආ) **ශ්‍රී ල ගි ප්‍ර 16 -** සේවක ප්‍රතිලාභ - ප්‍රමිතියෙහි 120 ඡේදයේ දක්වා ඇති පරිදි ලංකා විදුලි බල මණ්ඩලයේ විශ්‍රාම අරමුදල සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) **සංශෝධිත ශ්‍රී ලං ගි ප්‍ර 18 -** දේපල පිරියත හා උපකරණ (PPE) ප්‍රමිතියට පටහැනිව ශ්‍රී ලංකා මහ බැංකුව වර්ෂය සදහා ප්‍රසිද්ධ කරන ලද තොග මිල දර්ශකය, ආනයන අගය දර්ශකය හා දළ ජාතික නිෂ්පාදිත අනුපාතයෙහි වෙනස්වීම් පිළිබඳ ගණිතමය සරල සාමාන්‍ය මත පදනම්ව ගණනය කරන ලද මිල මණ්ඩලය එහි දේපල පිරියත හා උපකරණ (PPE) ඒවායේ ධාරණ අගය (Carrying Value) ගුණ කිරීම මගින් වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරයි.

තවද , අනුගමනය කරන ලද ක්‍රමයට අනුව , දේපල පිරියත හා උපකරණ ඒවායේ ඇස්තමේන්තුගත ආර්ථික ජීව කාලය දක්වා පමණක් ප්‍රත්‍යාගණනය කරමින් පැවතුණි. එයින් පසු වත්කම් වටිනාකම රු.1 ක නාමික අගයකට පවත්වා ගනිමින් ඒවායේ අපහරණය තෙක් දීර්ඝ කාලයක් එම වත්කම් භාවිතා කරමින් පැවතුණි.

ඊට අමතරව පහත දැක්වෙන තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

විගණකාධිපති වාර්තාව

- විකිණීම සඳහා රඳවා තැබූ හෝ අපහරණය තුළ ඇතුළත් කළ ලෙස වර්ගීකරණය කළ වත්කම්
- තාවකාලික නිෂ්කාර්ය දේපල පිරියත හා උපකරණවල ධාරණ අගය

(ඈ) **ශ්‍රීලංගිප්‍ර 21** - විදේශ විනිමය අනුපාත වෙනස්වීමේ ප්‍රතිඵලය

විදේශ අරමුදල් ව්‍යාපෘති මඟින් මූල්‍යයනය කෙරෙන ප්‍රාග්ධන වත්කම් ඉදිකිරීම් පිළිබඳව කාල පරිච්ඡේදය තුළ පැන නගින ලද විනිමය හුවමාරු වෙනස්කම් සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය, මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ 2.3.1 ඡේදයෙහි හෙළිදරව් කරන ලද ප්‍රතිපත්තිය මඟින් ආවරණය වී නොතිබුණි.

(ඉ) **ශ්‍රීලංගිප්‍ර 24** - රජයේ ප්‍රදාන හා රජයේ ආධාර ගිණුම්ගත කිරීම

ග්‍රාමීය විදුලි බල සැපයුම් වැඩ සටහන් ඇතුළත් විදුලි බල උත්පාදනය, හුවමාරු කිරීම හා බෙදාහැරීම් වැඩ සටහන් සඳහා මණ්ඩලය විසින් ලද විදේශ ආධාර සහ ප්‍රාග්ධන ප්‍රදාන දීර්ඝ කාලයක් දායක ප්‍රාග්ධනය ලෙස සලකා තිබුණි. එසේ වුවද මහා භාණ්ඩාගාරය විසින් එවැනි සමහර ප්‍රදාන ප්‍රාග්ධන දායකය ලෙස සලකා නොතිබුණි. 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, මණ්ඩලය සඳහා දායක වන ලද මුළු ප්‍රාග්ධනය රු.බිලියන 51 ක් වූ අතර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.බිලියන 96 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අතර රු.බිලියන 45 ක රජයේ ප්‍රදාන වෙනස සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කරන ලද ගිණුම්කරණ ගැලපීම ප්‍රමිතිය සමඟ අනුකූලවී නොතිබුණි.

(ඊ) **ශ්‍රීලංගිප්‍ර 41** - ස්ථාවර වත්කම් හානිකරණය (Impairment) - ප්‍රමිතියට අනුව හානිකරණ තක්සේරුවක් සිදුකර නොතිබුණි.

2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කාර්යයන් සඳහා යොදාගත් ශ්‍රමය හා පොදු කාර්ය පිරිවැය ප්‍රමිත පිරිවැයට අගය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පැන නගින ලද එකතුව රු.මිලියන 4,979 (2010 - රු.මිලියන 3,295) ක් වූ සමස්ථ හිතකර ද්‍රව්‍ය මිල විචලනය, ශ්‍රම මිල විචලනය, පොදු කාර්ය විචලනය නඩත්තු හා ප්‍රාග්ධන කාර්යයන් අතර බෙදාහැරීමෙන් තොරව විකුණුම් පිරිවැයට හිලව් කර තිබුණි. එබැවින් වර්ෂය සඳහා දැක්වෙන පාඩුව හා ප්‍රාග්ධන කාර්යයන්හි වටිනාකම පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වලින් සත්‍ය තත්ත්වයක් පිළිබිඹු නොවේ.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ඉදිරියට ගෙන එන ලද බදු පාඩුව රු.මිලියන 67,245 ක් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) රටේ විදුලි බල අංශ සංවර්ධනයන් සඳහා රජය විසින් ලබාගන්නා ලද විදේශ ආධාර ණය කිහිපයක් මණ්ඩලයට උප - ණය ලෙස ලබාදී තිබුණි. 2006 මාර්තු 01 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුව 2005 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.මිලියන 61,996 ක් වූ උප ණය වලින් 50% ක් ස්කන්ධයට මාරුකර තිබුණු අතර ශේෂය වන රු.මිලියන 30,998 ක් ඒකල ණයක් වශයෙන් සලකා තිබුණි. කෙසේ වුවද රජය විසින් පොලී අනුපාතය හා ආපසු ගෙවීම් ක්‍රමය සන්නිවේදනය කර නොතිබුණු බැවින් එම ණය නිරවුල් කිරීමෙන් තොරව පැවතුණු අතර කිසිදු පොලී ගාස්තුවක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. කෙසේ වුවද එම තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) රු.මිලියන 17,447 ක් වූ ණය නිදහස් කිරීමේ ශේෂය හා රු.මිලියන 165 ක් වූ වෙනත් සංචිත ශේෂයෙන් (විදේශ විනිමය සංචිත ලෙස වැරදියට නම් කරන ලද) 2011 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන සංචිතය සමන්විත වේ. කෙසේ වුවද ස්වභාවය, කාර්යය ආදී විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ (Insurance Escrow Fund) ආයෝජනයෙන් ජනනය වූ පොලී ආදායම , එස්ක්‍රෝ අරමුදලේ ආදායමක් ලෙස සැලකීමෙන් තොරව අරමුදල ආරම්භයේ සිටම මණ්ඩලයේ ආදායමක් ලෙස සලකා තිබුණි. උදාහරණයක් ලෙස සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 317 ක් වූ පොලී ආදායම (2010 වර්ෂයේ එය රු.මිලියන 404 ක් විය) මණ්ඩලයේ ආදායම් ලෙස සලකා තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය සඳහා මණ්ඩලයේ අලාභය හා 2011 දෙසැම්බර් 31 දිනට ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ ශේෂය යන දෙකම සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

විගණකාධිපති වාර්තාව

(ඊ) රු.මිලියන 3,047 ක් වූ වැඩ සටහන් ණය මුදලක් ලැබිය යුතු ශේෂයක් ලෙස සාක්ෂි නොමැතිව 2003 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) 2012 පෙබරවාරි 29 දින ආයු ගණක තක්සේරුකරුවකු විසින් කරන ලද තක්සේරුවට අනුව පාරිතෝෂික ගිණුම ගලපා නොතිබීම වර්ෂය සඳහා පාඩුව හා 2011 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වගකීම රු.මිලියන 480 කින් අඩුවෙන් දැක්වීමට හේතුවී තිබුණි.

(ඌ) 2011 වර්ෂයේදී මිලදීගත් පුනර්ජනනීය බලය සඳහා ගෙවිය යුතු රු.මිලියන 57 ක මුදලක් ගිණුම් ගත කර නොතිබුණ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වර්ෂය සඳහා පාඩුව හා උපචිත වියදම් ශේෂය යන දෙකම සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දැක්වුණි.

(එ) "වින්ඩ් පවර්", සමාගමට ගෙවිය යුතු රු.මිලියන 35 ක් වූ තීරු බදු ගැලපුම් ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පාඩුව හා ගෙවිය යුතු ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඒ) ලංකා ඛනිජ තෙල් සංස්ථාව (CPC) විසින් ගනු ලැබූ තීරණයක් හේතුවෙන් 2011 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා ලීටරයකට එකඟ වූ රු.76 ක මිල ඉක්මවූ මිලකට ගණනය කරන ලද ඉන්ධන පිරිවැය රු.මිලියන 1,369 ක් විදුලි බල උත්පාදන සමාගමකට ප්‍රතිපූර්ණය කර තිබුණි. අදාළ පාර්ශවයන් අතර විධිමත් එකඟතාවයක් නොමැතිව එම වැඩිපුර ගෙවීම අනුචිත ලෙස විකුණුම් පිරිවැය වලින් ඉවත්කර ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ලැබිය යුතු ලෙස ගිණුම් ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සමාලෝචිත වර්ෂයේ පාඩුව හා වෙනත් ණයගැති ශේෂය පිළිවෙලින් සමාන ප්‍රමාණයකින් අඩුවෙන් හා වැඩියෙන් දැක්වුණි.

(ඔ) පුද්ගල ගිණුම් වලට බිල්පත්‍ර ඇතුළත් කිරීමට පෙර පාරිභෝගිකයන් විසින් මාසික බිල්පත්‍ර ගෙවීම නිරීක්ෂණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගික පුද්ගල ගිණුම්වල සාවද්‍ය වැඩිපුර ගෙවීම් නිරූපණය විය. මෙම අඩුපාඩුව හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වෙළඳ ණයගැතියන් රු.මිලියන 764 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර එම බැර ශේෂයෙන් රු.මිලියන 748 ක මාස තුනකට අඩු ලෙජරයේ ඇතුළත් කිරීමේ දෝෂයන් නිරූපනය විය.

(ඕ) සාමාන්‍යයෙන් , පෙර වර්ෂවල ආරම්භ කරන ලද කාර්යයන් සඳහා නිකුත් කරන ලද අතිරික්ත ද්‍රව්‍ය පසු වර්ෂ වලදී ගබඩාවලට ආපසු භාර දෙනු ලැබේ. කෙසේ වුවද වර්තමානයේ පවත්නා ක්‍රියාමාර්ගය අනුව එම ආපසු භාර දෙන තොග විෂයයන් නිකුත් කරන අවස්ථාවේ පවතින මිලට අගය කිරීමෙන් තොරව වර්තමාන සම්මත මිලට තොගයට ගනු ලබන අතර කෙරීගෙන යන වැඩද ඒ අනුව ගලපනු ලැබේ. එබැවින් , තොග හා කෙරීගෙන යන වැඩ ශේෂයන් යන දෙකම ඇතැම්විට අඩුවෙන් දැක්විය හැක. උදාහරණයක් වශයෙන්, 2011 වර්ෂයේ මිලට අගය කරන ලද වයඹ පළාත් කාර්යාලයේ ගබඩා වලට භාරදී ඇති තොග විෂයයන් වල වටිනාකම රු.මිලියන 105 ක් විය.

(ක) වෙළඳ ණයගැතියන්ගේ හිඟ ශේෂ සඳහා මණ්ඩලයේ ප්‍රතිපත්තියට අනුව ප්‍රතිපාදන සැලසිය යුතු නමුත්, එසේ සලසා නොතිබූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙළඳ ණයගැතියන් හා අලාභය රු.මිලියන 289 කින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වුණි.

	මුදල රු.මිලියන
විගණනය විසින් සිදුකරන ලද ගණනය කිරීම් වලට අනුව මුළු ප්‍රතිපාදනය	2,207
මූල්‍ය ප්‍රකාශන අනුව මුළු ප්‍රතිපාදනය	1,918
ඌන ප්‍රතිපාදනය	289

(ග) වෙළඳ හා වෙනත් ණයහිමියන් සහ වෙළඳ හා වෙනත් ණයගැතියන් යටතේ එකතුව රු.මිලියන 327 ක හා රු.මිලියන 664 ක පිළිවෙලින් අසාමාන්‍ය හර හා අසාමාන්‍ය බැර ශේෂ ඇතුළත් කර තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එම ණයගැතියන් හා ණය හිමියන් යන දෙකම එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දැක්වුණි.

(ජ) මණ්ඩලයේ වයඹ පළාත් කාර්යාලයේ (NWP) කෙරීගෙන යන වැඩ ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට බැර හා හර ශේෂයන් සහිත කාර්යයන් ඇතුළත්ව තිබුණි. වර්ෂය අවසාන ශේෂය තහවුරු කර ගැනීම සඳහා එම හර හා බැර ශේෂයන් එකට එකතු කිරීමේ හේතුවෙන් කෙරීගෙන යන වැඩ ගිණුම රු.මිලියන 40 කින් අඩුවෙන් දක්වා තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට මාස තුනකට වැඩිකාලයක් එම බැර ශේෂයන් නිවැරදි කිරීමෙන් තොරව පැවතුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

විගණකාධිපති වාර්තාව

(ච) 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන බෙදාහැරීම් කලාප - 3 හි ඉඩම් වටිනාකම ප්‍රත්‍යාගණනය කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉඩම් වටිනාකම රු.මිලියන 17 කින් අඩුවෙන් දැක්වුණි.

(ට) ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ රු.මිලියන 52,736 ක් වටිනාකම වූ ඉඩම්, කාර්යාල ගොඩනැගිලි , හුවමාරු රැහැන් සහ උප කාර්යාල, වරාය පහසුකම් සඳහා ජැටිය, බත්තල් හා ටග් බෝට්ටු , සේවක නිවාස සංකීර්ණ ආදි දේපල මණ්ඩලයට භාර ගෙන තිබුණු අතර 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ අදියර 1 දැනටමත් ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද එම විෂයයන් අවම වශයෙන් කඩින්කඩ පදනම යටතේ හෝ ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරී ගෙන යන වැඩ ගිණුමේ අඛණ්ඩව පැවතුණි.

(ඩ) මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.මිලියන 2,000 ක මුදලක් වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ යටතේ කාරක ප්‍රාග්ධනය සංචලනයක් ලෙස සැලකීමෙන් තොරව ගෙවූ ආදායම් බදු ලෙස මණ්ඩලයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අනුචිත ලෙස දක්වා තිබුණි.

(න) 2011 දෙසැම්බර් මාසයේදී ගෙවන ලද පාරිතෝෂික (බෝනස්) සඳහා උපයන විට ගෙවීම් බදු ප්‍රතිපාදනය නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන උපචිත වියදම අඩුවෙන් දැක්වුණි.

(ත) යාපනය කලාපයේ විදුලි බල සැපයුම පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ යාපනය කලාපයේ විදුලි බල පුනරුත්ථාපනය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.මිලියන 37 ක ප්‍රාග්ධන ප්‍රදානය මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ණය ලෙස සාවද්‍යව ගිණුම් ගත කර තිබුණු අතර එහි ප්‍රතිපලයක් ලෙස 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන දායක ප්‍රාග්ධනය හා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ණය පිළිවෙලින් එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා වැඩියෙන් දැක්වුණි.

2.3.3 නොසැසඳු වෙනස්කම්

පහත දැක්වෙන නොසැසඳු වෙනස්කම් නිරීක්ෂණය විය.

			ශේෂය		වෙනස
	මූල්‍ය ප්‍රකාශනවල විෂයය	**උපයෝගී වාර්තා**	**මූල්‍ය ප්‍රකාශන අනුව රු.මිලියන**	**උපයෝගී වාර්තා රු.මිලියන**	**රු.මිලියන**
(අ)	ලංකා විදුලි (පුද්ගලික) සමාගමෙන් ලැබිය යුතු	ලංකා විදුලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන	1,628	1,736	(108)
(ආ)	ලංකා විදුලි (පුද්ගලික) සමාගමට ලැබිය යුතු	ලංකා විදුලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන	-	9	(9)
(ඇ)	ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ (අදියර - 1) සඳහා දායක ප්‍රාග්ධනය	ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන	3,586	3,570	16
(ඈ)	දේපල, පිරියත හා උපකරණ කලාප - 3	ස්ථාවර වත්කම් ලේඛන	2,454	2,462	(8)
(ඉ)	දේපල, පිරියත හා උපකරණ කලාප - 3	පොදු ලෙජරය	2,454	2,487	(33)
(ඊ)	මෝටර් වාහන හා කාර්යාල උපකරණ සඳහා සමුච්චිත ක්ෂය	ස්ථාවර වත්කම් ලේඛන	1,205	1,186	19
(උ)	මෝටර් වාහන හා කාර්යාල උපකරණ සඳහා සමුච්චිත ක්ෂය	පොදු ලෙජරය	1,205	1,219	(14)
(ඌ)	ලංකා ගල් අඟුරු සමාගමෙන් (LCC) ලැබිය යුතු	ලංකා ගල් අගුරු සමාගමේ මූල්‍ය ප්‍රකාශන - සටහන 13	-	11	(11)
(එ)	වියදම් සඳහා අත්තිකාරම් - ලංකා ගල් අඟුරු සමාගම	ලංකා ගල් අගුරු සමාගමේ මූල්‍ය ප්‍රකාශන - සටහන 13 (ලංවීම වියදම් අත්තිකාරම්)	-	1,606	(1,606)
(ඒ)	වෙළඳ ණයගැතියන් - කලාප 2	බිල් සාරාංශය සහ කාල විශ්ලේෂණ (උපලේඛන ශේෂය -)	1,906	1,956	(50)
(ඔ)	කෙරී ගෙන යන වැඩ (ප්‍රාග්ධන - නොවන) -කලාප 3	වෙනත් ණයගැති කාල විශ්ලේෂණ	110	86	24
(ඕ)	වෙනත් ණයගැතියන්හි ඇතුළත් වෙනත් ණයගැතියන් - කලාප 3	කාල විශ්ලේෂණ	2,049	2,045	4
	එකතුව				**(1,776)**

විගණකාධිපති වාර්තාව

2.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බස්නාහිර පළාත දකුණ - II නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා විදුලි (පුද්ගලික) සමාගමට අදාළව එකතුව රු.මිලියන 33 ක් වූ ලැබිය යුතු ශේෂ තුනක් හා එකතුව රු.මිලියන 27 ක් වූ ලැබිය යුතු ශේෂ තුනක් 2011 දෙසැම්බර් 31 දිනට දීර්ඝ කාලයක් තුළ නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(ආ) 2008 ජනවාරි 24 දිනැති දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ලිපියෙන් උපදෙස් දී ඇති පරිදි පසු වර්ෂ වලදී පැන නගින මණ්ඩලයේ බදු බැරකම්කට එරෙහිව නිරවුල් කිරීමෙන් තොරව රු.මිලියන 38 ක් වූ භාණ්ඩ හා සේවා බදු අතිරේක ගෙවීමක් (GST) 2002 ජනවාරි සිට අයකර ගත යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) වර්ෂ 10 කට වැඩිකාලයක් හිඟ හිට පැවති කලාප 1 විදුලි බල ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු.මිලියන 447 ක් සඳහා කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදනය අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂයෙන් වර්ෂය ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඈ) රජය විසින් බොහෝ ප්‍රදාන හා සහායන් මෙන්ම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සඳහා සහනයන්ද ලබාදී ඇති බැවින් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස වාර්තා කර ඇති රු.මිලියන 1,622 ක් වූ විදුලි බල ප්‍රතිදාන ලැබීම හා රු.මිලියන 3,451 ක් වූ වීථි ලාම්පු සඳහා ලැබීම සැක සහිතය.

කෙසේ වුවද මේ සම්බන්ධයෙන් සභාපතිවරයාගේ හා සාමාන්‍යාධිකාරිවරයාගේ අදහස පහත පරිදි වේ.

"භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ඉහත ශේෂයන් අයකර ගැනීමේ හෝ භාණ්ඩාගාරයේ වෙනත් ගෙවීම් වලට එරෙහිව නිරවුල් කිරීමේ අරමුණින් ගිණුම්වල පවත්වාගෙන ඇත. එබැවින් භාණ්ඩාගාරය අදාළ තීරණය දැන්වුවොත් මිස භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ සැක සහිත ලෙස සැලකිය නොහැක."

(ඉ) 2008 ඔක්තෝබර් 24 දිනැති අංක 1572/25 දරණ ගැසට් නිවේදනයේ 14 ඡේදයට අනුව විදුලි පරිභෝජනයට එරෙහිව මාස දෙකක් සඳහා එහි සියළු පාරිභෝගිකයන්ගෙන් විදුලි පරිභෝජනය සඳහා තක්සේරු කරන ලද පිරිවැයට සමාන තැන්පතුවක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ලබාගත යුතුය.

කෙසේ වුවද ප්‍රවර්ථන බිල් වටිනාකම පදනම් කර ගෙන තථ්‍ය මුදල තැන්පත් කිරීමට එරෙහිව තොග පාරිභෝගිකයන් සම්බන්ධයෙන් බෙදාහැරීම් කලාප - 1 හි තෝරාගත් පළාත් කාර්යාල දෙකක පවත්වා ගෙන යන තැන්පතු ප්‍රමාණවත් නොවූ බව අනාවරණය විය. පාරිභෝගිකයන් 149 දෙනෙකුගෙන් රු.මිලියන 470 ක හිඟයක් නිරීක්ෂණය විය. මීට අමතරව , කිසිඳු ඇප තැන්පතුවක් නොමැතිව වෙනත් තොග පාරිභෝගිකයන් 29 දෙනෙකු සමඟ ගනුදෙනු කරමින් තිබුණු අතර 2011 දෙසැම්බර් 31 දිනට ඔවුන්ගේ හිඟ ශේෂය රු.මිලියන 10 ක් විය. ඒ අනුව , මණ්ඩලය විසින් එම පාරිභෝගිකයන් සමඟ ඉහළ ණය අවදානමක් සහිතව ගනුදෙනු කරමින් සිටින බව අනාවරණය විය.

(ඊ) කොළඹ නගර කාර්යාලයේ රු.මිලියන 225 ක් වූ සාමාන්‍ය සැපයුම් ණය ගැති ශේෂය 2011 දෙසැම්බර් 31 දිනට මාස 6 කට වැඩි කාලයක් හිඟව පැවති අතර එම ශේෂයෙන් 79% ක් විධිමත් අයකිරීම් ක්‍රියාමාර්ගයක් නොගැනීම හේතුවෙන් වර්ෂ 3 කට වැඩි කාලයක් හිඟව පැවතුණි.

(උ) මණ්ඩලයේ කොළඹ නගර කාර්යාලයේ කෙරීගෙන යන වැඩ ගිණුමේ දැක්වෙන 2011 ජනවාරි 01 දිනට වර්ෂ 4 කට වැඩි කාලයක් ඉක්මවූ ශේෂය රු.මිලියන 13 ක් පමණක් වූ බැවින් 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ ශේෂය රු.මිලියන 78 ක් විය නොහැකිය. එබැවින් කෙරීගෙන යන වැඩ ගිණුමේ කාල විශ්ලේෂණය පිළිබඳ නිරවද්‍යතාවය සැක සහිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඌ) 2011 දෙසැම්බර් 31 දිනට සීමාසහිත එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (මණ්ඩලයේ පරිපාලිත සමාගමක්) සමාගමෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 11 ක් වූ අතර එම ශේෂය අයකර ගැනීමෙන් තොරව වර්ෂ තුනකට වැඩි කාලයක් හිඟව පැවතුණි.

(එ) ආගමික පරිශ්‍රයන්ගෙන් ලැබිය යුතු රු.මිලියන 2,418 ක මුදල 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් හිඟව පැවතුණි.

විගණකාධිපති වාර්තාව

(ඊ) තොග පාරිභෝගිකයන් සඳහා සාමාන්‍ය ණය කාලය මාසයක් වේ. කෙසේ වුවද මණ්ඩලයේ නැගෙනහිර පළාත් කාර්යාලයේ තොග පාරිභෝගිකයන්ගේ රු.මිලියන 523 ක් වු මුළු හිඟ ශේෂයෙන් රු.මිලියන 307 ක් 2011 දෙසැම්බර් 31 දිනට මාස තුනකට වැඩි කාලයක් හිඟව පැවතුණි. එබැවින් ණය පාලන පද්ධතිය අධීක්ෂණය කිරීම ඉතා දුර්වල බව නිරීක්ෂණය විය.

(ඔ) මණ්ඩලයේ නැගෙනහිර පළාත් කාර්යාලයේ රු.මිලියන 359 ක් වු ණය හිමි පාලන ගිණුම් (විදුලි) ශේෂය 2011 දෙසැම්බර් 31 දිනට මාස තුනකට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(ඕ) කලාප - 4 හි රු.මිලියන 168 ක් වු ප්‍රාග්ධන - නොවන කෙරීගෙන යන වැඩ වලින් රු.මිලියන 34 ක් වු කෙරී ගෙන යන වැඩ 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් තුළ නිම කර නොතිබුණි.

(ක) අත්තිකාරම් හා පූර්ව ගෙවීම් ගිණුම් ගත කිරීම සඳහා පොදු ක්‍රමයක් නොවු අතර එකම කාර්යය සඳහා විවිධ ගිණුම් පවත්වා තිබුණි. තවද 2011 දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල දිගුකාලීන හිඟ අත්තිකාරම් හා පූර්ව ගෙවීම් ශේෂයන් නිරීක්ෂණය විය. 2011 දෙසැම්බර් 31 දින එම විවිධ ගිණුම්වල වු රු.මිලියන 343.104 ක මුළු ලැබිය යුතු ශේෂයෙන් රු.මිලියන 281.888 ක මුදලක් වර්ෂයකට වැඩි කාලයක් තුළ අයකර ගෙන නොතිබුණි.

2.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති තහවුරු සාක්ෂි නොමැතිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත විෂයයන් සම්බන්ධයෙන් වු රු.මිලියන 8,732 ක මුදලක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

විෂයය	**වටිනාකම රු.මිලියන**	**ඉදිරිපත් නොකළ සාක්ෂි**
භාණ්ඩාගාර ණය	1,200	සම්බන්ධිත ලිපිගොනුව
බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන	ලබාගැනීමට නොහැක.	කරන ලද නිශ්චිත ප්‍රතිපාදන පිළිබඳ විස්තරාත්මක ලැයිස්තුව
ඉවත් කළ ට්‍රාන්ස්ෆෝමර් ගිණුම - කොළඹ නගර කාර්යාලය	160	දීර්ඝ ප්‍රමාදයට හේතු සහ අය කිරීමට ගත් ක්‍රියාමාර්ග
වෙනත් ණයගැතියන් - කෙරීගෙන යන වැඩ, ප්‍රාග්ධන-නොවන		
- කලාප 2	390	විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ
- මූලස්ථාන කාර්යාලය	14	
අත්තිකාරම් හා පූර්ව ගෙවීම්, තැන්පතු, ලං වි ම සේවකයන්ට ණය, වෙනත් ණයගැතියන් ආදිය (බස්නාහිර පළාත, උතුර)	2409	
කලාප-2 හි වෙනත් ණයගැතියන් තුළ ඇතුළත් වෙනත් ණය ගැතියන්	3,584	
ලියා හළ ගබඩා වෙනස්කම් (බස්නාහිර පළාත, උතුර)	22	විස්තරාත්මක උපලේඛන, අවශ්‍ය අනුමැතිය හා විමර්ශන වාර්තා ආදිය
කෙරීගෙන යන වැඩ - කලාප-2	138	විස්තරාත්මක උපලේඛන හා නිම කිරීමේ ප්‍රමාදයට හේතු
වෙනත් අංශයන්ට (ඉහළ කොත්මලේ ව්‍යාපෘතියට) මාරු කරන ලද නිම නොවු ප්‍රාග්ධන වැඩ	815	මාරු කරන ලද විෂයයන් හා අංශ වල නම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන
එකතුව	**8,732**	

විගණකාධිපති වාර්තාව

(ආ) විදේශ / රජය /ලංවීම මුල්‍යයනය කෙරෙන හුවමාරු , බෙදාහැරීම් , උත්පාදන , හා වෙනත් ව්‍යාපෘති කිහිපයක් පැවතියද , ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය අධීක්ෂණය කිරීමට හැකි වන පරිදි සම්පූර්ණ විදුලි බල ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (Clean Energy Access Improvement Project) සඳහා හැර ඉතිරි ව්‍යාපෘති සඳහා වෙනම ගිණුම් පවත්වා නොතිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලද මුළු ණය සම්බන්ධයෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අතර රු.මිලියන 108,769 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලද රු.මිලියන 6,146 ක් වටිනා ණය තුනක් සම්බන්ධයෙන් උප ණය ගිවිසුම් නොතිබූ අතර ඒ හේතුවෙන් ආපසු ගෙවීම් ක්‍රමය හා එම ණය සඳහා පොලිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) සේවා සම්බන්ධන කාර්යයක් සඳහා ගන්නා සාමාන්‍ය කාලය මාස 6 සිට 9 දක්වා වේ. කෙසේ වුවද කොළඹ නගර කාර්යාලය ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ඔවුන්ගේ රු.මිලියන 450 ක් වටිනා කාර්යයන් 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් ඉක්මවා තිබුණි. එබැවින් අදාල කාර්යයන් නිම කර තිබුණු අවස්ථා වලදී ද සේවා ප්‍රධාන තැන්පතු පාරිභෝගික දායක ගිණුමට මාරු නොකිරීමේ හැකියාවක් තිබුණි. එබැවින් නිමකිරීමේ දීර්ඝ ප්‍රමාදයට හේතු හඳුනා ගැනීම සඳහා හා 2011 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික දායකය පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා එම දිගුකාලීන හිඟ හිටි කාර්යයන් සම්බන්ධයෙන් විස්තරාත්මක විශ්ලේෂණ වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) මණ්ඩලයේ වයඹ පළාත් කාර්යාලයේ කෙරී ගෙන යන වැඩ ගිණුමේ රු.මිලියන 186 ක් හා රු.මිලියන 196 ක් පිළිවෙලින් වර්ෂ 2 සිට 5 දක්වා හා වර්ෂ 5 ට වැඩි කාල පරිච්ඡේදයක් තුළ නිරවුල් කිරීමෙන් තොරව ප්‍රධාන වශයෙන් නිම කිරීම් වාර්තා නොමැතිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව දක්වා තිබුණි. ප්‍රමාදය සඳහා හේතු හඳුනා ගැනීමට විස්තරාත්මක විශ්ලේෂණ වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3.6 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත

(i) **47(1)(අ) වගන්තිය** - වගන්තියට අනුව මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපල වල රක්ෂණය ආවරණය කිරීමට සහ කම්කරු වන්දි ආඥා පනත යටතේ පැන නගින තුන්වන පාර්ශ්වයේ අවදානම් සහ වගකීම් දැරීමට මණ්ඩලය විසින් භාණ්ඩාගාරය සමඟ රක්ෂණ සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතු නමුත් එයට අනුකූලවී නොතිබුණි. කෙසේ වුවද මණ්ඩලයේ හානිවන දේපල පිරිවැය දැරීමට ස්වයං රක්ෂණ සංචිතයක් ඇති කර පවත්වා ගෙන ගොස් තිබුණු අතර 2011 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.මිලියන 6,572 ක් විය.

(ii) **47(1)(ආ) වගන්තිය** - වගන්තියට අනුව , මණ්ඩලය විසින් ලබාගන්නා ණය ආපසු ගෙවීමට අදාලව භාණ්ඩාගාරය සමඟ එක්ව නිදන් අරමුදලක් (Sinking Fund) ස්ථාපිත කර පවත්වා ගත යුතුය. ණය නිදහස් කිරීමේ සංචිතයක් තිබුණද, එය 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි. එම සංචිත ගිණුමේ ශේෂය (වර්ෂය ආරම්භයේ ශේෂය ලෙස සාවද්‍යව සඳහන් කර තිබුණි. - යොමුව සටහන අංක 17.1) රු.මිලියන 17,447 ක් විය.

(iii) **47(2)(අ) වගන්තිය** - වගන්තියට අනුව , මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපල වල ක්ෂය ආවරණය කර ගැනීම සඳහා භාණ්ඩාගාරය සමඟ එක්ව ක්ෂය සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව , මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශන වල 2000 දෙසැම්බර් 31 දක්වා වාර්ෂිකව රු.මිලියන 1 ක් මාරු කර ක්ෂය සංචිතයක් ගොඩනගා තිබුණු අතර එයින් පසු කිසිඳු සංචලනයක් සිදුවී නොතිබුණි. එම දිනට සමුච්චිත වී ඇති රු.මිලියන 23 ක ශේෂයක් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබුණි.

(iv) **47(2)(ආ) වගන්තිය** - වගන්තියට අනුව , ආදායම් මුදල් වලින් ප්‍රාග්ධන වැඩ වලට මුල්‍යයනය කිරීමේ අරමුණ සඳහා , මණ්ඩලයේ මූල්‍ය ස්ථායිතාවය සහතිකවීමට සහ මණ්ඩලය විසින් වරින්වර තීරණය කරනු ලබන වෙනත් එවැනි අරමුණු සඳහා මහා භාණ්ඩාගාරය සමඟ එක්ව මණ්ඩලය පොදු සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශන වල වෙනත් ප්‍රාග්ධන සංචිතයක් ගොඩනගා තිබුණු නමුත් එය 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි. එම සංචිත ගිණුමේ ශේෂය රු.මිලියන 165.45 ක් විය.

විගණකාධිපති වාර්තාව

(ආ) 1969 අංක 17 දරණ විදුලිබල මණ්ඩල පනතේ 46 වගන්තියට හා 1971 අංක 38 දරණ මුදල් පනතේ II කොටසේ 11 (අ) හා (ආ) වගන්තිවල විධිවිධාන වලට පටහැනිව 1989 වර්ෂයේ සිට එක් එක් වර්ෂය අවසානයට එහි දළ ස්ථාවර වත්කම් වල මුළු අගයට 0.1% ක දායකයක් පදනම් කර ගෙන 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,710 ක්වූ අරමුදල් මණ්ඩලය විසින් ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ (Insurance Escrow Fund) ආයෝජනය කර තිබුණි.

(ඇ) 1990 මාර්තු 09 දිනැති අංක 15/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී / 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) චක්‍රලේඛ උපදෙස් වල දක්වා ඇති පරිදි පුවත්පත් දැන්වීම්, ගැසට් නිවේදනයන් ආදිය මඟින් සුදුසුකම්ලාභී අයදුම්කරුවන්ගෙන් දීප ව්‍යාප්ත ඉල්ලුම්පත් කැඳවීමෙන් තොරව ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලිපිකරුවන්, කැෂියර්වරුන්, ගබඩාකරුවන්, යතුරු ලියන්නන්, රියදුරන්, කාර්යාල සහායකයින් ආදි වශයෙන් නුපුහුණු හා අර්ධ පුහුණු කාර්ය මණ්ඩලය වාර්ෂිකව බඳවා ගෙන තිබුණි.

(ii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.2 ඡේදයට අනුව සියළු රාජ්‍ය ව්‍යාපාරයන් සතුව සියළු ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන ක්‍රමානුකූලව සංශෝධනය වන හා යාවත්කාලීන කෙරෙන ස්වකීය පද්ධති / අත්පොත් තිබිය යුතුය. කෙසේ වුවද වර්ෂ 24 කට පෙර පිළියෙල කරන ලද මණ්ඩලයේ පරිපාටි සංග්‍රහයන් මණ්ඩලය විසින් යාවත්කාලීන කර නොතිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 පිරිවැය ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සඳහාවූ මණ්ඩලයේ විකුණුම් පිරිවැය පිළිබඳ විශ්ලේෂණයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත වගුවෙන් දැක්වේ.

විස්තරය	වර්ෂය සඳහා වියදම 2011 රු.මිලියන	2010 රු.මිලියන	වෙනස රු. මිලියන	%
විදුලිබල මධ්‍යස්ථාන ඉන්ධන ගිණුම	24,982.470	16,350.498	8,631.771	53
ස්වාධීන විදුලිබල ආයතන වලින් බලය මිලදී ගැනීම	75,276.325	57,647.289	17,629.036	31
පුනර්ජනනීය බලය මිලදී ගැනීම	8,867.771	8,019.195	848.576	11
කාර්ය මණ්ඩල වියදම	11,745.872	11,635.701	110.171	1
ද්‍රව්‍ය පිරිවැය	12,989.753	5,124.311	7,865.441	153
නවාතැන් පහසුකම් වියදම	774.031	656.127	117.904	18
ප්‍රවාහන හා සන්නිවේදන	2,203.607	1,970.139	233.468	12
ද්‍රව්‍ය මිල විචලනය	(2,919.687)	(1,785.179)	(1,134.508)	64
පොදු කාර්ය අයකිරීම්	(1,255.475)	(961.658)	(293.817)	31
ශ්‍රම මිල විචලනය	(803.281)	(548.037)	(255.244)	47
ක්ෂය	18,297.458	15,990.333	2,307.126	14
වෙනත් වියදම	2,268.827	2,069.761	199.066	10
විකුණුම් පිරිවැය	**152,427.470**	**116,168.481**	**36,258.989**	**31**

ඉහත තොරතුරු වලට අනුව, මණ්ඩලයේ මුළු වියදමින් 70% ක් පමණ විදුලි බලය මිලදී ගැනීම හා උත්පාදනයට සෘජුවම අදාල වන බව අනාවරණය විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රමිත මිලට අගය කරන ලද ද්‍රව්‍ය පිරිවැය 153% කින් අසාමාන්‍යව වැඩිවී තිබුණි.

3.1.2 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 19,266 ක බදු වලට පෙර පාඩුවක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 4,832 ක් වූ බැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 24,098 කින් පිරිහීමක් දැක්වුණි. එම පිරිහීම සඳහා ප්‍රධාන හේතූන් පහත පරිදි විශ්ලේෂණය කෙරේ.

විගණකාධිපති වාර්තාව

විෂයය	2011 රු. මිලියන	2010 රු. මිලියන	වැඩිවීම / (අඩුවීම) රු. මිලියන	%	පාඩුවට දායකය %
විකුණුම්	**132,460**	**121,226**	**11,234**	46.6	47
ඉන්ධන	(31,992)	(16,551)	15,441	93.3	-64
බලය මිලදී ගැනීම	(84,144)	(65,466)	18,678	28.5	-78
මෙහෙයුම් හා නඩත්තු	(22,972)	(21,456)	1,516	7.1	-06
මිල විචලනය	4,978	3,295	1,683	51.1	07
ක්ෂය	(18,297)	(15,990)	2,307	14.4	-10
විකුණුම් පිරිවැය	(152,427)	(116,168)	36,259	31.2	
දළ ලාභය / (අලාභ)	(19,967)	5,058	25,025	494.8	
වෙනත් ආදායම	4,544	4,230	314	7.4	01
මෙහෙයුම් වියදම	(3,842)	(4,456)	(614)	(13.8)	03
මෙහෙයුම් ලාභය / (අලාභ)	(19,265)	4,832	(24,097)	(498.7)	100

((අ) ජල විදුලි බලය උත්පාදනය අඩුවීම තාප විදුලි බලය උත්පාදනය වැඩිවීමට හේතුවී තිබුණු අතර අවසානයේ ඉන්ධන වෙනුවෙන් හා ස්වාධීන විදුලිබල සැපයුම්කරුවන්ගෙන් විදුලි බලය මිලදී ගැනීම වෙනුවෙන් මණ්ඩලයට විශාල වියදමක් දැරීමට සිදුවී තිබුණි. එම කරුණු දෙක හේතුවෙන් 2011 වර්ෂයේ පිරිවැය වැඩිවීම ඉකුත් වර්ෂයට එරෙහිව රු.මිලියන 15,441 ක් හා රු.මිලියන 18,678 ක් වු අතර පිළිවෙලින් 64% කින් හා 78% කින් මුළු පාඩුව වැඩිවීමට එය දායකවී තිබුණි.

(ආ) 2011 වර්ෂයේ ක්ෂය ප්‍රතිපත්තිය වෙනස්වීම හේතුවෙන් රු.බිලියන 2 ක පමණ අතිරේක පිරිවැයක් ආදායම් ප්‍රකාශනයට අයකිරීමට මණ්ඩලයට සිදුවී තිබීම 10% කින් පාඩුව වැඩිවීමට හේතුවී තිබුණි.

(ඇ) ප්‍රමිත පිරිවැයට තොග විෂයයන් නිකුත් කිරීමේදී ඇතිවු වාසිදායක මිල විචලනයන්ට අමතරව ඉල්ලූමේ සුළු වැඩිවීමක් හා 2011 වර්ෂයේ තීරු බදු සංශෝධන වල ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 11,234 ක අතිරේක ආදායමක් උපයා තිබුණද , 2011 වර්ෂයේ මණ්ඩලයේ පාඩු තත්ත්වයක් ඉහත හේතූන් නිසා ඇතිවී තිබුණි.

3.1.3 ද්‍රවශීලතා තත්ත්වය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ද්‍රවශීලතා තත්ත්වය පහත අනුපාත මගින් දැක්වේ.

	අනුපාතය	2011	2010
(අ)	ජංගම අනුපාතය	0.9:1	1.2:1
(ආ)	ක්ෂණික වත්කම් අනුපාතය	0.8:1	0.9:1
(ඇ)	ජංගම බැරකම් වලට මුදල් හා බැංකු ශේෂය	0.01:1	0.02:1

(අ) සහ (ආ) අනුපාතයන් පිළිවෙලින් 2:1 හා 1:1 යන සීමාව ඇතුළත පැවතිය යුතු බවට අපේක්ෂා කෙරේ.

ඉහත විශ්ලේෂණයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ද්‍රවශීලතා තත්ත්වය ජල විදුලි බල උත්පාදනය අඩුවීම හේතුකොටගෙන ඉකුත් වර්ෂයට එරෙහිව එක්තරා මට්ටමකට පිරිහී තිබු බව අනාවරණය විය.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 විදුලිබල උත්පාදනය

සමාලෝචිත වර්ෂයේ විදුලිබල උත්පාදන විස්තර පිළිබඳ විශ්ලේෂණයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත වගුවෙන් දැක්වේ.

විගණකාධිපති වාර්තාව

මූලාශ්‍රය	2011 ගිගා වොට් පැය (ගි.වො.පැ.)	%	2010 ගිගා වොට් පැය (ගි.වො.පැ.)	%	වෙනස ගිගා වොට් පැය (ගි.වො.පැ.)	%
ජල විදුලි	4,018	35	4,988	46	-970	-11
තාප	5,748	50	4,994	47	754	3
ගල් අඟුරු	1,038	9	0	0	1,038	9
කුඩා ජල විදුලි	604	5	646	6	-42	-1
සුළං	3	0	3	0	0	0
සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලය (NCRE)	118	1	83	1	35	0
එකතුව	**11,529**	**100**	**10,714**	**100**	**815**	**0**

ඉහත තොරතුරු අනුව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජල විදුලිබල උත්පාදනය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී අඩු වැසි ලැබීම හේතුවෙන් ගි වො පැ (GWh) 4,988 සිට ගි වො පැ (GWh) 4,018 දක්වා 11% කින් පහත වැටී තිබුණි. කෙසේ වුවද එම අඩුවීම තාප හා ගල් අඟුරු බලය මගින් හිලව් කර තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2011 වර්ෂයේ මුළු විදුලිබල උත්පාදනය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ගි වො පැ (GWh) 815 කින් වැඩිවී තිබුණි. ඒ අනුව විදුලිය කපා හැරීමෙන් තොරව ලංකා විදුලි බල මණ්ඩලයට එහි මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීමට හැකිවී තිබුණි.

(ආ) මණ්ඩලයට 2010 වර්ෂයේදී හරිත බල මූලාශ්‍ර වලින් රටේ සමස්ථ විදුලිබල ඉල්ලුමෙන් 53% ක් උත්පාදනය කිරීමට හැකිවී තිබුණද , 2011 වර්ෂයේදී 12% ක අඩුවීමක් පෙන්නුම් කරමින් එය 41% දක්වා අඩුවී තිබුණි.

3.2.2 විදුලි බලය විකුණුම්

2011 වර්ෂය සඳහා මණ්ඩලයේ සංඛ්‍යාත්මක සම්පිණ්ඩනයෙන් (Statistical Digest) ලබාගත් වටිනාකම් හා ප්‍රමාණයන් අනුව විවිධ වර්ගයේ පාරිභෝගිකයන් යටතේ වර්ගීකරණය කරන ලද විකුණුම් ආදායම් සම්බන්ධයෙන් තොරතුරු පහත වගුවෙන් දැක්වේ.

පාරිභෝගික වර්ගය	පාරිභෝගිකයන් සංඛ්‍යාව	%	විකුණුම් කිලෝ වොට් මිලියන	%	රු.	%	ඒකකයකට කිලෝ වොට් පැය විකුණුම් මිල රු.
ගෘහස්ථ	4,165,738	88	3,379	34	33,131	25	9.80
ආගමික	28,3201	51	0	359	0	7.03	
සාමාන්‍ය කාර්යයන්	475,38010	1,927	19	41,674	32	21.63	
කර්මාන්ත හා හෝටල්	48,0081	3,290	33	42,328	32	12.87	
ලංවිස (LECO)	1 0	1,267	13	14,968	11	11.81	
වීථි ආලෝකකරණය	1 0	109	1	-	-	-	
	4,717,448	**100**	**10,023**	**100**	**132,460**	**100**	**13.22**

ඉහත විශ්ලේෂණයට අනුව , ගෘහස්ථ කාර්යයන් සඳහා එදිනෙදා විදුලි බලය භාවිතා කරන ගෘහස්ථ පාරිභෝගිකයන් සංඛ්‍යාව මුළු පාරිභෝගික සමූහයෙන් 88% ක් නියෝජනය වන අතර මණ්ඩලයේ මුළු ආදායම සඳහා 25% ක දායකත්වයක් දරමින් 2011 වර්ෂයේදී විකුණන ලද ඒකක ප්‍රමාණයෙන් 34% ක් පරිභෝජනය කර ඇත. එහෙත් එම කාර්යය සඳහා සාමාන්‍ය විකුණුම් මිල ඉතා අඩුය. එබැවින් පරිභෝජනය ඉතා අඩු මට්ටමකට පවත්වා ගැනීම සඳහා විදුලි බලය ඉතිරි කිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩ සටහන් උපරිම වැදගත්කමක් දරයි.

බැංකු, සමාගම් හා රජයේ කාර්යාල වැනි පාරිභෝගිකයන් සාමාන්‍ය කාර්යය පාරිභෝගිකයන් ලෙස වර්ගීකරණය කෙරේ. මුළු පාරිභෝගික සමූහයෙන් 10% ක් ඔවුන්ගෙන් නියෝජනය වන අතර මණ්ඩලයේ ආදායමට 32% ක දායකත්වයක් සපයමින් 2011 වර්ෂය සඳහා විකුණන ලද මුළු ඒකක ප්‍රමාණයෙන් 19% ක් පරිභෝජනය කර ඇත.

2011 වර්ෂයේ පාරිභෝගික සමූහයෙන් 1% ක් පමණක් කර්මාන්ත හා හෝටල් වලින් නියෝජනය විය. ඔවුන්ගේ පරිභෝජනය මුළු ඒකක විකුණුම් වලින් 33% ක් වුවද වර්ෂයේ ආදායමට දායකත්වය 32% ක් විය.

විගණකාධිපති වාර්තාව

විකුණන ලද මුළු ඒකක ප්‍රමාණයෙන් 14% ක් පරිභෝජනය කරන ලද ඉතිරි 1% ක ප්‍රමාණය වෙනත් සියළු පාරිභෝගික වර්ගයන්ගෙන් නියෝජනය වූ අතර 2011 වර්ෂයේ ආදායමට 11% ක දායකත්වයක් සපයා තිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය සංස්ථා හා මණ්ඩල ඇතුළත් සියළුම රාජ්‍ය අංශයේ සංවිධානවල මූල්‍ය හා පරිපාලනය සම්බන්ධයෙන් ඒකාකාරී පරිපාටි හා පරිචයන් පවත්වා ගැනීමට වරින් වර රජය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලන රීති වශයෙන් අනුගමනය නොකරන්නේ නම් ඔවුන්ට ඒවා අදාල නොවන බවත් 1969 අංක 31 දරණ පනතින් සංශෝධිත 1969 අංක 17 දරණ ලංකා විදුලබල මණ්ඩල පනතට අනුකූලව තත්ත්වය පවත්වා ගෙන තිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය. එවැනි උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

(i) 2008 ජූලි 01 සිට මණ්ඩලයේ සමස්ථ සේවකයන්ට ගෙවන ලද විශේෂ අතුරු දීමනාවට අදාලව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- දීමනා අත්තිකාරමක් ලෙස ගෙවීමටත් 2009 ජනවාරි 01 සිට බලපැවැත්වෙන යෝජිත වැටුප් සංශෝධනයේදී එම දීමනාව අන්තර් ග්‍රහණය කර ගැනීමටත් මූලික තීරණය ගෙන තිබුණි. කෙසේ වුවද දීමනාව තවමත් අඛණ්ඩව ගෙවන අතර අත්තිකාරමට එරෙහි වැටුප් වැඩිවීම් ගිණුමේ 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිතව පැවති රු.මිලියන 235 ශේෂය සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය මත වැටුප් ගිණුමට මාරු කර තිබුණද ඔහුට එසේ අනුමත කිරීමට බලයක් නොතිබුණි.

- 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ගෙවීම කර තිබුණි.

- 2009 හා 2012 දී කරන ලද වැටුප් සංශෝධන සැලකීමේදී දීමනාව පිළිබඳ විස්තර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව වාහන ණය 10% සිට 14 % දක්වා පොලී ප්‍රමාණයකට ලබාදෙනු වෙනුවට මණ්ඩලය විසින් 4.2% ක පොලී ප්‍රමාණයට ලබාදී තිබුණි. තවද මණ්ඩලයට බරපතල ද්‍රවශීලතා ගැටළු ඇති වුවත් කිසිදු පාලනයකින් තොරව සේවක ණය ලබාදී තිබූ බව නිරීක්ෂණය විය.

(iii) 2007 දෙසැම්බර් 13 දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ අංක සීපී/07/2116/332/050 අනුව ඊළඟ වැටුප් සංශෝධනයේ සිට උපයන විට ගෙවීම් බදු බැරකම සේවකයන්ට මාරු කිරීමට ගත් තීරණය ඉක්මවායමින් සේවකයින් විසින් දැරිය යුතු උපයන විට ගෙවීම් බදු බැරකම මණ්ඩලය විසින් දරමින් තිබුණි. එම අමාත්‍ය මණ්ඩල තීරණය ඉක්මවා යමින් 2010 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් ගෙවා තිබූ උපයන විට ගෙවීම් බදු ප්‍රමාණය රු.මිලියන 712 ක් විය.

(iv) 1994 ජුනි 04 දිනැති අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි අමාත්‍ය මණ්ඩලයෙන් හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් අනුමැතියක් නොමැතිව වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි මණ්ඩලය විසින් විවිධ සේවක දීමනා වර්ග 39 ක් ගෙවා තිබුණි. රු.මිලියන 426 ක් වූ එවැනි දීමනා 2011 වර්ෂයේ ගෙවා තිබුණු බව විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

(ආ) ලබාගත හැකි වූ තොරතුරු අනුව මණ්ඩලය විසින් ආයෝජන තීරණ ගැනීමට මණ්ඩලයේ මූල්‍ය කළමනාකරුට බලය පවරා නොතිබුණද 1990 වර්ෂයේ සිට රක්ෂණ අරමුදලෙන් නව ආයෝජනයක් බාහිර වශයෙන් කිරීමට මණ්ඩලයේ මූල්‍ය කළමනාකරු තීරණය කර තිබුණි.

(ඇ) 2008 මාර්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව , මණ්ඩලයේ පුනර්ජනනීය බලය පිරිවැයෙන් 10% ක් සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SEA) විසින් ආපසු ගෙවිය යුතුය. කෙසේ වුවද 2008 වර්ෂයේ සිට ඉහත සඳහන් වැඩ පිළිවෙලට අනුව මණ්ඩලයට ලැබිය යුතු එම පුනර්ජනනීය බලය පිරිවැය සුනිත්‍ය බල ශක්ති අධිකාරිය විසින් ආපසු ගෙවා නොතිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු මුළු මුදල රු.මිලියන 897 ක් වේ. කෙසේ වුවද එය බැරකමක් වශයෙන් සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර හෝ නොතිබුණු අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් ශේෂය සනාථ කිරීමක් ලබාගෙන නොතිබුණි.

(ඈ) රක්ෂණ සංචිත අරමුදලේ ශේෂය හා රක්ෂණ සංචිත ආයෝජන අරමුදලේ ශේෂය අතර 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,545 ක් වූ ඌනතාවයක් නිරීක්ෂණය විය. මණ්ඩලයේ ස්වයං රක්ෂණ ප්‍රතිපත්තිය ප්‍රකාරව ආයෝජනය සිදුකර නොතිබුණි.

විගණකාධිපති වාර්තාව

(ඉ) මණ්ඩලය විසින් ලංකා විදුලි සමාගමට (LECO) වර්ෂ කිහිපයක් තුළ විදුලි බලය විකුණා තිබුණද , එම පාර්ශ්වයන් දෙක අතර අලෙවි ගිවිසුමක් නොමැත. ඊට අමතරව ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම පිළිබඳවද විධිමත් වැඩ පිළිවෙලක් නොවීය.

(ඊ) 2011 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ගෙවිය යුතු රු.මිලියන 60,133 ක මුදලින් රු.මිලියන 51,139 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක් හිඟ හිට තිබුණි. රු.බිලියන 52 ක් වූ ඉහත සඳහන් දීර්ඝ කාලීන හිඟ ශේෂය සඳහා වර්ෂ 5, 10 හා 20 යන කල් පිරීමේ කාලයක් සහිතව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමටත් 2015 වර්ෂයෙන් ආරම්භ වී වර්ෂ 15 කට වැඩිකාලයකින් රු.බිලියන 3 ක වාර්ෂික වාරිකයක් මගින් නිරවුල් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකිවන පරිදි සහ බැඳුම්කර පිරිවැය ආපසු අයකර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය හා ලංවිම අතර ගිවිසුමකට එළඹීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් 2011 ජුලි 28 දින මහා භාණ්ඩාගාරයට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ලැබිය යුතු රු.බිලියන 50.5 නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2012 ජනවාරි 09 දින ලංකා බැංකුවට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කර එම දෙපාර්තමේන්තුවේ 2012 ජනවාරි 11 දිනැති අංක පීඩී/ඩීඑස් සහ ඒ / පීඩී /09/468 දරණ ලිපිය මගින් මණ්ඩලයට දන්වා තිබුණි. කෙසේ වුවද ඉහත තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවසන් කරන ලද (Finalized) ණයගැතියන් - සාමාන්‍ය සැපයුම්

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.මිලියන 11,193 ක් වූ අතර, එයින් රු.මිලියන 1,062 ක් අවසන් ගෙවීම් දිනයේ සිට අවම වශයෙන් මාස 6 ක කාලය ඇතුළත පාරිභෝගිකයින්ගෙන් ලැබිය යුතු මුදල් නොගෙවීම හේතුවෙන් මණ්ඩලය විසින් විදුලි මනු ඉවත් කළ පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු හිඟ මුදල් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ හයක කාල සීමාව (Time Bar) දැනටමත් ඉකුත්වී ඇති හෙයින් 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 47 ක් වූ හිඟ ශේෂය සම්බන්ධ පාරිභෝගිකයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට නොහැකි තත්ත්වයක මණ්ඩලය පැවතුනි.

තවද ආපසු අයකර ගත යුතු එකතුව රු.මිලියන 450 ක් වූ වෙනත් හිඟ ශේෂයන් ද වර්ෂ 6 ක කාලසීමාවට කෙටි කාලයක් තුළදී ලඟා වන බැවින් ඒවාද අයකර ගැනීම සැක සහිතය. කෙසේ වුවද එම ශේෂ අයකර ගැනීම සඳහා 2012 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ii) ඉහත සඳහන් රු.මිලියන 497 ට අමතරව , 2011 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති රු.මිලියන 655 කින් රු.මිලියන 126 ක්ද , 1999 දෙසැම්බර් 24 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාරිභෝගික සේවා) විසින් නිකුත් කරන ලද අංක 1999-12 දරණ චක්‍රලේඛයේ දක්වා ඇති අයකිරීම් ක්‍රියාවලියට අනුකූල නොවූ බැවින් අයකර ගැනීම සැකසහිතය. කෙසේ වුවද එම අඩුපාඩුකම් සඳහා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) 1999 අංක 20 දරණ ලංකා විදුලිබල පනතේ උපලේඛන II හි 1(4) උප වගන්තියට අනුව පාරිභෝගිකයකුගේ හිඟ මුදල් සම්පූර්ණයෙන් නිරවුල් කරන තුරු ඔහුගේ වෙනත් පරිශ්‍රයකට නව සම්බන්ධතාවයක් ලබා දෙනු නොලැබේ. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව, ඔවුන්ගේ බිල් හිඟයන් නොසලකා නව සම්බන්ධතාවයන් ලබාදී තිබුණි. කෙසේ වුවද මේ දක්වා එවැනි වැරදි ක්‍රියාවන්ට එරෙහිව පියවර ගෙන නොතිබුණි. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

විගණකාධිපති වාර්තාව

පළාත් කාර්යාලය	ගිණුම් අංකය		හිඟ මුදල රු.
	පැරණි සම්බන්ධතාවය	නව සම්බන්ධතාවය	
නැගෙනහිර	2402187506	2470100143	536,851
	3594268918	3594268810	361,309
	3504463309	3504463309	322,541
ඌව	3503514900	3570101614	833,004
	2304483003	2304291503, 2304291309 2304291406, 2304251005 2309048305, 2305402805	306,615

ඉහත නිරීක්ෂණයන්ට අනුව, ණයගැතියන් පිළිබඳ ණය පාලනය පමණක් නොව පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා කාලීනව පියවර නොගත් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමද ඉතා දුර්වල විය. දීර්ඝ කාලයක් සුදුසු හා කාලීන පියවර ගැනීමෙන් තොරව මහජන මුදල් අයුතු ලෙස පරිහරණයට ඉඩදීමේ අවසාන ප්‍රතිඵලය වන්නේ තොරතුරු නොමැති බව, ගිණුම් කරණ දෝෂ , පාරිභෝගිකයා සොයා ගැනීමට නොහැකිවීම ආදී හේතු දක්වමින් ගිණුම් පොත් පත් වලින් ඒවා කපා හැරීමයි. මෑතදී වු එවැනි කපා හැරීම් කිහිපයක් පහත දැක්වේ.

කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ගත් දිනය	ශේෂය පිළිබඳ විස්තර	කපා හරින ලද මුදල රු.මිලියන
2001	1989- 1998 කාල පරිච්ඡේදයට අදාලව එකක් රු.4,000 ට අඩු සාමාන්‍ය සැපයුම් ශේෂ 57,389	37.78
2007	1989- 1998 කාල පරිච්ඡේදයට අදාලව එකක් රු.4,000 ට වැඩි සාමාන්‍ය සැපයුම් ශේෂ 9,675	206.03
2007	1999-2001 කාල පරිච්ඡේදයට අදාලව එකක් රු.4,000 ට වැඩි සාමාන්‍ය සැපයුම් ශේෂ 21,544	123.26
2007	1999-2001 කාල පරිච්ඡේදයට අදාලව තොග සැපයුම් ශේෂ 314	80.90
එකතුව		**447.97**

මීට අමතරව , වෙළඳ ණයගැතියන් රු.මිලියන 401 ක් කපා හැරීම සඳහා තවත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සුදානම් කෙරෙමින් පවතී.

(ආ) හඳුනා ගැනීමට විමර්ශනය කිරීමෙන් තොරව හා වගකීම් පැවරීමට කටයුතු නොකර රු.මිලියන 22 ක් වු තොග ඌනතා වර්ෂයකට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි.

(ඇ) පුත්තලම වරායේ ගල් අගුරු මෙහෙයවීමේ කටයුතු සඳහා ටග් බෝට්ටු හා බත්තල් ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.මිලියන 114 ක මුදලක් මණ්ඩලය වැය කර තිබුණු අතර එම වත්කම් වල පිරිවැය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය යටතේ තවමත් කෙරීගෙන යන වැඩ ලෙස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. කෙසේ වුවද ලංකා ගල් අඟුරු සමාගම (Lanka Coal Company) (මණ්ඩලයේ පරිපාලිතයකි) එම වත්කම් ඔවුන්ගේ වරාය මෙහෙයුම් කටයුතු වලට යොදා ගන්නා අතර ගල් අඟුරු මෙට්රික් ටොන් එකකට එජඩො 2 බැගින් මෙහෙයුම් ගාස්තු මණ්ඩලයට අය කරයි. එසේ එම සමාගම විසින් අයකරන ලද ගාස්තුව 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 102 ක් විය.

තවද සමාගමේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ ගල් අගුරු මෙහෙයුම් කිරීම සඳහා ලයිටරින් උපකරණයක් (Lightering Equipment) නොතිබුණි. කෙසේ වුවද එම උපකරණයේ ක්ෂය සඳහා ගල් අඟුරු මෙට්රික් ටොන් එකකට එජඩො 1.70 ක් සමාගම අයකර තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට එසේ අයකරන ලද මුදල රු. මිලියන 87 ක් විය.

විගණකාධිපති වාර්තාව

වෙනම ආයතනයක් වශයෙන් ලංකා ගල් අඟුරු සමාගම (මණ්ඩලයේ පරිපාලිතයකි) ස්වයං මූල්‍යනයෙන් තොරව ඉන්වොයිසි මගින් එසේ රැස්කරන අරමුදල් ලයිටරින් උපකරණ ආදේශ කිරීම සඳහා සංචිත ඇති කිරීමට හා ලයිටරින් උපකරණ නඩත්තු කිරීමට යොදා ගෙන තිබුණි. මණ්ඩලය බරපතල මූල්‍ය ගැටළු වලට මුහුණ දෙමින් සිටියදීත් මණ්ඩලය විසින්ද එවැනි අනවශ්‍ය වියදම් සඳහා ගෙවීම් කර තිබුණි.

(ඈ) 2010 වර්ෂයේදී ගල් අඟුරු (ඇතුරුම් ගල් අඟුරු) මෙට්රික් ටොන් 45,000 ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 443 ක් ලංකා ගල් අඟුරු සමාගමට මණ්ඩලය විසින් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. එහෙත් සමාගම විසින් සම්පූර්ණ නැව් බඩු ප්‍රමාණය සපයා නොතිබූ අතර 2011 වර්ෂය අවසාන වන තෙක් ලබාදුන් අත්තිකාරම් වලින් රු.මිලියන 76 ක් හා රු.මිලියන 159 ක් පිළිවෙලින් සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම හා සීමාසහිත ලංකා නැව් සමාගම රඳවා ගෙන තිබුණි. කෙසේ වුවද මණ්ඩලය විසින් මෙම අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ලංකා විදුලිබල මණ්ඩලයේ අවිධිමත් අරමුදල් කළමනාකරණය හේතුවෙන් , ඉහත (ඇ) සහ (ඈ) ඡේදයේ සඳහන් ක්‍රමයන් මගින් මණ්ඩලයෙන් රැස්කර ගන්නා ලද අරමුදල් ආයෝජනය කිරීම මගින් රු.මිලියන 55 ක ආයෝජන ආදායමක් සමාගම විසින් උපයා තිබුණි.

(ඊ) 2009 වර්ෂයේ සිට සමාගමෙන් ගල් අඟුරු මිලදී ගැනීම මණ්ඩලය විසින් අඛණ්ඩව සිදුකර තිබුණද ගල් අඟුරු මිලදී ගැනීම සඳහා ලංකා කෝල් සමාගම සමඟ වානිජ ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට මණ්ඩලය එළඹී නොතිබුණි.

(උ) එක් එක් කලාප වල ඉදිකිරීම් ශාඛා ඔවුන් භාර ගන්නා විදුලි බලය ලබා දීමේ කාර්යයන් සම්බන්ධයෙන් වාර්තා ආරම්භකව ඇස්තමේන්තු වටිනාකම් හා ප්‍රමාණයන්ට පවත්වනු ලබන අතර මූල්‍ය අංශය තථ්‍ය වටිනාකම් හා ප්‍රමාණයන් මත ඔවුන්ගේ වාර්තා පවත්වා ගනු ලබයි. එබැවින් එම වාර්තා දෙවර්ගය සැසඳිය නොහැකිය.

3.5 හඳුනාගන්නා ලද පාඩු

හඳුනාගන්නා ලද පාඩු ලෙස සැලකිය හැකි සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී කපා හරින ලද බොල් ණය පිළිවෙලින් රු.මිලියන 226 ක් හා රු.මිලියන 1,513 ක් විය. විස්තර පහත දැක්වේ.

	2011 රු.මිලියන	2010 රු.මිලියන
වෙළඳ ණයගැතියන්		
කලාප - 1	41	-
ප්‍රධාන කාර්යාලය	160	1,510
වෙනත් ණය ගැතියන්		
ප්‍රධාන කාර්යාලය	25	3
එකතුව	**226**	**1,513**

3.6 ව්‍යාපෘති ප්‍රමාදය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමනල වැව සුළු ජල විදුලි ව්‍යාපෘතිය - වර්ෂයකට ගි වො පැ (GWh) 10-2006 වර්ෂයට පෙර ආරම්භ කර තිබුණු අතර ජල කාන්දුවක් හේතුවෙන් එය අත්හිටුවා තිබුණි. ව්‍යාපෘතිය නිවැරදි කිරීමේ කාර්යය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 200 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය අධ්‍යයන මට්ටම යටතේ පැවතුණි.

(ආ) 2011 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු මගින් විදුලි බල පහසුකම් ව්‍යාපෘති 9 ක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශය යටතේ රු.මිලියන 4,022 ක මුදලක් රජය විසින් වෙන් කර තිබුණි. කෙසේ වුවද 2011 වර්ෂයේදී එම ප්‍රතිපාදනයෙන් කිසිඳු උපයෝජනයක් සිදුකර නොතිබුණි.

විගණකාධිපති වාර්තාව

3.7 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයෙන් පසුව කාර්ය මණ්ඩල සංශෝධනයක් සිදුකර නොතිබුණි.

(ආ) මානව සම්පත් කළමනාකරණය සඳහා දත්ත ගබඩාවක් පවත්වා නොතිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට තාක්ෂණ ශ්‍රේණිවල ප්‍රධාන තනතුරු පුරප්පාඩු 173 ක් පැවතුණි.

(ඈ) මණ්ඩලය විසින් යොදවාගත් කොන්ත්‍රාත්තු , තාවකාලික , බැහැරින් ලබාගත් සේවකයන් සඳහා අනුමත සේවක සංඛ්‍යාවක් නොවීය.

(ඉ) මණ්ඩලය විසින් පහළ ශ්‍රේණිවල කම්කරුවන් , කාර්යාල සහායකයින් හා සමාන්තර තනතුරු වල සේවකයන් සිරිතක් වශයෙන් අභ්‍යන්තර විභාග පරීක්ෂණයක ප්‍රතිඵල මත ලිපිකරු ශ්‍රේණි වැනි ඉහළ තනතුරු වලට උසස් කරනු ලැබේ. මෙම පරිචය හේතුවෙන් අදාල තනතුරු වල පුහුණු නොමැති පුද්ගලයින් සේවයේ යෙදවීමක් වන අතර කාර්යක්ෂම කළමනාකරණයට එය අහිතකරව බලපා තිබුණි. එම හේතුවෙන් එහි ස්ථිර කාර්ය මණ්ඩලයට අතිකාල ආදිය ගෙවීමට අතිරේකව බාහිරින් සුදුසු මිනිස් බලය ප්‍රසම්පාදනය කර තිබුණි.

(ඊ) ප්‍රධාන තනතුරු සඳහා සම්පූර්ණයෙන්ම ජ්‍යෙෂ්ඨත්වය මත පදනම්ව කාර්ය මණ්ඩලය තෝරා ගැනීම හැරුණු විට ක්‍රමයක් විධිමත් අනුක්‍රම සැලැස්මක් නිරීක්ෂණය නොවීය. ආයතනයට වන අහිතකර බලපෑම සැලකීමෙන් තොරව විශ්‍රාම යන කාර්ය මණ්ඩලය සඳහා අනුග්‍රහයක් ලෙස නිලධාරීන් කෙටි කාලයක් තුළ උසස් කර තිබුණි.

(උ) ඉහළ තනතුරු සඳහා ස්ථිර මාරු කිරීම් ප්‍රතිපත්තියක් නිරීක්ෂණය නොවීය.

3.8 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව මණ්ඩලයේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

3.9 විගණන කමිටුව

මණ්ඩලයේ විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 4 දෙනෙකුගෙන් සමන්විත වු අතර එයින් තිදෙනෙකු රජයේ ආයතන වලින් නියෝජනය වු විධායක - නොවන සාමාජිකයන් විය. භාණ්ඩාගාර නියෝජිතයකු කමිටුවේ සභාපතිත්වය දරන අතර සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් 6 ක් පවත්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන වාර්තා හා විගණකාධිපති වාර්තා සම්පූර්ණයෙන් සමාලෝචනය කර නොතිබුණි.

(ආ) අතුරු මූල්‍ය ප්‍රකාශන , විමර්ශන වාර්තා , මාසික මූල්‍ය හා භෞතික ප්‍රගතිය , අයවැය පාලන , මණ්ඩල තීරණ ක්‍රියාත්මක පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග , ක්‍රියාකාරී සැලැස්ම , ප්‍රසම්පාදන සැලැස්ම ආදිය සමාලෝචනය කර නොතිබුණි.

3.10 අයවැය පාලනය

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

4. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

විගණකාධිපති වාර්තාව

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

(ඇ) ඉන්වෙන්ට්‍රි පාලනය හා තොග කළමනාකරණය

(ඈ) මානව සම්පත් කළමනාකරණය

(ඉ) ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය

(ඊ) ආයෝජන හා පරිපාලිතයන් පිළිබඳ පාලනය

(උ) කෙරීගෙන යන වැඩ

(ඌ) ව්‍යාපෘති කළමනාකරණය හා පාලනය

(එ) අයවැය

(ඒ) සේවක ණය

(ඔ) විකුණුම්



එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව

ලංකා විදුලිබල මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබදව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවට පිළිතුරු

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

තොරතුරු ඡේදයකි.

1.3 විගණකගේ වගකීම

තොරතුරු ඡේදයකි.

1.4 විගණන මතය සඳහා පදනම

තොරතුරු ඡේදයකි

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

2.2 සමූහය හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 සී/ස ලංකා විදුලි පුද්ගලික සමාගම (ලෙකෝ)

(අ) ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම. - කෙරීගෙන යන වැඩ, ආසන්න වශයෙන් රු.මිලියන 590

මෙහි සැකැස්ම පහත පරිදි වේ.

ශාඛාව	**වටිනාකම** (රු. මිලියන)
කෝට්ටේ	39.0
නුගේගොඩ	87.0
කැළණිය	29.8
මොරටුව	111.3
ගාල්ල	20.0
කළුතර	58.8
මීගමුව	36.5
ප්‍රධාන කාර්යාලය	210.0
	592.5
අඩු කළා - ලං.වි.ස. ව්‍යාපෘති	(2.4)
එකතුව රු. මිලියන	**590.1**

කෙරීගෙන යන වැඩ උපලේඛනය හා ලෙජර ශේෂය අතර සැසඳීම සඳහා 2012 වර්ෂයේදී විස්තරාත්මක අධ්‍යයනයක් සිදුකර ඇති අතර, නිමි වැඩ වත්කම් ගිණුම්වල මාරු කිරීමට කටයුතු කරනු ලැබීය. දැනට කෙරීගෙන යන වැඩ උපලේඛනය හා ලෙජර ශේෂය අතර වෙනසක් නැත. ඉක්මනින් නිමි වැඩ මාරු කිරීමට කටයුතු කිරීම දැනටමත් ආරම්භ කර ඇත.

(ආ) ප්‍රත්‍යාගණන ක්‍රමයෙන් වත්කම්වල සාධාරණ අගය නොපෙන්වීම

දේපල, පිරියත හා උපකරණ යටතේ දැක්වෙන සැපයුම් යටිතල පහසුකම්, ණය දෙන ආයතනය (ආ.ස.බැ.) විසින් සමාගමට නියම කරන ලද සම්මත සමීකරණයක් භාවිතා කර ප්‍රත්‍යාගණනය කර ඇත. විගණකයන්ගේ මතය අනුව මෙම ප්‍රත්‍යාගණන ක්‍රමය අදාල වත්කමේ

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

සාධාරණ අගය නොපෙන්වයි. වෘත්තීය තක්සේරුකරුවකු මෙම ප්‍රත්‍යාගණනය භාරගනු ලැබුවේ නම්, එය සංකීර්ණ කාර්ය පැවරුමක් වන අතර, එම සමාගමට සැලකියයුතු පිරිවැයක් දැරීමට සිදුවන කාර්යයක් වනු ඇත.
ජාත්‍යන්තර මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය (IFRS) ක්‍රියාත්මක කරන 2012 වර්ෂයේ සිට මෙම ප්‍රත්‍යාගණන ක්‍රමයට, වත්කම්වල වෙළඳපොල අගය පෙන්වන ප්‍රතිශ්ඨාපන පිරිවැය ක්‍රමය ආදේශ කරනු ලැබීය.

(ඇ) ලෙජර ශේෂ හා බිල් කිරීමේ පද්ධතිය අතර වෙනස්කම්

බිල් කිරීමේ පද්ධතියේ ණයගැති එකතුව හා ණයගැති පාලන ගිණුමේ දැක්වෙන මුළු ණයගැති ශේෂය අතර වෙනස්කම් නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බිල් කිරීමේ චක්‍රයට වෙනස් දින ගණන් සැලකිල්ලට ගැනීම හා ගිණුම් කටයුතු සඳහා බිල් කිරීමේ චක්‍ර විකුණුම් සැලකිල්ලට ගෙන ගිණුම් පිළියෙල කිරීමයි. මෙය දැනට නිවැරදි කර ඇත.

(ඈ) ලංවිමෙන් ලද සනාථ කිරීම් අනුව ගෙවිය යුතු ශේෂ එකඟ නොවීම

නොසැසඳූ ශේෂ, මනු කියවීමේ අර්බුද හා සම්බන්ධ පැරණි ශේෂයන් වේ. නොසැසඳුණු ශේෂ මුදල් පොත්වලින් ඉවත් කිරීමට දැනටමත් ලංවිම සමඟ සංවාදයක් ඇරඹීමට කටයුතු කර ඇත.

2.2.2 එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික සමාගම)

(අ) එකඟවූ පරිදි සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල එක් එක් මූල්‍ය ප්‍රකාශ විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමේ සහ ලංවිම වාර්තා කිරීමේ දිනයන් වෙනස් නිසා, ඒකාබද්ධ කිරීමේ කාර්යය සඳහා එල්ටීඑල් සමාගම, ලංවිම විසින් දැනුම් දෙනු ලබන ප්‍රමාණාත්මක සීමාවන් පදනම් කරගෙන ඒකාබද්ධ ගනුදෙනු සඳහා මාර්තු 31 දිනට විගණනයක් කළයුතු බවට එල්ටීඑල් හෝල්ඩින්ස් සමාගම, ලංවිම සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව එකඟවී තිබුණි. මෙම විගණනය ඒකාබද්ධ කිරීමේ කාර්ය සඳහා පමණක් වූ විශේෂ කාර්ය විගණනයක් විය. එබැවින් එල්ටීඑල් සමාගමේ විගණකයින් මේ සම්බන්ධයෙන් පමණක් මතයක් පළකරන ලදී.

පසුගිය කාලය පුරාම පරිචයක් වශයෙන් සමාගම හෝ එහි පරිපාලිතයන් දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශ නිකුත් කරනු නොලැබේ.

(ආ) සීමිත පවන් දනව් (පුද්ගලික) සමාගම නමින් නව පරිපාලිත සමාගමක් ස්ථාපිත කිරීම සඳහා ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය ලබාදීම

එල්ටීඑල් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට එහි නව පරිපාලිත සමාගම් පිහිටුවීමේ බලය ඇත. ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය, නව පරිපාලිත සමාගමක් පිහිටුවීමට අවශ්‍ය නොවේ. එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම, පවන් දනව් (පුද්ගලික) සමාගම සංස්ථාපනය කිරීමට විධිමත් අනුමැතිය ලබාදී ඇත. එල්ටීඑල් හි සාංගමික සංස්ථා පත්‍රයේ 106 සහ 109 වගන්ති අනුව එල්ටීඑල් අධ්‍යක්ෂ මන්ඩලයට නව ව්‍යාපාරයක් පිහිටුවීමට බලය ඇත. තවද, ලංවිම නිලධාරීන් දෙදෙනෙක් එල්ටීඑල් හෝල්ඩින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරති.

2.2.3 ඒකාබද්ධ කිරීමේ අඩුපාඩු

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වෙන වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්වල චලනය රු. මිලියන 122 කින් වැඩිපුර දක්වා තිබුණි.
වෙනස්කම් ගළපා ඇත.

2.3 ලංකා විදුලි බල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී. ලං. ගි. ප්‍ර.) සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) ශ්‍රී.ල.ගි.ප්‍ර.5 - තොග

තොග ඇගයීම සඳහා ප්‍රමිත පිරිවැය යොදා ගෙන තිබුණි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ උපදෙස් හා ප්‍රමිතයට අනුකූල වන පරිදි ශේෂ පත්‍ර දිනයේ තොග ශේෂයෙහි ප්‍රමිත පිරිවැය හා තථ්‍ය පිරිවැය අතර පරතරය අවම කිරීම සඳහා මිල විචලනයට ප්‍රතිපාදනයක්

විගණකාධිපති වාර්තාවට පිළිතුරු විගණකාධිපති වාර්තාවට පිළිතුරු

සලසා තිබුණි. එක් අස්ථිත්වයක් ලෙස ලංකා විදුලි බල මණ්ඩලය විදුලි බල උත්පාදනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම භාරගනී. කෙසේ වෙතත් මෙම ප්‍රධාන කාර්යයන්වල ස්වභාවය , පිරිවැය හා ආදායම අනුව එකිනෙක සැසඳිය නොහැක.

තවද, තොග පවත්වා ගෙනයාම කාර්යය හා අරමුණු අතින් එකිනෙක වෙනස් නිසා මෙකී අංශ පුරා තනි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් යොදා ගත නොහැක.

ජනන අංශවල තොග පවත්වා ගෙන යනු ලබන්නේ මෙහෙයුම් හා නඩත්තු කාර්යයන් සඳහා වන අතර ඒවා යළි විකි□මට, නිමි ද්‍රව්‍ය නිපදවීමට හෝ ඉදිකිරීම් සඳහා යොදා නොගනී. තොග, පාරිභෝගික අයිතම් ඉක්මණින් නිකුත් වන අමතර කොටස්, ඉන්ධන සහ නඩත්තුව සඳහා වන විශේෂ අමතර කොටස් වලින් සමන්විත වේ. සම්ප්‍රේෂණ අංශයේ තොගද අමතර කොටස් හා සම්පූර්ණයෙන් නිම කරන ලද ව්‍යාපෘති නිමවූ පසු ආපසු භාරදුන් ද්‍රව්‍ය වලින් සමන්විත වේ.

බෙදාහැරීමේ අංශයේ පවත්වා ගෙන යන තොග, ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් වැඩ සහ නඩත්තු වැඩ සඳහාය. ඉදිකිරීම් කාර්යයන් ප්‍රධාන සේවා කාර්යයන් සහ නඩත්තු ඇස්තමේන්තුවල ඒකාකාරී මිලක් පවත්වා ගෙනයාමට සියළු වැඩ සඳහා ප්‍රමිත ද්‍රව්‍ය මිල යොදා ගනු ලැබේ. අවපරිචය හා මිල කිරීමේ වැරදි අවම කර ගැනීම සදහා මෙම ප්‍රමිත ද්‍රව්‍ය මිල වසර 30 කට අධික කාලයක් තිස්සේ පවත්වා ගෙන යනු ලැබේ. මුලින් ලැබෙන තොග මුලින් නිකුත් කිරීම (FIFO) ක්‍රමය හෝ භරිත සාමාන්‍ය ක්‍රමය යොදාගතහොත් නිතරම ද්‍රව්‍ය මිල ගණන් යාවත්කාලීන කිරීමට සිදුවන අතර එය සාවද්‍ය මිල කිරීම්, අවපරිචය සහ ද්‍රව්‍ය මිල ගණන් නිතර වෙනස් වන නිසා තථ්‍ය හා ඇස්තමේන්තු මිල ගණන් සැසඳීමට නොහැකිවීම වැනි දෑට හේතු විය හැකිය.
ප්‍රමිත පිරිවැය හා වෙළඳ පොල මිල අතර පරතරය අවම කර ගැනීම සඳහා, මිල විචලනය ගැලපීමට ක්‍රියාකරනු ලැබේ.

(ආ) ශ්‍රී.ල.ගි.ප්‍ර. 16 - (සේවක සුබසාධනය) ලංකා විදුලි බල මණ්ඩලයේ විශ්‍රාම අරමුදල සම්බන්ධව අවශ්‍ය තොරතුරු අනාවරණය කර නොතිබුණි.

අනුකූල වීමට සටහන් කර ගන්නා ලදි.

(ඇ) මණ්ඩලය එහි දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරයි

ලංවිම එක් රැස් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව ශ්‍රී ලංකා මුල්‍ය ප්‍රකාශ වාර්තාකරණ උපදේශක විසින් දෙන ලද නිර්දේශ අනුව, දේපල පිරියත හා උපකරණ ඇගයීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය, 2011 ජනවාරි 01 දින සිට ප්‍රත්‍යාගණන ක්‍රමයෙන් පිරිවැය ක්‍රමයට වෙනස් කර ඇත. අවශ්‍ය ගැලපුම් 2012 වර්ෂයේදී හා ඉන් ඉදිරියට මුල්‍ය ප්‍රකාශවල අන්තර් ගත කරනු ඇත. (ශ්‍රී.ල.මු.වා.ප්‍ර පරිදි ගැලපු)

(ඈ) ශ්‍රී.ල.ගි.ප්‍ර. - 21 විදේශ විනිමය අනුපාත වෙනසේ බලපෑම

ලංවිම මුල්‍ය ප්‍රකාශවල සටහන 2.3.1 යටතේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මෙසේ දක්වා ඇත. ණය මුදලේ ප්‍රාග්ධන හා පොලී මත උද්ගත වන විදේශ විනිමය උච්චාවචනයේ ලාභය හෝ පාඩුව ඒවා ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන තෙක් ගිණුම්වලට ගනු නොලැබේ. සම්ප්‍රේෂණ අංශයේ හදිසි මිලදී ගැනුම් ශාඛාව විසින් මිලදී ගැනුම් සඳහා අයිපීපී ගෙවීම් මත පැන නගින විදේශ විනිමය පාඩුව ගිණුම්වල පිළිබිඹු වේ. කෙසේ වෙතත් එය ඉහත කී ප්‍රතිපත්තියෙන් ආවරණය නොවේ.

(ඉ) ශ්‍රී.ල.ගි.ප්‍ර. 24 - රජයේ ප්‍රදාන හා රජයේ අනුග්‍රහය ගිණුම්කරණය

කාලීන ණය හැර ප්‍රාග්ධන ව්‍යාපෘති සදහා මහා භාණ්ඩාගාරයෙන් ලංවිමට ලැබෙන සියළුම රජයේ ප්‍රාග්ධන දායක මුදල් , 1971 සිට ලංවිම පොත්වල දායක ප්‍රාග්ධනය ලෙස ගිණුම්ගත කරනු ලැබේ. කෙසේ වෙතත් ලංවිම අනුගමනය කරන පරිපාටිය 2012 ජුනි 22 දින පැවති රැස්වීමේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සාකච්ජා කොට එකඟ වෙන ලදි. තවද රු.44,891,730,058.10 ක් වූ වෙනස ඔවුන්ගේ පොත්වල දායක ප්‍රාග්ධනය ලෙස ගැලපීමට ද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව එකඟ වෙන ලදි. 2013 මාර්තු 21 දින එකී ගැලපුම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සනාථ කරන ලදි.

(ඊ) ශ්‍රී.ල.ගි.ප්‍ර. 41 - ස්ථාවර වත්කම් හානිකරණය

ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී ලංවිම එහි වත්කම් හානිකරණ පරීක්ෂණය සිදුකරන ලදි. එම වත්කම් හානිකරණයේ බලපෑම 2012 වර්ෂයේදී ඇතුළත් කර ගලපනු ලැබේ. (ශ්‍රී.ල.මු.වා ගැලපු) ඉන් අනතුරුව ගිණුම් හා පරීක්ෂණය අඛණ්ඩව සිදුකරනු ලැබේ.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) එකතුව රු.මිලියන 4,979 ක් වූ (2010 රු.මිලියන 13,295) ද්‍රව්‍ය මිල විචලනය, ශ්‍රම අනුපාත විචලනය සහ පොදු කාර්ය විචලනය, විකුණුම් පිරිවැයට එරෙහිව හිලව් කර තිබුණි.

ධන ද්‍රව්‍ය මිල විචලනය - රු.මිලියන 2,435 මෙයින් නියෝජනය වන්නේ පහත සඳහන් ගිණුම් දෙකෙහි ශුද්ධ මිල විචලනයයි.

- ද්‍රව්‍ය මිල විචලන ගිණුම - රු.මිලියන 2,919 බැර
- ප්‍රමිත මිල විචලන ගිණුම - රු.මිලියන 484 හර

ලංවිම බෙදාහැරීම් සමූහයේ තොග මිලදී ගන්නා අවස්ථාවේ ප්‍රමිත පිරිවැයට අගය කෙරෙන අතර උපයෝජනය කළ තොග මිල විචලනය සඳහා ප්‍රතිපාදන ගැලපීමෙන් පසු සාධාරණ මිලට ශේෂ පත්‍රයේ දක්වා ඇත.

බෙදාහැරීමේ අංශයේ ද්‍රව්‍ය මිලදී ගැනීම් පහත සඳහන් කාර්යයන් සඳහා භාවිතා කෙරේ.

- නඩත්තුව
- ප්‍රාග්ධන කාර්යයන් (වැඩ)

අදාල වර්ෂයන්හි ද්‍රව්‍ය භාවිත වටිනාකමෙන් ප්‍රමිත මිල විචලන බලපෑම පහත සඳහන් ගිණුම් අතර අනුපාතිකව විසුරුවනු ලැබේ.

- කෙරීගෙන යන වැඩ
- දේපල , පිරියත හා උපකරණ
- තොග
- නඩත්තු වියදම

එබැවින් මිල විචලනයේ එකතුව කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුමේ නියෝජනය නොවේ.

ධන ශ්‍රම මිල විචලනය - රු.මිලියන 803

ශ්‍රම පිරිවැය විචලනය නියෝජනය කරන්නේ ශ්‍රම මිල ගණන හා තථ්‍ය ශ්‍රම පිරිවැය අතර වෙනසයි. ද්‍රව්‍ය මිල විචලනය මෙන්ම මුළු ශ්‍රම මිල විචලනය කෙරීගෙන යන ප්‍රාග්ධන ගිණුමේ පමණක් පිළිබිඹු නොවන අතර එහි බලපෑම පහත සඳහන් ගිණුම් අතර සමානුපාතිකව විසුරුවනු ලබයි.

- කෙරීගෙන යන වැඩ
- දේපල, පිරියත හා යන්ත්‍ර
- නඩත්තු කිරීම

ද්‍රව්‍ය මිල විචලනය මෙන්ම කෙරීගෙන යන වැඩ, දේපල, පිරියත හා උපකරණ සහ නඩත්තු සඳහා වන නියම බලපෑම හඳුනා ගැනීම සැබවින්ම ප්‍රායෝගික නොවේ. අනිත් අතට ප්‍රාග්ධන කාර්යයන් එස්එම්සී කාර්යයන් හා ඉදිකිරීම් කාර්යන් වැඩි ප්‍රමාණයක් කරනු ලබන්නේ බාහිර කොන්ත්‍රාත්කරුවන් විසිනි. එබැවින් තථ්‍ය ශ්‍රමයට කරන ගෙවීම් ශ්‍රම පිරිවැය ලෙස ගිණුම්ගත කෙරේ.

ලංවිම සේවකයන් විසින් කරනු ලබන කාර්යයන් ප්‍රධාන වශයෙන් නඩත්තු කාර්යයන්ය. එබැවින් කෙරීගෙන යන වැඩ සහ දේපල, පිරියත හා උපකරණ වලට, පිරිවැය මිල විචලනයේ බලපෑම එතරම් වැදගත් නොවේ.

පොදු කාර්ය ආවරණය - රු.මිලියන 1255 (ධන) එක් එක් කාර්යයකට පොදු කාර්ය පිරිවැය ගිණුම්කරණය සඳහා ගිණුම් සටහන් තැබීම හේතු කොටගෙන පොදු කාර්ය අයකිරීම් ගිණුමේ ශේෂය පැනනැගී ඇත.

ගිණුම් සටහන්	හර	බැර
කෙරීගෙන යන වැඩ	xxx	-
අයවිය යුතු පොදු කාර්ය	-	xxx

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

එබැවින්, පොදු කාර්ය අයකර ගැනීමේ ගිණුමේ පැන නගින බැර ශේෂ , තථ්‍ය වියදම සහ ප්‍රමිත මිල අතර වෙනස නිසා උද්ගත වන්නක් නොවේ.

එබැවින් පොදු කාර්ය අයකිරීම් ගිණුමේ පෙන්වන ශේෂය වූ රු.මිලියන 1,255 මගින් කෙරීගෙන යන වැඩ හෝ වර්ෂයේ පාඩුව අඩුවෙන් හෝ වැඩියෙන් දැක්වීමක් සිදුනොවේ.

(ආ) මණ්ඩලයට ඉදිරියට ගෙන ආ රු.මිලියන 67,245 ක බදු අලාභයක් තිබීම

මෙය 2011 ගැලපු ගිණුම් වල නිවැරදි කරන ලදි.

(ඇ) බල ශක්ති අංශයේ සංවර්ධනය සඳහා රජය විසින් ලබාගෙන ඇති සමහර විදේශාධාර ණය

රජයේ ණය පිළිබඳ තත්ත්වය 2012 වර්ෂයේදී ගිණුම් වල අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. මහා භාණ්ඩාගාරය සමඟ ගිවිසුම් වලට එළඹීමත් සමඟම, රජයේ ණය සඳහා වූ පොලී සඳහා 2014 වර්ෂයේ සිට ඉදිරියට ප්‍රතිපාදන සැලසීමට අපේක්ෂා කෙරේ.

(ඈ) රු.මිලියන 17.447 ක් වූ ණය නිදහස් කිරීමේ ශේෂය සහ රු.මිලියන 165 ක් වූ අනෙකුත් සංචිත ශේෂ වලින් සමන්විත ප්‍රාග්ධන සංචිත

2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල රු.මිලියන 182 ක් වූ ප්‍රාග්ධන සංචිත (ණය නිදහස් කිරීමේ ශේෂය රු.මිලියන 17.4 ක් හා වෙනත් සංචිත ශේෂය වූ රු.මිලියන 165) ණය නිදහස් කිරීමේ සංචිතයක් ලෙස නිවැරදිව වර්ග කර ඇත.
ලංවිම පනත අනුව, පහත සඳහන් සංචිත ස්ථාපිත කර තිබේ.
රු.මිලියන 17.4 ක් වූ ණය නිදහස් කිරීමේ සංචිතය මහා භාණ්ඩාගාර ණය ආපසු ගෙවීම සඳහා ලංවිම විසින් භාවිතා කිරීම සඳහා සාමාන්‍යයෙන් පවත්වා ගනු ලැබේ. එහෙත් 1999 සිට මේ සඳහා වෙන්කිරීමට තරම් ප්‍රමාණවත් ලාභයක් නොමැතිවීම හේතු කොට ගෙන ප්‍රතිපාදන සලසා නැත.
ඉදිරිපත් නොකරන ලද චෙක්පත් වල වටිනාකම පදනම් කර ගෙන රු.මිලියන 165 ක් වෙනත් සංචිතයක් නිර්මාණය කර ඇත.
අනාගත අනුකූලවීම සඳහා සටහන් කර ගන්නා ලදි.

(ඉ) රක්ෂණ එස්ක්‍රෝ අරමුදලේ අයෝජන වලින් උද්ගතවූ රු.මිලියන 317 ක් වූ පොලී ආදායම (2010 වර්ෂයේදී එය රු.මිලියන 404 කි)

රක්ෂණ එස්ක්‍රෝ අරමුදලේ පොලිය 2012 ගිණුම් වලදී රක්ෂණ සංචිතයට මාරු කිරීමට ගැලපුම් කරනු ලැබේ.

(ඊ) 2003 වර්ෂයේ ලැබීම පිළිඳව නියම හේතුකාරකයක් නොමැතිව රු.මිලියන 3,047 ක් වූ වැඩ සටහන් ණය , මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණි

ඉහත වැඩ සටහන් ණය ගැන අදාල ලියකියවිලි පරීක්ෂා කිරීමෙන් පසු, මෙම ශේෂය කපා හැරීම සඳහා ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලයට මණ්ඩලීය සටහනක් ඉදිරිපත් කිරීමට මූලික පියවර ගෙන ඇති අතර එය ගිණුම්වල ගලපනු ලැබේ.

(උ) ආයු ගණිතඥ විසින් කරන ලද ඇගයීම අනුව පාරිතෝෂික ගිණුම ගලපා නොතිබුණි

2012 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ජීවගණක ඇගයීම් වාර්තාවට අනුව , වෘත්තීය තක්සේරුකරුවකු විසින් පිළියෙල කරන ලද මෙම වාර්තාව පදනම් කර ගෙන 2012 වර්ෂය සඳහා පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසන ලදි. එබැවින් 2011 ඌන ප්‍රතිපාදනයද ගලපා තිබේ.

(ඌ) 2011 වර්ෂයේදී මිලදී ගත් ආපසු පියවිය යුතු බලශක්ති සඳහා ගෙවිය යුතු රු.මිලියන 57 ක මුදල

(i) පහත සඳහන් නිෂ්පාදකයන්ගෙන් මිලදී ගත් ආපසු පියවිය යුතු බල ශක්ති පිරිවැය , 2011 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

අගලවත්ත වතුයාය	රු. 469,445
SEA (ගන්නොරුව) අදියර II	රු.1,115,730

(ii) ලෙමස්තොට විදුලි බලාගාරය එහි වානිජ මෙහෙයුම් ආරම්භ කරන ලද්දේ 2011 ජූනි මාසයේ වන අතර පළමු ඉන්වොයිසිය ලැබුණේ 2012 මාර්තු මාසයේදීය. එබැවින් විධිමත් තොරතුරු නොමැතිවීම හේතුවෙන් ප්‍රතිපාදනයක් කිරීමට ලංවිමට හැකියාවක් නැති විය.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

(iii) පහත සඳහන් නිෂ්පාදකයන්ගෙන් ඉන්වොයිසි ලැබුණේ 2012 මාර්තු මාසයේදීය. පුරෝකථනය කිරීම අපහසු බැවින් පුරෝකථනය කළ සංඛ්‍යා උපචිත නොකරන ලදි.

උලගල්ල වලව්ව රිසෝට්	රු.54,419
ටෝකියෝ සිමෙන්ති සමාගම	රු.28,377,274
2011 වර්ෂයේදී විදුලිය මිලදී ගැනීමේ පිරිවැය	රු.84,144,096,033 කි.

(ඒ) සුලං බල ශක්ති සමාගමට ගෙවිය යුතු රු.මිලියන 35 කට අදාල අයකුම ගැලපුම්

අයකුම ගැලපුම් ගණනය කරනු ලබන්නේ පූර්ව මෙහෙයුම් වර්ෂයේ බෙදාහරින ලද බල ශක්ති kwh ප්‍රමාණය පදනම් කරගෙනයි. ඒ සඳහා මෙහෙයුම් වසර සම්පූර්ණ විය යුතුයි. සෙනොක් සුලං බල ශක්ති හි මෙහෙයුම් වර්ෂය නිම වන්නේ 2012 මාර්තු 31 දිනදීය.

(ඒ) විදුලි ජනනය කරන සමාගමකට ඉන්ධන පිරිවැය වශයෙන් රු.මිලියන 1,369 ක් ප්‍රතිපූර්ණය කිරීම - මීට අදාල ගෙවීම අනුචිත ලෙස විකුණුම් පිරිවැයෙන් ඉවත් කොට එම සාමාගමෙන් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

ලංවිම සභාපති ඇමතූ 2012 මාර්තු 19 දිනැති අංක පීඊ/අයිඒ/27 දරන විදුලි හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2011 ජූලි මාසයේ සිට ඉදිරියට ඉන්ධන මිල ගණන් යළි ගැලපීමට එකඟ වූ බව සඳහන් කර තිබුණි.

ලංවිම ඒඊඑස් කැළණිතිස්ස (පුද්) සමාගම සමඟ ගිවිසුමකට එළඹ ඇති නමුත් ලංකා ඛනිජ තෙල් සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹ නැත. ඒඊඑස් කැළණිතිස්ස (පුද්) සමාගම සමඟ එළඹි ගිවිසුම අනුව ලංවිම විසින් ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ ඉන්ධන බිල්පත් ප්‍රතිපූර්ණය කළ යුතුය.

කෙසේ වෙතත් ලංකා ඛනිජ තෙල් සංස්ථාව 2011 සිට ඉන්ධන ලීටරයකට රු.76 බැගින් ඉන්වොයිස් කරනු ලබන නමුත් ඉකුත් ඉන්වොයිසි සංශෝධනය කර නොතිබුණි.

(ඔ) එක් එක් ගිණුම් වලට සටහන් කිරීමට පෙර මාසික බිල්පත් වටිනාකම් , පාරිභෝගිකයින් විසින් ගෙවා තිබීම නිරීක්ෂණ විය

මනු කියවන්නා විසින් අතින් පිළියෙල කරන ලද බිල්පත් ලද වහාම සමහර පාරිභෝගිකයෝ තම මාසික බිල්පත ගෙවති. ඒ අනුව ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට හර සටහන යෙදීමට පෙර එම ගෙවීම් ඔහුගේ ගිණුමට බැර කරනු ලැබේ.
සාමාන්‍ය සැපයුම් පාරිභෝගිකයන්ගේ බිල්කිරීමේ චක්‍රය එක් මාසයක 25 දිනෙන් පවත්වා ගෙන ඊලඟ මාසයේ 24 දිනෙන් නිම වේ. (උදා :- දෙසැම්බර් 25 දින සිට ජනවාරි 24 දක්වා) කෙසේ වෙතත් මනු කියවන්නා විසින් ඊලඟ මාසයේ බිල්පත (ජනවාරි බිල්පත) කියවීම ඊලඟ මාසයේ එහෙත් ඉකුත් මාසයේ බිල් කිරීමේ චක්‍ර කාල පරිච්ඡේදය තුළදී කරන අවස්ථා ඇත. (උදා - ජනවාරි 01 සිට 24 දක්වා) පාරිභෝගිකයකු ඊලඟ මාසයේ බිල්පත් එම කාල සීමාව තුළදීම ගෙවුවහොත් දෙසැම්බර් මස බිල්පත්‍ර චක්‍රය සඳහා එකතුවීම්, ජනවාරි බිල්පත්‍ර චක්‍රය තුළ ඇතුළත් විය හැක. ඒ අනුව පාරිභෝගිකයන්ගෙන් එකතු කිරීම් , අනුරූපී ආදායම් ගිණුම හර නොකර ඔහුගේ ගිණුමට බැර කරයි. ඒ අනුව ණයගැති ගිණුමේ බැර ශේෂයක් තිබිය හැක. කරන ලද ගෙවීමට අදාල නියම බිල් චක්‍රය හඳුනාගැනීමට පද්ධතිය උපකාරී නොවීම තුළ පද්ධතිය අනුරූපව විකරණය කරනු නොලැබුවහොත් ඊලඟ බිල්කිරීමේ චක්‍රයේ කරනු ලැබූ වැඩිපුර ගෙවීම හඳුනාගැනීම අපහසු වනු ඇත.

කෙසේ වෙතත් විමසුමේ සඳහන් ඊට සමාන බලපෑම කාලපරිච්ඡේදය ආරම්භයේදීද සිදුවිය හැකි නිසා ශුද්ධ බලපෑම ප්‍රමාණාත්මක විය නොහැක.

(ඕ) ඉකුත් වර්ෂ වල ආරම්භ කරන ලද කාර්යයන් වලට (වැඩ) නිකුත් කරන ලද අතිරික්ත ද්‍රව්‍ය , පසු වර්ෂ වලදී ගබඩාවට ආපසු භාරදීම

තොගයට එකතු කරන ලද 2011 දී ආපසු එවන ලද ද්‍රව්‍ය වලින් වැඩි ප්‍රමාණයක් එම වර්ෂයේදීම නිකුත් කරන ලද ද්‍රව්‍ය වේ. කෙසේ වෙතත් කාලය දීර්ඝ කරන ලද ඉදිකිරීම් හේතුවෙන් නිකුත් කරන ලද ද්‍රව්‍ය පසු වර්ෂ වලදී ආපසු එවනු ලබන අවස්ථා තිබිය හැක. එහෙත් ගනුදෙනු පරිමාවේ විශාලත්වය හා 'MITFIN', පද්ධතියෙන් ප්‍රමාණවත් සහායක් නොසපයන බැවින් භාණ්ඩ ආපසු භාරදුන් පසු ඒවාහි නියම පිරිවැය නිකුත් කරන ලද වර්ෂ හඳුනා ගැනීමට අපහසු වේ. 'MITFIN' පද්ධතියේ මෙම අවශ්‍යතාව වැඩිදියුණු කළ යුතු බවට හඳුනාගෙන ඇත.

(ක) අයවිය යුතු හිග වෙළඳ ණයගැතියන්ගේ ශේෂ සඳහා ප්‍රතිපාදන සැලසිය යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය ගත් ප්‍රතිපත්ති තීරණය

අදාල අංශ විසින් කරනු ලබන එක් එක් ගණනය කිරීම් වලින් මුළු ප්‍රතිපාදනය නියෝජනය වේ. එම ගණනය කිරීම් කරන ලද්දේ 2007 ජුනි 01 දිනැති අංක සීජීබී/ඩීඑෆ්එම් (ඒකාබද්ධ) චක්‍රලේඛ 3 මගින් දී ඇති උපදෙස් අනුව බව ඔවුහු තහවුරු කරති. කෙසේ වෙතත් එම ගණනය කිරීම් පරීක්ෂා කොට විගණකයින් කරන ලද ගණනය කිරීම් සමඟ සසඳා බලන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

(ග) ණයගැති හා ණය හිමි ශේෂ වැඩියෙන් දැක්වීම

තොග පාරිභෝගිකයින් - කොළඹ නගරය - රු.20,241,766

සාමාන්‍ය පරිපාටිය වන්නේ ලෙජරය අනුව ණයගැති ශේෂය , පළාතේ බිල්කිරීමේ පද්ධතියට එකඟ කිරීමයි. එබැවින් බිල්කිරීමේ පද්ධතිය, ණයගැතියන් තුළ ඇති බැර ශේෂයන් හඳුනාගැනීමට සහ ඒවා ණය හිමියන් ලෙස යළි වර්ග කිරීමට විකරණය කළ යුතුව ඇත. කෙසේ වෙතත් ගනුදෙනුකරුවකුගේ ගිණුමේ බැර ශේෂයක් උද්ගත වන්නේ, ඊළඟ බිල් කිරීමේ ආදායම හඳුනාගන්නා විට ගලපනු ලබන, ගනුදෙනුකරුවකු විසින් වැඩිපුර ගෙවීමක් කළහොත් පමණි. එබැවින් එය තාවකාලිකව නිර්මාණය වන බැර ශේෂයකි.

වෙනත් ණයගැතියන් - REP - රු.205,555,155

මෙම ශේෂය අදාල වන්නේ පිරිවැය මධ්‍යස්ථානය 760 (නි.ස.අ. - REP R1) දරන RE ව්‍යාපෘති සඳහා ආනයනය කළ ව්‍යාපෘති වැඩයි. RE ව්‍යාපෘති සඳහා ද්‍රව්‍ය ආනයනයේ ගිණුම්කරණ පද්ධතිය 2012 සිට ඉදිරියට ක්‍රමානුකූල කිරීමට අදාල ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙය නිවැරදි කර ඇත.

වෙනත් ණයගැතියන් - කලාප - 02 ආයතනික ශාඛාව
මෙම ශේෂය කලාප දෙකෙහි වෙනත් ලැබීම් හා සම්බන්ධ වන අතර එය පළාත් තුනෙහි හා ආයතනික ශාඛාවේ ශේෂයන් ඒකාබද්ධ කිරීමෙන් ඇති වූවකි.
මෙම තත්ත්වය පැන නැගී ඇත්තේ නැගෙනහිර පළාත් රැස්කිරීමේ පාලන ගිණුමේ බැර ශේෂයක් පෙන්වීම හේතුවෙනි.

එක් රැස්කිරීමේ පාලන ගිණුම - විදුලිය - මධ්‍යම පළාත

සාමාන්‍ය පරිපාටිය වන්නේ, ලෙජරය අනුව ණයගැති ශේෂ පළාත් බිල් කිරීමේ පද්ධතිය සමඟ එකඟ කිරීමයි. කෙසේ වෙතත් ණයගැතියන්ගේ බැර ශේෂ වෙනම හඳුනාගෙන ඒවා ණය හිමියන් ලෙස යළි වර්ග කිරීම සඳහා , බිල් කිරීමේ පද්ධතිය විකරණය කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. කෙසේ වෙතත් ගනුදෙනුකරුවකුගේ ගිණුමක බැර ශේෂයක් උද්ගත වන්නේ ඊළඟ බිල් කිරීමේ ආදායම හඳුනාගන්නා විට, ගලපනු ලබන ගනුදෙනු කරු විසින් වැඩිපුර ගෙවීමක් කළහොත් පමණි. එබැවින් එය තාවකාලිකව නිර්මාණය වන බැර ශේෂයක් පමණි.

ණය පාලන ගිණුම - ගෙවීම් වවුචරය - නැගෙනහිර පළාත

නැගෙනහිර පළාත් ගිණුම් කාර්යාලය ණයගැති ලෙජරයේ හර ශේෂ හා බැර ශේෂ වෙනම දක්වා තිබුණි. ප්‍රාදේශීය ගිණුම් ඒකාබද්ධ කිරීමේදී බැර හා හර ශේෂ 2 කම වැරදීමකින් ණය ගැතියන් ලෙස ගෙවා තිබුණි.
මෙවැන්නක් මින් ඉදිරියේදී සිදුනොවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

කෙරීගෙන යන වැඩ - කලාප - 02 සංස්ථා

2011 ජනවාරි 01 දිනට ආ.සං. බැංකු කාර්යයන් වල ආරම්භක ශේෂ තුළ පද්ධති වර්ධනයට (SAY) අදාල සමහර කාර්යයන් අන්තර්ගත විය. 2011 වර්ෂය තුළදී , ආසියානු සංවර්ධන බැංකු (ආ.සං.බැ.) යටතේ තිබූ SAY කාර්යයන් ආ.සං.බැ. කාර්යයන් වලින් ඉවත් කොට SAY කාණ්ඩයට එක් කරන ලදි. මෙකී බැර මුදල , මෙම වරද නිවැරදි කිරීම හේතුවෙන් ඇතිවී තිබුණි.

තොග ගැලපුම් ගිණුම - නැගෙනහිර පළාත - රු.4,260,190 / රු.3,316,015

රු.4,260,190 ක මුදල පිරිවැය මධ්‍යස්ථාන අනුව ණයහිමි උපලේඛනයෙන් සමන්විත අතර රු.3,316,015 ණය හිමියන්ගේ කාල විශ්ලේෂණයේ එයි. දී ඇති ගිණුම්කරණ ආකෘතියෙහි හර හා බැර ශේෂ දෙකම ඒකාබද්ධ කිරීම සඳහා එකට ගෙන ඇත.

වෙනත් ණයගැතියන් - බැර ශේෂය - රු.38,265,434 - කලාප 3

මෙම බැර ශේෂයන් කාල විශ්ලේෂනයේ බැර ශේෂයන් ලෙස පෙන්වන කාල පරිච්ඡේදය තුළදී ණය ගැතියන්ගෙන් ලද අරමුදල්ය. මෙම වරද 2012 වර්ෂයේදී නිවැරදි කරන ලදි.

වෙනත් ණයගැතියන් - සබරගමුව - රු.16,703,835

මෙම මුදල ඉහත රු.38,265,434 තුළ ඇතුළත්ය. එය දැනටමත් 2012 දී නිවැරදි කර ඇත.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

(ජ) කෙරීගෙන යන වැඩ ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට හර හා බැර ශේෂ වලින් සමන්විත වැඩ අන්තර්ගත විය

පහත සඳහන් හේතු නිසා රු.මිලියන 16.6 ක් වු කෙරී ගෙන යන වැඩ එකතු කිරීම් වල සෘණ ගැලපුමක් විය.

- සමහර කාර්යයන් නඩත්තු වැඩ ලෙස වර්ගීකරණය කළ යුතු වුවත් ඒවා ප්‍රාග්ධන ලෙස වර්ගීකරණය කර තිබුණි. එවැනි සියළුම නිම වු වැඩ වසා දමා නඩත්තු වලට මාරු කර තිබුණි.
- වියදම් ආවර්ණය ලෙස වර්ග කළ යුතු සමහර කාර්යයන් ප්‍රාග්ධන ලෙස වර්ග කර තිබුණි. එවැනි සියළු හිමි කාර්යයන් වසා දමා R 1370 ට මාරු කරන ලදි.) වියදම් ආවර්ණය කරන කාර්යයන්ගේ ශුද්ධ ආදායම
- සමහර කාර්යයන් අවලංගු කර මුලින් ලබාගත් ද්‍රව්‍ය ආපසු එවා තිබුණි. ද්‍රව්‍ය මිල වෙනස්වීම් හේතුකොට ගෙන එවැනි සමහර අවලංගු කළ කාර්යයන් වල සෘණ ශේෂයන් පැවතුණි. මෙම සියළු ගැලපුම් සැසඳුම් ප්‍රකාශයෙහි කෙරීගෙන යන වැඩ එකතු කිරීමේ තීරුව යටතේ කරන ලදි. මෙසේ ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස , කෙරීගෙන යන වැඩ වල සෘණ බලපෑමක් පෙන්වයි.

(ච) බෙදාහැරීමේ කලාප 3 හි මුල්‍ය ප්‍රකාශවල පෙන්වන ඉඩම් වල වටිනාකම - රු.මිලියන 17

ප්‍රත්‍යාගණන ඉඩම - මෙය 2012 දී නිවැරදි කිරීමට ක්‍රියාකරනු ඇත.

(ට) කෙරීගෙන යන වැඩ තුළ ඇති රු.මිලියන 52,736 ක් වටිනා දේපල ප්‍රාග්ධනිත නොකිරීම (ජනනය - ගල් අගුරු ව්‍යාපෘතිය)

2011 වර්ෂයේදී ව්‍යාපෘතියේ වානිජ මෙහෙයුම් ආරම්භ කරන ලද නමුත්, විවිධ තාක්ෂණික හේතු මත අඩුපාඩු වගකීම් කාල සීමාව තුළ කොන්ත්‍රාත්කරු විසින් (CMEC) කළ යුතු නිවැරදි කිරීම් කරන තුරු ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කළ නොහැකි වී ඇත. කෙසේ වෙතත් ප්‍රධාන අඩුපාඩු සාදාදීමෙන් පසු 2012 වර්ෂයේදී ව්‍යාපෘති කෙරීගෙන යන වැඩ, ප්‍රාග්ධනිත කරන ලදි. තවද යන්ත්‍රයේ වර්තමාන තත්ත්වය හේතු කොට ගෙන (CMEC) කොන්ත්‍රාත්කරු තවම ලබානොගත් මුදලක් ගෙවීමට ඇත. රු.මිලියන 49,355 ක්, ගල් අගුරු බලාගාර ව්‍යාපෘතියෙන් ලක් විජය විදුලි බලාගාරයට මාරු කර ඇති අතර 2012 වර්ෂයේදී එය ප්‍රාග්ධනිත කරනු ඇත.

(ඩ) මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල - රු.මිලියන 2,000

සටහන් කර ගන්නා ලදී

(න) උපචිත වියදම් රු.මිලියන 25 කින් අඩුවෙන් දැක්වුණි

දෙසැම්බර් මාසයේ උපයන විට ගෙවීමේ බදු සඳහා සහ ප්‍රසාද දීමනාවට අදාල බදු ප්‍රතිපාදන ගිණුම්වල සලසා නොතිබීම මෙම වෙනසට හේතු වී ඇත. එහෙත් පසුව 2012 වර්ෂයේදී එය ගලපා ඇත.

(ත) රු.මිලියන 37 ක් වු ප්‍රාග්ධන ප්‍රදාන

2012 වර්ෂයේදි නිවැරදි කරනු ලැබේ

2.2.3 නොසැසඳු වෙනස්කම්

(අ) ලංකා විදුලි (පුද්) සමාගමෙන් අයවිය යුතු මුදල්

ලංවිම මුල්‍ය ප්‍රකාශ අනුව රු.මිලියන	1,628
උපයෝගී වාර්තා අනුව රු.මිලියන	1,736
වෙනස රු.මිලියන	108

ඉහත සඳහන් වෙනස සසඳන ලදි. සමුහ මුල්‍ය ප්‍රකාශවල අවශ්‍ය ගැලපුම් කර ඇත.

(ආ) ලංකා විදුලි (පුද්) සමාගමට ගෙවිය යුතු මුදල් - ලංකා විදුලි (පුද්) සමාගමේ මුල්‍ය ප්‍රකාශ අනුව

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

මෙම මතභේදකාරී ශේෂයක් වන අතර ලංවිම විය ගෙවිය යුතු බවට අදාල තොරතුරු නැත. අනාගයේදී මතභේදය නිරාකරණය කර ගැනීමට සටහන් කර ගන්නා ලදි.

(ඈ) ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය (අදියර - 1) සඳහා දායක වු ප්‍රාග්ධනය - රු. මිලියන 16

ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ වෙනම දැක්වෙන මූල්‍ය ප්‍රකාශ අනුව, ශ්‍රී ලංකා රජයේ දායක ප්‍රාග්ධනය රු.මිලියන 3,570 කි. එය ලංවිම මූල්‍ය ප්‍රකාශ අනුව පහතින් වාර්තා කර ඇති පරිදි රු.මිලියන 3,585 කි.

	රු.000
ගල් අඟුරු	604,516
ගල් අඟුරු ව්‍යාපෘතිය	636,852
රජයේ ප්‍රදාන	2,344,590
එකතුව	3,585,958
වෙනස	15,927

ගැලපු ගිණුම්වල සාවද්‍ය වර්ගීකරණය නිවැරදි කරන ලදි. රු. මිලියන 15.927 ක් වු වෙනස සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) දේපල, පිරියත හා උපකරණ - ස්ථාවර වත්කම් ලේඛනය - කලාප - 3

මේවා 2012 වසරේදී නිවැරදි කර ඇත.

(ඉ) දේපල, පිරියත හා උපකරණ - පොදු ලෙජරය කලාප - 3

මේවා 2012 වසරේදී නිවැරදි කර ඇත.

(ඊ) මෝටර් රථ වාහන හා උපකරණවල සමුච්චිත ක්ෂය ස්ථාවර වත්කම් ලේඛනය

මේවා 2012 වසරේදී නිවැරදි කරනු ලැබේ.

(උ) මෝටර් රථ වාහන හා උපකරණවල සමුච්චිත ක්ෂය - පොදු ලෙජරය

මේවා 2012 වසරේදී නිවැරදි කරනු ලැබේ.

(ඌ) ලංකා කෝල් සමාගමෙන් ලැබිය යුතු මුදල් (LCC) රු. මිලියන 11

මෙයින් දැක්වෙන්නේ ලංකා කෝල් සමාගමේ සේවයට අනුයුක්ත කර සිටි ලංවිම කාර්ය මණ්ඩලයේ වැටුප්ය.

(එ) වියදම් සඳහා අත්තිකාරම් - ලංකා කෝල්

ලංකා කෝල් සමාගම රු.මිලියන 11 ක් සටහන් කර ඇත. එයින් රු.මිලියන 3 ක් ලංවිම මූල්‍ය ප්‍රකාශවල ලැබිය යුතු ලෙස සටහන් කර තිබුණි. එය මූල්‍ය ප්‍රකාශවලදී අන්තර් සමාගම් ගනුදෙනු වලට එරෙහිව හිලව් කර ඇත. වෙනස වු රු.මිලියන 8 ඉදිරි කාලයේදී සසඳනු ලැබේ.

(ඒ) වෙළඳ ණයගැතියන් - කලාප - 2

මෙය බස්නාහිර පළාත උතුර හා සම්බන්ධ වේ. කාල විශ්ලේෂණ ශේෂයේ සාමාන්‍ය හා තොග සැපයුම් ශේෂ පමණක් ඇතුළත්වන අතර ඊට අමතරව බිල් කිරීමේ සාරාංශයෙන් ලංකා විදුලි සමාගම සහ ක්ෂේත්‍ර අවිනිශ්චිත ශේෂද අඩංගු වේ. ලෙකෝ සහ ක්ෂේත්‍ර අවිනිශ්චිත ගිණුමේ ශේෂවල එකතුව රු.මිලියන 50 කි.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

(ඔ) කෙරීගෙන යන වැඩ (ප්‍රාග්ධන නොවන) - කලාප 3

මේවා 2012 වර්ෂයේදී නිවැරදි කර ඇත.

(ඕ) වෙනත් ණයගැතියන් යටතේ ඇතුළත් අනෙකුත් ණය ගැතියන් - කලාප 3

සටහන් කර ගන්නා ලදි.

2.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලංකා විදුලි (පුද්) සමාගම සම්බන්ධයෙන් එකතුව රු.මිලියන 33 ක් වු ලැබිය යුතු ගිණුම් ශේෂ 3 ක් හා එකතුව රු. මිලියන 27 ක් වු ගෙවිය යුතු ගිණුම් ශේෂ 3 ක්

ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ එකිනෙක හිලව් කළ පසු ලෙකොහි ශුද්ධ ශේෂය රු.මිලියන 11 කි. රු.මිලියන 18 ක්වු එෆ්ඒසී මුදල 2012 දී LECO විසින් සම්ප්‍රේෂණ අංශයට ගෙවන ලදි. ඉතිරි ශේෂය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) රු. මිලියන 38 ක් වු අතිරික්ත භාණ්ඩ හා සේවා බදු (GST) ගෙවීම්, ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශවල 2012 ජනවාරි සිට ඉදිරියට ගෙන එමින් තිබුණි.

දෙපාර්තමේන්තුවේ බදු වගකීමට එරෙහිව හිලව් කරන ලෙසට ඉල්ලීම් රාශියක් කළ නමුත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි. ඕනෑම බදු වගකීමකින් මෙම මුදල් හිලව් කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දැනුම් දෙන ලෙසට මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) වසර 10 කට වඩා හිඟව පවතින රු.මිලියන 447 ක් වු විදුලිය ණයගැතියන් සඳහා සම්පූර්ණ ප්‍රතිපාදනයක් සලසා ඇත. අයකර ගැනීමට පියවරක් නොගෙන මෙම ශේෂ වාර්ෂිකව ඉදිරියට ගෙන ගොස් තිබුණි. (කලාප 1)

විමධ්‍යගත කිරීමට පෙර, සියළුම ආදායම් ගිණුම්කරණ කාර්යයන් එකම අංශයකින් එනම් සහකාර මුදල් කළමනාකරු (බෙදාහැරීම්) ශාඛාව මගින් ක්‍රියාත්මක කරන ලදි. විමධ්‍යගත කිරීම ක්‍රියාත්මක කිරීමත් සමගම බිල්කිරීමේ සාරාංශ එකතූන් අනුව ණයගැති ශේෂ එක් එක් අදාල පළාත් වලට මාරු කරන ලදි. විමධ්‍යගත කිරීමේ ක්‍රියාවලිය වසර 4 ක් පමණ (2001 සිට 2005 දක්වා) සිදුකරන ලද අතර, ලංවිම කිසිදු බිල්කිරීමේ සාරාංශයකට සම්බන්ධ කළ නොහැකි ශේෂයක් විමධ්‍යගත කිරීම අවසානයේ ලෙජරයේ ඉතිරි වුණි.

එබැවින්, පාරිභෝගිකයන් අනුව සැදුනු ආකාරය දැක්වෙන ශේෂ ලබාගත නොහැකි හෙයින් අයකිරීම් ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කළ නොහැකි විය. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ ප්‍රතිපාදනයක් සලසා ඇති අතර දීර්ඝ කාලීන ශේෂ කපා හැරීමට අනුමැතිය පතා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත.

(ඈ) මූල්‍ය ප්‍රකාශවල ලැබිය යුතු ලෙස සටහන් කර ඇති රු.මිලියන 1,622 ක් වු විදුලිය ප්‍රතිදාන සහ වීදි ආලෝක කිරීම සඳහා වූ රු.මිලියන 3451 ක් අයකර ගැනීම සැක සහිතවී ඇත.

මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ඉහත සඳහන් ශේෂ ගිණුම්වල තබාගෙන ඇත්තේ අයකර ගැනීමට හෝ භාණ්ඩාගාරයට ගෙවීමට ඇති වෙනත් මුදලකට හිලව් කිරීමේ පරමාර්ථයෙනි.
එබැවින්, භාණ්ඩාගාරය සුදුසු තීරණයක් නොදෙන තුරු එය සැකසහිත ණයක් ලෙස සැලකිය නොහැක.

(ඉ) විදුලිය පරිභෝජනයට එරෙහිව මාස දෙකක තක්සේරු කළ විදුලි පරිභෝජන පිරිවැය , පාරිභෝගික තැන්පතු වලට සමානවීම

මෙවැනි අවස්ථා සිදුවන්නේ සමහර දේශපාලන බලපෑම් සහ ඉකුත් කාලයේදී කරන ලද නෛතික ඇඟවීම් හේතුවෙනි. කෙසේ වෙතත් දැනට දී ඇති උපදෙස් වන්නේ නව සබඳතාවලට වෙන්ව පවත්නා ගිණුම්වල සංශෝධනයන් සඳහාද තැන්පතු ලබාගන්නා ලෙසයි.

(ඊ) රු.මිලියන 225 ක් වු සාමාන්‍ය සැපයුම් ණයගැති ශේෂය - කොළඹ නගර කාර්යාලය

පසුගිය වසර කීපයක සිට කොළඹ නගරය තුළ බිල් ගෙවීම පැහැර හරින්නන්ගේ සම්බන්ධතා විසන්ධි කිරීම හා අයකර ගැනීමේ ක්‍රියාවලිය සාර්ථක ලෙස කර ගෙන යනු ලබන අතර දීර්ඝ කාලීන හිඟ ශේෂයන්ට හේතුවී ඇත්තේ මත්භේද සහ නෛතික

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

ඇඟවීමිය. කෙසේ වෙතත් දීර්ඝ කාලීන හිඟ ශේෂ, පාරිභෝගිකයින්ගෙන් අයකර ගැනීමට අඛණ්ඩව උත්සාහයන් දරමින් සිටී.

(උ) රු.මිලියන 78 ක කෙරීගෙන වැඩ ශේෂයක් තිබිය නොහැකි වීම (කොළඹ නගරය)

සටහන් කර ගෙන නිවැරැදි කරන ලදි.

(ඌ) චිල්ට්විල් ට්‍රාන්ස්ෆෝමස් (පුද්ගලික) සමාගමෙන් 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල් රු.මිලියන 11 (ලංවිම පරිපාලිත සමාගමකි) ව්‍යාපෘතිය සහ බරපල නඩත්තු

REP ශාඛාවේ ශේෂය රු.මිලියන 11 ක් වු අතර (පිරිවැය මධ්‍යස්ථාන සංකේතය 760) එය වසර 15 කට වඩා හිඟව පවතී. මෙම පැරණි හිඟ ශේෂය සඳහා කිසිදු උපකාරක සාක්ෂියක් නොවීය. කෙසේ වෙතත් අදාල සමාගමට ඉල්ලීම් ලිපි යවා ඇතත් මේ දක්වා ප්‍රතිචාර දක්වා නැත.

(එ) ආගමික පරිශ්‍රවලින් අයවිය යුතු රු. මිලියන 2,415 ක මුදල

මෙම ශේෂය සමන්විත වන්නේ ප්‍රසිද්ධ ආගමික සිද්ධස්ථාන වලින් අයවිය යුතු විදුලි පරිභෝජන ගාස්තුය. රජයෙන් අයකර ගත යුතු වේ.

(ඒ) තොග පාරිභෝගිකයන්ගේ සාමාන්‍ය ණය කාලය මාස 1 කි. කෙසේ වෙතත්, එය මුළු අයවිය යුතු මුදල වු රු.මිලියන 523 කින්, රු.මිලියන 307 ක් විය.

හිඟ මුදල් වලින් ආසන්න වශයෙන් රු.මිලියන 292 ක් රජයේ ආයතන 8 කින් (රෝහල් සහ සන්නද්ධ සේවා) එක් අර්ධ රජයේ ආයතනයකින් ලැබිය යුතුය. (ජාතික කඩදාසි සංස්ථාව) මෙම ලැබිය මුදල් අයකර ගැනීමට අඛණ්ඩ ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ඔ) ණය පාලන ගිණුම (විදුලිය) - ශේෂය රු.මිලියන 359

රු. මිලියන 359 ක් වු ණය හිමි පාලන ගිණුමේ ශේෂය සමාලෝචනය කළ යුතුව ඇත. 2013 වර්ෂයේදී මෙය නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටී.

ඕ) රු. මිලියන 168 ක් වු ප්‍රාග්ධන නොවන කෙරීගෙන යන වැඩ- වලින් රු.මිලියන 34 ක මුදල - කලාප 4

ඉදිරියේදී මෙවැනි අඩුපාඩු මග හරවා ගැනීම සඳහා පැහැදිළි ගිණුම් වර්ගීකරණ උපදෙස් නිකුත් කිරීමට සටහන් කර ගන්නා ලදි.

(ක) අත්තිකාරම් හා ඉදිරිගෙවීම් ගිණුම්කරණය සඳහා පොදු ක්‍රමයක් නොමැතිවීම

ඉදිරියේදී මෙවැනි අඩුපාඩු මග හරවා ගැනීම සඳහා පැහැදිළි ගිණුම් වර්ගීකරණ උපදෙස් නිකුත් කිරීමට සටහන් කර ගන්නා ලදි.

ඉදිරි ගෙවීම් - වෙනත් අංශ - රු.17,027,801

කලාප - 1 - රු.4,179,892

මෙම ශේෂය සෑදී ඇත්තේ එක් එක් කලාපවල කුලියට ගත් ගොඩනැගිලි වලට කරන ලද ඉදිරි ගෙවීම් වලිනි. ඒවා ගිණුම් සංකේත අංක 3750 යටතේ ගිණුම් ගත කර ඇත.

කලාප - 2 - රු.2,262,008

මෙය 2012 වර්ෂයේදී උත්පාදනය ඇත.

රු.10,552,781

මෙය සෑදී ඇත්තේ සාවද්‍ය ලෙස ඉදිරිගෙවීම් ලෙස වර්ග කර ඇති රු.4,873,086 කින් සහ රු.2,743,052 ක් වු කොන්ත්‍රාත් අත්තිකාරම් වලිනි. කෙසේ වෙතත් 2012 වර්ෂයේදී කොන්ත්‍රාත් අත්තිකාරම් පියවා ඇත.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

සහකාර කළමනාකරු - රු. 33,120

මෙය 2012 වියදමට එරෙහි කරන ලද ඉදිරි ගෙවීමකි. ඉදිරියේදී ගෙවීම් - වෙනත් අංශ - කලාප - 3 - රු. 11,516,414

මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

අත්තිකාරම් වශයෙන් ගෙවූ ප්‍රවර්තන වියදම් කලාප - 1 රු. 31,659,895

මෙය 2012 මුල් සමාසිකයේදී මනු මිලදී ගැනීම සඳහා ලෙකො මීටරිං සමාගමට ගෙවූ අත්තිකාරම් මුදලක් වන අතර ගිණුමේ සංකේත අංක 3750 යටතේ ගිණුම්ගත කර ඇත. කෙසේ වෙතත් වැරදි විස්තරයක්දී ඇති අතර පසුව නිවැරදි කර ඇත.
මෙවැනි අඩුපාඩු ඉදිරියේදී වලක්වා ගැනීම සඳහා පැහැදිළි ගිණුම් වර්ගීකරණ උපදෙස් නිකුත් කිරීමට සටහන් කර ගන්නා ලදි.

අත්තිකාරම් හා ඉදිරිගෙවීම් (ඉදිරිගෙවීම් - ඒ - 3750) රු.3,315,776 , රු.1,149,516

එකතුව රු.1,449,516 න් රු.1,388,958 ක් වටිනා ගනුදෙනු නිරවුල් කර ඇත. ඉතිරි රු.60,558 ක් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

සම්ප්‍රේෂණ දෙපා. - රු.1,866,259

මෙම මුදල් පෙට්‍රල් තැන්පත් වලින් නියෝජනය වන අතර වෙනත් ණයගැතියන් (විදුලිය නොවන) තැන්පතු යටතේ වර්ග කර ඇත.

විවිධ අත්තිකාරම් - රු.380,599

2012 වර්ෂයේදී මෙය පැහැදී ඇත.

ලංවිම විශ්‍රාම අරමුදලට ගෙවූ අත්තිකාරම් මුලස්ථානය - රු.30,000,000

ලංකා විදුලි බල මණ්ඩලය ආරම්භයේදී විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා රු.මිලියන 30 ක අග්‍රිමයක් මුදා හරින ලදි. (පරිවර්තිත විශ්‍රාම වැටුප) අග්‍රිම අරමුදල එක් අරමුදලක් වශයෙන් අඛණ්ඩව පවත්වා ගෙන යාමට සටහන් කර ගත් අතර ගෙවීම් කරන අවස්ථාවේදී එම මුදල ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

කාර්ය අත්තිකාරම් - කලාප 3 - රු.12,940,199

මෙම මුදල් කොන්ත්‍රාත් වැඩ වෙනුවෙන් ගෙවූ අත්තිකාරම් මුදල්ය. කොන්ත්‍රාත්තුව අවසන් වූ වහාම සම්පූර්ණයෙන් අයකරනු ලැබේ. මෙම මුදල 2012 වර්ෂයේදී රු.මිලියන 9 දක්වා අඩු විය.

2.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන පහත සඳහන් විෂයයන් ඒවා එකිනෙක ඉදිරියේ දැක්වෙන උපකාරක සාක්ෂි නොමැතිවීම හේතුවෙන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.

(i) භාණ්ඩාගාර ණය (අ.මු.ක./මු.කා.) - රු.මිලියන 1,200

සාක්ෂි නොවීය - අදාල ගොනුව

පවත්නා සාක්ෂි අමුණා ඇත.

(ii) බොල් හා සැක කටයුතු ණය සඳහා ප්‍රතිපාදනය - සාක්ෂි නොවීය - කරන ලද නිශ්චිත ප්‍රතිපාදනයට අදාල විස්තර

එක් එක් පළාත විසින් කරන ලද ප්‍රතිපාදන වල සැකැස්ම ප්‍රාදේශීය ගණකාධිකාරීවරුන් වෙත පවතින බව අංශ භාර සහකාර මුදල් කළමනාකරුවන් විසින් සනාථ කර ඇත.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

(iii) ඉවත් කළ මාරු ගිණුම - කලාප 1 - කොළඹ නගර කාර්යාලය

මෙම ශේෂයෙන් නියෝජනය වන්නේ විදුලි කොටසෙන් ඉවත් කළ මාරු කළ වටිනාකම්ය. එහෙත් මේවා අපහරණය කළ තොගද, තොගයට එකතු කළ තොගද යන්න පිළිබඳ තොරතුරු නොවීය. කෙසේ වෙතත් විස්තර ලබාගැනීම සඳහා සහ අවශ්‍ය ගැලපුම් කිරීම සඳහා එකී මාරු කිරීම් වල ලැයිස්තුවක් එක් එක් පළාතට යවනු ලැබේ. පොත්පත් වලින් මෙය පැහැදීමට ක්‍රියාකරනු ලැබේ.

(iv) වෙනත් ණයගැතියන්

සාක්ෂි නොවීය - විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ

වෙනත් ණයගැතියන් - ප්‍රාග්ධන නොවන කෙරීගෙන යන වැඩ රු. මිලියන 390- කලාප 2

ආයතනික කාර්යාලය හැර අදාල ශේෂ පිළිබඳ විස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේෂණ, යොමු කිරීම සඳහා අදාල ප්‍රාදේශීය ගණකාධිකාරී කාර්යාලවල ඇත. ඒවා 2012 වර්ෂයේ සිට ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදි.

වෙනත් ණය ගැතියන් - ප්‍රාග්ධන නොවන කෙරීගෙන යන වැඩ රු. මිලියන 14

ආරක්ෂක ලාම්පු සහ රජයේ ස්ථාපනය කිරීම් සඳහා විදුලිය සැපයීම වෙනුවෙන් දැරූ මුදල් අයකර ගැනීමට ලංවිම විසින් ඉල්ලීම් රාශියක් කරන ලද නමුත් ලැබිය යුතු මුදල් භාණ්ඩාගාරය විසින් 2011 දෙසැම්බර් 31 දින වන තුරු පියවා නොතිබුණි.

(v) අත්තිකාරම් සහ ඉදිරිගෙවීම් තැන්පතු, ලංවිම සේවකයින්ට ණය, වෙනත් ණයගැතියන් ආදිය (බස්නාහිර පලාත උතුර -WPN) රු.මිලියන 2,409

සාක්ෂි ඉදිරිපත් නොකරන ලදි - සඳහන් කර නැත.
අදාල ශේෂ සම්බන්ධව සියළුම උපලේඛන, සැකැස්ම සහ කාල විශ්ලේෂණ බ.ප.උ. කාර්යාලයේ යොමු කිරීම සඳහා තබා ඇත.

(vi) ණයගැතියන් තුළ ඇති වෙනත් ණයගැතියන් කලාප 2 - රු.මිලියන 3,584

අදාල ශේෂ වලට සම්බන්ධව සියළුම උපලේඛන , සැදුනු ආකාරය සහ කාල විශ්ලේෂණ, අදාල ප්‍රාදේශීය කාර්යාලවල හා ආයතනික කාර්යාලයේ ඇත.

(vii) කපා හල ගබඩා විෂමතා (බ.ප.උ.) රු. මිලියන 22

විස්තර ඉදිරිපත් නොවීය. විස්තරාත්මක උපලේඛන අවශ්‍ය අනුමැතීන් සහ විමර්ශන වාර්තා ආදිය

යොමුව සඳහා , විස්තරාත්මක උපලේඛන , අවශ්‍ය අනුමැතීන් සහ විමර්ශන වාර්තා බ.ප.උ. කාර්යාලයෙහි ඇත.

(viii) කෙරීගෙන යන වැඩ - කලාපය - 2 - රු. මිලියන 138

සාක්ෂි ඉදිරිපත් නොවීය. විස්තරාත්මක උපලේඛන සහ නිම කිරීමට ප්‍රමාද වූ හේතු අදාල ශේෂ පිළිබඳ විස්තරාත්මක උපලේඛන ප්‍රාදේශීය ගණකාධිකාරී කාර්යාල සහ ආයතනික කාර්යාලයේ ඇත. ප්‍රමාදවීම් වලට හේතු 2012 සිට ඉදිරි ගිණුම් සමඟ ඉදිරිපත් කරනු ලැබේ.

(ix) වෙනත් අංශ වලට මාරු කළ අසම්පූර්ණ ප්‍රාග්ධන වැඩ (ඉහළ කොත්මලේ ව්‍යාපෘතිය - රු.මිලියන 815)

සාක්ෂි ඉදිරිපත් නොවීය - මාරු කළ විෂයන් පිළිබඳ විස්තරාත්මක උපලේඛන සහ අංශවල නම්

සඳහන් කර ඇති පරිදි කෙරීගෙන යන වැඩ වල ඇති මෙම බැර ශේෂය ලංවිම වෙනත් අංශ වලට මාරු කරන ලද නිම් වත්කම් නොවේ. මෙම ශේෂයෙන් නියෝජනය වන්නේ ප්‍රධාන වශයෙන් විනිමය විචලනයන් සහ ව්‍යාපෘති වලට අදාලව පවරාගත් ගොඩනැගිලි හා ව්‍යුහයන් ඉවත් කිරීමෙන් පැන නැගුණු වෙනත් ආදායම්ය.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

(ආ) විදේශ / රජය / ලංවිම මුල්‍යකරණ ව්‍යාපෘති

පැහැදිළි බල ශක්ති ප්‍රවේශ වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය හැර වෙන් වෙන්ව තිබූ මුල්‍ය ප්‍රකාශ රාශියක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

ව්‍යාපෘති වැඩ කරනු ලබන එක් එක් අංශ වල විධිමත් ගිණුම් වාර්තා පවත්වා ගෙන යනු ලබන අතර ඒවා ලංවිම ඒකාබද්ධ ගිණුම් වලට ඇතුළත් කර තිබේ. ආසියානු සංවර්ධන බැංකු ගිවිසුමේ වගන්ති හා කොන්දේසි වලට අනුව පැහැදිළි බල ශක්ති ප්‍රවේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වෙනම ව්‍යාපෘති මුල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ. වෙනත් ණය දෙන නියෝජිතායතන වලට එවැනි අවශ්‍යතාවක් නොවීය.

(ඇ) රු. මිලියන 6,182 ක් වූ භාණ්ඩාගාරය අනුමත කරන ලද ණය 4 ක් සඳහා උප - ණය ගිවිසුම් නොවීය

පැරැණි ලක්ෂපාන පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා (රු.මිලියන 1245.82) සහ නව ලක්ෂපාන විමල සුරේන්ද්‍ර ව්‍යාපෘතිය සඳහා (රු.මිලියන 4,892.95) උපයෝගී ණය ගිවිසුම් පිළියෙල කිරීම සඳහා 2013 වර්ෂයේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලැබී තිබුණි. ඒ අනුව වර්ෂය තුළදී අවසන් තීරණයක් ගැනීම සඳහා කෙටුම්පත් උපයෝගී ගිවිසුමක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි. යාපනය ප්‍රාදේශීය විදුලිය සැපයුම් පුනරුත්ථාපන ව්‍යාපෘතියට (රු.මිලියන 37.17) ප්‍රදානයක් ලෙස ණය පහසුකම් ලබාදීමට මහා භාණ්ඩාගාරය කටයුතු යොදන බවද වැඩිදුරටත් සඳහන් කරනු ලැබේ. එබැවින් එය 2011 දී රජයේ ප්‍රාග්ධන දායකයන් ලෙස සටහන් කරන ලදි. ඉහල කොත්මලේ ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ අදියර II සම්බන්ධයෙන් රු.මිලියන 7.2 ක් සඳහාවූ කෙටුම්පත් උපයෝගී ණය ගිවිසුම පිළිබඳ අවසන් තීරණයක් ගැනීම සඳහා එය විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟත්වය ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

(ඈ) කොළඹ නගර කාර්යාලයේ රු.මිලියන 450 ක් වටිනා කාර්යයන් (Jobs) පැවති බව අනාවරණය විය. කොළඹ නගර පළාත් මුල්‍ය ප්‍රකාශ අනුව 2011 ජනවාරි 01 දිනට හා 2011 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ වටිනාකම පිළිවෙලින් රු.මිලියන 450 ක් ක් රු.මිලියන 82 ක් විය. (විගණන වාර්තාවේ ශේෂයන් දෙකක මාරුවී ඇති බව පෙනේ) මෙයින් පෙනීයන්නේ ශේෂයෙන් 80% කට වැඩි ප්‍රමාණයක්, දේපල, පිරියත හා උපකරණ වලට මාරු කර ඇති බවයි. තවද නිම් වැඩ, දේපල, පිරියත හා උපකරණ වලට මාරු කරන විට අදාල පාරිභෝගික තැන්පතු ද පාරිභෝගික දායක ගිණුමට මාරු කරයි. එය සංස්ථා කාර්යාල මට්ටමෙන් හරස් පරීක්ෂණයකට භාජනය කෙරේ. එබැවින්, පාරිභෝගික දායකය විධිමත්ව හඳුනාගැනීම බෙහෙවින් දුෂ්කරය.

(ඉ) වයඹ පළාත් (NWP) කෙරීගෙන යන වැඩ රු.මිලියන 186 ක් හා රු.මිලියන 196 ක් වසර 2 සිට 5 දක්වා අතර වූ කාල පරාසයක් අඛණ්ඩව මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි

වත්කම් ගිණුම් වලට මාරු නොකර කෙරීගෙන යන වැඩ ගිණුමේ රැඳී තිබීමට හේතු රාශියක් බලපායි. සමහර හේතු පහත දැක්වේ.

(i) මායිම් ඉදිකිරීමට මහජනයාගෙන් විරෝධතා පලවීම.
(ii) මාර්ග ශුද්ධ කිරීම, නිවාඩු සහ වන්දි මුදල් ප්‍රශ්න
(iii) අතිරික්ත ද්‍රව්‍ය සහ බිල්පත් නියමිත දිනට කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් නොකිරීම.
(iv) කොන්ත්‍රාත් ඒකකයේ වැඩ අධිකවීම ඉදිකිරීම් ප්‍රගතිය නියාමනය කිරීමට බලය ඇත.

කෙරීගෙන යන වැඩ ගිණුමේ හිඟව පවතින කාර්යයන් තවදුරටත් අඩුකිරීම සඳහා නිමකළ හා බලශක්ති ගැන්වූ කාර්යයන් මාරු කිරීමට ක්‍රියාකරමින් සිටී. මෙම කාර්යයන් වල ප්‍රතිඵලයක් වශයෙන් 2011 දී රු.මිලියන 196 .3 ක් වටිනා කාර්යයන් වලින් රු.මිලියන 103 ක් වටිනා කාර්යයන් 2012 වර්ෂයේදී වත්කම් ගිණුම්වලට මාරු කර ඇත.

2.3.6 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනත

(i) **47(1) (අ) වගන්තිය** - වංචල හා නිශ්චල දේපල රක්ෂණ ආවරණය සඳහා වූ රක්ෂණ සංචිතය රු.මිලියන 6,572

පසුගිය වසර කීපයකම ලංවිම පරිචය වන්නේ ලංවිම ගිණුම්වල රක්ෂණ සංචිතයක් පවත්වා ගෙන යාමයි. එසේම ස්ථාවර වත්කම් වලට සිදුවන හානි වලට මුහුණුදීම සඳහා , අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් පරිදි එය රක්ෂණ සංචිත අරමුදලක ආයෝජනය කරනු ලැබේ.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

(ii) **47(1) (ආ) වගන්තිය** - මණ්ඩලය ලබාගත් ණය ආපසු ගෙවීම සඳහා වූ නිදන් අරමුදල - රු.මිලියන 17,447 ක් 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි.

2000 වර්ෂයේ සිට ලංවිම මෙහෙයුම් පාඩු ලැබීම නිසා ණය නිදහස් කිරීමේ සංචිතය සඳහා ප්‍රතිපාදන එතැන් සිට දිගටම සලසා නොතිබුණි.

(iii) **47(2) (අ) වගන්තිය** - මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපල සඳහා වූ ක්ෂය ආවරණය කිරීම සඳහා පවත්වා ගෙන යන ක්ෂය සංචිතය

2000 වර්ෂයෙන් පසුව මණ්ඩලය මෙහෙයුම් පාඩු මත පවත්වා ගෙනයාම නිසා ක්ෂය සංචිතයට ප්‍රතිපාදන නොසලසන ලදි.

(iv) **47(2) (ආ) වගන්තිය** - මණ්ඩලයේ මුල්‍ය ස්ථායිතාව තහවුරු කර ගැනීම සඳහා ප්‍රාග්ධන වැඩ වලට මුල්‍යකරණය කිරීමේ කාර්යය සඳහා ආදායම් මුදල් වලින් පොදු සංචිතය පවත්වාගෙන යාම

2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි. රු.මිලියන 165.45 කරුණාකර අයිතම් 2.3.2(ඈ) ඡේදයට දී ඇති පිළිතුරු බලන්න.

(ආ) 1989 වර්ෂයේ සිට මණ්ඩලයේ එක් එක් වර්ෂ අවසානයේ පැවති දල ස්ථාවර වත්කම් වටිනාකමින් 0.1% ක දායකත්වයක් පදනම් කර ගෙන පවත්වා ගෙන යන රක්ෂණ එස්ක්‍රෝ අරමුදල - 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,710

එම පරිචයන්ම අඛණ්ඩව භාවිතා කිරීම හෝ භාණ්ඩාගාරයේ වෙනම ගිණුමක් පවත්වා ගෙන යාම ගැන භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කරනු ලැබේ. එස්ක්‍රෝ අරමුදල ස්ථාපිත කරන ලද්දේ ඕනෑම කාලයක සිදුවන හානියක් සඳහා අවශ්‍ය වූ වන්දි වහාම ලබාගැනීමේ අරමුණෙනි.

(ඇ) 1990 මාර්තු 09 දිනැති අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) දිවයින පුරා ප්‍රසිද්ධ අයඳුම්පත් කැඳවීමකින් තොරව ලිපිකරුවන්, මුදල් භාරකරුවන්, ගබඩා භාරකරුවන්, යතුරු ලියන්නන්, රියදුරන්, කාර්යාල සහායකයින් වැනි නුපුහුණු හා අර්ධ පුහුණු කාර්යාල මණ්ඩල වාර්ෂිකව බඳවා ගෙන තිබුණි.

ලංවිම බඳවා ගැනීමේ හා උසස්වීම් පරිපාටිය අනුව විධායක නිලධාරීන් හා මධ්‍යම මට්ටමේ කාර්මික ශ්‍රේණි සඳහා වූ පුරප්පාඩු

ප්‍රතිශත පදනමක් මත අභ්‍යන්තර සහ බාහිර අයදුම්කරුවන්ගෙන් පුරවනු ලැබේ. ඉංජිනේරුවරුන් ගණකාධිකාරිවරුන් මධ්‍යම මට්ටමේ කාර්මික ශ්‍රේණි වැනි විධායක ශ්‍රේණි තනතුරු සඳහා ජාතික පුවත්පත්වල දැන්වීම් පලකර අයඳුම්පත් කැඳවා බාහිර අපේක්ෂකයන් බඳවා ගනු ලැබේ. අනෙකුත් සියලු තනතුරු සඳහා අයදුම්පත් ලබාගන්නේ විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශයෙන් සපයන නම් ලැයිස්තුවකට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙනි. මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස්වීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කොට එකී ලැයිස්තුවෙන් සුදුසුකම් ලත් අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ. සමහර විධායක නොවන ශ්‍රේණි සඳහා බඳවා ගනු ලබන්නේ ලංවිම වෙනුවෙන් රජයේ ආයතනයකින් පවත්වනු ලබන තරඟ විභාග යක් ප්‍රතිඵල මතයි. අවසාන තේරීම කරනු ලබන්නේ තරඟ විභාගයේ ප්‍රතිඵල පදනම් කර ගෙන සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙනි. මෙම සම්පූර්ණ බඳවා ගැනීමේ පරිපාටිය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 මගින් හඳුන්වා දුන් නිර්නායකයන්ට බෙහෙවින් සමාන වේ.

(ii) 2003 ජුනි 02 දින අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.2 ඡේදය

පළමු උත්සාහය වශයෙන් 1985 - 1987 කාලය තුළ මණ්ඩලයේ සියළුම ප්‍රධාන තනතුරු සඳහා මෙහෙයුම් හා පරිපාලනමය අත්පොතක් පිළියෙල කරන ලදි. මණ්ඩලයේ බොහොමයක් මෙහෙයුම් / පද්ධති සඳහා භාණ්ඩාගාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යොදාගනී. සමහර විට අදාල බලධාරීන්ගේ අනුමැතිය මත මණ්ඩලය තමාගේම චක්‍රලේඛ නිකුත් කර ක්‍රියාත්මක කරයි. පරිපාටි අත්පොත යාවත්කාලීන කිරීමට දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර යාවත්කාලීන කළ අත්පොත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

3. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මුල්‍ය සමාලෝචනය

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

3.1.1 පිරිවැය ව්‍යුහය

තොරතුරකි.

3.1.2 මූල්‍ය ප්‍රතිඵල

තොරතුරකි.

(අ) 2011 වර්ෂයේ ජල විදුලි උත්පාදන

තොරතුරකි

(ආ) 2011 වර්ෂයේදී ක්ෂය ප්‍රතිපත්තිය වෙනස්වීම් හේතුකොට ගෙන මණ්ඩලයට රු.බිලියන 2 ක පමණ අතිරේක පිරිවැයක් ආදායම් ප්‍රකාශයට අයකිරීමට සිදුවී තිබුණි.

තොරතුරකි.

(ඇ) 2011 දී මණ්ඩලයේ අලාභය

තොරතුරකි.

3.1.3 ද්‍රවශීලතා තත්වය

තොරතුරකි.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 බල ශක්ති උත්පාදනය

තොරතුරකි.

(අ) සමාලෝචිත වර්ෂයේ ජල විදුලි උත්පාදනය

තොරතුරකි.

(ආ) හරිත බලශක්ති ප්‍රභවයන්ගෙන් විදුලි ජනනය

තොරතුරකි.

3.2.2 විදුලි බලය විකිණීම

තොරතුරකි.

3.3 මතභේදයට තුඩුදුන් කරුණු

(අ) 1969 අංක 31 දරන පනතෙන් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලි බල පනත - රජය නිකුත් කළ භාණ්ඩාගාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

(i) 2008 ජූලි 01 දින සිට ලංවිම සියළුම සේවකයන්ට ගෙවන ලද විශේෂ අතුරු දීමනා සම්බන්ධ නිරීක්ෂණ

මෙම තත්ත්වය අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලදි. 2012 ජූනි 06 දින රැස්වූ අධ්‍යක්ෂ මණ්ඩලය 2008 සිට ගෙවනු ලබන මෙම තාවකාලික දීමනාව නැවැත්වීම අපහසු බව විගණකාධිපතිට දැනුම් දෙන ලෙස තීරණය කරන ලදි. තවද මෙම ගැටළුව සාමුහික

විගණකාධිපති වාර්තාවට පිළිතුරු.

ගිවිසුම හරහා විසඳීමටත් තීරණය කරන ලදි. ඒ අනුව මෙය වෘත්තීය සංගම් සමඟ එළඹුනු සාමුහික ගිවිසුමේ ඇතුළත් කරනු ලැබේ.

(ii) 1998 මාර්තු 08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 130 පරිදි 10% - 14% දක්වා පොලී මත වාහන ණය අනුමත කරනු වෙනුවට 4.2% ක පොලී මත වාහන ණය අනුමත කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ආයතන සංග්‍රහයේ දැක්වෙන රෙගුලාසි හා කොන්දේසි අනුව සහනදායී පොලී අනුපාතයක් මත ලංවිම සේවකයන්ට වාහන ණය ලබාදී ඇත. කෙසේ වෙතත් මණ්ඩලයේ දැනට පවතින මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගෙන සේවය ස්ථිර කරනු ලැබූ සේවකයින්ට පමණක් සේවක ණය හා වාහන ණය අනුමත කරනු ලැබේ.

(iii) මණ්ඩලයේ සේවකයින් විසින් දැරිය යුතු උපයන විට බදු ගෙවීම් , මණ්ඩලය විසින් ගෙවීම

ලංවිම සේවකයින්ගේ උපයන විට බදු වගකීම පියවා තිබුණි. මෙය විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශයට හා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමට කීප වතාවක්ම දැනුම්දී ඇති අතර වෘත්තීය සංගම් සමග සාකච්ඡා කර ඇති නමුත් එකඟත්වයකට පැමිණ නැත. කෙසේ වෙතත් මෙම කරුණ යෝජිත සාමුහික ගිවිසුමට එළඹීමට ප්‍රථම වෘත්තීය සංගම් සමග සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ.

(iv) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ලංවිම වර්ග 39 ක්වූ විවිධ කාර්ය මණ්ඩල දීමනාව ගෙවා තිබුණි.

වැටුප් හා සේවක සංඛ්‍යාව කොමිෂන් සභාවේ නිර්දේශය මත ලංවිම සේවකයින්ට දීමනා ගෙවීම 2008 අප්‍රේල් 09 දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇත. කෙසේ වෙතත් දීමනා ගෙවීම හා කාර්ය සාධනය මත ප්‍රසාද දීමනා ගෙවීම් පද්ධතිය , වෘත්තීය සංගම් සමඟ එළඹීමට නියමිත සාමුහික ගිවිසුමට ඇතුළත් කිරීමට අපේක්ෂිතය.

(ආ) 1990 සිට රක්ෂණ සංචිත ආයෝජනය කිරීමට ලංකා විදුලි බල මණ්ඩලයේ මුල්‍ය කළමනාකරු තනි තීරණයක් ගෙන ඇත.

සභාපති, සාමාන්‍යාධිකාරී, මුදල් කළමනාකරු යන නිලධාරීන්ට රක්ෂණ අරමුදල් මහජන බැංකුවේ ආයෝජනය කිරීමට 1986 නොවැම්බර් 26 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය ලබාදී ඇත.

(ඇ) විකල්ප බල ශක්ති අධිකාරියෙන් (SEA) ලැබිය යුතු මුදල් - රු.මිලියන 897

පිරිවැය පදනම් කරගත් අළුත් කිරීමේ බල ශක්ති ගාස්තු ක්‍රමය ස්ථාපිත කරන අවස්ථාව වන විට වැලැක්විය හැකි පිරිවැයෙන් 90% ක කොටසක් පමණක් ලංවිම දැරිය යුතු බවට තීරණය කෙරුණි. ගාස්තු චක්‍රය පදනම් කර ගෙන ලංවිම විසින් මුළු මුදලම ගෙවිය යුතු අතර වැලැක්විය යුතු පිරිවැයෙන් 90% ට වැඩි කොටස විකල්ප බලශක්ති අධිකාරිය විසින් ලංවිමට ගෙවිය යුතු බවට තවදුරටත් එකඟ වන ලදි. ලංවිම විසින් මාසිකව ප්‍රතිපූර්ණය කළ යුතු මුදල අධිකාරියට දන්වා යවනු ලැබේ. 2010 දෙසැම්බර් 31 දිනට විකල්ප බලශක්ති අධිකාරියෙන් ලැබිය යුතු මුදල රු.897,025,999 ක් විය. ඒ අනුව ලංවිම අධිකාරියෙන් එය ලැබිය යුතු මුදලක් ලෙස සටහන් කර ගන්නා ලදි. මේ ගැන ඔවුන්ගේ තීරණය දැනුම් දෙන ලෙස 2008 ජනවාරි 16 දින නි.සා.(EPT/SEA/NCRE) සහනාධාර දරන ලංවිම ලිපිය මගින් විකල්ප බල ශක්ති අධිකාරියෙන් ඉල්ලා සිටින ලදි. එහෙත් මේ දක්වා ප්‍රතිචාරයක් ලැබී නැත.

(ඈ)රක්ෂණ සංචිත අරමුදලේ ශේෂය අඩුවීම - රු.මිලියන 2545

මණ්ඩලයේ අවාසි සහගත ද්‍රවශීලතා තත්ත්වය නිසා රක්ෂණ අරමුදලේ පහත වැටීම ආයෝජනය කළ නොහැක. මණ්ඩලයේ ද්‍රවශීලතා තත්ත්වය දියුණු වූ පසු අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) බොහෝ කාලයක සිට ලංවිම සහ ලෙකෝ අතර විකුණුම් ගිවිසුමක් නොමැතිවීම ලංකා ඛනිජ තෙල් සංස්ථාව සමඟ ඉන්ධන මිලදී ගැනීම් ගැන විධිමත් ගිවිසුමක් නොමැතිවීම

ලංවිම හා ලෙකෝ සමඟ විකුණුමේ ගිවිසුම කෙටුම්පත් කර එහි නෛතික රාමුව සහතික කර ගැනීම සඳහා ලංවිම ප්‍රධාන නීති නිලධාරී වෙත ඉදිරිපත් කර ඇති, අතර එය නිම කිරීම සඳහා ප්‍රතිපෝෂණය අපේක්ෂාවෙන් සිටී. ලංකා ඛනිජ තෙල් සංස්ථාවද රාජ්‍ය සංස්ථාවක් වන අතර දීර්ඝ කාලයක් තිස්සේ ලංවිමට ඉන්ධන සපයමින් සිටී. සැපයුම් කොන්දේසි රජයේ ප්‍රතිපත්ති මත තීරණය වන බැවින් ඉන්ධන මිලදී ගැනීමට වෙනම ගිවිසුමක් අවශ්‍යවී නැත.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

(ඊ) ලංකා ඛනිජ තෙල් සංස්ථාවට 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.මිලියන 60,133 ක මුදලෙන් රු.මිලියන 51,139 ක මුදලක් හිඟව පැවතුණි. ලංවිම විසින් ඛනිජ තෙල් සංස්ථාවට ගෙවිය යුතු මුදල් වලින් බිලියන 50.5 ක් පියවීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2012 නොවැම්බර් 09 දින භාණ්ඩාගාර බැඳුම්කර ලංකා බැංකුව වෙත නිකුත් කරන ලදි. (භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව නිකුත් කළ 2012 ජනවාරි 11 දිනැති අංක පීඩී/ඩීඑස් සහ ඒ /පීඩී/09/468 ලිපිය අමුණා ඇත) 2013 මාර්තු 30 දිනැති අංක පීඊ/එස්ටීබී/60/ඊස්ටී දරණ රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් නිකුත් කළ ලිපිය අනුව මෙම මුදල 2015 සිට වසර 15 කින් ලංවිම විසින් භාණ්ඩාගාරයට ආපසු ගෙවිය යුතුය. (මිලියන 3.37 ෆ 15) ඒ අනුව ලංවිම විසින් ගිණුම් පොත් 2012 දී ගලපනු ඇත.

2012 ඔක්තෝබර් 31 දිනැති අංක සීඊබී/එෆ්බී / ඒපී/ටීඕඩී දරන ලංවිම ලිපිය මගින් ණය ආපසු ගෙවීම සම්බන්ධ ගිවිසුම් කෙටුම්පත ගැන මහා භාණ්ඩාගාරයෙන් විමසුම් කර ඇත.

3.4 කළමනාකාරිත්ව අකාර්යක්ෂමතා

(අ) අවසන් තීරණගත් ණයගැතියන් - සාමාන්‍ය සැපයුම්

(i) 2011 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති රු.මිලියන 47 ක් වූ හිඟ පාරිභෝගික ණය අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලයට නොහැකිවීම

කලාප වල අවසන් නිගමන ගත් ගිණුම් සම්බන්ධයෙන් තදබල පරිපාටි අනුගමනය කරනු ලබන අතර එවැනි තීරණ ගැන සෘජුවම පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් මැදිහත්විය යුතුය. මෙම කාර්යෙහිදී නෛතික ක්‍රියාමාර්ග ගැනීමට පෙර හිඟ ශේෂ ගැන උපකාරක සාක්ෂි තබා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව පළාත් නිලධාරීන් අයකර ගැනීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටී.

(ii) රු.මිලියන 165 ක හිඟ මුදලින් රු. මිලියන 126 ක් අයකර ගැනීම

මෙම දිගු කාලීන හඟ ණය අයකර ගැනීම සම්බන්ධයෙන් පළාත් නිලධාරීන් ක්‍රියාකරමින් සිටී. ඊට අමතරව සමහර ශේෂ නීති කටයුතු සඳහා යොමු කරනු ඇත.

හිඟ බිල්පත් මුදල් නොසලකා නව සම්බන්ධතා ලබාදීම් අවසන් කළ ගිණුම් - ඌව පළාත

ගිණුම් අංක 3594268918 , 350446309 හා 3503514900 වල ශේෂ 2012 වර්ෂයේදී අයකර ගන්නා ලදි. කොටසක් පමණක් දැටමත් අයකර ගෙන ඇති ගිණුම් අංක 2304483003 හි ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.

රු.මිලියන 401 ක් වූ වෙළඳ ණයගැතියන් කපාහැරීම සඳහා වූ මණ්ඩලීය පත්‍රිකාව ක්‍රියාත්මකව පැවතීම

විමධ්‍යගත කිරීමට පෙර , සියළුම ආදායම් ගිණුම් කටයුතු එකම අංශයක් මගින් එනම් , සහකාර මුදල් කළමනාකරු (බෙදාහැරීම්) ශාඛාවෙන් පමණක් සිදුකරන ලදි. විමධ්‍යගත කටයුතු කරන විට බිල්පත් සාරාංශ එකතැන් අනුව ණයගැති ශේෂ එක් එක් අදාල ප්‍රදේශික වලට මාරු කරන ලදි. විමධ්‍යගත කිරීමේ කාර්යය සඳහා වසර 4 ක පමණ කාලයක් (2001 - 2005) ගත විය. එකී කාර්යය අවසානයේදී, ලංවිම බිල්කිරීමේ සාරාංශයට සම්බන්ධ නැති ශේෂයක් ලෙජරයේ ඉතිරි විය. එබැවින් පාරිභෝගිකයන් අනුව ශේෂ සැකසුනු ආකාරය ලබාගැනීමට නොහැකිවී ඇත. එබැවින් අයකර ගැනීමේ කාර්යය ආරම්භ කිරීමට නොහැකිවී ඇත. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ ප්‍රතිපාදනයක් සලසා ඇති අතර දිගු කාලීන හිඟ ණය කපා හැරීම සම්බන්ධයෙන් අනුමැතිය ඉල්ලා මණ්ඩලීය පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත. එකී මණ්ඩලීය පත්‍රිකාවෙන් අනුමැතිය ලබාදී ඇත්තේ දිගු කාලීන හඳුනාගත් හිඟ ශේෂ කපාහැරීමට මිස නොසැසඳූ ශේෂ කපාහැරීමට නොවේ.

(ආ) කාලයක් නිරවුල් නොකර පැවති රු.මිලියන 22 ක් වූ තොග ඌනතා

තොග ඌනතා - කලාප අංක 1

2011 මුල්‍ය ප්‍රකාශ අනුව උතුරු මැද පළාත් තොග ඌනතා වටිනාකම රු.328,537.75 ක් විය. මෙම ශේෂය සෑදී ඇත්තේ රු.12,060 ක් වූ අයකර ගත හැකි ශේෂයකින් හා රු.316,477.75 ක් වූ අයකර ගත නොහැකි ශේෂවලිනි. අයකරගත නොහැකි ඌනතා වලට වගකිව යුතු පුද්ගයා සේවයෙන් පහ කර ඇති අතර මොහුගෙන් මෙය අයකර ගැනීමේ හැකියාවක් නැත. එබැවින් එය මේ දක්වා හිඟව පවතී. ඒ අනුව මෙම ණය ගැති ශේෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2012 වර්ෂයේදී කරනු ඇත.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

තොග ඌනතා - කලාප අංක 2

රු.මිලියන 22 ක් වු තොග ඌනතා වලින් රු.280,743.82 ක් කලාප -2 බස්නාහිර පළාත උතුරට අයත් වේ. මීට වගකිව යුතු පුද්ගලයාගෙන් මාසික වාරික වශයෙන් ඌනතා වටිනාකම අයකරනු ලැබේ.

තොග ඌනතා - කලාප අංක 3

මෙය පියවීමට කටයුතු කරනු ලැබේ.

තොග ඌනතා - කලාප අංක 04

දකුණු පළාතේ රු.මිලියන 7.9 ක තොග ඌනතා 2011 දෙසැම්බර් 31 දිනට හිඟව පවතී. 2012 වර්ෂයේදී ඉන් රු.මිලියන 3.36 ක් නිරවුල් කරන ලදි. ඉතිරි රු.මිලියන 4.59 ක මුදල වසර 5 ට වඩා පැරැණි හිඟ ශේෂයකි.

(ඇ) මණ්ඩලය ලංකා කෝල් සමාගමට වරායට ටග් යාත්‍රාවක් සහ බාජස් ප්‍රසම්පාදනය සඳහා රු.මිලියන 114 ක් වැය කොට තිබුණි. මෙම වත්කම් ගල් අගුරු ටොන් 1 කට එ.ජ. ඩොලර් 2.00 ක කුලියකට ඔවුන්ගේ වරාය මෙහෙයුම් කටයුතු සඳහා යොදවා ගනී -රු.මිලියන 102

වරාය වියදම් ලෙස ටග් හා බාජස් යාත්‍රා වෙනුවෙන් රු.මිලියන 114 ක් වැය කර තිබුණි. මෙම ටග් හා බජස් ශාඛාවෙන් යාත්‍රා පුත්තලමට යවනතුරු ත්‍රිකුණාමලය වරායේ නැංගුරම්ලා තිබුණු කාල පරිච්ඡේදය සඳහා පරිපාලන සහ මෙහෙයුම් ගාස්තු හා වියදම් වශයෙන් සී/ස ලංකා නැවු සමාගමට ගෙවා තිබුණි. ලංවිම ටග් හා බාජස් යාත්‍රා ප්‍රසම්පාදනය සඳහා 2012 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 2513 ක් වැය කොට තිබුණි.

(ඈ) රු.මිලියන 443 ක් වු අත්තිකාරම් වලින් රු.මිලියන 236 ක් ගල් අඟුරු (Deaf coal) මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ගෙවා තිබුණි.

ගල් අගුරු (Deaf coal) මෙහෙයවනු ලබන්නේ සී/ස ලංකා කෝල් සමාගම විසිනි. (LCCL) මේ වන විට ලංකා කෝල් විසින් සපයන ලද ගල් අගුරු ප්‍රමාණය පහත දැක්වේ.

	මෙ.ටොන්
1 පළමු ප්‍රේෂණය) DCTI) 001 - 2011.01.25	19,892
2 වැනි ප්‍රේෂණය) DCTI) 002 - 2012.07.12	9,640
3 වැනි ප්‍රේෂණය) DCTI) 003 - 2012.11.15	14,750
4 වැනි ප්‍රේෂණය) DCTI) 004 - 2012.11.15	10,275

රු.මිලියන 236 ක ගෙවු අත්තිකාරම් මුදල අයකර ගෙන ඇති අතර 2012 දෙසැම්බර් 31 දින වන විට ඉහත ගල් අඟුරු ප්‍රසම්පාදනය සඳහා රු.මිලියන 116 ක මුදලක් ලංකා කෝල් වෙත ගෙවිය යුතුව ඇත. අනපේක්ෂිත මුහුදු රළ හේතුවෙන් සමහර විට ගල් අඟුරු ආපසු ගැනීමට බාධා සිදුවී ඇත.

(ඉ) ඉහත (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් ක්‍රමවේදයට අනුව සමාගම මණ්ඩලයෙන් එකතු කරන ලද අරමුදල් ආයෝජනය කර රු.මිලියන 55 ක ආයෝජන ආදායමක් උපයා තිබුණි.

ලංකා කෝල් විසින් දී ඇති අදහස් දැක්වීම
ලංවිම අරමුදල් වලින් පමණක් රු.මිලියන 55 ක ආදායමක් උපයා නොතිබුණි. රු.මිලියන 55 ක ආදායමින් රු.මිලියන 22 ක් ඔරු උපකරණ කුලී අතිරික්තය හා නඩත්තු පිරිවැයයි. පොලී ආදායම රු.මිලියන 33 ක් වු අතර එය උපයා ඇත්තේ කොටස් ප්‍රාග්ධනය , සැපයුම්කරුවන්ගෙන් ලද වරාය ප්‍රමාද වන්දි ඇතුළු අතිරික්ත අරමුදල් ආයෝජනයෙනි.

(ඊ) ගල් අඟුරු මිලදී ගැනීම් සම්බන්ධයෙන් ලංකා කොල් සමාගම සමඟ වාණිජ ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් මණ්ඩලය ඇති කරගෙන නොතිබුණි.

මේ සම්බන්ධයෙන් අවස්ථා කීපයකදී සාකච්ජා පැවැත්වු නමුත් මේ දක්වා විසඳී නැත.

(උ) එක් එක් ප්‍රාදේශීකවල ඉදිකිරීම් ශාඛා විසින් ඔවුන් භාර ගන්නා විදුලිය සැපයීමේ කාර්යයන් පිළිබඳ වාර්තා, මූලික ඇස්තමේන්තු අගයට පවත්වා ගෙන යාම

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

වර්ෂය මුල කොන්ත්‍රාත් ශාඛාව විසින් අනුමත කරන ලද ප්‍රමිත පරාමිති හා ප්‍රමිත මිල ගණන් පදනම් කර ගෙන කොන්ත්‍රාත් ශාඛා ඇස්තමේන්තු පිළියෙල කරනු ලැබේ. එහෙත් එක් කාර්යයක් සඳහා දැරූ තථ්‍ය පිරිවැය මුදල් ශාඛාවේ ගිණුම්වල සටහන් කරනු ලැබේ. එය තථ්‍ය ද්‍රව්‍ය අවශ්‍යතා හා ශ්‍රම කොන්ත්‍රාත් මිල ගණන් අනුව වෙනස් විය හැක.
එබැවින් එකී තොරතුරු සැසඳිය නොහැක. කෙසේ වෙතත් එක් එක් කාර්යයන් නිම කළ පසු සැලකිය යුතු ‑ හෝ - 10% බැහැරවීම් විමර්ශනය කරනු ලැබේ.

3.5 හඳුනාගත් පාඩු

වර්ෂය තුළදී කපාහල බොල් ණය රු.මිලියන 226 ක්(2011) හා රු.මිලියන 1513 කි(2013).

කලාපය 01

රු.මිලියන 41 ක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන් (DCC) අනුමත කළ යාපනය මහ රෝහලෙන් ලැබිය යුතු පොලිය කපා හැරීමකි.

ප්‍රධාන කාර්යාලය

සටහන් කර ගන්නා ලදි.

3.6 ව්‍යාපෘති ප්‍රමාදයන්

(අ) සමනල වැව කුඩා ජල විදුලි ව්‍යාපෘතිය 10 Gwh

2006 වර්ෂයට පෙර ආරම්භ කරන ලදි කාන්දුවීමක් නිසා අත්හිටුවා ඇත.

කාන්දුවීමක් නිසා සමනල වැව කුඩා ජල විදුලි ව්‍යාපෘතිය අධ්‍යයනය කරමින් පවතී.

(ආ) විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය යටතේ රජය විසින් වාර්ෂික ඇස්තමේන්තු වලින් රු.මිලියන 4022 ක් විදුලි සැපයීමේ ව්‍යාපෘති 9 ක් සඳහා විදුලි බල මණ්ඩලයට වෙන්කිරීම

කිසිඳු මුදලක් උපයෝජනය කර නැත.

ශ්‍රී ලංකාව අලෝකවත් කරමු (හම්බන්තොට - බෙලිඅත්ත) රු.මිලියන 315

2011 රජයේ මුද්‍රිත ඇස්තමේන්තුවල ශ්‍රී ලංකා දකුණු පළාත (ගාල්ල, මාතර, හම්බන්තොට) අලෝකවත් කරමු ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1297 ක් ලංවිමට වෙන්කර තිබුණි. 2011 වර්ෂයේදී රු.මිලියන 1172 ක් ලංවිමට ලැබී තිබුණි. ඉල්ලීම් කළ නමුත් ඉතිරිය වූ රු.මිලියන 125, 2011 දී නොලැබුණි.

බෙදාහැරීම් සංවර්ධන ව්‍යාපෘතිය - දෙහිවල / ගල්කිස්ස - රු.මිලියන 46

අරමුදල් මාර්ගය අවසානයක් නොවුන නිසා ව්‍යාපෘතිය පමා වුයෙන් අරමුදල් උපයෝජනය නොවීය.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාත අලෝකවත් කරමු නැගෙනහිර නවෝදය
ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාත ආලෝකවත් කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා ත්‍රිකුණාමලය හා මඩකලපුව දිස්ත්‍රික්කවල ග්‍රාමීය ප්‍රදේශ වලට විදුලිය සැපයීම සඳහා ගැනුම්කරුවන්ගේ ණය කොන්දේසි මත ද්‍රව්‍ය සැපයීම හා බෙදාහැරීම සඳහා 2010 නොවැම්බර් 12 දින චීනයේ සීමිත ෂැන්හයි ඉලෙක්ට්‍රික් පවර් ට්‍රාන්ස්මිෂන් සහ ඩිස්ට්‍රිබියුෂන් ඉන්ජිනියරිං සමාගමට කොන්ත්‍රාත්තුව පවරන ලදි. කොන්ත්‍රාත් ගිවිසුම 2011 පෙබරවාරි 21 දින අත්සන් කරන ලදි.
චීනයේ එක්සිම් බැංකුව හා ශ්‍රී ලංකා රජය අතර ගිවිසුම 2012 ජනවාරි 16 දින අත්සන් කරන ලද අතර ණය ඵලදායිත්වය 2012 ජූලි 25 දින ප්‍රකාශයට පත් කරන ලදි.

කල්පවත්නා විදුලිය අංශ උපකාරක ව්‍යාපෘතිය - 2 ග්‍රාමීය විදුලි සැපයීම හා බෙදාහැරීම් පද්ධති වැඩිදියුණු කිරීම පුළුල් කිරීම

ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා රජය අතර ගිවිසුම 2011 ජුනි 20 දින අත්සන් කරන ලදි. ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම සඳහා එය

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

කොටස් 11 ට කොටස් කරන ලදි. කොටස් 1-5 දක්වා වූ ලංසු 2011 මැයි 11 දින වසා දමන ලදි. 6 හා 7 කොටස් සඳහා ලංසු 2011 ජූනි 06 වසන ලද අතර කොටස් 8 සිට 11 දක්වා වූ ලංසු 2011 ජූනි 22 දින වසන ලදි. එහෙත් කොටස්වල සංකීර්ණ බව හේතු කොට ගෙන ලංසුකරුවන් ඔවුන්ගේ ප්‍රදානයන් ඉදිරිපත් නොකරන ලදි.
අනතුරුව එම කොටස් යළි කොටස 1 A, 1 B කොටස 3 A, 3 E, 3 C කොටස 6 සිට 6A1, 6 A11, 6 B සහ 6 D, කොටස 7 සිට 7 A, 7B ආදී වශයෙන් උප කොටස් වලට ලදි.

ත්‍රිකුණාමලය ඒකාබද්ධ යටිතල පහසුකම් ව්‍යාපෘතිය

අදාල වගකිව යුතු නිලධාරියාගෙන් ප්‍රමාදයට හේතු විමසා ඇත.

119-2-4-2302-6-12-KCTP (කිලිනොච්චි චුන්නාකම්) සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2011 වර්ෂයේ මුළු වෙන්කිරීම රු.මිලියන 350 කි. එයින් රු.මිලියන 216 ක් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කරන ලදි. වෙම්මුනි ග්‍රිඩ් උපපොල සහ ආශ්‍රිත සම්ප්‍රේෂණ මාර්ගය සඳහා වූ කොන්ත්‍රාත්තුව 2011 නොවැම්බර් මාසයේදී ප්‍රදානය කිරීමට හා වෙන්කළ මුදලින් රු.මිලියන 350 ක අත්තිකාරම් මුදලක් ගෙවීමටද සැලසුම් කරන ලදි. මෙම ව්‍යාපෘතිය අත්හිටවූ බැවින් අරමුදල් සැලසුම් කළ පරිදි විය පැහැදම් කළ නොහැකි විය.

119-2-4-2302-20-11 AGSAREP (ආපසු ගෙවිය යුතු බල ශක්ති ව්‍යාපෘතිය අන්තර්ග්‍රහණය ණය සඳහා ග්‍රිඩ් උපපොල වැඩිදියුණු කිරීම)

2011 වර්ෂයේදී ශ්‍රී.ලං. රු.මිලියන 650 ක් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද අතර ශ්‍රී.ලං.රු. මිලියන 380 ක් වර්ෂය තුළදී උපයෝජනය කරන ලදි. රත්ටැඹේ සහ විමල සුරේන්ද්‍ර ග්‍රිඩ් උපපොල වල ඉදිකිරීම් වැඩ ප්‍රමාදවීම හේතු කොට ගෙන අරමුදලේ ඉතිරිය උපයෝජනය කළ නොහැකි විය.

119-2-4-2302-6-12 - BHP (බ්‍රෝඩ්ලන්ස් ජල විදුලි ව්‍යාපෘතිය)

මෙම ව්‍යාපෘතියට වෙන්කළ මුදල් උපයෝජනය කළ නොහැකි වුයේ චීන බැංකුව සමඟ ණය ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද වූ හෙයිනි. (ඉන්ඩස්ට්‍රියල් කොමර්ෂල් බෑන්ක් ඔෆ් චයිනා) (ICBC) පසුගිය මාසයේදී සාක්ෂි වශයෙන් වූ ලියකියවිලි සෘජුවම විගණන අංශයට ඉදිරිපත් කරන ලදි.

මොණරාගල ජල විදුලි ව්‍යාපෘතිය

මොණරාගල ජල විදුලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ අංක එස්ආර්අයි 2733 දරන ආ.ස.බැංකු මූල්‍ය සහාය මත කල් පවතිනා විදුලි බල අංශ සහාය ව්‍යාපෘති ණය පැකේජය යටතේය. (ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන කමිටුව 2010 දෙසැම්බර් මස පත් කරන ලද අතර (CACPC) මෙහි සභාපති වශයෙන් වර්තමාන විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශයේ ලේකම් පත්කරන ලදි.
පළමු ප්‍රසම්පාදන කමිටුව දෙසැම්බර් මාසයේදී පවත්වන ලද අතර එතැන් පටන් 2011 වර්ෂයේදී පහත සඳහන් ක්‍රියාකාරකම් කරන ලදි.

- උපදේශකයන් පත් කර ගැනීමේ තේරීම් නිවේදනය (CSRN) ජාතික පුවත්පත්වල මෙන්ම ඇ.ස.බැංකු වෙබ් අඩවියේ 2011 පෙබරවාරි 09 දින පළ කරන ලදි. එය සැලසුම් කළ පරිදි සිදුවිය.
- EQ 1 28 ක් ලැබුණු අතර ඒවා ප්‍රසම්පාදන කමිටු නිර්ණායක මත ඇගයීමට ලක් කරන ලදි. කමිටුව විසින් කෙටි කළ ලැයිස්තුව 2011 මැයි 09 දින අනුමත කරන ලදි. මෙම කාර්යය සඳහා දින 10 ක් මුලින් සැලසුම් කළ නමුත් කමිටු සාමාජිකයන්ගේ අනෙකුත් රාජකාරි බැඳුම් හේතු කොට ගෙන එය කෙසේවත් ප්‍රායෝගික නොවුයෙන් මාස 3 ක කාලයක් ගත විය.
- එබැවින් ආසියානු සංවර්ධන බැංකු කෙටි ලැයිස්තුව සමාලෝචනයට මාස 4 ක කාලයක් ගත කළ අතර ඊට එකඟත්වය ලබාදුන්නේ 2011 සැප්තැම්බර් 06 දින දීය. මුල් අදියරේද මෙයට සැලසුම් කළේ දින 15 කි.
- REP 2011 ඔක්තෝබර් 03 දින නිකුත් කරන ලදි. මුලින් එය සැලසුම් කළේ කාර්යය 3 නිම වී දින 7 කිනි.
- යෝජිත ඉදිරිපත් කිරීම 2011 නොවැම්බර් 30 දින නිම කරන ලදි. කෙටි ලැයිස්තු කරන ලද උපදේශක සමාගමට ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා සති 3 ක කාලය දීර්ඝ කිරීමක් දුන් නිසා එයට මාස 2 ක කාලයක් ගත විය.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

2011 වර්ෂයේදී ආ.ස.බැ. හා ජා.ප්‍ර. නියෝජිතායතනයේ මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදන කමිටුව උසස් ප්‍රසම්පාදන කාර්යයන් 9 ක් පමණක් නිම කරන ලදි. ව්‍යාපෘති නියාමන ඒකකයේ පාලනයන් තොර හේතු නිසා වැඩි ප්‍රමාණයක් සිදුවූයේ කාර්යයන් 2 හා 3 සම්බන්ධයෙනි. 2011 වර්ෂයේදී මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා කොන්ත්‍රාත්කරුවකු සොයා ගැනීමට ප්‍රසම්පාදන කමිටුවට නොහැකි විය. මෙම හේතු පදනම් කර ගෙන වෙන් කළ මුදල් උපයෝජනය කළ නොහැකි විය.

ඌව උදානය

ඌව උදානය සඳහා ලද අරමුදල් උපයෝජනය කරන ලදි.

පැරණි ලක්ෂපාන විදුලි බලාගාරය පුනරුත්ථාපනය

මෙම ව්‍යාපෘතියේ වියපැහැදම් උපලේඛනය, මෙවලම් හා උපාංග සැපයීම සඳහා සැලසුම් කරන ලදි. 2012 අප්‍රේල් මාසයේදී වැඩ බිම් සජීවීකරණය සැලසුම් කළ අතර කොන්ත්‍රාත්කරු මෙවලම් හා උපාංග සැපයීම ප්‍රති උපලේඛන ගත කරන ලදි. එහෙත් එය කොන්ත්‍රාත්තුව නිම කිරීම කෙරෙහි බලපෑමක් නොවීය. මෙම තත්ත්වයන් යටතේ 2011 වර්ෂය සඳහා සැලසුම් කළ වියපැහැදම (රු.මිලියන 35) දැරිය නොහැකි විය.

උකුවෙල බලාගාරය පුනරුත්ථාපනය

මූල්‍ය සංකේත අංක 14 යටතේ 2011 වර්ෂයට වෙන්කිරීම රු.මිලියන 59 ක් වු අතර තථ්‍ය වියපැහැදම රු.මිලියන 100.94 කි. මෙය වෙන් කරන ලද මුදල ඉක්මවා යාමකි. එබැවින් අතිරේක අරමුදල් මාරුව 2011 දී සිදුකරන ලදි. උකුවෙල බලාගාරය 2011 මැයි මස 04 දින පුනරුත්ථාපනය කොට ප්‍රමාදයකින් තොරව නියමිත කාලය තුළදී භාරදෙන ලදි. ඉහත සඳහන් පැහැදිළි කිරීම් වලට අමතරව ප්‍රගති උපලේඛනයක්ද අමුණා ඇත.

3.7 මානව සම්පත් කළමනාකරණය

(අ) 2007 න් පසු කාර්ය මණ්ඩල සංශෝධනයක් සිදුකර නැත

බෙදාහැරීම හා සම්ප්‍රේෂණ පුළුල් කිරීම සැලකිල්ලට ගනිමින් සමහර වර්ගවල කාර්ය මණ්ඩලය වැඩි කිරීම සඳහා කෑලි වැඩ පදනම යටතේ බඳවා ගැනීමට අනුමැතිය අපේක්ෂා කරන ලද අතර ඊට අනුමැතිය ලැබුණි. කෙසේ වෙතත් 2012 වර්ෂයේදී සියළුම වර්ගවල කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට ක්‍රියාකරනු ලැබිය. 2012 ලංවිම කාර්ය මණ්ඩල විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2012 දී අපේක්ෂා කෙරේ. 2012 මෙම කාර්ය මණ්ඩල සැලැස්ම , ලංවිම බෙදාහැරීමේ අංශයේ සේවා සඳහා අනු කොන්ත්‍රාත් දීමද සැලකිල්ලට ගනිමින් පිළියෙල කරනු ලැබ ඇත. ඒ අනුව, හදිසි අවශ්‍යතා මත භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය තනතුරු 888 ක් සඳහා ලබාගන්නා ලදි.

(ආ) මානව සම්පත් කළමනාකරණය සඳහා දත්ත සමුදායක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

2003 වර්ෂයේ සිට මානව සම්පත් කාර්යයන් විමධ්‍යගත කර ඇති අතර අදාල අංශවල දත්ත සමුදායන් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව එක් එක් අංශ ඔවුන්ගේ දත්ත සමුදාය පවත්වා ගෙන යනු ලබන අතර කාර්ය මණ්ඩල වෙනස්කම් කාර්තු පතා ප්‍රධාන කාර්යාලයට එවනු ලැබේ. කෙසේ වෙතත් මධ්‍යගත පරිගණක ගත දත්ත සමුදා පද්ධතියක් ලංවිම සඳහා දැනට ක්‍රියාත්මක කරමින් පවතී. (මානව සම්පත් තොරතුරු කළමනාකරණ පද්ධතිය)

(ඇ) තාක්ෂණික ශ්‍රේණිවල ප්‍රධාන තනතුරු 173 ක් පුරප්පාඩු පැවතීම

2011 දෙසැම්බර් 31 දිනට තාක්ෂණික ශ්‍රේණිවල පුරප්පාඩු පැවතුණි. කෙසේ වෙතත් 2012 වර්ෂය තුළදී ඉංජිනේරුවරුන් 95 දෙනෙකු මධ්‍යම මට්ටමේ තාක්ෂණික සේවා නිලධාරීන් 144 දෙනෙකු බඳවා ගන්නා ලදි.

(ඈ) මණ්ඩලය විසින් සේවයෙහි යෙදවූ කොන්ත්‍රාත් තාවකාලික අනු කොන්ත්‍රාත් සේවකයන් වෙනුවෙන් අනුමත කාර්ය මණ්ඩලයක් නොවීය.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

2011 / 2012 සඳහා මණ්ඩලය අනුමත කළ කාර්ය මණ්ඩල සැලැස්ම පිළියෙල කරන ලද්දේ ලංවිම බෙදාහැරීම් අංශයේ අනු කොන්ත්‍රාත් සේවාද සැලකිල්ලට ගනිමිනි. මුල්‍ය බර සැහැල්ලු කිරීමට පිරිවැය අඩුකිරීම සඳහා මිනිස් බලය අනු කොන්ත්‍රාත්දීම කරන ලදි.

2012 කාර්ය මණ්ඩල සැලැස්ම අනුව පහත සඳහන් සේවාවන් අනු කොන්ත්‍රාත් දෙන ලදි.

- සේවා සම්බන්ධතා වැඩ (සේවා කොන්ත්‍රාත්තු)
- බෙදාහැරීමේ කොන්ත්‍රාත් වැඩ (සේවා කොන්ත්‍රාත්තු)
- මාර්ග බාධක ඉවත් කිරීමේ වැඩ (සේවා කොන්ත්‍රාත්තු)
- පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ආරක්ෂාව (ආරක්ෂක සේවා)
- සනීපාරක්ෂක සේවා (සේවා කොන්ත්‍රාත්තු) } මිනිස්බල ඒජන්ත ආයතන හරහා
- බිල් කිරීමේ සේවය (කෑලි වැඩ)
- දත්ත ඇතුළත් කිරීමේ සේවය (කෑලි වැඩ)
- වාහනය සමඟ රියදුරු - කුලී කොන්ත්‍රාත්තු
- නුපුහුණු ක්ෂේත්‍ර සේවා
- ලිපිකාර වැඩ
- කාර්යාල සේවක
- කාර්යාල කාර්ය සහායක
- යතුරු ලියන වැඩ (සිංහල / ඉංග්‍රිසි / දෙමළ)
- පිළිගැනීමේ නිලධාරි / දුරකථන ක්‍රියාකරවන්නන් / පාරිභෝගික සේවා උපස්ථායක
- දුරකථන මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය

මෙම ප්‍රතිපත්ති පදනම් කර ගෙන , පිරිස් බල ඒජන්ත විසින් සේවා සපයන්නන් සංඛ්‍යාව 4500 ක් පමණ වේ.

(ඉ) කම්කරු කාර්යාල සහායක සහ සමාන්තර සේවා වැනි පහළ ශ්‍රේණි සඳහා අමාත්‍යවරයාගේ ලැයිස්තුවකින් සේවයෙහි යොදවාගෙන ඉහල තනතුරු සඳහා උසස් කර තිබුණි.

නිරීක්ෂණයට පදනම සඳහන් කර නැත. එවැනි නිරීක්ෂණයකට අභ්‍යන්තරව පත් කළ හා උසස් කළ සේවකයන් පිළිබඳ අහඹු නියැදියක් පදනම් කර ගෙන උසස්වීම් යෝජනාක්‍රමය හා කාර්යක්ෂමතාව පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් අවශ්‍ය වේ. දැනට භාවිතයේ පවත්නා බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටිය බොහෝ පහළ ශ්‍රේණිවල සේවකයන්ට උසස්වීමේ මාර්ගයක්වී ඇත. කෙසේ වෙතත් මෙම අදහස් දැක්වීම බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රම කමිටුවේ අවධානයට යොමු කරනු ලැබේ.

(ඊ) ප්‍රධාන තනතුරු සඳහා ජ්‍යෙෂ්ඨත්වය මතට පුද්ගලයන් තෝරා ගැනීම හැර විධිමත් අනු පිළිවෙල සැලැස්මක් නොතිබූ බව නිරීක්ෂණය විය. ලංවිම බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටියේ සඳහන් නිර්නායකයන් අනුව තනතුරු පුරප්පුඩු වූ විට උසස්වීම් හා බඳවා ගැනීම් කරනු ලැබේ.

(උ) උසස් තනතුරු සඳහා ප්‍රබල මාරු කිරීම් ප්‍රතිපත්තියක් නැති බව නිරීක්ෂණය විය.

සේවා කොන්දේසියක් ලෙස සියළුම ලංවිම සේවකයෝ දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට බැඳී සිටිති. කෙසේ වෙතත් මාරු කිරීම් එදිනෙදා කෙරෙන්නක් ලෙස කරනු නොලැබේ. එහෙත් පහත සඳහන් තත්ත්වයන් මත අවශ්‍යතා පැනනැගුණු විට මාරු කිරීම් කරනු ලැබේ.

1. සේවයේ හදිසි අවශ්‍යතා
2. පරිපාලනමය හේතු සඳහා
3. විනයානුකූල ක්‍රියා මාර්ග මත
4. අසනීප, දරුවන්ගේ අධ්‍යාපනය, ආර්ථික ආතතිය වලක්වා ගැනීමට ස්වාමි පුරුෂයා හා භාර්යාව එකම ස්ථානයක සිටීම සහ වෙනත් සාධාරණ හේතු මත සේවකයින්ගේ ස්ථාන මාරු අනුමත කරනු ලැබේ.
5. සේවකයින්ගේ ගම් ප්‍රදේශයේ සේවය කිරීමට අවස්ථාව සැලසීම.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

3.8 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දින අංක පීඊඩී / 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන පරිදි මණ්ඩලයේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

2014 - 2018 කාල පරිච්ඡේදය සඳහා ලංවිමට සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමට කාර්ය පැවරුමක් කළමනාකාරිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය 2013 පෙබරවාරි මාසයේදී ඇත. එය මාස 3 ක් ඇතුළත නිම කිරීමට අපේක්ෂා කෙරේ.

3.9 විගණන කමිටුව

(අ) විගණකාධිපති වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා සීමා සහිතව සමාලෝචනය කිරීම

2011 වර්ෂය තුළදී පැවැත්වූ රැස්වීම් හයේදී වැදගත් විගණන විමසුම්, විගණකාධිපති වාර්තාවේ යළිත් දැක්වූ විමසුම්, රාජ්‍ය ව්‍යාපාර කමිටු වාර්තාවේ නිරීක්ෂණ, සාකච්ඡා කරන ලදි. සියළුම අභ්‍යන්තර සහ බාහිර විගණන වාර්තා කමිටුවේදී සාකච්ඡා කිරීම දුෂ්කර වන අතර වැදගත් වාර්තා හා විෂයයන් පමණක් සාකච්ඡා කරනු ලැබේ. ඊළඟ රැස්වීමේදී පසුවිපරම් කර සමාලෝචනය කරනු ලැබේ.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රසම්පාදන සැලැස්ම ආදිය පිළිබඳ පසුවිපරම් සමාලෝචනය නොකිරීම.

2013 වර්ෂයේ සිට ඉදිරියට මාසික ප්‍රගති වාර්තා අයවැය පාලනය සමාලෝචනය සඳහා කටයුතු කරනු ලැබේ. 2011 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට පෙර මණ්ඩලීය පත්‍රිකා කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කමිටුව ඒවා සමාලෝචනය කරන ලදි.

3.10 අයවැය පාලනය

අයවැය ලේඛනය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

ලංවිම එහි අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන උපකරණයක් ලෙස භාවිතා කරයි. කෙසේ වෙතත් ප්‍රධාන වශයෙන් සෘජු ජනනය පිරිවැයෙහි පාලනය කළ නොහැකි සිදුවීම් හා අනෙකුත් මෙහෙයුම් හා නඩත්තු පිරිවැයෙහි පාලන උත්සාහය නිසා අයවැය, තථ්‍ය ප්‍රතිඵල වලට වඩා විචලනය වී ඇත.

ආදායම් විචලනය

2011 වර්ෂයේදී අයවැයගත විකුණුම් රු.මිලියන 129,975 ක් වූ අතර තථ්‍ය විකුණුම් රු.මිලියන 132,460 ක් වුයෙන් ලංවිම 2 % ක වාසිදායක විකුණුම් විචලනයක් සාක්ෂාත් කර ගෙන තිබුණි. තවද මෙම විචලනය සෑදී ඇති ආකාරය අනුව විකුණුම් ඒකක මිලියන 429 ක් වැඩිවීම හේතුකොට ගෙන රු.මිලියන 6,242 ක වාසිදායක පිරිවැය විචලනයක් නියෝජනය විය. කෙසේ වෙතත් අයවැයගත ඒකක විකුණුම් මිල රු.13.59 සිට තථ්‍ය ඒකක විකුණුම් මිල රු.13.22 දක්වා රු.0.37 ඒකකය විකුණුම් මිල පහත බැසීම නිසා රු.මිලියන 3757 ක අවාසිදායක රේට් විචලනයක් වාර්තා විය.

වියදම් විචලනය

අයවැය ගත මුළු වියදම රු.මිලියන 150,032 ක් වූ නමුත් තථ්‍ය වියදම රු.මිලියන 156,269 ක් වුයෙන් රු.මිලියන 6,236 ක අවාසිගත විචලනයක් වාර්තා විය. මුළු ඇයවැයගත සෘජු ජනනය පිරිවැය රු.මිලියන 103,657 ක් වූ නමුත් තථ්‍ය පිරිවැය රු.මිලියන 116,136 ක් වුයෙන් අවාසි සහගත විචලනය රු.මිලියන 12,479 ක් හෙවත් අයවැය ගත ප්‍රමාණයෙන් 12% ක් විය. කාලගුණ තත්ත්වයන්, ඉන්ධන මිල සහ බෙදාහැරීම් ඇණවුම් වැනි ජනන මිශ්‍රණයේ ස්වභාවය හා බැඳුනු වෙනත් විචලන සාධක හේතු කොට ගෙන මෙම සෘජු ජනන පිරිවැය සම්පූර්ණයෙන් පාලනය කිරීමට ලංකා විදුලි බල මණ්ඩලයට නොහැකිය.

2011 වර්ෂයේදී සාක්ෂාත් කරගත් වාසිදායක විචලනය පහත දැක්වෙන වර්ග අනුව සහ අංශ අනුව දැක්වෙන අයවැය ගත මෙහෙයුම් හා නඩත්තු අයවැයගත හා තථ්‍ය සංඛ්‍යාවලින් පෙන්නුම් කෙරේ.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

මෙහෙයුම් හා නඩත්තු පිරිවැය
වර්ග අනුව මෙහෙයුම් හා නඩත්තු පිරිවැය

	තථ්‍ය රු.මිලියන	අයවැය රු.මිලියන	විචලනය			2010 රු.මිලියන
			රු.මිලියන	%		
සේවක මණ්ඩල	12,259	14,503	2,244	15%	F	12,443
ද්‍රව්‍ය	3,084	4,847	1,763	36%	F	3,350
නවාතැන්	940	1,079	139	13%	F	794
ප්‍රවාහන හා සන්නිවේදනය	2,373	2,494	121	5%	F	2,059
වෙනත් පිරිවැය	2,488	2,706	218	8%	F	2,253
පොදු කාර්ය අයකිරීම්	(1,255)	-	1,255			(962)
මූල්‍ය පිරිවැයට පෙර උප එකතුව	**19,890**	**25,629**	**5,739**	**22%**	**F**	**19,937**
මූල්‍ය පිරිවැය	1,828	2,909	1,081	37%	F	2,605
ක්ෂය කිරීමට පෙර උප එකතුව	**21,717**	**28,538**	**6,821**	**24%**	**F**	**22,543**
ක්ෂය	18,416	17,838	(578)	-3%	A	16,064
එකතුව	**40,133**	**46,376**	**6,243**	**13%**	**F**	**38,607**

අංශ අනුව මෙහෙයුම් හා නඩත්තු (O & M) පිරිවැය (ක්ෂය හැර)

	තථ්‍ය රු.මිලියන	අයවැය රු.මිලියන	විචලනය			2010 රු.මිලියන
			රු.මිලියන	%		
උත්පාදනය	5,228	5,194	(34)	-1%	A	4,557
සම්ප්‍රේෂණය	1,402	2,055	653	32%	F	1,638
බෙදා හැරීම - කලාප 01	3,158	4,473	1,315	29%	F	3,133
බෙදා හැරීම - කලාප 02	3,930	5,203	1,273	24%	F	4,096
බෙදා හැරීම - කලාප 03	2,194	3,060	866	28%	F	2,681
බෙදා හැරීම - කලාප 04	2,423	2,953	530	18%	F	2,461
සංයුක්ත	1,826	3,130	1,304	42%	F	1,692
බැංකු අයිරා හා ණය පොලී	1,226	2,170	944	44%	F	2017
IPP ගෙවීම් ප්‍රමාද මත පොලී	332	300	(32)	-11%	A	267
එකතුව	**21,717**	**28,538**	**6,821**	**24%**	**F**	**22,543**

4. පද්ධති හා පාලන

සටහන් කර ගන්නා ලදි.

සභාපති
ලංකා විදුලි බල මණ්ඩලය
2013.05.08

සාමාන්‍යාධිකාරී
ලංකා විදුලි බල මණ්ඩලය

සියළු දෙනාගේ ජීවිත ආලෝකමත් කරමින්

ලංකා විදුලිබල මණ්ඩලය

ලිපිනය : නො. 50, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 2

දුරකථනය: (011) 232 4471 (8 lines) / ෆැක්ස්: (011) 244 9572

වෙබ් අඩවිය: www.ceb.lk

Designed by Ceylon Printer PLC